සමාජ විද්‍යාත්මක
ප්‍රවේශය

# ජනමාධ්‍යවේදය

(ජනමාධ්‍ය අධ්‍යයනය සහ විචාරය)

**සමාජ විද්‍යාත්මක ප්‍රවේශය**

# ජනමාධ්‍යවේදය

## (ජනමාධ්‍ය අධ්‍යයනය සහ විචාරය)

සංස්කරණය

**මිටියුඩර් වීරසිංහ**

**ධර්ම කීර්ති ශ්‍රී රංජන්**

**ප්‍රකාශනය**

ශ්‍රී පාලි මණ්ඩපය,

කොළඹ විශ්වවිද්‍යාලය,

වැවල, හොරණ;

ප්‍රථම මුද්‍රණය 2005 ජනවාරි

ISN 1800-0401

**සංස්කරණය**

© මිටියුඩර් වීරසිංහ, ධර්ම කීර්ති ශ්‍රී රංජන්.

**ප්‍රකාශනය**

ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය.

දුරකථන 034 2261371 ෆැක්ස් 034 2261372

034 2263617

**පරිගණක අක්ෂර සංයෝගය**

පරිගණක උපදේශනය :- රාජේෂ් හෙට්ටිආරච්චි.

පරිගණක අධ්‍යයනාංශය,

ශ්‍රී පාලි මණ්ඩපය,

කොළඹ විශ්වවිද්‍යාලය.

**අක්ෂර සංයෝගය**

හෂිනි සමීරා කරඳන.

ගයාත්‍රි කෞශල්‍යා පෙරේරා.

**කංචුක නිර්මාණය** :- ඩිජිටෙල් ආර්ක් වර්ක්

කන්තලේ නන්දරතන හිමි.

**මිළ :-** රු. 450.00

**මුද්‍රණය :-**

**මෙහි පළවන ලිපිවල අන්තර්ගතය පිළිබඳ වගකීම එම ලේඛකයන් සතුය.**





# ලේඛකයෝ

1. මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක -
   B.Dv.S. (Hons) - Colmbo, P.G. Dip in Population St - Clombo, M.A.Brussels, PhD.Adelaide;
   හිටපු මණ්ඩපාධිපති - ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය;

2. මහාචාර්ය බී. ඒ. ටෙනිසන් පෙරේරා -
   ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය;

3. ආචාර්ය මිටියුඩර් වීරසිංහ -
   B.A.(Hons) Journalism - Moscow , M.A. Mass com. - Moscow, M.A. Philosophy - Moscow, PhD. Moscow, Dip in Russian, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, අංශ ප්‍රධාන, ජනමාධ්‍ය අධ්‍යයනාංශය, ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය;

4. ආචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂ -
   B.A. (Hons) - Lanka, M.A.- Lanka, PhD. Moscow, Dip in Russian, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, අංශ ප්‍රධාන,ජනසන්නිවේදන අධ්‍යයනාංශය,කැලණිය විශ්වවිද්‍යාලය;

5. අචාර්ය ස්වර්ණලතා පෙරේරා -
   B.A. (Hons), M.A., PhD. Japan,ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, අංශ ප්‍රධාන, සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය;

6. ආචාර්ය නන්දන කරුණානායක -
   තොරතුරු හා මාධ්‍ය අමාත්‍යාංශයෙහි මාධ්‍ය උපදේශක;
   B.Sc. - State University - New York, M.A. - State

University of Philippines, PhD - Missouri;

7. ආචාර්ය සුනිල් විජේසිරිවර්ධන -
B.A. (Hons), M.A. PhD. - Moscow, උපදේශක, ප්‍රසංග කලා අධ්‍යයනාංශය, ශ්‍රී පාලි මණ්ඩපය,කොළඹ විශ්වවිද්‍යාලය;

8. ධනපාල විජේසිංහ -
B.A. (Hons), M.A., M. Phil, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය;

9. ධම්ම දිසානායක -
B.A. (Hons)- Colomb, M. phil- Colombo, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, දේශපාලන විද්‍යා හා රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය;

10. සුගත් මහින්ද සෙනරත් -
B.A. (Hons) - Kelaniya, M. phil - Kelaniya, ජනමාධ්‍ය අධ්‍යයනාංශය, ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය;

11. කේ. ඩී. එල්. මනරංජනී -
B.A. (Hons) - Kelaniya, M.Mus.- B.H.U- India, Sangeeth and Vadya Visharad, PGDip in Archaeology, ප්‍රසංග කලා අධ්‍යයනාංශය, ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය;

12. ජී.ඩී. ධර්ම කීර්ති ශ්‍රී රංජන් -
B.A. (Hons) - J.pura, M.A. - J.pura, PGDip in Ed. Dip in Eng, PGDip in Bu.Phil, ජනමාධ්‍ය අධ්‍යයනාංශය, ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය;

13. උපුල් රණවීර -
B.A. (Hons), M.A., PGDip in Ed., හිටපු කථිකාචාර්ය රුහුණු විශ්වවිද්‍යාලය;

14. සුගත් හේවාවිතාරණ -
B.A. - Kelaniya, M.S.Sc.- Kelaniya, රූපවාහිනී වැඩසටහන් අධ්‍යක්ෂක;





15. ප්‍රභාත් චමින්ද -
B.A.- St.Petersburg;

16. හේමා සිරිවර්ධන -
B.A. (Hons) - Kelaniya, ජනමාධ්‍ය අධ්‍යයනාංශය, ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය;

17. ජේ. එම්. ආර්. සී . බණ්ඩාර -
B.F.A. (Hons)- Kelaniya;
ප්‍රසංග කලා ා අධ්‍යයනාංශය, ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය;

18. චන්දන විජේකෝන් -
Dip in Journalism - Colombo, Dip in Mass com. - J.Pura, Certificate Course in internation News writing and Editing- U.K., Dip in Democracy and Journalism - Sweden, Certificate Course in investeingation Reporting Sweden, Dip in News Room Management - Sweden;

19. විජේසිරි දිසානායක -
B.A. (Hons);

20. නිවන්ති තිලකරත්න -
ශිෂ්‍ය, ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්විද්‍යාලය;

# පටුන


පිටු

**පෙරවදන** xi --- xxiv

1. **ජනමාධ්‍යවේදයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ සමාජ විද්‍යාත්මක ප්‍රවේශය.** 1 --- 17
   මිරියුඩර් වීරසිංහ

2. **ගිබ්ර් හා ජොන්සන්ගේ සන්නිවේදන ආකෘතිය පිළිබඳ විමසුමක්.** 18 --- 21
   චන්ද්‍රසිරි රාජපක්ෂ

3. **ආසියානු සන්නිවේදන සිද්ධාන්ත සොයා යෑම** 22 --- 54
   නන්දන කරුණානායක

4. **සන්නිවේදනය භාෂාව හා බහුජන මාධ්‍ය** 55 --- 62
   බී.ඒ.ටෙනිසන් පෙරේරා

5. **භාෂාවේ සන්නිවේදනය හා සමාජ විද්‍යාත්මක කාර්යභාරය** 63 --- 72
   උපුල් රණවීර

6. **මහජන සේවා විද්‍යුත් මාධ්‍ය සහ එහි ශ්‍රී ලාංකේය කළමනාකරණ භූමිකාව** 73 --- 85
   හේමා සිරිවර්ධන







7. **මහජන සේවා මාධ්‍ය ප්‍රතිපත්තියක් සඳහා වූ නිර්මාණකරණීය ප්‍රවේශයක්.** 86 --- 105
   සුනිල් විජේසිරිවර්ධන

8. **අන්තර්ජාලීය ක්‍රියාකාරීත්වය නිසා හැඩගැසෙන මානව සමාජ සබඳතා පිළිබඳ තුලනාත්මක විශ්ලේෂණයක්** 106 --- 125
   එම්. සී. ස්වර්ණලතා පෙරේරා

9. **ගෝලීකරණය සහ මාධ්‍ය භූමිකාව** 126 --- 135
   සුගත් මහින්ද සෙනරත්

10. **සන්නිවේදන මාධ්‍ය ගුණාංග සහ මානවීකරණ ක්‍රියාවලිය** 136 --- 145
    ජී.ඩී.ධර්ම කීර්ති ශ්‍රී රංජන්

11. **මානව ගරුත්වය කලා නිර්මාණ හා ජනමාධ්‍ය** 146 --- 157
    ධනපාල විජේසිංහ

12. **විධාන මාධ්‍ය භාවිතය තුළ මැතිවරණ ප්‍රචාරණය** 158 --- 173
    ධම්ම දිසානායක

13. **රූපවාහිනී මාධ්‍ය පිළිබඳ විද්‍යාත්මක අධ්‍යාපනයක අවශ්‍යතාව** 174 --- 187
    සුගත් හේවාවිතාරණ

14. **තාක්ෂණික හා කලාත්මක ප්‍රවණතාවනට අනුකූලව වෙනස්වන සිනමා කැමරා ශිල්පියාගේ වෘත්තිකභාවය** 188 --- 207
    ප්‍රභාත් චමින්ද

15. **සන්නිවේදන මාධ්‍යයෙහිලා සංගීතයේ සමාජයීය භූමිකාව.** 208 --- 218

කේ.ඩී.එල්. මනරංජනී 219 --- 236

**16.තූර්ය භාෂාභ්‍යන්තරයෙහි ප්‍රවර්ධනීය සාම්ප්‍රදායික සමාජ සන්නිනවේදන ලක්ෂණ.**

ජේ.එම්.ආර්.සී. බණ්ඩාර

237 --- 242

**17.විශේෂාංග ලිපි රචනය**

චන්දන විජේකෝන්

243 --- 252

**18.අද්‍යතන රූපවාහිනී මාධ්‍ය සහ ජනප්‍රිය සංස්කෘතික ප්‍රාග්ධනයේ ක්‍රියාකාරීත්වය**

විජේසිංහ දිසානායක

253 --- 262

**19.ජනමාධ්‍යවේදියා සහ ඔහුගේ අධ්‍යාපනික භූමිකාව**

නිවන්ති තිලකරත්න

263 --- 295

**20.පවුල් සැලසුම් ක්‍රම භාවිතයේ දී උද්ගත වන ප්‍රජනක සෞඛ්‍යය පිළිබඳ සමාජ විද්‍යාත්මක විමසුමක්**

මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක






# පෙරවදන

20 වන සියවස සිදු වූ සන්නිවේදන මාධ්‍යයන්ගේ හා තොරතුරු තාක්ෂණයේ වේගවත් වර්ධනය සමස්තයක් වශයෙන් මානව සමාජය මාධ්‍යකරණයට ලක් කළේය. ජනමාධ්‍යවේදය බලපෑම් සහිත සමාජීය ආයතනයක් බවට පරිවර්තනය විය. එය රාජ්‍ය හා සමාජීය පරිපාලන නෛතික ව්‍යුහයන් සමාජ පුද්ගලභාවයට ඇති කරන බලපෑමට නොදෙවෙනි බලපෑමක් එල්ල කිරීමට තරම් සමත් වී තිබේ. ජනමාධ්‍යවේදය සතු ප්‍රබල ශක්‍යතා නිර්මාණාත්මකව යොදන්නේ නම් එය සමාජ සංවර්ධනය සඳහාත් සමාජ සම්බන්ධතා නවීකරණය කිරීම සඳහාත් ප්‍රජාතන්ත්‍රවාදී සම්බන්ධතාවන් ශක්තිමත් කිරීම සඳහාත් ඉවහල් වන්නේය. නමුත් ජනමාධ්‍යවේදය සමාජය තුළ ඊට ප්‍රතිවිරුද්ධව ප්‍රවණතා ඇති කිරීම සඳහා ද උපයෝගී කොට ගත හැකිය. සමාජ සම්බන්ධතා විකෘති කිරීම, ජනමතය නොම- යැවීම, සමාජය තුළ නිර්ඒකාග්‍රතා හා නිර්අනුස්ථාපනීය ප්‍රවණතා ඇති කිරීම ඒ අතර ප්‍රධාන වේ.

වර්තමාන ශ්‍රී ලාංකේය සමාජය තුළ ජනමාධ්‍යවේදය අතිශය වැදගත්කම උභතෝකෝටික භාවයක් දරන්නේ ශ්‍රී ලාංකේය සමාජය තුළ මාධ්‍ය විචාරය සම්ප්‍රදායක් වශයෙන් සාපේක්ෂව වර්ධනය වී නොමැතිකමයි. එසේම සාහිත්‍ය විචාරය, නාට්‍ය විචාරය, සිනමා විචාරය, සංගීත විචාරය ආදී ක්ෂේත්‍රවල ද ලාංකේය සම්ප්‍රදායක් ගොඩනැගී නොමැත.

අප රට තුළ යම්කිසි ප්‍රමාණයකට හෝ අවිධිමත්ව හා අක්‍රමවත්ව සිදුවන මාධ්‍ය විචාරය භාෂාමය හා ආචාරවිද්‍යාත්මක, සදාචාරාත්මක ව්‍යුහ හා ප්‍රවණතා තුළ සිර වී විකෘති වී තිබේ. මේ තත්ත්වය නිසාම ජනමාධ්‍ය විචාරය තුළින් සිදුවිය යුතු කාර්යභාරය නිසි පරිදි හා විද්‍යාත්මකව සිදු නොවේ. තොරතුරු සන්නිවේදනාත්මක, ප්‍රජානන, නියාමක, ශෝධක, සමාජ - සංවිධානමය, ශික්ෂණමය, ව්‍යාප්ති ප්‍රවර්ධන, ආලෝකනය ආදී මූලික කාර්යන් ජනමාධ්‍ය විචාරය තුළින් සිදු විය යුතු අතර මීට අමතරව ජනමාධ්‍ය විචාරය සම්බන්ධ තවත් උප කාර්යන් කිහිපයක් ද පවතී. ඇගයුම්ගිලි, පූර්වකථන, අර්ථකථන, විශ්ලේෂණාත්මක අධික්ෂණ, යනාදී කාර්යන් ඒ අතර වැදගත් ස්ථානයක් ගනී.

මාධ්‍ය විචාරය පිළිබඳ කතා කිරීම පසෙක තබා අප රට තුළ තවම පොදු ජන තොරතුරු ක්‍රියාකාරීත්වය පිළිබඳව පවා නිශ්චිත ආකල්පයක් නිර්මාණය වී නොමැත. එය තුළ ද ඉහත කී ප්‍රවණතා ආධිපත්‍ය දරයි.

සමාජය තුළ සිදුවන පොදු ජන තොරතුරු ක්‍රියාකාරිත්වය සර්වාංගික වශයෙන් නියෝජනය කිරිමට සමාජ විද්‍යාත්මක සංකල්පයක් නිර්මාණය කරගැනීමේ සිට එහි අන්තර්ගතය, විෂය පරාසය, නියාමයන් හා එහි මූලික ගතිලක්ෂණ නිර්ණය කිරීම දක්වාම තවම නොවිස දී ඇති ගැටලු විශාල ප්‍රමාණයකි.

20 වන සියවස තුළ ජනමාධ්‍යවේදය සර්ව පද්ධතියක් බවටත් වෘත්තියක් බවටත් පත් වීම තුළ තොරතුරු වාර ප්‍රකාශනයන්ගේ හා විකාශ ආයතනයන්ගේ දැවැන්ත වර්ධනයක් සිදුවූවා පමණක් නොව ජනමාධ්‍යවේදාත්මක නිර්මාණවල අන්තර්ගතමය බහු විධත්වය ද වර්ධනය විය.*

ජනමාධ්‍යවේදය සමාජීය ආයතනයක් වශයෙන් ස්ථාපිත වීමත් සම-ම පුද්ගලයා හා සමාජය කෙරෙහි එය කරන බලපෑම වර්ධනය වන්නට විය. එය සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් පමණක් නොව විවිධ සේවා සපයන, මාධ්‍යයක් වශයෙන් ද සමාජීය පාලනයේ සාධකයක් වශයෙන් ද ව්‍යාපාරික ප්‍රාග්ධන ආයෝජනයේ ක්ෂේත්‍රයක් වශයෙන් ද සමාජය පුරා ව්‍යාප්ත වී සාපේක්ෂ වශයෙන් ස්වාධීන පැවැත්මක් අත්පත් කර ගත්තේය.

මේ අනුව ජනමාධ්‍යවේදය පුද්ගල හා සමාජ ජීවිතය කෙරෙහි සිදු කරන ලද බලපෑමෙන් ඔබ්බට ගොස් එය රාජ්‍ය පාලනය, දේශපාලනය ආර්ථිකය, සංස්කෘතිය ආදි අංශ කෙරෙහි ද සැලකිය යුතු බලපෑමක් ඇති කිරීමට සමත් විය. මේ තත්ත්වයන් තුළ ලෝකයේ විවිධ රටවල විශේෂයෙන්ම බටහිර රටවල බුද්ධිමතුන්ගේ අවධානය ජනමාධ්‍යවේදය දෙසට යොමුවන්නට විය. මේ අනුව ජනමාධ්‍යවේදය ශාස්ත්‍රිය වශයෙන් අධ්‍යයනය කිරීමේ දැඩි අවශ්‍යතාව මතු වන්නට විය.

දැනට ජනමාධ්‍යවේදය ශාස්ත්‍රිය වශයෙන් අධ්‍යයනය කිරීම ආරම්භ වී වසර සියයකට ආසන්නය. මේ දසක දහය තුළ ජනමාධ්‍යවේදය විවිධ ගුරුකුල විවිධ ප්‍රවණතා ඔස්සේ අධ්‍යයනය කොට මෙම සංකීර්ණ සමාජ - දේශපාලනික

* මියුඩර් වීරසිංහ,චන්ද්‍රසිරි රාජපක්ෂ, 2002, ජනමාධ්‍යවේදය, සංහිඳ ප්‍රකාශන;





ප්‍රපංචයේ විවිධ පැතිකඩවල් අනාවරණය කරමින් එහි ක්‍රියාකාරීත්වය පිළිබඳ යම් යම් නියාමයන් සොයා ගෙන ඇත. නමුත් ජනමාධ්‍යවේදයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ බටහිර අධ්‍යයනයන් තුළ දක්නට ලැබෙන්නේ විද්‍යාත්මක ස්වරූපයකට වඩා දෘෂ්ටිමය ස්වරූපයකි. මෙය ජනමාධ්‍යවේදයට පමණක් නොව සියලුම සමාජ විද්‍යාවන්ට ද පොදු වූ ලක්ෂණයකි.

ජනමාධ්‍යවේදය අධ්‍යයනය කිරීමේ ප්‍රථම ගුරුකුල 20 වන සියවස සීමාවේදී ඇමරිකා එක්සත් ජනපදය, ජර්මනිය, එංගලන්තය, ස්විට්සර්ලන්තය, ජපානය, ඉතාලිය, චීනය වැනි රටවල බිහිවිය.* එය අදාළ රටවල පුවත් පත්, ස-රා ආදී වාර ප්‍රකාශනවල ප්‍රමාණාත්මක වර්ධනයන් සම- සම්බන්ධ වේ. නිදර්ශනයක් වශයෙන් 20 වන සියවසේ මුල් දශකය තුළ යුරෝපීය රටවල පළ වූ පුවත් පත්, ස-රා සංඛ්‍යාව දහස් ගණනක් විය. මේ රටවල ජනමාධ්‍යවේදය සමාජ -ආර්ථික දේශපාලන, දෘෂ්ටිමය, සංස්කෘතික හා විද්‍යාත්මක අවශ්‍යතාවන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් වර්ධනය වූ බව පෙනේ. ජනමාධ්‍යවේදය සමාජ,සංස්කෘතික වර්ධනයත් සම- ඓන්ද්‍රීමය සම්බන්ධයකින් යුතුව වර්ධනය විය.

ජනමාධ්‍යවේදයේ සමාජ විද්‍යාව සාපේක්ෂ වශයෙන් දීර්ඝ ඉතිහාසයක් නොමැති විද්‍යාත්මක විෂය පතයකි. මෙය 20 වන සියවසේ තුන්වන දශකයේදී පමණ ආරම්භ වූවකි. ජන සන්නිවේදනය මාධ්‍යයන්ගේ තාක්ෂණික වර්ධනය ජනමාධ්‍යවේදය පද්ධතියක් වශයෙන් වර්ධනය වීම සහ එය සමාජ ජීවිතය තුළ තිරණාත්මක සාධකයක් බවට පත්වීමත් සම-ම ජන සන්නිවේදනයේ සමාජ විද්‍යාත්මක පැතිකඩ කෙරෙහි අවධානය යොමු විය. ඉහත වර්ධනයන් නිසා ජනමාධ්‍යයේ ව්‍යාප්තිය සම්බන්ධ කාලය හා අවකාශය වැනි භෞතික සීමා පමණක් නොව මනෝ විද්‍යාත්මක හා පෞරුෂීය සීමා ද සාර්ථක ලෙස මැඩපවත්වා සිය ආධිපත්‍ය සමාජ ජීවිතයේ සියලුම ක්ෂේත්‍ර කෙරෙහි ව්‍යාප්ත කළේය.

ජනමාධ්‍යවේදයේ සමාජ විද්‍යාව පිළිබඳ උනන්දුවක් ඇතිවීම ඓතිහාසිකව සිදු වූවකි. ප්‍රථම ලෝක යුද්ධ සමයේ දී ජනමතය සාධකයක් වීම සඳහා යුධ ප්‍රචාරණය හා වෙළඳ දැන්වීම් ඉටු කරන ලද පුදුමාකාර සාර්ථකත්වය නිසා ජනමාධ්‍යවේදයේ සමාජ විද්‍යාත්මක ස්වභාවය පිළිබඳව විද්‍යාත්මක අධ්‍යයනයන් ආරම්භ වූ බව පැහැදිලි වේ. ජනමාධ්‍යවේදය සමාජ නවීකරණය

* L. G., Svitich, Shiryaeva A. A., 1997, Journalistic Education: A Sociological view, moscow;

කිරීමේ විශ්වසනීය ආයතනයක් හා සමාජ එක-තාවය සාක්ෂාත් කර ගැනීමේ මාධ්‍යයක් වශයෙන් සිය ශක්‍යතාව මොනවට සනාථ කළේය.

දේශපාලන විද්‍යාඥයන් මුලින්ම ජනමාධ්‍යවේදයේ සමාජ විද්‍යාත්මක ගතිලක්ෂණ අධ්‍යයනය කිරීමේ මූලික ප්‍රතිඵලදායක පියවරක් තබන ලදී. එම කාලයේදී ම ගවේෂකයින්ට සැනසිල්ල ගෙන නොදෙන සදාකාලික ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට දේශපාලන විද්‍යාඥයෝ උත්සාහ කළහ. කුමන සාධකයන්ගේ කුමන ප්‍රමාණයේ බලපෑම් යටතේ මිනිසාගේ හා මානව සමාජයේ ස්වභාවය වෙනස් වීමට භාජනය වන්නේද? ඔවුන්ගේ දෘෂ්මි පතයට මානව ප්‍රජානනයේ විවිධ ක්ෂේත්‍ර හසුවිය. ඉතිහාසය, ජනමාධ්‍යවේදය, මානව විද්‍යාව, ආර්ථික විද්‍යාව, සමාජ මනෝ විද්‍යාව, සමාජ විද්‍යාව, සහ දර්ශනවාදය ඒ අතර වේ. මීට අමතරව භෞතික විද්‍යාව, රසායනික විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව ආදිය ද පොදු ජන තොරතුරු සම්ප්‍රේෂණ කිරීමේ තාක්ෂණික මාධ්‍යයන් නිර්මාණය කිරීම හා නවීකරණය කිරීමෙහි ලා දායක විය.

ජන සන්නිවේදන පද්ධතීන්ගේ අන්‍යොන්‍ය සම්බන්ධතා පරීක්ෂා කරමින් තොරතුරුවේදයේ න්‍යායික හා සංකල්පීය වර්ධනයට අතිවිශාල දායකත්වයක් ගණිතය හා භෞතික විද්‍යාව තුළින් ලැබුනේය. නිදර්ශනයක් වශයෙන් යම් නාලිකාවක තොරතුරු සම්ප්‍රේෂණ හැකියාව හා සංඥාවන්ගේ ගුණාත්මකභාවය අතර ඇති සම්බන්ධය පිළිබඳ ගැටලුව ඔවුන්ගේ පරීක්ෂාවට ලක්විය.

ජනමාධ්‍යවේදීහු පොදුජන තොරතුරු මාධ්‍ය අධ්‍යයනය කරමින් පොදුජන සන්නිවේදන ක්‍රියාවලිය තුළ දී සම්ප්‍රේෂණය වන තොරතුරුවල ගුණාත්මකභාවය කෙරෙහි මූලික අවධානය යොමු කළහ. තොරතුරුවල පරිපූර්ණභාවය, විශ්වසනීයත්වය හා විෂයමූලිකත්වය ඔවුන්ගේ අවධානයට ලක්විය. සියලුම මට්ටමේ බල කේන්ද්‍රීය ආයතන සම- ජනමාධ්‍යවේදය දක්වන සම්බන්ධතාවයේ සන්දර්භය තුළ එම ගතිලක්ෂණ විග්‍රහ කරන ලදී.

මනෝ විද්‍යාඥයෝ පොදුජන මාධ්‍ය අධ්‍යයනයට පමණක් සීමා නොවූ අතර කුඩා කණ්ඩායම් හා ද්වි පුද්ගල සම්බන්ධතා පවා අධ්‍යයනය කළහ. මිනිස්සු ඉගෙන ගන්නේ කෙසේද? ඔවුන්ගේ අභිමතාර්ථ වෙනස් වන්නේ කෙසේද? ඒවා වෙනස් වන්නේ ඇයි? ඔවුනොවුන් අතර සන්නිවේදන භූමිකාවේ ස්වභාවය කුමක්ද? අසංවේදී හා තාර්කික (බුද්ධිවාදී) තොරතුරු වාර්තාවල බලපෑම් ආකාරය ගන්නා





ස්වභාවය කෙබඳුද? දැනුවත් කිරීමේ ආකාරයේ ඒක පාර්ශවීය හා ද්වි පාර්ශවීය භාවයේ ස්වරූපය ආදී ගැටලු ඔවුන්ගේ අධ්‍යයනයේ විෂය පතය නිර්මාණය කළේය.

දේශපාලන විද්‍යාඥයින්ගේ අධ්‍යයන දෙස අවධානය යොමු කිරීමේදී වැදගත් ප්‍රශ්නය වූයේ දේශපාලන ක්‍රියාවලිය තුළදී ජනමාධ්‍යවේදයේ කාර්යභාරය කෙබඳු ද යන්නයි. මැතිවරණයක දී ඡන්දය විමසීමේදී දේශපාලන ප්‍රචාරණවාදයේ බලපෑම පිළිබඳ ප්‍රබල අවධානයක් යොමු කරන ලදී. දේශපාලන නායකයින් විසින් යම් යම් තීරණ ගැනීමේ දී හා ප්‍රතිපත්ති සම්පාදනයේ දී ජනමාධ්‍යවේදයේ කාර්යභාරය කුමක් ද ආදී ගැටලු පිළිබඳව ඔවුහු සිය අවධානය යොමු කළහ.

ජනමාධ්‍යවේදයේ සමාජ විද්‍යාව, ආංශික සමාජ විද්‍යා න්‍යායක් ලෙස ජනමාධ්‍යවේදය සමාජය තුළ ක්‍රියාත්මක වන්නා වූ සමාජ ආයතනයක් වශයෙන් විභාග කරයි. ජනමාධ්‍යවේදයේ කාර්යක්ෂමතාව හා ජනමාධ්‍යවේද ක්‍රියාවලියේ සියලුම සංරචක කෙරෙහි සමාජීය පරිසරයේ බලපෑම විමර්ශනයට ලක් කිරීම ජනමාධ්‍යවේද සමාජ විද්‍යාවේ වැදගත් කාර්යභාරයකි. සමාජීය සබඳතා පද්ධතිය තුළ ජීවත්වන්නා වූ පුද්ගලයා වෙත එම සබඳතාවල බලපෑම හේතු කොට ගෙන ඔහු තුළ නිශ්චිත ආකල්ප, වටිනාකම්, පුරුෂාර්ථ, අභිමතාර්ථ හැඩගැසේ. ජනසන්නිවේදන මාධ්‍යයන් මි-න් සමාජගත කරනු ලබන තොරතුරු සමස්ත සමාජයේම හෝ එහි කොටසක හෝ පංතියක, කණ්ඩායමක හෝ සමාජීය ආයතනයක උවමනාවන් නියෝජනය කරනු ලැබේ. ජනමාධ්‍යවේදයේ ක්‍රියාකාරීත්වය නිසා ග්‍රාහකයා තුළ නිශ්චිත සමාජ තත්වාරෝපිත ස්වභාවයක් ඇති වන අතර ඒ නිසාම ජනසන්නිවේදන ක්‍රියාවලිය පිළිබඳ සමාජ විද්‍යාත්මක විශ්ලේෂණයක අවශ්‍යතාව මතු වේ. ජනසන්නිවේදනය, ජනමාධ්‍යවේදය අධ්‍යයන කිරීමේ එයට නිශ්චිත ව්‍යුහයක් සහ ස්වරූපයක් තිබෙන බව පැහැදිලි වේ. ජනමාධ්‍යවේදයේ සමාජීය සංවිධානයේ ස්වරූපය වශයෙන් පුවත්පත්, ගුවන්විදුලි හා රූපවාහිනිය ආදිය ඉදිරිපත් වේ. එම ස්වරූප හරහා පොදුජන තොරතුරු ක්‍රියාවලිය ප්‍රායෝගිකව භාවිතයට ලක් වන්නේය.

ජනමාධ්‍යවේදයේ න්‍යාය නිරන්තරවම සමාජ විද්‍යාත්මක න්‍යායන්ගේ බලපෑමට ලක් වෙමින් පෝෂණය වේ. ජනමාධ්‍යවේදය ස්වාධීනව විවිධ ගැටලු පිළිබඳ අධ්‍යයනය කරන අතරම ඒ සඳහා වෙනත් විද්‍යාවන්ගේ ද ආභාසය ලබා

ගන්නා බව පෙනේ.

මිනිසුන්ගේ අන්‍යෝන්‍ය සම්බන්ධතාවන්ගේ ස්වරූපයක් වශයෙන් සන්නිවේදනය ඉදිරිපත් වන අතරම ඔවුන්ගේ ස්ව විඥානය සහ සමාජ විඥානය හැඩගැස්වීමේ මාධ්‍යයක් වශයෙන් ද ක්‍රියාත්මක වේ. සෑම මානව ක්‍රියාකාරීත්වයකම වෙනස් නොවන සංයුක්ත සාධකයක් ලෙස සන්නිවේදනය පිහිටා තිබේ. ශ්‍රමය සහ සහවාසය (Intercourse) මානව පැවැත්මේ පූර්ව කොන්දේසියකි. සමාජීය පැවැත්මක් ලෙස මිනිසාට සමාගමය, සහවාසය අවේණික ගුණයකි. සන්නිවේදනය යන්නෙන් අදහස් වන්නේ අදාළ ක්‍රියාවලිය තුළදී දෙදෙනෙකු හෝ ඊට වැඩි පාර්ෂව ගණනක් අතර සිදු වන අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්වය හා අන්‍යෝන්‍ය බලපෑමකි. වර්තමානයේදී මෙම සන්නිවේදන ක්‍රියාවලිය තුළට පුළුල් ජන සංඛ්‍යාවක් ඇතුළත් වීම නිසා එම ක්‍රියාවලිය බහුජන ක්‍රියාවලියක් බවට පරිවර්තනය වී තිබේ.

ජනසන්නිවේදනය තාක්ෂණික මාධ්‍යයන් මුද්‍රණය, ගුවන්විදුලිය, රූපවාහිනිය හරහා සමාජය තුළ තොරතුරු සම්ප්‍රේෂණය කිරීමේ හා ව්‍යාප්ත කිරීමේ ආකාරයක් වශයෙන් නිර්වචනය කරනු බොහෝ විට දැකිය හැකිය. අධ්‍යාපනය, පාලනය, ශික්ෂණය ආදී මිනිසුන්ගේ අන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්වය සිදුවන සියලු ක්ෂේත්‍රයන්හි ක්‍රියාකාරීත්වය තුළ සමාජීය තොරතුරුවල භූමිකාව වේගයෙන් වර්ධනය වීම තුළ ඉහත අර්ථකථනය සාධාරණ වේ. එය සමාජීය තොරතුරු ජනසන්නිවේදන ක්‍රියාවලියේ සන්දර්භය සංයුක්ත කරන්නේය. වෙනත් ආකාරයකින් ප්‍රකාශ කරන්නේ නම් ජනසන්නිවේදනය තොරතුරුමය ස්වභාවයක් දරන්නේය. තොරතුරු ක්‍රියාවලිය සමාජීය නියමයන් මත තත්වාරෝපිතව ක්‍රියාත්මක වේ. සමාජය තුළ විද්‍යාත්මක, අධ්‍යාත්මික, නෛතික, සදාචාරාත්මක දැනුම හා පුරුෂාර්ථ ව්‍යාප්ත කිරීමෙහි ලා ජනමාධ්‍යවේදය උපකරණාත්මක මාධ්‍යයක කාර්යභාරය පමණක් නොව ජනමාධ්‍යවේදය ද අදාළ දැනුම හා පුරුෂාර්ථවල ස්වභාවය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් සිදු කරනු ලබන බව විද්‍යමාන වේ. සමාජය තුළ සිදුවන්නා වූ සන්නිවේදනාත්මක ක්‍රියාවලින්ගේ සමස්තය සමාජීය සන්නිවේදනය වශයෙන් එක් පදාර්ථයකට සංගෘහිත කොට දැක්විය හැකිය.

ජනමාධ්‍යවේදාත්මක න්‍යාය තුළ සමාජය සහ සන්නිවේදනය ඉතා සමීප අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් සහිත සංකල්ප වශයෙන් සලකා බලනු ලැබේ. ජනමාධ්‍යවේදය විසින් භාවිත කරනු ලබන “ ස්වරූප ” හා “ ආකාරයන් ” හරහා ඉහත සමීප අන්‍යෝන්‍ය සම්බන්ධතාව අවධාරණය වේ. ග්‍රාහකයා වෙත සිය





පණිවුඩය ඉදිරිපත් කිරීම සඳහා ජනමාධ්‍යවේදය යම් යම් සංකේත, ස්වරූප භාවිත කරමින් ග්‍රාහකයාට නිශ්චිත සන්නිවේදනාත්මක ක්‍රියාවකට ඇතුළත් වීමට බල කොට සිටියි. සමාජ සන්නිවේදනය පිළිබඳ කතා කිරීමේදී තවත් කාරණා දෙකක් ඉතා වැදගත් වන්නේය. ඉන් පළමුවැන්න සන්නිවේදනය සිදුවන සමාජ අවස්ථාව වන අතර දෙවැන්න වන්නේ ජනමාධ්‍යවේදය සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කරන සමාජ අභිමථාර්ථයන්ය.

ජනසන්නිවේදනයේ සමාජ විද්‍යාත්මක ප්‍රවණතාව ආරම්භයේදී වර්ධනය වූයේ පොදු සමාජ විද්‍යාත්මක න්‍යාය තුළය. නිදර්ශනයක් ගෙන හැර දක්වන්නේ නම් මැක්ස් වේබර් “ජනමාධ්‍ය ධනේශ්වර ව්‍යාපාරයක් ” වශයෙන් හැඳින්විය. කර්මිකරණය හා නාගරිකරණය සම- මතු වූ පොදුජන සාමාපිකයින්ගේ සහවාසයේ ස්වරූපයක් ලෙස ජනසන්නිවේදනය රොබට් පාර්ක්, චාර්ල්ස් එච්. කුලි හඳුන්වන ලදි. 1920 ගණනන්වල දී ජනසන්නිවේදන න්‍යාය අනුභූතික ගවේෂණවල බලපෑමට දැඩි ලෙස හසු විය. පොදු ජන ග්‍රාහකත්වය වර්ධනය කර ගැනීම සඳහා වූ අරගලය තියුණු වූ අතර එහිදී ග්‍රාහකයා ඒ හෝ මේ තොරතුරට දක්වන ප්‍රතිචාරය දැන ගැනීම ජනමාධවේදීන්ට හා ජනමාධ්‍ය ආයතනවලට අතිශය වැදගත් විය. එසේම වෙළඳ හා දේශපාලන තර-ය තුළ දී ජනමාධ්‍යවේදය අත්‍යවශ්‍ය ආයුධයක් බවට පත් විය. මේ තත්ත්වය තුළ ව්‍යවහාරික සමීක්ෂණ සීඝ්‍ර ලෙස ව්‍යාප්ත වූ අතර ඒ ස්ථාවරය පදනම් කොට ගෙන ජනසන්නිවේදන න්‍යායන් නිර්මාණය කරන ලදි.

ඉතිහාසඥයෝ, දේශපාලන විද්‍යාඥයෝ, වාග් විද්‍යාඥයෝ, මනෝ විද්‍යාඥයෝ හා දාර්ශනිකයෝ ආදී විවිධ වෘත්තීන්ට අයත් ගවේෂකයෝ තොරතුරු ක්‍රියාවලියේ සමාජීය සුවිශේෂතා සහ ජනමාධ්‍යවේදය විවිධ සමාජීය ආයතන සම-දක්වන අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්වය අධ්‍යයනය කරති. ජනමාධ්‍යවේදයේ සමාජ විද්‍යාත්මක ප්‍රවණතාව පිළිබඳ ගවේෂණය කළ විල්බර් ශ්‍රාම් එය ශාස්ත්‍රාලයීය විෂයක් බවට පරිවර්තනය කළේය. ශ්‍රාම් හා ඔහුගේ නායකත්වය යටතේ ලියන ලද බොහෝ කෘති ඇමෙරිකානු ජනමාධ්‍යවේදයටත් අනාගත ගවේෂණ සඳහා අවශ්‍ය න්‍යායික හා ක්‍රමවේදීය පදනමක් බවටත් පත් වී තිබේ.

ජනසන්නිවේදනයේ ව්‍යුහය පිළිබඳ කතා කිරීමේදී එයට සමාජ විද්‍යාත්මක ප්‍රවේශයක තිබෙන අදාළත්වය ඉතා පැහැදිළි වන්නේය. ජනසන්නිවේදනය සංඝටකයන්ගේ සමස්තයක් ලෙස විග්‍රහ කළ හැකිය. ජනසන්නිවේදන සමාජ

විද්‍යාවේ එක් පුරෝගාමියෙකු වන ලැස්වෙල්ගේ පංච සූත්‍රය මගින් ජනසන්නිවේදනයේ සමාජ විද්‍යාත්මක ස්වරූප නිශ්චිත සංකල්පීය රාමුවක් තුළ අනාවරණය කළේය. "කවුද? කුමක් කියන්නේ ද? කුමන මාධ්‍යයකින් ද? කවුරුන්හට ද? කුමන බලපෑමක් සඳහා ද?"* ජනමාධ්‍යවේදයට අදාළව මෙම ප්‍රශ්න පහ විස්තර කරමින් සමාජ විද්‍යාඥයාගේ සියලු මූලික ගවේෂණාත්මක සන්දර්භය හා ප්‍රවණතා අනාවරණය කර ගත හැකියැයි සැලකේ.

මෙහි ප්‍රථම ප්‍රශ්නයේ දී ජනමාධ්‍යවේදියා හා ඔහු විසින් සම්ප්‍රේෂණය කරනු ලබන තොරතුරුවල හැඩගැසීමේ ක්‍රියාවලිය අධ්‍යයනය කළ යුතු බව ගම්‍ය වේ. කවුද කියන්නේ යන ප්‍රශ්න එකිනෙකට වෙනස් ඒත් අන්‍යොන්‍ය වශයෙන් සමබරව ප්‍රවේශ දෙකක් හරහා අධ්‍යයනය කළ හැකිය. ඉන් එක් ප්‍රවේශයක් වන්නේ පොදුජන තොරතුරු ක්‍රියාවලිය නිර්මාණය සහ මෙහෙය වනු ලබන කළමනාකරුවන්, වාර්තාකරුවන්, අධ්‍යක්ෂකවරුන් සහ ඒහා සම්බන්ධ වෙනත් ක්‍රියාකරුවන්ගේ ගතිලක්ෂණ ගවේෂණය කිරීමයි. මේවා සමාජ විද්‍යාත්මක ගැටලුය. ජනමාධ්‍යවේදියාගේ සමාජීය සම්භවය, අධ්‍යාපනය, ලෝකදෘෂ්මිය සහ ජනමාධ්‍යවේද ක්ෂේත්‍රයට මිනිසුන් සමුර්ජනය කර ගැනීමේ ක්‍රම ආදී ජනමාධ්‍යවේදියා සතු ගුණාංග වැදගත් වේ. සමාජ විද්‍යාඥයා මෙම ගැටලු විසඳමින් ජනමාධ්‍යවේද ක්‍රියාවලිය තුළ නියැලී සිටින ජනමාධ්‍යවේදියාගේ පෞරුෂ ප්‍රභේදය හඳුනා ගනී. එසේම ජනමාධ්‍යවේදියා තමා පිළිබඳව දක්වන ආකල්පයන් සමාජය සම්බන්ධයෙන් ජනමාධ්‍යවේදයේ භූමිකාවන් සමාජ විද්‍යාඥයාට හඳුනා ගත හැකිය. අනෙක් ප්‍රවේශය වන්නේ ජනමාධ්‍යවේද ක්‍රියාවලිය තුළදී තීරණ ගැනීමේ ක්‍රියාවලිය අධ්‍යයනය කිරීමයි. එම ක්‍රියාවලියේ මූලික ලක්ෂණයක් වන්නේ එය තනි පුද්ගලයෙකු සම්බන්ධ කාර්යක් නොව සාමූහික කාර්යක් බවයි. මෙම සමාජ කණ්ඩායම් පාලන බලය, සමාජ තත්ත්වය හා වෙනත් සමාජ පාලනයේ සංරචක සම- ව්‍යුහ ගත වී තිබේ.

එසේම සමාජයේ ආර්ථික, දේශපාලනික හා දෘෂ්මිමය වර්ධනයේ විශේෂතා ජනමාධ්‍යවේදයේ ක්‍රියාකාරීත්වය පාලනය කරන්නේය.

ජනමාධ්‍යවේද සමාජ විද්‍යාවේ වඩාත්ම අඩුවෙන් අධ්‍යයනය කොට ඇත්තේ පෞරුෂමය හා වෘත්තීයමය ගැටලුය.

* M. Lasswell, 1971, The Stucture and function of Communication in so wetyll Th process and effect of mass Communication Chicago;





කුමක් කියන්නේ ද? යන ලැස්වේලියානු ප්‍රශ්නයෙන් අදහස් වන්නේ පණිවුඩයේ හෝ සම්ප්‍රේෂණය කරනු ලබන තොරතුරුවල සන්දර්භය අධ්‍යයනය කිරීමයි. සමාජය පාලනය කරන්නා වූ පාලක පංතියේ මතවාදය කුමන ප්‍රමාණයකින් පරාවර්තනය කරන්නේ ද යන්න මෙහි ඉතා වැදගත් වේ. මේ සඳහා අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමය භාවිත කරන අතර එමගින් අදාළ සංදේශයේ සන්දර්භය ප්‍රමාණාත්මකව මෙන්ම ගුණාත්මකව විස්තර කරනු ලැබේ. මේ අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමවේදය මගින් අදාළ ජනමාධ්‍යවේදයේ ව්‍යුහාත්මක හා සන්දර්භමය ප්‍රවණතාව දැන ගත හැකිය. ලැස්වේලියානු පංච සූත්‍රයේ තෙවන ප්‍රශ්නය වන කුමන මාධ්‍යයකින් ද? යන්නෙන් අදහස් වන්නේ තොරතුරු සම්ප්‍රේෂණය කරනු ලබන තාක්ෂණික නාලිකාවන්ගේ සුවිශේෂත්වයත් අදාළ තොරතුරේ ස්වරූපය කෙරෙහි ඇති කරනු ලබන බලපෑමත් අධ්‍යයන කිරීමයි.

ලැස්වේලියානු සූත්‍රයේ සිව්වන ප්‍රශ්නය වන කවුරුන් හට කියන්නේ ද? යන්නෙන් අදහස් වන්නේ ග්‍රාහකයින්ගේ ගතිලක්ෂණයි. ග්‍රාහකත්වය ජනමාධ්‍යවේද සමාජ විද්‍යාවේ ඉතා වැදගත් ම අංගයකි. ග්‍රාහකයා ඒ හෝ මේ තොරතුරුවලට යොමුවීමේ අභිප්‍රායන් අධ්‍යයනය කරයි. ජනමාධ්‍යවේදය උපරිම මට්ටමෙන් ග්‍රාහකත්වය මත බලපෑමට නම් ග්‍රාහකත්වය පිළිබඳ සමාජ විද්‍යාත්මක විශ්ලේෂණයක අවශ්‍යතාව අතිශයින්ම වැදගත් වන්නේය. මේ අනුව සමාජීය වෘත්තියමය භාවය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ප්‍රජා විද්‍යාත්මක ගතිලක්ෂණ සමාජ පංතිමය ආදී වැනි ග්‍රාහකත්වය පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයන්හි දී වඩා අවධානයට යොමු වේ.

තොරතුරු මූලාශ්‍රවලට ග්‍රාහකයින් දක්වන බහුවිධ සම්බන්ධතාව සලකා බැලීමේ දී එය ප්‍රධාන ප්‍රවණතා තුනක් තුළ ගොනු කොට දැක්විය හැකිය. අධ්‍යාත්මික පෞරුෂමය නැඹුරුව, වෘත්තියමය කෘත්‍යවේදී නැඹුරුව හා පරිභෝජනවාදී නැඹුරුව යනු ඒ ප්‍රවණතා තුනයි.

ලැස්වේලියානු සූත්‍රයේ පස්වන, අවසාන ප්‍රශ්නය වන කුමන බලපෑමක් සඳහා ද? යන්නෙන් අදහස් වන්නේ ජනමාධ්‍යවේදයේ ක්‍රියාකාරීත්වයේ සඵලතාවයි. ජනමාධ්‍යවේදයේ සඵලතාව මූලික පරාමිති දෙකක් හරහා විමසිය හැකිය. ඒ හෝ මේ සමාජීය තොරතුරුවල බලපෑම නිසා පොදුජන හෝ කණ්ඩායම් විඥානය වෙනස්වීම ඉන් පළමු වැන්න වන අතර දෙවැන්න වන්නේ පුද්ගලයාගේ සහ විශාල සමාජීය කණ්ඩායම්වල හැසිරීම වෙනස් වීමයි.

ජනමාධ්‍යවේදයේ සව්ලතාවය පිළිබඳ නිර්ණායක වශයෙන් ජනමාධ්‍යවේද සමාජ විද්‍යාව පහත සඳහන් නිර්ණායක ඉදිරිපත් කර සිමියි. විවිධ දැනුම් පද්ධති, නියමයන්, සාධක, පදාර්ථ ආදිය පුද්ගල මට්ටමේ දී අවශෝෂණය කර ගැනීම පළමු වැන්න වේ. දෙවැන්න වන්නේ ප්‍රජානන සක්‍රියතාව වෙනස් වීමයි. එනම් තමන්ගේ දැනුම වර්ධනය කර ගැනීම සඳහා වූ නිරන්තර ප්‍රයත්නයයි. තුන්වන නිර්ණායකය වශයෙන් දැක්විය හැක්කේ තම විශ්වාසයන් වෙනස්වීමට ලක් වීමයි. එනම් යථාර්ථවාදී හැසිරීම් රටාවන් ගළපමින් දැඩි විශ්වාසයකින් යුතුව ගැඹුරින් අදහස් අවශෝෂණය කර ගැනීමයි.

ජනමාධ්‍යවේද සව්ලතාවේ තවත් ඉතා වැදගත් නිර්ණායකයක් වන්නේ ජනමතයයි. විශාල සමාජ කණ්ඩායම්වල හෝ සමස්තයක් ලෙස සමාජයේ ම ජනමතය යම් යම් තොරතුරුවල බලපෑමට යටත්ව වෙනස් වීම මින් අදහස් වේ.

පොදුවේ සලකා බලන විට ජනමාධ්‍යවේදය පිළිබඳ ලැස්වේලියානු සංකල්පය මූලමය වශයෙන් අතික්‍රමණය කිරීමට සමත් සංකල්පයක් බිහි නොවූ අතර ඊට පසුව බිහි වූ ජනමාධ්‍යවේදයේ සමාජ විද්‍යාව පිළිබඳ සංකල්ප ලැස්වේලියානු සංකල්පයේ විවිධ විකරණයන් හෝ සංශෝධනයන් වශයෙන් සැලකිය හැකිය. බටහිර සම්භාව්‍ය භෞතික විද්‍යාවේ සංකල්පීය ව්‍යුහයේ ආභාසය ලබමින් බිහි වූ ලැස්වේලියානු ජනසන්නිවේදන සමාජ විද්‍යා සංකල්පය තුළ ද භෞතික විද්‍යාවේ සංකල්පය තුළ වූ දුර්ලවතා එලෙසම විද්‍යාමාන වන බව අපගේ හැ-මයි. මේ අනුව ලැස්වෙල්ගෙන් පසුව ජනසන්නිවේදනයේ සමාජ විද්‍යාව පිළිබඳව නිර්මාණය වන සියලුම “ සැකිලි ” ජනසන්නිවේදනය සමාජය තුළ ක්‍රියාත්මකවීමේ ක්‍රියාවලිය පිළිබඳ ලැස්වේලියානු සැකිල්ලම පුනර්ජනනය කිරීමකි. එම සියලුම සැකිලිවල මූලික හරය ජනමාධ්‍යවේදියා - ජනමාධ්‍යවේදය - නාලිකාව - ග්‍රාහකයා - ප්‍රතිපෝෂණ සබඳතා යන රේඛීය ව්‍යුහයට ඌනනය කළ හැකිය. මෙම සියලුම “ සැකිලි ” ව්‍යුහීය ස්වරූපයක් දරන අතර ගතිකභාවයෙන් තොරවේ. සමාජය තුළ තොරතුරු ජනනය වන්නේ කෙසේද? ප්‍රගමනය වන්නේ කෙසේ ද? සැබෑ ලෙස සමාජය තුළ තොරතුරු ක්‍රියාත්මක වන්නේ කෙසේ ද? යන ප්‍රශ්නවලට ලැස්වේලියානු ජනසන්නිවේදන සමාජ විද්‍යාව තුළ විසඳුම් නැත.

මෙම රේඛීය “ සැකිලි ” (රූපසටහන් ) සංකීර්ණ මානව සමාජය තුළ ජනමාධ්‍යවේදයේ, ජනසන්නිවේදනයේ ක්‍රියාකාරීත්වය යථාර්ථවාදී ලෙස පරාවර්තනය නොකරයි. එම රේඛීය සැකිලි හරාත්මක වශයෙන් ගත් කළ සම්භාව්‍ය යාන්ත්‍රික විද්‍යාත්මක සුසමාදර්ශකය තුළ අධිකාරිවාදී පිළිඹිබුවීමකි. සමකාලීන





භෞතික විද්‍යා සුසමාදර්ශකය තොරතුරු සම්ප්‍රේෂණය, ව්‍යාප්තිය පිළිබඳ ක්‍රියාවලියේ රේඛීය සංකල්පය ප්‍රතික්ෂේප කරන අතර ඒ වෙනුවට සමස්තිය, ගතික, බහු අංශයීය, බහුතලමය, චක්‍රීය හා සර්පිලාකාර ස්වභාවයක් ගන්නා බව පෙන්වා දෙයි. මේ අනුව තොරතුරු නැමැති සංකල්පය පමණක් නොව තොරතුරුවල සම්භවය එහි ක්‍රියාකාරිත්වය, විශේෂයෙන්ම එය සමාජය තුළ ක්‍රියාත්මක වන ආකාරය ඉතා සංකීර්ණ රේඛීය, පමණක් නොව නිර්රේඛීය ක්‍රියාවලියක් බව සමකාලීන භෞතික විද්‍යාව මගින් මනාව පෙන්වා දීතිබේ. නිදර්ශන වශයෙන් ක්වොන්ටම්වාදය* (Quantum Theory), සහ ක්‍රියාවාදය ** (Synergism), සහ සත්‍යාන්ත්‍රික විද්‍යාව *** (Cybernetics) පෙන්වාදිය හැකිය.

සමාජය තුළ ක්‍රියාකරී වන තොරතුරු ක්‍රියාවලිය, ලැස්වේලියානු ආකෘතිය මෙන් ව්‍යුහීය ස්වභාවයක් පමණක් නොව එය චක්‍රීය හා ගතික ස්වභාවයක් ගන්නේය. සමාජය තුළ තොරතුරු ගලනය ඒකපාර්ෂවීය නොවන අතර එය ද්වි ප්‍රවණතාත්මක හා නානාප්‍රවණතාත්මක ප්‍රගමනයකි. තොරතුරු ගලායාම කාලය තුළ වර්ධනය වන අතර එය අවම වශයෙන් සිය වර්ධනය තුළ ආරෝහණ, අවරෝහණ සහ නිශ්චලනය වශයෙන් අවස්ථා තුනක් සනිටුහන් කරන බව පෙනේ. මෙහිදී නිශ්චලනය යන්නෙන් අදහස් වන්නේ වෙනස්වීමකින් තොරව තොරතුරු එකම මට්ටමක ක්‍රියා කිරීමයි.

ඉහත සඳහන් කරන ලද ක්‍රමවේදී ප්‍රවණතාවන්ගේ ආභාසය ලබමින් ජනසන්නිවේදන ක්‍රියාවලින් සහ ජනමාධ්‍යවේදය විශේෂයෙන් ම ඒවායේ සමාජ විද්‍යාත්මක අංශය වර්ධනය කර ගත යුතුව ඇත.

එක් අතකින් මුළු සමාජයෙහිම ග්‍රාහකත්වය සමස්තයක් වශයෙන් සලකා බැලීම ජනමාධ්‍යවේද සමාජ විද්‍යාවේ මූලික කර්තව්‍යකි. ග්‍රාහකත්ව සමස්තය ජනමාධ්‍යවේදයේ ක්‍රියාකාරීත්වයේ ආරම්භක යාන්ත්‍රණය වශයෙන් ද, තොරතුරුමය අන්‍යොන්‍ය ක්‍රියාකාරීත්වයේ වේදක වශයෙන් ද ක්‍රියා කරයි. සමාජය තුළ ආරම්භක

* වර්තමාන භෞතික විද්‍යාවේ අංශයක් වන මෙය මගින් ක්ෂුද්‍ර ලෝකයේ වස්තුවල ප්‍රගමනයේ නියාමයන් අධ්‍යනය කරනු ලබයි.

** පද්ධතිවල ස්වයංසංවිධානය සහ ස්වයංවර්ධන ක්‍රියාවලියේ පදනමේ ඇති පොදු නියාමයන් අධ්‍යයනය කරනු ලබයි.

*** සංකීර්ණ පද්ධතිවල තොරතුරු පාලනය, නියාමනය, සහ සම්ප්‍රේෂණ ක්‍රියාවලිය පිළිබඳ නියාමයන් අධ්‍යයනය කරයි.

යාන්ත්‍රණය වශයෙන් දේශපාලන, ආර්ථික, සමාජීය, ආධ්‍යාත්මික හා ජෛව විද්‍යාත්මක තත්ත්වයන් මගින් තත්ත්වාරෝපිත කරනු ලබන තොරතුරු සඳහා වූ අවශ්‍යතාව ඉදිරිපත් වෙයි. අනෙක් අතින් මනෝමූලිකකරණයට ලක් වූ අවශ්‍යතාවන් ජනමාධ්‍යවේදය සඳහා ආරම්භක යාන්ත්‍රණය වශයෙන් ඉදිරිපත් වෙයි. මේ අනුව ජනමාධ්‍යවේදයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධ ප්‍රවණතා දෙකක් පිළිබඳව කතා කළ හැකිය. ඉන් පළමුවැන්න වන්නේ සමාජයේ දේශපාලන, සමාජීය, ආර්ථික, ජෛව විද්‍යාත්මක හා ආධ්‍යාත්මික අවශ්‍යතාවන් මගින් ජනනය කරනු ලබන සමාජ කේන්ද්‍රිය ප්‍රවණතාව වන අතර දෙවැන්න වන්නේ ග්‍රාහකත්වයේ සමාජීය වුවමනාවන් මගින් ජනනය කරනු ලබන ග්‍රාහක කේන්ද්‍රිය ප්‍රවණතාවයි.*

ජනමාධ්‍යවේදයේ විෂය ව්‍යුහය සහ එහි ස්වභාවය පිළිබඳ සැලකීමේදී එය ඉතා ගතික, නම්‍යශීලී, බහුත්වවාදී, සංශ්ලේෂීය යාන්ත්‍රික ඒකාබද්ධතා සමස්තියත්වයක් හා ගතික සමතුලිතභාවයක් දරන්නා වූ මානව සමාජ ක්‍රියාකාරීත්වයේ සංයුක්ත කොටසකි. ප්‍රකාශයට පත් කරන ලද තොරතුරු මාධ්‍ය විචාරයේ මූලිකතම ක්ෂේත්‍රය වශයෙන් ඉදිරිපත් වෙයි. අඛණ්ඩව තොරතුරු සැපයීමේ මූලාශ්‍ර අධ්‍යයනය හා ගවේෂණය කිරීම ජනමාධ්‍ය විචාරයේ ප්‍රධාන කර්තව්‍ය වන්නේය.

සමාජ යථාර්ථය අනුකරණාත්මකව පරාවර්තනය කිරීම නොව, ජනමාධ්‍යවේදියාගේ නිර්මාණාත්මක ශක්‍යතාව සහ මානසික සංයෝජනය ද සහිතව යථාර්ථය නිර්මාණාත්මකව ගොඩනැ-ීම ජනමාධ්‍යකරණයේ සුවිශේෂ ලක්ෂණයකි.

අද්‍යතන ජනමාධ්‍යවේදයේ දෘෂ්මිමය, දේශපාලනික සහ සමාජ සංස්කෘතිකමය නැඹුරුතාව එකිනෙකට වෙනස් වේ.

ජනමාධ්‍යවේදියා තුළ පවතින්නා වූ වෘත්තිමය, නිර්මාණාත්මක ප්‍රතිමාන හා ඇගයීම් ක්‍රම අනුව පමණක් නොව ඔහු දරන සමාජ - දේශපාලනික මතවාද අනුව ද සිය නිර්මාණය සඳහා තෝරා ගන්නා විෂය වස්තු වෙනස් වේ. මෙහි ප්‍රතිඵලය වන්නේ යථාර්ථය කොටස් වශයෙන් පරාවර්තනය කිරීමයි. ජනමාධ්‍යවේදය හා ජනමාධ්‍ය විචාරය සතු මේ බහුත්වවාදී ස්වරූපය නිසා සමාජ සත්‍ය පිළිබඳ ගැටලුව සංකීර්ණ වන්නේය. ජනමාධ්‍ය විචාරය යථාර්ථයට දක්වන

* L.G. Svitich, 2000, Phenomenon of Journalism,Moscow ;





සාදෘශ්‍යතාව පැහැදිලි කර ගන්නා අතර සමාජ යථාර්ථය ප්‍රජානනය කර ගනී. ජනමාධ්‍යවේදයේ සමාජ යථාර්ථය ජනමාධ්‍ය විචාරය මගින් නිර්ණය කරයි. ජනමාධ්‍යවේදය මගින් පිළිබිඹු කරනු ලබන ක්‍රියාවලීන්, ප්‍රපංචයන් හා සිද්ධීන් කොතෙක් දුරට සැබෑ සමාජ ප්‍රපංචයන් සම- සමපාත වන්නේ ද යන කාරණාව මත ජනමාධ්‍යවේදයේ සමාජ යථාර්ථය නිර්ණය වේ.

ජනමාධ්‍යවේදියා කොතෙක් දුරට ග්‍රාහකයින්ගේ සමාජ, ආර්ථික,දේශපාලනික, සංස්කෘතික, මානසික තත්ත්වයන් පිළිබඳ වැටහීමකින් යුතුව සිය ජනමාධ්‍යකරණයෙහි යෙදෙන්නේ ද යන සාධකය මත ඔහු ග්‍රාහකයින්ට ඉදිරිපත් කරන තොරතුරුවල සඵලතාව රඳා පවතින්නේය.

ග්‍රාහකයා පමණක් නොව ජනමාධ්‍යවේදියා ද ජීවත් වන්නේ සමාජ සබඳතාවන්ගෙන් නිර්මිත සංකීර්ණ පරිස්ථිතියක් තුළ බව ද සැලකිල්ලට ගත යුතු යථාර්ථයකි. එසේම සන්නිවේදන මාධ්‍යයන්ගේ නිරන්තරව සිදු වන ප්‍රමාණාත්මක හා ගුණාත්මක වර්ධනයන් ද ජනමාධ්‍යවේදියා හා ග්‍රාහකයා අතර සබඳතාවල ස්වරූපය වෙනස් කිරීමට පමණක් නොව ජනමාධ්‍යවේදය පොදුවේ සමාජයට දක්වන සබඳතාව වෙනස්වීමට සැලකිය යුතු බලපෑමක් කරන බව පෙන්වා දිය යුතුය.

එසේම ජනමාධ්‍යවේදය හා සමාජය අතර පවතින අන්‍යෝන්‍ය සම්බන්ධතාව පමණක් නොව මාධ්‍යය හා පණිවිඩය අතර ඇති සබඳතාව කෙරෙහි ද විශේෂ අවධානය යොමු විය යුතු බව මාෂල් මැක්ලුහන්ගේ “ මාධ්‍යම පණිවුඩය වේ ” හෝ “ මාධ්‍යම සන්දර්භය වේ ” (Medium is the message)* යන සංකල්පීය ප්‍රවේශයෙන් ගම්‍යමාන වේ. ලෝකය සංජානනය කර ගැනීමේ හා තොරතුරු සම්ප්‍රේෂණ කිරීමේ ස්වරූපය හැඩගැස්වීමට තාක්ෂණික මාධ්‍යය සතු ශක්‍යතාව හා පොදුවේ මාධ්‍ය තොරතුරු සම්ප්‍රේෂණයේ ගතිලක්ෂණ ව්‍යුහගත කරමින්, මාධ්‍ය, තොරතුරුවල ස්වරූපයට පමණක් නොව එය තොරතුරුවල සන්දර්භයට ද බලපාන්නේය. මාධ්‍යය වෙනස්වීමට අනුව තොරතුරුවල ගතිලක්ෂණ හා ලෝකය සංජානනය කරගනු ලබන ආකාරය වෙනස් වන්නේය.

ධනවාදයේ වර්ධනයත් සමගම සංස්කෘතිය හා ජනමාධ්‍යවේදය ඇතුලු ආධ්‍යාත්මික සමාජ ජීවිතයේ සියලුම ක්ෂේත්‍ර ප්‍රාග්ධනයේ නියමයන්ට නතුවීම නිසා සමස්ත මානව සබඳතා තිරණාත්මකව් පර්යාසයකට ලක් විය. ප්‍රාග්ධනයේ

* M. Mchuhan, Myth and Mass Media Daefalus, 1959 Vol. 88, P. 2;

ගෝලීයකරණය සංස්කෘතිය ඇතුලු සම්භාව්‍ය ජනමාධ්‍යවේදය සිය පැරණි ස්වරූපයෙන් අවසානය කරා ගෙන ගියේය.

ජනමාධ්‍යවේදය වෙළඳපොළ නියමයන්ට අනුව ක්‍රියාත්මක වීම හේතු කොට ගෙන එය වෙළඳ භාණ්ඩ සතු ගුණාංග අත්පත් කර ගත්තේය. මේ නිසා ජනමාධ්‍යවේදයේ කක්ෂයට අසුවන සියලු ක්ෂේත්‍ර වෙළඳපොළක් බවට පරිවර්තනය කර ගැනීම අද අප ඉදිරියේ ඇති යථාර්ථයකි. මේ තත්ත්වය සමාජය තුළ තොරතුරු හා ජනමාධ්‍යවේදයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධව වැදගත් ප්‍රවණතා දෙකක් ජනිත කොට ඇත. එක් අතකින් තොරතුරු හා ජනමාධ්‍යවේදයේ භූමිකාව සමාජ ජීවිතය තුළ, වර්ධනය වන අතර සමාජීය හා පුද්ගලික ජීවිතයේ සියලුම ක්ෂේත්‍ර ජනමාධ්‍යකරණයට (Mediatization)* ලක් වෙමින් පවතියි. අනෙක් අතින් තොරතුරු තාක්ෂණයේ හා සන්නිවේදන මාධ්‍යයන්ගේ තාක්ෂණික වර්ධනය නිසා සමාජය තුළ නිර්ජනමාධ්‍යකරණය (Demediatization) ** ප්‍රවණතාවක් මතුපිමින් විද්‍යාමාන වන්නේය.

නමුත් මේ ප්‍රවණතා දෙක වෙන වෙනම නොව ඒකීය සමස්තයක් හැටියට වර්ධනය වන බව සැලකිය යුතුවේ. මෙය අද්‍යතන සමාජ ජීවිතය කෙරෙහි සිදු කරන බලපෑම අතිවිශාල වන අතර වර්තමාන ජනමාධ්‍යවේද සමාජ විද්‍යාව මෙම ප්‍රවණතා අධ්‍යයනය කිරීම සඳහා සිය අවධානය යොමු කළ යුතු වන්නේය.

මේ අනුව ජනමාධ්‍යවේදය සමාජ විද්‍යාවේ රාමුව තුළ පමණක් නොව එය විවිධ විද්‍යාවන්ගෙන් පෝෂණය ලබමින් අන්තර්විෂයික හා බහුවිෂයික ප්‍රවණතාවක් වශයෙන් නිරන්තරවම වර්ධනය වෙමින් මානව සමාජය තුළ සිය අනන්‍යතාව සහ ආධිපත්‍යය ගොඩන-මින් ක්‍රියාත්මක වන බව දක්නට ලැබේ.

* J. Habermas, 1987, The Theory of Communicative Action Oxford, Cambridge, Vol 2 ;

** A. Toffler, , 1980, The Third Wave, N 1;





# 1

# ජනමාධ්‍යවේදයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ සමාජ විද්‍යාත්මක ප්‍රවේශය

**මිටියුඩර් වීරසිංහ**

ජනමාධ්‍යවේදය හා ජනමාධ්‍යවේදියා සඳහා සමාජ විද්‍යාවේ මූලධර්මයන්, එහි කාර්යභාරයන්, ක්‍රමවේදයන් ඉතා වැදගත් වේ. සමාජ විද්‍යාවේ මූලධර්ම හා එහි කාර්යයන් නොදැන මෙන්ම සමාජ විද්‍යාවේ ක්‍රම හා විධි හැඳින නොගෙන අද්‍යතනයේ දී උසස් මට්ටමේ විශේෂඥයෙකු බවට පත් විය නොහැකිය. විද්‍යාත්මක දැනුමේ ක්ෂේත්‍රයක් වශයෙන් සමාජ විද්‍යාව ජනමාධ්‍යවේදය අතර කොපමණ වෙනස්කම් තිබුනත් වෘත්තියමය - ප්‍රායෝගික ක්‍රියාකාරිත්වයේ ක්ෂේත්‍රයක් වශයෙන් සමාජ විද්‍යාව හා ජනමාධ්‍යවේදය අතර බොහෝ සමානකම් දක්නට ලැබේ. ජනමාධ්‍යවේදය හා සමාජ විද්‍යාව යන විෂයන් දෙකම සමාජ විද්‍යා ක්ෂේත්‍රයට අයත් වන්නේය. අද්‍යතන සමාජ ජීවිතය පරාවර්තනය කරන්නා වූ වඩාත්ම වැදගත් ස්වරූප දෙකක් ලෙස ජනමාධ්‍යවේදය හා සමාජ විද්‍යාව හැඳින්විය හැකිය.

සමාජ ජීවිතයේ සියලුම වැදගත් තත්ත්වයන් පිළිබඳව විද්‍යාත්මක දැනුම ලබා ගැනීමේදී ජනමාධ්‍යවේදයට වඩා සමාජ විද්‍යාව වැදගත් වේ. සමාජ විද්‍යාවේදී විද්‍යාත්මක දැනුම ලබා ගැනීමේදී වඩාත් අධිනිශ්චය වන්නේ පර්යේෂණාත්මක හා ප්‍රජානනාත්මක කාර්යයන්ය. එහි ප්‍රධානතම කර්තව්‍ය වන්නේ

සමාජ විද්‍යාත්මක නියාමයන් හා නියමානුකූලතාවන් ස්ථාපිත කිරීමයි. ජනමාධ්‍ය වේදය සඳහා වඩා වැදගත් වන්නේ මතවාදී හා ඍජු සංවිධානමය කාර්යන් හරහා සමාජීය අනුස්ථාපන ක්‍රියාවලිය කෙරෙහි බලපෑමයි.[1] මෙහිදී ජනමාධ්‍යවේදියා සඳහා පර්යේෂණාත්මක කාර්ය වැදගත් වන්නේ තොරතුරු සන්නිවේදනාත්මක හා සමාජ අනුස්ථාපන කාර්යන් ක්‍රියාවෙහි යෙදවීමේ මාධ්‍යයන් හෝ ආකාරයන් වශයෙනි. මේ කර්තව්‍යයන් සමාජ විද්‍යාඥයා සඳහා ද වැදගත්වේ. අවසාන වශයෙන් බලන කල ජනමාධ්‍යවේදියාගේ හා සමාජ විද්‍යාඥයාගේ වැඩවල කාර්යක්ෂමතාව තීරණය වන්නේ ඒවා කොතෙක් දුරට සමාජ ක්‍රියාවලීන් කෙරෙහි ධනාත්මක බලපෑමක් සිදු කරන්නේ ද යන කරුණ මතය. සමාජ ප්‍රපංච හා ක්‍රියාවලීන් පිළිබඳ අනාවැකි පළ කිරීමට සමාජ විද්‍යාත්මක දැනුමට හැකියාවක් ඇත. සමාජය තුළ සිදුවන කාලීන ප්‍රතිසංස්කරණ කෙරෙහි බලපෑමට ජනමාධ්‍ය වේදී නිර්මාණවලට හැකියාවක් තිබේ. එසේම දීර්ඝ කාලීන පර්යාවලෝකනයන් කෙරෙහි බලපෑමක් ඇති කිරීමට ජනමාධ්‍යවේදාත්මක නිර්මාණවලට හැකිය. එදිනෙදා සමාජ ජීවිතයේ සිදුවන ක්‍රියාදාමයන් කෙරෙහි නිරන්තර අවධානයෙන් සිටීම තුළින් ජනමාධ්‍යවේදීන් ලබන අද්විතීය අත්දැකීම නිසා ඔවුන් සමාජ විද්‍යාඥයින්ගේ ආර්ථික විද්‍යාඥයින්ගේ හා දේශපාලන විද්‍යාඥයින්ගේ තත්ත්වයට සමීප වන්නේය.[2] එසේම වැදගත් රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදන කටයුතු සඳහා ජනමාධ්‍යවේදීහු දායක වෙති. මානවවාදී නැඹුරුව, සමාජ වගකීම, පුරවැසි සංවේදීතාවන් හා විශ්වසනීය හා සහේතුක තොරතුරු ලබා ගැනීමට දරන ප්‍රයත්නය ආදිය ජනමාධ්‍යවේදියාගේ හා සමාජ විද්‍යාඥයාගේ ක්‍රියාකාරීත්වයේ පොදු මූලධර්ම වේ.

ජනමාධ්‍යවේදියාගේ හා සමාජ විද්‍යාඥයාගේ ක්‍රියාකාරීත්වය යොමුව පවතින්නේ කාට ද යන ප්‍රශ්නයේදී මේ දෙපාර්ශවය අතර සමහර වෙනස්කම් දක්නට ලැබේ. ජනමාධ්‍යවේදයා සිය නිර්මාණ ඉදිරිපත් කරන්නේ පොදු ජන ග්‍රාහකයින්ට වන අතර ඔහුගේ මුළු අවධානයම යොමු වී පවතින්නේ පොදු ජන ග්‍රාහකයින් වෙතය. ජනමාධ්‍යවේදියාගේ විශේෂ අවධානය ජනමතය වෙත යොමුව පවතියි. සමාජ විද්‍යාඥයාගේ නිර්මාණවල පාරිභෝගිකයන් වන්නේ සමාජයේ විවිධ ක්ෂේත්‍ර පිළිබඳ වැදගත් තීරණ ගන්නා විශේෂඥයින්ය.[3] නමුත් ජනමතය දැනුවත් කිරීම සමාජ විද්‍යාඥයා සඳහා ඉතා වැදගත් වන්නේ ස්වයං ප්‍රජානනය සමාජය සඳහා අත්‍යවශ්‍ය බැවිනි. පුවත්පත් ස-රා, ගුවන් විදුලිය, රූපවාහිනිය සමාජ විද්‍යාඥයා සඳහා එවැනි හැකියාවක් ලබා දෙයි. ග්‍රාහකයා හා සමාජ විද්‍යාඥයා අතර අතරමැදියකු ලෙස ජනමාධ්‍යවේදය ඉදිරිපත් වන්නේ සමාජ





විද්‍යාත්මක ආලෝකනය හා සමාජ විද්‍යාත්මක සාක්ෂරතාව ග්‍රාහකයාට ලබා දෙමිනි. මෙවැනි කාර්යක් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා සමාජ විද්‍යාව පිළිබඳ මනා දැනුමක් පමණක් නොව සමාජ විද්‍යා දැනුම ජනමාධ්‍යවේදී භාෂාවෙන් ග්‍රාහකයින් සඳහා ඉදිරිපත් කිරීමේ දක්ෂතාවක් ද ජනමාධ්‍යවේදියා තුළ තිබිය යුතුය. සමාජ විද්‍යාත්මක තොරතුරු ජනමාධ්‍යවේදාත්මක තොරතුරු බවට පරිවර්තනය කළ යුතුය. එසේ සමාජ විද්‍යාත්මක සාධක හා දත්ත විශ්ලේෂණය කිරීමට හා අර්ථකථනය කිරීමට ජනමාධ්‍යවේදියා සමත් විය යුතුය.

වර්තමාන සමාජයේ පවතින පංති ස්ථර කණ්ඩායම් ආදී එහි සියලුම සංයුක්ත කොටස් හා ඒවා අතර අන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්වයේ දී ඇති වන සමාජීය වුවමනාවන් එක් අතකින් සමාජ විද්‍යාඥයාටත් අනෙක් අතින් ජනමාධ්‍යවේදයටත් වැදගත් වන්නේය. සමාජ ක්‍රියාවලීන් ප්‍රතිරෝධතාවන්, ගැටලු ජනමාධ්‍යවේදියාගේ මෙන්ම සමාජ විද්‍යාඥයාගේ ගවේෂණයට ලක් වන විශේෂ පරාසයන් වශයෙන් හැඳින්විය හැකිය. තොරතුරු එකතු කිරීම,මිනිසුන් හඳුනා ගැනීම, ලියකියවිලි විශ්ලේෂණය කිරීම, වාර්තා විමර්ශනය කිරීම, විවිධ අවස්ථාවන් නිරීක්ෂණය කිරීම, සමාජ විද්‍යාඥයාට මෙන්ම ජනමාධ්‍යවේදියාට ද එකසේ පොදු ක්‍රියාකාරකම්ය. විවිධ සමාජ කණ්ඩායම්, පුද්ගලයින්ගේ ක්‍රියාකාරකම්, ඒ හෝ මේ සමාජය සාධකයන් පිළිඹිබු කරන්නා වූ සමාජ සත්තතාවේ විෂයමූලික ගතිලක්ෂණ මෙන්ම ජනමතය, වුවමනාවන්, ඇගයීම්, සබඳතාවන් හා අනුස්ථාපන ස්වරූපයන් පරාවර්තනය කරන්නා වූ මනෝමූලික ප්‍රවණතා ද ජනමාධ්‍යවේදියාගේ හා සමාජ විද්‍යාඥයාගේ දෘෂ්මි පතයට හසුවේ.

සමාජ විද්‍යාඥයා මූලික වශයෙන් සැලකිල්ලක් දක්වන්නේ සමාජ කණ්ඩායම් හා සමාජ ප්‍රජාවන්ට අදාළ පොදු සංඛ්‍යාන විද්‍යාත්මක සාධක, විෂයන් හා ක්‍රියාවලින් පිළිබඳවය. මීට සරිලන ලෙස සමාජ විද්‍යාඥයා තොරතුරු එක්රැස් කරගැනීම සඳහා පොදු සංඛ්‍යාන විද්‍යාත්මක ක්‍රම භාවිතයට ගනී. දත්ත රැස් කිරීම, ජනමත විමසීම්, සංගණන, ප්‍රශ්නාවලි හා ලේඛන, නියැදි ආදිය ඒ අතර වෙයි. ජනමාධ්‍යවේදියා සිය කරුණු හා දත්ත සමග කටයුතු කිරීමේදී සමාජ විද්‍යාත්මක සීමාවෙන් ඔබ්බට ඔහුගේ අවබෝධය යා යුතුය. ඒ සඳහා දැනටම තිබෙන සමාජ විද්‍යාත්මක දත්ත හා තොරතුරු මූලාශ්‍ර එකිනෙක සසඳමින් හා විග්‍රහ කරමින් තමන්ගේම ගවේෂණයක නියැලීමට ජනමාධ්‍යවෙදියාට සිදු වේ. මෙය බොහෝ විට සමාජ විද්‍යාත්මක ගවේෂණයක ස්වරූපයට සමීප විය හැකිය.

නමුත් ජනමාධ්‍යවේදියාගේ පර්යේෂණ කටයුතු ඉහත කී නිල, පිළිගත්, ප්‍රමිතිගත ක්‍රමවලට පමණක් සීමා නොවේ. ඔහු ඉන් ඔබ්බට ගොස් විවිධාකාර ක්‍රම හා විධිවලට අවශ්‍ය තොරතුරු එකතු කර ගනී. නොනිල සම්මුඛ සාකච්ඡා, නිදහස් නිරීක්ෂණය, නිල නොවන පුද්ගලික ඇසුර, ආදිය ඒ අතර වෙයි. සමාජ විද්‍යාව සමාජීය ප්‍රපංචයන්ගේ හා ක්‍රියාදාමයන්ගේ විෂයමූලික නියාමයන් අනාවරණය කිරීම කෙරෙහි සිය මූලික අවධානය යොමු කරයි. නමුත් ජනමාධ්‍යවේදියා එවැනි කටයුතු කෙරෙහි සිය විශේෂ අවධානය යොමු නොකරයි. ජනමාධ්‍යවේදය එම පොදු නියමයන් සක්‍රිය වීමේ පුද්ගලබද්ධ, මනෝමූලික හා අන්තර් මනෝ මූලික තත්ත්වයන් වෙත සිය විශේෂ අවධානය යොමු කරයි.

සම්පත්දායකයින් තෝරා ගැනීම, සම්මුඛ සාකච්ඡාවට සූදානම් වීම, විශ්වසනීයව හා ප්‍රශස්තව තොරතුරු ලබා ගැනීම සඳහා ප්‍රශ්න නිර්මාණය කරන ආකාරය ආදී ක්‍රමවේදී හැකියාවන් හා ශිල්පීය නිපුණතාවන් පිළිබඳ ගැටලුවලදී ජනමාධ්‍යවේදියාට සමාජ විද්‍යාව කෙරෙහි අවධානය යොමු කිරීම අවශ්‍ය වන්නේය.

සමාජ විද්‍යාඥයාගේ හා ජනමාධ්‍යවේදියාගේ ප්‍රවේශයන් එකිනෙක අන්‍යොන්‍ය වශයෙන් පරිපූර්ණය කරයි. මෙම වෘත්තීන් දෙකටම අදාළ වන්නාවූ ප්‍රකට සීමා අතික්‍රමණය කිරීම සඳහා ඉහත කාරණය වැදගත්වේ. මේ තුළින් මිනිසුන්ගේ සමාජ ජීවන ක්‍රියාකාරිත්වය පිළිබඳ බොහෝ දුරට පරිපූර්ණ චිත්‍රයක් නිර්මාණය කිරීමට හැකිවේ. සමාජ විද්‍යාඥයා විසින් අධ්‍යයනය කරන ලද සංඛ්‍යාන විද්‍යාත්මක දත්ත හා සොයා ගන්නා ලද නියමානුකූලතාවන් පිළිබඳ දැනුම, සමාජ ජීවිතයේ විවිධ ස්වරූප හඳුනා ගැනීම සඳහා ජනමාධ්‍යවේදියාට වැදගත් වේ.

ජනමාධ්‍යවේදියාගේ කටයුතු සාර්ථකව හා කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා සමාජ විද්‍යාත්මක චින්තනය ප්‍රගුණ කිරීම ඉතා වැදගත්වේ.[4] අඩු වැඩි වශයෙන් සාපේක්ෂ සංවෘත්ත සමස්තයක් ලෙස එකට ඒකාබද්ධ වී ජීවත් වන විශාල මිනිසුන් සංඛ්‍යාවකගේ ඒකරාශිවීම සමාජයක් ලෙස හැඳින්විය හැකිය. සමාජයේ ජීවත්වන සාමාජිකයින්ගේ ක්‍රියාකාරිත්වය ප්‍රතිනිෂ්පාදනයවීම තුළ අදාළ සමාජයේ සංවෘත්තභාවය සහ සමස්තියත්වය සැලකිය යුතු කාලයක් ආරක්ෂා වී පවතියි. මානව සංහතියේ ඉතිහාසය යනු සමාජයන්ගේ සම්භවයේ, පැවැත්මේ, වෙනස්වීමේ, බිඳ වැටීමේ, සංඝට්ටනයවීමේ, මිශ්‍රවීමේ අන්‍යෝන්‍ය බලපෑමේ ඉතිහාසයයි. එක් සමාජයක ඉතිහාසය මුළු මානව සංහතියේ ඉතිහසාය සම-





සමපාත නොවේ. එක් සමාජයක ඒකීයත්වය යන අදහසින් මානව සංහතියේ එකීයත්වය පිළිබඳව කථා කළ නොහැකිය.

සමාජය පිළිබඳව ඉහත දක්වන ලද දැක්ම තුළින් සමාජය යනු ගතිකව සංවර්ධනය වන්නා වූ පද්ධතියක් මෙන්ම සමස්තීය ජීව දේහයක් යන අදහස ව්‍යුත්පන්න වේ.

අධ්‍යයනයට හා නිරීක්ෂණයට පාත්‍ර වන වස්තුව හෝ ක්‍රියාවලිය පරමාදර්ශීකරණය කිරීම හා එය ක්‍රමික විශ්ලේෂණයකට භාජනය කිරීම මත පාදක වූ සමාජ විද්‍යාත්මක චින්තනය විද්‍යාත්මක ගුණයෙන් යුක්තය. සමාජ ක්‍රියාවලින් හා ප්‍රපංචයන් පුළුල් පරාසයක්, ව්‍යුහයක් මෙන්ම සබඳතාවක් තුළ තබමින් එහි ඉතිහාසය, සංවර්ධනය, කර්යභාරය හේතුඵල සබඳතාවක් තුළ විශ්ලේෂණය කිරීම සමාජ විද්‍යාත්මක චින්තනයේ මූලික ගතිලක්ෂණයකි.[5] ජනමාධ්‍යවේදියාගේ වෘත්තීය ක්‍රියාකාරිත්වයේ දී සමාජ විද්‍යාත්මක ප්‍රවේශය, සමාජ විද්‍යාත්මක චින්තනය විශාල වැදගත්කමක් උසුලයි. අද්‍යතන සමාජයේ පොදු ජන තොරතුරු ක්‍රියාවලිය, එහි හරය, කාර්යභාරය හා එය සමාජ ජීවිතය තුළ දරන ස්ථානය පිළිබඳ නිවැරදි හා යථාර්ථවාදී අවබෝධයක් ඇති කර ගැනීම සඳහා ජනමාධ්‍යවේදියාට සමාජ විද්‍යාත්මක ප්‍රවේශය ඉතා වැදගත් වන්නේය. වර්තමාන සමාජයේ සංයුක්ත කොටස් වන විවිධ සමාජ කණ්ඩායම්, පංති, ස්ථර, පුද්ගලයන් ආදී සමාජ ව්‍යුහයන් නිරන්තරව විචලනයන්ට හා විපර්යාශයන්ට ලක්වේ. මෙම සමස්ත සමාජ පද්ධතිය තුළ සිදු වන වෙනස්වීම් දැන හඳුනා ගැනීම ජනමාධ්‍යවේදියාට අතිශය වැදගත්ය. එය සමාජ විද්‍යාවේ සහයෝගයෙන් තොරව කළ නොහැකිය. ජනමාධ්‍යවේදියාගේ ක්‍රියාකාරිත්වයේ විවිධ අවධිවලදී සමාජ විද්‍යාත්මක ප්‍රවේශය, එම විද්‍යාවේ දත්ත, ක්‍රම සහ විධි කාර්යක්ෂමව යොදා ගත හැකිය.

අද්‍යතන සමාජය තුළ ක්‍රියාත්මක වන වෙළඳ පොළ හා දේශපාලන බල ව්‍යුහයන් තුළ ජනමාධ්‍යවේදයේ ක්‍රියාකාරිත්වය හා කාර්යක්ෂමතාව ප්‍රතිඵලදායකව සිදු වීමට සමාජ විද්‍යාත්මක අධ්‍යයනයන් අත්‍යවශ්‍යවේ. වර්තමාන සමාජයේ පුවත්පත්, ස-රා, ගුවන් විදුලිය හා රූපවාහිනිය ක්‍රියාත්මක වන්නේ වාණිජ හා දේශපාලන බල අධිකාරි ව්‍යුහයන් තුළය. ධනවාදී සමාජයේ සියලුම ක්ෂේත්‍ර මෙන්ම ජනමාධ්‍යවේදය ද ක්‍රියාත්මක වන්නේ ප්‍රාග්ධනයේ නියමයන්ට යටත්වය. කියන දේවල් ලාභය ගෙනදීමට හේතු වන්නේ නම් මිනැම දෙයක් කිව හැකිය. මෙය

ජනමාධ්‍යයේ වෙළඳපොළ ආකෘතිය වශයෙන් හැඳින්විය හැකිය.[6] ඒ නිසා ජනමාධ්‍යවේදය තුළ සිදු වන බොහෝ විචලයයන් තේරුම්ගත හැක්කේ දේශපාලන ආර්ථික විද්‍යාත්මක දෘෂ්ටි කෝණයකිනි. මෙම තත්ත්වය යටතේ තොරතුරු වෙළඳ පොළ තුළ තරඟකාරිත්වය වර්ධනයවේ. මෙහිදී විවිධ වැඩසටහන් සඳහා වෙළඳ පොළ අවශ්‍යතා සොයා බැලීම වැදගත්වේ. මේ සඳහා ද සමාජ විද්‍යාත්මක පර්යේෂණ ක්‍රම මුලිකව, වෙළඳ පොළ සමීක්ෂණ සිදු කළ යුතුය. ග්‍රාහකයින්ගේ අවශ්‍යතා හා වුවමනාවන් අධ්‍යයනය කිරීම, විශේෂයෙන්ම විවිධ සමාජ ස්ථර, කණ්ඩායම්වල හා පුද්ගල අවශ්‍යතාවන් හා වුවමනාවන් අධ්‍යයනය කිරීමට සමාජ විද්‍යාව අවශ්‍යවේ. ග්‍රාහකයින් තුළ සිදුවන වෙනස්කම් හඳුනා ගැනීම ජනමාධ්‍යවේදීන්ට අන් සියල්ලටම වඩා වැදගත්ය. ශක්‍යතා ග්‍රාහකත්වයේ විෂමතාවන් වන විවිධ සමාජ කණ්ඩායම්, විවිධ වර්ගයේ කණ්ඩායම් ඒ අතර වයස, ජාතිකත්වය, අධ්‍යාපනය, ආගම, ආර්ථික තත්ත්වය, පවුල් තත්ත්වය හා ද්‍රව්‍යමය තත්ත්වය ආදිය වැදගත්වේ. ඉහත කණ්ඩායම්වල තොරතුරු අවශ්‍යතාවන් සහතික කිරීම සඳහා තොරතුරු අලෙවිකරණය පිළිබඳව අවධානය යොමු කළ යුතුය.

ජනමාධ්‍යවේදය සඳහා නිශ්චිත වැඩසටහන් සම්පාදනය කිරීමේදී ජනමාධ්‍යවේදීන්ට සමාජවිද්‍යාත්මක දත්ත අවශ්‍ය වන්නේය. මෙය අදාළ වැඩසටහනේ අරමුණු නිශ්චය කර ගැනීමට අවශ්‍ය මූලික තොරතුරු විය හැකිය. මෙහිදී දැනටමත් සොයාගෙන තිබෙන සමාජ විද්‍යාත්මක සමීක්ෂණ තොරතුරු කෙරෙහි අවධානය යොමු කිරීම ප්‍රතික්ෂේප නොකළ යුතුය. එම තොරතුරු අතර යම් කිසි එක් වැඩ සටහනකට පමණක් සීමා වූ වැදගත්කමක් සහිත තොරතුරු පමණක් නොව, පොදු ජන තොරතුරු ක්ෂේත්‍රයේ මිනිසුන්ගේ හැසිරීම් රටා අවබෝධ කරගත හැකි වැදගත් මූලික තොරතුරු ඒ අතර විය හැකිය. විවිධ සමාජ කණ්ඩායම්වල, විශේෂයෙන්ම ඉලක්ක කණ්ඩායම්වල ස්ථාවර ගතිලක්ෂණ පිළිබඳ තොරතුරු ඒ අතර තිබිය හැකිය. ග්‍රාහකයින්ගේ අභිප්‍රේරණයන්, අවශ්‍යතාවන්, වුවමනාවන් , අපේක්ෂාවන් එසේම විඥානයේ වෙනත් විශේෂතා පිළිබද දැනුම ඊට ඇතුලත් විය හැකිය. අවසාන වශයෙන් ග්‍රාහකයින්ගේ විෂයමූලික සමාජ තත්ත්වයේ ගතිලක්ෂණ පිළිබද දැනුම ද එම තොරතුරු අතර තිබිය හැකිය.

සමාජ විද්‍යාත්මක දත්ත පදනම් කොට ගෙන යම්කිසි වැඩ සටහනක අන්තර්ගතය, ස්වරූපය ආදිය පිළිබඳව ආකල්පයක් ඇති කර ගැනීමට හැකි වේ. නිදර්ශන වශයෙන් තොරතුරු ඉදිරිපත් කළ යුත්තේ කෙසේද ? එනම්,





විවරණ සහිතව ද යන බව, කතුවරුන්ගේ වර්ගය; විවිධ ක්ෂේත්‍රවල විශේෂඥයින් ද, ජනමාධ්‍යවේදීන් ද යන බව, අදාළ සංදේශය යොමු කළ යුතු ග්‍රාහක ප්‍රභේදය, ස්ත්‍රී පුරුෂභාවය, වයස, අධ්‍යාපනය ආදිය යන බව එසේම අදාළ වැඩසටහන් තොරතුරුවල ස්වභාවය සැකැස්ම ආදිය පිළිබඳ ග්‍රාහක ආකල්පය හොඳයි, නරකයි, තේරුම් ගැනීමට අපහසුයි ආදිය මෙම කටයුතු සාර්ථකව සිදු කිරීම සඳහා සමාජ විද්‍යාව පිළිබඳවත් සමාජ විද්‍යාත්මක සමීක්ෂණ සිදු කරන ආකාරය පිළිබඳවත්, එසේම ලබාගත් දත්ත විශ්ලේෂණය හා අර්ථකථනය කිරීම පිළිබඳවත් මනා දැනුමක් ජනමාධ්‍යවේදීන්ට තිබිය යුතුය.

ජනමාධ්‍යවේද සංදේශයක ඇතුළත් කරුණුවල අන්තර්ගතය හැඩගැසීමේදී සමාජ විද්‍යාත්මක ප්‍රවේශය භාවිතයට ගැනේ.[7] ඕනෑම වැඩසටහනක ආරම්භයේ ප්‍රථම දින කීපය තුළදී අදාළ වැඩසටහනට ග්‍රාහකයින් දක්වන ප්‍රතිචාර දැන ගැනීම වැදගත්වේ. මේ කාලය තුළ ග්‍රාහකයන් සමග නිර්මාණය වන ප්‍රතිපෝෂණ සම්බන්ධතාව තහවුරු කර ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. ග්‍රාහකයින් නිශ්චිත අවශ්‍යතාවන්, වුවමනාවන් හා ඉල්ලීම් පිළිබඳව එහිදී වඩාත් අවධානය යොමු කිරීම වැදගත්වේ. වඩාත් සංකීර්ණ සමාජ - දේශපාලන ප්‍රශ්න පිළිබඳව ජනමාධ්‍යවේදියා සිය වැඩසටහන් හෝ ප්‍රකාශන සකස් කිරීමේදී එයට සමාජ විද්‍යාත්මක දත්ත විශ්ලේෂණ යොදා ගැනීම තුළින් ඉතා බලපෑම් සහිත ජනමාධ්‍යවේදී සංදේශ නිර්මාණය කළ හැකිය. සමාජ විද්‍යාත්මක සමීක්ෂණ මගින් සමාජ සත්තතාවේ සක්‍රිය හා දැවෙන ප්‍රශ්න නිතරම වාගේ මතු කර පෙන්වනු ලබයි. එම සමාජ විද්‍යාත්මක සමීක්ෂණ මගින් පෙන්වා දෙන ගැටලු සමාජයේ විවිධ ක්ෂේත්‍ර හා සම්බන්ධ වේ . විවිධ ජනමාධ්‍යවේදීන්ට තම ප්‍රකාශනයේ හෝ වැඩසටහන්වල විශේෂත්වයට සරිලන ගැටලු හා ගැටලුවලට අදාළ දත්ත සමාජ විද්‍යාත්මක සමීක්ෂණ තුළින් ලබා ගත හැකිය. සමාජ විද්‍යාඥයින් මගින් මතු කරන ලද ගැටලු ජනමාධ්‍යවේදාත්මක දෘෂ්ටියකින් ඉදිරිපත් කිරීමට අදාළ ජනමාධ්‍යවේදියා සමත්විය යුතුය. සාමාන්‍යයෙන් ජනමාධ්‍යවේද ආයතනයකට නිතිපතා විවිධ සමාජ විද්‍යාත්මක හා සංඛ්‍යාන විද්‍යාත්මක දත්තයන් ලැබේ. ඒවා ජනමාධ්‍යවේද සංදේශ නිර්මාණය කිරීමේදී අවශ්‍ය ආකාරයට යොදා ගැනීම තුළින් ජනමාධ්‍යවේද නිර්මාණවල කාර්යක්ෂමතාව හා ගුණාත්මකභාවය ප්‍රවර්ධනය වේ.

වර්තමාන ලෝකයේ බොහෝ ජනමාධ්‍යවේද ආයතන තමන්ට අවශ්‍ය සමාජ විද්‍යාත්මක සමීක්ෂණ අදාළ ආයතන මගින් සිදු කර ගනු ලැබේ. එමි-න්

වැඩසටහන්වලට සමාජ විද්‍යාත්මක පදනමක් නිර්මාණය වන්නේය. මෙය ජනමාධ්‍යවේදාත්මක වැඩසටහන්වල දෘෂ්මිමය බලපෑම වර්ධනය වීම කෙරෙහි ධනාත්මක බලපෑමක් සිදු කරයි. එතුළින් අදාළ ගැටලු සම්බන්ධව ශක්තිමත් හා සක්‍රිය ජනමතයක් ගොඩනැගීමට ඉවහල්වේ. විශේෂ වැදගත්කමකින් යුතු සිද්ධි රට තුළ සිදු වන විට මෙවැනි සමාජ විද්‍යාත්මක සමීක්ෂණවල වැඩිවීමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ. පාර්ලිමේන්තු මැතිවරණ, ජනාධිපතිවරණ, ජනවාර්ගික ගැටලුව ආදිය නිදර්ශන වශයෙන් දැක්විය හැකිය. මෙවැනි විශේෂ අවස්ථාවලදී ජන මතයේ උෂ්ණත්වය වේගයෙන් උච්චාවචනය වන්නේය.

රමේ ජනතාව හා රාජ්‍ය කෙරෙහි බලපාන ප්‍රශ්න ජනමාධ්‍යවේදය තුළින් සාකච්ඡා කරනු ලැබේ. මෙහිදී ජනමාධ්‍යවේදයට සුවිශාල හැකියාවක් තිබේ.[8] නමුත් එම හැකියාව අසීමිත නොවන්නේය. ජනමත විවරණයක් මගින් වඩා පුළුල් අන්දමට ජනමතය පිරික්සා බැලිය හැකිය. ජනමාධ්‍යවේදය තුළ සිදු වන සාකච්ඡා, සංවාද කතිකා සාධාරණ මෙන්ම අත්‍යාවශ්‍ය ද වන්නේය. නමුත් එවැනි කටයුතුවල ප්‍රතිඵල වඩාත් සාර්ථක හා කාර්යක්ෂම වීමට නම් ලබා ගන්නා තොරතුරු වඩාත් සප්‍රමාණික හා විශ්වසනීය විය යුතුය. ඒ සඳහා නිවරැදි ක්‍රමවේද හා සංවිධානාත්මක සැලැස්මක් ක්‍රියාවේ යෙදවිය යුතුවේ. සමාජ විද්‍යාත්මක දෘෂ්මිකෝණයට අනුව මෙහිදී වඩාත් වැදගත් අවස්ථාවන් කීපයක් වෙයි. පොදුජන ග්‍රාහකයින් අදාළ ගැටලුව පිළිබඳ දැනුවත් කිරීම මත එහි කාර්යක්ෂමතාව නිර්ණය වේ. දැනුවත් කිරීමේ ස්වරූප හා ක්‍රම විවිධ විය හැකිය. සාකච්ඡාවට බඳුන් වන ගැටලුව සම්බන්ධ වුවමනාවන් ඇති සියලුම පාර්ශවයන්, සමාජ ස්ථර සාකච්ඡාව සඳහා සහභාගී කරගත යුතුවේ.

අදාළ ජනමාධ්‍යවේද ප්‍රකාශනයේ සංස්කාරක මණ්ඩලයට ග්‍රාහකයින් සමග සබඳතා පැවැත්වීමේ ප්‍රශස්ත ආකාරයන් හැමියට ලියුම්, දුරකථන පණිවුඩ, පැමිණ අදහස් ප්‍රකාශ කිරීම ආදිය දැක්විය හැක. ලැබෙන ලියුම් විශේෂ ක්‍රම මගින් පාලනය කොට සමාජයේ විවිධ ක්ෂේත්‍රවල මිනිසුන් අදාළ සාකච්ඡාවලට සහභාගී කරගත යුතුය. සමාජයේ ජීවත් වන උදාසීන කණ්ඩායම් පවා විශේෂ ක්‍රම මගින් සාකච්ඡාව සඳහා පෙළඹවිය යුතුය.

සමහර අවස්ථාවන් හි ජනමාධ්‍යවේදය මගින් මතු කර දක්වනු ලබන ප්‍රශ්න සමාජය තුළ පුළුල් සංවාදයකට, කතිකාවකට ලක් නොවේ. එහි අරුත නම් එම ප්‍රශ්න පුළුල් ජන කණ්ඩායම්වලට එතරම් වැදගත් නොවන නිසාය. සමහර





විට එම ප්‍රශ්න සමාජයේ විවිධ දේශපාලන කණ්ඩායම්වල පටු වුවමනාවක් සමග හා පුද්ගලයින්ගේ පෞද්ගලික ප්‍රශ්න හා සම්බන්ධ විය හැකිය. ඒ නිසා බොහෝ විට එවැනි උත්සාහයන් අසාර්ථක වනු දැකිය හැකිය. සමාජ විද්‍යාඥයින් අවධානය යොමු කරන ප්‍රශ්න පිළිබඳව හෝ ජනමතය විමසීමේ මතුකර ගන්නා ප්‍රශ්න ජනමාධ්‍යවේදය සඳහා සක්‍රීය හා බලපෑම් සහිත තේමාවන් බවට පත් විය හැකිය. ජනමාධ්‍යවේදය වෙළඳ ප්‍රචාරණය සඳහා ද නිතරම පාවිච්චි කරනු ලැබේ. එහිදී ද ජනතාව වෙළඳ දැන්වීම්වලට දක්වන ප්‍රතිචාරය හා එය බලපෑමේ කාර්යක්ෂමතාව මැන බැලීම සඳහා ද සමාජ විද්‍යාත්මක සමීක්ෂණ යොදා ගැනේ.

යම් ජනමාධ්‍යවේද ආයතනයක සංස්කාරක මණ්ඩලයට නිතිපතා ලැබෙන ලියුම් පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතුය. ජනමාධ්‍යවේද ආයතනයකට සමාජ විද්‍යාත්මක සමීක්ෂණ ඒකක හා ග්‍රාහක ප්‍රතිචාර (ලියුම් දුරකථන පණිවුඩ) ක්‍රමාණුකූලව පවත්වාගෙන යාම අතිශය වැදගත්ය. ජනමතයේ හා ජන විඥානයේ තත්ත්වය සංස්කාරක මණ්ඩලයට දැන ගැනීම සඳහා එවැනි ක්‍රමවත් ව්‍යූහයක් ක්‍රියාත්මක වීම අත්‍යවශ්‍ය වේ. සමාජයේ සිදු වන විවිධ සිදුවීම් පිළිබඳව පොදු ජනතාවගේ ප්‍රතිචාරය දැන ගැනීමට එය අත්‍යවශ්‍ය වූවකි. මෙය සමාජ කාලගුණයේ කාලගුණ වාර්තාව වශයෙන් හැඳින්විය හැකිය. සංස්කාරක මණ්ඩලයට යොමු වන ලියුම්, දුරකථන පණිවුඩ එය සංස්කාරක මණ්ඩලය ග්‍රාහකයින් සම- අඛණ්ඩව ඒකාබද්ධ කරන නාලිකාවක් පමණක් නොව එය පොදුජන තොරතුරු ප්‍රවාහයක් ලෙසද සැලකිය යුතු වන්නේය. ග්‍රාහක ලිපිය අද්විතීය පුද්ගලික ලියවිල්ලක් වශයෙන් මෙන්ම ජනමාධ්‍යවේදය සඳහා මිල කළ නොහැකි වටිනාකමක් සහිත සබඳතාවක් වශයෙන් සැලකිය යුතුය. පරිගණක තාක්ෂණය ආධාරයෙන් ග්‍රාහක ලියුම පිළිබඳව සමාජ විද්‍යාවෙහි ගුණාත්මක හා ප්‍රමාණාත්මක ක්‍රම භාවිත කරමින් අන්තර්ගත විශ්ලේෂණයක් සිදු කළ හැකිය. අන්තර්ගත විශ්ලේෂණයේ ප්‍රතිඵල තුළින් අදාළ ජනමාධ්‍යවේදය කෙසේ වෙනස් විය යුතු ද යන වග පිළිබඳව අවබෝධයක් ලබාගත හැකිය.

අද්‍යතනයේ ජනමාධ්‍යවේදයේ සංවිධාන කාර්යභාරය පෙරට වඩා සංකීර්ණ වී තිබේ. ඒනිසා එය සංවිධානාත්මකව සිදු කිරීම අතිශය වැදගත්ය. මෙය කාර්යක්ෂම ප්‍රතිඵල ගෙන දෙන ආකාරයට සංවිධානය කිරීම සඳහා සමාජ විද්‍යාවේ ආධාරය පැතිය හැකිය.

සමාජ සංවිධානමය කටයුතුවලදී ජනමාධ්‍යවේදය සමාජයේ විවිධ

තරාතිරමේ ස්තරවලට සමාජමය වශයෙන් ද, ආර්ථිකමය වශයෙන්ද මානසික වශයෙන්ද ආධාර කරනු දැකිය හැක. මේ අනුව මෙම සංකීර්ණ කාර්ය බහුල සමාජ ජීවිතය තුළ ජනමාධ්‍යවේදය සමාජයේ විවිධ ස්තරවල ජීවත්වන මිනිසුන්ට අවශ්‍ය කරන ප්‍රායෝගික මෙන්ම මානසික මැදිහත්වීම්ද සිදු කරනු ලබයි. මෙම කටයුතු සඳහාද සමාජ විද්‍යාත්මක ක්‍රම ජනමාධ්‍යවේදියාට උදව් වන්නේය.

ජනමාධ්‍යවේද නිර්මාණකරණයේ පුද්ගලික කාර්යක්ෂමතාව සමාජ විද්‍යාත්මක ප්‍රවේශය මගින් සංවර්ධනය කෙරේ. සමාජ විද්‍යාවෙන් තොරව ජනමාධ්‍යවේදියාට එය කටයුතු කරගෙන යා නොහැකිය. ජනමාධ්‍යවේදියා සමාජ විද්‍යාව කෙරෙහි සිය අවධානය යොමු කරන්නේ කුමන නිශ්චිත අවස්ථාවකදී ද? එක් අවස්ථාවක් නම් සමාජ විද්‍යාත්මක මූලාශ්‍ර තොරතුරු භාවිතයේදී ජනමාධ්‍යවේදියා සමාජ විද්‍යාව වෙත සිය අවධානය යොමු කරයි. සමාජ විද්‍යාත්මක ප්‍රකාශන හඳුනා ගැනීම, සමීක්ෂණ වාර්තා හඳුනා ගැනීම හා විශේෂඥයින් සමග කෙරෙන සාකච්ජා ආදිය ජනමාධ්‍යවේදියාගේ අවධානයට යොමු වේ. පළපුරුදු ප්‍රවීණ ජනමාධ්‍යවේදියා නිතරම සමාජ විද්‍යාත්මක තොරතුරු මූලාශ්‍ර කෙරෙහි සිය අවධානය යොමු කළ යුතුවේ.

සමාජ විද්‍යාත්මක දත්ත සමග ජනමාධ්‍යවේදියා සිදුකරනු ලබන කටයුතුවල තවමත් විශාල විවිධත්වයක් දක්නට නොලැබේ. බොහෝ විට ජනමාධ්‍යවේද නිර්මාණවල සමාජ විද්‍යාත්මක දත්ත ඒ ආකාරයෙන් ගෙන හැර දැක්වීමක් දැකිය හැකිය. නමුත් ජනමාධ්‍යවේදියා සමාජ විද්‍යාත්මක දත්ත සිය නිර්මාණය තුළ ගැඹුරු විශ්ලේෂණයකට භාජනය කරනු දැකිය හැක්කේ ඉතාම කලාතුරකිනි. ඇත්ත වශයෙන්ම ඒ සඳහා උසස් මට්ටමේ සුදුසුකම් හා උසස් මට්ටමේ චින්තනයක් තිබිය යුතුය.

ජනමාධ්‍යවේදීන් බොහෝ විට සමාජ විද්‍යාත්මක දත්ත පාවිච්චි කරනු ලබන්නේ යම් කිසි තර්කයක් සාධාරණීකරණය හෝ නිශ්ප්‍රභා කිරීම සඳහාය. මෙය ඉතාම ප්‍රතිඵලදායක ක්‍රමයකි. යම්කිසි ජනමාධ්‍යවේදී නිර්මාණයක සමාජ විද්‍යාත්මක සමීක්ෂණ දත්ත ගෙන හැර දැක්වීම නිසා ග්‍රාහකයින්ගේ විශ්වසනීයත්වය ශක්තිමත් වන්නේය.

නමුත් බොහෝ ජනමාධ්‍යවේදීන් සිය නිර්මාණ තුළ සමාජ විද්‍යාත්මක දත්ත භාවිත කරන්නේ ඉතා අඩුවෙනි. නමුත් ඇත්ත වශයෙන්ම





ජනමාධ්‍යවේදියාගේ කාර්යභාරය ඊට වඩා පුළුල් පරතරයක් කරා පැතිරයයි. සමහරවිට ජනමාධ්‍යවේදීහු විවිධ සමාජ විද්‍යාඥයින්ගේ නිගමන හා තොරතුරු මත පිහිටමින් විවිධ සමාජ විද්‍යාත්මක සමීක්ෂණවල ප්‍රතිඵල එකිනෙකට සංසන්ධනය කරමින් ඔවුන්ගේ නිගමන හා සංකල්ප සැකයට භාජනය කරයි. ඒ තුළින් ජනමාධයවේදීහු සමාජ විද්‍යාඥයින් විසින් සාකච්ජාවන්ට, විග්‍රහයට ලක් කළ ගැටලු අවසානය දක්වා විශ්ලේෂණය කර නැති බව පෙන්වා දෙති. මෙවැනි ප්‍රතිපාක්ෂික ප්‍රවේශයක් ජනමාධ්‍යවේදීන් විසින් අනුගමනය කිරීම තුළින් ඔවුන් තුළ සමාජ විද්‍යාඥයින් කෙරෙහි ඇති විශ්වාසය නැති වී නොයයි. මෙය වඩාත් ගැඹුරින් සත්‍ය ගවේෂණය කිරීමේ අකාරයක් පමණි. මෙම ගැටලුව ගවේෂණය කිරීමේ ක්‍රියාවලියේ සක්‍රිය සහභාගිකයෙකු බවට ග්‍රාහකයා පත් කිරීමේ කර්තව්‍යයේදී සමාජ විද්‍යාඥයා හා ජනමාධ්‍යවේදියා සම මට්ටමින් සහභාගීවීමක් සිදුවේ.

විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණක් වන්නේ ජනමාධ්‍යවේදීන් ඉතාම කලාතුරකින් සිය නිර්මාණ තුළ සමාජ විද්‍යාත්මක හා සංඛ්‍යාන විද්‍යාත්මක දත්ත සාමාන්‍ය දෛනික පසුබිමක සිට නිරීක්ෂණය සිදු කිරීමයි. එය පොදු භාවය හා විශේෂතාවත්, නෛසර්ගිකත්වය හා පුද්ගලිකත්වයත්, පොදු ජනිත්වය හා නිර්පොදු ජනිත්වයත් සමාජ ජීවිතය තුළ ඒවායේ අන්‍යෝන්‍ය පරායත්තතාවය තුළ සංකීර්ණයක් හැමියට ප්‍රජානනය කිරීමේ අද්විතීය හැකියාවයි. ජනමාධ්‍යවේදියා සඳහා සමාජ විද්‍යාත්මක දත්ත පොළඹවන, සිද්ධිමය ජනමාධ්‍යවේදාත්මක නිර්මාණයක් කිරීම සඳහා පොළඹවන හෝ සිද්ධිමය හෝ කාර්යක්ෂම නිමිත්තක් විය හැකිය. පුළුල් අරුතින් ගත් කළ සමාජ විද්‍යාත්මක දත්ත ජනමාධ්‍යවේදියා සඳහා නිර්මාණාත්මක උත්තේජකයක් විය හැකිය.

යම්කිසි සමාජ සිද්ධියක් හෝ ක්‍රියාවලියක් අඛණ්ඩව ගවේෂණය කරමින් ඒ පිළිබඳව වැඩසටහක් හෝ ලිපි පෙළක් සම්පාදනය කිරීම වඩාත්ම ප්‍රතිඵලදායක ජනමාධ්‍යවේදී භාවිතයකි.

ජනමාධ්‍යවේදාත්මක නිර්මාණයක් සඳහා තොරතුරු එකතුකර ගැනීම ජනමාධ්‍යවේදියා හා සමාජ විද්‍යාඥයා අතර අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්වය අවශ්‍ය කරන තවත් අවස්ථාවකි. මහජන මතය විමසීම, ලියකියවිලි විශාල ප්‍රමාණයක් විශ්ලේෂණය කිරීම, නිරීක්ෂණය ආදිය විශාල ලෙස ශ්‍රමය වැය වන ක්‍රියාවක්ය. ඇත්ත වශයෙන්ම එවැනි කාර්යන් සාමුහිකව කළ යුතු කටයුතුය. නමුත්

ජනමාධ්‍යවේදියාගේ පුද්ගලික නිර්මාණවලදී එවැනි සාමූහික ක්‍රම භාවිත කිරීම සුලභ දෙයකි. තමන් සතු තොරතුරු හා කරුණු ප්‍රමාණවත් නොවන කල ජනමාධ්‍යවේදීහු එවැනි ක්‍රම කෙරෙහි සිය අවධානය යොමු කරති. මේ අනුව පෙනීයන්නේ ජනමාධ්‍යවේදය හා සමාජ විද්‍යාව අතර ඉතා සමීප සබඳතාවක් හා අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්වයක් පවතින බවයි. ජනමාධ්‍යවේදය සමාජ විද්‍යාවේ ජංගමශීලී කොටස වශයෙන් සැලකීම අතිශයෝක්තියක් නොවනු ඇත.

විවිධ අවස්ථාවන්හිදී විවිධ ප්‍රපංචයන් ගැටලු හා සිද්ධීන් පිළිබඳව හැදෑරීම සඳහා ජනමාධ්‍යවේදීහු විමසීම් ක්‍රම භාවිතයට ගනිති. ක්ෂණික විමසීම් ක්‍රම ජනමාධ්‍යවේදීන් සඳහා වඩාත් සමීප වන අතර ඔවුහු ඒවා පුළුල් ලෙස ප්‍රයෝජනයට ගනිති.

මෙම ක්‍රමය බහුලව රූපවාහිනී ජනමාධ්‍යවේදීන් භාවිත කරන අතර පුවත්පත් ජනමාධ්‍යවේදීන් හා ගුවන්විදුලි ජනමාධ්‍යවේදීන් ද භාවිත කරයි. ඒ හෝ මේ සිද්ධිය පිළිබඳව තොරතුරු ලබා ගැනීමටත් අදාළ සිද්ධියට ජනතාව දක්වන ප්‍රතිචාරය දැනගැනීමටත් මේ ක්‍රමය වැදගත් වේ. නමුත් ජනමාධ්‍යවේදියාට මෙම ක්‍රමයේ වාසි අවාසි පිළිබඳව පැහැදිලි ආකල්පයක් තිබිය යුතු අතර නිවැරදිව දත්ත පාවිච්චි කළ යුතුය. ම- තොට විමසීම් කෙරෙහි සමාජ විද්‍යාඥයින් නිතරම සිය අවධානය යොමු කළත් ඔවුන් තෝරා ගන්නා මාර්ග හා විමසීමට ලක් කරනු ලබන්නන් පිළිබඳව විශේෂ තේරීමක් කරනු ලබයි. මෙවැනි පිළිවෙලක් විශ්වසනීය හා නිවැරදි තොරතුරු ලබා ගැනීම සඳහා වැදගත්ය. දුරකථන විමසීම් සම්බන්ධව ද මේ තත්ත්වයම බලපාන්නේය. මෙය ජනමාධ්‍යවේදීන් සඳහා සම්පූර්ණයෙන්ම භාවිත කළ හැකි ක්‍රමයකි.

ජනමාධ්‍යවේදීන්ට සිය නිර්මාණාත්මක කටයුතුවලදී සරල සමාජ විද්‍යාත්මක ක්‍රම හා විධි පුළුල් ලෙස ව්‍යවහාරයට ගත හැකිය. බොහෝ විට ජනමාධ්‍යවේදීහු සමාජ විද්‍යාවේ හා සමාජ මනෝ විද්‍යාවේ ක්‍රමවේදී උපාංග වෙන් වෙන් කොටස් වශයෙන් භාවිතයට ගනිති.

කෙසේ වෙතත් සමාජ විද්‍යාව යනු සමාජ විද්‍යාත්මක ක්‍රම හා තොරතුරු මූලාශ්‍ර පමණක් නොවේ. එය සැමටම කලින්, සමාජ ගැටලු හා සමාජ ප්‍රපංචයන් ගවේෂණය කිරීමේ මාර්ගයකි, ක්‍රමවේදයකි. සමාජ මනෝ විද්‍යාව සමාජ විද්‍යාවට වඩා මානව ක්‍රියාකාරීත්වය සම- ඉතා සමීප වේ. එසේම සමාජ මනෝ විද්‍යාව හා





ජනසන්නිවේදනය අතර ඇත්තේ එකිනෙකට අන්තර් සම්බන්ධිත සමාන්තර පැවැතීම් දෙකක් පමණක් නොව පුද්ගලයාගේ සමාජ පැවැත්මේ පැති දෙකකි. [10]

අධ්‍යයනය කරනු ලබන ක්‍රියාවලියේ හා ප්‍රපංචයේ ගැටලු සහගත තත්ත්වයේ හරයත්, සමාජීය ප්‍රතිවිරෝධතාවන් අවබෝධ කර ගැනීමත්, ගවේෂණයට අදාළ වන සංකල්පීය තත්ත්වය පැහැදිලි කර ගැනීමත් සමාජ විද්‍යාඥයාගේ චින්තනමය ක්‍රියාකාරීත්වයේ සුවිශේෂතාය. තොරතුරු හා කරුණු මත වැඩකරන ජනමාධ්‍යවේදියාටද මෙම චින්තනමය අවධි එකසේ වැදගත් වන්නේය.

ජනමාධ්‍යවේද නිර්මාණ වර්ග අතර සමාජ විද්‍යාත්මක ප්‍රකාශන වර්ග දැකිය හැකිය. ජනමාධ්‍යවේදය තුළ විටින් විට සමාජ විද්‍යාත්මක ප්‍රකාශන පළ වන අතර එහි විශේෂත්වය වන්නේ බොහෝ විට එම ප්‍රකාශන පළ කරනු ලබන්නේ ජනමාධ්‍යවේදීන් විසින් නොව සමාජ විද්‍යාඥයින්, දේශපාලන විද්‍යාඥයින් හෝ බොහෝවිට ආර්ථික විද්‍යාඥයින් විසින් වීමය. ජනමාධ්‍යවේදය තුළ පළ වන සමාජ විද්‍යාත්මක වර්ගයේ ප්‍රකාශන අනෙක් ජනමාධ්‍යවේදාත්මක ප්‍රකාශන වර්ගවලින් වෙනස් වන්නේ කුමන ලක්ෂණ හේතු කොට ගෙනද? සමාජ විද්‍යාත්මක වර්ගයේ ප්‍රකාශන සිය විශේෂ අවධානය යොමු කරන්නේ වැදගත් වුවත් එක් එක් වෙන් වූ සාධක පිළිබඳව නොව සමාජ ප්‍රපංචයන් හා ක්‍රියාවලින් ගවේෂණය කිරීම හා ඒවායේ කාර්යභාරය හා ජීවන ක්‍රියාකාරිත්වය විශ්ලේෂණය කිරීම පිළිබඳවය. සමාජ ක්‍රියාවලින් හා සමාජ ප්‍රපංචයන් ගවේෂණාත්මකව විශ්ලේෂණය කිරීම එවැනි ප්‍රකාශනවල මූලික ලක්ෂණ වශයෙන් හැඳින්විය හැකිය.

සමාජ විද්‍යාත්මක වර්ගයේ ප්‍රකාශනවලට තෝරා ගන්නා විෂය ගැටලු පිළිබඳව පමණක් නොව ප්‍රධාන කාරණය ඒවා විශ්ලේෂණය කරන දෘෂ්ටිකෝණයද විශේෂත්වයක් ගනී. මෙහිදී වඩාත් වැදගත් වන්නේ විෂය ගැටලුව විග්‍රහ කිරීමේ සිද්ධිමය ප්‍රවේශය නොව සමාජීය අර්ථමය ප්‍රවේශයයි. සංකල්පීය හා සාකල්‍යයමය විශ්ලේෂණය කෙරෙහි වූ ප්‍රවණතාව හා ප්‍රයත්නය විශේෂයෙන් කැපී පෙනේ.

සමාජ සාධකවල හා සමාජ සන්දර්භවල්[11] හේතුඵල සබඳතාවන්ගේ බහු විවිධත්වය හා අන්‍යෝන්‍ය පරායත්තතාව සමාජ විද්‍යාත්මක ජනමාධ්‍යවේදියාගේ දෘෂ්ටි විග්‍රයට හසුවේ. මෙහිදී සමාජ විද්‍යාත්මක තොරතුරු සහ සමාජීය සංඛ්‍යානය

පුළුල් ලෙස භාවිතයට ගැනේ. මෙතුළින් සමාජ විද්‍යාත්මක ජනමාධ්‍යවේදියා සමාජමය වශයෙන් වැදගත් වූද අර්ථවත් වූද නිගමනවලට හා පොදු තත්ත්වයන්ට ප්‍රවේශ වෙයි. නමුත් එය පරම විද්‍යාත්මක ගවේෂණයක් නොවන්නේය. නිශ්චිත මිනිසුන්ගේ ක්‍රියාකාරිත්වය හා ඉරණම හරහා ගැටලුව දෙස බැලිය යුතු අතර සිය ජනමාධ්‍යවේදී නිරීක්ෂණ මත පිහිටා ගැටලුව විශ්ලේෂණය කිරීම සමාජ විද්‍යා ජනමාධ්‍යවේදියාගේ මූලික ලක්ෂණයකි. සමාජ විද්‍යාත්මක හා ජනමාධ්‍යවේදාත්මක ප්‍රවේශයන් වනුයේ අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්වය තහවුරු කිරීම සඳහා සමාජ විද්‍යාත්මක වර්ගයේ ජන මාධ්‍යවේදාත්මක නිර්මාණ උපරිම මට්ටමින් දායක වේ.

සංස්කරණ ක්‍රියාවලියේ ප්‍රතිඵල විමර්ශනය කිරීම පොදුවේ ජනමාධ්‍යවේදයේ කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය වීම කෙරෙහි බලපාන සාධකයකි. ජනමාධයවේදීන්ගේ විමර්ශන ශක්‍යතාව පුළුල් පරාසයක් කරා පැතිරී යයි. මෙමගින් ඉලක්ක ග්‍රාහක කණ්ඩායමෙත් ශක්‍යතා ග්‍රාහක කණ්ඩායමෙත් සැබෑ ග්‍රාහක කණ්ඩායමෙත් ප්‍රමාණාත්මක හා ගුණාත්මක සංවර්ධනය කෙරෙහි බලපෑමක් කළ හැකිය. ග්‍රාහක සාධකය පිළිබඳව සමාජ විද්‍යාත්මක ප්‍රවේශය ජනමාධ්‍යවේදීන් සඳහා ඉතා වැදගත්වේ. ග්‍රාහකයින් පිළිබඳව ක්‍රමානුකූලව නිශ්චිත හා නිතිපතා තොරතුරු ලබා ගැනීම ජනමාධ්‍යවේදී ආයතනයට ඉතාම වැදගත් වන්නේ එමගින් ඔවුන්ගේ නියම අවශ්‍යතාවන් හා වුවමනාවන් පිළිබඳ දැනුමක් හා ආකල්පයක් අදාළ ජනමාධ්‍යවේද ආයතනයට ඇති කර ගත හැකි බැවිනි.

ජනමාධ්‍යවේදාත්මක නිර්මාණකරණ ක්‍රියාදාමයේදී ප්‍රකාශනයේ හෝ වැඩසටහන්වල සංකල්පය යම් යම් වෙනස්කම්වලට හා අමතර අදහස්මය අඩු වැඩි කිරීම්වලට භාජනය විය හැක. එසේම ඉලක්ක කණ්ඩායම පිළිබඳව ජනමාධ්‍යවේදීන්ගේ ආකල්පයද වඩාත් නිවැරදිවීම්වලට ලක් විය හැකිය. නමුත් මිනැම අවස්ථාවකදී සැබෑ ග්‍රාහකයින් පිළිබඳව ඉතා හොඳින් දැනසිමිය යුතුය. අඩුම තරමින් එම ග්‍රාහකත්වයේ සමාජ ප්‍රජා විද්‍යාත්මක ව්‍යුහයක් ද,[11] ඔවුන්ගේ අවශ්‍යතාවන් හා වුවමනාවන්ද, ඔවුන් භාවිත කරන තොරතුරු මූලාශ්‍ර මොනවාද, අදාළ වැඩසටහන හෝ ප්‍රකාශනය ඔවුන් අගයන්නේ කෙසේද ඉන් ඔවුන් තෘප්තිමත් වන්නේද නොවන්නේද යන මූලික කරුණු පිළිබඳව අවබෝධයක් තිබිය යුතුය. ග්‍රාහකත්වය පිළිබඳ සංස්කාරකවරුන් සතු අවබෝධයේ අවශ්‍යතාව බහුවිධ විය හැක. ග්‍රාහකත්වය පිළිබඳ සමීක්ෂණය සිදු කරන්නේ ප්‍රථමවරට ද එසේ නොවේද ග්‍රාහකත්වය පුළුල් කිරීමේ අවශ්‍යතාවක් තිබේද ග්‍රාහකත්වයේ ස්ථාවරභාවය





කොපමණද? යනාදී කරුණු මත අදාළ බහුවිධත්වය රඳා පවතී. එක් එක් ග්‍රාහක කණ්ඩායම් පිළිබඳ වඩාත් සවිස්තරාත්මකව සමීක්ෂණය කිරීමේ අවශ්‍යතාව ද මතු වන්නේය. එමගින් සමාජ දේශපාලන නැඹුරුවීම් හා ජීවන ශෛලින් ආදී ග්‍රාහකත්ව ගතිලක්ෂණ වඩාත් ගැඹුරින් අනාවරණය කර ගත හැකිවේ. එසේම එක් එක් වැඩ සටහන් හා ඉදිරිපත්කරන්නන් පිළිබඳ ජනප්‍රියත්වය ද දැන ගත හැකිය.

තෝරාගන්නා ලද පිරිසකගෙන් ඒ හෝ මේ වැඩසටහන පිළිබඳ මත විමසීම තරම් විශ්වාසනීය ක්‍රමයක් නොමැත. මෙයද සමස්ත ග්‍රාහකත්වයේ ව්‍යුහය පරාවර්තනය නොකරන අතර නමුත් එය අදාළ ග්‍රාහකත්වයේ විශේෂතා පිළිබඳව නිශ්චිත ආකල්පයක් ලබා ගැනීමට ප්‍රමාණවත් වේ. විශේෂයෙන්ම ග්‍රාහක ලියුම් මගින් වඩාත් සක්‍රීය ග්‍රාහකයින්ගේ මතය නිරූපණය වේ.

තොරතුරුවල අන්තර්ගතය විශ්ලේෂණය කිරීම තුළින් ග්‍රාහකයින් අදාළ ජනමාධ්‍යවේද වැඩසටහන් හෝ ප්‍රකාශනයට දක්වන සම්බන්ධතාව මනාව වටහා ගත හැකිය. ඊට අමතරව එය වැදගත් වෘත්තියමය කර්තව්‍යකි. වැඩසටහන් හෝ ප්‍රකාශනය මගින් කොතෙක් දුරට අරමුණු ඉටු වන්නේද එහි අන්තර්ගතය කුමන වෙනස්වීම්වලට හෝ සංශෝධනවලට හෝ වර්ධනයන්ට ලක් විය යුතුද යනාදී කරුණු අන්තර්ගත විශ්ලේෂණය තුළින් දැනගත හැකිය. පුවත්පතේ හෝ වැඩසටහනේ සම්පූර්ණ අන්තර්ගතය තමන් දන්නා බව බොහෝ ජනමාධ්‍යවේදීහු ප්‍රකාශ කරති. නමුත් එය වැරදි මතයකි. සිදු කරන ලද විශේෂ සමීක්ෂණ මගින් එය එසේ නොවන බව ඔප්පු වී තිබේ. සමස්තයක් වශයෙන් යම් කිසි පුවත්පතක් අන්තර්ගත විශ්ලේෂණයට භාජනය කිරීමත් එහි එක් නිර්මාණයක් අන්තර්ගත විශ්ලේෂණයට භාජනය කිරීමත් එකිනෙකට වෙනස් කාර්යයන් වශයෙන් සැලකිය යුතුය.

පුවත්පතක හෝ රූපවාහිනී ගුවන්විදුලි වැඩසටහනක අන්තර්ගතය යනු වෙන් වූ එක් එක් තොරතුරුවල යාන්ත්‍රික එකතුවක් නොවේ. එය අඛණ්ඩ තොරතුරු ප්‍රවාහයකි. එතුළ අනේකවිධ තොරතුරුවල ගතිලක්ෂණ අපූර්ව ලෙස සංකලනය වී වෙනත් තොරතුරු සඳහා සන්දර්භයක් හා පසුබිමක් නිර්මාණය කරයි. යම් කිසි ගැටලුවක් හෝ මාතෘකාවක් පිළිබඳ ප්‍රකාශන ප්‍රමාණයක් නිශ්චිත මට්ටමක දී නව ගුණාත්මක පරිවර්තනයකට පත්වේ. නිශ්චිත වශයෙන් ග්‍රාහකයින්ට සම්බන්ධ වන්නට, සිදුවන්නේ එවැනි ග්‍රාහකත්වය තුළ නිලින ප්‍රවණතාවන් හා ස්ථිරසාර

ගතිලක්ෂණ පැහැදිලි කර ගැනීම සඳහා පිටපතේ හෝ පෙළේ අඩංගු තොරතුරු හා කරුණු අන්තර්ගත විශ්ලේෂණයකට භාජනය කළ යුතුය. යථාර්ථවාදී ලෙස හැඩගැසෙන්නාවූ සන්දර්භය කොතෙක් දුරට වැඩසටහන්වල හෝ ප්‍රකාශනවල අරමුණුවලට හා ග්‍රාහක අවශ්‍යතාවන්ට සරිලන්නේද යන බව අවබෝධ කර ගැනීමේ හැකියාව මෙම ක්‍රමය මගින් සැලසේ. අද්‍යතන පරිගණක තාක්ෂණය පදනම් කර ගෙන මෙම ක්‍රමය භාවිත කරමින් වෘත්තියමය ස්වයං විශ්ලේෂණය කිරීමේ විශේෂ හැකියාවක් තිබේ. අන්තර්ගත විශ්ලේෂණය තුළින් ලබා ගන්නා මූලික හා වඩාත් වැදගත් දත්තයන් පරිගණක ගත කිරීමෙන් හා ඒවා නිවැරදිව සංකේතගත කිරීමෙන් නිරන්තරවම කාර්යක්ෂම විශ්ලේෂණයක් සිදු කිරීමට අවකාශ විවෘත වේ. මෙ මි-න් මාතෘකාවල හා ගැටලුවල සංවර්ධනයේ අනුක්‍රමිකතාව සහතික කෙරෙන අතර ඉන් ජනමාධ්‍යවේදීන්ට සැබෑ තොරතුරු සැපයීමෙන් සමස්තයක් ලෙස ජනමාධ්‍යවේද ආයතනයේ ක්‍රියාකාරිත්වයේ කාර්යක්ෂමතාව වර්ධනය වන්නේය.

## මූලාශ්‍ර


1) *Journalism and Sociology, Moscow State University Press ;*

2) *Ct John W. Johnstone, 1976, The News People : A Sociological Portrait of American Journalists and their work, University of Illinois Press ;*

3) *Ballie, Earl, The Practice of Social Research Fifth Ed, wads worth publishing co, California ;*

4) *Aron, Raymond, 1990, Main Currents in Sociological Thought – 2, Penguin Books, London ;*

5) *Abraham, M., Francis , 1982 , Modern Sociological Theory, An Introduction Oxford University Press, NewYork ;*

6) *Williams R., 1962, Communications, Penguin, London;*

7) *Lasswell H., 1948, The Structure and Function of Communication in Society, The Communication of Ideas Ed., H. Bryson NY ;*







8) *A Ltshull J.H, 1984, Agents of Power: The role of the mews media in human affairs, New York and London: Longman ;*

9) *Gurevich S. M, 1987, Fundamentals of Scientific Organization of the Journalistic Work, (In Russian) Moscow ;*

10) *B. F. Lomov, 1984, Methodological and Theoretical Problems of Social psychology (In Russian), Nauka Publishers, Moscow ;*

11) *Ball – Rokeach, Sandra J. and Cantor, Muriel G. Media, 1986, Audience and Social Structure, New York, London ;*

# 2

# ගිබර් හා ජොන්සන්ගේ සන්නිවේදන ආකෘතිය පිළිබඳ විමසුමක්.
# ( Gieber and Johnson's model )

චන්ද්‍රසිරි රාජපක්ෂ

සන්නිවේදන විෂය විවිධ විෂයයික පදනමකින් වර්ධනය වුවකි. ජනමාධ්‍යය සමාජ ගත වී ප්‍රචලිත වීමත් සම- සන්නිවේදනය විෂයයක් ලෙස ගොඩනැගී ආ බව පෙනේ. විවිධ විෂයයන්හි ප්‍රවීණත්වයක් ලද විද්වත්හු මේ නව විෂය පිළිබඳ නිර්වචන, අර්ථකතන ඉදිරිපත් කළහ. භාෂාව, සාහිත්‍යය, මනෝ විද්‍යාව, සමාජ විද්‍යාව, දේශපාලන විද්‍යාව, ගණිතය, ඉංජිනේරු විද්‍යාව වැනි විවිධ විෂය ක්ෂේත්‍රවල විද්වත්හු ජනමාධ්‍ය හා සමාජය අතර ඇති වූ සම්බන්ධතාව ගැන මත පළ කළහ. සන්නිවේදන ආකෘති බිහිවූයේ එහි ප්‍රතිඵලයක් වශයෙනි.

ආකෘතිවලින් විෂය ක්ෂේත්‍රයක පදනම, විද්‍යාත්මක ස්වරූපය, සංවිධානාත්මකභාවය, ක්‍රමික වර්ධනයට පත් වීම යනාදී කරුණු ගණනාවක් දක්නට ලැබේ. සන්නිවේදන ආකෘතිවලින් ද මෙම කරුණු විග්‍රහ වන අතර විවිධ විෂය ක්ෂේත්‍රවලට සම්බන්ධ වී ඇති ආකාරයද පැහැදිලි කෙරේ. ඒ අනුව අවධි කිහිපයක් යටතේ එහි ලක්ෂණ මැනගත හැකිය. මුල් අවධියේදී රේඛීය (Linear) ලක්ෂණ එනම් සෘජු සන්නිවේදන පෙන්නුම් කරන බව පෙනේ. සන්නිවේදනයේ ඒකපාක්ෂික ස්වරූපය මෙන්ම සන්නිවේදකයා සතු ප්‍රබලත්වය ප්‍රකාශවන පරිදි ආකෘති ගොඩනැ- ඇති බව දක්නට ඇත. දෙවන අවධියේ දී සමාජය හා බද්ධ වී





ආර්ථික, දේශපාලන වැනි සමාජ ආයතන හා සම්බන්ධ කරමින් සන්නිවේදනයේ ඓන්ද්‍රිය පදනම විග්‍රහයට හසුකිරීම කැපී පෙනෙන ලක්ෂණය වේ. තෙවන අවධියේදී සන්නිවේදන විෂය ක්ෂේත්‍රයේ නව විෂය ධාරාවන් වර්ධනය වී ඇති ආකාරය පෙන්නුම් කරයි. දැනුම ජනගහණය විසරණය හා භාවිතය යන අංශ කෙරෙහි අවධානය යොමු කරමින් නව චින්තන ප්‍රවාහයක් සඳහා සන්නිවේදනය දායක වන ආකාරය දක්නට ලැබේ. එහි දී පද්ධති න්‍යාය, සංඥාර්ථ විද්‍යාත්මක චින්තනය, අන්තර් විශ්ලේෂණය වැනි ක්ෂේත්‍ර ගණනාවක විසිර ගිය දැනුම් ප්‍රවාහයක් ගැන සාකච්ඡා කරනු ඇත. මේ ආකාරයට විමසා බැලීමේ දී සන්නිවේදන ආකෘති වලින් ක්ෂේත්‍රය තුළ සිදු වී ඇති නවීකරණය මැනගත හැකි වේ.

ගිබර් හා ජොන්සන් ( Gieber and Johnson's) ආකෘතියේ දී මූලාශ්‍රය හා වාර්තාකරුවා අතර ඇති සම්බන්ධතාවය විවිධ පැතිවලින් විග්‍රහයට භාජනය කොට තිබේ. බෲස් වෙස්ට්ලි හා මැල්කම් මැක්ලීන් ( Bruce Westley and ~~Malcom Maclean ) යන සන්නිවේදන විද්‍යාඥයන් දෙදෙනා ඉදිරිපත් කරන~~ ලද සංකල්පික ආකෘතිය ගිබර් හා ජොන්සන් විසින් ප්‍රයෝජනයට ගෙන මෙම ආකෘතිය සකස් කොට තිබේ. ප්‍රාදේශීය වර්තාකරුවන්ගේ භූමිකාවේ සිට වාර්තාකරණයේ පවතින ලක්ෂණ හඳුන්වා දීමට මෙහි දී උත්සාහය තබා ඇත. නිදහස් පරිසරයක සිට තොරතුරු ලබාදීමේ දී ඒවායේ පවතින සත්‍යතාව මෙන්ම පුද්ගලයා සතු ශක්තිය ද වටහා ගත හැකිවේ. ගිබර් හා ජොන්සන් අවස්ථා කීපයක් තුළින් මේ කරුණු වටහා දීමට උත්සාහ දරා ඇත්තේ මෙසේය.

I.




Separate source - Communicator roles

මෙහි දැක්වෙන " A " හා " C " යන දෙදෙනාම සන්නිවේදන කාර්යන්ට සම්බන්ධවූ පුද්ගලයන්ය. " A " මූලාශ්‍රයේ හෝ සන්නිවේදකයා ලෙසත් " C " වාර්තා කරුවෙකු ලෙසත් හැඳින්විය හැකිය. මේ දෙදෙනා එකිනෙකට වෙනස් වූ පසුතලයක සිට සන්නිවේදන ක්‍රියාදාමය හා සම්බන්ධ වේ. ඔවුනොවුන්ගේ

ඇගයීම්, සංජානන ශක්තිය වෙනස්වන අතර සංවිධිත ලෙස ක්‍රියාකරන බව ද පෙනේ. එම නිසාම එකිනෙකාට ස්වාධිනව ක්‍රියාකිරිමට ඇති හැකියාව ද පෙන්නුම් කරයි. වෙනස් වු පරිපාලන ව්‍යුහයකට සම්බන්ධ වීම නිසා නිදහස් ප්‍රවෘත්ති රටාවකට අයත් වන බව පෙනේ. " A හා C " අතර ඇති දුරස්ථතාව ද මෙයට බලපා ඇත. මෙවන් ආයතනයන්හි කටයුතු කරන විට එකිනෙකාට ඇති බැඳීම් සන්නිවේදන කටයුතු සඳහා බලපාන ආකාරය ද අපට සිතා ගත හැකිය. නිදහස් චින්තනයට ද එයින් ලැබෙන ඉඩ මෙන්ම මෙය අනුරන ආකාරය ද අපට හඳුනා ගත හැකිය. " → → " මෙම සංකේතයෙන් තොරතුරු ගලා යෑමේ රටාව ගිබර් හා ජොන්සන් පෙන්වා දී තිබේ.

II.




Partially assimilated source and communicator roles

මෙම අවස්ථාවට අනුව " A " හා " C " අතර යම් ප්‍රමාණයක එක් වීමක් දක්නට ඇත. එමනිසා එකිනෙකාගේ රුචි අරුචි කම් එකිනෙකාට ගැළපෙන බවක් ද පෙනේ. එමෙන්ම එකෙකු අනෙකා අභිබවා ඇති බවක් ද ගම්‍ය කෙරේ. දෙදෙනාටම යම් යම් අරමුණු ඇති බවත් ඒවා අනුව ක්‍රියාත්මක වන බවත් ද පෙනේ. එක් පුද්ගලයෙකුට පුවත්පතට යම් කතාවක් ඉදිරිපත් කිරිමට අවශ්‍ය වන අතර අනෙකාට ද සිය කතුවරයා සතුටුකරවන ආකාරයේ යම් ප්‍රවෘත්තියක් ඉදිරිපත් කිරිමට අවශ්‍ය වේ. මෙහි දී " C " පැවති වාර්තාකරුට සිය නිදහස අහිමි වන ආකාරයක් දැනෙනු ඇත. මෙබඳු අවස්ථාවක දී අපක්ෂපාතීව ජනතාවට කරුණු ඉදිපත් කරන්නේ කවුද? යන ප්‍රශ්නය උද්ගත වේ. පුද්ගලයන්ගේ ග්‍රහණයට හසුවීම නිසා වාර්තාකරුවාට මුහුණුපෑමට සිදුවන ආත්මීය යටහත් පහත් වීමේ ගැටලුව ඔහුට පමණක් නොව පොදු පාඨකයාට ද බලපාන බව අමතක කළ නොහැකිය.

III.




Assimilated source - communicator roles





" A " හා " C " අතර මෙහි දැක්වෙන ලෙසට දුරස්ථතාවක් නැතිබව පෙනේ. දෙදෙනාම එකම රාමුවක් තුළ ක්‍රියාකරන සමාන පුද්ගලයන් බවට පත් වී තිබේ. එකිනෙකාගේ අරමුණු එක සමානව ක්‍රියාත්මකවන බවද පෙනේ. ඔවුන් අතර ඇති ඇගයීම, විවරණයන් ප්‍රකාශ කිරිම්වලට සාමූහිකත්වය දක්නට ඇත. මෙහිදී සිදු විය හැකි තවත් යමක් නම් එක් පුද්ගලයෙකු අභිබවා අනෙකා නැ-සිටීමේ ලක්ෂණය ද විය හැකිය. පුවත් ආයතනය ඉල්ලා සිටින එසේම වැඩි කැමැත්තක් දක්වන ප්‍රවෘත්ති වාර්තා කිරීම සඳහා උනන්දු විය හැකිය. සමාජය තුළ ඇති අරමුණු හා පුවත්පත් ආයතනයේ අරමුණු අතර සාමූහත්වයක් දක්නට ලැබේ. ගිබර් හා ජොන්සන් දක්වන පරිදි මෙය අසීමිත බලයක් ඇති රටවල ක්‍රියාත්මක වන ප්‍රතිපත්ති රටාවක් ලෙස ද හැඳින්විය හැකි බවය.

පොදුවේ සලකා බලන විට මෙම ආකෘතිය තුළින් මූලාශ්‍රය හා වාර්තාකරුවා (Source and Reporter) පිළිබඳ විග්‍රහ කරනු ඇත. මොවුන් අතර දොරටු පාල ක්‍රියාවලිය ( Gate keeper ) සිදු වන ආකාරය ද අවධානයට හසු වී තිබේ. නිදහස්ව අදහස් ප්‍රකාශ කිරීම සඳහා මාධ්‍යකරුවාට මුහුණ දීමට සිදු වන සමාජ බාධකයන් ද මෙහිදී අවබෝධ කරගත හැකිවේ. බෲස් වෙස්ට්ලි හා මැල්කම් මැක්ලීන්ගේ සංකල්පිත ආකෘතියෙන් ද තොරතුරු ලබාදීමේ දී ඒවායේ සත්‍ය ගරුක හා අදාළ බව පිළිබඳ අවධානයක් යොමු කරනු ඇත. ජනමාධ්‍ය වලින් ඉදිරිපත්වන තොරතුරු කොතරම් දුරට පවත්නා සමාජ තත්වය නිරූපණය කරන්නේද යන ගැටලුව උද්ගත වේ. එය මූලාශ්‍රයෙන් තොරතුරු තෝරා ගන්නා විට ඇති වන තත්වයකි. ඒ සඳහා විවිධ වූ සමාජ සාධක බලපානු ඇත. වාර්තාකරුවා හෝ සන්නිවේදකයාගේ රුචිකත්වය, අරමුණු, දේශපාලන සම්බන්ධතා, සංස්කෘතික ගැටලු, යනාදී විවිධ සාධකයන් බලපෑමට පුලුවන. එබැවින් ජනමාධ්‍යකරුවන් තමාගෙන් සමාජයට වන යහපත - බලපෑම යනාදිය ගැන මනා අවබෝධයකින් යුක්තව මාධ්‍ය හැසිරවිය යුතු බව මෙයින් ගම්‍ය කරන්නකි. ඒ මාධ්‍ය ශික්ෂණය, මාධ්‍ය සංස්කෘතිය, යන කරුණුවල වර්ධනයක් අවශ්‍ය වනු ඇත. කෙසේ වුවත් වාර්තාකරුවාගේ හෝ සන්නිවේදකයාගේ ක්‍රියා කලාපය සමාජ සංවර්ධනය සඳහා බලපාන ආකාරය ගැන අවබෝධයක් ලබා ගැනීම අවශ්‍ය වේ.

## මූලාශ්‍ර


1. *Mcquall Denis and Sven Windahl, 1989, Communication Models - for the study of Man, Longman ;*

3

# ආසියානු සන්නිවේදන සිද්ධාන්ත සොයා යෑම

නන්දන කරුණානායක

බටහිර රටවලට උචිත, බටහිර රටවල, විශේෂයෙන්ම අමෙරිකා එක්සත් ජනපදයේ සන්නිවේදන විශේෂඥයින් විසින් හඳුන්වා දී ඇති සන්නිවේදන හා ජන සන්නිවේදන සිද්ධාන්ත දකුණු ආසියානු රටවලට සුදුසුද? ශ්‍රී ලාංකේය හෝ දකුණු ආසියානු සිද්ධාන්ත කරා ගමන් කරන්නේ කෙසේද?

සෑම අවස්ථාවකම බටහිර සිද්ධාන්ත ආසියාවේ වෙනස්කම් පැහැදිලි කිරීමට අපොහොසත් වී ඇති බව පෙනී ගොස් ඇත. න්‍යායාත්මක/සෛද්ධාන්තික සංවර්ධනයක් යෝජනා කිරීමට ආසියානු සාම්ප්‍රදායයන් සහ වමිනාකම් සඳහන් කරන සෑම අවස්ථාවකම ආසියානු අධ්‍යයන ප්‍රජාව ඉදිරියේ ප්‍රධාන ගැටලුවක් ඇත. මේ ගැටලුව නම් ආසියානු සන්නිවේදන සිද්ධාන්ත කොහේද යන්නයි. ඒ සඳහා සෑහීමකට පත්විය හැකි පිළිතුරක් නොලැබීමෙන් පෙනී යන්නේ ඔවුන්ගේ මෙහෙවර මේ දක්වා අසාර්ථක වී ඇති බවයි. එනම් ආසියානු පර්යේෂකයන්ගෙන් සන්නිවේදන ක්ෂේත්‍රයට ලැබී ඇත්තේ අඩු දායකත්වයක් බවයි.

මෙම ලිපිය මි-න් සුවිශේෂ සන්නිවේදන සිද්ධාන්ත යෝජනා කිරීමෙන් මෙම ගැටලුව විසඳීමට අදහස් නොකරයි. නමුත් ප්‍රශ්නය දෙස න්‍යායාත්මකව බැලීමට අපේක්ෂා කරයි. ආසියානු සිද්ධාන්ත ගොඩනැ-මේ දි සලකා බැලිය යුතු





ප්‍රධාන කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම මේ ලිපියේ මුඛ්‍ය පරමාර්ථයයි. ආසියානු සන්නිවේදන සිද්ධාන්ත ගොඩනැ-මේ මෙහෙවරේ අරමුණු පැහැදිලි ද? ආසියානු සන්නිවේදන න්‍යාය යනු කුමක් ද? ආසියානු සන්නිවේදන සිද්ධාන්ත නිර්මාණය කිරීම ළ-ාවිය හැකි ඉලක්කයක් ද? නැතිනම් වඩා විශේෂිතව, සන්නිවේදන පර්යේෂණ සඳහා මෙතෙක් පැවති ඌන දායකත්වය පිළිබඳ ප්‍රශ්නයට ඇති විසඳුම කුමක් ද? ශාස්ත්‍රාලයීය අධ්‍යයන දෘෂ්මිකෝණයෙන් බලන විට වෙනස් යමක්, ආසියාතික යමක් සොයා ගැනීමෙහි අරුත කුමක් ද?

මෙම සාකච්ජාව ඇරඹෙනුයේ ආසියානු සංකල්පය දෙස බැලීමෙනි. ආසියානු සන්නිවේදන න්‍යායක් නිර්මාණය කිරීමේ අරුත පළමුව විමසිය යුතුය. ආසියාව සහ බටහිර අතර සංස්කෘතික වෙනස සහ ආසියාතික ප්‍රජාව තුළ න්‍යාය ගොඩනැ-ම සඳහා ප්‍රවේශයේදී ඇති සංකීර්ණ වෙනස්කම් සැලකිල්ලට ගත යුතුය. ආසියානු සන්නිවේදන පර්යේෂණ සඳහා වේදිකාව සැකසීමට අවශ්‍ය පසුබිම අධ්‍යයනය කිරීම සඳහා උත්සාහයක් දැරීම ද මේ ලිපියේ සෙසු අරමුණුය. මෙම ලිපියේ ආසියානු සන්නිවේදන න්‍යාය සොයා යෑම සඳහා විකල්ප දෘෂ්මියක් යෝජනා කරයි. අපගේ බලාපොරොත්තුව මෙම ව්‍යායාමය මෙම කාරණයට වඩා යථාර්ථවාදී ප්‍රවේශයක් ලබා දෙනු ඇතැයි යන්නයි

සන්නිවේදනයේ නිවැරදි දිශාව සහ ජාතික සංවර්ධන මාර්ගය සොයා යෑමේ දී ජනමාධ්‍ය ප්‍රතිපත්තිකරුවන් ද, වෘත්තිකයින් ද, විශ්වවිද්‍යාල බුද්ධිමතුන් ද විශාල උනන්දුවක් දක්වා ඇත. ඔවුන්ගේ ප්‍රධාන තර්කයක් වී තිබෙන්නේ බටහිර සන්නිවේදන සිද්ධාන්තයන් තම රටවලට අනුචිතය යන්නකි. ආසියානු සන්නිවේදනය මෙන්ම පුවත්පත් කලාව ද දැඩි ලෙසකින් බටහිර බලපෑමකට හසුවී තිබේ. විශේෂයෙන් ම සන්නිවේදනය හා පුවත්පත් කලාව පිළිබඳ ඉගැන්වීම ඇරඹුණු මුල් අවධියේම මේ බලපෑම ආරම්භ වූ බව කිව හැකිය.[1] පුවත්පත් ප්‍රකාශන ආයතන මෙන්ම ජනමාධ්‍ය ආයතන ආරම්භවීමේදීත් ක්‍රියාත්මකවීමේදීත් මේ බලපෑම ඒ ආකාරයට තිබෙන බව කිවයුතු නැත.

බටහිර සිද්ධාන්ත බොහෝ විට ගුණාත්මක අගය අමතක කොට හෝ සුළුවෙන් තකමින් හෝ ප්‍රමාණාත්මක ක්‍රම කෙරෙහි අවශ්‍ය තරමටත් වැඩියෙන් අවධාරණයේ යෙදීම ප්‍රධාන ඌනතාවක් ලෙස හඳුනාගෙන ඇත. තවද, කේන්ද්‍රියත්වයෙන් තොරවීම, පුනරුක්තිය,නොතකා හැරීම, සන්නවේදනයේ ව්‍යුහය හා ක්‍රියාකාරිත්වය පිළිබඳ අධ්‍යයනයන්හිදී සමාජ සන්දර්භය සහ සන්නිවේදනයේදී

සංස්කෘතික සාධකයට අවශ්‍ය තරමට අවධානය යොමු නොකිරීම ආදිය මෙවැනි දුර්වලතා ලෙස "චූ" විසින් හඳුනාගෙන තිබේ.

17 වෙනි සහ 15 වෙනි ශත වර්ෂවල දී යුරෝපය තුළ ලෝකය පිළිබඳ සංකල්පයත් ඒ තුළ මිනිසුන් දරන ස්ථානයත් විශාල විපර්යාසයකට භාජන විය. කලාත්මක, ආර්ථික, සංස්කෘතික, දේශපාලනික, සාහිත්‍යමය සහ බුද්ධිමය යනාදී සියලුම ක්ෂේත්‍රයන් තුළ මේ වෙනස් වීම දැකගන්නට ලැබිණ. නවීන ආකාරයකට සිතීම මෙන්ම නව ප්‍රාර්ථනා ඇති කොට භෞතික මෙන්ම සමාජීය ලෝකයේ නව විෂයන් වශයෙන් වර්ගීකරණය කරමින් අධ්‍යයනය කිරීමට මේ අනුව ම- පැදිණි. මේ සඳහා කාරණා කිහිපයක් ම බලපෑවේ ය. 16 වන ශත වර්ෂයේ පුනරුදයත් කාර්මික විප්ලවයත් ධනවාදී ආර්ථික ක්‍රමය වර්ධනය වීමත් 18 වන ශත වර්ෂයේ බුද්ධි ප්‍රබෝධයත් ඒ කාරණාය.

ඇන්තනී ගිඩ්න්ස් විසින් අවධාරණය කොට ඇති පරදි 18 සහ 19 වෙනි ශත වර්ෂවල අවසාන භාගයේ ස්වභාවික විද්‍යාව සහ තාක්ෂණය තුළ ඇති වූ ආශ්චර්යවත් ප්‍රගතිය විසින් වෙනත් කිසිම දෙයකට වඩා අද අප දන්නා සමාජයීය විද්‍යාවන් සියල්ලෙහි ම පාහේ රූපාකරය සකස් කරන ලදී (Giddens, 1976: 11) ජනසන්නිවේදනය නම් වූ සමාජයීය විද්‍යාව ආරම්භ වුයේ 1930 ගණන් වලදීය. යුරෝපීය ප්‍රභවයකින් ආරම්භ වූ ජනසන්නිවේදනය අමෙරිකා එක්සත් ජනපදයේ දී ශීඝ්‍රයෙන් වැඩී ආවේය. 1960 දශකයෙන් පසුව ආසියාවේ ජනසන්නිවේදන අධ්‍යාපනය ආරම්භ විය. පිලිපීනය, තායිලන්තය, මැලේසියාව ආදී අග්නිදිග ආසියානු රටවල ද ඉන්දියාව, ශ්‍රී ලංකාව, බංගලාදේශය, පාකිස්තානය ආදී දකුණු ආසියානු රටවල ද ජනසන්නිවේදනය නව ශික්ෂණයක් ලෙස විශ්වවිද්‍යාලවලට පිවිසියේය.

ආචාර්ය සුසන්ත ගුණතිලක 1984 පළ කළ *Aborted Discovery : Science and Creativity in the Third World* ( London: Zed Press, 1984) කෘතියෙන් ආසියානු සිද්ධාන්ත වර්ධනය නොවීම පිළිබඳ ව විමසයි. ඔහු ඉන්දියාව ගැන විශේෂයෙන් ම සඳහන් කරයි. විද්‍යාත්මක බලය අනුව ඉහළ ම ස්ථානයක සිටින ඉන්දියාව නිර්මාණාත්මක පර්යේෂණයන් හි නොයෙදෙන්නේ ඇයි ද යන්න ද විමසා බලයි. ආචාර්ය ගුණතිලක පවසන පරිදි භාරතීය ශාස්ත්‍රඥයෝ තමන්ගේ ම නව ව්‍යාපෘතින් සංවර්ධනය කිරිම හා ගොඩනැ-ම අමතක කොට බටහිර විද්‍යාව මත ගැතිව සිටිති. බටහිර විද්‍යාවට මෙන්ම ආඩම්බර විය හැකි ප්‍රෞඪ





ඉතිහාසයක් පෙරදිග රටවලට ඇතැයි තර්ක කරන ආචාර්ය ගුණතිලක මෙම අවාසනාවන්ත තත්ත්වයෙන් මිදිය හැකි මාර්ගයක් යෝජනා කිරිම සිය කෘතියේ අරමුණ බව පවසයි.

විද්‍යාව ස්වාභාවික පම්පාමිය ගවේෂණය කරන්නක් හැමියට නිර්වචනය කරන්නේ නම් නැගෙනහිර සම්ප්‍රදාය ඒ පක්ෂයෙන් දුර්වලයයි පැවසී ඇත. මේ දුර්වලකම ඇත්තේ විශ්ලේෂණීය සහ න්‍යායාත්මක සංස්ථිතික භාවයක් නැගෙනහිර සම්ප්‍රදාය තුළ දක්නට නොමැති වීම නිසා යැයි එස්. නකයාමා හෙළි කරයි (Nakayama 1977)

අයින්ස්ටයින් විසින් ජේ.එෆ්.ස්විට්ෂර් ට යවන ලද ලිපියකින් මේ බව පෙන්වා දී ඇතැයි ආචාර්ය මල්ලිකාරච්චි ගෙනහැර දක්වයි. බටහිර විද්‍යාවේ වර්ධනයට බලපෑ ප්‍රධාන ජයග්‍රහණයන් දෙක නම් ග්‍රීක දාර්ශනිකයන් විසින් රූපික තර්ක ක්‍රමය සොයා ගැනීමත් (ඉයුක්ලිඩියානු ජ්‍යාමිතිය) විධිමත් සම්පරීක්ෂණයන් තුළින් හේතු - ඵල සම්බන්ධතාවන් සොයා ගැනීමත්ය. (පුනරුදය) චීන මුනිවරයන් විසින් මෙම පියවරයන් නොගැනීම ගැන කෙනෙකු විමතියට පත්විය යුතු නැත. ඇත්තෙන් ම විමතියට පත්විය යුත්තේ මේවා සොයා ගැනීම පිළිබඳවය.

ආසියානු සංස්කෘතින්ට හා සම්ප්‍රදායන්ට සාපේක්ෂකව බටහිර සන්නිවේදන සිද්ධාන්ත නැවත පරීක්ෂා කිරීමේ නව ප්‍රවණතාවක් ඇති වී තිබේ. නව ප්‍රවණතාව පිළිබඳ පැතිරුණු හැ-මක ආසියානු සන්නිවේදන විද්වතුන් අතර විශේෂයෙන් පවතින බව කිව යුතුය. ශ්‍රී ලංකාව ඇතුළු ආසියානු විශ්වවිද්‍යාලවල සන්නිවේදන පර්යේෂණ හා අධ්‍යයනයන් අමෙරිකානු - සන්නිවේදන සිද්ධාන්තවලින් උත්තේජනය ලබන බව කිව යුතු නැත. මේ ගැතිකම නිසා බටහිර ආකෘති සහ සිද්ධාන්ත අවිචාරාත්මකව පිළිගැනීමක් සිදු වී ඇති බව නිතරම අසන්නට ලැබේ. මේ බටහිර විශේෂයෙන්ම අමෙරිකානු ගැතිකම නිසා ආසියානු සම්ප්‍රදාය තුළ ගැබ්ව ඇති සංකල්පයන් නොසලකා හැරීමක් සිදු වී ඇතැයි ද චෝදනා නැ-ී.

බොහෝ සන්නවේදන විද්වත්හු ක්ෂේත්‍රයේ සිදුවන ශීඝ්‍ර වෙනස්වීම දෙස අපූර්වත්යෙන් බලති. එහෙත් අමතක නොකළ යුතු දෙයක් ද ඇත. ඊට නොදෙවැනි ලෙසටම අඳුරු වූ තවත් දෙයක් ද තිබේ. එනම් ක්ෂේත්‍රය බොහෝ දුරටම නො වෙන්ව තිබීමයි. ආසියානු සන්නිවේදන සිද්ධාන්ත සොයා යෑම පිළිබඳව මහාචාර්ය විමල් දිසානායක සංස්කරණය කළ (1988) ග්‍රන්ථය ප්‍රකාශයට පත්ව දශක එක

හමාරකට වැඩි කාලයක් ගත වුව ද, සන්නිවේදනය පර්යේෂණ කටයුතු සඳහා වන ආසියාවේ දායකත්වය පිළිබඳ ව ශ්‍රී ලාංකික හා ආසියාතික පර්යේෂකයන් අතර අතෘප්තිමත්, අසහනකාරී හැඟීමක් පවති.

ආසියානු සන්නිවේදන පර්යේෂණ ප්‍රජාව ශීඝ්‍ර ලෙස වර්ධනය වී ඇත. ඉන්දියාවේ සේජ් ප්‍රකාශන ආයතනය විසින් ජන සන්නිවේදනයටම කැපවුණු ඉංග්‍රීසි භාෂාවෙන් නිකුත්වන සඟරා රැසක් ම එළි දක්වනු ලබයි. සන්නිවේදන සිද්ධාන්ත වෙනුවෙන්ම කැප වූ ඉංග්‍රීසි භාෂා සඟරා තුනක් ද දැනට ප්‍රකාශයට පත් වෙයි. විශේෂයෙන්ම ආසියානු සන්නිවේදන පර්යේෂණ සඳහා කැපවුණු සහ කලාපය තුළ අධ්‍යාපන සහ වෘත්තිමය හුවමාරු කිරීම් ශීඝ්‍ර ලෙස ප්‍රවර්ධනය කර සිංගප්පූරුවේ **ඇමික් ආයතනය** දි විශාල සේවයක් සලසන බව කිව යුතුය. එනමුත් ආසියාතික සන්නිවේදන පර්යේෂකයන්ගේ මෙහෙවර තවමත් අසම්පූර්ණ වූ සෙයකි.

ජනසන්නිවේදන අධ්‍යාපනය විශ්වවිද්‍යාල මට්ටමින් උගැන්වීම ආරම්භ වූ දින සිට අද දක්වාම අසියාව පුරාම දැකගත හැක්කේ මූලික වශයෙන් ම ඇමෙරිකානු බලපෑමයි. අග්නිදිග ආසියාවේ සියලුම රටවල පාඨග්‍රන්ථ වශයෙන් භාවිත වන්නේ අමෙරිකානු සන්නිවේදන විද්වතුන් ලියා පළ කළ පහත සඳහන් පොත් බව සමීක්ෂණ ගණනාවකදීම හෙළ වී ඇත.

1. *The Process and Effects of Mass Communication,* Schramm and Roberts, 1971
2. *Communication of Innovations,* Rogers with Shoemaker, 1971
3. *The Process of Communication,* Berlo, 1960
4. *Effective Public Relations, Cutlip and Center,* 1971
5. *Television Production Handbook and Workbook,* Zettl, 1968

දකුණු ආසියානු රටවල තත්වය ද මීට බොහෝ දුරට සමානය. ඇමෙරිකාවේ පළ කළ පහත සඳහන් පොත් නිතරම භාවිත කරන බව සමීක්ෂණවලදී වී හෙළි වී ඇත.

1. *Mass Media and National Development,* Schramm, 1964
2. *Communication and Change in the Developing Countries,*





Lerner and Schramm, 1967.
3. *The Process and Effects of Mass Communication*, Schramm, 1954
4. *The Process of Communication,* Berio, 1960
5. *Diffusion of Innovations*, Rogers, 1962
6. *Introduction to Mass Communication,* Emery, et.al:, 1960
7. *Responisibility in Mass Communication*, Rivers and Schramm, 1959
8. *Theories of Mass Communication,* DeFluer, 1970
9. *The Effects of Mass Communication,* Klapper, 1960
10. *Four Theories of the Press,* Siebert, et. al.

## ආසියානු පෙරදිග ලක්ෂණ තිබේ ද?

ජපන් ජාතික විද්වතකු වන, නකමුර අවධාරණය කරන පරිදි එක් විශේෂ “ පෙරදිග ” ලක්ෂණයක් නැති බව අප පිළිගත යුතු වන අතර, ඇත්තේ සමස්ත පෙරදිග ආසියාවට නොව සමහර ජාතිකයනට පොදු විවිධ චින්තන විධිය. “ බටහිර හා පෙරදිග ද එක සේ පවතින, පොදු විශ්වීය මනුෂ්‍ය ස්වභාවයන් හැරෙන්නට සමස්ත වශයෙන් පෙරදිග ආසියාතිකයන්ට පමණක් අනිවාර්ය වූ චින්තන විධි ලක්ෂණ නොමැත. ”(නකමුර, 2003:26)

නකමුර තව දුරටත් මෙසේ පවසයි.

“ ගණිතය, ස්වාභාවික විද්‍යාව, අධ්‍යාපනය, කලාව ආදී අන්‍ය ක්ෂේත්‍රවල ද, බටහිර සංස්කෘතියේ ආභාසය තීරණාත්මක වෙයි. ලෝකය එක්සත් වීම සමඟම බටහිරකරණය ද සිදු වුයේ යැයි සිතීමට හේතුව මෙයයි. කෙසේ වෙතත් ලෝකය එක්සත් කිරීම කැපී පෙනෙනුයේ ඒකාංගිකව විශේෂයෙන් භෞතික, ස්වාභාවික ලෝක පාලනය හා උපයෝගී කර ගැනීම් වශයෙන් පමණි. භාෂා, ආචාරධර්ම, කලාව, සිරිත් විරිත් ආදිය ඇතුළත් එක් එක් ජාතියක අධ්‍යාත්මික සම්ප්‍රදායයන් වෙනස් කිරීම අතිදුෂ්කරය.” නකමුරගේ අදහස නම් පෙරදිග ආසියාතික ජනයා හා ඔවුන්ගේ සංස්කෘති පහත් හෝ පසුගාමී හෝ යැයි මෙහිලා නොසැලකෙන බවයි. සමහර අංගවලින් ඒවා බටහිර තරම් ම දියුණුය. ලෝකයේ නව මාවත් ඔස්සේ දියුණුවට යද්දී එයට අයත් විවිධ ජාතීන් සතු බොහෝ සාම්ප්‍රදායික සංස්කෘතිකාංග ඒවායේ විශේෂ දායකත්වය මගින් ලෝකය සාරවත් කිරීමට සමත් බැව් දැක්වීමයි.

නකමුර පවසන පරිදි සිය සංස්කෘතීන් ආරක්ෂා කර ගැනීම හා දියුණු කිරිම සඳහා විවිධ ජාතීන් තුළ ඇති ආධ්‍යාසය හේතු යුක්ත වෙයි. එය බුහුමන් ලැබිය යුත්තකි. ඒ එසේ නම්, වෙනත් ජාතීන් සතු සංස්කෘතීන් විචාරයට ලක් කිරීමේ දී සිය සංස්කෘතිය ද විචාරාත්මකව බැලිය යුතු වෙයි. මෙසේ සබුද්ධික වූ ආත්ම - විවේචනයෙන් යුක්ත නිරහංකාර භාවයෙන් හා ආත්මාවබෝධයෙන් නව සංස්කෘතියක් ගොඩන-ා ගත හැකිවෙයි. (නකමුර , 2003, 35 පිටුව)

නකමුර පෙන්වාදී ඇති පරිදි ම යම් ප්‍රදේශයක දේශගුණය, කාලගුණය, භූ විද්‍යා ලක්ෂණ, පසෙහි ගුණය හා භූ විෂමතා ලක්ෂණ මිනිසුන් අතර චින්තන විධිවල වෙනස්කම් සඳහා බලපාන බව ද විශ්වාස කෙරේ. ඒ එසේ වුව ද එකම දේශගුණික පරිසරයක් තුළ වෙසෙන එකම මිනිස් කොටසක් වෙනත් ජාතීන්ගේ චින්තනයෙහි අභාසය ලබා සිය චින්තන විධිය වෙනස් කරනු දැකිය හැකිය.

පුද්ගලයා පිළිබඳ බෞද්ධ දර්ශනය මෙහි දී අමතක නොකළ යුතුය. මහාචාර්ය ධර්මසිරි පෙන්වා දෙන පරිදි තමා විශාල සමස්තයක කොටසක් බවත්, වෙන් වූ නිදහස් නොවන පුද්ගලයකු නොවන බවත් අවබෝධ කරගත යුත්තේය. බෞද්ධ චින්තනයේ දී සාමාන්‍ය පුද්ගලයා පෘථග්ජන යනුවෙන් හඳුන්වා ඇත්තේ හෙතෙම තමා (පෘථග් ) වෙන් වූ පුද්ගලයෙකු යැයි සිතන නිසාය. පෘථග් යනු “ වෙන් වූ ” යන අර්ථයයි. ජන යනු පුද්ගලයායි. සමස්තය සහ කොටස අතර ඇති සම්බන්ධය ජිවීමය ය. සමස්තය විසින් කොටස ගොඩ න-න්නේ, නිර්මාණ කරන්නේ යම් සේ ද, ඒ ආකාරයෙන්ම කොටස විසින් ද සමස්තය නිර්මාණය කරනු ලබන්නේය.

මේ ආකාරයෙන් කල්පනා කොට, සමස්තයේ කොටසක් වන තමාට ද විශ්වමය සිද්ධි මාලව තුළ, විශ්වමය ආකාරයෙන් එම සිද්ධීන් කෙරෙහි බලපෑමක් කළ හැකි බව තමා විසින් අවබෝධ කරගත යුත්තේය. එක්තරා අකාරයකින් බලන විට, සමස්තය මගින් කොටස සකසනු ලබන්නේය. එහෙත් බුදු සමය මගින් කියා සිටින වැදගත් කරුණ නම් කොතරම් සුළු වුව ද, කොටස මගින් සමස්ත සැකසීම කෙරෙහි ද ඉතා වැදගත් වූ බලපෑමක් කළ හැකි බවය. ( ගුණපාල ධර්මසිරි, 1988 : 21)





## සිද්ධාන්ත සහ ආසියානු සංස්කෘතිය

සංස්කෘතීන් සතුව නිශ්චිත සංවර්ධන මාවතක් ඇති අතර විද්‍යාව සංස්කෘතිකමය වශයෙන් බැඳී ඇත. න්‍යාය පිළිබඳ සංකල්පය සහ සමාජ විද්‍යාත්මක පර්යේෂණයන් පිළිබඳ ප්‍රමුඛ මතය තත්කාලීන බටහිර ශිෂ්ටාචාරයේ නිෂ්පාදිතයකි. ආසියානු දර්ශනයන් සහ සංස්කෘතික සම්ප්‍රදායන්, ඒවායේ පොහොසත් කම හැරුණු කොට සම්පූර්ණයෙන් වෙනස් සංවර්ධන මාර්ගයක් අනුගමනය කර ඇත. එමගින් අපට බටහිර හැ-මට අනුව න්‍යාය හෝ එවැනි න්‍යායන් ගොඩනැ-මට සන්දර්භායානුගත මූලික ව්‍යුහයක් හෝ ලබා දෙන්නේ නැත.

මෙම නිරීක්ෂණ මගින් කරන්නේ ආසියානු ජනතාව සතුව ඔවුන්ගේ ම විද්‍යාවක් හෝ සහජ දැනුමක් නොමැති බව පැවසීමක් නොවේ. තවද ලෝකය සංජානනය කිරීම සහ මිනිසා - මිනිසා අතර සහ මිනිසා - පරිසරය අතර සබඳතා පරිකල්පනය කිරීමේ මාර්ගයක් නොමැති බවක් යෝජනා කිරීමට ද එමගින් අදහස් නොකෙරෙයි. සහස්‍රක තුනක් ඈතට දිවයන ඓතිහාසික සාධකයන්ට අනුව ලෝකයේ **බොහෝ වැදගත් දාර්ශනික, ආගමික සහ ජිවන සම්ප්‍රදායන් ආසියාව තුළින් බිහිවී ඇත.** මේ වනවිට, බටහිර සහ ආසියාතික විද්‍යාවන් සහ ඒවායේ වෙනත් මූලාශ්‍රයන් සහ ස්වභාව අධ්‍යයන ආකෘතීන් අතර යම් සංසන්දනයක් කිරීම ප්‍රයෝජනවත් විය හැකිය.

මුලින් ම ප්‍රභවයන්ගේ වෙනස්කම් ගැන සැලකිලිමත් වෙමු. නූතන බටහිර විද්‍යාව *Theoria* යන ග්‍රීක සංකල්පය තෙක් ඈතට දිවයයි. *Theoria* යන ග්‍රීක සංකල්පයේ තේරුම අපක්ෂපාතීව සත්‍යය සොයා යෑම සහ බුද්ධිමය කුතුහලය සපුරා ගැනීමයි. (Shen 1984) මේ සංකල්පය අනුව බලන විට පෙනී යන්නේ ආසියානු හෝ පෙරදිග සාම්ප්‍රදායික විද්‍යාව තුළ පර්යේෂණ ලැදියාව අරබයා ඌනතාවක් තිබෙන බවයි. ලැදියාව ඇත්තේ ප්‍රායෝගික පැත්ත සම්බන්ධවයි.

බටහිර විද්‍යාත්මක හා දාර්ශනික ඥාන විභාගය (episteme) යන්න ආරම්භ වූයේ කුහුල (wonder) යන ආකල්පය මතයි. එතුළින් න්‍යායාත්මක පසුබිමකින් විද්‍යාත්මක හා දාර්ශනික දැනුම ගොඩනැ-මට හැකියාව ලැබිණි. මෙම සංකල්පය භාවිතයෙන් පෙනී යන්නේ ආසියානු සාම්ප්‍රදායික විද්‍යාවන් න්‍යායාත්මකව ලැදියාවෙන් ඌන බව සහ ඒ වෙනුවට වඩා උපයෝගිතාව කෙරේ යොමුවී ඇති බවයි. බටහිර පැවති කුහුල නිසාම විද්‍යාත්මක හා දාර්ශනික දැනුම, න්‍යායාත්මකව

ව්‍යුහගත කිරීම වෙත යොමු වීමත් අනිවාර්යයෙන්ම සිදු විය. ආසියානු විද්‍යාවන් සහ දර්ශනයන් ඇරඹුණේ මිනැකම (Concern) සහ අදාළතාවේ ආකල්පය සම-යි. එමගින් පිවිසුණේ පුද්ගලික සහ සාමූහික ඉරණම සඳහා ම-පෙන්වන ප්‍රායෝගික බුද්ධිය කෙරෙහිය.

චීනයේ සුප්‍රකට I Ching (Book of Change) කෘතියේ මහා උපග්‍රන්ථයට අනුව, දර්ශනය විද්වත් ක්‍රියාදාමයක් ලෙස ඇරඹුණේ සාංකාව සහ ව්‍යසනය පිළිබඳ තත්ත්වයන් තුළ ඇතිවන කනස්සල්ල සහ උනන්දුව සම-යි. මෙය ජීවන ක්‍රමයක් ලෙස විවේකය (Leisure) සහ විනෝදය යන තත්ත්වයන්ගෙන් සම්පූර්ණයෙන් ම වෙනස් වූවකි. Metaphysics ග්‍රන්ථ තුළින් ඇරිස්ටෝටල් යෝජනා කරන පරිදි, ඊජිප්තුවේ පූජකයින් දැනුම සොයා ගියේ “දැනුම - දැනුම සඳහාම ය යන ස්ථාවරය ඔස්සේය. ඒ පදනම ඔස්සේ ඔවුහු ජ්‍යාමිතිය නිර්මාණය කළහ. මෙනිසා මූලාරම්භයන් දෙක අතර වෙනස නම්, න්‍යායාත්මක ළැදියාව සහ උපයෝගිතා ළැදියාව අතර වෙනසයි.

ඥාන විභාග (Episteme) ආකෘතිය සැලකිල්ලට ගනිමු. ආසියානු සහ බටහිර සංස්කෘතින් අතර එක් වැදගත් වෙනස්කමක් ඇත. මේ වෙනස ඇත්තේ දැනුමේ අර්ථය සහ එය සංජානනය කිරීම සහ දැනුම ගොඩනැ-ීම යන කාරණා අනුවයි.

මුල් කාලයේ සිට ම බටහිර දර්ශනයන්, දැනුම සහ එහි සබඳතාව ඉන්ද්‍රියයන් සම- සබඳතාව සහ ආනුභවික දත්ත සම- සබඳතා ආදි ලෙසින් ප්‍රමුඛ ස්ථානයක තබා ඇත. නිදසුනක් වශයෙන් සියලු දැනුම අපගේ ඉන්ද්‍රියයන් තුළින් ලබාගත හැකි ද යන්න, ප්ලේටෝ සහ ඔහුගේ සමකාලීන දර්ශනිකයන් අතර ඇති වූ උණුසුම් විවාදයේ මාතෘකාව විය. (Russell, 1988) මෙම විවාදය අඳුරු යුග සමයේ ( 5-10 සියවස් ) දී මර්දනයට ලක්වීය. නමුත් පුනරුදයේ නැ-ීමත් සම- යළිත් දැවැන්ත ලෙස පෙරට ආවේය. සමගාමී ලෙස අනුභූතිකවාදයේ නැ-ීමත් සම- බටහිර ශිෂ්ටාචාරයේ විද්‍යාත්මක පර්යේෂණ සඳහා පදනම ඇති වූ බව කීම නිවැරදිය.

එහි ආනුභවික පාර්ශවයෙන්, බටහිර නූතන විද්‍යාවේ ලක්ෂණ වී ඇත්තේ එහි හොඳින් පාලන කරන ලද ක්‍රමවත් සම්පර්යේෂණ (අත් හදා බැලීම් පර්යේෂණ ) ක්‍රියාවලියක් ඔස්සේ සිදුවීමය. අපගේ ඉන්ද්‍රියන්ගෙන් ලබා ගන්නා





දත්ත විශ්ලේෂණ සහ මෙම දත්ත පිළිබඳ අපේ සංජානනයන් මගින් එය පරිසරය හා බද්ධ කරයි. මේ පරිසරය, අපි සැබෑ ලෝකයයි විශ්වාස කිරීමට තුඩු දෙන කෘත්‍රිම, තාක්ෂණික වශයෙන් පාලන කරන ලද එකක් බව ද සිහිතබා ගත යුතුය. එහි සහේතුක පාර්ශවයෙන් බටහිර, බටහිර විද්‍යාව යන න්‍යායන් ගොඩනැ-ීමේ ක්‍රියාවලියේ දි , තාර්කික ගණිතමය ආකාරයේ ව්‍යුහගත කළ භාෂාවක් භාවිත කෙරේ. එසේ යොදා ගනිමින් රටකට / ප්‍රදේශයකට වැදගත් එහෙත් විශ්ව මට්ටමට යොදා ගැනීමේ වම්නාකමක් ඇති දැනුමක් උත්පාදනය කරයි.

මේ දැනුම උත්පාදනය වන්නේ යම්කිසි සංසිද්ධියක් පිළිබඳවය. මේ සුවිශේෂ සංසිද්ධිය විශ්ව මට්ටමින් පැහැදිලි කළ හැකිය. පුරෝකථනය කළ හැකි ලක්ෂණවලින් යුක්තය. රටකට/ ප්‍රදේශයකට වැදගත් සංසිද්ධිය පිළිබඳව දැනුම උත්පාදනය කිරීමත්, විශ්ව මට්ටමින් යොදා ගැනීමත් යන දෙක අතර තුලනයක් ඇති කරන්නේ කෙසේද? ලෝක විස්තර කිරීම හා පාලනය කිරීම අරමුණක් වී ඇත. ඒ අරමුණ ඉටු කර ගැනීමේ අම්යෙන් තාර්කික පැත්තක් ආනුභවික පැත්තත් අතර ඇති සමරූපිතාව පිළිබඳව නිරන්තරව හා සවිඥානකව සොයා බැලේ.

අනෙක් අතට චීන සහ ඉන්දියානු සාම්ප්‍රදායික විද්‍යාවන්, ඓතිහාසික වශයෙන් බටහිර විද්‍යාවන්ගෙන් බොහෝ දුරට වෙනස්ය. ආනුභවික පාර්ශවයෙන්, බටහිර විද්‍යාවන්ගෙන් දත්ත ස්ථාපිත වන්නේ නිරික්ෂණ ඔස්සේය. කෙසේ දැයි දැන ගැනීමින් මෙය වටහා ගත හැකිය. දත්ත ස්ථාපිත වන්නේ මෙවලම් භාවිතය ඇතිව හෝ නැතිව හෝ කෙරෙන ඉතා සවිස්තරාත්මක ව නමුත් නිෂ්ක්‍රිය නිරීක්ෂණ ඔස්සේය. ආසියාතික විද්‍යාවන් හි තත්ත්වය මීට පටහැනිය. ස්වාභාවික වස්තූන් මිනිසා සංජානනය කරන්නේ කෙසේ ද? යන්න අධ්‍යයනය සඳහා පාලිත කෘත්‍රිම තත්ත්වයන් යටතේ ක්‍රමානුකූල, සංවිධානාත්මක පර්යේෂණ නොකෙරෙන තරම්ය.

තාර්කික පැත්ත අනුව බැලීමේදී පෙනී යන තවත් දෙයක් ඇත. ආසියානු සාම්ප්‍රදායික හැදෑරීම ගොඩනැ-ීමේදී තාර්කික ගණිතමය ආකෘතිය කිසිසේත් ම යොදා ගන්නේ නැත. ආසියානු සංස්කෘතියෙහි ගණිතය ඉහළ වර්ධනයක් ලබා තිබුණ ද, එය යොදා ගනු ලැබූයේ දත්ත විස්තර කිරීමට හෝ සංවිධානය කිරීමට හෝ මිස සිද්ධාන්ත ගොඩනැ-ීමට හෝ නොවේ. තාර්කික ගණිතමය ව්‍යුහයන්ගෙන් තොරව, ආසියානු අර්ධ - විද්‍යාත්මක න්‍යායන් මූලික වශයෙන් ඉදිරිපත් කෙරෙන්නේ ප්‍රතිභා ඥානය හා අනුමානිත පරිකල්පනය ඔස්සේය. ඒවාට සමස්ත ජීවිතයට සහ සමස්ත පරිසරයට ප්‍රවේශ වීමේ හැකියාව ඇති බව සත්‍යයකි.

ආසියානු සාම්ප්‍රදායික විද්‍යාවන් ගැන තවත් දෙයක් පැවසිය යුතුය. ඒවා බටහිර විද්‍යාවන්ගේ වැදගත් අංගයක් වන දෘඩ ව්‍යුහාත්මක සංවිධානයන් සහ තාර්කික ගොඩනැඟීමෙන්, ඌන වූ බව අවධාරණය කළ යුතුය. ආනුභවික දැනුම සහ එහි බුද්ධිමය ඒකාග්‍රතාව අතර සම්බන්ධයේදී නිගමනය/අසත්‍යකරණය (Deduction / Falsification) හෝ උද්ගමනය/සත්‍යෙක්ෂණය (සත්‍යය) පරීක්ෂණය Induction/Verification තහවුරු කිරීම අතර අන්තර් සම්බන්ධතාවන්, ආසියානු සාම්ප්‍රදායික විද්‍යාවන් තුළ පවතින්නේ මඳ වශයෙනි. නමුත් ආසියානු සාම්ප්‍රදායික විද්‍යාවන් අතර ඒකමිතියක් ඇත. උදාහරණයක් වශයෙන්, කොන්ෆියුසියානුවාදය[2] සැලකිල්ලට ගත හැකිය. කොන්ෆියුසියස් වරක් ඔහුගේ ශිෂ්‍ය ට්සූ කුන්ග්ට (Tzu Kung) යොමු කළ ප්‍රශ්නය මෙසේය. මාගේ අරමුණ, බොහෝ දේ ඉගෙන ගෙන ඒවා මාගේ මතකයේ තබා ගැනීම යයි මා විශ්වාස කරනවා යයි කියා ඔබ සිතනවා ද?

Tzu Kung මෙසේ පිළිතුරු දුනි. “ එය එසේ නොවේ ද? ” ඇඳුරුතුමා පිළිතුරු දෙමින් ඒ සියල්ල එකට බඳිනා ඒකමිතියක් (Unity) ඇත.

අප පැහැදිලි කරගත යුතු දෙයක් ඇත. එනම්, සාම්ප්‍රදායික චීන විද්‍යාවන්ගේ ඒකාග්‍රතාවේ ස්වභාවය යම් මානසික සමෝධානයකි. තාම් (අවසාන යථාර්ථය) දර්ශනය ආචාරධර්මීය පදනමකින් යුක්තය. ආචාරධර්මීය ප්‍රයුක්තිය - ස්වාභාවික හෝ සමාජ සංසිද්ධීන් හෝ පාලනය කිරීම - සඳහා තාක්ෂණික මට්ටමෙන් සිද්ධාන්ත යොදා ගැනීමක් සේ නොසැලකිනි.

පුද්ගල ජීවිතයේ සහ සමාජ ජීවිතයේ සැබවින්ම මානුෂීය ලෙසින් සලකන්නේ කුමක්දැයි තේරුම් ගැනීමේ ක්‍රියාදාමය ඍජුව මැදිහත්වීමකි. විද්‍යාව සහ තාක්ෂණය නොසලකා නොහැරිය යුතුය. ආචාරධර්මීය පදනමකින් නැවත සලකා බැලිය යුතුය.

එවැනි සැසඳීම් මත පදනම්ව, පෙර - අපර දෙදිග වෙනස්කම්, තවදුරටත් වෙන්කර හඳුනා ගැනීම සඳහා නව ආකෘතීන් සංවර්ධනය කළ හැකිය. බටහිර නූතන විද්‍යාවන් අවධානය යොමු කරනුයේ විද්‍යාත්මක, න්‍යායානුගත හා තර්කනය කළ හැකි ආකාරයේ හේතු සාධක පිළිබඳවය. නමුත් චීන විද්‍යාවන් අර්ථ විවරණාත්මක යුක්ති යුක්තකරණයක ස්වරූපය ගනී.





දිසානායක සංස්කරණය කළ ග්‍රන්ථයට පාදක වූ සම්මන්ත්‍රණය (1984) සැලසුම් කර තිබුණේ මෙම අරමුණ කරා ළඟාවීමටයි. මහාචාර්ය දිසානායකගේ පොතට පාදක වූ සම්මන්ත්‍රණය පවත්වා වසර විස්සකට වැඩි කාලයක් ගෙවී ඇතත් තවමත් ජයගෙන නොමැති දෙයක් තිබේ. එනම් ආසියාවට ඔබින සිද්ධාන්ත නිර්මාණය වීම සඳහා පර්යේෂණ පැවත්වීමේ අවසන් අදියර වෙත තවමත් ළඟා නොවීමයි.

අද වන විට නිසැකවම ආසියාතික යැයි දැක්විය හැකි සන්නිවේදන න්‍යායන් ඇත්තේ ස්වල්පයකි. සඟරා කිහිපයක් ඇත. *Asian Journal of Communication, Keio Communication Review,* Inter - Asia Cultural Studies යන සඟරාවලට අමතරව ඉන්දියාවේ සේජ් ආයතනය ද සඟරා කීපයක්ම එළිදක්වයි. මෙය බරපතළ කාරණයකි. මන්ද යත් සාමාජීය හා විද්‍යාත්මක පර්යේෂණවලදී සිද්ධාන්තවලට විශේෂ කාර්යභාරයක් පැවරී ඇති බැවිනි. සිද්ධාන්ත පුරෝගාමී, අලුතින් ම සිතීමේ ප්‍රතිඵලයක් නොවේ. නමුත් ශාස්ත්‍රීය විමර්ශනයේ දිශාව සහ ව්‍යුහය හැඩගස්වනුයේ සිද්ධාන්ත මඟිනි.

## බටහිර සන්නිවේදන සිද්ධාන්ත

අද පවත්නා සන්නිවේදන සිද්ධාන්ත හෝ සමාජ විද්‍යාත්මක සිද්ධාන්ත හෝ රාශියක් බිහිවූයේ බටහිර රටවල ඔවුන්ගේ ම සමාජ සංස්කෘතික පසුබිම නිරීක්ෂණය කිරීම තුළිනි. ආසියාවේ පවත්නා පොහොසත් සංස්කෘතික උරුමය ආසියානු පර්යේෂකයා විසින් හඳුනා ගැනීමට අපොහොසත් වීම යනු සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රයට මහඟු දායකත්වයක් සැපයිය හැකි වමිනා සම්පත් ඉවතලීමයි. සිද්ධාන්ත ගොඩනැඟීම සාර්ථක වීමට නම් සිද්ධාන්ත සැකසීමට වැදගත් වන්නා වූ සියලු මානව ඉතිහාස අත්දැකීම්, දර්ශනයන් හා සංස්කෘතික සාම්ප්‍රදායන් සහ සාරධර්ම ද සැලකිල්ලට ගත යුතුය.

අද්‍යතන ජනමාධ්‍ය සිද්ධාන්ත බොහොමයකම ප්‍රභවය ලෙස දැක්විය හැක්කේ සමාජීය විද්‍යාවන්ය. අද්‍යතන මාධ්‍ය සිද්ධාන්ත මේ හේතුව නිසාම මානව විද්‍යාව, ආර්ථික විද්‍යාව, මනෝවිද්‍යාව,දේශපාලන විද්‍යාව, සමාජ විද්‍යාව හා යම් දුරකට ඉතිහාසය යන විෂයයන් කේන්ද්‍ර කොට ගොඩනැඟී ඇත. මේ විෂයයන් බොහොමයක් අධ්‍යයන ක්ෂේත්‍ර වශයෙන් බිහිවූයේ 19 වන සියවසේ අග භාගයේදී හා 20 වැනි සියවසේ මුල් භාගයේදී බටහිර යුරෝපයේ යයි කීම නිවැරැදිය. මේ

විෂයය ක්ෂේත්‍රයන් (ශික්ෂණයන්) තව දුරටත් ඇමෙරිකා එක්සත් ජනපදයේදි වැඩි දියුණු වීමක් ද විස්තාරණය වීමක් ද දැක ගත හැකිය.

සත්‍ය වශයෙන් කියනවා නම් අදාළ සුවිශේෂ විෂයන් සංවර්ධනය වීමේදී නොවැළැක්විය හැකි ලෙසම හා මකා දැමිය නොහැකි ලෙසම ඒවාට සංස්කෘතික සන්දර්භයක් ලැබුණි. ඊට සමාන්තර කාලය හා ස්ථානය අනුව ද බටහිර රටවලම පොදු බවක් විදහා පෑ බව ද කිව යුතුය. අදාළ ශික්ෂණයන්හි මූලධර්ම හා ක්‍රමවේදයන්හි වටිනාකම්වල ද සමාජ ජීවිතය ගැටලුවක් ලෙස ඉදිරිපත් කිරීමේදී ද මේ බටහිර ගැති භාවය අවියෝජනීය ලෙස විද්‍යමාන විය.

ආසියානු පර්යේෂකයින් දැනට ඇති දැනුම් සම්භාරය පිරික්සුමට බඳුන් කරමින් සිද්ධාන්ත ගොඩනැගීම කළ යුතුය. ආසියානු සංස්කෘතිය ප්‍රතිනිර්වචනය කිරීම හා සමාජ ශාස්ත්‍ර ප්‍රතිනිර්වචනය කිරීම ද කළ යුතුව ඇත. එම ක්‍රියාවලට කොතරම් කලක් ගතවේදැයි නිශ්චිතව කිව නොහැකිය. මෙයට " චැන් "සපයන උදාහරණය චීන මහායාන බුද්ධාගමයි. ඔහුට අනුව චීනයේ පවතින මහායාන බුදු දහම, දකුණු ආසියාවේ පවතින ථේරවාද බුදු දහම නොවේ. චීන මහායාන බුදු දහම සංවර්ධනය වූයේ චීන භික්ෂූන් වහන්සේලා විසින් චීන දර්ශනවාදයට අනුව බුද්ධාගම පෝෂණය කිරීමට උත්සාහ ගැනීමේ හේතුවක් වශයෙනි.[4]

බටහිර සිද්ධාන්ත බිහි වූයේ බටහිර විද්වතුන් අතිනි. ඔවුන් මේ සිද්ධාන්ත ගොඩනැගුවේ තමන්ගේ ම මව් රටවල ජීවත් වෙමින් එම රටවල මාධ්‍ය නිරීක්ෂණය කිරීම තුළිනි. මේ කාරණය නිසාම ඔවුහු ගොඩනැගූ මාධ්‍ය සිද්ධාන්ත ඔවුන්ට සුපුරුදු සත්‍ය සංස්කෘතික සන්දර්භයේ ද බටහිර නියම වටිනාකම්වලට ද කළ බලපෑම අනිවාර්යයෙන් ම දක්නට ඇත. මාධ්‍ය සිද්ධාන්ත හඳුන්වා දුන් තමන්ගේ ම සමාජයන් හි වටිනාකම් හුවාදැක් වූයේ නම් එහි වරදක් තිබේ ද? " වටිනාකම් "නොතකන මතයන් තිබිය හැකි ද?

ප්‍රවීණ සමාජ විද්‍යාඥ මැක්ස් වේබර්ගේ ආගම සහ ධනවාදයේ නැගීම *(Religion and the Rise of Capitalism)* යන කෘතිය උදාහරණ වශයෙන් ගත්විට පැහැදිලි වන්නේ එයින් පෙන්වා දෙන්නේ බටහිර ධනවාදයේ නැගීම මිස පෙරදිග ධනවාදයේ නැගීම නොවේ.

සංස්කෘතියේ, සමාජයේ හා ආගමේ වෙනත් ආකාරයන් කෙරෙහි වූ





ආකල්ප සම්බන්ධව සංකීර්ණතාවන් පැවතිණි. එහෙත් මූලික වශයෙන්ම හා ඉමහත් පැහැදිලිතාවකින් යුතුව ඉදිරිපත් වුණු ආකල්පය වූයේ අධිමානිත්වයයි. මේ සුපිරි මතවාදය කාර්මිකරණයේ වාසි, නීතියේ ක්‍රියාකාරිත්වය (Rule of Law) මහ ඉහළින් හුවා දැක්වීය. මේ සුපිරි හැඟීම ( අධිමානය) පිළිබඳ අවබෝධයකින් යටත් විජිත වැඩපිළිවෙළ සාධාරණීකරණ කළ නොහැකිය.

කලින් සඳහන් කළ මැක්ස් වේබර්ගේ පොතෙන් පැහැදිලි දර්ශනයක් පෙන්වා දුන්නේය. එය වෙනෙකක් නොව වඩාත් උචිත බටහිර දර්ශනාත්මක දිශාගත කිරීමක් ඔස්සේ සිදුවිය යුතු භෞතික ලෝකය පිළිබඳ බටහිර දැක්මයි. වෙනත් වචනවලින් කියනවා නම් බටහිර ගැති බවයි. මේ සියලුම ලක්ෂණ දකුණු යුරෝපයේ නොව උතුරු යුරෝපයේ කලින්ම ඇතිවූයේ එක් හේතුවක් නිසාය. දකුණු යුරෝපයේ කතෝලික ආගම වෙනුවට උතුරු යුරෝපයේ ප්‍රොතෙස්තන්ත්‍රවාදය ව්‍යාප්තවීම මීට ප්‍රධාන හේතුවක් නිසාය. ප්‍රොතෙස්තන්ත්‍රවාදයෙන්, ධනේශ්වර දර්ශනය හා පිළිවෙත් කෙරෙහි දැඩි අනුග්‍රාහකත්වයක් පෙන්නුම් කෙරුණු බව ද මෙහිලා පැවසිය යුතුය.

මාධ්‍ය සිද්ධාන්ත පහළවීමට බොහෝ කලකට පෙරම වෙනත් විෂයයන් සම්බන්ධව දැඩි බටහිර ගැති හා බටහිරවාදී දෘෂ්ටියක් පැවතුණු බව ඔබට දැන් පැහැදිලිය. වර්තමාන මාධ්‍ය භාවිතය ආරම්භ වීමට බොහෝ කලකට පෙරම බටහිර ගැති බව මනාව ස්ථාපනය වී තිබුණි.

විසිවෙනි සියවසේ මුල් අඩසියවස තුළ ජනමාධ්‍ය වර්ධනය වීමේදී බොහෝ සිද්ධාන්තවේදීන් ජන සන්නිවේදනය දෙස බැලුවේ වපර ඇසකිනි. ඔවුහු ජන සන්නිවේදනය දෙස බැලුවේ සමාජය පාලනය කරන මෙවලමක් ලෙස හෝ සමාජය තමන්ට ඔබින ලෙස යොද ගැනීමට පාවිච්චි කළ හැකි උපක්‍රමයක් හෝ ලෙසයි. සංස්කෘතික හා සමාජ වටිනාකම්වලට සෘජු තර්ජනයක් ලෙසින් සලකමින් ජන සන්නිවේදනය දෙස බැලූ බව ද කිව යුතුය. පෙළඹවීමටත්, ප්‍රචාරය සඳහාත් ජන සන්නිවේදනය යොදා ගත හැකිය. (නිදසුනක් වශයෙන් හැරල්ඩ් ලැස්වෙල්ගේ සුප්‍රකට සන්නිවේදන සූත්‍රය මේ පෙළඹවීම නැඹුරව පෙන්වයි. කවරෙක් විසින්, කුමක්, කවර චැනලයන් / නාළිකාවන් ඔස්සේ, කුමන ප්‍රතිඵලයක් ඇතිව පවසන්නේද, එය සන්නිවේදනය නම් මේ යයි ලැස්වෙල්ගේ සූත්‍රයේ සඳහන් වේ.) ජන අධ්‍යාපනය සඳහාත් ජගත් මට්ටමින් තොරතුරු ව්‍යාප්තිය සඳහාත් යොදා ගත හැකිය යන මතවාදයක් ද ව්‍යාප්ත වන්නට විය. ජන සන්නිවේදනය ඔස්සේ බහුජන දේශපාලනය,

ප්‍රචාරණය සහ ප්‍රශස්ත ජීවිතයක් යනු කුමක් ද පිළිබඳ ඉදිරිපත් කළ ප්‍රතිරූපත් හරහා මහා පරිමාණ භාණ්ඩ පරිභෝජනයත් පාරිභෝගික සංස්කෘතියකුත් ප්‍රවර්ධනය කළේය.

ජනමාධ්‍ය මගින් උන්නතිකාමය දිරිමත් කළ අතර කාර්මික සංවර්ධන උදෙසා කම්කරු සංචලනය හා ජනගහන සංචලනය ද දිරිමත් කළේය. තව ද රැඩිකල් සමාජ වෙනසක් සිදුවන කාලවකවානුවක පොදු තොරතුරු, පොදු විශ්වාස හා පොදු මතයන් ආදිය යොදා ගෙන සමාජය එකට බැඳ තැබීමට ද ජනමාධ්‍ය මහෝපකාරී විය. බලයේ සිමින පිරිසට බලය රඳවා ගෙන සිටීමට ද ජනමාධ්‍ය උදව් විය.

බටහිර කාර්මික සමාජයන්හි ප්‍රගතිය උදෙසා ජනමාධ්‍ය මගින් ලබාදිය හැකි යයි විශ්වාස කළ දායකත්වයන්ට සමපාතී ලෙසින්ම යම් යම් අන්තරායන් ද නොතිබුණා නොවේ. ජනමාධ්‍යයන්ට නිරන්තරව යොමුවීම හේතුකොට ගෙන පුද්ගලයින් සමාජයෙන් බෙහෙවින්ම ඈත්වීම සිදුවේ. ඒ හේතුව නිසාම විවිධ අවුල් වියවුල් මානසික ඝට්ඨන ආදිය ද අනිවාර්යෙන්ම ඇති වේ. අනිසි අර්බුද හා අනිසි තරගය ද නොවැළැක් විය හැකිය. සමාජයේ, විශේෂයෙන්ම තරුණ කොටස් හා වැඩ කරන පංතිය ද අතර සාමාන්‍යයෙන් දක්නට ඇති පිළිවෙළ සහගත බව, බිඳීයාමට ජනමාධ්‍ය හේතුකාරකයක් වේ. මේ තත්ත්වය ඇතිවන්නේ පෞද්ගලික අවශ්‍යතා ඉටුකර ගැනීමට පෙළඹවීම, උදාසීනත්වය දිරිගැන්වීම මෙන්ම ලිංගික ජීවිතය මිනැවට වඩා උලුප්පා දැක්වීම ආදී කාරණා නිසාය.

1955 දී සී.ඩබ්ලිව්. මිල්ස් දැක්වූ අදහස දෙසට හැරෙමු. ඔහු කීවේ එක-ත්වය, කීකරු බව, පුද්ගලයාගේ කැමැත්ත හා නිර්මාණශීලීත්වය රහිතවීම යන ලක්ෂණවලින් යුත් සමාජයක් ඇති වී තිබෙන බවයි. එවැනි සමාජයන් ඇතිවීමට ප්‍රධානම හේතුකාරකය වූයේ ජනමාධයේ බලය භාවිත කොට බලගතු ආර්ථික,දේශපාලනික හා ආර්ථික බලපුළුවන්කම් ඇති පිරිසේ කැමැත්ත මත රඳා පවත්නා සමාජ ක්‍රමයක් බිහිවීමයි. ක්ෂණික දියුණුවක් ඇති කිරීමේ විස්මිත (ඉන්ද්‍රජාලික) බලයක් ජනමාධ්‍ය සතුව පවතින බව මෙම පර්යේෂකයෝ පෙන්වා දුන්හ.

දෛවය නිසා සියල්ල සිදුවන්නේය යන මතවාදය නැති කිරීමට ද ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීමට ද ජනමාධ්‍යයට ශක්තියක් ඇතැයි පැවසෙන්නට විය. තව ද ග්‍රාමීය, ප්‍රාදේශිකවාදී සිතිවිලිවලින් ජනතාව මුදවා ගැනීමට ද හැකි





අද්භූත බලයක් ජනමාධ්‍ය සතුව පවතින බව පර්යේෂණවලින් අවධාරණය කැරිණි. මේ අමෙරිකානු පර්යේෂකයින් හඬ නගා කීවේ කුමක් ද? වෙනත් වචනවලින් කියනවා නම් මැක්ස් වේබර්ගේ චින්තනයේ සමාලෝචනයක් හා යාවත්කාලීන කිරීමක් පමණි. තව ද සාමූහික ආගමික විශ්වාසවල සිට පෞද්ගලික මනෝවිද්‍යාව (පෞද්ගලිකත්වය අවධාරණය කිරීම) දෙසට අවධානය හැරීමයි. එහෙත් ජන සන්නිවේදනය වාර්ගික කේන්ද්‍රීත්වයෙන් කිසිසේත් මිදුනේ නැත.

මහාචාර්ය එවරට් එම්. රොජර්ස් ප්‍රමුඛ සංවර්ධන සන්නිවේදන විශේෂඥයින් වාර්ගික කේන්ද්‍රීත්වයෙන් තරමක් මිදුණු වඩාත් අපක්ෂපාතී නවීකරණ විසරණය පිළිබඳ සිද්ධාන්තය ඉදිරිපත් කළහ. කෘෂිකර්මය, සෞඛ්‍ය, පවුල් සංවිධානය හා සංවර්ධන සැලසුම් සඳහා ඉහතින් දැක් වූ අදහස්වලින් ගම්‍යවන ප්‍රධාන කාරණය කුමක් ද?

මුල්කාලීන සිද්ධාන්තවේදීන් විසින් ජනාමධ්‍ය දෙස බැලුවේ බටහිර ගැති දෘෂ්මියකිනි. කොමියුනිස්ට්වාදය ව්‍යාප්ත වූ රටවල් ගැන ද යමක් කිව යුතුය. ජනමාධ්‍ය යනු ආර්ථික හා භෞතික ප්‍රගතිය ළ-ාකරන හා සමාජ හා සංස්කෘතික වෙනස ඇති කරන මාර්ගයක් ද නව සමාජ ක්‍රමය පාලනය කරන උපකණයක් ලෙස දක්නා ලදි. ධනවාදී රටවල දෘෂ්ටිය වූයේ ජනමාධ්‍ය යනු සමාජය අවුල්කරන ලක්ෂණයන්ගෙන් සමන්විත බලවේගයක්ය යන්නය. ධනේශ්වර රටවල මේ දර්ශනයට අඩු අවධානයක් යොමු කළ වෙනත් දර්ශනයක් කොමියුනිස්ට්වාදී රටවල දක්නට හැකි විය. සෝවියට් සිද්ධාන්තය වූයේ මාධ්‍ය ක්‍රියාකාරීත්වය සමාජය ප්‍රතිසංස්කරණයට යොදාගත හැකි ප්‍රබල අවියක්ය යන්නය. ඒ මතය ව්‍යාප්ත විය.

## මාධ්‍ය හා සංවර්ධනය පිළිබඳ සාම්ප්‍රදාය

මාධ්‍ය සිද්ධාන්තය අරභයා වූ බටහිර ගැති බව අනිවාර්යෙන්ම පෙන්වා දෙන්නේ සංවර්ධනය හා සන්නිවේදනය පිළිබඳ බටහිර සිද්ධාන්ත මගින්ය. නවීකරණය යන සංකල්පය දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු කාලයේ අමෙරිකානු පර්යේෂකයන්ගේ ඉමහත් අභිරුචි මාතෘකාවක් විය.

1950 දශකයේ ඩැනියෙල් ලර්නර් හා විල්බර් ශ්‍රාම් ආදීන්ගේ සංවර්ධන සන්නිවේදන පර්යේෂණ නිසා සංවර්ධනය කරා ගමන් කිරීමට අපේක්ෂිත හා අඩු දැනුම හා අවබෝධය ඇති රටවල්වල නව උනන්දුවක් ජනිත වීය. නවීනත්වය

පිළිබඳ සංශෝධිත පණිවුඩය ගෙනයන වාහකයක් ලෙස ජනමාධ්‍ය ඉදිරියට පැමිණයත් කලින් පැවති මතවාදී ලක්ෂණවලින් මුළුමනින්ම මිදුනේ නැත. ආයතනික ස්වරූපයන් ද, වෘත්තිය දෘෂ්ටීන් ද, බලපෑම් ගලනය සම්බන්ධ සාමාන්‍ය දිශාව ද වෙනස් වූයේ නැති තරම්ය.කලින් මෙන්ම බටහිරවාදී ස්වරූපය එලෙසම පැවති බව කීම නිවැරදිය. භෞතික සංවර්ධනය සඳහා ඉදිරිපත් කළ මාර්ගෝපදේශ පද්ධතිය බටහිර ගැති සංස්කෘතික හා සමාජ සන්දර්භයක් ඉදිරිපත් කළ බව කිව යුතුය.

## විචාරාත්මක පරායත්තතාව (යටත්බව;පරාධිනතාව)

පෙරදිග හා අපරදිග සබඳතා විශ්ලේෂණයේදී අවධානය නව විචාරාත්මක සුසමාදර්ශයක් කරා යොමු වී ඇත. මෙය බොහෝ විට හැඳින්වූයේ සංස්කෘතික හෝ අධිරාජ්‍යවාදී මතය වශයෙනි. විශ්ව සන්නිවේදනයේ අසමතුලිත ගලනය අනෙකක් නිසා නොව ව්‍යුහවාදී හා " අපනයනය " කළ ඌන සංවර්ධනය හා පරායත්තාව (ගැති බවට දින භාවය)නිසා ඇතිවූවක් බව, නව මතවාදයෙන් ඉදිරිපත් කළ තර්කයයි.

1970න් පසු කාල පරිච්ඡේදය තුළ පෙරදිග හා අපරදිග සබඳතා විග්‍රහ කිරීමට සංස්කෘතික අධිරාජ්‍යවාදය, මාධ්‍ය අධිරාජ්‍යවාදය, යන නව වදන් මාලාවක් හඳුන්වා දෙනු ලැබුණි. ගෝලීය සන්නිවේදනයේ අසමතුලිත ගලනය යන වදන ද භාවිත කෙරිණි. මේ සියල්ල ව්‍යුහමය හෝ ආනයනිත ඌන සංවර්ධනයේ හා පරාධිනත්වයේ ප්‍රතිඵල ලෙස විග්‍රහ කෙරිණි. සංස්කෘතික අධ්‍යයන ක්ෂේත්‍රය මේ නිසා ඉදිරියට ආවේය.

සුපිරි අමෙරිකානු මාධ්‍ය නිෂ්පාදන, සංවර්ධනය වන රටවලට ගලා ඒම නිසා සංස්කෘතික අධිරාජ්‍යවාදය පැතිරෙන බව විවේචකයෝ කියා පෑහ.

## ආසියානු සන්නිවේදන න්‍යාය

අතීත සන්නිවේදන න්‍යාය, ප්‍රචාරණය සහ මාධ්‍ය බලපෑම් පිළිබඳ අධ්‍යයන තුළින් මූලිකව ම බිහිවී ඇත. උදාහරණයක් ලෙස අද ජනප්‍රියතාවට පත්ව ඇති ඩෙනිස් මැක්වෙල්ගේ ජනසන්නිවේදන සිද්ධාන්ත කෘතිය ගනිමු. ඔහුගේ සන්නිවේදන න්‍යායන් තුළ, සාකච්ඡා කරන්නේ ජන සන්නිවේදන න්‍යායන් පමණි.





ඒවා ජනමාධ්‍යවල ස්වභාවය සහ ආදීනව පිළිබඳ නිරීක්ෂණ සහ සාක්ෂි මගින් පොදුභාවයට පත් වූ න්‍යායන්ය.

අද සන්නිවේදන පර්යේෂණවලදී අවධානය යොමුවන්නේ ජනමාධ්‍යයටයි. කෙසේ වෙතත්, ජනමාධ්‍ය ක්‍රමවත්, ඒකාබද්ධ බහු කාර්ය සන්නිවේදන සහ තොරතුරු පද්ධතියක කොටසක් වී ඇති බව අමතක නොකළ යුතුය. ශීඝ්‍ර ලෙස ගෝලීයකරණය වන සමාජයක, සන්නිවේදන න්‍යායන් වඩා පුළුල් සහ ගතික දෘෂ්මියක් ගැනීමේ අවශ්‍යතාව මතුවී ඇත.

දැනටමත් මතුවී එමින් පවතින සන්නිවේදන න්‍යාය පිළිබඳ අපගේ අවබෝධය, ග්‍රහණය කර ගැනීමේ අපහසුතාව අප පිළිගන්නේ යයි සිතමු. එවිට මතු වන වැදගත් කාරණයක් ඇත. සන්නිවේදන න්‍යායට "ආසියානු" යන විශ්ලේෂණය යෙදීමෙන් එහි නිර්වචනය වඩා අපැහැදිලි වන බව අප පිළිගත යුතුය. වඩා විශේෂිතව කිවහොත්, "ආසියානු" යන යෙදුම එක් කිරීමෙන් අප බලාපොරොත්තු වන්නේ න්‍යාය භාවිතයේ ඉලක්කය විශේෂිකරණය කිරීමක් ද, නැතිනම් එහි සංස්කෘතික පර්යාලෝකය හුවාදැක්වීමක් ද? මහාචාර්ය විමල් දිසානායකට අනුව න්‍යාය ආසියාතික වීමට ඉහත සඳහන් සියල්ල අවශ්‍ය වෙයි.

නව සංස්කෘතික අනන්‍යතාවක් ඇති සහ මානව සන්නිවේදනයේ සංකීර්ණභාවය වඩා හොඳින් අවබෝධකර ගැනීමට සහ වඩා පැහැදිලිව සංකල්පනය කිරීමට අවස්ථාව සලසන ආකෘතියක් ගොඩනැ්‍ීම, අවශ්‍යතාවය යැයි සිතමු. අවශ්‍යතාව එය නම් ඔවුන් විසින් යාන්ත්‍රික ඇරිස්ටෝටලියානු ආකෘතියේ උත්තේජනයෙන් මිදීම අනිවාර්යයෙන්ම කළ යුත්තකි.

ජනයාගේ සංස්කෘතික ආචාරධර්මයන් නිරූපණය කරන සන්නිවේදන ආකෘති සහ න්‍යායන් ගොඩනැ්‍ීම සඳහා ආසියානු මානව ශාස්ත්‍රයන්හි ඥානය කෙසේ උකහාගත යුතුදැයි සොයාගැනීමට ඔවුන් උත්සුක විය යුතුය. ගවේෂණය කළ යුතුය.

මෙවන් ගවේෂණයක් හුදෙක් එම කාරණය සඳහා වඩාත් උචිත වනවා සේම ප්‍රයෝජනවත් වේ. සන්නිවේදන සිද්ධාන්ත සොයා යාමේදී භර්තෘහරිගේ " වාක්‍යපදිය " නමැති ග්‍රන්ථය මෙහිදී වැදගත් වන බව මහාචාර්ය විමල් දිසානායක පවසයි. වාක්‍යපදිය භාෂාවත් දර්ශනයත් සියුම් ලෙස ඒකාබද්ධ කරන ශබ්ද

තත්ත්වය නැමැති සංකල්පය ජැක් ඩෙරිඩාගේ විග්‍රහයන්ට සමානත්වයක් දරන බව මහාචාර්ය දිසානායක තව දුරටත් පවසයි. "වාක්‍යපදිය" ඇතුළත් ඇතැම් සංකල්ප ජැක් ඩෙරිඩාගේ පශ්චාත් නව්‍යවාදී භාෂාත්මක විශ්ලේෂණයන්ට සමීපවේ යැයි පවසන දිසානායක භර්තෘහරිගේ ශබ්ද තත්ත්වය සංකල්පය වටහා ගැනීමට ඩෙරිඩාගේ අසාම්‍යය (Difference) යන සංකල්පය උපකාරීවේ. අසාම්‍යය යන සංකල්පය වටහා ගැනීමට ශබ්ද තත්ත්වය යන සංකල්පය ඉවහල් වේ.

සන්නිවේදන ප්‍රජාවෙන් වැඩිදෙනෙක් මහාචාර්ය දිසානායකගේ බලාපොරොත්තු සම- ඒකාත්මික වන බවට විවාදයක් නැත. උක්ත ප්‍රකාශයේ දී යම් පරස්පරතාවන් ද දක්නට (Contradictions) ඇත. න්‍යායන් නිර්වචනය වන්නේ, කරුණුවලින් උකහාගත් ප්‍රස්තුත හෝ සංකල්ප හෝ සමුදායන් ලෙසයි.

සුප්‍රකට සමාජ ශාස්ත්‍ර පර්යේෂකයකු වූ ෆ්‍රෙඩ් කර්ලින්ජර් සිද්ධාන්තයන් විග්‍රහ කරන්නේ මෙසේය. සිද්ධාන්තයක් යනු අන්තර් සබඳතාවක් ඇති සංකල්ප, අර්ථ නිරූපණ හා ප්‍රස්තුත සමූහයකි. සිද්ධාන්තයකින් සංසිද්ධීන් පිළිබඳ ක්‍රමවත් දැක්මක් ඉදිරිපත් කරයි. සංසිද්ධීන් පැහැදිලි කිරීමෙන් හා පුරෝකථනය කිරීම මගින් විවිධ සාධක (විචල්‍යයන් ) අතර සබඳතා පැහැදිලි කරයි. A theory is a set of interrelated constructs (concepts),definitions, and propositions that present a systematic view of phenomena by specifying relations among variables, with purpose of explaining and predicting the phenomena. (Kerlinger, 1996)

න්‍යායක් ගොඩනැගීමේ දී යම් සංස්කෘතිකට විශේෂිත වූ අදහස්, චින්තනය සහ සමුච්චිත බුද්ධිය නිසැකවම වටිනා දායකත්වයක් දරනු ඇත. එමෙන්ම සංස්කෘතික වටිනාකම් සහ ලෝකදෘෂ්ටීන් ද පර්යේෂකයන්හට ප්‍රයෝජනවත්ය. ඉහතින් සඳහන් කළ සියලු කාරණා, ඔවුන්ගේ පර්යේෂණ කටයුතුවලදී විශේෂිත යථාදැක්මක් නතුකර ගැනීම සඳහා ඔවුන් යොමුකරනු ඇත. කෙසේ වුවත් මෙම අදහස්, බුද්ධිය, ලෝක දෘෂ්ටීන්,ක්ෂණිකව සිද්ධාන්ත තනන්නේ නැත. කීර්තිධර දාර්ශනිකයෙකු වූ, මාරියෝ බන්ජ් (Mario Bunge) පවසා ඇත්තේ " සිද්ධාන්ත කිසිදා පූර්ණව සංවර්ධනය වී බිහිවී නැත " යනුවෙනි. මාරියෝ බන්ජ්ට අනුව සිද්ධාන්ත ඇරඹෙනුයේ ව්‍යාකූලත්වයෙන් යුතු යම් තරමක් ලිහිල්ව සම්බන්ධ වූ, අපැහැදිලි සංකල්ප ඇතුළත් ප්‍රස්තුතයන් ලෙසිනි. ඒවා කලල රූපයක් සේ සංවර්ධනය විය යුතුය. ඒ සඳහා එකතු කිරීම, උකහා ගැනීම, නිදර්ශනය සහ





සාමාන්‍යකරණය හරහා සංකල්ප ඔප්නැංවීම සහ ආනුභවික දත්තයන්ට එදිරිව පරීක්ෂා කිරීම සිදුවිය යුතුය.

සන්නිවේදන සිද්ධාන්ත ගෝලීය වශයෙන් භාවිත කිරීමේ හැකියාවක් ඇති අතර, විශේෂ කොට්ඨාසයකට සීමා නොවේ. සිද්ධාන්ත සඳහා, සාමාන්‍යකරණය නොවැළැක්විය හැක්කකි. අවම මට්ටමින් ඒවා ගෝලීය වීමට ප්‍රමාණවත් ධාරිතාවක් ඇත. උපරිම මට්ටමේ පරිපූර්ණ ගෝලීය බවක් ද ඇත. යම් න්‍යායක අදාළ භාවය හෝ වලංගු භාවය හෝ යම් ජන කොටසකට සීමාවන්ගේ නම් හෝ නිශ්චිත සමාජයීය තත්ත්ව යටතේ පමණක් අදාළ වන්නේ නම් හෝ එය තවමත් න්‍යායක් බවට පත්ව නැත. එය උපරිම වශයෙන් සීමිත වපසරියක පමණක් ක්‍රියාකළ හැකි ලිහිල් උපකල්පනයක් පමණි.

ඉන්දියාව, ශ්‍රී ලංකාව, පාකිස්තානය, නේපාලය, බංග්ලාදේශය, භූතානය, ජපානය, මලයාසියාව, කොරියාව සහ තායිවානය යන රටවල සමාජයන්ට ගැළපෙන සන්නිවේදන න්‍යායන් අප සතුව ඇතැයි අප පවසන්නේ යැයි මොහොතකට සිතමු. ඒ අනුව නව දිල්ලිය, කොළඹ, ඉස්ලාමාබාද්, කත්මන්ඩු, ඩකා, තිම්පු, ටෝකියෝ, ක්වාලාලම්පූර්, සෝල්, තායිපේ යන නගරයන්ට වඩාත් ගැළපෙන න්‍යායන් අප සතු විය යුතයැයි ද තර්ක කළ හැකිය. තව ද ඒ ප්‍රධාන නගරවල යම් විශේෂිත ජන කොටසකට වඩා ගැළපෙන න්‍යායන් තිබිය හැකියැයි ද තව දුරටත් තර්ක කළ යම් විශේෂිත ජන කොටසක් ඉලක්ක කොට සීමා කළ නොහැකි බවයි.

එම තර්කය අනුවම යමින්, යම් ආකෘතියක් (උදාහරණය ග(ර්)බ්නර් ආකෘතිය), ආසියාවේ දෝෂසහගත වන්නේ නම්, එය වෙනයම් ප්‍රදේශයක දී වුව ද දෝෂ සහගත වීමේ වැඩි ඉඩක් ඇත. (ගර්බ්නර් ආකෘතිය ගැන සන්නිවේදන විමසුම, සදීපා, 2000 ) එම නිසා එහි බලපෑමෙන් මිදීමට අවශ්‍ය වන්නේ ආසියානු අද්‍යතන ප්‍රජාව පමණක් නොවේ.

ආසියානු සන්නිවේදන න්‍යාය යන්නෙන් ආසියාවට හා ආසියානුවන්ට වඩාත් අදළ වන න්‍යායක් හ-වන්නේ නැද්ද? එසේ නැත්නම් එයින් අදහස් වන්නේ, ආසියාව තුළින් උත්පාදනය වන සන්නිවේදන න්‍යායන් ගැන ද? එය එසේ නම්, අප මුහුණ දිය යුතු තවත් ප්‍රශ්නයක් ඇත. එනම්, සම්භවය (Origination) යනුවෙන් අදහස් වන්නේ කුමක් ද? එයින් අදහස් වන්නේ, ආසියාවේ සංවර්ධනය මත පදනම්ව

න්‍යායන්ද? හෝ ආසියානු මානව විද්‍යාවන්ගේ සමුච්චිත බුද්ධියෙන් උකහාගත්, ආසියානු විද්වතුන් විසින් ගොඩනැ-ූ න්‍යායන් ද? එසේත් නැත්නම් හෝ සුවිශේෂි ආසියානු දැක්මකින් යුතු න්‍යායන් ද?

ස්වභාව ධර්මය හැර අන් සියලු දේ සංස්කෘතිය ලෙස කෙනෙකුට තර්ක කළ හැකිය. එසේ වුවත්, යම් න්‍යායන් තුළ සංස්කෘතික ගුණාංග කා වැදී ඇති ද, එසේනම්, ඒ කොපමණ දුරකට ද යන්න නිශ්චය කර ගැනීමට උත්සාහ කිරීම නම් ඉතා දුෂ්කර කටයුත්තකි. ඇතැම් විට කිසිසේත්ම කළ නොහැක්කකි. මෙය වෙසෙසින් සත්‍යයක් වන්නේ, සන්නිවේදන න්‍යායක් ගොඩනැ-ීමේ දී මතුවන සංස්කෘතික වෙනස්කම් දෙස සමීපව බැලීමේදීය.

මුළුමනින්ම හා පැහැදිලිවම ආසියානු සිද්ධාන්ත නිර්මාණය කරනු වෙනුවට බටහිර රාමුව තුළ සිද්ධාන්ත ගොඩනැ-ීමට වැඩි ප්‍රයත්නයක් ගත යුතුය යන හඬක් නැගෙන්නට පටන්ගෙන ඇත. වැන් (2000) ආසියාවේ සන්නිවේදන අධ්‍යයනයන්හි ඇති ඛේදනීය තත්ත්වය සාකච්ඡාවට බඳුන් කරයි. අපි කැමැති වුවද අකමැති වුවද අමෙරිකාව සන්නිවේදන පර්යේෂණයේ කේන්ද්‍ර ස්ථානයයි. එහෙත් එමගින් අර්ථ ගැන්වෙන්නේ සෙසු සැම දෙනෙක් ම එය අනුගමනය කළ යුතු බව නොවේ.

වැන් එයට පටහැනිව යෝජනා කරන්නේ ආසියානු පර්යේෂකයින් තම සන්නිවේදන ගැටලුවල උචිත බව අන්තර්ජාතික විශ්වවිද්‍යාල ප්‍රජාවට පෙන්වා දෙමින් සිද්ධාන්ත ගොඩනැ-ීම කළ යුතු බවයි. සිද්ධාන්ත ගොඩනැ-ීමෙන් පමණක් භූ ගෝලීය හා සංස්කෘතික කාරණා මගින් ආසියානු පර්යේෂකයින්ට පනවා ඇති වම්නාකම් පිළිබඳ බාධාවන් අතික්‍රමණය කොට සෙස්සන් සම- අර්ථවත් සාකච්ජාවක් ඇරඹිය හැකිය. එහෙත් වැන්ගේ තර්කයෙන් ඉස්මතු නොවන කරුණ වන්නේ මෙසේ ගොඩනැ-න සිද්ධාන්ත පැහැදිලිවම ආසියානු ලකුණක් පෙන්නුම් කරන්නේද? යන්නයි.

ආසියාව හෝ ආසියානුවන් හෝ පිළිබඳ වූ සන්නිවේදන අධ්‍යයන බොහොමයක් හුදු විස්තරාත්මක ඒවා පමණි. පවත්නා සිද්ධාන්ත පිරික්සුමට බඳුන් කරන අධ්‍යයනවල සොයා ගැනිම්, බොහෝ විට ඒවායේ පැන නි-න න්‍යායාත්මක ගැටලු සාකච්ජාවට බඳුන් කරන්නේ නැත.ආසියාව පිළිබඳව පර්යේෂණ රාශියක්ම අද ග්‍රන්ථ වශයෙන් එළි දක්වා ඇත. ප්‍රකාශන සමාගම් රාශියක් විසින්ම ආසියාව,





ආසියාවේ සංස්කෘතික අධ්‍යයන, ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාව හා සමාජ ගැටලු පිළිබඳ ප්‍රකාශන රාශියක් එළිදක්වා තිබේ. ආසියානු ජාතිකයින් සිය ප්‍රමුඛ අවධානය යොමු කළ යුත්තේ ආසියානු දේ කෙරෙහිය.

න-ි එන්නාවූ ආසියානු සන්නිවේදන ආකෘතිවල හා සිද්ධාන්ත වල අදාළත්වය පිළිබඳව ද තවදුරටත් එවැනිම පර්යේෂණ පැවැත්වීම යෝග්‍යය. සංස්කෘතික හා දේශපාලනික අනන්‍යනතාවන් සොයා යෑම සමාන්තර සාධක දෙකක සන්දර්භය ඔස්සේ තේරුම් ගත යුතුය. එකක් ගෝලීයකරණයයි. අනෙක් අදාළ රටට උචිත ලෙස යොදා ගැනීමයි. කලාපීයකරණය (Localisation) නවීනත්වය හේතු කොට ගෙන ආසියාව සෙසු ලෝකයේ රටවල්වලට ද විවෘත වී තිබේ. තාක්ෂණය හා කළමනාකරණය ආසියාවට ගලා ඒම නිසා මේ රටවලට ශීඝ්‍රයෙන් සංවර්ධනය කරා යාමට පහසුවී ඇති වා පමණක් නොව අලෙවි පොළ සම්පත් යන සාධක නිසා අවශේෂ ලෝකයා සම- තවදුරටත් අන්තර් සබඳතා ගොඩනංවා ගැනීමට ද හැකිවී තිබේ.

ගෝලීයකරණය යන ක්‍රියාවලිය නිසා තමන්ගේ සංස්කෘතික හා දේශපාලනික අනන්‍යතාවන් පවත්වා ගෙන යාමේ වැදගත්කම ද ආසියානු රාජ්‍යයන් විසින් තේරුම් ගෙන තිබේ. මේනිසාම ආනයනික කළමනාකරණය සහ අදහස් තමන්ට ඔබින ලෙස යොදා ගැනීමේ ක්‍රියාවලිය හා ආසියානුකරණය (දේශීයකරණය) යන වැඩපිළිවෙලක් ද සමගාමීව ඇරඹී තිබේ. බටහිර තාක්ෂණයත්, කළමනාකරණ සංකල්ප හා අදහසුත් තමන්ට ඔබින ලෙස යොදා ගෙන ආර්ථික ප්‍රගමනය කරා ගමන් කිරීම මේ රටවල උත්සාහය වී තිබේ. ගෝලීය ආර්ථිකයක් කරා යන අතරතුර දේශීය ලෙසින් තම රටේ සංස්කෘතික බැම් බිඳ නොගනිමින් සිටීමට මේ රටවල් දැඩි අරගලයක යෙදී සිටිති.

නමුත් ඇත්තෙන් ම මේ මෙහෙවර කුමක් ද? ඉහත සඳහන් කරුණු දැක්වීමෙන් මතුවන ප්‍රශ්න කිහිපයක් ම ඇත. ආසියානු සංස්කෘතියට අනුව බටහිර සන්නිවේදන සිද්ධාන්ත නැවත විභාග කිරිමේ නොහැකියාව එකම ගැටලුව නොවේ. තව ද සන්නිවේදන පර්යේෂණ අදහස් පොහොසත් කිරිම සඳහා ආසියානු දාර්ශනික චින්තනයට සහ සම්ප්‍රදායන් වෙත යොමු නොවීම අනෙක් ගැටලුව ද නොවේ. තව දුරටත් අවධාරණයට ලක් විය යුතු වෙනත් කරුණු ද තිබේ.

ආසියානු රටවල පුවත්පත් කලාව සංවර්ධනය වීමට බටහිරින් සාධනීය

බලපෑමක් ලැබී ඇතැයි යන්න පහසුවෙන් ප්‍රතික්ෂේප කළ නොහැකි සත්‍යයකි. ඒ ආකාරයටම ආසියානු පුවත්පත් කලාවට බටහිරින් අයෝග්‍ය හා අනුචිත බලපෑම් ද එල්ල වී ඇති බව ද පහුසවෙන් බැහැර කළ නොහැකි තර්කයකි. මේ නිශේධනාත්මක බලපෑම වඩාත් ප්‍රකටව පෙනෙන්නේ භාවාත්මක ප්‍රවෘත්ති වාර්තා කිරීම, පසමිතුරු ලෙසින් පුවත්පත් කලාව ක්‍රියාත්මක කිරීම (Adversary Journalism) හා විනෝදාස්වාදයට වැඩියෙන් බරවීම ආදි කරුණු අශ්‍රිතවයි.

ආසියාවේ සන්නිවේදන සංසිද්ධීන් පූර්ණ ලෙසින් විස්තර කිරීමට හා පුරෝකථනය කිරීමට බටහිර සන්නිවේදන සිද්ධාන්තවලට නොහැකි වී ඇත යන්න එල්ල වන ප්‍රධාන චෝදනාවකි. උදාහරණයක් වශයෙන් වයසින් වැඩිමහළුවීම හා බැඳි වටිනාකම් හා සාරධර්ම ආසියානු කලාපයට ම සුවිශේෂ වන බව පෙනේ. පුද්ගලයින්ගේ සමාජ තත්ත්වය ද ආසියානු රටවල වැදගත් සාධකයකි. ආසියානු රටවල සුවිශේෂි දාර්ශනික හා ආගමික පසුබිම් ආදිය විස්තර කිරීමට බටහිර සිද්ධාන්තවලට හැකියාවක් ලැබී නැතැයි ගොට්බර්ග් තර්ක කරයි. (Gotberg 1985)

ආසියාවේ නවීකරණය හෝ සංවර්ධනය යම්තාක් දුරකට බටහිර කරණය ලෙස සැලකීමේ ප්‍රවණතාවක් දක්නට ඇත. එසේ වන්නේ තාක්ෂණය හා කළමනාකරණය බටහිරෙන් ආසියාවට පැවරීමේ ක්‍රියාවලියේදිය. බටහිර තාක්ෂණය හා කළමනාකරණය අසියාවට සම්ප්‍රාප්තවීමත් සම-ම බටහිර වටිනකම් හා අදහස් එම රටවලට ගලා එන්නට පටන්ගෙන ඇත. මෙනිසාම ආසියානුවන්ගේ චින්තනය ද ක්‍රියාකලාපය ද දැඩි බටහිර බලපෑමකට ගොදුරුව ඇත. බහුජාතික හා පාරජාතික සමාගම්වල සම්ප්‍රාප්තියත්, කොකා කෝලා, පෙප්සි, මැක්ඩොනල්ඩ්, ව්‍යාපරයේ බිග් මැක්, කෙන්ටාකි ප්‍රයිඩ් චිකන් (KFC), පීට්සා හට් සමුහයේ පීසා ආදි ආහාරපාන වර්ග මේ රටවල ව්‍යාප්තවිම ද බටහිර ජීවන ක්‍රමය මේ රටවල කුළුගැන්වීමට ආධාරක වී ඇත. බටහිර ගැති ටෙලි නාට්‍ය, චිත්‍රපට හා වෙනත් රූපවාහිනී වැඩ සටහන් ව්‍යාප්ත වීම නිසා ද මේ තත්ත්වය උග්‍ර වී ඇත.

බටහිර බලපෑම් මධ්‍යයේ වුවද තම සංස්කෘතික අනන්‍යතාවන් හා දේශපාලන අනන්‍යතාවන් නොවෙනස්ව පවත්වා ගෙන යාමට ආසියානු දේශපාලන නායකයින් විසින් (යම් යම් රටවල)විශාල සටනක යෙදෙන බව සත්‍යයකි. බටහිර ආධිපත්‍ය පතුරුවාලීමේ ක්‍රියාවලියේ දී වැඩිම බලපෑම එල්ල වන්නේ බහුජාතික හා පාරජාතික මාධ්‍ය ආයතන විසින් විකාශය කරනු ලබන වැඩසටහන් මගින්ය. අසමතුලිත තොරතුරු ගලනය මේ තත්ත්වය තවත් උග්‍ර අතට පත් කොට තිබේ.





මේ හේතුව නිසාම දේශපාලන නායකයෝ ද, බුද්ධිමත්තු ද, ශාස්ත්‍රාලයීය උගත්තු ද, ආසියානු වටිනාකම් හා හර පද්ධතීන් ගවේෂණය කිරීමට පෙළඹී සිටිති. නිරන්තරව හුවා දක්වන ආසියානු වටිනාකම් රැසක්ම ඇත.

සාමුහිකත්ව, මා පිය සෙනෙහස, දරුවන්ගෙන් මා පියන්ට විය යුතු යුතුකම් හා වගකීම්, මහන්සි වී වැඩ කිරීම, මමත්වය පසෙකලා රට හා ජාතිය කෙරෙහි ඇල්මක් ආදරයක් දැක්වීම, අයිතිවාසිකම් නොව වගකීම් ගැන වැඩියෙන් සිතීම, නිදහසට වඩා වගකීම ගැන වඩාත් විමසිලිමත් වීම, සමාජ සුරක්ෂිතතාව හා සහජීවනය, අධ්‍යාපනය ගැන වැඩි උනන්දුව හා අධිකාරිත්වය ගරු කිරීම ආදි වටිනාකම් මෙලෙස අවධාරණය කොට ඇත. සත්තකින්ම මේ අවධාරිත වටිනාකම් සියලුම රටවල්වලට පොදු ලෙස සැලකීමේ වරදක් ද නැත.

තම ජාතිය ගොඩනැ-මේ කර්තව්‍යයයේදි ඇතැම් ආසියානු දේශපාලන නායකයින් බොහෝ දුරට පවසන කරුණක් වන්නේ බටහිර සෑම දෙයක්ම අන්ධානුකරණයෙන් වැළඳ නොගත යුතු බවයි. භාෂා, ආගම්, ජාතීන් සංස්කෘතීන් හා ආර්ථික වර්ධනයන් ආදි කරුණුවලින් ආසියාව නානාවිවිධත්වයක් පැහැදිලිව ම පෙන්වයි. මේ නිසා බටහිර ජීවන ක්‍රම පමණක් නොව, වටිනාකම් ද අන්ධ භක්තියකින් වැළඳ ගන්නට පෙර මැනවින් සිතා බැලිය යුතු බව ඇතැම් ආසියානු දේශපාලන නායකයෝ අවධාරණය කරති.

මානව අයිතිවාසිකම් ප්‍රජාතන්ත්‍රවාදි හා අදහස් පළ කිරීමේ නිදහස ආදිය ජාතික සමාජ හා දේශපාලන ව්‍යුහයන්ටත්, ඓතිහාසික අත්දැකීම්වලටත් සංස්කෘතික වටිනාකම් හා ආර්ථික තත්ත්වයන්ටත් උචිත විය යුතුය. කාලය හා අවකාශය අනුව බලනවිට ඒවා සාපේක්ෂ වනවා පමණක් නොව ගතික ස්වරූපයක් ගන්නා බව ද පැවසිය යුතුය. වූ අවධාරණය කරන පරිදි සන්නිවේදන සිද්ධාන්ත පිළිබඳ ආසියානු දැක්ම අදාළ එකක් විය යුතුය.

සන්නිවේදන සිද්ධාන්ත අරභයා වූ ආසියානු දැක්ම සන්නිවේදනය හා බැඳුණු ගැටලු කෙරෙහි යොමු විය යුතුය. අපැහැදිලි නොව පැහැදිලි ස්ථාවරයක් ගත යුතුය. යෝග්‍ය හා ගැළපෙන ක්‍රම භාවිතයෙන් සිදුකරන පර්යේෂණ විසින් ශක්තිමත් කළ පසු බිමක නිරීක්ෂණය කළහැකි මට්ටමක විය යුතුය. සන්නිවේදනයේ ආසියානු සිද්ධාන්ත සොයා යාම යනු බටහිර සිද්ධාන්ත මුලුමනින්ම ප්‍රතික්ෂේප කිරිම නොවේ. අනුවර්තනය, උපයෝගි කර ගැනීම හා ජාතික ස්වාධිපත්‍ය සුරක්ෂිත

කර ගැනීම ද ඊට ඇතුළත්වේ. අනුවර්තනය යනු අනෙකක් නොව බොහෝ නොදියුණු රටවල ප්‍රමුඛ අවශ්‍යතාවන් සඳහා නව තාක්ෂණයන්හි වාසි උචිත ලෙස යොදා ගැනීමේ උපක්‍රමයයි.

එසේ කිරීමෙන් තර්ජනයට බඳුන් වී ඇති සංවර්ධනය වන රටවල වටිනාකම් රැක ගත හැකි බව අවධාරණය කොට ඇත. (නායිටෝ 1996, ගෝමියර් 1996) අනුවර්තනය හා උපයෝගිකරණය යන ක්‍රමෝපායන්ට අමතරව ගෝලීය සමාජයක රැඳිසිමිමින් සිය අනන්‍යතාව හැකි පමණකින් රැක ගනිමින් ජාතික ස්වෛරීභාවය රැක ගැනීම ද ඇතුළත්ය.

කලින් ද සඳහන් කළ පරිදි 1994 සිට 1996 දක්වා කාලය තුළ සිංගප්පූරුවේ පිහිටි ඇමික් ආයතනය විශේෂයෙන් ම පුවත්පත් කලාවට සම්බන්ධ ආසියානු වටිනාකම්/හරයන් සොයා යාමට පැවැත්වූ සම්මන්ත්‍රණ සුවිශේෂී ස්ථානයක් ගනී. සෑම සම්මන්ත්‍රණයකදී ම නිතරම ඇසුණු හා නිතරම අවධාරණය කළ කරුණක් විය. එනම් පුවත්පත් කලාවේදීන් බටහිර ආකෘතිය අමු අමුවේ ම කොපි කිරීම හෝ අන්ධානුකරණයෙන් වැළඳ ගැනීම නොකළ යුතු බවයි. බටහිර රටවල දී මෙන් නොව ආසියානු රටවල පුවත්පත් රජයට පසමිතුරු ක්‍රියාකලාපයක් සෑම විටම අනුගමනය නොකළ යුතුය.

බහු වාර්ගික, බහු ආගමික, සංස්කෘතික පසුබිම් සහිත ආසියානු රටවල පවතින රජයේ අසාධාරණකම් හා අයුතු ක්‍රියාකලාපයන් ද, වංචා හා දූෂණ තිබේ නම් ඒවා ද පෙන්වා දීමේ හා ඉදිරිපත් කිරීමේ කිසිදු වරදක් නැත. එහෙත් රජය කරන හොඳ කටයුතුවලදී ජනවාර්ගික සමගිය රැකීමේදී හා සංවර්ධන ක්‍රියාවලියේ දී පසමිතුරු පුවත්පත් කලාව නොව සහයෝගී පුවත්පත් කලාව කෙරෙහි යොමු විය යුතු බව ඇමික් සම්මන්ත්‍රණ වලදී අවධානයට බඳුන් වූ බව ද කිව යුතුය.

රජයට ම- පෙන්වීම කළ යුත්තකි. ජාතික සමගිය ගොඩනැ-මේදී හා ජාතික සංවර්ධන ක්‍රියාවලියේදී සිදුවන වැරදි අඩුපාඩු අතපසුවීම පසමිතුරු ලීලාවකින් නොව හැකි සෑම විටම සුහදශීලීව ඉදිරිපත් කළ යුතුය. පසමිතුරු මට්ටමට යා යුත්තේ සියලු විකල්පයන් අසාර්ථක වූ විටයි.

## කළ යුත්තේ කුමක් ද?

පෙර - අපර දෙදිග වෙනස්කම් පිළිබඳ අප කළ කෙම් සාකච්ජාව ආසියානු





සන්නිවේදන න්‍යායන් සොයා යන මේ ගමන සඳහා දෙයාකාරයකින් දායක වේ. පළමුවෙන්, අද සමාජ විද්‍යාත්මක පර්යේෂණ තුළ නිර්වචනය වන අකාරයේ න්‍යායන් ආසියානු සංස්කෘතික සම්ප්‍රදාය තුළ නොමැත. උපරිම වශයෙන් අප සතුවන්නේ සිද්ධාන්ත ගොඩන-ා ගත හැකි කලල රූප පමණි. මෙම කලල රූප මෑත කාලීනව සන්නිවේදන ක්ෂේත්‍රයේ ආසියාව ලැබූ අත්දැකීම් සහ ආනුභවික දත්ත ආධාරයෙන් ව්‍යාප්ත කොට බටහිර අර්ථයෙන් සිද්ධාන්ත ලෙස වර්ධනය කළ හැකිය. කෙසේ වෙතත් මෙම කළල රූප බොහෝ විට ආසියාතික සාම්ප්‍රදාය තුළ ගැබ් වූ මානව සන්නිවේදනයේ සාකල්‍යවාදී දෘෂ්ටීන් හා ආශ්‍රිත අනුමානයන් වේ. ඒවා සන්නිවේදන පර්යේෂකයින් විසින් වැඩිදුර සංවර්ධනය කළ යුතුය.

දෙවනුව, සංස්කෘතික වෙනස්කම් හරහා යම් ව්‍යවහාරයන් සහ විෂයානුබද්ධ සංහිතාවක් සංවර්ධනය වී ඇත්තේ හෝ නැත්තේ ඇයි දැයි හොඳින් පැහැදිලි කළ නොහැකිය. එසේ වුවත්, මේ වෙනස්කම් හුවා දැක්වීමෙන් අප තවත් අවදානමක් වෙත යොමුවෙයි. එනම්, පෙරදිග හා අපරදිග සමජාතීය පැවැත්මක් ලෙස සැලකීමයි. නකමුරා (Nakamura 1989:23) පෙන්වා දුන් පරිදි, පෙරදිග ලෙස ගත හැකි තනි සවරූපයක් නොමැති බව අප පිළිගත යුතුය. ඒවා පවතින්නේ සමහර ජනවර්ග තුළ මිස සියලු ජනවාර්ගික කොටස් තුළ නොවේ. මින් පැහැදිලි වන කාරණයක් ඇත. යෙදුම් සහ සංකල්ප නිරතුරුව භාවිතයට ගැනුණේ ඒ හා සම්බන්ධ අර්ථයන්ගේ සංකීර්ණත්වය පිළිබඳ ඉතා අල්ප වූ අවබෝධයකින් යුතුව බවයි.

පළමුකොටම ආසියානු සන්නිවේදන පර්යේෂකයින්ට තමාගේ සංස්කෘතියේ දාර්ශනික පසුබිම සහ සම්ප්‍රදායයන් පිළිබඳ පුළුල් අවබෝධයක් නැත. තමන් කවුදැයි අවබෝධකර ගැනීමට මේ අවබෝධය අත්‍යවශ්‍යය. දර්ශනය සහ මානව විද්‍යා දෙපාර්තමේන්තුවල හැරෙන්නට විශ්වවිද්‍යාල පාඨමාලාවල සංස්කෘතීන් හා දර්ශනයන් පිළිබඳ පාඨමාලා නොමැත. මේ හේතුව නිසාම සන්නිවේදන සිසුන්ට විකල්ප තුනක් ඇත.එනම්

1. ස්වාධිනව සංස්කෘතික චින්තන හා සංකල්ප පිළිබඳ හදාරමින් සන්නිවේදන අධ්‍යයනය හා ඇති සබඳතාව මතුකරගැනීම, ස්වයං අධ්‍යයනය තුළින් නව සංකල්ප හා සිද්ධාන්ත ගොඩනැ-ම.

2. සන්නිවේදන අංශයෙන් සපයනු ලබන කවර හෝ අධ්‍යාපනයක් තුළින්

ප්‍රයෝජනයක් ගැනීම, එසේ නැත්නම් පංති කාමරයෙන් පරිබාහිර දැනුමෙන් කුමක් හෝ කිරීම හා අවස්ථාවෝචිතව ප්‍රයෝජනයට ගැනීම. ජන ශ්‍රැතිය, පුරාණෝක්ති, මානව විද්‍යාත්මක අධ්‍යයන ආදියහැදෑරීමය. අමාවතුර, පූජාවලිය, බුත්සරණ, උම්මග්ග ජාතකය,සද්ධර්මරත්නාවලිය වැනි සම්භාව්‍ය කෘතීන් හැදෑරීමයි.

3. බටහිර ලෝකයේ ඒකරාශී වී ඇති සාහිත්‍යය අනුගමනය කිරීම.

අවාසනාවකට මෙන් ආසියානු පර්යේෂකයින් බොහෝ දෙනෙක් අතීතයේ දී සිදු කොට ඇත්තේ තෙවැනි විකල්පය අනුගමනය කිරීමයි. එනම් බටහිර සන්නිවේදන සාහිත්‍යය දෙසට නැඹුරු වීමයි. මේ තත්ත්වය වෙනස් කිරීමට දෙයාකාරයකින් පියවර ගත යුතුය. එනම්

1. ආසියාවේ සන්නිවේදන පාඨමාලාවන්හි විෂය මාලාවන් සමාලෝචනය කිරීම. තමන්ගේ ජාතික උරුමය තුළ ඒකරාශී වී ඇති දෑ නොදකින විට බටහිර ආකෘතීන් හා සිද්ධාන්ත අවිචාරයෙන් වැළඳ ගැනීමට සිදුවේ. දේශීය දැනුම, දේශීය චින්තනය, බෞද්ධ සන්නිවේදනය ආදිය කෙරෙහි වැඩියෙන් යොමුවීම.

2. ආසියානු දර්ශනවාදයන් හා මතවාදයන් පිළිබඳව ලියවුණු පොත් පත් වැඩි වැඩියෙන් බිහි කිරීම. ඒ තුළින් සන්නිවේදන අධ්‍යයනයට වඩාත් වැදගත් හා උචිත දෑ තොරාගෙන භාවිත කිරීම. දේශීය ඌරුවට ගැළපෙන පොත් පත් ව්‍යාප්ත කළ යුතුය.බෞද්ධ දර්ශනය, ඉන්දිය දර්ශනය ආදිය ගැන වැඩියෙන් පොත් පළ විය යුතුය.

ඒ තුළින් ආසියාවේ සන්නිවේදන ඉගැන්වීම, ආනයනය කළ (ඇමෙරිකානු) පොත් පත් මතම නොරුඳෙනු ඇත.

**සටහන්**

1. පිලිපීනයේ ශාන්ත තෝමස් සරසවියේ ප්‍රථම පුවත්පත් කලාව පිළිබඳ උපාධි පාඨමාලාව 1936 දී ආරම්භ විය. ෆා ඊස්ටර්න් සරසවියේ (පිලිපීනයේ) 1956 දී ජනසන්නිවේදනය විශ්වවිද්‍යාල මට්ටමින් උගන්වන්ට පටන් ගන්නා ලදි. තායිලන්තයේ චුලාලොන්ග්කෝන් සරසවියේ පුවත්පත් කලාව පිළිබඳ





උපාධි පාඨමාලාවක් 1939 දී පටන් ගන්නා ලදි. 1954 දී ඉන්දියාවේ ඔස්මානියා සරසවියේ ජනමාධ්‍ය අධ්‍යාපනය ආරම්භ වූයේ මහාචාර්ය කේ.ඊපන් යටතේ ය. එවකට පිනැං සරසවිය වශයෙන් හැඳින්වූ අද මැලේසියාවේ විද්‍යා සරසවිය නමින් හැඳින්වෙන විශ්වවිද්‍යාලයේ 1971 දී ජන සන්නිවේදන අධ්‍යාපනය ආරම්භ විය. නේපාලයේ ත්‍රිබුවන් සරසවියේ 1976 දී ජනසන්නිවේදන අධ්‍යාපනය ට පියවර තැබිය. ශ්‍රී ලංකාවේ කනිෂ්ඨ විශ්වවිද්‍යාලවල 1969 දී ආරම්භ වූ ජනසන්නිවේදන අධ්‍යාපනය ජාතික විශ්වවිද්‍යාල මට්ටමින් ඇරඹෙන්නේ 1973 දී ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ කැලණි මණ්ඩපයේ දිය. ( අද කැලණිය විශ්වවිද්‍යාලය ) මහාචාර්ය විමල් දිසානායක මහතා සන්නිවේදන අංශයේ ප්‍රථම අංශාධිපති ලෙස සේවය කළේය. විවෘත විශ්වවිද්‍යාලයේ පුවත්පත්කලාව හා ජනසන්නිවේදන අධ්‍යාපනය 1991 වසරේ ඇරඹිණි. කොළඹ විශ්වවිද්‍යාලයේ හොරණ ශ්‍රී පාලි මණ්ඩපයේ ජනමාධ්‍යවේදී විශේෂ (ගෞරව) උපාධිය 1998 වර්ෂයේ ආරම්භ විය.1973 දී ම එවක විද්‍යෝදය නමින් හැඳින් වූ ශ්‍රී ජයවර්ධනපුර සරසවියේ සංවර්ධන විද්‍යා අධ්‍යයන අංශය යටතේ සංවර්ධන සන්නිවේදනය පිළිබඳ ගෞරව උපාධියක් ලබා ගැනීමට අවස්ථාව සලසන ලද්දේ මහාචාර්ය තිස්ස කාරියවසම් මහතා විසිනි.

2. සිංගප්පූරුවේ පිහිටි ආසියානු ජනමාධ්‍ය, තොරතුරු සහ සන්නවේදන මධ්‍යස්ථානය (ඇමික් - AMIC) ආයතනය ජර්මනියේ ෆෙඩ්රික් ඊබ(ර්)ට් පදනමේ මූල්‍ය අනුග්‍රහයෙන් පිහිටුවා ඇති ආයතනයකි. ආසියාව කේන්ද්‍ර කොට ගත් මේ ආයතනය සන්නිවේදන, පර්යේෂණ, ප්‍රකාශන, සම්මන්ත්‍රණ හා හුවමාරු වැඩසටහන්වලින් සන්නිවේදනය හා ජන සන්නිවේදනය ව්‍යාප්ත කිරීමට ද එහි ප්‍රගමනය සැලසීමට ද ක්‍රියා කරයි. ඇමික් ආයතනයේ මූලස්ථානය සිංගප්පූරුවේ නැන්යැං තාක්ෂණික විශ්වවිද්‍යාලයේ පිහිටුවා තිබේ.

ඇමික් ආයතනය ආසියානු සන්නිවේදන මූලයන් හා ලක්ෂණ හඳුනා ගැනීමේ ප්‍රයත්නයේදී සුවිශේෂී කාර්යභාරයක් ඉටු කොට ඇත. ආසියානු සන්නිවේදන ලක්ෂණ සොයා යෑමේ තේමාව යටතේ ඇමික් 1985 සිට අද දක්වා සම්මන්ත්‍රණ හා වැඩමුළු අටක් ම පවත්වා ඇත. ආසියානු සන්නිවේදනය, පුවත්පත් කලාවට අදාළ ආසියානු වටිනාකම් , පුවත්පත් කලාව, පවත්පත් නිදහස හා වෘත්තිය ප්‍රමිති ආදිය මේ සම්මන්ත්‍රණවලදී අවධානය යොමු කළ තේමාවන්ය.

1985 දී බැංකොක් නුවර දී ඇමික් ආයතනය විසින් තායිලන්තයේ තමාසාත් සරසවිය සම- ඒකාබද්ධව සම්මන්ත්‍රණයක් පවත්න ලදි 1985 ඔක්තෝම්බර් මස පැවති මේ සමුළුවට ශ්‍රී ලංකාව, පිලිපීනය,

මැලේසියාව,තායිලන්තය, ඉන්දුනීසියාව, සිංගප්පූරුව, හොංකොං, ඉන්දියාව සහ ඇමෙරිකා එක්සත් ජනපදය යන රටවල පර්යේෂකයෝ/සන්නිවේදන විද්‍යාඥයෝ විසි දෙනෙක් පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කළහ. දින තුනක් තිස්සේ පැවති උක්ත සමුළුවට ඉදිරිපත් වූ පත්‍රිකාවලින් දහයක් ම වෙන් වූයේ ආසියානු සන්නිවේදන සිද්ධාන්ත ගවේෂණය කිරීමටයි.

බටහිර සන්නිවේදන සිද්ධාන්තයන්ට ඔබින සේ කෙලෙස යොදා ගත යුතුද? කෙලෙස අනුවර්තනය කළ යුතුද? බටහිර සිද්ධාන්ත කෙසේ දේශීයකරණය කළ යුතුයද? ආදිය ගැන විශේෂ අවධානය මෙහිදී යොමු වූ බව කිව යුතුය. ආසියානු සන්නිවේදන සිද්ධාන්ත සොයා යාමේ ප්‍රයත්නයේ පළමු හා පුරෝගාමී මෙහෙවර ඉටු කරන ලද්දේ මේ බැංකොක් සමුළුව මගිනි.

ඇමෙරිකා එක්සත් ජනපදයේ හවායි ප්‍රාන්තයේ පෙර’පර දෙදිග මධ්‍යස්ථානයේදී ද (East- West Centre) සමාන සම්මන්ත්‍රණයක් පවත්වන ලදි. ඇමික් සම්මන්ත්‍රණයේදී ඉදිරිපත් වූ ප්‍රධාන පත්‍රිකා හා හවායි සම්මන්ත්‍රණයේ පත්‍රිකා ද එකතුකොට ඇමික් ආයතනය විසින් පොතක් ද පළකෙරිණි. මහාචාර්ය විමල් දිසානායක සංවිධානය කළ මේ පොත 1988 දී ඇමික් ආයතනය විසින් පළ කරන ලදි.(Communication Theroy- The Asian Perspectives නමැති පොතේ ඉදිරිපත් වන ප්‍රධාන තර්කය මෙලෙස සම්පිණ්ඩණ්ය කළ හැකිය. ආසියානු සන්දර්භයන් ඔස්සේ බටහිර සන්නිවේදන සිද්ධාන්තවල අදාළත්වය පිළිබඳ තවදුරටත් පිරියෙදුම් කළ යුතුය.

3. ගෞතම බුදුරජාණන් වහන්සේ පිළිබඳ විශේෂයෙන් සඳහන් කළ යුතුය. මීට වර්ෂ දෙදහස් පන්සියයකටත් පෙර උන් වහන්සේ දේශනා කළ ධර්මයේ සන්නිවේදනයට අදාළ වැදගත් සංකල්ප හා සිද්ධාන්ත ගැබ් වී තිබේ. උන් වහන්සේගේ සන්නිවේදන ආකෘතියේ මූලික ලක්ෂණ කිහිපයක් දැක්විය හැකිය.

1. ග්‍රාහකයා පිළිබඳ ප්‍රමුඛ අවධානය.

2. ග්‍රාහකයාට මූලික සංකල්පය අවබෝධ කර දීමට ක්‍රියා කිරීම.

3. තෝරා ගැනීම (වරණය) පිළිබඳ අවධාරණය.





4. සන්නිවේදනය හා ග්‍රාහකයා අතර සබඳතාව සමමිතික එකක් වීම.

5. ග්‍රාහකයා හා සන්නිවේදකයා අතර තිබිය යුතු සහවේදනය පිළිබඳ අවධාරණය.

බුදුන්වහන්සේ ලොහිච්ච සූත්‍රයේදී සන්නිවේදකගේ විශ්වසනීයත්වය (ප්‍රශංසාවට සුදුසුවීම) පිළිබඳ අගනා කාරණා කිහිපයක්ම දැක්වූහ. සංදේශය/ පණිවුඩය මුල - මැද - අග මනා අරුත් සහිතව ආකේතගත කරයි ද, ඉන් ග්‍රාහකයා තුළ යහපත් පරිවර්තනයක් ඇති වේද? එවැනි සන්නිවේදකයා පැසසිය යුතුය. මනා අවබෝධයකින් හා පරිචයකින් කරනු ලබන දේශනය (සංදේශය / පණිවුඩය ) ග්‍රාහකයාගේ තත්ත්වය (දැනුම, අවබෝධය, ආකල්ප හා චර්යා වෙනස) උසස් කිරීමට හේතුවේ නම්, එවැනි සන්නිවේදකයා ද පැසසිය යුතුය. යම් සංදේශයකින් /පණිවුඩයකින්/දේශනයකින් ග්‍රාහකයා ආවේග බහුල අයෙකු නොකොට සත්‍යයක් ලෙසින්ම දැකීමට යොමු කරන්නේ නම් එබඳු සන්නිවේදකයා ප්‍රශංසා කටයුතුය. ග්‍රාහක සිත සන්සුන් කර තමා හා පරිසරය ඇති සැටියෙන් දකින්නට සමත් වේ නම් එබඳු සන්නිවේදකයා ද ප්‍රශංසාවට ලක් විය යුතුය.

බුදුරජාණන් වහන්සේගේ දේශනාවලින් උකහා ගන්නා වූ සන්නිවේදන සංකල්ප හා සිද්ධාන්ත වර්තමානයට බෙහෙවින්ම ගැළපේ. බටහිර සන්නිවේදන සිද්ධාන්තවේදීන්ට වඩා උන්වහන්සේ ඉදිරියෙන් සිටිති. විශේෂයෙන්ම අන්තර්පුද්ගල සන්නිවේදනය සහ සමූහ / කණ්ඩායම් සන්නිවේදනය සඳහා උන්වහන්සේගේ දේශනාවලින් වම්නා උපදෙස් සහ මාර්ගෝපදේශ ලබා ගත හැකිය.

4. කොන්ෆියුසියස් තුමා (ක්‍රි.පූ. 551- 479)

මෙතුමා චීනයේ විසූ ශ්‍රේෂ්ඨතම දාර්ශනිකයා වශයෙන් සම්මානයට පාත්‍ර වී තිබේ. ගුරුවරයෙකු, දේශපාලඥයෙකු හා සමාජ ශෝධකයෙකු වශයෙන් ප්‍රසිද්ධියට පත් මෙතුමා කොන්ෆියුසියානු ධර්මයේ නිර්මාතෘවරයා ද වෙයි. ලෞකික දෘෂ්ටියක් දෙසට දර්ශනය නැඹුරු කළ කොන්ෆියුසියස් තුමා ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයෙන් ඔබ්බෙහි පවත්නා කරුණු ගැන අවධානය යොමු කරනවාට වඩා මිනිසා හා සමාජය පිළිබඳ ප්‍රශ්න කෙරෙහි අවධානය යොමු කිරීමේ වැදගත් කම පෙන්වා දුන් දාර්ශනිකයෙකි. (විස්තර සඳහා බලන්න ධම්මික පී. බිබිලේ, කොන්ෆියුසියස් ” සිංහල විශ්වකෝෂය, 8 වැනි කාණ්ඩය, 99 - 104 පිටු)

5. චීන බුදු දහම ගැන ඉතා වම්නා විස්තරයක් සඳහා කියවන්න, තිස්ස කාරියවසම්, 1999, චීන බුදු දහමට පෙරවදනක්, සදීපා පොත් හල;

6.ශ්‍රී ලංකාවේ මානව විද්‍යාව පිළිබඳව ලියැවුණු පොත්පත් කියවීම දේශීය සන්නිවේදන සිද්ධාන්ත ගොඩනැ-මට ඉවහල් විය හැකිය. විශේෂයෙන්ම බෲස් කැප්ෆරර්, තම්බයියා, ඔබේසේකර, එඩ්මන්ඩ් ලීච්, නූර් යාල්මන් ආදීන්ගේ පොත්පත් කියවීම මෙහිදී ඉමහත් සේ ප්‍රයෝජනවත් වනු ඇත.

E.R. Leach , 1953, Caste in Moden Ceylon, New Brunswick, N.J. Rutgers University Press;

Bruce Kapferer, 1983, *Celebrations of Demons,* Bloomingtion: Indiana University Press;

Bruce Kapferer, 1997, Feast of theSorcerer: Practies of Consciouness and Power, Chicago & London, Chicago University Press;

H.L.Seneviratne, 1997, Rituals of the Kandyan State, Cambridge: Univesity Press;

Nandana Karunanayake, 2000, Changing Patterns of Marriage in Sri Lanka, Nugegoda, INSDEV;

7. පහත සඳහන් පොත් කියවීමෙන් ශ්‍රී ලංකාව හා ආසියාව පිළිබඳ මනා අවබෝධයක් ලබා ගත හැකිය.

බස්නායක, එච්.ටී., 2002, ශ්‍රී ලංකාවේ ශිෂ්ටාචාරය, කොළඹ, එම්.ඩී. ගුණසේන සහ සමාගම;

වීරසිංහ, අමරදාස, 2002, සිංහල ජන ශ්‍රැතිය හැදෑරීම, දීපානි මුද්‍රා හා ප්‍රකාශන, නුගේගොඩ;

ආර්.එල්. සිංගල්, 2001, ඇරිස්ටෝටල් සහ භරත, පරිවර්තනය, ඒ.වී. සුරවීර,





සරසවි ප්‍රකාශකයෝ, නුගේගොඩ;

දේවාලේගම මේධානන්ද හිමි, ජුලි - 2003, බුදු බණ, බුදුරජාණන් වහන්සේ සහ සන්නිවේදනය, දයාවංශ ජයකොඩි සහ සමාගම;

ධර්මසේන හෙට්ටිආරච්චි 2001, බෞද්ධ සමාජ විද්‍යා ප්‍රවේශය, එස්. ගොඩගේ පොත් මැඳුර;

රුක්මනී ගුණවර්ධන, 2003, සිංහල ජන කවිය සහ අවිධිමත් අධ්‍යාපනය, සරසවි ප්‍රකාශකයෝ;

රැල්ෆ් පීරිස්, 2002, සිංහල සමාජ සංවිධානය, පරිවර්තනය කේ.ඒ.ඩී.පෙරේරා, විසිදුනු ප්‍රකාශකයෝ;

පරිවර්තනය : පී.බී. මීගස්කුඹුර, නකමුර, එම්., 2003, පෙරදිග මිනිසුන්ගේ චින්තන විධි භාරතය, චීනය, තිබ්බතය,ජපානය, විසිදුනු ප්‍රකාශකයෝ ;

ඩෙස්මන් මල්ලිකාරච්චි, 2003, සමාජ හා මානව විද්‍යාත්මක ලිපි,පේරාදෙණිය : (කර්තෘ ප්‍රකාශනයකි.)

## මූලාශ්‍ර

*1. Chua, H.B., 1995, Communitarian ldeology and Democracy in Singapore, London: Routledge;*

*2. Dissanayake, W., (Ed.) 1988, Communication Theory: The Asian Perspective, Singapore: AMIC*

*3. Gauier, D., 1996, Thinking Globly and Action Locally: The Art of Accommodoation, Paper Presented at the AMIC Conference on Asian Communications in the Next Twenty - Five Years, Singapore;*

*4. Giddens Antony, 1976, New Rules of Sociological Method London: Hutchinson;*

*5. Goonasekara, A.P. and S.N.Lee (Eds.), 1998, TV Without Borders, Asia Speaks Out, Singapore, AMIC;*

6. *Gottberg. H.V., 1985 October, Keynote Speech., Speech delivered at the AMIC- Thammasat Univesity Symposium on Mass Communication Theory, The Asian Perspective, Bangkok;*

7. *Gunathilake, S., 1984, Aborted Discovery; Sciece and Creativity in the Third World London: Zed Press;*

8. *Halbfass,W., 1991, Tradition and Reflection, Explorations in Indian Thought, Albany: State University of New York Press;*

9. *Kerlinger, Fred N., 1996, Foundations of Behavioral Research, Delhi: Surjeet Publication, (Indian edition);*

10. *Masterton, M., 1996, (Ed.), Asian Values in Journalism, Singapore, AMIC;*

11. *Mcquail, Denis, Some Reflections on the Westen Bias of Media Theory, Asian Journal of Communication, Vol 10, No.2.;*

12. *Mehra, M., 1989, Press System in ASEAN States, Singapore, AMIC;*

13. Natio, T., 1996, *Thinking Globally and Acting Lacally, The Art of Accommodation,* Paper presented at the AMIC 1996 Conference on Asian Communications in the Next Twenty - Five Years, Singapore;

14. Nakayama, S., 1977, *Alternative Sciences of the East* In Human Implications of Scientific Advance, Proceedings of the XVth International Congress of the Histroy of the Science (ed.) by F.G. Forbes: Edingburgh;

15. Needham, J., 1954, *Science and Civilization in China,* Cambridge. Cambridge Univesity Press;

16. Wang, Georgette & Vincent Shen, 2000, East,West, Communication, and Theory, *Asian Journal of Communication,* Vol. 10, No. 2;

17. නකමුර, එම්., 2003, පෙරදිග මිනිසන්ගේ චින්තන විධි - භාරතය, චීනය,තිබ්බතය,ජපානය,පරිවර්තනය:පී.බී.මීගස්කුඹුර, බොරලැස්ගමුව, විසිදුනු ප්‍රකාශකයෝ;

18. ධර්මසිරි ගුණපාල,1988, පේරාදෙනිය, බෞද්ධ සදාචාරයේ මූලධර්ම, පේරාදෙනිය: කර්තෘ ප්‍රකාශනයකි;





# 4

# සන්නිවේදනය, භාෂාව හා බහුජන මාධ්‍යය

## ටෙනිසන් පෙරේරා

සන්නිවේදනය මානව අවශ්‍යතාවකි. මිනිස් සංහතියේ ආරම්භයේ සිට ම එකිනෙකා අතර අන්තර් සම්බන්ධතා ගණනාවක් උපයෝගී කොට ගෙන ඇතැයි පැවසීම අතිශයෝක්තියක් නොවේ. එකිනෙකා අතර අදහස් හුවමාරු කර ගැනීමට, නව දැනුමක් ල-ා කර ගැනීමට මෙසේ සන්නිවේදනය අවශ්‍ය වේ. ප්‍රධාන වශයෙන් සන්නිවේදනය කෙරෙන ආකාර දෙකකි. එනම් වාචික සන්නිවේදනය (Verbal Communication) භාෂාවක් භාවිත කරන එක් පුද්ගලයෙකු හෝ පුද්ගලයන් ගණනාවක් සම්බන්ධ කරගෙන අදහස් හෝ තොරතුරු හුවමාරු කර ගැනීම මෙසේ වාචික සන්නිවේදනය ලෙස හැඳින්විය හැකිය.

වාචික නොවන (Nonverbal Communication) සන්නිවේදනයේදී පුද්ගලයෙකු තම ශාරීරික අ- පස- ආශ්‍රය කොට ගෙන අදහස් හුවමාරු කර ගනී. මුහුණෙන් ඇති කරගන්නා ඉරියව් මගින්, ඇස් හා අතපය මගින් ද සංසිද්ධිවලට ගැළපෙන අයුරින් කතා නොකොට මුඛයෙන් පිට කරන විවිධ ශබ්ද රටා තුළින් ද මිනිසා අදහස් බෙදා ගනී. වර්තමාන සමාජවල විද්‍යාත්මක තාක්ෂණය ප්‍රයෝජනයට ගෙන අන්තර් පුද්ගල සන්නිවේදනවලට පුද්ගලයා සහභාගී වේ. නිදසුනක් ලෙස කාර්යාලයක විධායක නිලධාරියා අවශ්‍යතාවක් සඳහා තම සේවකයාට සන්නිවේදනය කරන්නේ කිසියම් උපකරණයකට ශබ්ද කිරීමෙන් විය

හැකිය. මේ ආකාර සන්නිවේදන උපක්‍රම නූතන සමාජයේ බහුල වශයෙන් ක්‍රියාත්මක වනු පෙනේ.

සංස්කෘතික අධ්‍යයන (Cultural Studies) යටතේ හෝ සමාජ මනෝ විද්‍යාව හා බහු ජනමාධ්‍ය අධ්‍යයන යටතේ විෂයක් වශයෙන් සන්නිවේදනය එහි අනන්‍යතාව මේ වන විට වර්ධනය කරගෙන ඇතැයි සඳහන් කිරීම යුක්ති යුක්ත වේ. විශේෂයෙන් බටහිර රටවල සන්නිවේදනය හා සන්නිවේදන මාධ්‍ය ක්ෂේත්‍රවල න්‍යායාත්මක (Theoretical) හා ආනුභවික (Empirical) අධ්‍යයන රාශියක් දියත් කර ඇත.

මානව විද්‍යාත්මකව විමසන විට මිනිසා කවදා කොතැනක සිට එකිනෙකාගේ අදහස් හුවමාරු කර ගත්තේ ද යන්න ගැන නිශ්චිත අදහසක් ඇති කර ගත නොහැකිය. භාෂාවක් උපයෝගී කර ගැනීමක් ගැන වුව ද ස්ථිර කාල වකවානුවක් නම් කිරීමට මානව විද්‍යාඥයින් පවා අසමත් වී ඇතැයි සඳහන් කළ යුතුය. ඇතැමුන්ගේ අදහසට අනුව මීට අවුරුදු ලක්ෂයකට පූර්වයෙහි ජීවත් වූ මුල් නූතන මානවයා (Early Homo - Sapiens) භාෂාවක් කතා කරන්නට ඇතැයි ප්‍රකාශ වේ. එහෙත් තවත් මානව විද්‍යාඥවරුන් කණ්ඩායමක අදහස වී ඇත්තේ මීට අවුරුදු 40,000 කට පෙර මානවයා කවර හෝ භාෂාවක් ව්‍යවහාර කරන්නට ඇති බවයි.

භාෂාමය සංකේත, සංඥා හා ඉ- මුල් කරගෙන ද සන්නිවේදනය ක්‍රියාත්මක වේ. එහෙත් එහිදි වැදගත් වන්නේ ඒ සම්බන්ධයෙන් පුද්ගලයන්ගේ අවබෝධය හා ප්‍රතික්‍රියායි. අප ඉ-යෙන් හිතවතෙකුට සන්නිවේදනය කරන ආකාරයට පිටස්තරයෙකුට කළ නොහැකිය. එවිට එය අර්ථ රහිත සන්නිවේදනයක් විය හැකිය. මෙහිලා සමාජ - සංස්කෘතික සන්දර්භය විශේෂයෙන් තීරණාත්මක ව බලපායි.

මානව සන්නිවේදනය වර්තමානයේ බෙහෙවින් සිදුවන්නේ විද්‍යාත්මක තාක්ෂණය පදනම් කරගෙනයි. එය එක්තරා අන්දමක සන්නිවේදන විප්ලවයක ප්‍රතිඵලයක වශයෙන් ද අර්ථ දැක්විය හැකිය. මේ තත්වයට මානව සමාජයට ළ-ාවන්ට සිදුවූයේ එක් රැයකින් නොවේ. මානව සමාජ අවුරුදු දහස් ගණනාවක් තිස්සේ පුරුදු පුහුණු කරගෙන ආ ව්‍යවහාර, උපාය මාර්ග හා තාක්ෂණය තුළින් මේ අවස්ථාව දක්වා ජනසන්නිවේදනය වර්ධනය විණ. පුද්ගලයන් දෙදෙනෙකු





අතර ඇතිවන අන්තර් පුද්ගල සම්බන්ධතාවක සිට ඉතා දුර බැහැර විදේශ ගත පුද්ගලයන් අතර ඇතිවන සබඳතා සියල්ල වර්තමානයේ සිදුවන්නේ වාචික සන්නිවේදනයක් වශයෙන් පමණක් නොව, වාචික නොවන සන්නිවේදනයක් ද වශයෙනි. ඊ මේල්, ෆැක්ස් යනාදිය ද මෙයට නිදසුන් වේ.

පැරණි ගෝත්‍රික හා සම්ප්‍රදායානුකූල සමාජවල ද වාචික සන්නිවේදනය උදෙසා භාෂාව ඉවහල් කර ගැනීමට අමතර ව වාචික නොවන සන්නිවේදන ක්‍රම ද භාවිත කරන ලදි. ඒවා ක්‍රියාත්මක වූයේ ඒ ඒ සමාජ හා සංස්කෘතික සන්දර්භයන්ට අදාළ වන පරිදිය. මිනිස් කට හඬ ( හුව ) ගින්දර, භෞතික උපකරණ හෝ ද්‍රව්‍ය දෙකක් එකට ගෙන ශබ්ද නිපදවීම මගින් ඝණ්ඩාරය හා අණබෙරය මගින් තම සහෝදර ජනතාවට කිසියම් පණිවුඩයක් ලබා දීමට එම ජන කොටස් උත්සාහ කළ අයුරු මානව වංශ විද්‍යාවෙන් අපට දත හැකිය.

එදා සමාජයේ තත්වයන්ට අනුව පැවති වාචික නොවන සන්නිවේදන ක්‍රම ජනතාවගේ පණිවුඩ හා දැනුම් අවශ්‍යතා සපුරා ලන්නට සමත් විය. අඩු ජනගහනයක් ඇති ප්‍රාථමික සමූහ ලක්ෂණවලින් හෙබි මෙවන් සමාජවල සන්නිවේදනයේ භාවාත්මක බවක් ද තිබිණ. කුඩා ජන සමූහවල ගොඩ නැ-ුණු අන්තර් පුද්ගල සම්බන්ධතාව බෙහෙවින් ප්‍රාථමික මම්ටමේ සන්නිවේදනය මි-න් තහවුරු වී තිබිණ. මීට අමතරව විශේෂ අවස්ථා හා සිද්ධි සඳහා ද වාචික නොවන සන්නිවේදන ක්‍රම ගැමි සමාජවල පැවතිණ. කිසියම් නිවසකට පදිංචි අයෙකුට අම්මාවරුන්ගේ රෝග ලෙස ගම්මුන් සලකන සරම්ප, පැපොල්, කම්මුල්ගාය වැනි වසංගත රෝග වැළදුණු විට කොහොඹ කොළ අත්තක්, දෙහි කොළ අත්තක් හෝ ඇතැම් විට අඹ කොළ අත්තක් ගෙදොරෙහි එල්ලා තිබීම මගින් සෙසු අසල් වැසියන්ට අවබෝධ වන්නේ එම ගෙදර අයට බෝවන රෝග වැළඳී ඇති බවයි. දෙවොල් මඩු ගම්මඩු ආදි පුද පූජාවලදී සිදුවන කප්රුක සන්නිවේදනයේ සංකේතයකි. සොබාදහම පිහිට කොටගෙන සන්නිවේදන සම්බන්ධතා ඇති කර ගැනීමට පැරණි ගැමි සමාජ මේ ආකාරයෙන් ක්‍රියා කොට ඇත.

ඉතා විද්‍යාත්මක පදනමකින් ගොඩ නැ-ුණු සන්නිවේදන ක්‍රම අපට දක්නට ලැබෙන්නේ වර්තමාන සමාජයේය. ශීඝ්‍රයෙන් වර්ධනය වන ජනගහනයක් ජීවත් වන නූතන සමාජවල ජාතික හා ජාත්‍යන්තර මම්ටමේ තොරතුරු හුවමාරු කර ගන්නට දැනුම ලබා ගන්නට සරල සන්නිවේදන ක්‍රම නොසෑහේ. විශේෂයෙන් බටහිර යුරෝපයේ දහසය වැනි සියවසේ පටන් ඇති වූ කාර්මික

විප්ලවයෙහි ප්‍රතිඵලයක් ලෙස නව සන්නිවේදන ක්‍රම භාවිත විණ. කාර්මාන්ත ප්‍රගතියට, පොදුවේ ආර්ථික හා සමාජ සංවර්ධනයට වේගවත් ලෙස පණිවුඩ හුවමාරුවන සන්නිවේදන ක්‍රම අත්‍යාවශ්‍යය.

විශාල ජන කොටසකට කෙම් වේලාවකින් පණිවුඩ තොරතුරු හා දැනුම ලබා දෙන බහුජන මාධ්‍ය පිළිබඳ යමක් සඳහන් කිරීමට පෙරාතුව සන්නිවේදනයේ ප්‍රධානම මාධ්‍යයක් වන භාෂාව ගැන සඳහන් කළ යුතුවේ. මානව හා සමාජ විද්‍යාඥයින් අවධාරණය කර ඇති පරිදි භාෂාව සංස්කෘතික විශ්වයන් (Caltural Universals) ගෙන් එකකි. ටොල්කොට් පාර්සන්ස් (Tallcott Parsons) ට අනුව අනිත් සංස්කෘතික විශ්වයන් තුන වන්නේ ආගම, ඥාතීත්වය හා තාක්ෂණයයි. (Parsons, 1964). කෙසේ වෙතත් භාෂාව සෑම සංස්කෘතියකම සජීවී බලවේගයකි. වාචික නොවන සන්නිවේදනයට වඩා භාෂාව තුළින් පුළුල් ලෙස අදහස් ප්‍රකාශ කළ හැකිය. අනිත් අතට භාෂා ව්‍යවහාරය හදවතට වඩා සමීප වේ. අන්තර් පුද්ගල සම්බන්ධතා අඛණ්ඩව පවත්වා ගෙන යාමට හා භාවාත්මක වශයෙන් එකිනෙකා අතර සමාජ සම්බන්ධතා තහවුරු කර ගැනීමට භාෂාවක් මගින් කළ හැකි සන්නිවේදනය වාචික නොවන සන්නිවේදනය තුළින් කළ නොහැකිය.

සත්ව කොට්ඨාසවලට ද සන්නිවේදනය කිරීමේ හැකියාව පවති. එහෙත් එය එක්තරා සීමාවකට පමණි. එයට හේතුව භාෂාවක් කතා කිරීමට එම සතුන්ට ඇති නොහැකියාව නිසයි. ඇතැම් වානර සතුන්ට භාෂාමය ශිල්ප උගන්වන්නට හැකි වුවත් එය ද කළ හැක්කේ දළ මට්ටමිනි. භාෂාව පුළුල් අර්ථයෙන් ගත්විට වාචික නොවන සංකේත ද එම ගණයට වැටේ. මහා මාර්ගයේ දෙපස ඇති මාර්ග පුවරු සලකුණු සංකේතාත්මක භාෂාවක් ලෙස සැලකිය හැකිය. මහා මාර්ගයේ යන එන ජනතාව විශේෂයෙන් මාර්ග සංඥා එළි සමග ප්‍රතික්‍රියා කරයි. සමාජ විද්‍යාඥයින් එය හඳුන්වා ඇත්තේ සංකේතාත්මක අන්තර් ක්‍රියා (Symbolic Interaction) වශයෙනි. මිනිසුන් වශයෙන් ජීවත්වන අප සෑම දෙනාටම භාෂාවක් කතා කිරීමේ හා ඉගැනීමේ හැකියාව ලැබී තිබේ. සමාජ හෝ අගම්ක උත්සව, පුද පූජා අභිචාර හා එදිනෙදා ජීවිතයේ කතා බහ සම්මන්ත්‍රණ දේශන ආදි මේ සියල්ලම ක්‍රියාත්මක වනුයේ කවර හෝ භාෂාවක් ආශ්‍රය කර ගෙනයි. ළමා සමාජානුයෝජනයේ දී (Child Socialization), අධ්‍යාපනයේ දී වෘත්තිමය කටයුතුවලදී භාෂාව මධ්‍යගත කාර්යභාරයක් ඉටු කරයි. එවිට එය සරල සන්නිවේදන මාර්ගයක් නොව සංකීර්ණ ක්‍රියාදාමයක් වේ.





කිසියම් සමාජයක් නියෝජනය කරන සංස්කෘතිය පිළිබඳව සැලකිය යුතු අවබෝධයක් ලබා ගැනීමට නම් එම සමාජය ව්‍යවහාර කරන භාෂාව ගැන හොඳ දැනුමක් තිබිය යුතුය. “ භාෂාව සංස්කෘතියේ කැඩපත වේය ” යන්න පෙන්වා දී ඇත්තේ මානව විද්‍යාඥයින් විසිනි. සමාජයක සංස්කෘතික ක්‍රියාවලින්ට සහභාගී වීම හා ඒ ආශ්‍රිත අත්දැකීම් ලබා ගැනීමට මෙසේ භාෂා ව්‍යවහාරය අනිවාර්යයෙන්ම අවබෝධ කර ගත යුතුය. පුද්ගල සන්නිවේදනය සාර්ථක වන්නේ ඒ තත්ත්වය යටතේය. කිසියම් සමාජයක චින්තන මාර්ගය හා දර්ශන රටාව භාෂාව මගින් ප්‍රකට කරනු ලබයි. එසේම භාෂාව සංස්කෘතික සංකේතයක් ද වේ.

නූතන සමාජවල ප්‍රධාන වශයෙන් ක්‍රියාත්මක වන සන්නිවේදන ක්‍රම අතර බහුජන මාධ්‍යයන් (Mass Media) ට, ලැබෙන්නේ අද්විතීය ස්ථානයකි. “ සංස්කෘතික කර්මාන්ත ” (Cultural Industries) ලෙස හඳුන්වන මේවා මගින් පොදුජන සන්නිවේදන වේ. ලෝකය පිළිබඳ පුළුල් දැනුමක් කරා ජනතාව මෙහෙයවන බහුජන මාධ්‍ය, අනෙකුත් සමාජ ආයතන හා සංස්ථා සම්බන්ධ කරගෙන සමස්ත සමාජයට කරනු ලබන බලපෑම සමාජ විද්‍යාඥයෝ අධ්‍යයනය කරති. ( Fenton, 1999 ) පුවත් පත් හා අනෙකුත් මුද්‍රිත ප්‍රකාශන, ගුවන්විදුලිය හා රූපවාහිනීය ප්‍රධාන බහුජන මාධ්‍ය ලෙස සැලකිය හැකිය. බහුජන මාධ්‍ය නිර්වචනය කළ හැක්කේ ඉහතින් සඳහන් කළ එක් මාධ්‍යයක් හෝ මාධ්‍ය කිහිපයක් තුළින් විශාල ජන කොටසකට සන්නිවේදනය කිරිමේ මහා පරිමාණ සංවිධාන ලෙසයි. ඇමරිකා සමාජ විද්‍යාඥ සී. රයිට් මිල්ස් ( C. Wright Mills) තමාගේ ප්‍රබුද්ධ බලය (Power Elite, 1956) නැමති කෘතියෙන් බහුජන මාධ්‍ය අර්ථකථනය කරමින් එහි සමාජ විද්‍යාත්මක ලක්ෂණ දෙකක් පෙන්වා දෙයි. පළමුව එය ඉතා කුඩා පිරිසකට, විශාල පිරිසක් අමතා සන්නිවේදනය කිරීමට ඇති හැකියාවයි. දෙවනුව සන්නිවේදනය ලබා ගන්නා පාඨක, ශ්‍රාවක, හා ප්‍රේක්ෂක ජනතාවට පෙරළා පිළිතුරු දීමට නොහැකි බවයි. බහුජන මාධ්‍ය මේ අනුව එක් මාර්ගික ක්‍රියාවලියක් (One Way Process)වේ. නිලබලවාදී පදනමක් බහුජන මාධ්‍යවලට තිබෙන බවද මෙහිලා සඳහන් කළ යුතුය.

සම්ප්‍රදායානුකූල සමාජවල ජන සන්නිවේදනය ප්‍රාදේශානුගත වී තිබේ. එයින් අදහස් කරනුයේ එවන් සමාජවල දැනුම බාහිර ලෝකයට සම්බන්ධ වී නොමැති බවයි. මානව විද්‍යාඥයෙකු වූ ක්ලිෆර්ඩ් ගියට්ස් (Clifford Geertz) පෙන්වා දී ඇත්තේ එවැනි සමාජවල නියෝජනය වන්නේ ප්‍රාදේශිය දැනුම (Local Knowledge) බවයි. ප්‍රාදේශිය ප්‍රජාව එම දැනුම ගෙන එන්නේ සම්ප්‍රදායයන්ගෙනි.

එම සම්ප්‍රදායයන් ශක්තිමත් කර ඇත්තේ මිථ්‍යා මත පුරාවෘත්ත හා ජනකතා මගිනි.

එහෙත් වර්තමාන සමාජයේ පැතිර පවත්නා බහුජන මාධ්‍ය ප්‍රාදේශයානුගත වී නොමැත. ජාතික හා ජාත්‍යන්තර ප්‍රවෘත්ති, හා වෙනත් විවිධ සිද්ධි රටපුරා, ප්‍රචාරය වේ. විකාශය වේ. අපේ මානසික ජීවිතයට ද බහුජන මාධ්‍ය බෙහෙවින් බලපෑමක් කර ඇතැයි සඳහන් කළ යුතුය. දියුණු වූ රටවල මෙන් ම දියුණු වෙමින් පවතින රටවල ද ප්‍රධාන බහුජන මාධ්‍යයක් ලෙස පුවත්පත ජනතාවගේ ඇතැම් ආකල්ප වෙනස් කිරිමට හා දුර්මත ඉවත් කිරීමට යම් දායකත්වයක් ඉටු කරයි. එහෙත් පුවත්පත් හා ගුවන්විදුලි මාධ්‍ය අභිබවා අද පෙරට පැමිණ ඇත්තේ රූපවාහිනියයි. පසුගිය වසර පනහක කාලයක් තුළ විශේෂයෙන් බටහිර රටවල ජනතාවගේ හදවතට බලපෑ ප්‍රධානතම බහුජන මාධ්‍ය වූයේ රූපවාහිනියයි. ලෝක පූජිත නළු නිළියන්, ගායකයින්, ක්‍රීඩකයින් පිළිබඳ ජනතාව වඩාත්ම දැනුම ලබා ගන්නේ ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යක් වන රූපවාහිනියෙනි. අනෙකුත් බහුජන මාධ්‍යයන්ට වඩා රූපවාහිනිය නැරඹීමට ජනතාව පෙළඹී ඇති අයුරු අපේ රට තුළින් ද පෙන්වාදිය හැකිය.

විශාල වියදමක් දරා නොගෙන තමන්ට නිවසේ සිට දැනුම, විනෝදය, අධ්‍යාපනය ලබා ගැනීමට ජනතාවට රූපවාහිනිය මගින් ඉඩකඩ ලබා දී ඇත. එහෙත් දැන් දැන් රූපවාහිනී වැඩ සටහන්වල ගුණාත්මක භාවය ගැන ප්‍රශ්න මතු වී තිබේ. රූපවහිනිය නැරඹීමේ වර්තමාන ප්‍රවණතාව දිගටම පැවතුණ හොත් තරුණ ළමයෙකු නිදා ගැනීම හැරුණ විට තම ජීවිතයේ වැඩි කලක් වැය කරනුයේ රූපවාහිනී නැරඹීමට බව සමාජ විද්‍යාඥයින් පෙන්වා දී තිබේ. (Giddens , 1989)

බහුජන මාධ්‍යයක් වශයෙන් රූපවාහිනී සමාජ බලපෑම සම්බන්ධව දැන් දැන් බහුල වශයෙන් බටහිර රටවල පර්යේෂණ කර ඇත. විශේෂයෙන් අපරාධ හා හිංසනය කෙරෙහි රූපවාහිනී වැඩ සටහන් වල බලපෑම, රූපවාහිනී ප්‍රවෘත්ති විකාශය මගින් සිදුවන බලපෑම හා දේශපාලන ජීවිතය කෙරෙහි රූපවාහිනී කාර්යභාරය පිළිබඳව සමාජ විද්‍යාත්මක අධ්‍යයන කෙරී ඇතත් අපේ රටවල එවැනි පර්යේෂණ තවමත් ඇත්තේ ප්‍රාථමික මට්ටමෙනි.





සන්නිවේදනය සම්බන්ධව කරන ලද සමාජ විද්‍යාත්මක අධ්‍යයන වලින් හෙළි වී ඇත්තේ මේ හැම සන්නිවේදන මාධ්‍යයකින් ම සමාජ ජීවිතයට ධනාත්මක වශයෙන් පමණක් නොව සෘණාත්මක වශයෙන් ද බලපෑම් ඇති බවයි. විශේෂයෙන් නූතන බහුජන මාධ්‍ය ගත් විට ඒවායේ අන්තර්ගතය (ලිපි - වැඩසටහන් - කතා) ආදිය වාණිජ පදනමක් ගෙන තිබේ. අධ්‍යාපනය හා දැනුම ව්‍යාප්ත කිරීමක් අද සිදුවන්නේ ද්විතීක කාර්යභාරයක් ලෙසිනි. එක් අතකින් බහුජන මාධ්‍යවල මූලික කාර්යභාරය එදිනෙදා ලෝකයේ සිදුවන නානාවිධ සිදුවීම් ක්ෂණිකව ජනතාවට ළ-ා කර දීමය යන තර්කය සාධාරණ වුවත්, ඒ මගින් ජනතාවගේ සදාචාර ධර්ම වර්ධනය ප්‍රගුණ කරනු ලබන වැඩ සටහන් ද යම් තරමකින් ඉදිරිපත් කිරිම ලංකාව වැනි රටක බහුජන මාධ්‍ය මගින් සිදුවිය යුතු සමාජ වගකීමකි.

සන්නිවේදන ක්‍රම මහා පරිමාණ ලෙස ව්‍යාප්ත වී තිබෙන වර්තමාන සමාජය එක් අතකින් මහා සමාජයක් (Mass Society) ලෙස අර්ථ දැක්විය හැකිය. මනුෂ්‍ය ජීවිතයේ පැවැත්මට ආහාර පාන අවශ්‍ය වන්නා සේ සමාජ ජීවිතයේ පැවැත්මට සන්නිවේදනය ද අවශ්‍යයය. කලට හා තැනට සරිලන සේ දැනුම් සම්භාරයක් ලබා දීමේ වැඩ පිළිවෙල බහු ජන මාධ්‍ය මගින් සකස් කළ යුතුවේ. මහජනතාව තුළ දැනුම, විනෝදය, අධ්‍යාපනය හා වෙනත් ක්ෂේත්‍ර පිළිබඳ අදහස් එමට ඇත. ඒවා පාඨක, ශ්‍රාවක, ප්‍රේක්ෂක සමීක්ෂණ පවත්වා දැන ගැනීම අත්‍යවශ්‍යවේ. රටට සරිලන මාධ්‍ය ප්‍රතිපත්තියක් සකස් කර ගත හැක්කේ ඒ අනුවය.

## මූලාශ්‍ර


1. *Ember Carol, R., Melvin Ember, Peter N. Peregrine, 2002, Anthropology Singapore: Person Education Inc;*

2. *Fenton Natalie, 1999, "Mass Media" in steve Taylor (ed) Sociology: Issuesand debates, Landon Macmilla, pp 297-320;*

3. *Geertz, Clifford, 1983, The local Knowledge:Further essays in Interpretive Anthropology New York: Basic Books;*

*4 Giddens, Anthony, 1999, Sociology Cambridge: The Polity Press.*

5. *Kuper Adam, Jessica Kuper(eds) 1996, The Social Science Encyclopedia London: Routledge;*

6. Marshall, G., (ed), 1994, The Conese Oxford Dictionary Oxford: Oxford University Press;

7. Mills,C., Wright , 1956, The Power Elite, Oxford University Press.

8. Parsons, Talcott., 1964, Evolutionary Universals in Society American Socialogical Review Vol 29;





5

# භාෂාවෙහි සන්නිවේදනමය හා සමාජ විද්‍යාත්මක කාර්යභාරය

උපුල් රණවීර

මනුෂ්‍ය සත්වයා අන්‍ය සත්වයන්ගෙන් වෙසෙසා දැක්වෙන ප්‍රධාන ලක්ෂණය භාෂාව වශයෙන් දැක්විය හැකිය. අන්‍ය සත්වයෝද මුඛ මාධ්‍යයෙන් නොයෙක් පණිවුඩ හුවමාරු කර ගනිති. එහෙත් මනුෂ්‍ය භාෂාව එම පණිවුඩ හුවමාරු ක්‍රමයන්ට වඩා සංකීර්ණ අදහස්වලට වාහකයක් බව පැවසිය හැකිය. මනුෂ්‍ය සත්වයා විසින් නිපදවාගෙන ඇති මේ අසහාය මාධ්‍යයේ පිහිටෙන් ඔහුට අතිශය පෘථුල වූ ශිෂ්ටාචාරයක් ගොඩ නගා ගැනීමට හැකි වී ඇත.[1] ආචාර්ය ජැක් ගුඩි විසින් මනුෂ්‍යයාගේ පෞරුෂය හා සමග භාෂාව තරම් සමීපතර ලෙස සම්බන්ධ වූ අන් කිසිවක් නොමැත්තේ යැයි පවසා ඇත. මිනිසා හා භාෂාව අතර ඇති මේ සබඳතාව බොහෝ විට අපගේ අවධානයට යොමු නොවූවකි. මිනිසා ජීවත් වන සමාජ හා සංස්කෘතික පරිසරය මෙන්ම ඔහු උරුම කරගත් හා ඔහුට අනිවාර්යයෙන් මුහුණ පාන්නට සිදු වන ආර්ථික හා දේශපාලනමය සංසිද්ධීන් ද විසින් ඔහු භාවිත කරන භාෂා ව්‍යවහාරය හැඩ ගස්වනු ලැබේ. භාෂාවෙන් තොරව අපට දේශපාලන, ආර්ථික, ආගමික , චර්යා ධර්ම, ආචාර ධර්ම, නීති රීති, විද්‍යාව, අභිධර්මය, සාහිත්‍ය, ක්‍රීඩා, සංගීතය හෝ යුද්ධමය සංවිධානයක් යන ආදි කිසිවක් ඇති කරගත හැකි නොවේ.[2] එහෙයින් භාෂා චර්යාව තුළ මිනිසාගේ සමාජ ජීවිතය සපුරා පිළිබිඹුව ඇතැයි පැවසිය යුතුය.

මානව විද්‍යාඥයින්ගේ හා වාග් විද්‍යාඥයින්ගේ පිළිගැනීම අනුව භාෂාව යනු මානව සංස්කෘතියෙහි ඉතාම වැදගත් අංගයයි. මහාචාර්ය කේ.එන්.ඕ. ධර්මදාස මහතා ඒ පිළිබඳව මෙසේ දක්වා ඇත. “ භාෂාව මනුෂ්‍යයා විසින් සිය අවශ්‍යතා සපුරා ගනු වස් නිපැයුණු උපකරණයක් බව දනිමු. මේ අනුව භාෂාව මනුෂ්‍ය සංස්කෘතියේ එක් අංගයක් වෙයි. භාෂාව සහ මනුෂ්‍යයා විසින් නිපැයුණු සංස්කෘතික අංග අතර සමාන්තරතා හා සම්බන්ධතා පැවතිය හැකි බවද පැහැදිලි කරුණකි. මානව සංස්කෘතිය පිළිබඳ අධ්‍යයනය මානව විද්‍යා විෂය ක්ෂේත්‍රයෙහි ප්‍රධාන මාතෘකාවකි. වාග් විද්‍යාවත් මානව විද්‍යාව හා සම්බන්ධ වූ ගවේෂණ මාර්ගයකැයි පැවසිය හැකිය. නූතන වාග් විද්‍යාව පසුගිය ශත වර්ෂයක් පමණ කාලය තුළ බටහිර ලෝකයේ ශීඝ්‍ර ලෙස සංවර්ධනය වීමට මානව විද්‍යාව බෙහෙවින් උපස්තම්භක වූ බව කිව යුතුය. පසුගිය ශත වර්ෂ කීපය තුළදී යුරෝපය ලෝකයේ විවිධ දිගා භාගයන්හි ව්‍යාප්ත වෙද්දී යුරෝපීය මානව විද්‍යාඥයින්ට මෙතෙක් ශාස්ත්‍රීය පරීක්ෂණයට භාජන නොවූ ප්‍රාකෘතික ජන සමාජ රාශියක් මුණ ගැසිණි. ප්‍රාකෘතික ජන සමාජ පිළිබඳ ගවේෂණයන්හිදී එම ජන සමාජගත සංස්කෘතීන් අධ්‍යයනය කරනු වස් එම ජන සමාජයන්හි භාවිත වන භාෂා දැන ගැනීම අවශ්‍ය විණි. මෙහිදී මානව විද්‍යාඥයෝ වාග් විද්‍යාඥයින්ගේ සහයෝගය පැතූහ. මානව විද්‍යාඥයින් සමග දරන ලද මේ සහයෝගී ප්‍රයත්නයේ දී මනුෂ්‍ය භාෂාව පිළිබඳව මින් පෙර නොලැබුණු දුර්ලභ දෘෂ්මියක් වාග් විද්‍යාඥයින්ට ලැබිණි.”[3]

මානව විද්‍යාඥයින්ගේ හා වාග් විද්‍යාඥයින්ගේ පිළිගැනීම අනුව භාෂාව යනු මානව සංස්කෘතියෙහි ඉතාම වැදගත් අංගයයි. ශබ්ද මගින් අදහස් ප්‍රකාශ කිරීම මිනිස් වගට පමණක් සීමිත කටයුත්තක් නොවේ. තමන්ට ආහාර තිබෙන බව හෝ ආහාර සොයා ගත් බව, තමන්ට හෝ තම වර්ගයාට කරදරයක් පැමිණ තිබෙන බව, තමන්ගේ සීමාවට වෙනත් කෙනෙකු නොපැමිණිය යුතු බව, තමන්ට කරදරයක්, අන්තරාවක් ඇති බව වැනි අදහස් කීපයක් ප්‍රකාශ කිරීමට නාද ක්‍රම කීපයක් යොදා ගැනීමට සත්ව ලෝකයෙහි වෙනත් සතුන්ට ද හැකිය.[4] එහෙත් එය මනුෂ්‍ය වර්ගයාගේ භාෂාව තරම් කවරම ලෙසකින්වත් සංකීර්ණ නොවන බව පැවසිය හැකිය. ඒ සියල්ලටම වඩා මිනිසාට තම ජාතියේ භාෂා සමාජයේ භාෂාව පමණක් නොව වෙනත් ජාතීන්ගේ හා සමාජ වලට අයත් භාෂාවන් ද ඉගෙන ගෙන භාවිත කිරීමට ශක්තියක් ඇත. එසේම විවිධ සම්මත අක්ෂර ක්‍රම අනුව ඒ ඒ භාෂාවන් සංකේතාත්මකව දැක්වීමට ද ඔහුට ඉගෙනීමට පිළිවන.[5]





සතුන් අතරින් මිනිසාට ඉතාම ආසන්න සත්වයා චිම්පන්සීන් ලෙස විද්‍යාඥයෝ සලකති. එහෙත් චිම්පන්සීන්ට මනුෂ්‍ය භාෂාවක් උගන්වන්නට මෙතෙක් ගත් සියලුම උත්සාහයන් ව්‍යර්ථ වීමෙන් පෙනෙන්නේ මිනිසාට මෙන් සතුන්ට භාෂාවක් සාර්ථකව ඉගෙනීමට නොහැකි බවයි. එපමණක් නොව මිනිසුන්ගේ හා චිම්පන්සීන්ගේ මොළයෙහි වර්ධනය පිළිබඳව පර්යේෂණ කළ ජීව විද්‍යාඥයින් හා වෛද්‍යවරුන් පවසා ඇත්තේ සංකීර්ණ භාෂාවක් ඉගෙනීමට හා භාවිතයට මිනිසාට ඇති ශක්තිය මිනිස් වර්ගයාට විශේෂ වූ සහජ ලක්ෂණයක් බවයි.[6]

සත්ව ලෝකයේ වෙනත් ජීවීන්ට කළ නො හෙන පරිදි සමාජයේ කවරම අවස්ථාවකට වුව සරිලන අයුරින් භාෂාවක් භාවිත කිරීමේ ශක්තිය ඇත්තේ මිනිසාට පමණි. වෙනත් කිසිඳු සත්වයකුගේ භාෂාවක දක්නට නොලැබෙන අන්දමේ නිර්මාණාත්මක ගුණයක් මිනිසාගේ භාෂාවෙහි ඇත. එබැවින් මිනිසාගේ සංස්කෘතික නිර්මාණයක් වන භාෂාව පිළිබඳව සොයා බැලීම අප ගැනම අපේ අවබෝධය පුළුල් කර ගැනීමක් වේ. භාෂාව යනු මනුෂ්‍ය වර්ගයා ජීව ලෝකයේ වෙනත් සත්ව කොට්ඨාස වලින් වෙන් කොට දක්වන වැදගත්ම අංගයයි. මහාචාර්ය ඒ.ඒ. අභයසිංහ මහතා ඒ පිළිබඳව අදහස් දක්වා ඇත්තේ මෙසේය. “ මිනිසා තනි තනිව නොව සමාජ ජීවිතය ප්‍රිය කරන එකට ජීවත් වන සාමාජික සත්වයෙකි. ඒ අනුවම සංස්කෘතික සත්වයෙක්ද වේ. ඔහු සෙසු සත්වයින්ගෙන් වෙනස් වන්නේ ප්‍රධාන වශයෙන් ඉතා සංකීර්ණ භාෂාවක් භාවිත කිරීමට ඔහුට ඇති අසීමිත ශක්තිය අනුවය.”[7]

මානව විද්‍යාඥයින් මිනිසා සෙසු සත්ව වර්ගයාගෙන් වෙනස් කර දැක්වීමට උත්සාහ ගෙන ඇත්තේ අවිආයුධ මෙවලම් පාවිච්චි කිරීම, නිවාසයක් තනාගෙන වාසය කිරීම වැනි ලක්ෂණ අනුවය. වානර පවුලට අයත් චිම්පන්සීන් දඬු මුගුරු රැගෙන සතුරාට පහර දීමට ඉදිරිපත් වන අවස්ථා දක්නට ලැබේ. කුරුළු පවුලට අයත් වඩු කුරුල්ලන් ඉතා විසිතුරු කූඩු තනාගෙන ජීවත් වන බවද දක්නට ලැබේ. සතුන් පිළිබඳව අධ්‍යයනය කළ වන සත්ව විද්‍යාඥයින් පෙන්වා දී ඇත්තේ මුගුරු වැනි ආයුධ පාවිච්චි කිරීමත් නිවාස තනා ගෙන වාසය කිරීමත් මිනිසුන් අතර මෙන්ම සතුන් අතරද සමානව දක්නට ලැබෙන බවයි. එසේ වුවත් මිනිසාට මෙන් විවිධ අවස්ථා වල විවිධ කාර්යයන්ට අනුගතව අන්‍යයන් සම- අදහස් හුවමාරු කර ගැනීමේදී ඉතා සංකීර්ණ භාෂාවක් භාවිත කිරීමේ හැකියාවක් මිනිසා හැර වෙන කිසිම සත්වයෙකුට නැති බව ඉතා ප්‍රකටව පෙනෙන සත්‍යයකි. මිනිසා එකට ජීවත් වන විට පිළිපැදිය යුතු චර්යා ධර්ම පද්ධතියක්

පවතින හෙයින් ඉතා ප්‍රාකෘතික යැයි හැඳින්විය යුතු මිනිස් කොට්ඨාස අතරද කිසියම් සංස්කෘතියක් විද්‍යමාන වෙයි. එසේම ඒ ඒ කාර්යය අනුව භාවිත වන සංකීර්ණ ලක්ෂණ ඇතුළත් භාෂා ව්‍යවහාර ඔවුන් අතරද පවතී. එහෙත් එබදු සංකීර්ණ අදහස් ප්‍රකාශ කර දක්වන මාධ්‍යයක් වෙනත් කවරම සත්ව වර්ගයක් අතර හෝ නැති බව කිව යුතුය. මෙසේ සලකා බලන විට අපට දැක්විය හැක්කේ මිනිසා සතුව පවතින භාෂාවක් භාවිත කිරීමේ ශක්තිය ඔහු සෙසු සත්ව කොට්ඨාස වලින් වෙන්කර දක්වන ප්‍රධාන සාධකයක් බවයි.

අපේ සමාජයේ සෑම කටයුත්තක්ම පාහේ මුදුන් පමුණුවා ගැනීමට අපට භාෂාවක් අවශ්‍ය වේ. මේ නිසා භාෂාව වූ කලී මානව සංස්කෘතියේ පදනම වශයෙන්ද, මනුෂ්‍යයාගේ මූලික මෙවලම වශයෙන්ද සැලකිය හැකිය. මනුෂ්‍යයා ස්වකීය ලෝකය මවා ගන්නේ භාෂාව නිසාය. භාෂාවෙන් තොර ලෝකයක් නොමැත. මිනිසා සහ භාෂාව වෙන් කළ නොහැකිය. එමනිසා සමහර වාග් විද්‍යාඥයින් භාෂාව මිනිසාගේ සෙවනැල්ලක් වැනි යැයි දක්වා ඇත. මිනිසාත් භාෂාවත් අතර නොබිඳෙන සබඳතාවක් විද්‍යමාන වන බව මින් පෙනී යයි.

අදහස් ප්‍රකාශනයේදී මිනිසා බොහෝ විට භාෂාවක් භාවිත කරයි. එසේ නොවුන විට නිහඬව සිටීමද ඔහුගේ ස්වභාවයයි. මෙයින් අපට පැහැදිලි වන්නේ අදහස් ප්‍රකාශ කිරීමට පමණක් මිනිසා භාෂාව භාවිත කරන බවයි. සමහර මානව විද්‍යාඥයින් හා වාග් විද්‍යාඥයින් පෙන්වා දී ඇති ආකාරය අනුව අදහස් ප්‍රකාශ කර දැක්වීම භාෂාවේ එක් කාර්යයක් පමණි. එහි තවත් බොහෝ කාර්ය ඇතත් එය ප්‍රධාන කාර්යය ලෙස ගත යුතුය. ඔවුන් පෙන්වා දෙන සමාජ සන්ථවය, පාළුව මගහරවා ගැනීම, සාමූහිකව වැඩෙහි යෙදීම, වැනි කාර්ය සඳහා භාෂාව යොදා ගැනීම සෑම සමාජයකම දක්නට ලැබෙන ලක්ෂණයයි.[8] එහෙත් ඒ සියලු කාර්යන් අදහස් ප්‍රකාශනය තුළම අන්තර්ගත සේ සැලකිය හැකි යැයි තවත් වාග් විද්‍යාඥයින්ගේ මතයයි. භාෂාවක ප්‍රධානතම පරමාර්ථය අදහස් ප්‍රකාශනය බව මේ අනුව පිළිගත හැකිය. මහාචාර්ය ආනන්ද ජයසේකර සහ චිත්‍රා ජයසේකර යන දෙදෙනාගේ තුලනාත්මක වාග් විද්‍යාව නම් කෘතියෙහි භාෂාව පිළිබඳ නිර්වචන කිහිපයක් දක්වා ඇත්තේ මෙසේය.

“ පොදු ව්‍යවහාරය මගින් ක්‍රමානුකූලව පිළියෙල වී සමාජ සම්මුතිය ලත් වාග් ශබ්ද සංකේත සමුදාය භාෂාවයි.”





“ ජනතාව අතර සබඳතාව ගොඩ නගන ඉතා වැදගත් සමාජ බන්ධනය භාෂාවයි.”

මේ නිර්වචනයන්ගෙන් භාෂාව යනු කුමක්දැයි මැනවින් ප්‍රත්‍යක්ෂ වෙයි. වාග් විද්‍යාඥයින් භාෂාව යන්න සිතුවිලි උසුලන්නා ( Language is vehicle of thought) යයි පවසා ඇත. ග්‍රීක් භාෂාවෙහි චින්තන ශක්තියට හා භාෂාවට Logos යන වචනය භාවිත කර ඇත. ඉංග්‍රීසි Language යන වචනය සෑදෙන්නට ඇත්තේ මෙය පදනම් කර ගෙන විය හැකිය. මෙයින් භාෂාවත් චින්තන ශක්තියත් අතර සම්බන්ධය ප්‍රකට වේ. භාෂාවෙන් හා චින්තන ශක්තියෙන් තොර නිසා එම බසෙහි තිරිසනාට Aloga යන වචනය භාවිත කර ඇත. සිත තුළින් නැගෙන අදහස් හා චින්තාවලින් ඔවුනොවුන්ට අවශ්‍ය පරිදි ව්‍යවහාර කිරීම සඳහා භාෂාව පාවිච්චි කරයි. භාෂාව හුදෙක් බුද්ධි වර්ධනයට ඉවහල් වේ. භාෂාව යනු හුදකලා විෂයයක් නොවේ. භාෂාවෙන් තොරව කිසිදු විෂයයක් උගත නොහැකිය. එය විෂය මාලාව සිසාරා විසිරෙන අතර සියලුම විෂයයන්ගේ කේන්ද්‍රීය විෂය භාෂාවයි. ඉගෙනීමේ හා ඉගැන්වීමේ මාධ්‍ය භාෂාවයි. හැම ගුරුවරයෙකුම භාෂා ගුරුවරයෙකි. භාෂාවෙහි චතුර්විද කාර්යය වන කතාවත්, සවන්දීමත් ස්වාභාවිකය. ලිවීමත් කියවීමත් අස්වාභාවිකය. කතාවෙනුත් ලිවීමෙනුත් පිටට යමක් දෙන අතර සවන්දීමෙනුත් කියවීමෙනුත් ඇතුළට යමක් ගනී. මේ අනුව ආත්මීය පෝෂණය හා සමාජ පෝෂණය මෙහි නිර්වචිත කාර්යභාරයයි. භාෂාව ස්වයං ප්‍රකාශන මාධ්‍යයක් ලෙස ද සැලකිය හැකිය.

සිතීමේ හා අදහස් ප්‍රකාශ කිරීමේ ප්‍රධාන මාධ්‍ය භාෂාවයි. මේ අනුව ගිය ඇතැම් වාග් වේදීහු භාෂාව යනු අදහස් හුවමාරු කරගැනීමේ මාධ්‍ය ලෙස දැක්වූහ. (Language is the medium of the expression) මනුෂ්‍යයා අදහස් ප්‍රකාශ කිරීම සඳහා වාචික සංකේත මෙන්ම අවාචික සංකේතද උපයෝගී කරගනී. වාචික සංකේතවලට භාෂාවත් අවාචික සංකේතවලට අදහස් ප්‍රකාශ කිරීම සඳහා යොදා ගනු ලබන අන් සියලු උපක්‍රමත් ඇතුළත්වේ. ඉඞගිත භාෂා ( Gesture Language) අදහස් ප්‍රකාශ කිරීම සඳහා යොදා ගනු ලබන ප්‍රබල අවාචික සංකේතයකි. ශීර්ෂ චලන ( හිස සෙලවීම) මුඛ විකාර ( මුහුණේ ඉරියව් වෙනස් කර පෙන්වීම ) හස්ත මුද්‍රා (අතින් දෙන සංඥා) ආදිය ඉඞගිත භාෂා ලෙස දැක්විය හැකිය. ඉඞගිත භාෂා මගින් අදහස් හුවමාරු කර ගැනීම ලෝකයෙහි පොදු බවක් දක්නට ලැබේ. සිංහල මිනිසෙකු අංග චලනයෙන් හෝ ඉ-යෙන් දෙන අදහසක් ඉංග්‍රීසි ජාතිකයකුට හෝ රුසියන් ජාතිකයකුට හෝ වෙනත්

කවරම ජාතිකයකුට හෝ අවබෝධ විය හැකිය. එසේ වන්නේ එම ඉඩගිතීන්හි අදහස් ප්‍රකාශ කිරීමේ පොදු බවක් දක්නට ලැබෙන බැවිනි. අදහස් ප්‍රකාශ කිරීමට යොදා ගන්නා අවාචික සංකේත අතර ලෝකයෙහි පොදු වශයෙන් යොදා ගන්නා සංඥා හා සංකේත ද ඒ ඒ භාෂාවන්හි පෞද්ගලික වශයෙන් යොදා ගන්නා සංඥා හා සංකේත ද දක්නට ලැබේ. රතු බල්බ් එකක් දැල්වීම හෝ රතු කොඩියක් භාවිත කිරීම අන්තරායදායක බව ඇ-වීමට යොදා ගනු ලබන පොදු සංඥාවක් හෝ සංකේතයකි. නැවක කහ පාට කොඩියක් දැමීමෙන් එම නැවෙහි බෝවන රෝග සහිත ලෙඩෙකු සිමින බවට සංකේතයකි. මෙය මුළු ලොවටම පොදු සංකේතයකි. අපේ රටෙහි ගොක් කොළ වැලක් ගේ ඉදිරිපිට දැමීමෙන් එය අ-වයි. පැරණි මනුෂ්‍යයා තමා සිමින තැන ඇ-වීමට හූ කීම හෝ ගිණි ගොඩක් ගැසීම ආදී ක්‍රම මගින් ප්‍රකාශ කළේය. ශරීර අවයව, විද්‍යුත් හා ද්‍රව්‍යමය උපකරණ රූප සටහන් ආදිය මගින් ද අවාචික සංකේත භාවිත කරයි. දීර්ඝ කාලයක් පැවතුණු පොදු සමාජ සම්මුති අනුව අවාචික සංකේත වලට අර්ථ ආරෝපණය කෙරේ. අවාචික සංකේත බොහෝ දුරට දෘශ්‍ය සංකේත වන්නේය. හූ කීම, අප්පුඩි ගැසීම වැනි සමහර සංකේත ශ්‍රව්‍ය සංකේත වන්නේය. ශබ්ද ප්‍රකාශ කිරීම සඳහා යොදනු ලබන සංකේත හැරුණු විට යම් යම් අර්ථ හෝ අදහස් ප්‍රකාශ කිරීම සඳහා ද සංකේත භාවිත කරනු ලබයි. මෙම ගණයේ සංකේත ඇසට ගොදුරු වන ඒවා මෙන්ම කණට ගොදුරු වන ඒවාද විය හැකිය. නිදර්ශන හැමියට මහාමාර්ග වල යොදා ඇති සංඥා, වංගුවක් දැක්වීමට, හන්දියක් දැක්වීමට, පාසැලක්, ආරෝග්‍ය ශාලාවක් දැක්වීමට, පාර මාරුවන තැනක් ඇ-වීමට යෙදූ සංකේත මෙන්ම ආලෝක සංඥා ද දැක්විය හැකිය. මෙවැනි සංකේත යොදා ඇත්තේ රියදුරන්ගේත් මගීන්ගේත් ප්‍රයෝජනය සඳහාය. මෙහිදී අක්ෂර භාවිතා නොකළ ද දී ඇති සංකේත මගින් පැහැදිලි අදහසක් ප්‍රකාශ කරනු ලබයි. මේ හැරුණු විට පොලිස් භටයෙකු විසින් දෙනු ලබන මාර්ග සංඥා, දුර සිමින දෙදෙනෙකු අතර අදහස් ප්‍රකාශ කර ගැනීමට යොදා ගන්නා සංඥා හා යම් යම් වර්ණවලින් ප්‍රකාශ කෙරෙන සංඥා ආදිය දැක්විය හැකිය.

අවාචික සංකේත භාවිත කිරීමේදී හිස,කට, දිව , තොල්, දත්, අත්, ඇස්, නාසය, මුහුණ වැනි ශරීර අවයව උපයෝගී කරගනියි. ශරීර අවයව වලින් කරන මෙම සංකේත සියලුම සමාජවල සංස්කෘතීන් අතර සමාන නොවන්නට ද පුළුවන. ලංකාවේ සිටින ජාතීන් එකට ජීවත් වීම නිසා සංස්කෘතියේ මෙම සංකේත පොදු බවට පත්ව ඇත. මෙවැනි ශරීර අවයව වලින් අවාචික සංකේත භාවිතය සංස්කෘතියේ පහත් අංගයක් ලෙස සමහරු සලකති. ශරීරාවයව මගින් සංකේත





භාවිතය සංස්කෘතියේ සමාරම්භක අවස්ථාවේ ඇති වූ ලක්ෂණයකි. නමුත් එය අද දක්වාම ව්‍යාප්තව පවතී. මෙය මනුෂ්‍යයාට මෙන්ම සතුන්ට ද පොදු බවක් දක්වයි. ශරීරාවයව වලට අමරතරව අදහස් ප්‍රකාශ කිරීමේ මාධ්‍යයක් ලෙස ද්‍රව්‍ය, සලකුණු වැනි දේ සංකේත හැමියට භාවිත කරයි. මේ සියල්ල අවාචික සංකේත මගින් අදහස් ප්‍රකාශ කිරීමට උපයෝගී කරගත් උපක්‍රම ලෙස දැක්විය හැකිය. එහෙත් මෙම අවාචික සංකේතවලට වඩා අදහස් ප්‍රකාශ කිරීමේදී ප්‍රබල වන්නේ වාචික සංකේත හෙවත් භාෂා මාධ්‍යය බව පැවසිය හැකිය.

සංස්කෘතියක භාෂා සංකේතයද වැදගත් වේ. මෙය උච්චාරණයෙන් කණට ඇසෙන්නට සැලැස්වීමෙන් ද ලේඛනය මගින් ඇසට දකින්නට සැලැස්වීමෙන් ද භාවිත කරයි. මානව සංස්කෘතියේ වැදගත්ම සංකේතය ලෙස භාවිත කරන්නේ භාෂාවයි. මිනිසාගේ අර්ථාන්විත සන්නිවේදනයක් හැටියට හැඳින් විය හැකි භාෂාව සහ වෙනත් සංකේත උපයෝගී කොට ගනිමින් ඔහුගේ සංස්කෘතියෙහි මූලික ලක්ෂණ ඉගෙන ගන්නා අතර ඊළ- පරපුරට ඔහු විසින් ඒවා උරුම කරනු ලබයි. මිනිසා වෙනත් සතුන්ගෙන් වෙනස් වන්නේ ඉගෙනීම (අද්දැකීම්) ආශ්‍රයෙන් ලබාගත් දැනීම පරපුරෙන් පරපුරට මෙහෙයවීම නිසාය[9]. අත්දැකීම් ආශ්‍රයෙන් ලබාගත් දැනීම් සම්භාරය පරපුරෙන් පරපුරට උරුම කරන්නේ බොහෝ කොට අර්ථාන්විත සන්නිවේදනයක් හැටියට හැඳින්විය හැකි භාෂාව හා සංකේත උපකාරී කොට ගෙනය. ශබ්ද එකතුවීමෙන් සෑදුණු වචනවලින් භාෂාව ගොඩ නැගී ඇත. ශබ්දවල එකතුවෙන් සෑදුණු වචන විශේෂ වූ තේරුම් ගෙන දෙන වාචික සංකේත හැටියට හැඳින්විය හැකිය. සෑම දියුණු භාෂාවකම දක්නට ලැබෙන මෙම වාචික සංකේත ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදිය හැකිය. එනම් ;

1. කණට ගොදුරුවන සංකේත හෙවත් ශ්‍රව්‍ය ගෝචර සංකේත
2. ඇසට ගොදුරු වන සංකේත හෙවත් දෘෂ්මිගෝචර සංකේත වශයෙනි.[10]

ශබ්ද හැඳින්වීම සඳහා යොදන අකුරු හෝ වෙනත් ආකාර වූ ලකුණු දෘෂ්මි ගෝචර සංකේත හෙවත් ඇසට ගොදුරුවන සංකේත හැමියට හැඳින්විය හැකිය. ශබ්ද සංකේත වෙනුවට අක්ෂර භාවිතය ඇති වූයේ ක්‍රමානුකූල දියුණුවකිනි. අදහසක් ප්‍රකාශ කිරීම සඳහා භාවිත කරන භාෂාව නමැති සංකේතය

ඉක්මන් වෙනසකට පත් නොවන්නේ එය සංස්කෘතියේ වාහකයා මෙන්ම ප්‍රාණ නාලිය හැමියටද සැලකෙන බැවිනි.

සෑම මානව සංස්කෘතියකම භාෂා සංකේතය දක්නට ලැබේ. එම භාෂා සංකේතය මානව සංස්කෘතියේ දියුණුව අනුව රඳා පවතී. භාෂා සංකේතය දියුණු නැත්නම් සංස්කෘතියේ දියුණුවක්ද නොමැත. භාෂාවක් බිහි වීමට සංස්කෘතියක් අවශ්‍යය. සංස්කෘතියක වර්ධනයට භාෂාව පිහිට වේ. භාෂාව පිරිහෙන විට සංස්කෘතියත් පරිහානියට පත්වේ. සිංහල භාෂා සංකේත ඇති වූයේ ක්‍රි.පූ. 3 වන සියවස පමණදිය. සිංහල හෝඩිය ඇති වූයේ බ්‍රාහ්මී හෝඩිය ඇසුරෙනි. පාලි සංස්කෘත භාෂාවන්ගේ ආභාසයෙන් එය පෝෂණය විය. රට විදේශ ආක්‍රමණවලට ගොදුරු වීමෙන් අපේ භාෂාව ද යටපත් වී සංස්කෘතියෙහිද පසුබෑමක් ඇති විය. අද සිංහල භාෂාව ජාත්‍යන්තර භාෂා සංකේත ගණයට පැමිණ ඇත. ඕනෑම රටක භාෂාවකින් ලියැවුණු පොත් සිංහල භාෂාවට පරිවර්තනය කිරීමට තරම් සිංහල භාෂාව අද දියුණු වී ඇත. සංස්කෘතියේ ශිෂ්ට හෝ අශිෂ්ට බව රඳා පවත්නේ භාෂාවේ දියුණු හා නොදියුණු බව මතය. භාෂාව මිනිසා හා සංස්කෘතිය එකට බැඳ තබන සාධකයකි. සංස්කෘතිය හඳුනා ගත හැක්කේ භාෂාව මගිනි. සංස්කෘතිය හැඩ ගැස්මට අන් සියල්ලටම වඩා වැදගත් වන්නේ භාෂාවයි. මානසික හැඩ ගැස්ම ප්‍රකාශ වන්නේ භාෂාවෙනි.

සිංහල භාෂාව දීර්ඝ කාලයක් තිස්සේ විවිධ භාෂා හා සංඝට්ටනයෙන් සකස් වූ භාෂාවකි. ආරම්භයේ සිට මේ දක්වා ප්‍රාකෘත, පාලි, සංස්කෘත, දෙමළ, හින්දි, පෘතුගීසි, ඕලන්ද හා ඉංග්‍රීසි භාෂා සමග සිංහල භාෂාව සංමිශ්‍රනය ලබා ඇත. මේ හැර සමහර සිංහල වචන ඉන්දුනීසියා භාෂාවල හා ඉන්දියානු අප්‍රකට ජාතීන්ගේ භාෂාවල තිබෙන වචනද සමග මිශ්‍රනය වී ඇත. සිංහල " ලිං " යන වචනය පොලිනීසියන්වරුන් අතර ද එමෙන්ම පාවිච්චි වෙයි. පෙකිරිත්ත ( පෙකණිය) යන වචනය රොඩී ජනයා අතරද පාවිච්චි කරන වචනයකි. රොඩී, කින්නර ජනයා තනිකරම සිංහල නොවේ. මෙයින් පෙනී යන්නේ ඒ ඒ ජාතීන්ගේ මිශ්‍රනය පමණක් නොව ඔවුන්ගේ සංස්කෘතියද අපේ සංස්කෘතියට සම්බන්ධ වූ බවයි. සිංහල භාෂාවේ දක්නට ලැබෙන දිශාකවුඩු යන වචනය සෑදී ඇත්තේ කිසියම් සංස්කෘතික ලක්ෂණයක් පාදක කරගෙනය. පෙර නැව්වල ගිය මිනිසුන් මුහුද මැදට ගියවිට ගොඩබිම සොයා ගැනීමට නොහැකි වූ විට එය දැන ගැනීම සඳහා කවුඩුවෙකු ගෙන යන සිරිතක් තිබුණි. ඌ අතහැරි විට පියාඹන පැත්ත බලා ගොඩබිම ගැන දැන ගත්හ. කවුඩා දිශාව බලා ගැනීමට උපයෝගී කරගත්





නිසා මේ වචනය භාවිතා විය. සේවටු යන වචනයත් එබඳුය. සේවටු නම් පුරුදු කරන ලද වටුවන්ය. දඩමීමා, දඩ ඇතා යන වචන ද එබඳුය. පැරණි මිනිසුන් දඩයම සඳහා ගත් උත්සාහය ඉන් පෙනේ.

භාෂාවෙහි එකම කාර්ය අදහස් ප්‍රකාශ කිරීම පමණක් නොවන බව භාෂාවේදීහු දක්වති. කිසිදු අදහසක් ප්‍රකාශ නොකරන වාගාලාපයන් මනුෂ්‍යයා එදිනෙදා ව්‍යවහාරයේදී යොදා ගනියි. මේ නිසා භාෂාවේ විවිධ පරමාර්ථ පිළිබඳව අපට සැලකීමට සිදුවේ. සමාජවාසීන් ප්‍රිය මනාප ජීවිතයකට එළඹවීමද භාෂාවේ වැදගත් පරමාර්ථයක් බව වාග් විද්‍යාඥයෝ පවසති. නිශ්ශබ්දතාව මනුෂ්‍යයා නොරුස්සයි. එයින් අප තුළ ජනිත වන්නේ බිය ජනක ස්වරූපයකි. දකුණු අප්‍රිකාවේ මිලේච්ඡ ජාතික මිනිස් කොටසක් තමන්ට අතර මගදී මුණ ගැසෙන පුද්ගලයා කවරකු හෝ වේවා ඔහු තමා සමග කථා නොකර ගියහොත් ඔහුගේ මරණය පවා සිදු කරයි. මෙයින් පෙනෙන්නේ නිශ්ශබ්දතාව මනුෂ්‍යයා තුළ බිය ජනක තත්වයක් ඇති කරන බවය. කිසිදු අදහසක් නොනගන යම් යම් ව්‍යවහාරයන් කවරම භාෂාවක වුවද දක්නට ලැබෙන්නේ නිශ්ශබ්දතාවට මනුෂ්‍යයා දක්වන නොකැමැත්ත නිසා විය හැකිය. මෙබඳු ව්‍යවහාර මනුෂ්‍යයා භාවිත කරනු ලබන්නේ ඔවුනොවුන් අතර සුහදශීලිත්වය තවදුරටත් රුකෙන බව ඇ-වීමටය. කවරම භාෂාවක වුවද දක්නට ලැබෙන මෙබඳු ව්‍යවහාරයන් මැලිනොව්ස්කි නම් මානව විද්‍යාඥයා හඳුන්වා දී ඇත්තේ සමාජ සංවාද වශයෙනි. මහාචාර්ය බ්ලොක් පවසන පරිදි භාෂාව වනාහි සමාජයක පුද්ගලයන් අන්‍යොන්‍ය සම්බන්ධය පවත්වා ගැනීම සඳහා උපයෝගී කොට ගන්නා කෘත්‍රිම වාග් සංකේත පද්ධතියකි. ( Artificial System of Vocal Symbols) මෙම සංකේත ශ්‍රව්‍ය සංකේත හා දෘශ්‍ය සංකේත වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදනු ලැබේ. භාෂාවේ කථා ව්‍යවහාරය ශ්‍රව්‍ය සංකේත ලෙසත්, භාෂාවේ ලිඛිත ව්‍යවහාරය දෘශ්‍ය සංකේත ලෙසත් සැලකිය හැකිය. මෙයින් වඩාත් ප්‍රධාන වන්නේ ශ්‍රව්‍ය සලකුණු බව පැවසිය හැකිය. දෘශ්‍ය සලකුණු වලටද පදනම වන්නේ ශ්‍රව්‍ය සලකුණුය. මේ අනුව භාෂාවක භාෂණය ප්‍රධානය. ලේඛනය ද්විතීයිකව ඇති වන්නකි. මහාචාර්ය රත්න විජේතුංග මෙසේ පවසයි.

" භාෂාවේ මූලික වන්නේ කථා ව්‍යවහාරයයි. කථා ව්‍යවහාරයේදී සිදු වන්නේ උච්චාරණ ඉන්ද්‍රියන්ගේ මාර්ගයෙන් භාෂා සංකේත ඉදිරිපත් කිරීමයි. කුඩා දරුවෙකු බහ තෝරන වියේදීම ඉගෙන ගන්නේ කථා ව්‍යවහාරයයි. එසේම ගෝත්‍රික ජනයා කථාව පමණක් උපයෝගී කොට ගෙන සන්නිවේදන කාර්යයෙහි

නියැළෙන බව පෙනේ. ”[12] සන්නිවේදන කාර්යයෙහිදී කථා ව්‍යවහාරය ප්‍රමුඛ වන බව මින් කදිමට පිළිබිඹු වේ.

## මූලාශ්‍ර


1. ධර්මදාස, කේ. එන්. ඕ., භාෂාව හා සමාජය, ආමුඛය, 1 පිටව;
2. *Leslie A White, 1960, The Basis of Language and Culture, (ed) by Walter Goldschmidt Exploring the ways of Mankind, N.Y., PP. 70 - 77;*
3. ධර්මදාස, කේ.එන්.ඕ., ඉහත ග්‍රන්ථය, ආමුඛය, IV,V, පිටු ;
4. *Brown, Roger, Words and Tings, Ch. V ,;*
5. *-- Ibid -- , PP.155 - 193;*
6. *Lenneberg, E.H., 1964, A Biological Perspective of Language in New Directions in the Study of Language, PP 65-88;*
7. අභයසිංහ, ඒ. ඒ., සම්භාව්‍ය ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය , භාෂාව හා ව්‍යාකරණය, 62 පිටුව;
8. ද සිල්වා, සුගතපාල, භාෂා විමර්ශණය, 1- 8 පිටු ;
9. *Coon, Carletons, 1954, The story of Man , New York, Alfred A. knopf, Inc, P.5;*
10. පල්ලියගුරු, චන්ද්‍රසිරි, සංස්කෘතියේ සමාජ මුහුණුවර, 30 - 31 පිටු;
11. *Bloomfield, Leonard, 1958, Language ; ( second ed.)*
12. විජේතුංග, රත්න, හෙළ වහර හා සන්නිවේදනය, 23 පිටුව ;






**6**

# මහජන සේවා විද්‍යුත් මාධ්‍ය සහ එහි ශ්‍රී ලංකේය කළමනාකරණ භූමිකාව

**හේමා සිරිවර්ධන**

මහජන සේවා විද්‍යුත් මාධ්‍ය යන්නට නිශ්චිත අර්ථ විවරණයක් දැක්වීම අසීරු බව විචාරක මතයයි. එහෙත් මහජන සේවාවක් යන්න කවර ස්වරූපයක ගති ලක්ෂණ සහිත පද්ධතියක් විය යුතු ද යන්න විවිධ අර්ථකථනයන් මගින් ප්‍රකාශයට පත්ව ඇත. මහජන සේවා විද්‍යුත් මාධ්‍ය පිළිබඳව නිර්වචනය කිරීමට ප්‍රථම වරට උත්සාහ ගනු ලැබුවේ බ්‍රිතාන්‍ය විද්‍යුත් මාධ්‍ය පර්යේෂණ ඒකකය මගිනි. Marc Raboy සඳහන් කරන ආකාරයට මහජන සේවා විද්‍යුත් මාධ්‍යයක මූලික ලක්ෂණ කිහිපයකි. (1) එනම් ඒ සඳහා විශ්වීය ලෙස ළඟා විය හැකිවීම, විශ්විය ලෙස ආකර්ෂණය කරගත හැකි වීම සුළුතරය කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීම, ජාතික වශයෙන් පුද්ගල අනන්‍යතාව තහවුරු කිරීමට දායක වීම, පෞද්ගලික සහ බලතල සහිත පක්ෂවලින් ඈත්වී සිට පවතින නීති රීති සාර්ථක වැඩ සටහන් නිපදවීමට බාධාවක් නොවීම , හොඳ වැඩ සටහන් තර-කාරී ලෙස නිපදවීම සහ ඒවා සංඛ්‍යාත්මකව සීමා නොකිරීම යන මූලික ලක්ෂණ වලින් සමන්විත විද්‍යුත් මාධ්‍ය සේවාවක් මහජන සේවාවක් ලෙස හඳුනාගත හැකි බව රැබෝයිගේ අදහසයි. මහජන සේවා විද්‍යුත් මාධ්‍ය සඳහා සම්මත අර්ථකථන නැති වුවද, එහි ක්‍රියාකාරී ස්වරූපය විවිධ සමාජ ආර්ථික සංකල්පවල අවශ්‍යතාවය අනුව වෙනස් වේ. එහෙත් මහජන සේවාවක ප්‍රධාන භූමිකාව වන්නේ සිය ග්‍රාහකයන් පුරවැසියන් ලෙස සැලකීමයි.

ජාත්‍යන්තර මහජන සේවා විද්‍යුත් මාධ්‍ය හඳුනාගෙන ප්‍රකාශයට පත් කර ඇති පරිදි මහජන සේවා මාධ්‍ය ආයතනයක සිද්ධාන්ත කිහිපයකි. එම සිද්ධාන්ත මාර්ක් රැබෝයි විසින් ප්‍රකාශයට පත් කරන්නට යෙදුණු මහජන සේවා මූලධර්ම වල වර්ධනීය අවස්ථාවක් වශයෙන් හඳුනා ගත හැකිය. ජාත්‍යන්තර මහජන සේවා විද්‍යුත් මාධ්‍ය ප්‍රකාශයට පත් කරන පරිදි මහජන සේවා විද්‍යුත් මාධ්‍ය ආයතනයක වැඩ සටහන් මූලධර්ම වන්නේ,

* විවිධ අවශ්‍යතා, විවිධ රුචිකත්වයන්, විවිධ ඇල්ම සහිත පුරවැසි පිරිසක් සිය නරඹන්නන් ලෙස සැලකීම. ඔවුන් හුදෙක් පාරිභෝගික භාණ්ඩ මිල දී ගන්නන් ලෙස නොසැලකීම.
* ප්‍රවෘත්ති, තොරතුරු , සංස්කෘතික, අධ්‍යාපන සහ විනෝදාශ්වාදය යන විවිධ පරාසයන් පුරා පැතිර ඇති, වැඩ සටහන් සම්පාදනයෙන් ප්‍රජාවගේ බහුවිධ අවශ්‍යතා ඉෂ්ට කිරීම.
* වැඩ සටහන් අභිමතාර්ථ, පැහැදිලිව හඳුනාගෙන ශ්‍රාවකයනට ඒවාට සහභාගී වීමට අවකාශ සලසා දීම.
* වැඩ සටහන් පිළිබඳව අදහස් උදහස් දැක්වීමට ශ්‍රාවකයාට අවස්ථා සලසා දෙන යාන්ත්‍රණයක් ක්‍රියාවට නැගීම.
* අසභ්‍ය හෝ ප්‍රචණ්ඩත්වයට තුඩු දෙන වැඩසටහන් පිටු දැකීම.
* ප්‍රජාතන්ත්‍රවාදි හරයන් හා බහුවිධතා රැක ගනිමින්, පාරිසරික අවශ්‍යතාවලට අවධානය යොමු කරමින් ජාත්‍යන්තර සාමය වෙනුවෙන් ඇපකැප වීම.
* ස්වාධීනත්වය සුරැකීම සහ දේශපාලන සහ වෙළඳ ප්‍රචාරණ බලපෑම්වලින් ස්වාධීනව වැඩසටහන් වල සමබරතාව රැක ගැනීම ඇතුළත්ව වෛෂයිකතාව (objectivity) පිළිබඳව අවධාරණය යොමුකරීම.

එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානයේ (UNESCO) පොදු වර්ගීකරණයට අනුව විද්‍යුත් මාධ්‍ය ප්‍රධාන වශයෙන් පද්ධති 03 කි. එනම්

* මහජන සේවා විද්‍යුත් මාධ්‍ය පද්ධතිය
* පෞද්ගලික ව්‍යාපාර සහිත විද්‍යුත් මාධ්‍ය පද්ධතිය
* රාජ්‍ය විද්‍යුත් මාධ්‍ය පද්ධතිය යනුවෙනි.

යුනෙස්කෝව තව දුරටත් වර්ගීකරණය කරනු ලබන පරිදි ආයතනික වශයෙන්





රාජ්‍ය විද්‍යුත් මාධ්‍ය ආයතන පහත සඳහන් කොටස් වලින් යුක්තය.

* ජාතික මහජන සේවා විද්‍යුත් මාධ්‍ය
* විකල්ප මහජන සේවා විද්‍යුත් මාධ්‍ය
* පෞද්ගලික හිමිකාරත්වය සහිත වෙළඳ විද්‍යුත් මාධ්‍ය
* බහු ජාතික හිමිකාරත්වය සහිත විද්‍යුත් මාධ්‍ය (මෙය මහජන +මහජන හෝ මහජන + පෞද්ගලික සම්බන්ධතාවය මත ක්‍රියාත්මක වේ.)
* ප්‍රජා විද්‍යුත් මාධ්‍ය
* රාජ්‍ය විද්‍යුත් මාධ්‍ය

ඉහත වර්ගීකරණයත් සමගින් ශ්‍රී ලංකාවේ විද්‍යුත් මාධ්‍ය වර්ගීකරණය කළ හැක්කේ කවර අයුරින් ද යන්න විමසීම වැදගත්ය.

ශ්‍රී ලංකාවේ පවතින විද්‍යුත් මාධ්‍ය පහත සඳහන් කොටස් වලින් සමන්විතය.

## ජාතික මහජන සේවා විද්‍යුත් මාධ්‍ය ආයතන:

මෙම වර්ගයට අයත් විද්‍යුත් මාධ්‍ය ප්‍රධාන වශයෙන් දෙකක් හඳුනා ගත හැකිය. මෙහි දැකිය හැකි විශේෂත්වය වන්නේ මෙම ආයතන කෙරෙහි රජයේ පාලනමය සහ නීතිමය හස්තයන් ක්‍රියාත්මක වීමයි. ආයතන පවත්වා ගැනීමේදී බලපවත්වන පරිපාලනය සහ අරමුදල් සම්පාදනය යන ඉතා වැදගත් තීරණාත්මක සාධකයන්හි දී, දේශපාලනික තීරණයන්හි බලපෑම ප්‍රධාන ස්ථානයක් ගනු ලබයි. දීර්ඝ කාලයක් තිස්සේ බලපත්‍ර ගාස්තු අය කිරීම මගින් අරමුදල් සම්පාදනය කර ගත් අතර, 2000 වර්ෂයෙන් පසුව එය අහෝසි කර දමන ලදි. එහෙත් කාලයක් තිස්සේ වැඩි තක්සේරුවක් නොකළ වෙළඳ ප්‍රචාරණ සඳහා මහජන සේවා විද්‍යුත් මාධ්‍ය තුළ වැඩි අවධානයක් සහ අවස්ථාවන් ලබා දීම මගින් අරමුදල් සපයා ගැනීමට උත්සුක වන බවක් පෙනේ. එවැනි තත්වයක් තුළ ජාතික මහජන සේවා සංකල්පය (National Public Service Concept) ආරක්ෂා කරගත හැකි ද යන්න විවිධ සමාජ කණ්ඩායම් විසින් ප්‍රශ්න කරමින් සිටී.

## පෞද්ගලික හිමිකාරත්වය සහිත වෙළඳ විද්‍යුත් මාධ්‍ය :

ශ්‍රී ලංකාවේ මුලින්ම බිහිවන රූපවාහිනී සේවාව (ITN) ආරම්භවන්නේ ද මෙම අංශය යටතේය.(පසුකාලීනව එනම් මාස 03 කට පසු එය රජයට පවරා

ගන්නා ලදි) මේ වන විට මෙම කොටසට අයත් නොවන විද්‍යුත් මාධ්‍ය රාශියක් ශ්‍රී ලාංකේය ග්‍රාහකයන් වෙත සිය සේවාවන් සම්පාදනය කරමින් සිටී. ඔවුන්ගේ අරමුදල් සපයා ගැනීමේ ප්‍රධානම මාර්ගය බවට පත් ව ඇත්තේ වෙළඳ අනුග්‍රාහකයන් සහ වෙළඳ දැන්වීමය.

## බහු ජාතික හිමිකාරීත්වය සහිත සේවාවන් :

මේ වර්ගයට අයත් ගුවන් විදුලි සහ රූපවාහිනී සේවාවන් කිහිපයක් ද ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වෙමින් පවතී. ශ්‍රී ලංකාව තුළ මෙහි දැකිය හැකි තත්ත්වය වන්නේ මෙහි හිමිකාරත්වය පෞද්ගලික ව්‍යවසායන් මගින් ක්‍රියාත්මක වීමයි.

## ප්‍රජා විද්‍යුත් මාධ්‍ය

මේ වර්ගයට අයත් විද්‍යුත් මාධ්‍ය වශයෙන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන්නේ ගුවන් විදුලි සේවාවන් පමණි. එවැනි සේවාන් සපයන ආයතන 08 ක් පමණ මේ වන විට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වෙමින් පවතී. මේවායෙහි සියළු තීරණාත්මක සාධකවල ඒකාධිකාරී බලය රජය සතුය. අරමුදල් සැපයීම සහ පරිපාලන පද්ධතිය කෙරෙහි සෘජුවම දේශපාලනික තීරණවල බලපෑම ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකේය ග්‍රාහකයාගේ ප්‍රථම විද්‍යුත් මාධ්‍ය අත්දැකීම වන්නේ ගුවන් විදුලියයි.1922 වර්ෂයේ දී බ්‍රිතාන්‍ය ප්‍රථම නිත්‍ය ගුවන් විදුලිය සේවයක් ආරම්භ කළ වසරේදීම, යටත් විජිත රාජ්‍යයක් ව පැවති ශ්‍රී ලංකාවට ගුවන් විදුලි පිළිබඳ අත්දැකීම හඳුන්වා දෙනු ලැබීය. බ්‍රිතාන්‍ය යටත් විජිතයක්ව පැවති රටවල් අතරින් ගුවන්විදුලි සේවාවක් හඳුන්වා දුන් දකුණු ආසියාතික රට වුයේ ශ්‍රී ලංකාවය. එය ලංකා ආධුනික රේඩියෝ සංගමය (Ceylon Amature Wirless Society) නමින් හැඳින් විය. පසුව 1928 දී එහි නම වෙනස් විය. ශ්‍රී ලංකාව තුළ නිල වශයෙන් ගුවන් විදුලි සේවා ස්ථාපිත වන්නේ 1924 ජුනි මස 27 වන දිනයි. නිල වශයෙන් ස්ථාපිත වු ගුවන් විදුලි සේවාවක් පිහිටු විමේ අරමුණ වුයේ ග්‍රාහකයාට පුළුල් සේවාවක් සැපයීමයි. ගුවන්විදුලිය එහි අරමුණු සහ ඒ පිළිබඳව පනතක් ගෙන එනු ලැබුවේ 1966 වර්ෂයේදිය. එතෙක් විවිධ කොමිසම් වාර්තා සහ විවිධ මණ්ඩල වල නිර්දේශයන් මත ආයතනයේ කළමනාකරණ කාර්යන් ක්‍රියාත්මක විය. මෙම පනතට අනුව ගුවන්විදුලි සංස්ථාවේ කර්තව්‍ය වශයෙන් දක්වා ඇති ශිර්ෂ අතර,





"to carry on a broadcasting service within Sri Lanka and from time to time develop extend, and improve the service in the public interest"[2] යන ප්‍රකාශනය කෙරෙහි වඩාත් සැලකිල්ලක් දැක්විය යුතුය.

1967 ජනවාරි 05 වන දින ගුවන් විදුලි දෙපාර්මේන්තුව රජයේ සංස්ථාවක් බවට පත් කරමින් එය විවෘත කළ එවක අගමැති ඩඩ්ලි සේනානායක මහතා "නව සංස්ථාව පිහිටුවීමේ ප්‍රධාන පරමාර්ථය වුයේ, රටේ සිදුවන දේ පිළිබඳව ජනතාව වඩා හොඳින් දනුවත් කිරීමයි." යන්න සංස්ථාවේ අරමුණු ලෙස ප්‍රකාශයට පත් කරන ලදි. ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි සේවාවක් ස්ථාපනය වීමෙන් වසර 55 කට පසුව ඇරඹෙන රූපවාහිනී සේවාව 1979 දි පෞද්ගලික අංශයක් මගින් ඇරඹුණ ද ශ්‍රී ලංකා රූපවාහිනිය ස්ථාපිත වන්නේ 1982 වර්ෂයේදිය. ජාතික රූපවාහිනිය වශයෙන් ශ්‍රී ලාංකේය ජනතාව විසින් හඳුනා ගනු ලබන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සිය සංස්ථාවේ දර්ශනය (vision) පිළිබඳව දක්වන්නේ "හෙට දින වඩාත් යහපත් සමාජයක් ගොඩ නැගීමේ අරමුණෙන් අති උසස් තත්වයේ රූපවාහිනී වැඩ සටහන් විකාශය කිරීම " යනුවෙනි.

එහි කාර්යභාරය පිළිබඳව ශ්‍රී ලංකා රූපවාහිනී කෙටුම් පතෙහි මග පෙන්වීම යටතේ ජාතික රූපවාහිනී විකාශනාගාරය ලෙසට මෙන්ම රමේ පුමුඛතම රූපවාහිනී විකාශනය වීම සඳහා අනභිභවනීයත්වය ලබා ගැනිම යනුවෙන් දැක්වේ. උක්ත ආකාරයේ දර්ශනයක් සහ ක්‍රියාකාරීත්වයක් පිළබඳව සඳහන් කරන ජාතික රූපවාහිනියේ අරමුණු කවරේද යන්න ද විමසිය යුතුය.

* ප්‍රේක්ෂකයා පරමෝත්තමයා ලෙස සැලකීම
* ගුණාත්මක වැඩ සටහන් විසුරුවා හැරීම සඳහා රූපවාහිනී විකාශ තාක්ෂණයේ උසස් බව සහ යාවත්කාලීන බව රඳවා ගැනීම.
* ශ්‍රී ලංකාවේ ජාතික රූපවාහිනී විකාශනාගාරය ලෙසින් අපගේ ආකර්ෂණය තව තවත් වැඩි දියුණු කර තබා ගැනිම.
* ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමයන් සහ යහපත් ජාත්‍යන්තර ප්‍රතිරූපය ඇති කිරිමට හා වැඩි දියුණු කිරිම මෙන්ම ප්‍රවර්ධනය කිරීම පවත්වා ගැනීම.
* ශ්‍රී ලංකාවේ යහපත් ආකල්ප ප්‍රවර්ධනය කරවන විධිමත් සහ අවිධිමත් අධ්‍යාපනික වැඩ සටහන් ප්‍රවර්ධනය තුළින් ජාතියට අධ්‍යාපනය ලබා දිමේ ප්‍රධාන භූමිකාවක් ලබා ගැනීම.

උක්ත අරමුණු ශ්‍රී ලංකාවේ ජාතික රූපවාහිනිය විවිධ අවස්ථාවන් වලදී ප්‍රකාශයට පත් කරන ලද ඒවාය. ඊට අමතරව ජාතික රූපවාහිනී සේවය ආරම්භ කිරීමට පෙර එය ආරම්භ කොට පවත්වා ගත යුත්තේ කවර කරුණක් නිසාද යන්න විවිධ අයුරින් මතවාද පළවිය. ඒ අතර දේශපාලනමය වශයෙන් ප්‍රකාශිත මත වඩාත් වැදගත් වන්නේ එකී හඬ රටේ බහුතර ජනතා නියෝජනයේම කොටසක් ලෙස සලකන්නට සිදුවන නිසාය. රූපවාහිනී කෙටුම්පත දෙවන වර කියවීමේදී එවකට රාජ්‍ය ඇමතිව සිටි ආනන්ද තිස්ස ද අල්විස් මහතා ප්‍රකාශ කළේ මෙම පනත ඉදිරිපත් කිරීම ලෝකය ගම දෙසට රැගෙන යාම සඳහා ගනු ලබන පියවරකි [5] යනුවෙනි.

“ අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි පමණක් නොව සෞඛ්‍ය, කෘෂිකාර්මය වැනි තවද බොහෝ ක්ෂේත්‍රයන්හි රූපවාහිනීය භාවිත කළ හැකි වේ. ”[6]

“ මූලික වශයෙන් ශ්‍රී ලංකාව කෘෂිකාර්මික රටකි. නිවැරදි රූපවාහිනී වැඩ සටහන් අලුතින් සැපයිය හැකි නම් අපගේ ගොවීන් දැනුවත් කළ හැකිවේ. අප රමේ කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවක් තිබුනත් පිම්සර ගැමි ගොවීන් වෙත පුවත් රැගෙන යාමට එය ප්‍රමාණවත් නොවේ. දැන් රූපවාහිනිය ප්‍රයෝජනට ගත හැකිව තිබේ. පිම්සර ගම්බද ගොවියා පවා රූපවාහිනී යන්ත්‍රයක් මිල දී ගැනීමේ හැකියාවෙන් යුතු වේ. එම නිසා මේ ආකාරයේ වැඩ සටහන් කෙරෙහි අවධානය කේන්ද්‍රගත විය යුතුය.”[7]

1982 අංක 06 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා ආඥා, පනතේ II වන කොටසෙහි සංස්ථාවේ කර්තව්‍ය,බලතල සහ කාර්ය යන ශිර්ෂය යටතේ සංස්ථාව පිහිටුවීමේ අරමුණු පිළබඳව දැක්වේ. එනම් එහි (1) (අ) “ ශ්‍රී ලංකාව ඇතුලත රූපවාහිනී ප්‍රචාරක සේවයක් පවත්වාගෙන යාම සහ එම සේවය ප්‍රවර්ධනය කිරීම සහ මහජන හිත පිණිස වැඩ සටහන් සම්පාදනය කිරිමෙහිලා උසස් තත්වයක් පවත්වාගෙන යාම යනුවෙනි.[8] උක්ත සඳහන් කරන ලද සියලු කරුණු මගින් මහජන සේවා විද්‍යුත් මාධ්‍ය ක්ෂේත්‍රයේ කළමනාකරණය කෙරෙහි සෘජුවම බලපෑම් සහිත වන ක්ෂේත්‍රයක් ආවරණය කෙරේ.කළමනාකරණය යනු සීමිත සම්පත් ඊට අයත් කාර්යයන් සමග ගැලපීමෙන් ආයතනික අරමුණු ජය ගැනීම සඳහා මෙහෙයවීමේ කලාව වශයෙන් හඳුනා ගත හැකිය.

කළමනාකරණය පිළබඳව ඇති අර්ථකථන අතුරින් ඩොනල්ඩ් ක්ලෂ් විසින් ප්‍රකාශ කරන්නට යෙදුණු පරිදි “ ජනතාවට උපරිම සේවය සැලසීමටත්,





සේවක සේව්‍ය දෙපක්ෂයට උපරිම සමෘද්ධිය සහ සංතෘෂ්මිය ලබා දීමටත්, හැකිවන පරිදි අවම පරිශ්‍රමයකින් උපරිම ප්‍රතිඵල ලබා ගැනීමේ කලාව කළමනාකරණයයි ” [9]

කළමනාකරුවන් යනු කවුරුන්ද යන්න පිළිබඳව Peter Druker ප්‍රකාශ කරන්නේ The people in an organization whose jobs include managing responsibilities[10] යනුවෙනි.

මේ අනුව පැහැදිලි වන්නේ කළමනාකරණය යනු ලාභ ඉපයීම අරමුණු කරගත් ව්‍යාපාර ආයතන වලට මෙන්ම, සේවාවන් සැපයීම අරමුණු කරගත් ආයතතනවලට ද , ඒවායෙහි ආකෘතික ස්වරූපය හෝ කාර්යන්වල විවිධත්වයෙන් තොරව, කළමනාකරණය විද්‍යාත්මක අයුරින් භාවිතයට ගත යුතු බවයි. මේ අනුව ශ්‍රී ලංකාවේ මහජන සේවා විද්‍යුත් මාධ්‍ය ආයතන සිය ආයතනික කළමනාකරණය හැසිරවීම මගින් ආයනයන් හි අරමුණු අත්පත් කර ගැනීම සඳහා කොතරම් දුරට සාර්ථක භාවයක් පෙන්නුම් කර ඇද්ද යන්න විමර්ශනය කළ යුතුය. මහජන සේවා විද්‍යුත් මාධ්‍ය ආයතන වශයෙන් හඳුනා ගැනෙන ශ්‍රී ලංකා ජාතික ගුවන්විදුලිය සහ රූපවාහිනිය පිළිවෙලින් වසර 80 ක සහ වසර 22 ක පමණ කාලයක් ශ්‍රී ලංකේය ග්‍රාහක විඥානය හැසරවීමේ කාර්යයෙහි යෙදී ඇත. එම කාලය තුළ දී අත්පත් කර ගනු ලැබූ ඉෂ්ටාර්ථ හෝ අනිෂ්ටාර්ථ පිළිබඳ සාකච්ඡා කිරීමට පෙර මෙම ආයතන ද්විත්වයෙහි කළමනාකරණය සහ එහි ක්‍රියාකාරිත්වය පිළිබඳව අවධානය යොමු කළ යුතුව ඇත.

* ජාතික විද්‍යුත් මාධ්‍ය නාලිකා ද්විත්වය රමේ සමස්ත ග්‍රාහක ප්‍රජාවගේ බහුවාර්ගික, බහු ආගමික, බහුවිධ අපේක්ෂාවන් ඉෂ්ටකිරිම සඳහා සිය මාධ්‍ය භාවිතය ක්‍රියාත්මක කරනවා ද?
* රට තුළ ක්‍රියාත්මක එකම මහජන සේවා ජාලය වශයෙන් රමේ සමස්ත ජනගහනයෙන් කොතරම් පිරිසක් රඳවා තබා ගන්නටත්, (maintain) ආකර්ෂණය (Attraction) කර ගන්නටත් හැකි වුවා ද?
* වැඩ සටහන්කරණය ( සැලසුම්කරණය, සංවිධානකරණය,විකාශය) නියමිත පරිදී ආයතනික අරමුණු සහ ග්‍රාහක අරමුණු ඉෂ්ට වන අයුරින් පවත්වා ගෙන යනවාද?පවත්වා ගත හැකි වුවා ද?
* ආයතනික,මානව සම්පත් ඇතුළු අනෙකුත් සියලු භෞතික සම්පත් විධිමත් කළමනාකරණයකට යටත් ව පමණක් හැසිරවීය හැකි වුවා ද?

* හදිසි පාරිසරික වෙනස්වීම් (දේශපාලන)ආයතනික දිගුකාලින කළමනාකාර සැලසුම් වෙනස් කිරිම කෙරෙහි බලපෑම් සහිත වුවා ද,?
* කළමනාකරණ තිරණ ගැනිම සහ සැලසුම් ක්‍රියාත්මක කිරිම කොතරම් දුරට නිදහස් භාවයකින් යුතුව කළ හැකි වුවා ද?
* ඉහළ මම්ටමේ කළමනාකරණයේ සිට (Top level Management) පහළ මම්ටමේ කළමනාකරණ (Lower level Management) තනතුරු දක්වා කළමනාකරුවන් කළමනාකරණ න්‍යායන් සහ එහි භාවිතය පිළිබඳව දැනුම සහ අවබෝධය සහිත වුවා ද?
* අන්තර්ජාතික මහජන සේවා විද්‍යුත් මාධ්‍ය සම- සසඳන විට සිය ආයතනයන්හි භාවිත කළමනාකරණ රටාව සහ වැඩ සටහන්වල ප්‍රමාණාත්මක සහ ගුණාත්මකභාවය පිළිබඳව තෘප්තිමත් විය හැකිද?

ඉහත ප්‍රශ්නවලට අදාළ පිළිතුරු සැපයිමේදී ඒවාට ලැබෙන ප්‍රතිචාරවල සාර්ථක අසාර්ථකභාවය තුළින් පැහැදිලි වන්නේ මහජන සේවා විද්‍යුත් මාධ්‍ය ආයතන සිය ආයතනයන්හි ආරම්භක අරමුණු කොතෙක් දුරට ඉෂ්ට කර ගෙන තිබේද යන්නයි. උක්ත ප්‍රශ්නවලට පිළිතුරු සැපයිමේදී ශ්‍රී ලංකාවේ රාජ්‍ය විද්‍යුත් මාධ්‍ය ආයතනවල ක්‍රියාකාරීත්වය ඉතා දුර්වල කළමනාකරණය මෙහෙයවීමක අසාර්ථකභාවයයි. ලොව බොහෝ මහජන සේවා විද්‍යුත් මාධ්‍ය ආයතනවලට සිදු වු පරිදි ශ්‍රී ලංකාවේ මහජන සේවා විද්‍යුත් මාධ්‍ය ආයතනවලට ද ඒ කෙරෙහි බලපාන පාරිසරික විචල්‍යතා වලින් ගැළවී ගත නොහැකි වු බව පෙනේ. විශේෂයෙන්ම වර්තමාන ජනමාධ්‍ය ආයතන පාලනය කරන ප්‍රධාන බලවේග වන

* රජය සහ දේශපාලන බලවේග
* සමාජ සංස්කෘතික පරිසරය
* සමාජ ආර්ථික රටාව
* සමාජ සිරිත් විරිත් සහ ආචාරවිධි
* නීතිය යන ප්‍රධාන පාරිසරික බලවේගයන්හි විචල්‍යතාවන් ප්‍රධාන වේ.

ශ්‍රී ලංකාවේ මහජන සේවා විද්‍යුත් මාධ්‍ය කෙරෙහි වන ප්‍රධාන පාරිසරික බලපෑම වන්නේ රජය සහ දේශපාලන විචල්‍යතාවයයි. සෑම අවස්ථාවක දීම බලයට පත්වන රජයන් මගින් මෙම ආයතනවල කළමනාකරණය හැසිරවීමේ තීරක බලය සියතට ගැනීම නිසා කළමනාකරණ තනතුරු වෙනස් වීමේ සිට සියලු කළමනාකරණ තීරණයන් සහ එතෙක් ක්‍රියාත්මකව පැවති තීරණ සහ සැලසුම් ක්‍රියාත්මකවීම සම්පුර්ණයෙන් ම හෝ අර්ධ වශයෙන් බිඳවැටීම හෝ ඇණ හිටීමක්





සිදුවේ. මෙවැනි අවස්ථාවලදී බොහෝ විට දැකිය හැකි දෙයක් වන්නේ එතෙක් පැවති,ජනතාවට හිතකර යහපත් කළමනාකරණ ප්‍රතිපත්තීන් පවා වෙනස්වීම් වලට හෝ අතහැර දැමීමට යටත් වන බවයි. එය රජය සහ දේශපාලන වශයෙන් වාසිදායක වුවද වගකීම් සහිත මහජන සේවා ආයතනයකින් ජනතාව බලාපොරොත්තු වන අපේක්ෂාවන් මුදුන් පැමිණවීමට එය බාධාවක් වේ. සෑම අවස්ථාවකම නව රජයක් බලයට පත්වන විට මහජන සේවා ආයතනවල කළමනාකරණ තනතුරු වෙනස් කරන්නට යාම නිසා සෑම විටම අලුතෙන් පත්වන කළමනාකරුවන්ට ආයතනය පිළිබඳව තීරණ ගන්නටත් සැලසුම් සකස් කරන්නට කාලයක් ගැනීමට සිදුවේ. එවිට තවත් රජයක් බලයට පත් වී ඔවුන්ව තනතුරුවලින් ඉවත්කොට තවත් කොටසක් බලයට පත්වේ. මෙය චක්‍රිය ලෙස සිදු වන්නට වීම නිසා ආයතනයන්ට ස්ථිර ප්‍රතිපත්තියක පිහිටා ක්‍රියාකරන්නට නොහැකි වේ. එම තත්වය ආයතනයේ කළමනාකරණය ඉතා නරක ලෙස පිරිහී යාමට මෙන්ම ආයතනික අරමුණු මෙන්ම ජනතා අරමුණු ඉෂ්ට වීමට නිෂ්ක්‍රිය වීමට ද හේතු වේ.

වර්තමාන ශ්‍රී ලංකාවේ මහජන සේවා විද්‍යුත් මාධ්‍ය ආයතන වලට ග්‍රාහක පාර්ශවයෙන් විවිධ චෝදනා එල්ල වෙමින් පවතී. එනම් මෙම ආයතනවල මානව සම්පත් ඇතුළු සියලු භෞතික සම්පත් දේශපාලන අවශ්‍යතා සහ වෙනත් සුළුතරයකගේ අවශ්‍යතා ඉෂ්ට කිරිම සඳහා යොදා ගන්නා බවයි. එසේම ජාතික ආගමික සහ සංස්කෘතික හර පද්ධතීන් විකෘති කරමින් විනාශ කිරිමේ කාර්යයෙහි ඉතා උසස් මට්ටමින් නියැලෙන බවටත් චෝදනා කරමින් සිමිති. එසේම ජනමාධ්‍ය විසින් මහජනතාවගේ හැසිරීම අනතුරට පත් කොට ඇති බවටත්, ළමා සහ තරුණ පරපුර අශ්ලීල,නොවැදගත් දේ වෙත බලෙන් තල්ලු කරමින් සිමින බවටත් චෝදනාවන් පවතී. මෙම තත්වය මහජන සේවා ආයතනයක එහි සංකල්ප ක්‍රියාත්මක කිරීම කෙරෙහි ප්‍රශ්නකාරී තත්වයකි. ලෝකයේ බොහෝ මහජන සේවා ආයතනවලට සිදු වු පරිද්දෙන් දේශපාලන වැඩ කටයුතු වලට ආයතනවලින් වැඩි ඉඩ කඩක් ලබා දීමට යාම නිසා එහි ආදායම් ඉපයීම් තත්වය පහළ වැටීමේ අවධානමට ශ්‍රී ලංකාවේ මහජන සේවා විද්‍යුත් මාධ්‍ය වලට ද මුහුණ පැමට සිදු විය. එම නිසාම ආයතනයන්හි ආදායම් තත්වය යහපත් කර ගැනීම සඳහා වෙළඳ අනුග්‍රාහකයන් සහ ප්‍රචාරකයන් පිටුපස යන්නට මහජන සේවා ආයතනවලට සිදු විය. ඔවුන්ගේ අරමුණු ඉෂ්ට කර දෙමින් ආයතනයන්හි ආදායම් ඉපයිම සඳහා අනුග්‍රහකයන්ගේ තීරණ සහ යෝජනා ක්‍රියාත්මක කරන්නට මහජන සේවා ආයතනවල කළමනාකරුවන්ට සිදු වී ඇත.එහිදී ජනමාධ්‍ය ව්‍යාපාරික පංතිය නමැති

සමාජ ආර්ථික කොටස මගින් පාලනය කරමින් සිමින බව පෙනේ. මාධ්‍ය පිළිබඳ තක්සේරු කරන්නට ග්‍රාහකයාට තිබූ අයිතිය ද ගිලිහී යමින් පවතී. එම නිසාම අදහස් පිළිබඳ නිදහස් සහ විවෘත වෙළඳ පොල අනතුරුදායක තත්වයට පත්ව ඇත. එපමණක් නොව මාධ්‍ය අතිවිශාල ව්‍යාපාර කෙරෙහි ඉතා යටහත් පිළිවෙතක් අනුගමනය කරන්නට යාම නිසා බොහෝ අවස්ථාවල දී මහජන සේවා ආයතනවල සංස්ලේඛ්‍ය අන්තර්ගතය (editorial content) සහ සංස්ලේඛ්‍ය ප්‍රතිපත්තීන් (editorial policy) ද වෙළඳ අනුග්‍රහකයනගේ යටතට පත් කර ඇත. එම තත්වය සමාජයේ යහපත් සමාජීය වෙනස්කම් වලට විරුද්ධ වී යාමේ අවදානම දක්වා මාධ්‍ය කළමනාකරුවන්ගේ භූමිකාව වෙනස් කොට ඇත.

ශ්‍රී ලංකාව සංවර්ධනය පිළිබඳව වසර ගණනාවක් තිස්සේ සිහින දකින රටකි. එකී සිහින සිහිනයන්ම පමණක් වන තරමට කටයුතු කරන්නට අපේ රමේ ඒවා මෙහෙය වූ සියලු පාර්ශවයන්ගේ දායකත්වය සම්මාදම් වී ඇත. ඒ අතර මහජන සේවා ආයතන කළමනාකරණය ප්‍රධාන තැනක් ගනී. මාධ්‍ය කළමනාකරණයේ දී සැලකිල්ලට ගත යුතු මානව සම්පත් ඇතුළු භෞතික සම්පත් කළමනාකරණය යන කටයුතු මහජන සේවා මාධ්‍ය කළමනකරණ තුළ දී නිවැරදි අර්ථකථනයකට හසු වී නැති බව පෙනේ. එම නිසාම තීරණ ගැනීම, සහ සැලසුම් සකස් කිරිම, සංවිධානය කිරීම, මෙහෙයවීම , පාලනය සහ ඇගයීම යන කළමනාකරණ කටයුතු විද්‍යාත්මකව සිදු වන බවක් නොපෙනේ. එසේ කළමනාකරණය විද්‍යාත්මක ලෙස හැසිරවීම සඳහා අවශ්‍ය කළමනාකරණ පිළිබඳ ව න්‍යායාත්මක දැනුම කළමනාකරුවන් සතුව නොතිබීම ද ඊට හේතු වී ඇත. අනපනත්වල සහ වෙනත් ලිමිත වාර්තාවන්ට පමණක් සීමා වූ ජාතික විද්‍යුත් මාධ්‍ය ආයතනයන්හි දර්ශනයන් සහ අරමුණු මෙන්ම කාර්යභාරය ද හඳුනා නොගත්, සහ ඒ පිළිබඳ අවබෝධයක් රහිත පුද්ගලයන් මෙකී ආයතනවල අග්‍ර මම්ටමෙ තනතුරු (Top Level Management) සඳහා පත්වීම ද ශ්‍රී ලංකාවේ විද්‍යුත් මාධ්‍ය කළමනාකරණය දියාරු ලිහිල් ස්වභාවයකට පත් කිරිමට හේතු වී ඇත. එපමණක් නොව සමස්ත ශ්‍රී ලාංකේය ග්‍රාහකයන් විසින් දිගු කලක් තිස්සේ හඳුනා ගනිමින් , භාවිතයට ගන්නා ලද ජාතික රූපවාහිනිය, ජාතික ගුවන්විදුලිය යන සේවාවන් " ජාතික" වශයෙන් හඳුන්වනවාට අකමැති වූ සහ ඒ පිළිබඳව ද්වේශයෙන් කථා කළ පුද්ගලයන් උක්ත ආයතනයන් කළමනාකරණය කිරිමට සම්බන්ධවීම ද ආයතනික කළමනාරණයේ ප්‍රතිඵල ග්‍රාහක කේන්ද්‍රිය නොවන්නට හේතු විය.





සංවර්ධනය සහ සන්නිවේදන (Communication and development) යන කෘතියේදී මජිඩ් ටෙහෙරානියන් (Majid Teheranian) විසින් වගකීම් සහිත මාධ්‍ය පද්ධතියක මූලික කාර්යය විය යුත්තේ කවර කරුණු ද යන්න අවධාරණය කරනු ලබයි.

* සමාජ සංස්කෘතිකමය පාරිසරික අවශ්‍යතාව සහ ඉල්ලුම මෙන් ම සීමාවන් සහ ශක්‍යතාවන් හඳුනා ගැනීම.
* ස්ථාවර වූ සාමාජිය,ආර්ථික සහ සංස්කෘතික අවශ්‍යතාවන්ට සමීපව ප්‍රතිචාර දැක්වීම සඳහා ප්‍රතිපත්ති මෙන්ම වැඩ සටහන් ද මනාව එකට එක් කිරීම.
* මාධ්‍යයේ කාර්යභාරය ඉටු කිරීම සම- අත්වැල් බැඳ ගැනීමට හැකියාවක් ඇති ආයතන සහ ජනමත නායකයින් සමග සමීපව වැඩ කිරීම
* එහි විශ්වාසනීයත්වය සහ සවිලත්වය ආරක්ෂා කර ගැනීම සඳහා අවසාන වශයෙන් ස්වාධීකාරය,වගකීම් සහ දැනුවත්වීමේ ඉහළ මම්ටමක් රඳවා ගැනීම.

ටෙහෙරානියන් විසින් ප්‍රකාශිත උක්ත කරුණු වගකීම් සහිත මහජන සේවාවන් වශයෙන් ශ්‍රී ලංකාවේ මහජන සේවා විද්‍යුත් මාධ්‍ය සම- කොතෙක් දුරට ගැලපිය හැකිද? යන්න විමසීම වැදගත්ය. උක්ත කරුණු සියල්ල අවසාන වශයෙන් අරමුණු වී ඇත්තේ ග්‍රාහක කේන්ද්‍රිය ජනමාධ්‍ය හැසිරවීමක් උදෙසාය. සමාජයේ සුළුතර පිරිසක් වෙනුවෙන් පමණක් ඒ තුළ නියෝජනයක් නැත. එහෙත් ශ්‍රී ලංකාවේ මහජන සේවා මාධ්‍ය මේ වන විට ක්‍රියා කොට ඇත්තේ ග්‍රාහකයා හුදෙක් පාරිභෝගිකයෙක් හෝ හුදු බොළඳ ආශාවන් සහ අශ්ශිල ආශ්වාදය සහිත පුද්ගලයෙක් ලෙස පමණක් සිතා බව පසුගිය කාලය තුළ මහජන සේවා දෘශ්‍ය මාධ්‍යයන්හි ගමන් මග පිරික්සන විට පෙනේ. ( මෙම තත්ත්වයෙන් බොහෝ දුරට දුරස් වීමට ස්වධීන රූපවාහිනී සේවය උත්සාහ ගනිමින් සිම් බවක් පෙණින.) ගෝලීයකරණයේ ග්‍රහණයෙන් මිදී ක්‍රියාත්මක විය නොහැකි බව ප්‍රකාශ කරමින් මහජන සේවා යන සංකල්පය වෙළඳ ව්‍යාපාර සංකල්ප සහ අරමුණු වෙත ආරෝපණය කරන්නට උක්ත ආයතන මෙහෙයවූ කළමනාකරුවන් ඉතා කැපවීමෙන් ක්‍රියා කළ බව පෙනේ. එහි දී සිය මධ්‍ය වගකීම හෝ එය ඉටු කිරීම සඳහා අවැසි කළමනාකරණ ප්‍රතිපත්ති කෙරෙහි ඔවුන්ගේ අවධානය යොමු වූ බවක් නොපෙනේ. මේ අනුව පැහැදිලිවන්නේ ග්‍රාහක කේන්ද්‍රිය ලෙස සිය කළමනාකරණය හැසිරවීමට අපොහොසත් වී ඇති බවයි. පොදු ග්‍රාහක අපේක්ෂාව සහ අභිලාෂයන් පිළිබඳව සිය මාධ්‍ය කාර්යභාරය ඉෂ්ට කිරීමේ වගකීම් ඔවුහු සිතා මතාම අමතක කොට

දමා ඇත. ජාතික සංවර්ධන ක්‍රියාවලිය තුළ සිය කාර්යභාරය ඉතා සුළු කොට අවධානයට ගෙන ඇති අතර, වඩා වැඩි අවධානයක් යොමු කොට ඇත්තේ දේශපාලන සහ වාණිජ්‍ය අරමුණු ජය ගැනීම උදෙසා බව පෙනේ. මහජන සේවා ආයතන කළමනාකරණයේ දී අනුගමනය කළ යුතු කළමනාකරණ ප්‍රතිපත්ති භාවිතයට නොගැනීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපාන ලද සාධක කිහිපයක් ද හඳුනා ගත හැකිය.

දේශපාලන අරමුණු වාණිජ්‍ය අරමුණු,ආගමික සහ ජාතික උන්මාදය, රමේ ආර්ථික ප්‍රතිපත්ති, සන්නිවේදන තාක්ෂණයේ වෙනස්කම් හඳුනා නොගැනීම,සහ කළමනාකරුවන්ගේ පෞද්ගලික මතවාදයන් මේ අතර ප්‍රධාන වේ. මහජන සේවා විද්‍යුත් මාධ්‍ය වශයෙන් සමස්ත ග්‍රාහක කේන්ද්‍රිය වන අයුරින් සිය කළමනාකරණ භූමිකාව විධිමත්ව සහ නිවැරදිව හසුරවන්නට නම් ගත යුතු පියවර කිහිපයක් පෙන්වාදිය හැකිය. උක්ත ආයතනවල අනපනත්වල සඳහන් යල් පැන ගිය සහ වර්තමානයට නොගැළපෙන යම් යම් කරුණු ඉවත් කිරීම හෝ වෙනස් කළ යුතුය.එසේම සමහර නිර්වචනයන් ක්‍රියාත්මක කළ හැකි ආකාරයට අර්ථකථනය කළ යුතුය. දේශපාලන ගැති භාවයන් සහ හිතැතිභාවයන් උපරිම අයුරින් ඉටු කරන්නට නොව, ජනතා අරමුණු ඉෂ්ට කරන්නට හැකියාව සහ දැනුම් සහිත පුද්ගලයන් මෙකී ආයතනවල අග්‍ර තනතුරු සඳහා පත් කළ යුතුය. ජනතා පරමාධිපත්‍ය සුරැකිය හැකි ආකාරයේ ක්‍රියාකාරී ප්‍රතිපත්තීන් සකස් කළ යුතුය. ජාතික ජනමාධ්‍ය ප්‍රතිපත්තියක අවශ්‍යතාව සඳහා ඇති රික්තය සම්පූර්ණ කළ යුතුය. වැඩසටහන්කරණය, මානව සම්පත් කළමනාකරණය සහ විකාශන කළමනාකරණය ජනතා හිතවාදි ලෙස හැසිරවීම පිණිස අවැසි කාර්යන් පවත්වා ගෙන යාමේ පාරිසරික නිදහස කළමනාකරුවන් ඇතුළු ජනමාධ්‍ය ශිල්පීන් වෙත ලබා දීමට රජය වග බලා ගත යුතු අතර, එකී නිදහස ග්‍රාහක කේන්ද්‍රිය අරමුණු සඳහා ම පමණක් භාවිතයට ගැනීමේ වගකීම පිළිබඳව නිති රීති සහ ආචාරධර්ම පද්ධතියක් සහ ප්‍රතිපත්ති මාලාවක් වර්ධනය කොට භාවිතයට ගත යුතුය.එවැනි ක්‍රියා පම්පාමියක් පවත්වා ගැනීම තුළින් විද්‍යුත් මාධ්‍ය වැඩ සටහන්කරණය මගින් ඉටු විය යුතු කාර්යන් වන මතවාදි කාර්ය, සංස්කෘතික සහ අධ්‍යාපන කාර්ය, ඍජු සංවිධානමය කාර්ය, ප්‍රතිශ්ඨාපන කාර්ය මෙන්ම වෙළඳ දැන්වීම් සහ තොරතුරු විමර්ශන කාර්ය ද ඉෂ්ට කළ හැකිය. BBC ආයතනයේ ආරම්භක මහා යුග පුරුෂයකු වූ ජෝන් රීත් විසින් බලපත්‍ර ගාස්තු, විද්‍යුත් මාධ්‍ය සේවා සඳහා අය කළ යුත්තේ කවර කරුණක් මත ද යන්න වඩා නිවැරදිව පැහැදිලි කරන ලදි. වාණිජ්‍යභාවයෙන් මිදි දේශන, තොරතුරු, අධ්‍යාපනික වැඩ සටහන් සහ කලාත්මක





වැඩ සටහන් යන ආදිය මහජනයා වෙනුවෙන් ඉදිරිපත් කිරීමට නම් විද්‍යුත් මාධ්‍ය බලවතුන්ගේ (රජයෙන් ) මෙන්ම වෙළඳ ව්‍යාපාරිකයන්ගේ බලපෑමෙන් ද තොරවිය යුතු බැවින් මහජන සේවාවන් පවත්වා ගෙන යාමේ අභිලාෂයෙන් බලපත්‍ර ගාස්තු අය කළ යුතු බවයි. මෙම උදාහරණය ශ්‍රී ලංකාවට ආදේශ කර බලන විට, මහජන සේවා මුලධර්මයන් ට අනුව ක්‍රියාත්මක වු ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සිය සේවාවන් වෙනුවෙන් බලපත්‍ර ගාස්තු අයකර ගැනීම ඔවුන්ට තිබූ අයිතිය අවලංගු කර දැමීම තුළින් මහජන සේවා සංකල්පය ක්‍රියාත්මක වීමට මෙරට තුළ තිබූ අවසාන ග්‍රාහක අයිතිය ද උදුරා ගත් බව පෙනේ. එවැනි ක්‍රියා මාර්ගයන් හේතුවෙන් ග්‍රාහක කේන්ද්‍රිය විද්‍යුත් මාධ්‍ය කළමනාකරණය නිෂ්ක්‍රිය වුයේ ග්‍රාහක අභිලාෂයන් මෙන්ම ජාතික අනන්‍යතාව ද යටපත් කොට දමමිනි.

## මූලාශ්‍ර


1. *Raboy, Marc, 1995, The world situation of P.S.B. overview & Analysis, Paris;*

2. *No 37 at 1966 Sri Lanka Broadcasting Act, 5th January 1976;*

3. *Stevans, Nick, Understanding Media culture;*

4. *1995, Public service broadcasting cultural & educational Dimeantions, UNESCO, Paris;*

5. *ද අල්විස්, ආනන්ද තිස්ස, 1982 - ජනවාරි, හැන්සාඩ්;*

6. *වික්‍රමසිංහ, රනිල්, 1982 - ජනවාරි, හැන්සාඩ්;*

7. *Ramond, L., carrd & Donald M. Davis, 1993, Electronic Media Programming , USA;*

8. *1982 අංක 6 දරණ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත;*

9. *Teheranian, Majid, condon 1977, Communication & development , reflections on Theries & Policies;*

10. *Drucker, Peter, 1977, People and performance, Heineman, London;*

7

# මහජන සේවා මාධ්‍ය ප්‍රතිපත්තියක් සඳහා වූ නිර්මාණකරණීය ප්‍රවේශයක්

සුනිල් විජේසිරිවර්ධන

## 1. හැඳින්වීම

වෙනත් රටවල මෙන්ම ශ්‍රී ලංකාවේද විද්‍යුත් මාධ්‍ය ආරම්භ වුයේ රාජ්‍ය අධිකාරයට නතු ගුවන්විදුලි ආයතනයක් වශයෙනි.

මෙකී විද්‍යුත් මාධ්‍ය ආයතන, යුරෝපීය සන්දර්භය තුළ නම්, විශේෂයෙන්ම දෙවන ලෝක යුද්ධයෙන් පසුව, සිවිල් හා දේශපාලන අයිතින් සහ ප්‍රජාතන්ත්‍රවාදය කේන්ද්‍රකර ගත් බලගතු සමාජ කතිකාවක තෙරපුමට භාජනය විය. ඒ ආශ්‍රිතව පැන නැගුණු " මහජන සේවා සන්නිවේදන (Public Service Broadcasting - PSB) " සංකල්පය ඔස්සේ ඉදිරියට යමින්, ස්වාධීන සහ මහජන කේන්ද්‍රීය මාධ්‍ය ක්‍රියාවලියක් වූ කලී ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක මූලික අවශ්‍යතාවයක් ලෙස පිළිගන්නා වූ සහ අදාළ ආයතනික ව්‍යුහයන් සහතික කරන්නා වූ ප්‍රබුද්ධ රාජ්‍ය ප්‍රතිපත්තියක් සම්පාදනය වීම එම ආයතනික පදනම් පසුබිමේ ඇත.

ආසියානු කලාපය දෙස බලන විට මේ ආකාර වර්ධනයන් අඩු වැඩි වශයෙන් ඉන්දියාව තුළ ද, වඩා ප්‍රබල ආකාරවලින් ඕස්ට්‍රේලියාව, නවසීලන්තය හා ජපානය වැනි රටවල් තුළ ද දක්නට ලැබිණ. එමෙන් ම එකී PSB කතිකාවේ





බලපෑම පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් සියල්ලම වෙත පාහේ කිසියම් හෝ ප්‍රමාණයකින් යොමු වූ බව සාමාන්‍ය වශයෙන් සටහන් කළ හැකිවෙයි.

50 දශකය තුළ PSB ආයතන වේගවත් වර්ධනයක් අත්පත් කර ගන්නා අතරම වෙළඳ ප්‍රාග්ධනය විසින් මෙහෙය වන ලාභය අරමුණු කර ගත් ගතිකයකින් සමන්විත මාධ්‍ය ආයතන විශේෂයක් ද ලෝකය පුරා බිහිවෙමින් වේගවත් ව්‍යාප්තියකට ලක් විය. PSB ආයතන සම්ප්‍රදායය ස්ථාපනය නොවී හෝ ප්‍රමාණවත් වර්ධනයකට ලක් නොවී, දෘඪ රාජ්‍ය ඒකාධිකාරයක් විද්‍යුත් මාධ්‍ය සම්බන්ධයෙන් බලපැවැත් වූ රටක වාණිජ මාධ්‍යයේ බිහිවීම වූ කලී මහජනයාට විකල්පයන් පිරිනැමූ මහා ආශිර්වාදයක් යැයි අර්ථකථනය කිරීමට ලිබරල් දේශපාලන කතිකාවන්ට ඉඩක් ලැබිණ. එහෙත් PSB සම්ප්‍රදාය ශක්තිමත්ව පවතින සමාජයක වාණිජ මාධ්‍ය ආයතනවලට පුරවැසි මනුෂ්‍ය ජීවිතයේ පෝෂණය සම්බන්ධයෙන් ධනාත්මක භූමිකාවක් ඉටු කළ නොහැකි බව ද ඒවා පෙන්වන ඇතැම් නව ශක්‍යතාවන්ට සාපේක්ෂව ඒවා විසින් සමාජයේ සාමූහිකත්ව පදනමට - ශිෂ්ටත්වයට එල්ල කරන අනතුරු උපද්‍රව විශාල බව ද ඉක්මනින්ම පැහැදිලි විය. එවැනි සමාජයක විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වල ගුණාත්මක බව හා "ප්‍රවණතා නිර්මාණයෙහි " ලා PSB ආයතන සතු ප්‍රමුඛත්වය හා නෛපුණ්‍යය වාණිජ මාධ්‍ය නිසා යම් ආකාරයක (ධනාත්මක) අභියෝගයන්ට ලක් විය හැකි නමුත්, කවර ලෙසකින් හෝ තර්ජනයකට ලක් වන බවත් අද දක්වාම නිරීක්ෂණය වී නැත.

ශ්‍රී ලංකාවේ විද්‍යුත් මාධ්‍ය ඉතිහාසය විමසන අපට පෙනී යන්නේ 1950 දශකයත් සම- එවකට ඒකාධිකාරී තත්වයේ තිබූ රාජ්‍ය (විද්‍යුත්) මාධ්‍ය ආයතනය (Radio Ceylon - පසුව SLBC ) යට කී මාධ්‍ය සම්ප්‍රදාය දෙකම එකවර නියෝජනය කරන්නට පටන් ගත් බවයි. එනම් " වෙළඳ සේවයක් " මගින් ගුවන්විදුලිය වෙළඳ ප්‍රාග්ධනය මාධ්‍ය ක්‍රියාවලිය තුළට ඇතුල් වන්නට එක අතකින් දොරටු හළ අතර, අනිත් අතින් " ස්වදේශීය සහ අධ්‍යාපන " සේවාවන් හරහා, යම් බරපතල සීමාවන් තුළ නමුත්, PSB සංකල්පයන් ආශ්‍රිත මාධ්‍ය ක්‍රියාවලියක නිරත වූ බවයි; පශ්චාත් - විජිත රාජ්‍ය කතිකාව තුළ හුස්මකට ඉඩක් නැතිව සිරගතව සිටින අවවර්ධිත පුරවැසි ( යටත් වැසි ) සමාජයට මෙම රාජ්‍ය - කේන්ද්‍රීය " මහජන සේවා " වන්ට විකල්පව, වඩා දියුණු සේවාවක් පරිකල්පනය කර ගැනීම සපුරාම අපහසු විය.

මේ තත්ත්වය ගැන, උදාහරණ වශයෙන්, ඉන්දියාවේ එවකට වර්ධනය

වු තත්ත්වය සම- තුලනය කොට, ඇගයීමක් කරගත හැකිය. 1970 ගණන් තරම් ඈත දි ඉන්දියාවේ විද්‍යුත් මාධ්‍ය පුරවැසි පර්ෂද, දේශපාලකයාට අ෴-ලි ගැසිමට නොහැකි වන පරිදි රාජ්‍ය විද්‍යුත් මාධ්‍ය තුළ සංස්කාරක නිදහස (Editorial Freedom) තහවුරු කර ගැනීම අරමුණු කොට නඩු මගට පවා බැස ජයග්‍රහණ කිහිපයක් ලැබීය. එම සම්භාෂණය ආශ්‍රිතව ප්‍රකට මාධ්‍යවේදියෙක්ව සිටි රොමේෂ් තාපාර් 1978 දි මෙසේ ලියුවේය. “ සමස්ත ඉන්දිය ගුවන්විදුලිය හා දුර්දර්ශන් යන ආයතන සංස්කාරක නිදහස තහවුරු කිරීමට අදාළව පූර්ණ ස්වාධිනත්වයක් කරා ගෙන ඒමේ අවශ්‍යතාව සඳහා තොරතුරු මුලාශ්‍ර පිළිබඳ ගැටලුව වඩා ස්වාධින ආකාරයකට විසඳාගත යුතුවෙයි. වෙසෙසින්ම මෙම ක්‍රියාවලියට අ෴-ලි ගැසීමට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට කිසිදු නෛසර්ගික අයිතියක් නොමැතිය. මාධ්‍ය නිදහසට එරෙහිව ඇති ප්‍රධාන තර්ජනයක් නම් අද බෙහෙවින්ම ව්‍යාප්තිය ලබා ඇති දූෂිත දේශපාලකයා නම් වු ප්‍රපංචයයි. ඔවුන් බලය ලබා ගන්නේ ජනතාව වන අපෙන්ය. එබැවින් කිසියම් චර්යා ධර්ම පද්ධතියක් සම්පාදනය කොට ඔවුන් මෙහෙයවා ගැනීමේ අයිතිය අප වෙත ඇත. ” ලංකාවේ දැඩි දේශපාලනීකරණයකට ලක් වූ රාජ්‍ය විද්‍යුත් මාධ්‍ය ආයතන සෙවනේ වැඩුණු අය අතර මේ ආකාර වු කතිකාවකට ප්‍රවිෂ්ට වූ මාධ්‍යවේදියෙක් “ වෙළඳ හෝ ස්වදේශිය ” ධාරාවන් තුළ දක්නට නොලැබුණු තරම්ය. එවැනි අය අතළොස්සක් වැඩුණේ ගුවන්විදුලියේ බෙහෙවින් චූල ඒකකයක් ලෙස සැලකුනු බව පෙනෙන, “ අධ්‍යාපන සේවය ” තුළ පමණය. එම චූල විකල්ප මාර්ගය සහ ඊට අදාළ කතිකාව තුළ පන්නරය ලබා වැඩී ඉතා කෙම්කාලයක් තුළ පමණක් පැවතීමට වරම් ලද “ නව අධ්‍යාපන සේවය ” 1994 දි පැවති ආණ්ඩුව බලහත්කාරි ලෙස වසා දැමූ කතාව ලංකාවේ විද්‍යුත් මාධ්‍ය ඉතිහාසයේ වැදගත් සිද්ධියකි. එම සිද්ධිය මහජන කතිකා ගෝලය තුළ ප්‍රබල සිද්ධියක් නොවීම විසින් වුව සරලව පෙන්වන්නේ එකී ප්‍රජාතන්ත්‍රවාදි මහජන- කේන්ද්‍රිය විකල්ප කතිකාවන් රමේ විද්‍යුත් මාධ්‍ය පිළිබඳ දේශපාලන කතිකාවේ ප්‍රධාන ධාරාව තුළට අද දක්වා ම පිවිස නැති බවයි.

පශ්චාත් - විජිත රාජ්‍ය ගතිකයන් තුළ, රාජ්‍ය මහජන- සේවා ආයතන වේගවත් දේශපාලනීකරණයට පොදුවේ භාජනය වන තතු යටතේ, 1970 දශකය මුලදි ම වාගේ ඒකාධිකාරී රාජ්‍ය මාධ්‍ය වඩා ගැඹුරු දේශපාලනීකරණයට භාජනය වනු දක්නට ලැබිණ. මේ තත්ත්වයට ඉඩ හළ ආසන්නම හේතුව නම් යට කී පැහැදිලි කිරිම්වලින් ඇ-වෙන පරිදි ප්‍රජාතන්තවාදි සම්භාෂණ රාමුවක් තුළින් ව්‍යුත්පන්න වු ප්‍රබුද්ධ රාජ්‍ය ප්‍රතිපත්තියක් නොමැති කමත්, ඊට සහසම්බන්ධව ව්‍යවස්ථාමය හා නෛතික රාමුවල තිබූ දුබලකමත් ය.





මේ නිසා බලයට පැමිණෙන දේශපාලන පක්ෂ රාජ්‍ය මාධ්‍ය දෙස සාම්ප්‍රදායිකව බැලුවේ සිය දේශපාලන අරමුණ හා බලය සඳහා යොදා ගත හැකි ප්‍රධානම ප්‍රචාරක මෙවලම් ලෙසයි. අද දක්වාම “ වමේ සිට දකුණට ” ලංකාවේ සියලුම දේශපාලන පක්ෂවල ප්‍රතිපත්ති ලේඛන පරීක්ෂා කරන කෙනෙකුට විද්‍යුත් මාධ්‍ය සම්බන්ධයෙන් ජනතා හිත සුව අරමුණු කරගත් ප්‍රතිපත්ති රාමුවක් ඒවායේ දක්නට නොලැබෙන්නේ මේ නිසාය.

ඉන්පසු 90 දශකය වන විට විශාල වෙළඳ සමාගම්වල මැදිහත්වීම කරණ කොට ගෙන වෙළඳ මාධ්‍ය ආයතන ගණනාවක් ලංකාවේ බිහිවීමට රාජ්‍යය විසින් ඉඩ හරින ලදමුත්, ඒ අතර ප්‍රජා ගුවන්විදුලි ආරම්භ කිරීමට බලපත්‍ර ලබාගැනීම සඳහා පුරවැසි සමාජ කණ්ඩායම් විසින් වරින් වර කරන ලද ඉල්ලීමට කන් නොදෙන ලදි. අනතුරුව වෙළඳ සමාගම්වල තෙරපුමට යටවෙමින් නඩත්තු ක්‍රම “ ප්‍රති - ව්‍යුහකරණය ” කිරීම හරහා ජාතික මාධ්‍යය ද වෙළඳ ප්‍රාග්ධනය සමග සෘජුව සම්බන්ධ කෙරුණි. මේ මගින් ශ්‍රී ලංකාවේ සීමිත මාධ්‍ය වෙළඳපොළ තුළ පවතින දැඩි තර-යට එම මාධ්‍යය ද තල්ලු කර දමනු ලැබීය. මෙය කරණකොට ගෙන මෙම කාලය වන විට “ මහජන සේවා සන්නිවේදන ” රාමුවකට අයත් යම් මාධ්‍ය ක්‍රියාවලියක් ජාතික මාධ්‍ය තුළ ඉතිරිව තිබුනා නම් ඒ සියල්ල කටු ගා දමා, එම නාලිකා හුදෙක් දේශපාලනඥයාට හා වෙළෙන්දාට ප්‍රමුඛ වශයෙන් සේවය කරන ප්‍රචාරක මෙවලමක ස්වරූපයකට පූර්ණ ලෙස විකරණය වීම ආරම්භ විය. අප අද නිරීක්ෂණය කරන්නේ විද්‍යුත් මාධ්‍යයේ එම සදාචාර විරෝධි ගමනයි.

## 2. ජාත්‍යන්තර ප්‍රමිතින්.

මානව හිමිකම් විශ්ව ප්‍රකාශනය (The Universal Declaration of Human Rights - UDHR ) වූ කලී සෑම රජයක්ම හා සමාජයක්ම විසින් මානව හිමිකම් රැකීමට යොමු කරන්නා වු ජාත්‍යන්තර සදාචාරිය ධජය ලෙස සැලකේ. එහි සුප්‍රකට 19 වගන්තිය මෙසේ පවසයි. “ මත දැරීමේ සහ ප්‍රකාශනයේ නිදහසට ඇති අයිතිය සෑම කෙනෙකුම සතු වන්නේය. බාධා කිරීම්වලින් තොරව මත දැරීමේත්, දේශ සීමා නොතකා කවර හෝ මාධ්‍යයක් මගින් තොරතුරු සහ අදහස් සෙවීමේත්, ලබා ගැනීමේත් හා බෙදා හැරීමේත් නිදහස මේ අයිතියට ඇතුළත් වේ. ” මානව හිමිකම් ප්‍රකාශනය සෙවනේ ඉදිරියට පැමිණි නෛතික ශක්තිය සහිත ලේඛනයක් වන සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (The International Covenant on Civil and Poilitical Rights - ICCPR ) මේ

වනවිට ලෝකයේ රාජ්‍යයන් 140 ක් විසින් පිළිගෙන තහවුරු කොට එහි පාර්ශවකරුවන් බවට පත් වී ඇත. ශ්‍රී ලංකාව ද 1980 දී මෙම වැදගත් ජාත්‍යන්තර සම්මුතියේ පාර්ශවකරුවෙක් වශයෙන් අත්සන් කොට ඇත. මෙම ලේඛනයේ එන 19 වගන්තිය විශ්ව මානව හිමිකම් ප්‍රකාශනයේ 19 වන වගන්තියට හරයෙන් සමාන වන අතර එය මෙහිලා වඩා විස්තිරණ සූත්‍රගත කිරීමකට ලක්ව ඇත. ඒ අතර මෙම සම්මුතියේ 2 වගන්තිය විසින් පාර්ශවකාර රාජ්‍යයන්ගේ වගකීම් ගැන මෙසේ ද නිශ්චිත ප්‍රකාශයක් කරයි. “ සම්මුතිය විසින් පිළිගන්නා අයිතීන් තථ්‍ය වශයෙන් තහවුරු කිරීම උදෙසා අවශ්‍ය කෙරෙන නෛතික හා වෙනත් පියවර රාජ්‍යයන් විසින් ගත යුතු වෙයි. ”

මින් අදහස් වන්නේ රාජ්‍යයන් විසින් තොරතුරු ලබා ගැනීමේ, ප්‍රකාශනයේ හා භාෂණයේ අයිතීන් ද ඇතුළත් එම අයිතීන් සමුච්ජය උල්ලංඝනය නොකිරීමට පමණක් නොව එය සහතික කිරීමට අවශ්‍ය කෙරෙන සාධක හා තත්වයන් ස්ථාපනය කිරීමට ද, ප්‍රවර්ධනය කිරීමට ද උචිත ධනාත්මක පියවර ගැනීම හරහා එය ක්‍රියාකාරී ලෙස ආරක්ෂා කිරීමට ද බැඳී සිටින බවයි.

ICCPR සම්මුතිය විසින් තහවුරු කරන අයිතීන් සමුදාය තුළ මෙකී 19 වගන්තියේ ප්‍රකාශිත අයිතීන් සමුච්ජය ප්‍රජාතන්ත්‍රවාදය, පුරවැසි සමාජයේ පැවැත්ම සහ වර්ධනය මෙන්ම ජන ජීවිතයේ යහ පැවැත්ම සම්බන්ධයෙන් තීරණාත්මක අගයන් ගන්නා බව වෙනත් ජාත්‍යන්තර ලේඛනවලින් ද අවධාරණය කොට නැවත නැවත පෙන්වා දී ඇත්තේය.

ප්‍රකාශනය සහ භාෂණයට අදාළ ජාත්‍යන්තර මානව හිමිකම් ලේඛන අධ්‍යයනය කරන විට පෙනී යන වැදගත් කරුණක් නම් එකී අයිතිය ආරක්ෂා කොට තහවුරු කිරීමේ වගකීම වියුක්ත ලෙස “ මාධ්‍ය ” හෝ “ සමාජය ” මත පැවරී නොමැති බවත් එය පැහැදිලිවම ප්‍රථම කොට රටක රාජ්‍යය සතු වගකීමක් ලෙස හඳුන්වා දී ඇති බවත් ය. මේ අනුව බලනවිට කෙටියෙන් දක්වන්නේ නම් ජනතාවගේ බහුවිධ අවශ්‍යතාවන්ට ආමන්ත්‍රණය කරන්නා වූ, ජන ජීවිතයේ සහ පැවැත්ම සහතික කොට එහි ප්‍රවර්ධනයට කැප වන්නා වූ නිදහස් මාධ්‍ය සඳහා අවශ්‍ය කෙරෙන පරිසරය නිර්මාණය කිරීම රජය සතු වගකීමක් ලෙස ජාත්‍යන්තර වශයෙන් පිළිගෙන ඇත. ඇතැම් ජාත්‍යන්තර ලේඛනයක් විසින් මේ වගකීම් සම්බන්ධයෙන් රජයක් විසින් ගත යුතු පියවර ද සාකච්ඡා කොට නිර්දේශ කරන අවස්ථා බොහෝ ය.





කෙසේ නමුත් PSB ආයතන ඇති කොට පවත්වා ගැනීම සම්බන්ධයෙන් රාජ්‍යයන් නෛතික වශයෙන් සෘජුව බැඳීමට ලක් කරන ජාත්‍යන්තර උපකරණ නැතත් එම නිර්දේශය වක්‍ර ආකාරවලින් රජයන් වෙත යොමු කෙරෙන අවස්ථා ඇත. මේවා අතරින් ඉතාම වැදගත් ලේඛනයක් වන්නේ යුරෝපීය රාජ්‍යයන් 40ක් සහභාගි වන ව්‍යුහයක් වන මානව හිමිකම් හා සමාජ ප්‍රගමනය සඳහා ඇපකැපව සිටින යුරෝපීය කවුන්සලයේ අමාත්‍ය කමිටුව විසින් සම්මත කරගන්නා ලද නිර්දේශයකි; නිර්දේශ අංක R(96)10 මහජන සේවා සන්නිවේදන ආයතනවල ස්වාධීනත්වය සහතික කිරීම යන අරමුණට අදාළය. එම නිර්දේශයේ ලා එන 1 වගන්තිය මගින් මහජන සේවා ආයතනවලට අදාළ නෛතික රාමුව විසින් සංස්කාරක නිදහස, වැඩසටහන් හා ප්‍රවෘත්ති යන ආදිය සම්බන්ධයෙන් ආයතනික ස්වාධීනත්වය සහතික කළ යුතු බව කියයි. මේ තත්ත්වය සාක්ෂාත් කර ගැනීමට අදාළව කළමනාකරණ මණ්ඩලවල ව්‍යුහය හා ඒවා පත්විය යුතු ආකාරය ගැන ද දීර්ඝ වශයෙන් නිර්දේශ ඉදිරිපත් කරයි. එමෙන්ම මේ මණ්ඩල වගකිව යුත්තේ ආණ්ඩුවට හෝ ආණ්ඩුවේ බලධරයෙකුට නොව අදාළ ස්වධීන අධීක්ෂණ මණ්ඩලයකට හා අධිකරණයට පමණි.

එමෙන් ම එක්සත් ජාතීන්ගේ සංගමයේ යුනෙස්කෝ ආයතනය විසින් ආසියානු මාධ්‍ය අරභයා සංවිධානය කරන ලද අල්මා - ආටා ජාත්‍යන්තර සමුළුවේ ප්‍රකාශනය (Alma-Ata Declaration, 1992) මහජන සේවා විද්‍යුත් ආයතන (PSB) පිහිටු වීම සහ ප්‍රවර්ධනය සඳහා පියවර ගැනීමට පාර්ශවීය රජයන් වෙත කෙලින්ම නිර්දේශ කර සිටී.

කෙසේ නමුත් කිසියම් රටක රජයක් විසින් මහජන සේවා වරම යටතේ විද්‍යුත් මාධ්‍ය ආයතනයක් ඇති කළ පසු එම ආයතන කරාද යට කී වගකීමේ සුවිශේෂ භාරයක් මාරුවේ. මන්ද යත් එම ආයතනය රාජ්‍යයට සම්බන්ධ එහි අවයවයක් වන බැවින් ද එමෙන්ම ඒවා ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය යටතේ ආරක්ෂාවට ලක් වන බැවින් ද වේ. අද ලෝකයේ දක්නට ලැබෙන වර්ධිත PSB ආයතන ඇතැම් විට තම රටේ ඉතිහාසයේ ඉතා ආතතිජනක අවස්ථාවලදී පවා සිය ආණ්ඩුවලින් පැමිණෙන දේශපාලන බලපෑම් වලට යටත් නොවී ප්‍රතිරෝධය පාමින් සිය නිදහස රැක ගනිමින් තමන්ගේ මහජන සේවා වරමට අනුව ශක්තිමත් අදින සම්ප්‍රදායයන් ගොඩ නැගීමේ තතු එංගලන්තය ඇතුළු යුරෝපීය රටවල් ගණනාවක දී ම අපට හමුවේ.

සමාජයක් තුළ නිදහස් හා මහජන කේන්ද්‍රීය මාධ්‍ය ක්‍රියාවලියක් සඳහා පසුබිම නිර්මාණය කිරීම සම්බන්ධයෙන් රාජ්‍යයක් සතු මෙම වගකීම, අනෙක් අතට කිසිදු ලෙසකින් හෝ මාධ්‍ය නිදහස උල්ලංඝනය කිරීමට, නැතහොත් PSB ආයතනයක මාධ්‍ය ක්‍රියාවලියට බලහත්කාරකම් කිරීමකට හෝ ඒ රාජ්‍යයට ඉඩ කඩ සපයන්නේ නැත. ජාත්‍යන්තර වශයෙන් ප්‍රසිද්ධියට පත්, ඝානා රජයේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් වරක් ප්‍රකාශිත නිරීකෂණවල මෙසේ සඳහන් වේ. “ රාජ්‍යය සතු මාධ්‍ය වනාහි ජාතික සම්පත් වෙති. ඒවා සමස්ත ප්‍රජාවටම අයත් වනවා මිස “ රජය ” යනුවෙන් හැඳින්වෙන වියුක්තියකට අයත් නොවේ. එපමණක් නොව ඒවා බලයේ සිටින ආණ්ඩුවේ හෝ කිසියම් පක්ෂයක හෝ පුද්ගලයක් ද නොවේ. මෙවැනි වැදගත් ජාතික සම්පතක්, බලයට අත දිගු කරන නැතහොත් බලයේ සිටින පක්ෂයක හෝ පක්ෂ සන්ධානයක ප්‍රචාරක ආයතනක් බවට පත් වුව හොත් ප්‍රජාතන්ත්‍රවාදය හුදු වාගාලංකාරයක් පමණක් වන ව්‍යාජයක් වනු ඇත. ”

මෙම අයිතීන් සුරක්ෂිත කිරීමට අදාළ ජාත්‍යන්තර භාවිතයන් හා ප්‍රමිතීන් තුළ මතු වන එක් වැදගත් කරුණක් නම් විද්‍යුත් මාධ්‍ය ආයතන මෙන්ම එකී ආයතනයන් මත අධීක්ෂණය සහ ඒවා විධිමත් කිරීමේ බලය පැවරී ඇති ව්‍යුහයන් ( ජාතික විද්‍යුත් මාධ්‍ය අධිකාරීන්,විද්‍යුත් මාධ්‍ය කොමිසම්, මාධ්‍ය ආයතනයක පාලක අධිකාරිය යනාදිය ) දේශපාලන ක්‍රියාවලීන් ගෙන් දුරස්ව එම බලපෑම්වලින් නිදහස්ව පැවතිය යුතු බවයි. මේ සඳහා, විශේෂයෙන් PSB ආයතන ක්‍රියාත්මක වන රටවල, එම ආයතන අධීක්ෂණය කිරීමේ බලය සහිත ස්වාධීන මාධ්‍ය අධිකාරයක් වැනි යම් ව්‍යුහයක් සඳහා නිශ්චිත නෛතික ප්‍රතිපාදන ඇති කරගෙන තිබේ. මේ කරුණු අරභයා ලංකාවේ දිගටම පවතින්නේ දැඩි පසුගාමී තත්ත්වයකි. ලංකාවේ විද්‍යුත් මාධ්‍ය අධීක්ෂණය කිරීමේ, විධිමත් කිරීමේ ( එබැවින් බලපත්‍ර නිකුත් කිරීමේ හා ඒවා අවලංගු කිරීමේ ) අවසාන බලධරයා නම් බලයේ සිටින ආණ්ඩුවේ විෂයභාර ඇමතිවරයාම වේ. මෙම තත්ත්වය වෙනස් කිරීමේ නියායෙන් 1997 දී ආණ්ඩුව විද්‍යුත් මාධ්‍ය අධිකාරියක් ස්ථාපනය කිරීම සඳහා පනතක් ඉදිරියට ගෙනාවේය. නමුත් මෙම පනත තිබෙන ගැටලු සහගත තත්ත්වය හරයාත්මකව වෙනස් නොකරන බව මේ ගැන උනන්දු වූ සිවිල් ක්‍රියාකාරිකයින්ගේ මතය විය.; එකී අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීමේ ලා අමැතිවරයා සතුව ගැටලු සහගත බලයක් ඇති බව උදාහරණයක් වශයෙන් දක්නට ලැබුණි. මේ කරුණ ගැන එකී පනත් කෙටුම්පත නිෂ්ප්‍රභා කිරීමට හේතු වූ ශ්‍රේෂ්ඨාධිකරණයේ නිරීක්ෂණය මෙබඳුය. “ බොහෝ ආකාර වලින් ජනතා මතය කෙරෙහි වඩාත්ම





ඉහළ බලපෑමක් කළ හැකි සේ පිළිගැනෙන විද්‍යුත් මාධ්‍ය ආරභයා අධීක්ෂණය හා විධිමත්කරණය පිළිබඳ කාර්යභාරයක් පැවරීමට යෝජිත අධිකාරියට ඊට අවශ්‍ය වන ස්වාධීනත්වය ලැබී නැත.” සමාන්තර ආයතනික ව්‍යුහයක් ගැන ( ජාතික මාධ්‍ය කොමිසම ) ඝානා දේශයේ ශ්‍රේෂ්ඨාධිකරණය මෙසේ පවසයි.; “ ජාතික මාධ්‍ය කොමිසමේ භූමිකාව වනාහි රාජ්‍ය මාධ්‍ය වෙත ආණ්ඩුවේ හෙවත් බල දේශපාලනයේ බලපෑමෙන් නිදහස්ව ක්‍රියාත්මක වනු වස් අවශ්‍ය වන ස්වධීනත්වයේ ජීවන හුස්ම පිඹීමයි. ”

## 3. ලෝකයේ PSB ආයතනවල ප්‍රයෝගික ක්‍රියාකාරීත්වය ගැන නිරීක්ෂණ සහ නිගමන කිහිපයක්;

### අරමුදල්

බොහෝ නිරීක්ෂකයින් විසින් පෙන්වා දෙන පරිදි PSB ආයතනවල මුල්‍ය හා සම්පත් ගොඩන-ා ගැනීමේ උපාය මාර්ග හා ඒවායේ පැවැත්ම සහ වරම සාර්ථක ලෙස ක්‍රියාවට නැංවීමේ ශක්‍යතාව සම්බන්ධයෙන් තීරණාත්මක අගයක් ගනියි. මේ කරුණට අදළව ලෝකයේ පවතින සෑම ශක්තිමත් PSB ආයතනයකම කැපීපෙනෙන පොදු ලක්ෂණයක් වන්නේ ඒවා වාණිජ්‍ය ප්‍රාග්ධනයේ විනාශකාරි බලපෑමෙන් පූර්ණ වශයෙන්ම නිදහස්ව පැවතීමයි. බොහෝ PSB ආයතන යම් වාණිජ ක්‍රියාකාරීත්වයක් නොපෙන්වනවා නොවේ. එහෙත් එම ක්‍රියාකාරීත්වය සාමාන්‍ය වාණිජ මාධ්‍යවල මුල්‍ය හා අරමුදල් පදනමට සම්පූර්ණයෙන්ම වෙනස්ය. එනම්, බොහෝ විට තමා නිෂ්පාදකයෙක් වශයෙන් සිය මාධ්‍ය නිෂ්පාදනයන් අලෙවිය සඳහා, බොහෝ විට ජාත්‍යන්තර වෙළඳපළට ඉදිරිපත් කරන්නේ නමුත්, ගුවන් කාලය එක්කෝ කිසිදු ලෙසකින් අලෙවි නොකරන ආස්ථානයක සිටියි, නැතහොත් සිය වරමට හානියක් නොවන පරිදි ඉතා නිශ්චිත ප්‍රතිපත්ති රාමුවක සිට ගුවන් කාලය ඉතා සීමිත ආකාරයකින් පමණක් අලෙවි කිරීමේ පදනමක සිටියි. ඒ කෙසේ වුවත් වාණිජ ක්‍රියාකාරිත්වය ශක්තිමත් PSB ආයතනවල ප්‍රධාන මූල්‍ය මූලාශ්‍රය බවට කිසිවිටෙකත් පත් වී නැත. ඒවායේ ප්‍රධාන නඩත්තු ක්‍රමය ගැන විමසද්දී ආදර්ශන කිහිපයක් අපට ලොව පුරා දක්නට ලැබේ. ඒවාට අදාළව උදාරහරණ කිහිපයක් සහිතව දළ සටහනක් පහත වගු ගත කර ඇත.

| ප්‍රධාන නඩත්තු මූලාශ්‍ර | PSB උදාහරණ |
|---|---|
| රාජ්‍ය අරමුදල් | ඕස්ට්‍රේලියාවේ ABC ආයතනය / SBS ආයතනය<br>කැනඩාවේ CBC ආයතනය<br>නවසීලන්තයේ RNZ ආයතනය |
| බලපත්‍ර ගාස්තු | එක්සත් රාජධානිය BBC දේශීය විකාශයන් |
| ග්‍රාහක ගාස්තු | ජපානයේ NHK ආයතනය |
| ස්වාධීන ආයතනයක් විසින් මහජන අරමුදල් එකතු කොට බෙදා හැරීම | නවසීලන්තයේ Newzealand on Air ආයතනය |

ලෝකයේ PSB ආයතන අතර වාර්ෂික රාජ්‍ය මුදල් ප්‍රදානයන් අතර යැපෙන ආයතන රාශියකි. ඉන් ප්‍රකට උදාහරණ කිහිපයක් ඉහත දක්වා ඇත. ඕස්ට්‍රේලියාවේ, 1983, ABC පනතේ 4 වන කොටස විශේෂ වශයෙන් අරමුදල් ප්‍රශ්නයට යොමුවේ. ඊට අනුව ABC ආයතනයට වෙළඳ දැන්වීම් සඳහා ගුවන් කාලය අලෙවි කිරීම සපුරා තහනම්ය. එය මුළුමනින්ම යැපෙන්නේ රාජ්‍ය අරමුදල් මතයි. ABC පාලක සභාව වාර්ෂික මූල්‍ය ඇස්තමේන්තු සකසා ඉදිරි මුදල් වර්ෂය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු අතර පාර්ලිමේන්තුව එය අනුමත කොට මුදල් වෙන් කරයි. ඕස්ට්‍රේලියාවේ SBS ආයතනයට ද වාර්ෂික මුදල් ප්‍රදානයක් රජයෙන් වෙන් කෙරෙන නමුත්, ABC ආයතනය මෙන් නොව ඊට පැයකට විනාඩි 5ක කාලයක් වෙළඳ ප්‍රචාර සඳහා වෙන් කිරීමට අවසර ඇත. එනමුත්, වෙළඳ ප්‍රචාර පමණක් නොව අනුග්‍රාහක දැන්වීම් සහ සමාජ ආයතනවල අධ්‍යාපන ප්‍රචාරක දැන්වීම් පවා ඉදිරිපත් කළ හැක්කේ වැඩ සටහන් අතර කාලය තුළ එන ස්වාභාවික හිඩැස් තුළ වන අතර එම සියලු කාලය පැයකට විනාඩි 5 කට නොවැඩි





විය යුතුය. එම දැන්වීම් සම්බන්ධයෙන් ස්වකීය වරමට අනුකූල වූ වරණයක් ක්‍රියාත්මක කිරීම සඳහා පාලක සභාව කටයුතු කළ යුතුය. තවද තමා භාරගන්නා දැන්වීම් වර්ග මොනවාද, එහි ගුණාත්මක ලක්ෂණ මොනවාද යනාදිය ගැන මෙන්ම ඒවා සම්ප්‍රේෂණය කළ හැකි කාල සීමාවන් ගැන ද කරුණු ප්‍රසිද්ධ කළ යුත්තේය. ඊට අමතරව එය ප්‍රජාවට අදාළ තොරතුරු සහ ප්‍රජා/සමාජ ආයතන විසින් ලබා දෙන ප්‍රචාරක දැන්වීම් සහ අනුග්‍රාහක දැන්විම් ගැන ද ප්‍රමිතීන් ප්‍රසිද්ධ කළ යුතුය.

කැනඩාවේ CBC ආයතනය ද අරමුදල් ලබා ගැනීමේ ප්‍රධාන ක්‍රමවේදය අතින් ABC මොඩලයට සමාන වේ. කෙසේ වුව ද CBC ආයතනයේ වර්තමාන වැය ශීර්ෂයට සාපේක්ෂව ගත් කල මධ්‍යම රජයෙන් ලැබෙන මුදල් ප්‍රදානය ආවරණය කරන්නේ 75% ක් පමණ වූ කොටසකි. ( එය, එක් පුරවැසියෙකුට වර්ෂයකට ඩොලර් 28 - 30 පමණ වන ප්‍රමාණයකි.) CBC රූපවාහිනී වැඩසටහන් නඩත්තුව සඳහා අවශ්‍ය කෙරෙන හි-ය ඊට ලැබෙන්නේ වාණිජ ප්‍රචාර (22% ක් පමණ) සහ වෙනත් මූලාශ්‍ර (2.9%ක් ) මගිනි.

නවසීලන්තයේ RNZ ආයතනය (ගුවන්විදුලි ආයතනය) කිසිසේත්ම වාණිජ ප්‍රචාරණයේ නොයෙදෙන අතර එය මුළුමනින්ම නඩත්තු වන්නේ වාර්ෂික රාජ්‍ය අරමුදල් ප්‍රදානයක් මගිනි. එහෙත් අනික් අතට, එහි TVNZ (රූපවාහිනී) ආයතනය විශාල වශයෙන් යැපෙන්නේ මාධ්‍ය වෙළඳපළ සහ වාණිජ කටයුතු මතය. එනමුත් එහි PSB වරම ශක්තිමත් කිරීම සඳහා පිටුබලය දෙන්නා වූ වෙනත් ස්වාධීන ආයතනයක් 1989 දී රජය මගින් පිහිටුවන ලදී. Broadcasting Commission නම් මේ ආයතනයේ ජනප්‍රිය නාමය New Zealand On Air වේ. එහි කාර්යභාරයක් වන්නේ සෑම නවසීලන්ත වැසියෙකුගෙන්ම “ ගුවන්විදුලි ගාස්තුවක් ” අය කර එකතු කර ගැනීමත් එම අරමුදල් නවසීලන්තයේ මහජනයාගේ අවශ්‍යතා සහ දේශියත්වය කේන්ද්‍රීය කරගත් වැඩසටහන් නිෂ්පාදනය සහ ඒවායේ ප්‍රවර්ධනය සඳහා ඒ ඒ මාධ්‍ය ආයතනවලට ලබා දීමත්ය.

රාජ්‍ය අරමුදල් මත ප්‍රධාන වශයෙන් යැපෙන PSB ආයතන සහිත ඕස්ට්‍රේලයාව, කැනඩාව වැනි රටවල මාධ්‍ය කතිකාවක් විමර්ශනය කරන විට පෙනී යන කරුණක් නම් එකී අරමුදල් මාදිලිය ගැන ස්වාධීන මාධ්‍යකරුවන් සහ පුරවැසි ආයතන තෘප්තියකින් නොසිටින බවයි. PSB ආයතන තම මහජන කේන්ද්‍රීය වරම නිසාම බොහෝවිට පවතින ආණ්ඩුවේ කටයුතු ගැන විමසුම් ඇසින් බලමින් “ මහජන අධීක්ෂණ ” කාර්යභාරයක් ඉෂ්ට කිරීම අපේක්ෂා කළ හැකිය. අනෙක්

අතට ඉන් අපහසුවට පත්වන ආණ්ඩුවකට අවශ්‍ය නම් එවැනි ආයතනයක අරමුදල් තත්ත්වය පහළ වැට්ටවීමට බලපෑමක් එල්ල කළ හැකිවීමේ අනතුර නිරතුරුව පවතී. මෙය අනාරක්ෂිත තත්ත්වයකි. මේ නිසා උදාහරණයක් ලෙස, 1997 අප්‍රේල් මාසයේ දී ස්ථාවර අරමුදල් තත්ත්වයක් ඇති කිරීමට කැපවීමක් කරන මෙන් ආණ්ඩුවෙන් ඉල්ලා ප්‍රසිද්ධ නිවේදනයක් කිරීමට ABC ආයතනයේ පාලක සභාවට සිදු විය. එමෙන්ම, කැනඩාවේ පුරවැසි පර්ෂද එක්ව Friends of Canadian Braodcasting නම් පුරවැසි සංවිධානයක් පිහිටුවා ගන්නා ලදී. එහි අරමුණක් ලෙස දක්වා ඇත්තේ “ කැනඩාවේ ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයන්හි කැනේඩියානු වැඩසටහන් ප්‍රමාණය සහ ගුණය ප්‍රවර්ධනය කිරීමයි. ” එම සංවිධානය CBC ආයතනයේ වරම ඉටු කිරීමට අපොහොසත් කරන්නා වූ මූල්‍ය අවහිරතා සම්න්ධයෙන් මෑත අවුරුදුවලදී පැවති ආණ්ඩු කෙරෙහි දැඩි විවේචනයක් එල්ල කර ඇත.

විශාල වශයෙන් රාජ්‍ය අරමුදල් මත යැපෙන ක්‍රමයකට වඩා, බොහෝ PSB ආයතන සහ එකී සන්නිවේදකයෝ මහජන අරමුදල් මත සෘජුව යැපීමේ ක්‍රමවලට වඩා රුචි කරති. ඒවා මූලික වශයෙන් බලපත්‍ර ගාස්තු හෝ ග්‍රාහක ගාස්තු මාදිලි වශයෙන් නිරීක්ෂණය කළ හැකිය. බලපත්‍ර ගාස්තු මත යැපීම පිළිබඳ ප්‍රකට උදාරහණයක් BBC දේශීය සේවාවන් විසින් සපයනු ලැබේ. මේ වන විට BBC දේශීය සේවාවන්ගේ යැපුම් අරමුදලින් 80% කට වඩා ලැබෙන්නේ බලපත්‍ර ගාස්තු මගිනි. තවත් 15% ක් පමණ වාණිජ ක්‍රියාකාරිත්වය මගින් සැපයේ. ( ඉන් අදහස් වන්නේ වෙළඳ ප්‍රචාරණයම නොවේ; BBC වනාහි ලෝකයේ ප්‍රකට හා ජනප්‍රිය වැඩසටහන් නිෂ්පාදකයෙක් වන අතර එය සතුව ජාත්‍යන්තරව ජනප්‍රිය ලේඛනාගාරයක් ද ඇත.) එමෙන්ම, ජපානයේ NHK ආයතනය ස්වකීය අරමුදල් ගොඩ න-ා ගන්නේ ඉතා ස්වීය මාර්ගයක් අනුගමනය කිරීමෙනි. එය සම්පූර්ණ වශයෙන්ම යැපෙන්නේ ජපානයේ ග්‍රාහක ජනතාව විසින් ගෙවන වාරික ග්‍රාහක ගාස්තුවක් මත පදනම් වෙමිනි. පසුගිය 2002 වසරේ මෙලෙස එකතු වූ අරමුදල ඩොලර් බිලියන 6 කට වඩා වැඩි විය. NHK ආයතනයේ මූල්‍ය උපාය මාර්ගය BBC ආයතනයකට වඩා බෙහෙවින්ම වෙනස්ය. උදාරහණයක් ලෙස BBC ආයතනයට තම ග්‍රාහකයින්ගෙන් වාර්ෂික බලපත්‍ර ගාස්තුව ලබා ගැනීමට නෛතික ආවරණයක් ඇතත්, NHK ආයතනය බලාපොරොත්තු වන්නේ කවර හෝ නෛතික බලපෑමකින් තොර ග්‍රාහකයා විසින් ලබා දෙන “ ස්වේච්ඡා ප්‍රදානයකි. ” ඒ සඳහා ජනතාව දැනුවත් කොට පොළඹවනු පිණිසත්, ඔවුන් නිරතුරුව NHK ආයතනය සම- නොයෙක් අයුරින් සම්බන්ධ කරනු පිණිසත් විශේෂ ක්‍රම හා ව්‍යුහයන් වර්ධනය කොට ගෙන ඇත.





## දර්ශනය

ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන් පවතින රටවල විද්‍යුත් සන්නිවේදනය පිළිබඳ ප්‍රධාන මූලධර්මයක් වන්නේ ගුවන්විදුලි තරංග ජනතාවට අයත් බවත් එය ඔවුන්ගේ යහ - පැවැත්ම උදෙසා යෙදවිය යුතු බවත්ය.

වෙන කිසි කලෙක නොවූ විරූ වේගයෙන් හා ප්‍රමාණයෙන් සන්නිවේදන තාක්ෂණය දියුණු වෙමින් පවතින අද්‍යතන සන්දර්භය තුළ බොහෝ රටවල ජනතාවගේ හිත සුව පිණිස PSB ආයතන මෙන්ම පෞද්ගලික ආයතන යන දෙපාර්ශවයේම වෙනස්කම්, හැකියාවන් සහ සම්පත් ගණනයට ගෙන ඒවා වඩා යහපත් ආකාරයට යෙදවීම අරමුණු කරගත් ඒකාබද්ධ ජාතික ප්‍රතිපත්තීන් සම්පාදනය වීම දෙසට යොමුවෙමින් පවතී.

PSB ආයතනවල දර්ශනය සකස් වීමේදී රටක මහජනයාගේ මූලික අවශ්‍යතා තෘප්ත කිරීම සහ ඊට අදාළ ව්‍යවහාරාත්මක තත්ත්වයන් ප්‍රවර්ධනය කිරීම මෙන්ම එම යහපත් ගොඩනැ-ීම් චිරස්ථායී ලෙස පවත්වා ගැනීම පිළිබඳව ද ඒවාට විශේෂ මෙහෙයක් අයත් වන බව සාමාන්‍යයෙන් පිළිගැනේ. මෙලෙස, මනුෂ්‍යයාගේ මූලික අවශ්‍යතා පිළිබඳ PSB ආශ්‍රිතව මෙන්ම ඉන් බැහැර ද පෘථුල කතිකාවක් දක්නට ලැබේ. PSB ආයතනවලට බැහැරින් සිට එකී කතිකාවන්ට වැදගත් බලපෑමක් කළ චින්තකයින් සහ ශාස්ත්‍රඥයින් අතර මහාචාර්ය ජොහාන් ගල්තුං සහ චිලී ජාතික මැන්ෆ්‍රෙඩ් මැක්ස්නීෆ් වැනි අය වැදගත්ය. මහාචාර්ය ගල්තුං ට අනුව මිනිසාගේ මූලික අවශ්‍යතා හතර වර්ගයකි, පැවැත්ම, යහ - පැවැත්ම, අනන්‍යතාවය සහ නිදහස වශයෙනි. මෙහිදී “ පැවැත්ම ” මිනිසාගේ භෞතික පැවැත්ම ද ඇතුළත් වන ඉතා සංකීර්ණ සහ බහුවිධ සංකල්පයකි. “ අනන්‍යතාවය ” මූලික වශයෙන් සංස්කෘතික ආධ්‍යාත්මික ක්ෂේත්‍රයට සම්බන්ධය. මෙහිලා “ නිදහස ” යනු යට කී සියල්ල සාක්ෂාත් කර ගැනීම සම්බන්ධයෙන් පුද්ගලයාට හා සමාජයට තෝරා ගැනීම්වලට ඇති ඉඩ ප්‍රස්ථාවයි.

මිස්ට්‍රේලියානු විද්‍යුත් සන්නිවේදන සංස්ථා පනතේ 6 වැනි කොටස් මගින් ABC ආයතනය සඳහා වූ ප්‍රඥප්තිය ඉදිරිපත් කර ඇත. ABC ආයතනයේ මහජන සේවා භූමිකාවේ මූලික දාර්ශනික ආස්ථාන එමගින් හඳුන්වා දී ඇත. එහි එන ප්‍රධාන කරුණු අතර මිස්ට්‍රේලියානු ජාතික අනන්‍යතාවය නිර්මාණය කිරීම සම්න්ධයෙන් ධනාත්මක භූමිකාවක් එයට වෙන්වී ඇත. ඒ සම- මහජන ජීවිතයට

අදාළ මිස්ට්‍රේලියානු ප්‍රජාවේ සංස්කෘතික විවිධත්වය ධනාත්මකව පිළිබිඹු කිරීම ද ඊට අයත් අනෙකුත් වැදගත් කාර්යභාරයන් අතර වේ. විශේෂ වශයෙන් සංගීතය, නාට්‍යය සහ වෙනත් ප්‍රාසංගික කලාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා විශේෂ මැදිහත්වීමක් කිරීම ද එමෙන්ම පොදු හා විවිධ අධ්‍යාපනික සේවාවන් සැපයීම ද ඊට අයත්ය. ප්‍රවෘත්ති සම්න්ධයෙන් ඉතා පැහැදිලි නිර්දේශ මෙම ප්‍රඥප්තිය ඉදිරිපත් කරයි; ස්වාධීන ප්‍රවෘත්ති සේවාවක් ප්‍රවර්ධනය කිරීම සහ පත්වාගෙන යාම අපේක්ෂා කෙරෙන අතර දෛනික පදනමින්, සියලුම ජාතික ගුවන්විදුලි නාලිකා රූපවාහිනී මධ්‍යස්ථාන මගින් කාර්යක්ෂම ලෙස, ඉහළ මට්ටමින් විධිමත් සහ කාලීන තොරතුරු සංග්‍රහ සහ වෙනත් ප්‍රවෘත්ති වැඩසටහන් නිපදවා ඉදිරිපත් කළ යුතු වෙයි.

කැනඩාවේ අදාළ පනතට අනුව CBC හි මූලික කාර්යභාරය වන්නේ " තොරතුරු, අදහස්, මත සහ ඥානය ද මෙන්ම කලා රසාස්වාදනය ද අරමුණු කරගත් වූ පෘථුල සේවා පරාසයක් රේඩියෝ සහ රූපවාහිනී වැඩසටහන් හරහා සම්පාදනය කිරීමයි. " තවදුරටත් පනත අරමුණු මෙසේ පැහැදිලි කරයි. " CBC හි වැඩසටහන් නිශ්චිත ලෙසම කැනේඩියානු විය යුතුය. ඒවා මගින් ප්‍රාදේශිය මෙන්ම ජාතික යථාර්ථයන් පිළබිඹු විය යුතුය. විශේෂ වශයෙන් ප්‍රාදේශීය ජන ජීවිතයේ අවශ්‍යතාවන්ට අමන්ත්‍රණය කරමින් ඉංග්‍රීසි මෙන්ම ප්‍රංශ භාෂාවලින්, ඒ ඒ සංස්කෘතික ධාරාවන්ගේ ප්‍රගමනය හා අන්‍යොන්‍ය හුවමාරුවකට පිටුබලයක් සැපයිය යුතුය. තවද සිය සම්ප්‍රේෂණයන් තුළ ගුණාත්මක වශයෙන් සමාන තත්ත්වයක් ඉංග්‍රීසි හා ප්‍රංශ භාෂාවන්ට ලබාදීමට වෙර දරමින්, බෙදා හදාගන්නා වූ පොදු විඥානයක් හා අනන්‍යතාවක් තහවුරු කිරීමට දායක විය යුතුය. එමගින් ඉහළම තාක්ෂණ ක්‍රම සහ වෙනත් පහසුකම් ප්‍රයෝජනයට ගනිමින් කැනඩාවේ බහු - සංස්කෘතික, බහු වාර්ගික ස්වභාවය පිළිබිඹු කළ යුතුය. "

ඒ අතර CBC ආයතනය සිය භූමිකාව ගැන මෙසේ පවසයි: අපේ කාර්ය " කැනේඩියානු කතන්දර කීම සහ කැනේඩියානු යථාර්ථයන් පිළිබිඹු කිරීමයි " සෑම ප්‍රබල PSB ආයතනයක් තුළම වර්ධිත චර්යා ධර්ම පද්ධතියක් දක්නට ලැබීම පොදු ලක්ෂණයකි. යට කී CBC ආයතනය තම මාධ්‍යවේදීන්ගේ කාර්යය කටයුතු ඉහළ ප්‍රමිතියක් තුළ රැඳවීමේ අරමුණින් Journalistic Policy ( සංස්කාරක ප්‍රතිපත්ති ) නම් අත්පොතක් භාවිතාවට ගනියි. BBC ආයතනයේ බොහෝ කාලයක් තිස්සේ වර්ධනය වෙමින් පැමිණ තිබෙන නිෂ්පාදක මාර්ගෝපදේශන නම් අත්පොත පිටු 358 කින් යුත් ඉතා විස්තරාත්මක ලේඛනයකි. වැඩසටහන් නිෂ්පාදනය සහ සංස්කරණය සම්බන්ධයෙන් තේමා 14 ඔස්සේ අලලා සදාචාරික ප්‍රමිතීන් පිළිබඳ





විග්‍රහයක් සහ ප්‍රයෝගික භාවිතය සඳහා අත්වැලක් එයින් සැපයී ඇත.

## 4. මහජන සේවා සන්නිවේදන රාමුවක අවශ්‍යතාව

ජාත්‍යන්තර වශයෙන් PSB ආයතනවල ස්වභාවය ගැන තුලනාත්මක විමසීමකදී ඉතා සරලව විශද වන සත්‍ය මෙයයි; සදාචාරීය මාධ්‍යයක් හෙවත් ජනතා හිතසුව පිණිස ක්‍රියාත්මක වීම දර්ශනය කරගත් මාධ්‍යයක මූලික අරමුණ වන්නේ, ජනතාවගේ

I මූලික අවශ්‍යතා

II මූලික අයිතීන්

III චිරස්ථායී සංවර්ධනය යන්නයි.

එය ජනතාව විසින් වඩ වඩා සාක්ෂාත් කර ගැනීමට හා එම තත්ත්වයන් ප්‍රවර්ධනය කර ගැනීමට පිටුබලය දෙන මාධ්‍ය ක්‍රියාවලියක නිරත වීමයි. බාධාවකින් තොරව ජනතාවට අවශ්‍ය වන තොරතුරු, අදහස්, මත, දැනුම සන්නිවේදනය කිරීම, අධ්‍යාපනය, සංස්කෘතික - අධ්‍යාත්මික පෝෂණය, සමාජයේ විවිධ පර්ෂද/ කණ්ඩායම්/ සම්ප්‍රදායන්/ චින්තන ධාරාවන් අතර සම්භාෂණයක් ගොඩනැ-ම යනාදිය අලලා සිදු කෙරෙන ක්‍රියාවලියකි. අනෙක් අතින් එය ජන සමාජයේ විවිධත්වය (ස්ත්‍රී/පුරුෂ,ජනවාර්ගික, ආගමික, පරම්පරාව, ප්‍රාදේශීය, වෘත්තික යනාදි වශයෙන්) නිරූපණය කරයි. විවිධ අවශ්‍යතා හා විවිධ ඉලක්ක කණ්ඩායම් ආවරණය කරයි.

ලාභය වේවා දේශපාලනය බලය වේවා සීමිත පරමාර්ථ සහිතව, ක්‍රියාත්මක වන මාධ්‍යයකට මෙම පුළුල් මහජන අවශ්‍යතාවන්ට කිසිසේත් ආමන්ත්‍රණය කිරීම කළ නොහැකි වීම නිසා මහජන සේවා ආයතන නොමැති තැනක ජනතාවගේ යහපැවැත්ම සම්න්ධයෙන් සමනය කළ නොහැකි ගැටලු අර්බුද පැන නැගී ප්‍රචණ්ඩ ගැටුම් කරා එම සමාජය ඇදී යාම වැළැක්විය නොහැකිය. ප්‍රශ්න අර්බුද කල් තබා දැනගන්නටත් එම ප්‍රශ්න අර්බුද යහපත් ලෙස හා ප්‍රජාතන්ත්‍රවාදී ආකාරයට විසඳා ගැනීමට ජනතාව සතු ශක්තිය ඒකරාශි කර ගැනීමටත් සමාජයට උදව් කරන්නා වූ " ස්නායු පද්ධතියක් " නොමැති හෙයිනි.

රටක ප්‍රජාතන්ත්‍රවාදයේ පැවැත්ම සඳහා අවශ්‍ය වන මූල සාධකය වන්නේ වර්ධිත පුරවැසියෙක් හා පුරවැසි සමාජයක් තිබීමයි. හුදු “ යටත් වැසියන් ” හෝ “ පාරිභෝගිකයන් ” අභිනකට ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් ධාවනය කළ නොහැකිය. එම පුරවැසියාගේ පැවැත්මට අත්‍යවශ්‍ය සාධකයක් වන්නේ, පුරවැසි සමාජයේ වර්ධනයට පිටුබලය දෙන මාධ්‍යයක් පැවතිමයි. දැනට අප රට තුළ ක්‍රියාත්මක වන මාධ්‍ය අවසම්ප්‍රදායයන් යටත්වැසියන් /පාරිභෝගිකයින් නිර්මාණය කිරීමට කඹුරනවා විනා පුරවැසියන් නිර්මාණය කිරීමට කවර හෝ ශක්තියක්, ශක්‍යතාවක් පෙන්වන්නේ නැත.

මේ අනුව අද අප රට මුහුණ දෙන ප්‍රජාතන්ත්‍රවාදයේ අර්බුදය හා සාමය ගොඩනැ-ීම යන ක්ෂණික අරමුණු සම්බන්ධයෙන් ද මහජන සේවා සන්නිවේදන රාමුවක් තුළ ස්ථාපනය කෙරෙන මාධ්‍ය ආයතන අත්‍යවශ්‍ය වී ඇත.

## 5. ජාතික මාධ්‍ය ප්‍රතිපත්ති සඳහා මාර්ගෝපදේශන

සමාජයක් නිර්මාණය වන්නේ ප්‍රධන ක්ෂේත්‍ර තුනක චලනයක් එක්තැන් වීමෙනි. ඒවා නම්, ආර්ථික,දේශපාලනික හා සංස්කෘතික - අධ්‍යාත්මික වශයෙනි. එබැවින් ජනතාවට බලපාන මිනැම ආයතනික ප්‍රතිපත්ති

**PSB පදනම් සාධක**








### සංස්කෘතික - අධ්‍යාත්මික

- දැක්ම
- ඉලක්ක සහ අරමුණු
- චර්යා ධර්ම පද්ධතිය / නිෂ්පාදක මාර්ගෝපදේශන
- ඒවා ක්‍රියාවට නංවනු පිණිස ඇති ආයතනික ප්‍රතිපාදන
- පුහුණු ක්‍රම
- සම්ප්‍රදායය

### ආර්ථික

- වෙළඳ ප්‍රාග්ධනය සම- සම්බන්ධය
- රාජ්‍ය අරමුදල් සම- සම්බන්ධය
- අරමුදල් ක්‍රම
- ඉලක්ක කණ්ඩායම් හා වැඩසටහන් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රමුඛතා
- තාක්ෂණික ශක්තිය

### දේශපාලන

- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල ව්‍යවස්ථා ප්‍රතිපාදන
- පාර්ලිමේන්තු පනත් සහ වෙනත් නෛතික ලේඛන
- ආයතන ප්‍රතිපත්ති සම්පාදන ව්‍යුහ / තීරණ ක්‍රියාවලින්ගේ ස්වභාවය
- තුලන හා සංවරණ ක්‍රම
- ග්‍රාහකයා සම- විධිමත් සබඳතා කළමනාකරණය කර ගැනීමේ ව්‍යුහ

රාමුවක් සම්පාදනය කිරීමේදී, එම ක්ෂේත්‍ර තුන තුළම එම ආයතනය නිරූපණය වන්නේ කෙසේදැයි සලකා බැලිය යුතු වෙයි. PSB හෙවත් මහජන සේවා සන්නිවේදනය සම්න්ධයෙන් දැනට පවතින ජාත්‍යන්තර උදාහරණ තුලනාත්මකව අධ්‍යයනය කිරීමෙන් ද එම ක්ෂේත්‍ර තුන තුළ ප්‍රකාශිත මූලධර්ම ක්‍රියාත්මක වන අයුරු හඳුනා ගත හැකි බව මේ රචනාවෙන් කෙටියෙන් පෙන්වා දී ඇත. එබැවින් මහජන සේවා සන්නිවේදනය (PSB) අරමුණු කොට ගත් ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමේදී අත්‍යවශ්‍යයෙන් අධ්‍යයනයට භාජනය කළ යුතු මූලික තේමාත්මක කරුණු එම ක්ෂේත්‍ර 3 ආශ්‍රිතව සම්පාදනය කළ හැකිය. මේ සඳහා ප්‍රයෝජනවත් මූලික ප්‍රශ්න හඳුනා ගැනීමට වෑයම් කිරීමේදී ජාතික ප්‍රතිපත්තිය සඳහා මූලික රාමුවක් නිරායාසයෙන් සකස් වනු ඇත. එබඳු වෑයමක් ඇසුරින්

සම්පාදනය කර ගත හැකි ප්‍රතිපත්ති මාර්ගෝපදේශන ඒ ඒ ක්ෂේත්‍රවලට අදාළව පහත දක්වමු.

## I ආර්ථික

1) ජාතික විද්‍යුත් මාධ්‍ය ආයතන වෙළඳ ප්‍රාග්ධනයෙන් සපුරාම ස්වාධීන විය යුතුය.

2) මේවායේ නඩත්තුව සම්බන්ධයෙන් ලෝකයේ දැනට මෙවැනි මාධ්‍ය අනුගමනය කරන ක්‍රම ගණනාවක්,සුදුසු ආකාරයට එකතු කිරීමෙන් සකසා ගත හැකි වෙයි. (උදා: බලපත්‍ර ගාස්තු/ ග්‍රාහක ගාස්තු/ රාජ්‍ය අරමුදල්/ මාධ්‍ය නිෂ්පාදන විකිණීමෙන් ලබන ලාභය/ සමාජ ආයතනවල දායකත්වය (Social Marketing ආදිය )

3) ආයතනයේ මූල්‍ය ශක්තිය, ආයතනයේ තාක්ෂණික ශක්තිය ද මනුෂ්‍ය සම්පත් ද ඉහළම ප්‍රමිතීන්ට අනුව වර්ධනය කර ගැනීම උදෙසා යෙදවිය යුතුය.

4) වැඩ සටහන් හා ඉලක්ක කණ්ඩායම් පිළිබඳ පිරිවැය ප්‍රමුඛතා නිර්ණයේදී, එය මහජන සේවා සංකල්ප රාමුවට අනුගතව කළ යුතුය. ජනතාවගේ මූලික අවශ්‍යතා (පැවැත්ම, යහ පැවැත්ම, අනන්‍යතාව, නිදහස වැනි සංකල්පවලින් විස්තර කෙරේ - Existance, Wellbeing,Identity,Freedom ) ඉන් ආවරණය විය යුතු අතර තවද, ජන සමාජයේ විවිධත්වය ගැන පැහැදිලි දැක්මක් සහිතව එය කළ යුතුය.

## II දේශපාලන

1) ලංකාව ද පාර්ශවකරුවෙකු වන සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය ඇතුළු අනෙකුත් වැදගත් ප්‍රඥප්ති සම්මුතීන්ට හා ප්‍රමිතීන්ට අනුකූලව මාධ්‍යයට අදාළ ව්‍යවස්ථා හා නෛතික රාමු සම්පාදනය විය යුතුය. ( උදාහරණ වශයෙන් මාධ්‍යයට බාධා කරන “ පාර්ලිමේන්තු වරප්‍රසාද ” පනත වැනි පනත් අවලංගු විය යුතුය.)

2) මේ අනුව ස්ථාපනය කෙරෙන PSB ආයතන අධීක්ෂණය කිරීම හා





විධිමත්කරණය සඳහා බල දේශපානයෙන් නිදහස් ව අධිකරණයට/ පාර්ලිමේන්තුව හරහා ජනතාවට සෘජුව වග කියන ප්‍රාමාණික ස්වාධීන ව්‍යුහයක් ඇති කළ යුතුය.

3) ආයතනික සංවිධානය / කළමනාකරණ / පරිපාලන ව්‍යුහයන් මහජන සේවා සන්නිවේදන දර්ශනයට අනුකූල හා එය ආරක්ෂා කරන ආකාරයට සැකසිය යුතු වෙයි.
උදාහරණයක් ලෙස මෙම ආයතනවල ප්‍රධාන ප්‍රතිපත්ති නියමුවන් පත් විය යුත්තේ දැනට පවතින ලෙස ආණ්ඩුවක බලපෑමට යටත්ව නොවේ. එය ඉහත කී (2) ආකාරයේ “ ස්වාධීන මාධ්‍ය කොමිසමක් ” හෝ එවැනි ව්‍යුහයක අධීක්ෂණ හරහා සිදුවිය යුතුය. මෙම ආයතනවල කළමනාකරණය හා නිෂ්පාදන අංශවලට අදාළ ප්‍රධානීන් මෙන්ම සේවකයන් ද පත් විය යුත්තේ සාමාන්‍ය රාජ්‍ය නිලධාරීන් තෝරා ගන්නා “ සුදුස්සාට තැන ” ලබාදීමේ ක්‍රමවේදයට අනුවය.

4) ආයතනික අභ්‍යන්තර තීරණ ක්‍රියාවලින්, දැනට ජාත්‍යන්තරව පවතින උසස් ආදර්ශ හරහා සකසා ගත හැකිය. මෙහිදී සැලකිය යුතු අවශ්‍යතාවක් වන්නේ චලනයට භාජනය වන මහජන අවශ්‍යතා හඳුනා ගැනීම මෙන්ම අදාළ ප්‍රතිපත්ති සකස් කිරීමේ දී පුරවැසි සමාජයේ ප්‍රමුඛ විශේෂඥයින් සහ ක්‍රියාධරයන්ගේ මැදිහත්වීම සහතික කිරීමට ආයතනික ක්‍රම සම්පාදනයයි.

5) පුළුල් මහජනතාවගේ ප්‍රතිචාර, අදහස්, යෝජනා ක්‍රමානුකූලව ලබා ගැනීම හා විමර්ශනය කර සුදුසු නිගමනවලට පැමිණීම සඳහා විශේෂ ආයතනික හස්තයක් සම්පාදනය කළ යුතුය.

## III සංස්කෘතික - ආධ්‍යාත්මික

1) ලෝකයේ දියුණු මහජන සේවා ආයතනවල ස්ථාපිත දර්ශනයන් පිළිබඳ අධ්‍යයනයන්ද, මේ රටේ මහජනයාගේ ආර්ථික, සාමාජීය, සංස්කෘතික අවශ්‍යතා පිළිබඳ දැනුම ඇසුරින්ද, විශේෂයෙන් අප රට දීර්ඝකාලීනව මුහුණ දෙන විශාල අභියෝග සැලකිල්ලට ගනිමින්ද මෙම ජාතික නාලිකාවල “ දර්ශනය ” සම්පාදනය විය යුතුය. මෙහිදී පොදුවේ ජනතාවගේ මූලික අවශ්‍යතා සහ විශේෂ වශයෙන් සිවිල් හා දේශපාලන

අයිතීන් මෙන්ම ආර්ථික හා සංස්කෘතික අයිතීන් ගැන ද මනා දැනුමක් මත එය සම්පාදනය විය යුතුය.

2) එම දර්ශනයට අනුකූලව ඉදිරි වසර 10 ක පමණ කාලයකට අදාළව මේ ආයතනවල අරමුණු සහ ඉලක්ක ඉතා විස්තිරණව සම්පාදනය කර ගත යුතුය.

3) ජාත්‍යන්තර ප්‍රමිතීන් ද, අප රටේ සංස්කෘතික ආධ්‍යාත්මික අභියෝග සහ අවශ්‍යතා සැලකිල්ලට ගනිමින්ද, මෙම මාධ්‍ය සඳහා චර්යා ධර්ම පද්ධතියක් හා “ නිෂ්පාදන මාර්ගෝපදේශන ” සම්පාදනය විය යුතුය.

4) එම චර්යා ධර්ම හා “ නිෂ්පාදන මාර්ගෝපදේශන ” ප්‍රායෝගිකව ක්‍රියාවට නංවනු වස්, මාධ්‍යකරුවා පුහුණු කිරීම සඳහා විධිමත් ආයතනික ව්‍යුහ හා ක්‍රමවේද නිර්මාණය කර ගත යුතුය.

## ලෝකයේ විද්‍යුත් මාධ්‍ය ආයතන සඳහා සදාචාර සිතියමක්

ප්‍රජා අයිතිය (පොදු ජනතා අයිතිය)




ඒක මාර්ග සන්නිවේදනය (උඩ සිට පහළට)

ද්වි - මාර්ග සන්නිවේදනය (තිරස්/බහු රේඛීය)

ඒකාධිකාරී (රාජ්‍ය/ සමාගම් ) අයිතිය





A දියුණු PSB ආයතන
B ප්‍රජා ගුවන්විදුලිය
C ජාතික මට්ටම්වල වාණිජ ආයතන / බල දේශපාලනයට යටත් රාජ්‍ය ආයතන
D ජාත්‍යන්තර වාණිජ මාධ්‍ය

අප ඉදිරියේ ඇති අභියෝගය නම් ශ්‍රී ලංකාවේ රාජ්‍ය මාධ්‍ය ආයතන ඉහත රූ සටහනේ දක්වා ඇති C සංකල්පයේ සිට A කලාපයට ගෙන ඒමයි.

# 8

# අන්තර්ජාලීය ක්‍රියාකාරීත්වය නිසා හැඩගැසෙන මානව සමාජ සබඳතා පිළිබඳ තුලනාත්මක විශ්ලේෂණයක්

එම්. සී. ස්වර්ණලතා පෙරේරා

මිනිසා හා තාක්ෂණය අතර ඇත්තේ ඉතා සමීප සම්බන්ධතාවකි. ඈත අතීතයේ සිට ම මිනිසා නානාවිධ තාක්ෂණික ක්‍රම භාවිතයෙහි යෙදුන බවට සාධක ඇත. ඉතා සරල තාක්ෂණික ශිල්පීය ක්‍රම භාවිතයේ සිට නුතන සංකීර්ණ තාක්ෂණික ශිල්පීය ක්‍රම දක්වා පරිණාමය වෙමින් පැවත එන නොයෙකුත් භාණ්ඩ හා උපකරණ භාවිතය මිනිස් අවශ්‍යතා සපුරාලීමට සමත් වී ඇත. එහෙත් ඉන් නො නැවතුණු මිනිස් වර්ගයා ස්වකීය ජීවිතය වඩාත් පහසුකරලීමට, සුඛ නම්‍ය කිරීමට, ප්‍රබෝධවත් කිරීමට, හැකි සෑම තත්ත්වයන් පිළිබඳ කරන ලද පර්යේෂණාත්මක හා ගවේෂණාත්මක යොමු වීම් නිසා මිනිසා හා සම්බන්ධිත බෙහෝ ක්‍රියාකාරීත්වයන් නවීන යන්ත්‍ර සුත්‍රානුසාරයෙන් සිදු කළ හැකි අතර කායික හා මනෝමය සම්බන්ධතා මෙන්ම ප්‍රජා සම්බන්ධතා වර්ධනය කිරීමට හැකි කාර්යන් ද ඒවා විසින් පවරාගෙන ඇති ආකාරය රොබෝ සහ පරිගණක වැනි යන්ත්‍ර තුළින් තහවුරු වේ.

තාක්ෂණික උපක්‍රම භාවිතය නිසා මිනිස් අවශ්‍යතාවන් සම්පූර්ණ කර ගැනීමට හැකි වුවා සේම මිනිසාගේ සිත ගත හා ක්‍රියාවන් ද වෙනස් කිරීමෙහිලා එවන් උපකරණ සමත්වී ඇති ආකාරයද, එනිසා සමාජයට හා මානවයාට බලපා ඇති ධනාත්මක ප්‍රතිඵල මෙන්ම සෘණාත්මක ප්‍රතිඵල කෙරෙහි ද අපගේ අවධානය යොමු කළ යුතුව ඇත. ඒ ඒ යුග වල ඇති වූ පාරිසරික විපර්යාශයන් නිසා





මිනිසාට දෙපයින් සිට ගැනීමේ භාග්‍ය උදාවිය. එහි ප්‍රතිඵලයක් ලෙස මිනිසා නොයෙකුත් මෙවලම් නිෂ්පාදනයට මෙන්ම භාවිතයට ද හුරු පුරුදු විය. මේ අයුරින් ගස්වැල් වල ලැග ජීවත් වු කාල පරිච්ජේදය අවසන් කරමින් නව ජීවන රටාවකට හුරු පුරුදු වු මිනිසා ස්වකීය දෙඅත් හා බුද්ධිය මෙහෙය වීමෙන් අතිසංකීර්ණ හා අධිවේගී තාක්ෂණික සමාජ රටාවකට අවතීර්ණ වී ඇත.

මෙසේ කාර්මික ජීවන රටාවකට අවතීර්ණ වීමේ භාග්‍ය උදාවූයේ කාර්මීකරණය නිසාය. විශේෂයෙන් 18 වන ශත වර්ෂයේ අගභාගයේ සිට වර්ධනය වෙමින් පැවති කාර්මික නිෂ්පාදනයන් ස්වයංක්‍රිය යාන්ත්‍රික නිෂ්පාදනයන් කරා ගමන් කිරීමට වැඩි කාලයක් ගත නොවිණ. 20 වන සියවසේ බිහි වූ ස්වයංක්‍රිය නිෂ්පාදනයන් යුද්ධාදි කටයුතු වලටත් වාණිජමය පාරිභෝජනයටත්, එදිනෙදා ජීවිතයටත් ළංවූයේ ඉතා වේගයෙනි. මෙවැනි යාන්ත්‍රිකරණයේ ප්‍රතිඵලයක් වශයෙන් පරිගණකයද අද සමාජයේ භාවිතයට පිවිස ඇත. පළමුවන විද්‍යුත් පරිගණකය භාවිත කරන ලද්දේ 1946 දීය. එය ENIAC ( Electronic Numerical Integrator and Calculator ) යනුවෙන් හඳුන්වනු ලැබීය. මෙවැනි විද්‍යුත් පරිගණකයන් වසර 20 ක් තුළදී 30 000 පමණ භාවිත වු අතර එහි මූලික වටිනාකම ඩොලර් බිලියන 8 ක් පමණ විය. RAND පරිගණක විශේෂඥයෙකු වූ පෝල් ආම්ඩ් ( Paul Amerd ) දක්වන පරිදි 1965 වනවිට පරිගණකයන් පෙර පැවති පරිගණකයන්ට වඩා දහසකින් අධි බලැති වූ අතර 1975 දී නිෂ්පාදනය කරන ලද ඒවා 1965 පැවති පරිගණකයන්ට වඩා 1000 න් අධි බලැති ඒවා වන බව පවසා ඇත. 1940 දශකය අග භාගයේදී වාණිජමය කටයුතු සඳහා යුනිවැක් ( Univac) නම් වූ පරිගණක නිෂ්පාදනය උදෙසා එකර්ට් (Eckert) සහ මවුච්ලි (Mauchly) විසින් ව්‍යාපාරික ආයතනයක් පිහිටුවන ලදී. ඇත්ත වශයෙන්ම මේවාට Computer යන නම භාවිත කරන ලද්දේ 1950 ගණන් වලදීය. 1954 දී General Electrical නම් වූ කොම්පැනිය විසින් ව්‍යාපාරික කටයුතු වලට යෝග්‍ය වන ආකාරයෙන් පරිගණක නිෂ්පාදනය ඇරඹීය. ජාත්‍යන්තර වෙළඳාම් කටයුතු දියුණුවීම නිසා එම වෙළඳ ගනුදෙනු පවත්වාගෙන යාමට උපකාර වන පරිදි IBM ආයතනය විසින් නව තාක්ෂණයෙන් යුතු පරිගණක නිෂ්පාදනය කරන ලදී.

ව්‍යාපාරික ලෝකයේ සාමාන්‍ය ජීවිත ව්‍යවහාරයට පරිගණක භාවිතය එළඹීමෙන් එහි කාර්යභාරයන්, ක්‍රියාත්මක ශක්තීන් තව තවත් පුළුල් වන්නට විය. විශේෂයෙන් එය විද්‍යුත් මාධ්‍යයක් වශයෙන් ජනතාව අතර වඩාත් ප්‍රචලිත වීම නිසා ලේඛන කලාවේත්, මාධ්‍ය රටාවන්ගේත් විශාල වෙනස්කමක් ඇති විය. එම

වෙනසට ප්‍රධානම සාධකය වූයේ පරිගණකයට අන්තර් ජාලය අන්තර්ගත වීමය. මෙම අන්තර්ජාලයට ඇතුල්වීම නිසා භාෂා විලාසයත්, සංස්කෘතිය හා සමාජීයවත් ලොව පුරා සිසාරා සම්බන්ධ වූ සමාජ සමූහයන් හා ව්‍යාපාරයන්ගේ උන්නතිය ද ක්‍රමයෙන් වැඩි දියුණු විය. එනිසා අද අන්තර්ජාලය හා වෙබ් අඩවි තොරතුරු තාක්ෂණය පාරා වළල්ලක් වී ඇත.

අන්තර්ජාලය අපේ ජන ජීවිතයට සමීප වී එතරම් කලක් නොවේ. ඒත් සෑම ක්‍රියාවකම ප්‍රතිඵලයක් ඇත යන කියමන සනාථ කරමින් අන්තර්ජාලය හා සම්බන්ධිත අපේ ක්‍රියාකාරීත්වයන්ගේ ධනාත්මක හා ඍණාත්මක ප්‍රතිඵලයන් සමාජයේ ඉස්මතු වෙමින් පවතී. මෙම අන්තර්ජාලය නැමති ජනමාධ්‍ය සමාජයට අහිතකර බලපෑම් ඇති කරන බවත් එම තත්ත්වය දිනෙන් දින වර්ධනය වෙමින් නොයෙකුත් අපරාධයන්ට එනම් පැහැරගෙන යෑම්, මිනී මැරුම්, මංකොල්ල ආදිය හා පවුල් ජීවිතයේ බිඳ වැටීම් සිදු වන බවත් සමහරු පවසති. අනෙක් අතට ජන ජීවිතය සුවපහසු කරවන වාණිජ ව්‍යාපාරයන් හා අනෙකුත් ආර්ථික කටයුතු වඩාත් සංවිධානාත්මක රාමුවකට ගෙන ඒමේ ක්‍රියාවලිය අන්තර්ජාලය ඔස්සේ වඩාත් සාර්ථක වී ඇති බවත් සමහරු පවසති. ඒ කෙසේ වෙතත් මේ පිළිබඳ සමාජ හා මානව සාධක ඔස්සේ විමසා බැලීමේ වටිනාකම අද කාලීන සමාජ රටාවට අනුව වැදගත් තේමාවක් වී ඇත.

අන්තර්ජාලය සමාජයට සිදු කර ඇති බලපෑම ගැන සලකා බැලීමේදී අවධානය යොමු කළ යුතු කරුණු කීපයක් වෙති. එනම් ආර්ථික ප්‍රගමනය, කළමනාකරණ පද්ධතිය, සමාජීය හා සංස්කෘතික වාතාවරණය යන සාධක ප්‍රධාන වේ. මේවා කෙරෙහි අන්තර්ජාලයේ ඇති සම්බන්ධකම් හා එහි ප්‍රතිවිපාක කවරේද යන්න විමසීම වැදගත්ය. අන්තර්ජාලය ඔස්සේ ලැබෙන තොරතුරු මගින් තම ආයතනයේ උන්නතියට ගත යුතු පියවර, තම නිෂ්පාදනයන් හා සැලසුම් ආදියද ඒ ඒ රටවල සම්බන්ධීකරණ හා සැලසුම් කටයුතු ක්‍රියාත්මක කළ යුතු ආකාරය පිළිබඳ ම- පෙන්වීමක් සිදු කරන නිසා අන්තර්ජාලය රාජ්‍ය හා ව්‍යාපාරික ආයතන කෙරෙහි වන බලපෑම පහත සඳහන් අයුරින් වර්ගීකරණය කළ හැකිය.

- * තාක්ෂණික සංවර්ධනය කෙරෙහි ඇති බලපෑම
  Effort of the technical changes.
- * කළමනාකරණ ක්‍රියාවලිය කෙරෙහි ඇති බලපෑම
  Effort of the Management Process යනුවෙනි.





ආයතනයේ නිෂ්පාදනයන් හා සේවාවන් කාර්යක්ෂම කිරීම සඳහා අන්තර්ජාලය හා සම්බන්ධිත වැඩසටහන් ක්‍රියාත්මක වෙමින් පවතී. එසේම තම නිෂ්පාදනයන් සඳහා නව වෙළඳ පළවල් මේ මගින් හඳුනා ගත හැකිව තිබේ. වෙළඳ ව්‍යාපාර වලින් තමන්ට අවශ්‍ය කරන දේ තම සේවා ස්ථානයේ සිට හෝ නිවසේ සිට ඇණවුම් කිරීමට ( to order ) හා ඒවා හැකි ඉක්මනින් ඒ ඒ ස්ථානයන්ට බෙදා හැරීම් අන්තර්ජාල තොරතුරු තාක්ෂණය නිසා වේගවත් වී ඇත. නිරවද්‍යතාව මෙහි විශේෂත්වයක් වී ඇත. එමනිසා බොහෝ සංවිධාන වලටද අන්තර්ජාලයෙහි උපයෝගීතාවය වඩාත් අවශ්‍යව ඇත.

පරිගණක ආර්ථික කටයුතු සංවිධානාත්මකව පවත්වා ගෙන යෑමට ඉවහල් වන නව තාක්ෂණික ප්‍රවේශයක් වන අතර අන්තර්ජාලය සඳහා අවශ්‍ය දැනුම ලබා දෙන මධ්‍යස්ථානයක් බවට ද පත්ව ඇත. ප්‍රාථමික සමූහ සම්බන්ධතා තහවුරු කරගැනීමේදී මුහුණට මුහුණලා සම්න්ධතාවන්ගේ වැදගත්කම චාල්ස් හෝර්ටන් කූලි (Chals Horton Cooley) විසින් පෙන්වා දී ඇතත් වර්තමානයේ මෙම සම්බන්ධතා ඇති කරගැනීමේදී පුද්ගලයා උපයෝගී කර ගන්නා වූ විවිධ තාක්ෂණික මාධ්‍යයන් නිසා එම සමාජ සම්බන්ධතා වඩාත් කඩිනමින් නිවැරදිව පවත්වා ගෙන යා හැකි මාධ්‍යයක් ලෙස අන්තර්ජාලය අද ක්‍රියාත්මක වෙමින් පවති.

මිනිසා හා අන්තර්ජාලය අතර සම්බන්ධතා වර්ධනවීමේ ප්‍රතිඵලයක් වශයෙන් සමාජ ජිවිතයට, විවාහ සම්බන්ධතාවලට, පවුලේ කටයුතුවලට, රැකියාවන් හා සෞඛ්‍ය ජීවිතයට අහිතකර බලපෑම් ඇතිවේය යන බිය හා සැකය බොහෝ දෙනා අතර මත භේදයට තුඩුදුන් කරුණක් වී ඇත. මෙයට හේතු වී ඇත්තේ අන්තර් ජාලයට බොහෝ දෙනෙක් ඇබ්බැහිවීම (internet addiction) අන්තර්ජාලය හා සම්බන්ධිත ආදරවන්තභාවය (On - line romance) සමාජය විනාශයට පත් කරන්නන් (Predature) හා අන්තර්ජාලය හා සම්බනධිත ලිංගික ක්‍රියාවන් (Cybersex) ආදිය සඳහා අද බොහෝ දෙනා සූක්ෂම ලෙස ආකර්ෂණය කර ගෙන ඇත.

මේ නිසා ප්‍රධාන වශයෙන් අන්තර් ජාලය හා සම්බන්ධිත පුද්ගලයින් ප්‍රවර්ගයන් කිහිපයක් විග්‍රහ කළහැකිය.

1) නිරන්තරයෙන් අන්තර්ජාලය පරිග්‍රහණය කරන්නවුන් (Continuous Adopters )

2) කලින් පරිග්‍රහණය කළ නමුත් දැනට එය නවතා දමා ඇති අය (Discontinous Adopters)
3) පරිග්‍රහණ කර නතර කළ ද නැවත එය භාවිත කරන්නන්
4) දැඩි ලෙස පරිග්‍රහණය කරන්නන් (Potential Adopters)
5) කොහෙත්ම පරිග්‍රහණය නොකරන්නන් (Continuous non Adopters)

යන්ත්‍රයක් වශයෙන් පරිගණකය භාවිත කිරීම පමණක් නොව එහි මෘදුකාංග (Software) හා මහජනතාව අතර සම්බන්ධතාව පවත්වන ආකාරය පිළිබඳව විද්‍යාත්මකව සෙවීම තුළින් අනාවරණය කර ගැනීම වැදගත්වේ. එසේම ඒවා භාවිත කරන පුද්ගලයින් ඔවුන් ඒවාට දක්වන ප්‍රතිචාරයන් හා චර්යාත්මක විග්‍රහයන් පිළිබඳ විවිධ පර්යේෂණයන් තුළින් අවබෝධ කර ගැනීම වැදගත් විය හැක. පරිගණක භාවිත කරන ලෝකයේ මිනැම සමාජයක පුරවැසියන් හා චර්යාත්මක විග්‍රහයන් පිළිබඳ විවිධ පර්යේෂණයන් තුළින් අවබෝධ කර ගැනීම වැදගත් විය හැක. පරිගණක භාවිත කරන ලෝකයේ මිනැම සමාජයක පුරවැසියන් ඉහත සඳහන් කුමන ආකාරයේ ප්‍රවර්ගයකට හෝ අයත්වේ. අද ලෝකයේ බොහෝ දෙනෙක් එදිනෙදා ජීවිතයට පරිගණක කටයුතු උපයෝගි කර ගන්නා නිසා ලෝකයේ දියුණු රටවල තම රැකියා ආයතන තුළ පමණක් නොව ස්වකීය නිවෙස් වලද පරිගණක භාවිතයේ යෙදෙමින් සිටින නිසා ස්වකීය නිවසේ සිට ම අන්තර්ජාලය හා සම්බන්ධවීමට ඔවුනට අවස්ථා උදා වී ඇත. මේ හෙයින් අන්තර්ජාලය භාවිත කරන්නන් ප්‍රධාන වශයෙන් ස්ථානයන්ට අනුව එනම් රැකියා ස්ථානයන්හිදී අන්තර්ජාලය භාවිත කරන්නන් වශයෙන් හෝ ස්වකීය නිවෙස්වලම නියැළෙන්නන් වශයෙන් තවදුරටත් වර්ගීකරණය කළ හැක. ලෝකයේ අන්තර්ජාලය භාවිත කරන්නෝ මිලියන 300-350 ක් අතර ප්‍රමාණයක් දැනට සිටිති. සාර්ක් කලාපීය රටවල් අතුරින් අන්තර්ජාලය හා ඊ- මේල් භාවිතය ප්‍රථම වරට ඇරඹුණේ ශ්‍රී ලංකාවේය. ඉක්බිතිව ඉන්දියාව, පාකිස්තානය, නේපාලය, බංගලාදේශය හා මාලදිවයින පිළිවෙලින් අන්තර්ජාලය භාවිතයට හුරුවිය.

පරිගණක ඔස්සේ අන්තර්ජාල භාවිතය සමාජයේ ලොකු කුඩා සැම දෙනාම පාහේ ඉමහත් රුචිකත්වයෙන් භාවිත කරන බව විවිධ පර්යේෂණ ඇසුරින් අනාවරණය වී ඇත. විශේෂයෙන් දියුණු රටවල ළමා සංවර්ධනයට අවශ්‍ය උපදෙස් අන්තර්ජාලය ඔස්සේ ලබා දෙන හෙයින් බොහෝ ගැබිණි මව්වරු ඒවායේ තොරතුරු දැන ගැනීමට වඩාත් උනන්දු වී ඇත. මේ නිසා ළදරුවා ගැබ්ගත්





අවස්ථාවේ සිට මිනිසා ඉපදී ජීවත්ව මියයන තුරු ජීවිතයේ විවිධ අවස්ථාවලට අනුකූලව අන්තර්ජාලය භාවිතය සිදුවන හෙයින් මේ සමාජයේ එක්තරා කණ්ඩායමකට පමණක් සීමාවූ තාක්ෂණික මාධ්‍යයක් ලෙස හුවා දැක්වීම සාධාරණ නොවේ. අන්තර්ජාල භාවිතය පිළිබඳ විවිධ රටවල කරන ලද පර්යේෂණ හා ගවේෂණ ඇසුරු කිරීමේ දී එය භාවිතා කිරීමේ ඇති වැදගත් කම හෝ ඉන් ඇතිවන හිතකර, අහිතකර තත්ත්වයන් අනාවරණය කර ගැනීම වඩාත් පහසුවිය හැක. මේ අනුව 2000 වසරේ දි අන්තර්ජාලය පරිහරණය කිරීමේ ව්‍යාපෘති පිළිබඳව හොංකොං (Hong Kong) හි කරන ලද පර්යේෂණය ඉතා වැදගත්ය. මෙය Zhu & Zhon He යන අය විසින් පවුල් 1007 ආශ්‍රයෙන් අන්තර්ජාල භාවිතය පිළිබඳ විමසීමක් කරන ලදි. එමගින් හෙළිදරව් වූ ආකාරයට අනුව නිරන්තරයෙන් අන්තර්ජාලය හා සම්බන්ධවන පවුල් 40% ද වඩාත් දැඩි ලෙස එය ග්‍රහණය වූ අය 12% ද සම්බන්ධතාවක් නැති පවුල් 7% ද භාවිතයට අකමැති 41% ක් ද සිටි බව පැහැදිලි වේ. මේ අනුව අන්තර්ජාලය භාවිත කරන්නවුන් රූප සටහනක් ආශ්‍රයෙන් මෙසේ දැක්විය හැක.

## අන්තර්ජාලය භාවිත කරන්නන්ගේ ව්‍යුහාත්මක රටාවන්




## අන්තර්ජාලය භාවිත කරන්නන් හා ඔවුන්ගේ සමාජ ගතිලක්ෂණ:-

අන්තර්ජාලය භාවිත කිරීම කෙරෙහි ඒ ඒ පුද්ගල ගති ලක්ෂණ බලපෑම සලකා බැලීම වැදගත්වේ. ඒ ඒ පුද්ගලයාගේ පෞරුෂය ස්වභාවය, සමාජ ආර්ථික

තත්ත්වයන් දැනුම් මට්ටම සහ ඔවුන් ජීවත් වන පරිසරයේ ස්වභාවයන්ට අනුව අන්තර්ජාලය හා බැඳීමේ ප්‍රමාණය වෙනස් විය හැක. ඇමරිකාවේ පරිගණක භාවිතය සෑම ප්‍රජාවක් කෙරෙහි ම පැතිර පවතින අතර අන්තර්ජාලය හා සම්බන්ධ පුද්ගලයින්ගේ සමාජ කවයන් ද සංවිධානය කර ඇත. මිනිසා විසින් නිෂ්පාදනය කරන සියල්ලක්ම මිනිසාගේ පරිහරණය සඳහා යම් ආකාරයකින් උපයෝගී කර ගනී. මෙම උපයෝගීතාවය පුද්ගලයාගේ සමාජ යහපත හෝ අයහපත උදෙසා ප්‍රයෝජනයට ගත හැක. එනිසාම මේ සමාජයේ ජන ජීවිතයේ සෑම අංශයකට ම එය සමීප වෙමින් ලද හැකි හෝ ලද්දා වූ යහපත් ප්‍රතිඵලයන් හා ඉන් සමාජයට කුමන ආකාරයෙන් හිතකර වේ ද යන්න පිළිබඳ විග්‍රහයන් අපට අනුමාන වශයෙන් ප්‍රකාශ කළ හැකි වුව ද විද්‍යාඥයින් ඉන් සෑහිමකට පත් නොවේ. ඔවුහු සෑම විටම තීරණයන් හා විසඳුම් ඉදිරිපත් කිරිමට උත්සාහ දරන්නේ විවිධ ගවේෂණයන් හා පර්යේෂණයන් තුළිනි. එසේ පරිගණක හා අන්තර්ජාල භාවිතය පිළිබඳ කරන ලද පර්යේෂණ හා විමර්ශන තුළින් එයින් සමාජයට ඇති කරන යහපත් හා අයහපත් බලපෑම් කවරේ ද යන්න විමසා බැලීම වැදගත් වේ.

අන්තර්ජාලය භාවිතය තුළින් ගොඩනැගෙන සමාජ ව්‍යුහය එම සම්බන්ධතා චර්යාත්මක රටාවන් සමාජයට ධනාත්මක ප්‍රතිඵල ගෙන ඒදැයි විමසා බැලීමේදී ඉහත සඳහන් වර්ගීකරණය යම් ම- පෙන්වීමක් ලබා දෙයි. එයින් සමාජයේ අන්තර්ජාල භාවිත කරන්නන් තුළින් ඍජුව හා වක්‍රව එම බලපෑම් ඇති කෙරේද යන්න විග්‍රහ කර බැලිය හැක.

ඒ ඒ පුද්ගල ගති ලක්ෂණ වලට අනුව පුද්ගලයා අන්තර්ජාලයට බැඳීමේ ප්‍රමාණය හා එහි බලපෑම් වෙනස් විය හැක. මිනෑම සාධකයක් සෑම පුද්ගලයාටම එකහා සමානව බලනොපාන බව අප දන්නා කරුණකි. ඒ ඒ පුද්ගලයින්ගේ වයස් පරිමාණයන්, අධ්‍යාපන තත්වය, රැකියාව, ලිංගිකත්වය, පදිංචිය, විවාහක අවිවාහක බව, ආගම යන විචල්‍යයන්ගේ පුද්ගලයා යම් තත්ත්වයකට ඇබ්බැහි වීමට එම තත්ත්වයන්හි එල්බ ගැනීමට බැහැර වීමට හෝ ප්‍රතික්ෂේප කිරීම එසේත් නැත්නම් උපේක්ෂිතව ක්‍රියා කිරීමට බලපෑමක් කෙරේ. එයට පුද්ගලයාගේ කායික මානසික තත්ත්වය බලපෑ හැකි අතර එම තත්වය වෙනස් කිරීමට බාහිර විචල්‍යයන්ද එසේම ඉවහල් විය හැක. අන්තර්ජාලය ආශ්‍රයෙන් මෙම තත්ත්වය විග්‍රහ කිරීමේ දී සැලකිය යුතු කරුණු කීපයක් වෙයි. ඒවා නම්,

1) පුද්ගලයින්ට තමන්ගේ අධ්‍යාපනය, රැකියාව හෝ විනෝද කටයුතු සඳහා අන්තර්ජාලය ප්‍රයෝජනවත්වේ ද?





2) ඔවුන්ගේ සමාජ රටාවන් සම- අන්තර්ජාලය කොතරම් සමීපවේ ද?
3) තමන්ගේ කටයුතු වලට අන්තර්ජාලය කොතරම් පහසුවේ ද?
4) එහි ඵල ප්‍රයෝජන අනිත් අයට ප්‍රකාශ කිරීම් කොතරම් පහසුද?
5) එම තාක්ෂණික මානව අවශ්‍යතාවන් මැනීමට තමන්ගේ සමාජ තත්ත්වයන් කොතරම් උපකාරීවේ ද?

පාසල් අධ්‍යාපනය ලබන දරුවන්ට ඔවුන්ගේ කායික මානසික සංවර්ධනයට හෝ දැනුම වර්ධනයට පරිගණක හා අන්තර්ජාලයට ප්‍රවේශවීමෙන් අද සමාජයේ හට ගෙන ඇති තත්ත්වය කුමක් ද? ඉන් ළමයාට කායික මානසික වශයෙන් ධන හෝ ඍණ බලපෑමක් ඇතිවේදැයි මනෝ විද්‍යාඥයින් මෙන්ම නොයෙකුත් සංවර්ධන හා පර්යේෂණ ආයතන ආශ්‍රයෙන් විමසීම් කර ඇත. අන්තර්ජාලය හා ළමයින් අතර සම්බන්ධතාව අනුව ළමුන් එමගින් හුදකලාවේදැයි යන්න මත භේදයට තුඩුදුන් කරුණකි. අනෙක් අතට ළමයා අන්තර්ජාලයට ඇබ්බැහි වූවෙක්ද යන්න තවත් ප්‍රශ්නයකි. මේ නිසා ඔවුන් කලකිරීමකට පත්වේ ද? සතුටට පත්වේ ද? ඉන් පාසල් කටයුතු සාර්ථක හෝ අසාර්ථකවේ ද ? යනාදි ප්‍රශ්න රාශියක් කෙරෙහි අපගේ අවධානය යොමු කළ යුතු කාලය එළඹ ඇත. මේ පිළිබඳ ධනාත්මක ආකල්පයන් ඉදිරිපත් කරන විද්වතුන් ප්‍රකාශ කරන්නේ පාසල් අධ්‍යාපන ක්‍රමයේ පවතින අඩුලුහුඬුකම් මකාලමින් ළමයා තව දුරටත් අධ්‍යාපන කටයුතු වලට යොමු කරන එමෙන්ම ඔහු දැනුවත්කරන කාර්යභාරයන් අන්තර්ජාලය ඔස්සේ සිදුවන බවයි. තවද මෙම දැඩි සම්බන්ධතාව නිසා ළමයාගේ සෞඛ්‍ය වර්ධනයට, පෝෂණ වර්ධනයට යම් අහිතකර බලපෑමක් ඇතිවේය යන මතයේ එල්බගෙන සිටින පිරිසක්ද නැත්තේ නොවේ. මේ නිසා මෙවැනි බලපෑම් කෙරෙහි ඇති ස්වභාවය වටහා ගැනීමට පර්යේෂණ මට්ටමෙන් විවිධ ආයතන උත්සාහ දරා ඇති බව කිව යුතුය. විශේෂයෙන් ජාතික විද්‍යාත්මක පදනම මගින් කරන ලද පර්යේෂණයන් එයට උදාහරණයක් වශයෙන් දැක්විය හැකිය.

2000 වර්ෂය අග භාගයේදී ඇමරිකාවේ ජාතික විද්‍යාත්මක පදනම විසින් පවුල් 90 ක් ආශ්‍රයෙන් වසර 1 1/2 ක පර්යේෂණයක් දියත් කර ඇත. මෙය Home Net Too නමින් හඳුන්වා ඇත. මේ සඳහා ඇමරිකා එක්සත් ජනපදයේ බටහිර ප්‍රදේශයේ ජීවත් වූ නාගරික ප්‍රජාව තෝරා ගෙන ඇති අතර එහි අඩු ආදායම් ලබන පවුල් වලින් වැඩිහිමියන් 117 දෙනෙක්ද, ළමුන් 140 ක් ද නියැදියට තෝරා ගෙන ඇත. වැඩිහිමි පිරිස අතර කළු ජාතිකයින් 67% ක් ද, කාන්තාවන් 80% ක් ද, අවිවාහකවූවන් 42%ක් ද, තෝරා ගෙන ඇති අතර

ළමුන්ගෙන් වැඩි දෙනෙක් එනම් 83% පිරිමි ළමුන් වූ අතර 75% ක් දෙමාපියන්ගෙන් එක් අයෙකු පමණක් සිටින පවුල් වලට අයත් වෙති. නියැදියට හසුවූ ළමුන්ගේ වයස අවුරුදු 13 ක් පමණ විය. මෙම පර්යේෂණයේ මූලික අරමුණ වූයේ සමාජීය, මනෝමය හා අධ්‍යාපනික කටයුතු කෙරෙහි අන්තර්ජාලය බලපාන ආකාරය ගැන සෙවීමයි.

අන්තර්ජාලය හා සම්බන්ධතා පරීක්ෂා කිරීමේදී ළමුන් ඒ සඳහා ගත කරන කාලය හා වාර ගණන ඉතාමත් වැදගත් වේ. මෙය රඳා පවතින්නේ ළමයා තෝරා ගන්නා තොරතුරු අනුව, සෙවීමට යන කාලය, තෝරා ගන්නා තොරතුරු වාර්තා කර ගැනීමට යන කාලය අනුවය. ( වාර්තා කරන්නේ තමාද එසේත් නැත්නම් ස්වයංක්‍රිය ලෙස මුද්‍රණයෙන්ද) තොරතුරට ළමයා දක්වන උනන්දුව, ළමයාගේ වයස, ළමයා සමග සිටින අනෙකුත් පිරිස් ( මිත්‍රයන් සමගද, පවුලේ අය සමගද, හුදෙකලාවද) යන කරුණු ඉතාමත් වැදගත් වන අතර ඔවුන්ගේ ආර්ථිකයද මේ සඳහා යම් බලපෑමක් ඇති කරයි. ලංකාවේ නම් ඉන්ටනෙට් ( Internet ) භාවිතය සඳහා වැය වන මුදල ද දුරකථන හා සම්බන්ධ වීම නිසා වැය වන ගාස්තුව ද අධිකවන නිසා ඒවා භාවිතා කරන අවස්ථා සීමා කිරීමට සිදු වී ඇත. එහෙත් වර්තමානයේ හඳුන්වා දී ඇති පැකේජය ( Package System ) නිසා විශේෂයෙන් ඉන්ටනෙට් කැෆේ (Internet Cafe) සයිබර් කැෆේ ( Syber Cafe ) ආදි අන්තර්ජාල පරිහරණය කිරීම සඳහා පවත්වා ගෙන යනු ලබන විවිධ ක්‍රම උපයෝගී කර ගනිමින් ඒ සඳහා වැඩි වශයෙන් සම්බන්ධවනු ලබන්නේ පාසල් දරුවන්ය. එහෙත් තවමත් අධ්‍යාපන විද්‍යාඥයින්ගේ හා දේශපාලන විද්‍යාඥයින්ගේ මතය වී ඇත්තේ පරිගණක භාවිතය තව දුරටත් වර්ධනය විය යුතු බවය. දියුණු බටහිර රටවල් සහ නවීන කාර්මික රටවල් ආශ්‍රිත ළමුන් අන්තර්ජාලය හා සම්බන්ධයෙන් අධික කාලයක් ගත කරන බව සාමාන්‍ය මතයයි. Home Net Too යන පර්යේෂණයට අනුව ළමයින් අන්තර්ජාලය භාවිත කිරීම සඳහා යෙදෙන කාලය දිනකට විනාඩි 30 ක් පමණ වේ. එම විනාඩි 30 පමණ කාලය තුළ වෙබ් අඩවිය හරහා අංශ 10කට පමණ විසිරෙන බව සොයා ගෙන ඇත. ඔවුන් සතියකට යවා ඇති ඊමේල් ( e- mail) ප්‍රමාණය එකකි. වෙනත් විනැයුම් හුවමාරු සිදු වී නැත. මෙම ළමුන්ගෙන් 16%ක් පමණක් ඊමේල් යවා ඇත. කතා බස් ( Chat ) සඳහා අන්තර්ජාලය උපයෝගී කර ගෙන ඇත. මෙම පරීක්ෂණයෙන් හෙළි දැක්වූයේ ළමුන් ඉතා සුළු කාලයක් අන්තර්ජාලය භාවිත කළ බවය. එයට හේතුව වශයෙන් මෙම පරීක්ෂණයෙන් පෙන්නුම් කර ඇත්තේ





පර්යේෂණය සඳහා යොදා ගත් ළමුන් හා ඔවුන්ගේ පවුල් ආර්ථික අතින් එතරම් ශක්තිමත් නොවීමය.

ළමුන්ගේ අන්තර්ජාල භාවිතය පිළිබඳ ධනාත්මක ප්‍රතිචාරයන් හා ආකල්ප ඇගයීමේදී අන්තර්ජාලය භාවිත කරන ළමුන් ඒ සඳහා ගත කරන කාලය සැලකිල්ලට භාජනය කිරීමේදී ඔවුන් අනෙකුත් කටයුතු ඉටු කිරීම සඳහා ගත වන කාලයත් ඒවා සඳහා ඇති කරගන්නා වූ යම් යම් සීමාකම් නිසාත් වෙනත් සමාජ කටයුත්තකට හෝ එසේත් නැත්නම් ක්‍රීඩාවකට හා වෙනත් විනෝදාංශ වලට යොමු නොවන බවත් එයින් වෙනත් අහිතකර ප්‍රතිඵලයන් ඇති විය හැකි බවත් ඇතැම් පරීක්ෂකයින්ගේ මතය වී ඇත. ඇත්ත වශයෙන්ම ඔවුන් මෙසේ ගත කරන කාලය තමන්ගේ දුරබැහැර සිටින මිතුරු මිතුරියන් සමග සංවාද කථාබහ වලට යොමු වුවද ඒවායේදී අධ්‍යාපනය පිළිබඳව වෙබ් අඩවිවල කරුණු පිළිබඳව සිදුවන කතාබස් ද නැත්තේ නොවේ. ඇතැම් විට ඔවුන්ගේම කාලය අන්තර්ජාලයේ ක්‍රීඩාවන් සඳහා යොදවන බැවින් එය කාලය විනාශ කිරීමක් හැටියට සැලකිය නොහැකි බව බේකර් විසින් පෙන්වා දී ඇත. මෙහිදී ප්‍රධාන වශයෙන් අවධානය යොමු විය යුත්තේ ළමයා අන්තර්ජාලය භාවිත කරන්නේ කා සම- ද? කුමන කටයුත්තක් සඳහා ද යන්න පිළිබඳවයි.

## ළමයා හා අන්තර්ජාලය අතර සම්බන්ධතාව




අන්තර්ජාලය ඔස්සේ ගොඩනගා ගන්නා වූ නව සම්බන්ධතාවන් මත ඒවායින් සිදුවන බලපෑම්ද විස්තර කළ හැකි වේ. ඒ ඒ අවස්ථාවන්ට අනුකූලව ද, පුද්ගල සාධක අනුව ද මෙම බලපෑම්හි වෙනස්කම් ඇති විය හැක. නිරන්තරයෙන්

පුද්ගලයෙකු අන්තර්ජාලය භාවිත කිරීමේදී ඔහුගේ මනස බොහෝ විට එයට ඇදී යා හැකි අතර එයින් පරිබාහිර වීමට හැකියාව අවම වේ. ඒ නිසා සාමාජීය ජීවිතයෙන් යම් පුද්ගලයෙකු හුදකලා විය හැක. විශේෂයෙන්ම මනෝ විද්‍යාත්මකව බලන කළ එවැන්නක් ඇති නොවිය හැකි බව පවසන්නෝ අන්තර්ජාලය භාවිතය හා ඍජු භාවිතයක් නැති අය බව විද්‍යාඥයෝ පෙන්වා දෙති.( Sheield & Behrman) අන්තර්ජාල භාවිතයට සම්බන්ධ වන මුල් තුන්මස තුළ එවැනි තද බලපෑමක් නැති විය හැකි නමුත් කල්යාමෙන් ඒවාට ඇබ්බැහි වීම නිසා මානසික පරිහානිය, හුදෙකලාවීම ආදි ගති ලක්ෂණ පුද්ගලයා තුළින් ඉස්මතු වීමෙන් අනෙකුත් සමාජ සම්බන්ධතා දෙදරා ගොස් පවුල් ව්‍යුහය තුළ හා අනෙකුත් සමාජ කණ්ඩායම් වලින් පුද්ගලයා හුදෙකලා වීමට ඇති හැකියාව බහුලය. මෙයින් පුද්ගලයා ඉච්ඡා භංගත්වයට පත් වී සමාජ හා මානසික පරිහානියට ඇද වැටේ. Home Net Too පර්යේෂණයට අනුව ළමුන් කියවීම සඳහා ලබා ගත් ලකුණු ප්‍රමාණය අධික වුවත් ගණිතමය ගැටලු විසඳීම සඳහා ලබා ගත් ලකුණු අවම වූ බව පෙන්වා දේ. අන්තර්ජාලයේ වෙබ් අඩවි කියවීමට ළමයා හුරුපුරුදුව ඇතත් බුද්ධිය මෙහෙයවා තිරණ ගැනීමට ඇති ශක්තිය හීන වීම නිසා ගණිතමය ගැටලු විසඳීමට ඔවුන්ට නොහැකි වූ බව මෙයින් වටහා දෙයි.

අන්තර්ජාලය භාවිත කරන්නේ ළමුන් පමණක් නොවේ. වැඩිහිමියන් අතර ද මෙය ජනප්‍රිය මාධ්‍යයක් වී ඇත. විනැයුම් මාධ්‍යයක් වශයෙන් මෙය අද බොහෝ දෙනා භාවිතයට ගනී. ලෝකයේ සෑම දියුණු රටකම පාහේ බොහෝ නිවෙස් වල පරිගණක භාවිතයට හුරුපුරුදුව සිමියි. මෙය මිනැම සමාජයක විවිධ සමාජ මට්ටම් හොබවන විවිධ වෘත්තීන් හි නියැලෙන විවිධ සමූහයන් තුළ සහ විවිධ පෞරුෂ වලින් යුක්ත පුද්ගලයන් අතර භාවිත වෙමින් පවත්නා අතර ඒ ඒ අවස්ථාවන්ට හා අරමුණු වලට අනුව ඔවුන්ගේ ආකල්පමය හා චර්යාත්මක වෙනස්කම් ද එයින් ඇති වන සමාජ බලපෑම් ද යම්තාක් දුරට වෙනස් විය හැකිය. මේ ආකාරයට පුද්ගලයන්ට හා සමාජ පරිසරයට වන බලපෑම් අධ්‍යයනය කිරීමේ දී පහත සඳහන් කරුණු පිළිබඳව අවධානය යොමු කළ යුතුව ඇත.

2001 දී Honkong ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද පර්යේෂණයක ට අනුව නියැදියට හසු කළ පවුල් 1007කින් 69% ක් ම ස්වකීය නිවෙස්වල පෞද්ගලික පරිගණකයක් පරිහරණය කළ අතර එයින් 52% ක් අන්තර්ජාලය හා සම්බන්ධ වී ඇත. 21% ක් Board + Ban - Homes නම් අන්තර්ජාලයට සම්බන්ධවී ඇත. මෙම සම්බන්ධතා නිසා





සමාජයේ පවතින අනෙකුත් විනැයුම් මාධ්‍යයන් අතර සම්බන්ධතාවය අවම වේ. නිදසුනක් ලෙස ඉහත පරීක්ෂණයෙන් හෙළිදරව් වී ඇති ආකාරයට සතියකට විනාඩි 629 ක් ( පැය 10 -14 ක් ) අන්තර්ජාලයට සම්බන්ධවන අතර 350 ක් නිවසේ දී විනාඩි 262 ක් (පවුලේ පාසලේ හෝ රැකියා ස්ථානයේ දී විනාඩි 17 ක් වෙනත් ස්ථානයක දී ) රූපවාහිනිය නැරඹීම සඳහා සතියකට පැය 14.4 ක්, ගුවන්විදුලිය සඳහා පැය 7.5 ක් ද, පුවත් පත් කියවීම සඳහා පැය 6.2 ද, ශාරීරික අභ්‍යාස සඳහා 2.6 ක් ද, පවුලේ සමාජ සම්බන්ධතා කටයුතු සඳහා පැය 8.2 ක් ද, යොදවා ඇත. මෙම පර්යේෂණයට අනුව අධ්‍යාපනය හදාරන්නන්, විශ්‍රාමික හා රැකියා වියුක්ති පුද්ගලයින් වැඩි වශයෙන් අන්තර්ජාලය භාවිත කරන බව හෙළිදරව් වී ඇත. තම රැකියාවේ වැඩ කටයුතු පවුලේ කටයුතු හා වෙනත් සාමාජික කටයුතු නිසා රැකියා නියුක්තිකයින්ට අමතර කටයුතු වලට යෙදීමට කාල වේලාව නොමැති බව පැහැදිලි කරුණකි. වෘත්තියමය වශයෙන් සුදු කරපම් සේවයේ යෙදෙන්නන්ට වඩා වෘත්තියමය කළමනාකරුවන් බොහෝ විට අන්තර්ජාලය ඔස්සේ විවිධ තොරතුරු ඒකාරාශි කරන බැවින් ඒ සඳහා ඔවුන් යොදවන කාලය අධික විය හැකිය.

සමාජයේ අනෙකුත් කටයුතු අතර මෙන්ම ලිංගිකත්වය අන්තර්ජාල භාවිතයට බලපාන සාධකයක් විය හැක. රැකියාවල යෙදෙන්නන් හෝ බහුතයක් පිරිමින්ය. ඒනිසාම පරිගණක භාවිතයේ යෙදෙන්නන් පිරිමින් බව තර්කානුකූල මතයක් නොවේ. මන්ද අද සමාජයේ පරිගණක ආශ්‍රයේ රැකියාවල යෙදෙන්නන් වැඩි දෙනෙකු කාන්තාවන් නිසා කාන්තාවන් අද බහුල වශයෙන් පරිගණක භාවිතයට යොමු වී ඇත. එසේම ගෘහාශ්‍රිත පරිගණකයන් භාවිත කිරීමට යොමුවන වැඩිපුරම කාන්තාවෝ ඒ සඳහා වැඩි පුර කලක් ගත කරති. විශේෂයෙන් අර්ධ කාලීන රැකියාවල නියුක්ත කාන්තාවන් ද රැකියා විරහිත හෝ රැකියා නොකරන විශ්‍රාමික කාන්තාවන් ප්‍රමාණයෙන් අධික නිසා මෙවැනි අයට තම නිවෙස් වල පරිගණක හා අන්තර්ජාලය ඇසුරින් විවිධ සම්බන්ධතා ගොඩනැගීමට හැකියාව ඇත. ඒ ඒ පුද්ගලයින් ගත කරන දින චරියාවට ද බෙහෙවින් බලපාන සාධයක් වන අන්තර්ජාලය එම ජීවන රටාව වෙනස් කිරීමට ද අනෙක් අතට ඉවහල් විය හැක.

මිනිස් චර්යාව සකස් වීමෙහිලා පරිසරය බෙහෙවින් බලපායි. යහපත් සංස්කෘතික පරිසරයක් තුළ ජීවත්වන්නන්ගේ ක්‍රියාවන් ද යහපත් වෙයි. මේ තත්වයන් න-ාලීමට හෝ බිඳ දැමීමට පරිසරයේ සිදුවන වෙනස් කම් ද එසේම ඉවහල්වනු ඇත. සමාජය වෙනස් කරන කාරකයන් වශයෙන් තාක්ෂණය,

නාගරිකත්වය හා නවීකරණය ප්‍රධාන සාධක වන බව අපි දනිමු. තාක්ෂණය තුළින් අද ලෝකය කුඩා ඒකකයක් බවට පත් කර ඇත. තාක්ෂණයේ බල මහිමයෙන් ක්ෂණිකව ලොවේ සිද්ධි දැන ගැනීමට එයට ප්‍රතිචාර දැක්වීමට අපට හැකියාවක් ඇත. මෙම ක්‍රියාකාරිත්වය වඩාත් පහසු වී ඇත්තේ පරිගණකය හා බැඳුනු සංකීර්ණ තාක්ෂණික උපක්‍රම සහ පහසුකම්ය. එනිසා ලෝකය “ ගම්මානයක් ” වී ඇත. ගමේ ඇති සමීප බව ලොව විසුරුනු ජනතාවට ලබා දීමට හැකි වී තිබේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් එහි විවිධ සමාජ වෙනස්කම් මතු වී සංස්කෘතික පෙරළියකට තුඩු දී ඇත. සමාජ සංස්කෘතික පරිසරය හා තාක්ෂණය එක හා සමාන තත්ත්වයකට පත් වන්නේත් සමාජ ගැටුම් ඇති වන්නේත් නැත.

මිනිසුන් නෛතික වශයෙන් ඒකීය රාමුවකට ගෙන එමට තාක්ෂණයකට හැකි වුවත් මිනිස් හදවත තුළ විශ්ව ගම්මානයක් ගොඩ නැ‍ගීමට තවමත් අපොහොසත් වී ඇත. මෙයට හේතුව සංස්කෘතික හා තාක්ෂණය අතර ඇති දුරස්ථභාවයයි. එසේත් නැතිනම් එහි නොගැළපීමයි. මෙවැනි වාතාවරණයක් ඇති වීමට බොහෝ විට අන්තර්ජාලය හා බැඳුණු වම්නාකම් හා ක්‍රියාකලාපයන් ඉවහල් විය හැක.

අන්තර්ජාලය හා සම්බන්ධවීමෙන් ගොඩනගා ගන්නා මිත්‍ර සම්බන්ධතා අගය කරන පිරිසක් ද සිටියි. කායික වශයෙන් ඔවුනොවුන් අතර සම්බන්ධතාවක් නොමැති වුවද කතා බස් කිරීමට ඇති හැකියාව නිසා ඇතැම් විට අන්තර්ජාලය තුළින් දැකිය හැකි රූප දර්ශනයන් නිසා මානසික ලෙස සමීපවීමේ හැකියාව අවම වී නැති බව මේ අයගේ මතයයි. ඇමරිකාවේ මේ පිළිබඳ කරන ලද සමීක්ෂණයක දී ග්‍රාහකයින් 40% ක් තවමත් අන්තර්ජාලය හරහා මිතුරන් සමග සම්බන්ධතා පැවැත්වීමට සාමාන්‍ය ජීවිතයේ මිතුරන්ට වඩා වැඩි කාලයක් ගත කරන බවත් 22% ක් අන්තර්ජාලයේ මිතුරන්ට වඩා තමාගේ සාමාන්‍ය ජීවිතයේ මිතුරන් සම-වැඩි ඇසුරක් පවතින බවත් ප්‍රකාශ කර ඇත. මෙම සමීක්ෂණයේ දී අනාවරණය වූ තවත් කරුණක් වන්නේ කාන්තාවන්ට වඩා පිරිමින් On Line මිතුරන් සම-සම්බන්ධතා පැවැත්වීමට වඩාත් ප්‍රියකරන බවයි. මෙයට වඩාත් හේතු වී ඇති කරුණු සලකා බැලීමේදී පෙනීයන කරුණක් වන්නේ අන්තර්ජාලය හරහා මිත්‍රත්වය පවත්වා ගෙන යාමේ ඇති පහසුවයි. ඒ සඳහා වැය වන මුදල් ප්‍රමාණය අඩු වීම ( නෑදෑ මිතුරන් බැලීමට යාම සඳහා විශාල වශයෙන් මුදල් වැය වීම ) තමාගේ නිදහස් වේලාවල දී පරිගණකය ඉදිරිපිට සිට දුර බැහැර මිත්‍රත්ව සම්බන්ධතා





පැවැත්වීමට හැකි වීම. එනිසා කාලය ඉතිරිකර ගැනීමට හැකිවීම ඉන් ප්‍රධාන හේතුන් බවයි.

දෙවන කරුණ වන්නේ අන්තර්ජාලයේ දී තමාට අවශ්‍ය මිතුරන් පමණක් තෝරා ගැනීමට ඇති හැකියාව නිසා තම සිතැගි වලට ගැළපෙන අය අතර පමණක් සුහදතාව පවත්වා ගෙනයාමට හැකිවීමය. මේ නිසා අන්තර්ජාලය සමාජ ජීවිතය වර්ධනය කිරීමට සුදුසු මාර්ගයක් ලෙස මේ අය සලකති.

තුන්වන කරුණ වන්නේ අන්තර්ජාලය හා කතා බස් කිරීමට ඇති ප්‍රවේශයන් විශාල වශයෙන් පවතින නිසාය. ( නිදසුනක් ලෙස American on line Virtual places, Yhoo & MSN ) ආදිය මගින් සාර්ථක පණිවුඩ Instant messages,& e-mail-) පෞද්ගලික පණිවුඩ Personal Messages මෙම සම්බන්ධතාවන් පෞරුෂත්වයේ යම් යම් දුර්වලතා පවතින අයට ද ඉතා වැදගත් වේ. යමෙකුට පුද්ගලයින් ඉදිරියේ කතා බස් කිරීමට ලැජ්ජාශීලී බව, භය, තිගැස්ම, අත පය සැලෙන්නට ගැනීම වෙනත් කායික ආබාධයන් ( ගොළුකම, බිහිරිකම, ඇවිදීමට නොහැකිකම ) ඇති අයට මේ මගින් මිත්‍ර සම්බන්ධතා ගොඩ නැගීමට ආධාර වන බව පෙනී යයි. ඉතාමත් ඉක්මනින් තමාගේ අනන්‍යතාවය ආරක්ෂා කර ගනිමින් හැ‍ඟිම්බර සම්බන්ධතා පවත්වා ගෙන යාමට ලැබෙන සහාය සුළු පටු නොවිය හැක. තවද මෙවැනි සම්බන්ධතා හුදෙක් මිත්‍රත්වය ගොඩ නැ‍ගීමට පමණක් නිසා විවාහ සම්බන්ධතා තහවුරු කිරීමට ඉවහල් වී ඇත. තමන්ගේ සහකරුවා හෝ සහකාරිය තෝරා ගැනීම සඳහා අවශ්‍ය ඉඩකඩ ( තමා ජීවත් වන පරිසරය තුළින් හෝ වෙනත් විදේශ රටකින් හෝ) සැලසී ඇතත් මංගල සේවාවන් සඳහා සංවිධානය වූ ඇතැම් සේවාවන්ගේ (Match Making Services ) සහායද අන්තර්ජාලය හරහා ලබා ගැනීමට හැකි වී තිබේ. විවාහ සම්බන්ධතා ගොඩ නැගීමට පමණක් නොව විවාහ සංස්ථාව තුළ පවතින ප්‍රශ්න දික්කසාද ආදී ගැටලු විසඳීමටද, අන්තර්ජාලය අද වැදගත් වී ඇත. සෞඛ්‍ය ගැටලු සාකච්ඡා කිරීමට උපදෙස් ගැනීමට හා ඖෂධ ආදිය ලබා ගැනීමට අවශ්‍ය තොරතුරු අන්තර්ජාලය තුළින් ලබා ගැනීමට හැකිවීම නිසා දියුණු රටවල ජනතාව අන්තර්ජාලයට ප්‍රවේශ වීමට ඇති ඉඩකඩ හෝ ඒවාට දැඩි ලෙස ඇබ්බැහිවීම දිනෙන් දින වර්ධනය වී ඇත. අන්තර්ජාලය හරහා දෝලනය වන තොරතුරු පවුල් ජීවිතය ශක්තිමත් කරන අඩිතාලමක් ලෙස සලකන අය ප්‍රකාශ කරන්නේ එය බාල මහලු අපට පමණක් නොව තරුණ පරපුරටත් ගැටලු සඳහා මඟ පෙන්වන මාධ්‍යයක් බවය. විශේෂයෙන් තරුණ පරපුරක් මානසික අවශ්‍යතා හා ලිංගික අවශ්‍යතා පමණක් නොව ආර්ථිකමය

අවශ්‍යතා සඳහාද මහෝපකාරී වන රැකියා වෙළඳපළ පිළිබඳ විස්තරය අන්තර්ජාලය හරහා ලබා ගැනීමට හැකි වීම විශාල භාග්‍යයක් කොට සළකති. මේ නිසා දේශීය වශයෙන් හෝ ජාත්‍යන්තර වශයෙන් විවිධ රැකියා වලට ප්‍රවේශවීමත් ඒ ඒ රැකියා තොරතුරු ලබා ගැනීමටත් හැකි වී ඇත. අද වාණිජ ලෝකයේ රජයන අන්තර්ජාලය ව්‍යාපාරික කටයුතු සංවිධානාත්මක කාර්යක්ෂම හා ලාභදායී ලෙස පවත්වා ගෙන යාමට බහු ජාතික සමාගම් වලට හා අනෙකුත් අවශේෂ වෙළඳ ව්‍යවසායයන් වලට හැකි වී ඇත. එමගින් තම වෙළඳ භාණ්ඩ පිළිබඳ තොරතුරු පමණක් නොව ඒවා අලෙවි කර ගැනීමටද අණවුම් කිරීමට ද හැකියාවක් ඇත. එසේම වාහන, ඉඩකඩම්, දේපළ හෝ වෙනත් භාණ්ඩ ද අලෙවිය වෙන්දේසි කර ගැනීම අද බොහෝදුරට අන්තර්ජාලය හරහා සිදු වේ.

## අන්තර්ජාලය හා සම්බන්ධ ක්‍රියාදාමය

1) ගත වන කාලය ඉඩකඩ ආර්ථිකය
2) අන්තර්ජාලය සීමා කිරීමට ගන්නා වූ උත්සාහයන් අසාර්ථක වීම.
3) අන්තර්ජාලය භාවිතයේදී වැඩි කාලයක් ගත කිරීම ( bying internet books ect)
4) සමාජ වෘත්තීයමය හා අනෙකුත් විනෝදාංශයන්ගෙන් ඉවත් වීම.
5) භෞතික, සමාජීය, මනෝ විද්‍යාත්මක වාණිජමය ගැටලු, නින්ද අඩුවීම, විවාහක ගැටලු අනෙකුත් කටයුතු වලට ප්‍රමාද වීම, රාජකාරී කටයුතු අතපසු වීම, හුදකලා වීම.

මිනිසුන් අන්තර්ජාලය හා සම්බන්ධ වීම වැඩි වශයෙන් නිරත වන්නේ කුමන කටයුතු වලද ඒ අය කවරෙක්ද යනාදි කරුණු පිළිබඳ පරීක්ෂණ පැවැත්වූ ප්‍රසිද්ධ මනෝවිද්‍යාඥ Kimball S Young අන්තර්ජාලය හා දැඩි සම්බන්ධතා පවත්වන පුද්ගලයින් 496 ආශ්‍රයෙන් කරන ලද පර්යේෂණයේ දී පෙන්වා දෙන ආකාරයට මේ සඳහා වැඩි වශයෙන් ඇබ්බැහි වී ඇති අය යම් කිසි ව්‍යාධියකට පත්වී ඇති බැව් පෙන්වාදේ. විශේෂයෙන් මේ අය සූදුව ( gambling ) වැනි ක්‍රීඩාවලට ඇබ්බැහි වී ඇති අතර ඒ නිසා ඒ අය මානසික රෝග වලින් පෙළෙන්නන් බව තම චිකිත්සක පර්යේෂණ වලින් සනාථ කොට ඇත. විශේෂයෙන් වයස 29-45 ත් අතර ගැහැණු හා පිරිමි මෙයට ඇබ්බැහි වී ඇති අය අතර විවිධ සමාජ තරාතිරම් වල අය වූවෝ වෙති. ඇමෙරිකාවේ සින්සිනැටි (cincinnati) විශ්වවිද්‍යාලයේ ජීව විද්‍යාත්මක මනෝ චිකිත්සාව පිළිබඳ වැඩසටහනේ (biological psychiatry





programme) සොයා ගැනීම් අන්තර්ජාලයට ඇබ්බැහි වූවන් 72%ක් මානසික අවපීඩනයට ( biopolar disorder) හා ස්නායු ක්‍රියාකාරීත්වයන්ගේ ව්‍යාකූලත්වයකට ( Impulse disorder ) පත්වූවන් බව තහවුරු කර ඇත. Dr. Nathan Spapra මෙම තත්වය විස්තර කරන්නේ ඉන්ටොනෝමේනියා (Internetomanias ) වශයෙනි. අන්තර්ජාලය හරහා පවත්වන සම්බන්ධතා නිසා පවුල් ජීවිතයට අහිතකර තත්ත්වයන් මතු වීමට ඇති ඉඩකඩ බහුලය. ඇතැම් විවාහක පුද්ගලයින් පවා ප්‍රේම සම්බන්ධතා හා ලිංගික සම්බන්ධතාවන් මේ අලුත් මිතුරන් හා ඇති කරගන්නා බව අනාවරණය වී ඇත.

ඇමෙරිකාවේ කරන ලද එක්තරා ගවේෂණයකදී අන්තර්ජාලය හා ඔබ යම් අයෙකු සමග ප්‍රේම සම්බන්ධතා පවත්වන්නේද? යන ප්‍රශ්නයට පිරිමින්ගෙන් 52% ක් හා ගැහැණුන්ගෙන් 42% ක් “ ඔව් ” යන පිළිතුර දී ඇති අතර මෙම පිළිතුර දුන් අයගෙන් 70% ක් විවාහක අය බවද හෙළිදරව් වී ඇත. මෙම වග උත්තරකරුවන් 40% ක් දැඩි මිත්‍ර සම්බන්ධතා පවත්වන්නේ පිරිමි ලිංගිකයින් සමගයි. මෙම පරීක්ෂණයෙන් පෙනී යන්නේ කාන්තාවන්ට වඩා පිරිමින් මේ ආකාරයේ සම්බන්ධතා පවත්වන බවයි. එහි ප්‍රතිශතය වන්නේ පිරිමි 65% කි. කාන්තාවන් 31% කි. මේ අය අන්තර්ජාල සම්බන්ධතාවන් හැරුණු කොට දුරකථන මාර්ගයෙන්ද ලියකියවිලි හා වීඩියෝ මාර්ගයෙන්ද විනෝද ගමන් බිමන් යාමෙන් ද ( Dating ) තම සම්බන්ධතා තව දුරටත් තහවුරු කර ගන්නා අතර අවසානයේ තමාගේ සහකරුවා හෝ සහකාරිය වශයෙන් තෝරා ගෙන විවාහයට පත් වන්නන් නැත්තේ නොවේ. එනිසාම දික්කසාද වූවෝ ද මේ අතර සිමිති. එමෙන්ම නොයෙකුත් ආකාරයේ ලිංගික සම්බන්ධතාවයන් ද මේ නිසා ඇති වේ. සමහරු අසභ්‍ය ලෙස ලිංගික ක්‍රියා අන්තර්ජාලය භාවිතයේදී කැමරා මගින් පවත්වා ගෙන යන බව ද (cybersex ) මේ නිසා ලිංගික මානසික පීඩාවන්ට පත් වූවන්ගේ ගණන ක්‍රමයෙන් අධික වනු ඇත. 1998 දී Cooper විසින් කැලිෆෝනියාවේ අන්තර්ජාල ආශ්‍රිත ලිංගික ක්‍රියා ඇසුරින් ( cybersex ) කරන ලද පර්යේෂණයේදී පුද්ගලයින් 9000 ක් උපයෝගී කර ගෙන ඔවුන්ගේ ලිංගික චර්යාවන් අධ්‍යයනය කරන ලදී.

මින් පිරිමින්ගේ ලිංගික සම්බන්ධතා කාන්තාවන්ට වඩා අධික බව එනම් 5:1 ක් වශයෙන් පෙන්වා දී ඇත. විශේෂයෙන් පිරිමින් අන්තර්ජාලය හා සම්බන්ධතා පවත්වා ගෙන යමේදී දෘශ්‍ය මාධ්‍ය (Visual ) වඩාත් ප්‍රිය කරන බවත් කාන්තාවන් ප්‍රකාශන මාධ්‍ය (Chat room) පිය කරන බවත් මෙයින් පෙන්වා දෙයි. මොවුන්ගේ සමහරක් අය තමාගේ රාජකාරී වේලාවන්හිදී පවා අන්තර්ජාලය හරහා තම

සම්බන්ධතා පවත්වා ගෙන යන බව හෙළිදරව් වී ඇත. අද බොහෝ කාන්තාවන් මෙම ලිංගික සම්බන්ධතා පවත්වා ගෙන යාමට රුචිකත්වයක් දැක්වීමට හේතු වශයෙන් ඉතාමත් රහසිගතව ආරක්ෂිතව හා සමාජ බාධක වලින් තොරව ඒවා පවත්වා ගෙන යාමට ඇති ඉඩකඩ බහුලවීමය. ශාරීරික වශයෙන් පවතින දුර්වලතා මෙවැනි සම්බන්ධතා වලට හරස් නොවන නිසා කාන්තාවන් මෙන්ම පිරිමින් ද මෙවැනි සම්බන්ධතා පැවැත්වීමට පසුබට නොවේ. විශේෂයෙන් තමාගේ වර්ණය, ආබාධිත බව, තට්ටය, වෙනත් අවයව වල ස්වභාවය ආදිය ද අනවශ්‍ය දරු උපත් හට ගැනීම ආදිය ද සිදු නොවන හෙයින් දෘශ්‍ය ක්‍රම උපයෝගී නොකර කතා බස් (Chatroom talk) පමණක් සම්බන්ධතා තහවුරු කර ගැනීමට එමගින් මානසික තෘප්තියක් ලබා ගැනීමටත් ගැහැණු පිරිමි දෙපක්ෂයම එයට ඇබ්බැහි වීමටත් ඉවහල් වන සාධක කිපයකි.

අන්තර්ජාලය හා සම්බන්ධතා චර්යා රටාවන් පරීක්ෂා කර බැලීමේදී පහත සඳහන් ආකාරයේ වෙනස්කම් රැසක් දැක ගත හැකිවේ.

1) නිදා ගැනීමේ රටාවේ ඇති වන වෙනස්කම් ( නින්ද නොයාම, නිදා ගන්නා කාලය අඩු වීම, නිදා ගන්නා වේලාවන් වෙනස්වීම)
2) පෞද්ගලිකත්වයේ අවශ්‍යතාවය අධික වීම ( යම් යම් දේ පවුලේ අයට සැ-වීම, තමන්ගේ ඉන්ටනෙට් අංක (Password) එක වරින්වර වෙනස් කිරීම, හුදෙකලා වීමට උත්සාහ ගැනීම )
3) ගෘහයේ කටයුතු, අධ්‍යාපන, රැකියා කටයුතු ආදිය නොසලකා හැරීම.
4) සත්‍ය ප්‍රකාශ නොකිරීම, එයට මැලි වීම හා බියවීම.
5) පෞරුෂත්වයේ ඇති වන වෙනස්කම්
6) ලිංගික කාර්යයන් සඳහා ඇති උනන්දුව හීන වීම, තම විවාහක පුද්ගලයා සමග ලිංගික සම්බන්ධතා පැවැත්වීමට උනන්දුවක් නොතිබීම.
7) ආයෝජන හා සකසුරුවම හිනවීම හා ආර්ථික පරිහානිය

පිලඩෙල්පියාව ( Philadelphia) ප්‍රෙන්ඩ් නම් වු රෝහලේ (Friend Hospital) ළමා රෝග විශේෂඥයෙකු වු සුසාන් රීස් ( Suzanne Riess ) ප්‍රකාශ කරන පරිදි අන්තර්ජාලය හරහා ඇති වන සම්බන්ධකම් නිසා ළමයාගේ තැතිගැනීම





( Shock) භය සංත්‍රාසය අධික වී ඇති බවත් ස්ත්‍රී දූෂණ හා වෙනත් ලිංගික හිරිහැර ආදිය ඇතැම් විට මරණයද සිදු විය හැකිය. 1998 ඇමරිකාවේ Online භාවිතය පිළිබඳ ළමුන් ඇසුරු කරන ලද පර්යේෂණයකදි ඉන් ළමුන් 800 ක් පමණ පැහැර ගෙන ගොස් ඇති බව අනාවරණය වේ. ළමුන් පමණක් නොව වැඩිහිටි අය කාන්තාවන්, ව්‍යාපාරිකයින්, දේශපාලඥයින් හෝ වෙනත් කටයුතු වල යෙදී සිටින්නන්ද මෙවැනි පැහැර ගැනීම් හෝ තර්ජන වලට ලක්ව ඇත.

තත්ත්වය මෙසේ නම් මින් ප්‍රජාව වළකා ගැනීම සඳහා කළ යුතු මාර්ග පිළිබඳ සැලකිලිමත් වීම ඉතා වැදගත්වේ. ඒ සඳහා ජනතාව දැනුවත් කිරීමද යෝග්‍යවන්නකි. පරිගණක හා තොරතුරු තමන්ගේ පොදු යහපත සඳහා යොදා ගැනීමේ අවශ්‍යතාව හා ක්‍රමවේදයන් ඔවුන්ට වටහා දිය යුතුය. විශේෂයෙන්ම මේ අනතුරෙන් ළමුන් මුදවා ගැනීම සඳහා අනුගමනය කළ යුතු උපායමාර්ග කිහිපයක් මෙසේ හඳුන්වාදිය හැකිය.

(1) පරිගණකය හා අන්තර්ජාලය ඵලදායි ලෙස භාවිත කිරීමට අවශ්‍ය කායික මානසික තත්වයන් වර්ධනය කිරීම.
(2) පරිගණකය ඉතාමත් පොදු ස්ථානයක තැබීම.
(3) තමන්ගේ දරුවන් පරිගණකය හා සම්බන්ධවන දේ සම්බන්ධව නිරීක්ෂණය කිරීම.
(4) ළමයින්ට ප්‍රවේශ විය නොහැකි ඇතැම් ජාලයන් නවතා තැබීම.
(5) අන්තර්ජාල භාවිතයේ දි තමන්ගේ සත්‍ය තොරතුරු යෙදීම.( නම, ලිපිනය, පාසල, රැකියාව, වයස)
(6) ළමයින්ට පුද්ගලික ස්ථානවලට වැටි කිරීමට යාමට ඉඩ නොදීම.
(7) තමාට පරිභාහිරව ලැබෙන ඊ-මේල් ආදිය ප්‍රතික්ෂේප කිරීමට හෝ ඒවාට ප්‍රතිචාර නොදැක් වීම.
(8) ළමුන් පරිගණක හා අන්තර්ජාල භාවිත සඳහා ගත කරන කාලය පිළිබඳ අවධානයෙන් සිටීම.
(9) ළමයාගේ බාහිර ඇඳුම් පැළඳුම් කතා විලාශය හා සමූහ ගතවන ආකාරය, නින්ද හා වෙනත් හැසිරීම් පිළිබඳව ද අවධානයෙන් සිටීම.

අන්තර්ජාල භාවිතය තුළින් වඩාත් සෘණ ප්‍රතිඵල ලැබෙන්නේ ඇයි ද? යන්න වර්තමානය තුළ විමර්ශනයට භාජනය වී ඇති ප්‍රශ්නයකි. විශේෂයෙන් මිනැම මාධ්‍ය ජාලයක් යමෙකු ග්‍රහණය කර ගැනීමට, යම් ආකාරයකින් ප්‍රකාශ

කිරීමට යාම මෙයට ප්‍රධාන හේතුව විය හැක. එසේම ඒ හා සම්බන්ධිත පුද්ගලයින් පිළිබඳ දක්වන ප්‍රතිරූපයන් ද සමාජයේ ඇතැම් කොටස් මෙවැනි තත්ත්වයකට ඇබ්බැහිවීමට පෙළඹෙන සාධකයකි. අහිතකර තත්ත්වයන්ට ආකර්ෂණය වන බලවේග අධික විය හැකිය. ඒවා ව්‍යාපාර වශයෙන් පවත්වාගෙන යාමට දරන උත්සාහයන් ද තවත් හේතුවකි. මේ නිසා අභිප්‍රේරණ ඒ සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබාදෙන හෝ වැඩ සටහන් නිෂ්පාදන කරන එමෙන්ම ඒවා ප්‍රචාරණය කරන ආයතන ද අද බහුලව තිබීමට හේතුවක් වී ඇත. ඒ නිසා මෙවැනි භයානක තත්ත්වයකට සමාජය පත් නොකර නව තාක්ෂණය තුළින් පුද්ගලයා සමාජයේ යහපත් තත්ත්වයක් කරා වර්ධනය කිරීමට අවශ්‍ය ලෙස තොරතුරු තාක්ෂණය පොදු වන්නේ නම් යහපත් සමාජයක් ගොඩ නැගීමට ඉවහල් වන පරිසරයක් ඉන් ඇති කරලීමට හැකි වනු ඇත.

## මූලාශ්‍ර


1. *Amer, P., 1996 Feb., " Computer aspects of technological change, automation & economic progress " , The Outlook for Technological change & Employment Appendix., Vol. 1., Report of the National Commision on Technological, Automation & Economic Progress, Government Printing Office, Washington. D.C.;*

2. *Becker, H. J., 2000, Who's wired & Who's not? Children's Access to and use of Computer Technology, Children and Computer Technology, The Future of Children, Vol. 10 (2), Fall/Winter, PP. 44 -75;*

3. *Caron, A.H., L., Grioux, & S., Douzou, 1985, The presence of micro - computers in the homes, Users & impacts, Paper presented at The Annual Meeting of the International Communication Association, Honolulu.;*

4. *Census & Statistics Department ( 2001) Population by Age Group & Sex, Retrieved June 15, 2001, from the world wide web;*

5. *Cooper, A1 (1998) , MSNBC Website;*

6. *Dutton, W. H, E.M., Roger, & S.H., June, 1987, Diffusion and Social impacts of personal Computers, Communication Research, 14, PP. 219 -250;*




ජනමාධ්‍යවේදය


7. *Jackson, L., A., A., Von Eye, F., Biocca, G., Barbatiss, V., Zhao, & H.E., Fitzgerald, 2003, Children and Internet use, Findings from HomeNetToo project Presentation at the NSF Sponsered workshop on the " Domestic impact of imformation and Communication technology s" East Park, Co. June 5-8;*

8. *Kraut, R., W., Scaherlis, T., Mukhopadhpyay, J., Manning, & S., Kiesler, 1996, The HomeNet field trialof residential Internet service, Communications of the Association for Computing Machinery, 39, PP. 55-65;*

9. *NSF Report 2001;*

10. *Quittner, J., 1997, " Rise of the Divorce Cases Involving Cyberaffairs ", Time Magazine, April 14, P. 72;*

11. *Rogers, E.M., 1995, Diffusion of innovations ( 4th ed.), New York,. Free Press;*

12. *Young, K., 1998, Caught in the Net, PP. 124 -127;*

2) පරිසර දූෂණය
3) ලෝක ජනගහන වර්ධනය
4) වසංගත රෝග
5) බලශක්ති අර්බුදය
6) කාර්මීකරණයත් සම- ඇති වූ මානසික අවපීඩනය
7) අසමාන ආර්ථික වර්ධනය
8) ලෝක ආහාර ප්‍රශ්නය, යනාදී වශයෙනි.[2]

මෙලෙස 60 දශකයේදී මානව සංහතියේ ඉතිහාසයේ ප්‍රථම වරට කාර්මික නිෂ්පාදනයේ සිදු වූ ශීඝ්‍ර වර්ධනය නිසා ස්වභාවික පරිසරයේ සමතෝලන ශක්‍යතාවයට ප්‍රබල තර්ජනයක් එල්ල වූ බවට මතවාදී නිගමනයකට පැමිණීමට " රෝම සමාජය " ට සිදු විය. මෙය යථාර්ථවාදීව සිදු වූ ගෝලීය ලෝක ක්‍රියාවලියට බටහිර දැක්වූ දෘෂ්මිවාදීමය ප්‍රතිචාරයකි.

මෙහිදී ද ගෝලීයකරණයේ යථා ස්වරූපය විග්‍රහ නොවිණ. එමගින් සිදු වූයේ හුදෙක් බටහිර මතවාදය තවදුරටත් ශක්තිමත් ලෙස ස්ථාපිත කිරීම පමණකි.

1980 දශකයේ මැද භාගයේදී ලෝක දේශපාලන සිතියමේ සිදු වූ වෙනස්කම් හා 1990 දශකය ආරම්භයේදී සෝවියට් සංගමයේ බිඳවැටීම, ලෝකය ගෝලීයකරණය පෙරදිග සංකල්පය පරාජයට පත්විය. 1946 සිට 1986 කාලය තුළ සිදු වූ සිසිල් (නිරවි) යුද්ධයෙන් බටහිර ජයග්‍රහණය අත්පත් කර ගැනීමත් සම- ම මානව සංහතියේ අනාගත පරිණාමය පිළිබඳ ගැටලුවේ අන්තර් විකල්පීය දෝලනය බොහෝ කලකට නිරාකරණය විය.

ගෝලීය සමාජය හා බටහිරවාදය වර්ධනය වීමට කොමියුනිස්ට්වාදය ඉටුකළ කාර්යභාරය අතිවිශාලය. නමුත් ගෝලීය සමාජය නිර්මාණය වීමට කොමියුනිස්ට්වාදයේ සුවිශාල දායකත්වය බටහිර ප්‍රතික්ෂේප කරයි. මෙයද ගෝලීය සමාජයේ සැබෑ ස්වරූපය වසන් කිරීමේ බටහිර උපක්‍රමයකි. බටහිරවාදය පරිණාමයේදී කොමියුනිස්ට්වාදය නැමැති සංකල්පය සිය පොදු හතුරා වශයෙන් ඉදිරිපත් වීමේ වැදගත්කම තවම විද්‍යාත්මක අධ්‍යයනයකට ලක්ව නොමැත.

1992 දී මෙක්සිකෝ රාජ්‍යයේ " රියෝද ජැනෙයිරෝ " නුවර දී





ගෝලීයකරණය හා පරිසර සංරක්ෂණය පිළිබඳව සම්මේලනයක් පැවැත්විණ. මෙහිදී ඔවුන්ට සෝවියට් සමුහාණ්ඩුව බිඳ වැටීමෙන් පසුව පහරදීමට පොදු සතුරෙකු සෙවීමට අවශ්‍ය විය. ඔවුන් මෙහිදී පොදු සතුරා ලෙස හඳුනා ගනු ලැබූයේ කුසගින්න හා පරිසර සංරක්ෂණය පිළිබඳ ගැටලුවය. සැබවින්ම මෙය නිරර්ථක උත්සාහයක් විය. පරිසර සංරක්ෂණය පිළිබඳ ගැටලුව හා කුසගින්න පොදු සතුරෙකු ලෙස පිළිගැනීමට ලක්වූයේ නැත.

පාරිසරික ගැටලුව මානව ක්‍රියාකාරිත්වය සම්-න් බැඳී පවත්නා ගැටලුවකි. ගෝලීය සමාජයේ ක්‍රියාකාරිත්වය හා ස්වභාවික පරිසරය අතර ගැටුම වර්තමානයේදී මානව ඉතිහාසයේ අන් කවරදාකටත් වඩා උග්‍ර වී තිබේ. ගෝලීය සමාජයේ මූලික ලක්ෂණය වන්නේ ස්වභාව පරිසරයද සිය පැවැත්මේ හා ක්‍රියාකාරිත්වයේ නියමයන්ට යටත් කර ගැනීමයි. මෙය ඇතැමෙකුට පරිසර ගැටලුවක් ලෙස පෙනී යා හැකිය. නමුත් එය එසේ නොවන බව පෘථිවියේ මානව සමාජ පරිණාමය පෙන්වා දෙයි. ගෝලීය සමාජය තුළ මිනිසා හා පරිසරය පිළිබඳ ප්‍රශ්නය මතවාදී අවියක් ලෙස පමණක් භාවිත වන බව ඉතා පැහැදිලිය. එනම් ගෝලීය සමාජයේ ප්‍රධාන ක්‍රියාකාරී බලවේග සිය ආධිපත්‍ය මුළු පෘථිවිය පුරාම ව්‍යාප්ත කර ගැනීම සඳහා ආර්ථික, දේශපාලන, සංස්කෘතික, යුධමය පීඩනය පමණක් නොව පාරිසරික බලපෑම ද භාවිත කරන බව පෙනේ.

## මූලශ්‍ර


1. බයිබලය - උත්පත්ති - 1 : 28, 31;

2. වීරසිංහ මියුඩර්, 2001, ගෝලීය සමාජය හා එහි මතවාදය, එස්.ගොඩගේ, මරදාන, 79 පිටුව ;

## 10

# සන්නිවේදන මාධ්‍ය ගුණාංග සහ මානවීකරණ ක්‍රියාවලිය

ජී.ඩී.ධර්ම කීර්ති ශ්‍රී රංජන්

ස්වභාවික මිනිසා සමාජීය මිනිසෙකු බවට පත් කරනු ලබන දිගු කාලීන ක්‍රියා ස්වරූපය මානවීකරණය ලෙස විෂයානුබද්ධ සංකල්පීය ප්‍රවේශයන් තුළින් හඳුනාගත හැකි වේ. උපතේ සිට මරණය දක්වාම සවිඥානික සහ අවිඥානික ස්වරූපයෙන් සන්නිවේදනය ප්‍රධාන මාධ්‍ය බවට පත්වෙමින් මානවීකරණ ක්‍රියාවලිය සිදුවේ. මෙම දිගු කාලීන ක්‍රියා ස්වරූපය පිළිබඳව සමාජ විද්‍යාව, සමාජ මනෝ විද්‍යාව සහ සමාජ මානව විද්‍යාව ප්‍රධාන අධ්‍යයන ප්‍රවේශ නිර්මාණය කර දී ඇත.

පිරිසිදු මානසික තත්ත්වයන් සහිතව මෙලොවට බිහිවන ළදරුවා පුද්ගල ක්‍රියා සහ සමාජ අන්තර් ක්‍රියාදාමය මුල් කරගත් සන්නිවේදන රටාවෙන් ඉගෙනුම් ප්‍රවේශය ලබා ගනී. එතැන් සිට මව සහ පවුලේ සාමාජිකයන් මූලිකව තම සමාජාවලෝකය පුළුල් කර ගැනීමට උත්සාහ දරමින්, සංකීර්ණ සමාජ පරිසරයකට ප්‍රවේශය සිදු කර ගනු ඇත. තම ජීව විද්‍යාත්මක ප්‍රේරණයන්හි සංතෘප්තිය අපේක්ෂා කරන දරුවා කායික, මානසික පරිණතිය සමඟින් සමාජ සන්නිවේදන රටාවනට අනුගත වීමට ද උත්සහා දරයි. ජීව විද්‍යාත්මකව ද එයට අනුකූලව ඉන්ද්‍රියන්ගේ තියුණු පරිණතියක් ගොඩ නැගෙන්නේ මිනිසාගේ පමණි. පරිණතිය නිරන්තරව කාලයට අනුරූප බව පැහැදිලි වේ. භෞතික මානව විද්‍යාත්මක ප්‍රවේශය තුළින් ද මෙම ජීව විද්‍යාත්මක පරිසරය පිළිබඳ කරුණු තහවුරු වේ.





මෙම කායික ප්‍රේරණ තෘප්තිය ලබන දරුවා අනතුරුව තම මානසික හා සමාජීය ලෝකය පුළුල් කර ගැනීමට උත්සහ ගනී. කායික සංතෘප්තීන් එම සමාජීය සංස්කෘතික සන්දර්භයනට අනුකූලව තෘප්තිමත් කිරීමට ඔහු සූදානම් වන්නේ සන්නිවේදන රටා මූලිකව සංස්කෘතික හර පද්ධතීන් මනෝද්ගමනයෙහි ( Internalization) ප්‍රතිඵලයක් ද වශයෙනි. පුද්ගලයා හෝ සමාජ සමූහ, භූගෝලීය සංක්‍රමණීය අවස්ථා තුළින් ප්‍රතිමානවීකරණයට මුහුණ දෙනු ලබන අවස්ථා ඇති අතර එය සමාග්‍රහණයෙහි ද ( Assimilation ) ප්‍රතිඵලය වේ. කායික සහජ ප්‍රේරණ පාලනයක් මනස මූලිකාංගව නිර්මාණය වන්නේ ද මානවීකරණ ක්‍රියාදාමයෙහි ප්‍රතිඵලයෙනි. මෙය එම සමාජ සංස්කෘතික පරිසරයට අනුකූල නොවන කල, සමාජ පර්යාය ( Social order) බිඳ දමන දුෂ්කෘත්‍යාත්මක සාධක ( Disfunctional Factors) ගොඩ නැගෙනු ඇති බැව් පෙනේ. මානව ස්වීයත්ව ( Personality) සාධකයේදී සමාජ සහ මනෝ මූලික ප්‍රවේශය අතිශය වලංගු වන බැව් පැහැදිලිය. සිග්මන්ඩ් ෆ්‍රොයිඩ්ගේ පර්යාලෝකනයට අනුව සහජාශයන් පදනම්ව ගම්‍යමාන පුද්ගල කායික ප්‍රේරණ සමාජීය ප්‍රවේශයන් තුළ තෘප්තිමත් කිරීමට හුරුකරවන ක්‍රියාවලිය මානවීකරණයයි. මෙම සමාජ සංස්කෘතික රටා සියල්ල පුද්ගලයාට අභ්‍යන්තරීකරණය වනු ලබන්නේ වාචික, අවාචික, භෞතික, අභෞතික, විධිමත් හෝ අවිධිමත් ලෙසින් ගොඩ නැගෙන සන්නිවේදන රටා පදනම් කර ගනිමිනි. සාර්ව සහ ශූක්ෂම සන්නිවේදන ප්‍රවේශයන් පුද්ගල සහ සමාජ ක්‍රියා සහ සමාජ අන්තර් ක්‍රියා මූලිකාංග කර ගනිමින් පුද්ගල සහ සමාජ චර්යා සාධනීය තත්ත්වයන් ගොඩ නංවයි. ලතින් භාෂාවේ ක්‍රියා විධි ස්වරූපයක් ( Latin verb ) මූලික වූ " Communicate " යන්නෙහි අර්ථය ද එයයි.[1] සන්නිවේදන ක්‍රියාවලියේ හරයාත්මක ක්‍රියාදාමයන් අතර එක් එක් පුද්ගලයාගේ චර්යාත්මක පාලනයන් ගොඩ නංවන අතර ඔවුනොවුන් සමූහ සංවිධාන ලෙස, සාමූහික විඥානික තත්ත්වයන් නිර්මාණය කරවයි. ඒ තුළින් අන්තර් ක්‍රියාදාමය සඳහා පවතින බාධා ( barries) බිඳ වැටෙනු ඇත. අන්‍යෝන්‍ය අවබෝධය, සුහදත්වය සහ ජනතා බන්ධුතා ගුණයෙහි නිර්මාණකරණය මෙහි ප්‍රතිඵලයයි. මේ සඳහා අන්‍යෝන්‍ය වශයෙන් හඳුනා ගෙන ඇති සංඥා සහ සංකේත සමූහයක්ද උපයෝගී කරගනු ලැබේ.[2] මේ අනුව සන්නිවේදනය පුද්ගලයාට ඍජු ලෙස කරන බලපෑම ප්‍රබල වන අතර එය කෙම් කාලීන හේතු ඵල සමීක්ෂණ තුළින් දැනගත නොහැකි වේ. සන්නිවේදනය සාම්ප්‍රදායික ප්‍රධාන ක්‍රියා ස්වරූප රාශියක භූමිකා රංගනයන්හි යෙදේ. ඒවා අතර,

1. මුරකරුවෙකු ලෙස ( As a watchman)

2. සමාජ තීරණ නිර්මාණකරුවෙකු ලෙස (Social decision maker)
3. ගුරුවරයෙකු ලෙස ( As a teacher) යනාදී වශයෙනි.[3]

මෙහිදී සමාජ ආරක්ෂණ කෘත්‍ය, සමාජ සාධන කෘත්‍ය, සමාජ මං පෙන්වීමේ කෘත්‍ය හෙවත් සමාජ නායකත්ව ගුණය නිර්මාණය වීම යනු සන්නිවේදනයේ සමාජ කෘත්‍ය සාධනයයි. යම් සමාජ ඛණ්ඩයක පවතින සමාජ සංස්කෘතික රාමුව තුළ සංවර්ධනීය ප්‍රවේශයකට උචිත ලෙස ජන විඥානය සහ ජනමතය සැකසීම සංවර්ධන සන්නිවේදනයේ ප්‍රධාන කාර්යභාරයයි. ජනමතයක් නිර්මාණකරණය සඳහා ප්‍රධාන කරුණු හතරක් බලපාන බැව් ජෝර්ජ් කාල් ලේක් නම් ආචාර්යවරයා පවසයි. එනම්,

1) සංදේශයක විසරණය - Diffusion
2) එහි අඛණ්ඩතාවය - Persistence
3) එහි ප්‍රබලත්වය - Intensity
4) තර්කානුසාරී බව - Reasonableness

යනාදී වශයෙනි. මෙහි ප්‍රතිඵලය එක් එක් පුද්ගලයාගේ අභ්‍යන්තරීකරණ සංකල්පීය ප්‍රවර්ගයන් තුළට නව අනුභූතීන්ගේ ප්‍රවේශය සඳහා වර්ණාත්මකව මං පෙන්වන ක්‍රියාකාරකයෙකු ලෙසින් ද සම්බන්ධවීමයි. සමාජ ප්‍රතිපත්ති නිර්මාපකයෙකු බවට ද පුද්ගලයාව පත් කිරීමේ හැකියාව මාධ්‍ය සතුවේ. පුද්ගල සහ සමාජ කෞශල්‍යතා ප්‍රාගුණ්‍ය සඳහාත්, පුද්ගල විභව ශක්තීන් අවධි කිරීම සඳහාත් සන්නිවේදනය ගුරුවරයෙකු ලෙස සිය කාර්යභාරය ඉටු කරනු දැකිය හැකිය.

මිනිසා යනු හුදෙකලාව ජීවත්විය නොහැකි සමාජීය සත්වයෙකි. ( Social being)[4] ඔහු සමාජීය මිනිසකු ලෙස විවිධ භූමිකා රංගනයන්හි නිරත වේ. මෙහිදී ස්ථාපිත හා විශේෂී දිශානතීන් තුළ මෙම රංගනමය ප්‍රවේශයන් සඳහා ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ බහු විධ උපකාරයන් කෘතහස්තය. මේ සඳහා දීර්ඝ කාලීන, සංකීර්ණ බහුවිධ සන්නිවේදන විනේය ක්‍රම රාශියක් ඇත. සමාජ විනය ගොඩ නැංවීම සහ එහි රැකවරණ කෘත්‍ය මාධ්‍යයෙහි ප්‍රධාන නිර්වචිත කාර්යභාරයකි. ඒ තුළ සමාජ ව්‍යුහිය සුරක්ෂිතතාවය මනාව තහවුරු වේ. එය පුද්ගල චිත්තවේගිය පරිණතිය සහ සමාජ පරිණතිය සඳහා වැදගත් වේ. මිලර් සහ ඩොලාර්ඩ් ( Miller & Dollard) ට අනුව මෙම පරිණතිය ඔහු ලබන්නේ සමාජ පරිසරය තුළ





ගොඩ නැංෙන සන්නිවේදන රටා මූලිකාංගවය.

මානවීකරණය යනු පහසුවෙන් අර්ථකථනය කළ හැකි සංකල්පයක් නොවේ. පුද්ගල ජීවිතය සමාජ සංස්කෘතික සන්දර්භයට අනුකූල ලෙස නිර්මාණය කිරීමට මහෝපකාරී වන පුද්ගල සහ සමාජ නියෝජිතයන් අතර සිදු වන සංකීර්ණ, දීර්ඝ කාලීන, බහුවිධ, සන්නිවේදන හුවමාරු සමුදාය මෙහිදී වැදගත් වේ. සන්නිවේදනය මූලිකාංගව ගොඩ නංවන මානවීකරණ ක්‍රියාවලියෙන් පුද්ගල සහ සමාජ පර්යාය සුරැකේ. සංස්කෘතියේ පැවැත්මට අදාළ විනේය ක්‍රම ගොඩ නැංවීම සහ සමාජ පාලන ගුණය ( Social Control) ද නිර්මාණය වනු ඇත. සමාජය වෙනස් කිරීමේ ( Social change) ගුණය ද මෙහි ප්‍රධානය. හැසිරීම් රටා ඉගෙනීමේ ගුණය ( learned quality), පතුරුවා හැරීමේ ගුණය ( Transmissive quality), සමාජයට අවශ්‍ය තෘප්තිය දැනවීමේ ගුණය ( gratifying quality ), ප්‍රජාව එකට එකතු කිරීමේ ගුණය ( Integrative quality ), අවස්ථාවෝචිතව සකස්වීමේ ගුණය ( Adaptive quality), පරමාදර්ශී ගුණය ( Ideal type) යනාදී වශයෙන් සමාජීය ගුණාංග ( Social qualities) රාශියක් ජනමාධ්‍ය ක්ෂේත්‍රය අභ්‍යන්තරීකරණය කරගෙන ඇත. ජනමාධ්‍ය සහ මානවීකරණය යන සංකල්ප දෙක අන්තර්විෂයීය පෝෂණයක් ( Interdisciplinary) සහිතව තම අනන්‍යතා සංවර්ධනය සම-න් විකාශනය වනු දැකිය හැකිවේ.

මානවීකරණය යන ක්‍රියාවලිය සඳහා සංස්කෘත්‍යායනය යන වචනය මානව විද්‍යාවේදී භාවිත කරයි. සංස්කෘත්‍යායනය ඒ ඒ සමාජ සන්දර්භයනට අනුගතව සිදුවන්නකි. මෙම සෑම සමාජයක් තුළම තම පිළිගැනීමට අනුව සමාජ සාරධර්ම හා ධර්මතා නීතිරීති පවතී. මෙම ධර්මතා, ප්‍රතිමාන නීති රීති ආදී සියල්ල සමාජානුයෝජන ප්‍රවේශයට අනුගත වන්නේ සන්නිවේදන ක්‍රියාවලිය මූලිකාංග වෙමිනි. එහිදී පුවත්පත්, ගුවන් විදුලිය, රූපවාහිනිය, සිනමාව ආදී මාධ්‍ය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. අවාචික සන්නිවේදනය තුළින් බොහෝ දුරට ප්‍රතිසමාජානුයෝජනයක් සිදුවේ. ටෙලි නාට්‍ය, ප්‍රවෘත්ති, කාලීන වැඩ සටහන් ආදිය තුළින් පුද්ගලයා ලබන දැනුම තම චර්යා සාධනයෙහි විවිධ දිශානතීන් ගොඩ නගා ගනී. අතීත විස්තෘත පවුල මූලික වූ සාම්ප්‍රදායික ග්‍රාමීය පවුල් සමාජ සංවිධානය තුළ වැඩිහිටි සාමාජිකයන් විසින් තම දූදරු මුණුබුරු ආදීන් සඳහා පුද්ගල අන්තර් ක්‍රියාදාමය මූලිකව විවිධ ජනශ්‍රැතිකාංග තුළින් වින්දනාත්මකතා පෝෂණයක් ගොඩ නැංවීය. එම සන්නිවේදන රටා මූලික වූ මානවීකරණ ක්‍රියාවලිය නිරවද්‍ය, යුක්තිගරුක පුද්ගල සහ සමාජ කණ්ඩායම්

නිර්මාණය වීමට පාදක විය. කෘෂිකර්මය, විවිධ රෝගාබාධ, අභිචාරී ක්‍රම ආගමික ආදී තත්ත්ව, සුවිශේෂී සන්නිවේදන රටා නිර්මාණය සඳහා බෙහෙවින් බලපාන ලදී. දරු නැළවිලි ගීත, වාචික, අවාචික සහ අභිනයමය අයුරින් නිර්මාණය වන සන්නිවේදනය මානවීකරණ ක්‍රියාවලියේදී විශාල මෙහෙයක් ඉටු කරයි. එහෙත් වර්තමානය තුළ වැළඳ ගෙන ඇති සන්නිවේදන රටා මෙයට වෙනස් වූ ශිල්පීය ක්‍රම සහිත වූ තාක්ෂණයක් උපයෝගී කර ගනී.

සිග්මන්ඩ් ෆ්‍රොයිඩ්ගේ මනෝ විශ්ලේෂණවාදී ප්‍රවේශය තුළ ස්වීයත්ව සාධනයේදී ප්‍රධාන අවස්ථා තුනක් ( 03) පිළිබඳව පැහැදිලි කර ඇත. එනම් Id, Ego සහ Super Ego යනුවෙනි. Id අවස්ථාව තුළින් ශාරීරික නැතහොත් ජීව විද්‍යාත්මක ප්‍රේරණ තෘප්තිය අපේක්ෂා කරන අතර Ego සහ Super Ego තුළින් එම අවශ්‍යතා සමාජීය ස්වරූපයකින් ඉටු කිරීම සඳහා ම- පෙන්වනු ලබයි. මොහුගේ මෙම පර්යාලෝකනයට අනුව සමාජානුයෝජනය තුළින් පුද්ගලයෙකුට සමාජ සම්මත සිරිත් විරිත්, නීති රීති, උගන්වන අතර අපගාමී චර්යාවන් පිළිබඳව ද දැනුම නිර්මාණය කරයි. සමාජය අනුමත ලෙස ප්‍රේරණ පාලනය පිළිබඳව ද උගන්වනු ලබයි.

වර්තමාන ජනසන්නිවේදනාත්මක මූලාශ්‍ර තුළින් පුද්ගල විඥානය දක්වා ප්‍රවේශ කරනු ලබන, සමාජ ඇගයුම් නොලබන සාදාචාර විරහිත ඇතැම් නිර්මාණයන් තුළින් පුද්ගලයාගේ Id මානසික තත්ත්වයට ආමන්ත්‍රණය කිරීම ඛේදනීය තත්ත්වයකි. එහි ප්‍රතිඵල ලෙසින් විකෘති චර්යා ස්වභාවයක් දක්නට ලැබේ. කායික අවශ්‍යතා නිසි අයුරින් තෘප්තිමත් නොවන විට ඒවා යම් මනස දක්වා අවරෝධනය වී උඩු මනස දුර්වල අවස්ථාවල ඉස්මතු වී අයහපත් චර්යාත්මක ලක්ෂණ හෙවත් අපගාමී රටා පුද්ගලයා තුළින් නිර්මාණය කරවයි. Id හෙවත් ඇළ සිතෙහි ස්වභාවය Ego සහ Super Ego තුළින් පාලනය එතරම් පහසු කර්තව්‍යයක් නොවන්නේ ජීව විද්‍යාත්මක අවශ්‍යතාවන්හි සංතෘප්තිය එහි අනන්‍යතාවය වශයෙන් පවත්වාගෙන යන බැවිනි. Ego සහ Super Ego යනු සමාජීය ස්වරූපයනට අනුගත වන සිතෙහි ක්‍රියා ස්වභාවයකි. ජනමාධ්‍ය Ego සහ Super Ego ට ආමන්ත්‍රණය කරමින් එහි ස්වකීය අනන්‍යතා පෝෂණය සිදු කළ යුතුය. මාධ්‍ය Id සංස්කාරයෙහි අවශ්‍යතා සංතෘප්තීන් නිර්මාණය කිරීමට උත්සාහ ගැනීම යනු සමාජ පැවැත්ම පිළිබඳ ගැටලු මතු කරවීම යන්නයි. එහි ප්‍රතිඵලය සුශික්ෂිත සමාජ පාලනයට සහ සමාජ සංස්කෘත්‍යායනයට සංරෝධක නිර්මාණය කරනු ලබන මිනිසාගේ බිහිවීමයි.





මානවීකරණ ක්‍රියාවලිය පිළිබඳ සාකච්ඡාවේදී න්‍යායාත්මක ප්‍රවේශය තුළ සමාජ ඉගෙනුම් න්‍යාය ( Social Learning Theory) දරන ස්ථානය අතිශය වැදගත් වේ. මෙය න්‍යායාත්මක ප්‍රවේශ කිහිපයකින්ම පෝෂණය වී තිබේ. ඒවා අතර ඇල්බට් බන්ධුරාගේ ( Albert Bandura) න්‍යාය තුළින් පැහැදිලි වන්නේ ඉගෙනුම් ක්‍රියාවලිය යනු අඛණ්ඩව සිදුවන්නක් බවයි.[5] එමෙන්ම යම් ක්‍රියාවලියක් හෝ හැසිරීම් රටාවක් නිරීක්ෂණය කිරීමෙන් එය මානසික අත්දැකීමක් බවට පත්වීමෙන් අනතුරුව චර්යාත්මකව නිර්මාණයක් වීමටද හැකි වෙයි. යම් ජනමාධ්‍යයක මූලිකව විකාශය වන චරිත හෝ රූ-පැම් ආදිය තුළින් ග්‍රාහකයා තම චර්යාව හැඩ ගස්වා ගන්නා බව පැහැදිලිය. මොහුගේ න්‍යාය ජනමාධ්‍ය හා ධනාත්මක සබඳතාවකින් විග්‍රහ කළ හැකිය.

× ජනමාධ්‍ය තුළින් නිරූපණය කෙරෙන යම් වූ චර්යා පුද්ගලයා සංජානනය කර ගනු ලබයි.

× ඒවා ඒ අයුරින් පුද්ගලයා අභ්‍යන්තරීකරණය කර ගනිමින් අපේක්ෂිත වැඩි ප්‍රතිඵල සහිතව ඉදිරිපත් කළ හැකි යැයි ඔහු විශ්වාස කරයි.

× එම චර්යා රටා අනුකරණය කරන අතර ඒවා වඩාත් ප්‍රයෝජනවත් බව ඔහුගේ අත්දැකීම් පදනම්ව කල්පනා කරයි.

× පසුව එම චර්යාවන් යොදා ගැනීමටත් තීරණය කරයි.

මෙම සිද්ධාන්තයෙන් ජනමාධ්‍ය තුළින් ප්‍රචලිත වන නාට්‍ය සහ අනෙකුත් ප්‍රචාරණයන් එක් වරම හෝ ඒකාකාරී ලෙසින් අනුකරණය කරතැයි ගම්‍යමාන නොවේ. දිගු කාලීන ප්‍රවේශයන් තුළ ස්වකීය ජීවිතයට ඒවා අභ්‍යන්තරීකරණය කර ගැනීමට ඉඩ තිබේ. මේ අනුව ජනමාධ්‍ය තුළින් පුද්ගලයාගේ සහ සමාජයේ සමස්ත චර්යාවන් වෙනස් කිරීමට හැකියාවක් තිබේ. ඒ අනුව නිෂ්ක්‍රීය ග්‍රාහකයන් වඩා සක්‍රීය ග්‍රාහක නිර්මාණයක් කිරීමට මාධ්‍යයට හැකියාව ලැබේ. එක් එක් පුද්ගලයාගේ ආකල්ප, අවශ්‍යතා, ස්වීයත්ව සාධක පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වන බැවින් , වෙනස ද පාදකව මාධ්‍ය හා සම්බන්ධිත පණිවුඩයට ප්‍රතිචාර දක්වන බව සමාජ මනෝ විද්‍යාඥයෝ පෙන්වා දෙති.

මිනිස් ජීව විද්‍යාත්මක ප්‍රේරණ සංතෘප්තියට වඩා ඒවා තෘප්තිමත් කරන

ස්වභාවය වෙනස් කිරීමට පරිසරය දැඩි බලපෑමක් කරනු ලබන බැව් පැහැදිලිය. වරණීය බලපෑම් න්‍යායට අනුව මාධ්‍යයෙහි බලපෑම ඒ හා සබඳතාවයෙහි අඩු වැඩි ප්‍රමාණයන් මත ගොඩ නැංවෙන බැව් පැහැදිලි වේ. ජනමාධ්‍ය පණිවුඩය ඔවුනට සංජානනය වන්නේ ද බොහෝ දුරට ඔවුන් පාදක කරගත් මානසික සහ චර්යාත්මක පසු බිමට සාපේක්ෂවය. ජන සමාජයක ( Mass Society) ජනමාධ්‍ය මගින් විවිධ වැඩ සටහන් ප්‍රචලිත කළත් වරණීය ලෙස ඔවුහු අදාළ අර්ථ ගොනු කර ගනු ලබයි. මෙහිදී මූලිකාංග වන්නේ එතෙක් පාදක වූ සංජානන සහ චර්යාත්මක ප්‍රවේශයන්ය. මෙම එක් එක් සමාජ සංස්කෘතික ප්‍රවේශයන් තුළ නිර්මාණය කරන ලද අදහස්, ආකල්ප, සාරධර්ම, ධර්මතා එයට විශේෂිත වූ තත්ත්වයන් නිර්මාණය කරයි. ඒ අනුව මාධ්‍ය බලපෑම ඒකාකාරී යැයි ද ප්‍රකාශ නොවන අතර එතරම් ප්‍රබල වනු ද නැත. පුද්ගලයාගේ මානසික තත්ත්වයන්හි වෙනස්කම් නිසා ද බලපෑම් කෙරෙහි සීමාකම් නිර්මාණය වේ. ඒ අනුව යම් බලපෑම් මාධ්‍ය පදනම් ව නිර්මාණය වන බැව් ද බෙරල්සන් පෙන්වා දෙයි.

ජනවර්ගයන්හි සහජීවනය බොහෝ දුරට ඔවුනොවුනට සාපේක්ෂ වූ සන්නිවේදනයෙහි ද ප්‍රධාන ප්‍රතිඵලයකි. එවිට මෙම කණ්ඩායම් ඉලක්ක කොට ගනිමින් සන්නිවේදනයන් නිර්මාණය කරගත හැකිය. එහි ප්‍රතිඵලය වරණීය වූ සමාජ ප්‍රවර්ග සිද්ධාන්තයන් නිර්මාණය වීමයි. ( Theory of selectivity based on social categories) ආත්මාර්ථකාමීත්වය වැනි සාධක පුද්ගල උත්පත්තිය හා සම්බන්ධ වන අතර පරාර්ථකාමීත්වය හුදෙක් ලබන්නේ සමාජය ඇසුරිනි. ජනමාධ්‍ය පුද්ගලයාට හා සමාජයට සෘජු බලපෑම් ( Direct influences) සහ වක්‍ර බලපෑම් (indirect influences) ගොඩ නංවනු ලබයි. ඒ සඳහා මාධ්‍ය තුළින් ලැබෙන උත්තේජනය ප්‍රමුඛ සාධකයකි. දෙවනුව එයට සාපේක්ෂ වූ ප්‍රතිචාරයන් සැලසුම් කෙරේ. එහි නිෂ්ඨාව චර්යාත්මක සාධකයයි. මේ සඳහා පුද්ගල ජීව විද්‍යාත්මක සාධක හැඟීම් ස්වභාවයන් සහ වෙනත් සාධක, පුද්ගලයාගේ ඥානන ව්‍යුහය ( Cognitive Structure) සැඳුම් ගන්නා වූ උපාර්ජිතයන් (Acquired ) හෝ හැදෑරීමෙන් ලැබූ ( Learned) සාධක ද මැදිහත් වන ආකාරය පැහැදිලිය. මේ අනුව පුද්ගල හැසිරීම් රටාවට ම- පෙන්වනු ලබන සාධක ලෙස ජීව විද්‍යාත්මක, භාවාත්මක, ඥානන සාධක මෙන්ම ස්වීයත්ව නිර්මාණය ද වැදගත් වනු පෙනේ. ස්වීයත්ව නිර්මාණකරණය සඳහා අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය (intrapersonal communication) සහ පුද්ගලාන්තර සන්නිවේදනය ( interpersonal Communication ) ප්‍රධානව පුද්ගලයාගේ චිත්තාභ්‍යන්තරයෙහි ඇති කරන ආත්ම භාෂණය වැදගත් වනු ඇත. මෙම සන්නිවේදන රටා පදනම්ව





පුද්ගලයා තුළ ස්වයං සංකල්පය (Self Concept), ස්වයං ප්‍රතිරූපය ( Self Image), ස්වයං සම්භාවනාව (Self Esteem), ස්වයං දැක්ම ( Self View ), ආදිය නිර්මාණය වේ. ආත්ම සංඥතාවය ද ( Self Consciousness ) මෙහි ප්‍රතිඵලයයි.

භාවමය සාධක මූලික වූ පෙළඹවීම මාධ්‍ය තුළින් ප්‍රබලව දක්නට ලැබේ. බොහෝ ඥානන සාධකයන්ගේ උපාර්ජිත භාවය සිදුවන්නේ මානවීකරණ ක්‍රියාවලිය පදනම්ව බැව් පැහැදිලිය. ඥානන සාධකය පෙළඹවීම් සාධකයක් බවට පත්වන්නේ ඉගෙනුම් ක්‍රියාවලිය පදනම්වය. ඥානන සාධකය සහ චර්යාත්මක සාධකය ඒ අනුව ධනාත්මක ලෙසින් බැඳී පවතී. මේ අනුව කාර්යසාධන පණිවුඩයන්ගෙන් යුක්ත ජනමාධ්‍යයෙහි ගුණය විය යුත්තේ පුද්ගල මානසික ක්‍රියාකාරීත්වය වෙනස් කිරීමට අවශ්‍ය හරයාත්මක නිර්මාණයයි.




මේ අනුව මනෝ ගතික පෙළඹවීම් දැකිය හැකිය. ජෝන් ෆිලිප්ස් ජෝන්ස් පැහැදිලි කරන්නේ හේතු ප්‍රත්‍ය ධර්ම මූලිකාංගව, ඉගෙනුම ආකල්ප සහ චර්යාවන් නිර්මාණය වන බවයි. එමෙන්ම චාල්ස් රේමන්ඩ් ඉගෙනීම - හැඟීම - කිරීම ( Learn – feel – do) යනාදී වශයෙන් එය විස්තර කරයි.[6] මානවීකරණ ක්‍රියාවලියේදී භාෂාව පූර්ණ ශාබ්දික සංකේත සමූහයක් සහ සංකල්පනික චින්තනයක් මනුෂ්‍යයාට හිමි කර දෙමින් මාධ්‍ය ප්‍රවේශය තුළ විශාල කාර්යභාරයක් ඉටු කරනු පෙනේ.[7] එහි කාර්ය අතර ප්‍රධාන සිව් වැදෑරුම් ප්‍රවේශයන් දක්නට ලැබේ.

1. ප්‍රකාශන කාර්ය - Expressive Quality
2. සංඥාමය කාර්ය - Indicative Quality
3. විස්තරාත්මක කාර්ය - Descriptive Quality
4. තර්කන කාර්ය - Logical Quality යනුවෙනි.

තවද භාෂාවේ ප්‍රධානතම කාර්යභාරයන් 06ක් ජැකෝබ්සන් (Jakobson) විසින් ද පෙන්වා දෙයි.[8] විධිමත් වූ භාෂාමය ප්‍රවේශය සහ තර්කන කාර්ය උපයෝගී කරගත හැක්කේ මිනිසාට පමණකි. සංඥාමය කාර්ය, ප්‍රකාශන කාර්ය සහ විස්තරාත්මක කාර්ය එක් ශාබ්දික සංකේතයකින් ඉදිරිපත් කළ හැකි වුවද තර්කන

කාර්ය එසේ නොවනු ඇත. එසේම තර්කන කාර්ය සඳහා භාෂාව යෙදීමේදී ව්‍යුක්ත චින්තනය වැනි ප්‍රජානන හැකියාවන් අවශ්‍ය වේ. මෙම ප්‍රජානන හැකියාව ද උරුම වන්නේ මිනිසාට පමණි.

මේ අනුව පුද්ගල සහ සමාජීය චර්යාවන්හි ප්‍රතිජනනාත්මක සහ නිෂේධනාත්මක ස්වභාවයන් නිර්මාණය කිරීම සඳහා මාධ්‍ය හැසිරීම බෙහෙවින් බලපානු ඇත.[9] එසේම මනස තුළ සංස්කරණාත්මක චිත්තවේග සහ විනාශකාරී ස්වභාවයන් ගොඩනංවන චිත්තවේග වුව නිර්මාණය වනු ඇත.[10] මානවීකරණ ක්‍රියාවලිය සඳහා බෙහෙවින් හේතු කාරක වන උත්තේජන ආදේශනය ( Substitution of stimulus), ප්‍රතිචාර අදේශනය ( Substitution of responses), අනුකරණාත්මක ( Imitation) ගුණය, චිත්තවේග ව්‍යාපනය (Spreading of emotion) ජනමාධ්‍යවේදීය ක්‍රියා ප්‍රවේශයන් තුළ දක්නට ලැබේ. තවද මාධ්‍ය, මානවීකරණ ප්‍රවේශයක් ලෙස මෙහි ගුණයන් ( qualities) රාශියක් පිළිබඳවද සැලකිය හැකිය. ඒවා අතර,

× අරමුණු හා පරමාර්ථ තෘප්තිමත් කිරීමේ ගුණය
× කාංසාත්මක තත්ත්වයන් නැති කිරීමේ ගුණය
× සකාර්ය ඉගෙනුමක් ඇති කිරීමේ ගුණය
× ස්මෘතිය හා අධි ඉගෙනුම් ලබා දීමේ ගුණය
× පරිණතිය සහ සූදානම් කරවීමේ ගුණය
× ගවේෂණයට ඉඩ සැලැස්වීමේ ගුණය
× පුද්ගල සහ සමාජ චර්යාවන් වෙනස් කිරීමේ ගුණය යනාදී වශයෙනි.

මේ අනුව පැහැදිලි වන්නේ ජනමාධ්‍යවේදීය මූලිකාංගයන්හි ප්‍රධානතම කෘත්‍ය සහ වගකීම වන්නේ මානවීකරණ ක්‍රියාවලිය බවය. නිවැරදි ප්‍රජා ශක්‍යතා පූරණයෙහි ප්‍රතිඵල ලෙසින්, ජනනීය සාධකය ලෙස විද්‍යමාන සමාජ ප්‍රගමන ක්‍රියාදාමය උචිත හා බහු විධ ක්‍රමවේදයන් ඔස්සේ නිර්මාණයෙහි සහ ප්‍රති නිර්මාණයෙහි වගකීම, මාධ්‍ය සතු වන බැවින් මාධ්‍යවේදියාට සිතීමට කාලය පැමිණ ඇති බැව් පැහැදිලිය.





## මූලාශ්‍ර


1. *Encyclopedia of Mass Communication, Vol. 2, P. 76;*

2. *Steinfatt , Thomas, Human communication, communication in the process of exchanging mutually understood symbols, P.12;*

3. *Schramm, W., Mass Media and National Development, Stanford University Press;*

4. *Aristotle, Politics, 1988, Quoted in the Social Animal by Elliot Arson, P. 1;*

5. *Bandura, A., 1961, Dorothea Ross and A., Sheila Ross, Transmission of aggression through imitation of aggressive modals, A., Abnorm, Social Psychology, PP.572 - 82;*

6. *John Phillips Johnes, What's in a name? , Advertising and the concept of bonds Lexington , Mass D. Heath and Company P. 141;*

7. *Melvin, L., Defleur, 1991, Everette E. Dennis, Understanding Mass Communication, 1991, fourth Ed., Houghton Mifflin Company, Boston, P. 5;*

8. *Jakobson, Roman, 1960, Closing Statement, Linguistics and Poetics in Sebeok (ed) PP. 350 - 77;*

9 . *Defleur, Melvin, L., E., Everett, Dennis, Op, cit. 1991, PP. 559 – 96;*

10. *Goldstein , Brigitte, 1980, ' Television's Portrayals of the Mentally ill' ( M.A. Thesis, University of New Mexico.)*

# 11

# මානව ගරුත්වය, කලා නිර්මාණය සහ ජනමාධ්‍ය

ධනපාල විජේසිංහ

මෙම ලිපියේ ප්‍රධාන අරමුණ වන්නේ මෙරට ඇතැම් කලා කරුවන් විසින් නොදැනුවත්ම හෝ හිතාමාතාම හෝ සිදු කරනු ලබන නොමනා ක්‍රියාවක් කෙරෙහි සද්භාවයෙන් යුක්තව අවධානය යොමු කිරිමයි. එනම් කායික හා මානසික ආබාධ, දුර්වලතා, අඩුපාඩුකම් හා පළපුරුදු ආදිය සදාචාර විරෝධි ලෙස ඇතැම් කලා කෘති තුළින් හුවා දැක්වීම සහ එමගින් වින්දනයක් ලැබීම හා ලැබීමට සැලැස්වීමයි. මෙරට ජනතාවට දැනුම හා වින්දනය සපයන නාට්‍ය, ගීත, රංගන, චිත්‍රපට ආදිය පිළිබඳව සුපරික්ෂාකාරි වුවහොත් ඉහත සඳහන් ප්‍රශ්නය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම දුෂ්කර නොවන්නේය. කිසියම් නිර්මාණයක් මහජනයාගේ ප්‍රසාදයට ලක් කර ගැනීම සඳහා සදාචාර සම්පන්න උපක්‍රම මෙන්ම එසේ නොවන උපක්‍රම ද භාවිත කළ හැකිය. මිනිසුන්ගේ කායික හා මානසික දුර්වලතා, ආබාධ හා හුරුපුරුදු මතු කොට එයින් හාස්‍ය උත්පාදනය කිරීමට හෝ සතුටක් නිර්මාණය කිරීමට හෝ ප්‍රයත්න දරන්නේ නම් එය නිර්මාණශීලිත්වයේ බංකොලොත්භාවය ම ප්‍රකට කරන්නේය. මිනිසුන්ගේ කායික හා මානසික දුර්වලතා හා ආබාධවලට සිනාසීම අතිශය පහත් ක්‍රියාවකි. එවැනි දෑ මගින් තමන්ගේ නිර්මාණයට අපූර්වත්වයක් ආරෝපණය කිරීම හා එමගින් ප්‍රේක්ෂකයන් පොළඹවා ගැනීම ද එවැනි ම පහත් ක්‍රියාවක් වන්නේය. උසස් නිර්මාණ වූ කලී සදාචාර සම්පන්න වූද, මානව ගරුත්වය සුරකින්නා වූද මිනිසුන්ගේ සාමූහික ජීවිතයේ හෝ පෞද්ගලික ජීවිතයේ ගැඹුරු ක්‍රියාකාරිත්වය පිළිබිඹු කරන්නා වූද කෘතින්ය. එහෙත් එවැනි භාරදූර කාර්යකට





අත ගසනවා වෙනුවට මිනිසුන්ගේ කායික හා මානසික දුර්වලතා මුළුමනින් ම ඉස්මතු කරන චරිත තුළින් ප්‍රේක්ෂකයන්ට වින්දනය සැපයීමේ ලාභදායි උපක්‍රමයකට අද ඇතැම් කලාකරුවෝ තල්ලු වී සිටිති.

මේ ප්‍රවණතාවට සමාජ විද්‍යාත්මක අර්ථයක් ඇත්තේ තත්කාලීන සමාජ සංස්කෘතිය තුළ මිනිසුන්ගේ කායික හා මානසික දුර්වලතා පිළිබඳ මති මතාන්තර හා ආකල්ප සමුදාය තුළය. මිනිසුන් සමාජ සම්බන්ධතා පැවැත්වීමේදි මේ ආකල්ප හා මතිමතාන්තර බලපාන්නේය. ලෝකයේ ඇතැම් සමාජවලට සාපේක්ෂව බලන කල අපේ සමාජයේ පවත්නා මෙකී ආකල්ප හා මතිමතාන්තර ඉතා ප්‍රබල යැයි සිතමි. කායික හා මානසික ආබාධ හා දුර්වලතා පදනම් කොට ගෙන කෙරෙන වෙනස්කම් ද ඉතා ප්‍රබල මට්ටමක පවතී. ඉතා සංක්ෂිප්තව දක්වන්නේ නම් මෙරට ආබාධිත පුද්ගලයන් පමණක් නොව සාමාන්‍ය ශරීර ලක්ෂණ වලට වඩා යම් වෙනසක් දක්වන අය පවා විවිධ වෙනස්කම්වලට හා අපහසුතාවලට භාජනය වෙති. සමාජයේ අන් අය හා සාමාන ගරුත්වයකින් සැලකිල්ලට ලක් නොවෙති. මෙය වූ කලී වහා වෙනස් විය යුතු තත්ත්වයකි.

මෙවැනි ඌනතා ම-හරවා ගැනීමෙහිලා ශරීරය පිළිබඳ සමාජ හා මානව විද්‍යාත්මක කරුණු පිළිබඳ අවබෝධයක් නිර්මාණකරුවන් සතුව තිබීමේ වැදගත්කම අවධාරණයෙන් සඳහන් කළ යුත්තකි. ශරීරයේ විවිධ ලක්ෂණ හා රෝගාබාධ පිළිබඳව සමාජය තුළ ඒකාකාර පිළිගැනීමක්, සැලකිල්ලක් , ආකල්පයක් නොපවතී. ශරීර ලක්ෂණ හා රෝගාබාධ පිළිබඳව විවිධ ආකල්ප මෙන්ම අර්ථ විග්‍රහයන් ද දක්නට ලැබේ. සමහර විශ්වාස, ආකල්ප හා අර්ථ විග්‍රහ පුද්ගලයාගේ සමාජ ජීවිතයට හා පෞද්ගලික පැවැත්මට ප්‍රබල ලෙස බලපාන අතර සමහර ඒවා එතරම් බලපෑමක් නොකරන්නේය. ආබාධිත දරුවකු පවුලකට ඉපදීම කෙනෙකුට බරපතල ප්‍රශ්නයක් වන්නේ එකී සමාජය තුළ ආබාධිතභාවය පිළිබඳව පවත්නා ආකල්ප, විශ්වාස හා අදාළ ආබාධිතභාවය පිළිබඳ අර්ථකථන ආදිය අනුවය. ආබාධිතභාවය ද සාමාන්‍ය ලක්ෂණයක් ලෙස සලකන්නේ නම් එය ගැටලුවක් නොවන්නේය. විවිධ සමාජ, සංස්කෘතීන්හි, ශාරීරික ලක්ෂණ, රෝග හා ආබාධ විවිධාකාරයෙන් සැලකිල්ලට හා විග්‍රහයට ලක්වන හෙයින් ඒවායින් ඇතිවන බලපෑම ද විවිධ ස්වරූප ගන්නේය.

ජවි වර්ණය හෙවත් සමේ පාට මිනිසුන් වර්ග කිරීමටත්, භේද කිරීමටත් පදනම් වී ඇති එක් ශාරීරික ලක්ෂණයකි. ලෝකයේ විවිධ රටවල මිනිස්සු

ජවි වර්ණය අතින් ද විවිධ වෙති. ජවි කල්‍යාණය කාන්තාවන්ට අනගි සම්පතකි. සමේ පාට තමන්ට විනයක් වූ ජන කොටස් ද සිටිති. වර්ණභේදවාදය ගැන අපි කවුරුත් අසා ඇත්තෙමු. කළු ජාතිකයෝ මේ වර්ණ භේද වාදයෙන් බොහෝ සෙයින්ම බැට කෑවෝ වෙති. අද බොහෝ රටවල වර්ණභේදවාදය පවතී. ඒ අනුව කෙරෙන වෙනස්කම්, නොපණත්කම්, හිරිහැර, තාඩන පීඩන, අලාභහානි තවමත් ලෝකයේ දක්නට ලැබේ. අප්‍රිකාවේ හෝ ආසියාවේ ඇතැම් රටවල අය සුදු ජාතිකයන් වසන රටවලදී පහත් කොට සැලකීමේ ප්‍රශ්නයක් ද පවතී.

ජවි වර්ණ භේදය අපේ දේශීය සමාජය තුළ ද දක්නට ලැබේ. එකම කලාපයක සිටින අය වුව ද සමේ වර්ණය අනුව තම තමන් වර්ග කර ගනිති. මෙහිද ප්‍රධාන ලක්ෂණය කළු සුදු භේදයකි. සමේ වර්ණය අනුව පුද්ගලයන් හඳුනා ගැනීම එකකි. භේදය තව එකකි. ජවි වර්ණය අනුව පුද්ගලයන් හඳුනා ගැනීම අතීතයේ ද පැවතිණි. කාක වණ්ණ තිස්ස කාවන් තිස්ස විය. කළු මැණිකා, සුදු මැණිකා, කළු බණ්ඩා, සුදු බණ්ඩා ආදි නම් වර්ණ භේදයකින් තොරව අද භාවිතයේ පැවතිය ද එවැනි නම් නිර්මාණය වීමට ජවි වර්ණ සවිඥානය බලපාන්නට ඇතැයි සිතිය හැකිය. “ කළු අයියා ” “ කළු මල්ලි ” “ කළු මාමා ” , “ කළු නංගි ” “ කළු මහත්තයා ”, “ සුදු මහත්තයා ”, “ සුදු අයියා ” ආදි ව්‍යවහාර දැනුදු සමාජය තුළ භාවිතයේ පවතී. එකී ව්‍යවහාර තුළ කිසිඳු වෙනස්කමක් හෝ අගෞරවවාචී ගුණයක් අන්තර්ගත නොවන්නේය.

එසේ වුවද පුද්ගලයන් හෙලා දැකීමට හා අගෞරවවාචීව ආමන්ත්‍රණය කිරීම සඳහා “ කළුවා ” යන යෙදුම බොහෝ විට භාවිත වන්නේය. “ සුද්දා ” යන්නෙහි ද ඇත්තේ පහත් ආමන්ත්‍රණයකි. පුද්ගලයාගේ ආත්ම ගරුත්වයට හානි වන අයුරින් “ කළුවා ” හෝ “ සුද්දා ” යන්න භාවිත කිරීම සදාචාර සම්පන්න නොවේ. සාමාන්‍ය ජනයා තුළ පවත්නා එවැනි ව්‍යවහාර ජන මාධ්‍ය තුළින් ද දැන් දැන් ප්‍රකාශ වන බව පෙනේ. නොයෙක් වෙළඳ දැන්වීම්, සංගීත වැඩසටහන් හා නාට්‍ය ආදියෙහි ජවි වර්ණයට අදාළ අගෞරවවාචී පද ප්‍රතිනිර්මාණය වන බව පෙනේ. සමේ වර්ණය අනුව “ කළුවා ”, “ සුද්දා ” “ රත්තා ”, “ කබරයා ” ආදි වශයෙන් කෙරෙන ආමන්ත්‍රණ බහු ජනමාධ්‍ය මගින් විකාශය වන වැඩ සටහන් හා කලා නිර්මාණවලට ඇතුළත් කොට එයින් මහජනයාට වින්දනයක් ගෙන දීමට උත්සාහ කරන්නේ නම් එය සදාචාර සම්පන්න ක්‍රියාවක් නොවන්නේය.

අපේ මාධ්‍යවලින් විකාශය වන ඇතැම් වැඩසටහන්වල, එනම් සංගීත හා





නාට්‍ය ආදියෙහි උස පිළිබඳ ප්‍රශ්නයක් ද ප්‍රති නිර්මාණය කෙරෙන බවක් පෙනේ. උස වැඩි අයට සමාජය තුළ “ දිඝ ජන්තුවා ” යැයි ව්‍යවහාරයක් පැවතිය ද එය භාවිතයන් අදාළ පුද්ගලයාට හානියක් නොවන්නේ උස වැඩිකම කවුරුත් අගය කරන හෙයිනි. අපේ සමාජයේ ප්‍රශ්නයක් කොට ගෙන ඇත්තේ උස අඩුකමය. උස වූ කලි ලබා උපන් තත්ත්වයකි. ව්‍යායාම ආදි ශාරීරික අභ්‍යාස මගින් උසෙහි යම් වෙනසක් ඇතිකර ගත හැකි බව ප්‍රකාශ කළද ඒවා මගින් විශාල වෙනසක් කළ නොහැකිය. ඒ නිසා ලබා උපන් උස ප්‍රමාණය කැමැත්තෙන් හෝ අකමැත්තෙන් භාර ගැනීමට සිදු වන්නේය. අපේක්ෂිත තත්ත්වය එසේ වුවත් එසේ යථාර්ථය පිළිගැනීමට හා ඒ අනුව හැසිරීමට ඇතැම් සමාජ ආකල්ප හා විග්‍රහයන් ඉඩ නොදෙන්නේය. උස අඩු අයට “ මිට්ටා ” “ කුරුට්ටා ” “ කුරු මිට්ටා ” “ කොටා ” “ ෂෝටා ” ආදි පද රාශියක් අගෞරවවාචී ලෙස භාවිතයේ පවතී. කෙනෙකුගේ ආත්මාභිමානයට, සමාජ තත්ත්වය හා ගෞරවයට හානියක් නොවන අයුරින් උසෙහි කිසියම් සාපේක්ෂ අඩුකමක් දැක්වීමෙහි වරදක් නැත්තේය.

එහෙත් අද මෙවැනි භාවිත දක්නට ලැබෙන්නේ කෙනෙකුගේ තත්ත්වයට හානිකර අයුරින්ය. ශාරීරික උස පිළිබඳ සැලකිල්ල බොහෝ සමාජවල යම් ප්‍රමාණයකට පැවතියත් උස වැඩිකම හෝ අඩුකම පිළිබඳ ප්‍රශ්නයක් පවතින්නේ සමහර සමාජවල පමණි. ඇතැම් ජපන් කාන්තාවෝ උස වැඩියෙන් දැක්වීමට කැමැත්තෝය. අන් අයට සාපේක්ෂව තමන්ගේ උස අඩු බවට හැ-මක් ඇති අය මේ අතර ප්‍රධාන තැනක් ගනිති. මෙවැනි අය සඳහා අ-ලේ සිට අ-ල් 06ටත් වඩා උසින් වැඩි වූ අඩි සහිත සපත්තු සෙරෙප්පු ආදිය නිෂ්පාදනය කර ජපන් වෙළඳපොළේ අලෙවි කෙරේ. ඒවා භාවිතා කරන්නෝ ද සුලභව සිටිති. උස පිළිබඳ රුචිකත්වය ඊට බලපා තිබේ යැයි සිතමි. උස් මිටිකම් අනුව වෙනස්කම් කිරීමත් එරට ප්‍රකටවම නොවපතී.

ලංකාවේ තත්ත්වය වෙනස් යැයි පෙනී යන්නේ ශාරීරික උස අනුව කෙරෙන වෙනස්කම් ද නොසැලකිලි ද පවතින හෙයිනි. ඇතැම් පාසල්වල ක්‍රීඩා ආදි නොයෙක් කටයුතුවලට ළමුන් තේරීමේදී “ ඔය ළමයා මිටි වැඩියි.” හෝ “ උස මදියි ” කියා කෙරෙන කිසිඳු තාර්කික පදනමක් නොමැති නිගමන ඇත්තේය. “ උස නැති නිසා තෝරා ගත්තේ නැතැයි ” කියා කනස්සල්ලට පත්වන ළමෝ බොහෝ දෙනෙක් පාසල්වල සිටිති. හමුදාවට බැඳීමේදී අවම උසක් ඇත. එය අදාළ කටයුත්තට අවශ්‍ය කායික ලක්ෂණ පිළිබඳ සම්මත නිර්දේශයකි. එහෙත් විවාහයේදී උස ගැන සලකන්නෝ සිටිති. සති අන්ත පුවත්පත්වල පළවන දැන්වීම් අතර මංගල

යෝජනා ප්‍රධාන තැනක් ගන්නා අතර එකී සෑම දැන්වීමකම පාහේ ශාරීරික උස පිළිබඳව සටහනක් ද ඇතුළත්ය. තරුණයෙක් නම් කඩවසම් සිරුරක් සම- උස ගැන සඳහන් වේ. තරුණියක නම් පැහැපත් සිරුරක් සම- උස ගැන තොරතුරු දැක්වේ. උස පිළිබඳ සවිඥානය විවාහයට සහකරුවෙකු හෝ සහකාරියක සොයා ගැනීමේදී බලපාන බවක් මෙයින් හැ-වෙන්නේය. උම්මග්ග ජාතකයේ එන කාලගෝලයා හා දික්තලා ආකෘතියේ විවාහවලට කාන්තාවෝ අකමැති වෙති. ඒ තමාට වඩා ස්වාමියා උසින් අඩු බැවිනි. එහෙත් එසේ විවාහ වූ අය සමාජයේ සිටින අතර ඔවුන්ට එය ප්‍රශ්නයක් වන්නේ සමාජයේ එය උලුප්පා දක්වන විටය. “ මහත්තයා ඔයාට වඩා උස අඩුයි නේද ” කියා ඇතැමෙක් උපහාසාත්මක නොමනා ප්‍රශ්න නගති. ඇතැමෙක් එසේ අන් අයට පීඩා කරති. තමාට වඩා භාර්යාව උසින් වැඩිවීම ගැනද ඇතැමෙක් සතුටු නොවෙති.

ශාරීරික උස් මිටි කම් පිළිබඳ මේ සවිඥානික භාවය ඇති තැන් මෙන්ම නැති තැන්ද පවති. ඇති අය මෙන්ම නැති අයද සිටිති. මෙහිලා හානිකර වන්නේ ජනමාධ්‍ය වලින් විකාශය වන නොයෙක් දැන්වීම් හා වැඩ සටහන් ම්-න් එවැනි විභේදන හුවා දැක්වීමය. වඩාත් භයානක වන්නේ, උස අඩු අයට අගෞරවවාචීව, එනම් ආත්මාභිමානයට හානිකර ලෙස යොදන “ මිටිටා ”, “ කොටා ”ආදි නොමනා ආමන්ත්‍රණ පද මාධ්‍ය ම්-න් විකාශය කෙරෙන වැඩ සටහන් මගින් තව දුරටත් තහවුරු කිරීමය.උස ගැන මෙසේ සවිඥානික වෙති. අඩුපාඩු දැකීමට පටන් ගනිති. මෙතෙක් නොපැවති කනස්සල්ලක් සිත් තුළ රෝපණය කර ගනිති. ඇතැම් වැඩ සටහන් වල උස අඩුකම හුවා දැක්වීම තුළින් ප්‍රේක්ෂකයන් තුළ වින්දනයක් ජනනය කිරීමට ප්‍රයත්න දැරේ. මිනිසුන්ගේ ශරීර ලක්ෂණයක ඌනතාවක් සමාජයීය වශයෙන් හානිකර ලෙස නිර්මාණය කිරීමත් , මාධ්‍ය මගින් එය ප්‍රතිනිර්මාණය කිරීමත් නොහොබිනා ක්‍රියාවක් වන්නේය.

ආබාධිත පුද්ගලයන්ගේ ආබාධිත භාවයෙන් අනිසි ප්‍රයෝජන ගැනීම ද සදාචාර විරෝධී ක්‍රියාවකි. අද ජන මාධ්‍යවලින් විකාශය වන ඇතැම් වැඩසටහන්වල හා වෙළඳ දැන්වීම්වල කිසියම් ආබාධයකින් පෙළෙන චරිත නළුවෝ ර-පාති. එනම් ආබාධිත භූමිකා රංගනය යි. ඒවා ආබාධිත ප්‍රජාවට යහපතක් වනවාට වඩා විණයක් වන ආකාරයට සම්පාදනය වී තිබීම ගැටලුවකි. එක් වෙළඳ දැන්වීමක භාණ්ඩයක් ඉදිරිපත් කරනු ලබන්නේ කථනාබාධයකින් පෙළෙන සෙයක් දක්වන ළමයෙකු විසිනි. කථනාබාධය වූ කලී මෙරට මෙන්ම වෙනත් රටවල ද සැලකිය යුතු පිරිසක් අතර පවත්නා ගැටලුවකි. අපේ රමේ සමාජ ආකල්ප අනුව එවැනි





අයට “ ගොතයා ” යන අපහාසාත්මක වදනින් ආමන්ත්‍රණය කෙරේ. කථාව හොඳටම බැරි නම් “ ගොළුවා ” යැයි කියති. තම පවුලේ කෙනෙකුට තබා සමීප මිතුරෙකුටවත් “ ගොතයා ” හෝ “ ගොළුවා ” කියා ආමන්ත්‍රණය කරනවා ට කිසිවෙක් කැමති නොවෙති. එවැනි ප්‍රශ්න මතුකොට දැක්වීම ද ඔවුන්ගේ මනාපයට හේතු නොවන්නේය. දරුවන්ගේ එවැනි ප්‍රශ්න දෙමව්පියන්ට ද මානසික වධයකි. බොහෝ දෙමව්පියෝ ඉන් තැවෙති. ප්‍රතිකාර පතා නොයෙක් පරිශ්‍රම දරති.මෙවැනි පරිසරයක් තුළ කථනාබාධයක් හෝ වෙනයම් ආබාධයක් ප්‍රේක්ෂක ආකර්ෂණ කාරකයක් ලෙස යොදවා ගැනීම සාමාන්‍ය සමාජ සදාචාරයට කිසිසේත් එක-නොවන්නේය. එවැනි දැන්වීම් දකින දකින වාරයක් පාසා අදාළ ගැටලුවෙන් පෙළෙන අයට ද සමීප ඥාතීන් ඇතුළු දෙමව්පියන්ට ද චෛතසික පීඩාවක් ගෙන දෙන්නේය. අදාළ ප්‍රශ්නය ඇත්තේ පාසල් දරුවෙකුට නම් සමවයස් කණ්ඩායම් තුළදී එකී ප්‍රශ්නය වඩාත් අවධාරණය වීමටද එය බලපාන්නේ ය.

චිත්‍රපට හා ටෙලි නාට්‍ය ආදී සමහර නිර්මාණවල ද කථනාබාධය ප්‍රේක්ෂකයන් තුළ වින්දනය හා හාස්‍යය ඇති කිරීමේ කාරකයක් ලෙස භාවිත වන බව පෙනේ. “ ගොත ගසන ” විහිළු කාරයෝ, ගොත ගසන ළමෝ හා වැඩිහිටි ගැමියෝ, මෙරට විකාශය වන ඇතැම් චිත්‍රපට හා ටෙලි නාට්‍යවල බොහෝ සිටිති. අමනෝඥ ලෙස “ ගොත නළුවන් ”මගින් නිර්මාණය රස ගැන්වීමට ප්‍රයත්න දරන්නෝ අද ද සිටිති. තමන් මෙසේ අවඥාවට ලක් කරන්නේ කුමක් ද යන්න පිළිබඳ අවබෝධයක් ඔවුන් තුළ නැතුවා සේය. කෙනෙක් “ ගොත ගසන්නේ ” එක්කෝ තවම භාෂාව හැසිරවීමේ කුසලතාවය මැනවින් ප්‍රගුණ වී නොමැති නිසාය. එසේ නැත්නම් එවැන්නක් වළක්වනු ලබන කායික ආබාධයක් නිසාය. ඒ ගැන අනුකම්පා සහගතව බැලීම හා එවැන්නක් අදාළ පුද්ගලයාගේ ආත්මාභිමානයට හානිකර නොවන ලෙසට කටයුතු කිරීම සමාජයේ වගකීම වන්නේය. ඉවක් බවක් නෙමැතිව වන සතුන් ප්‍රිති වන්නා සේ කථනාබාධ ප්‍රතිනිර්මාණය කරමින් වින්දනය, ප්‍රීතිය, හාස්‍යය ජනනය කරීමට ප්‍රයත්න දැරීම කිසිදු මානව ගුණධර්මයකට එක-නොවන්නේ ය.

ආබාධිත ප්‍රජාවට සෙතක් ශාන්තියක් සැලසෙන්නා වූ වැඩ සටහන් නිර්මාණය කිරීමේ වරදක් නොමැත. එවැනි වැඩ සටහන් ම්-න් ආබාධිත ප්‍රජාව පත්ව ඇති තත්ත්වයෙන් ගොඩ ගත හැකිය. ආබාධිත අය පදනම් කොටගෙන ඔවුන්ගේ ඥාතීන් හා සමීපතමයන් මුහුණ දෙන ගැටලු ද විසඳා ගත හැකිය. අපේ සමාජයේ ආබාධිත අය විෂයෙහි විවිධ ආකල්ප මතිමතාන්තර හා අර්ථ

විවරණ පවතී. ආබාධිත අය හැඳින්වීම සඳහා භාවිත වන පද අතර අපහාස කාරක පද විශාල සංඛ්‍යාවක් ඇත්තේය. අන්ධයා, කනා, පොම්ටයා, ගොතයා, ගොළුවා, බීරා, කොරා,නොණ්ඩියා, බකලයා, සොත්තියා, මුක්කමා, කුදි, කුදා, අතකොටා,පිස්සා, ආදිය ඉන් සමහරකි. මේ හා සබැඳි පවතින ආකල්ප යහපත් ඒවා නොවේ. එවැනි ලක්ෂණ ඇති අයට සමාජය තුළ නිසි සැලකිල්ලක් නොලැබේ. රැකි රක්ෂාවලට වරම් නොලැබීමට පවා එය හේතු වේ. විවාහය ද සිහිනයක් පමණක් ම වන තරමටම මේ ආබාධිත ලක්ෂණ විසින් අදාළ පුද්ගලයා කොන් කරනු ලැබේ. සමහරෙක් ආබාධිත පුද්ගලයන් හා බැඳි පවතින සමාජ ආකල්පවල ප්‍රබලතාව හේතු කොට ගෙන මහත් චෛතසික පීඩා විඳිති. ඊට ප්‍රතිචාර ලෙස ආබාධිත දරුවන් සමාජයෙන් වසන් කිරීමට ද ක්‍රියා කරන අය සිටිති. එසේම සමාජ සම්බන්ධතාවලින් සපුරා බැහැර කර තැබීම ද සමහරෙකුගේ ප්‍රතිචාරයකි. ආබාධිත දරුවන් රහසිගතව මරා දැමීම පිළිබඳ ප්‍රශ්න ද ඇතැම් විට අසන්නට ලැබෙන්නේය. ආබාධිත දරුවෙකුගේ උපත පවුලට අභාග්‍යයක් කොට සලකන මතිමතාන්තර හා ආකල්ප ඉතා හානිකර ලෙස ආබාධිත අයට ද අදාළ ඥාතීන්ට ද බලපාන්නේ ය. මේ ලිපියේ දී ඒ සියල්ල සාකච්ඡා කිරීමට අදහස් නොකෙරේ. අපේ සමාජයට අද මධ්‍ය වැදගත් වන්නේ මේ භයානක අගාධයෙන් ආබාධිත ප්‍රජාව හා ඔවුන්ගේ දෙමව්පියන් ඇතුළු පීඩාවට පත් සමීපතමයන් ගොඩ ගැනීම සඳහා ය. ඔවුන් ඵලදායි ලෙස සමාජ ක්‍රියාකාරීත්වයට හා සංවර්ධනයට දායක කිරීම සඳහා ය. ඒ සඳහා මාධ්‍ය මගින් ඉටු කළ හැකි කාර්යභාරය සුළු පටු නොවන්නේ ය. හඬක් නැති අසරණයන්ට හඬක් වී ඔවුන්ගේ පෞද්ගලික හා සමාජ උන්නතිය සැලසීම මිල කළ නොහැකි සමාජ සේවයක් වන්නේ ය.

විය යුතු දෙය එසේ වුවද අද සිදු වන්නේ ඉඳුරා වෙනස් දෙයක් බව ප්‍රේක්ෂක කාගේත් අත්දැකීම බවට සැකයක් නොමැත. කායික ආබාධ පමණක් නොව මානසික ආබාධවලින් පෙළෙන බව නිරූපණය කරන දර්ශන විවිධ වැඩ සටහන් නැරඹීමේදී දක්නට ලැබෙන්නේ ය. එකී වැඩ සටහන්වල අබාධිත චරිත ම්-න් ආබාධිත බව උලුප්පා දක්වනු ලැබේ. විනෝදය සම්පාදනය කරනවා යැයි කියන ඇතැම් වැඩ සටහන්වල ආබාධිතභාවය සිනහවට ලක් කරනු ලැබේ. මානසික රෝගවලින් පෙළෙන අය සාමාන්‍ය ජනයාට වඩා වෙනස් වූ චර්යාවක් නිරූපණය කරති. ඔහු හෝ ඇය එවැන්නක් නිරූපණය කරන්නේ ප්‍රකෘති සිහියකින් නොවේ. ප්‍රකෘති සිහියක් ඇත්නම් එවැනි විකෘති චර්යා නිරූපණය නොකරනු ඇත. කිසියම් කලාකරුවෙක් මේ මානසික රෝගී චර්යාව හුවා දක්වා ප්‍රේක්ෂකයන් නියමින් හෝ අනියමින් පිනවීමට යත්න දරන්නේ නම් ඉන් එකී





කලාකරුවාගේ සාරධර්ම පදනමේ පරිහානිය ම පිළිබිඹු වන්නේ ය. මෑතක විකාශය වූ එක් ටෙලි නාට්‍යයක මානසික රෝගී චරිතයක් විය. හැඩි දැඩි මහත නළුවෙක් සාමාන්‍ය පිස්සු චරිතයක් එහි ර-පෑවේය. මේ චරිතය කුමක් සඳහා ඒ නාට්‍යයට ඇතුළත් කළේ ද යන්න පවා අපහැදිලි තරමටම කෘත්‍රිම ලෙස එකී චරිතය කතාවට ඇතුළත් කරන ලද්දක් බව දර්ශන වාර එක දෙක විකාශය වන විටම පැහැදිලි විය. ඒ චරිතය හසුරුවා ඇති ආකාරය අනුව මැනවින් පෙනී යන්නේ “ පිස්සු චරිතයක් ” තුළින් ප්‍රේක්ෂකයන් සතුටු කිරීමට දැරූ වෑයමකි. ඔහුගේ “ පිස්සු රංගනය ” දැක ළමෝ උඩ පැන පැන සිනා සුනහ. තවද එය අනුකරණය කළහ. වැඩිහිමියන් ද තම තම නැණ ගුණ මට්ටමට අනුව සිනාසී සතුටු වූ අවස්ථා ද උපේක්ෂාවෙන් බලා සිටි අවස්ථා ද විය. තවත් නාට්‍ය කීපයක ස්නායු රෝග වලින් පෙළෙන බවක් අ-වන චරිත දක්නට ලැබේ. ඇතැම් ස්නායු ආබාධ ඇති අය අසාමාන්‍ය ලෙස ඇස් පිල්ලන් ගසති. ඇතැමෙක් තම ශරීරයේ නහර උලුප්පාලමින් අසාමාන්‍යතාවක් පෙන්වති. තවත් එවැනි විවිධ ලක්ෂණ තිබේ. නොකඩවාම අත කට වෙව්ලීම වැනි දෑ ඒවාට ඇතුළත් ය. මෙවැනි කායික රෝගාබාධයන් ඇති අය සමාජයේ කොතෙකුත් සිටිති. ඔවුහු ඒවා සුවකර ගැනීමට ද මහත්සේ වෑයම් කරන්නාහ. ප්‍රතිකාර සඵල නොවීම හේතුවෙන් නිතර තැවෙමින් කනස්සල්ලෙන් පසු වන අයද සිටින බව මෙහිදී අමතක නොකළ යුතුය.

එසේම ස්නායුගත රෝග හා වෙනත් කායික හා මානසික රෝගවලින් හා ආබාධවලින් පෙළෙන අය සමාජයීය වශයෙන් ද නොයෙක් අපහසුතාවලට ද ලක්වී සිටින බව සඳහන් කළ යුතුය. අසාමාන්‍ය ලෙස අත කට වෙව්ලීම ක්ෂණිකව ශරීරයේ නහර ප්‍රබෝධ වී මතු වී ඒම, ක්ෂණික කායික වෙනස්වීම, ගැස්සීම්, විසිවීම් ඇතිවීම ආදිය නිසා ඒ අයට සාමාන්‍ය සමාජ සම්බන්ධතාවලදී ද රැකී රක්ෂා ආදියේ දී ද, වෙළඳපොළ ආදියේදී ද නොයෙකුත් අපහසුතාවලට ලක් වීමට සිදුව තිබේ. ඒ නිසාම එයින් පෙළෙන බවද සඳහන් කළ යුතුව ඇත.

මෙම ප්‍රශ්නවල බරපතලකම නොදන්නා ඊනියා කලාකරුවෝ එවැනි ලක්ෂණ සහිත චරිත තමන්ගේ චිත්‍රපට, සංගීත, නාට්‍ය ආදියට ද ඇතුළත් කොට නැති ප්‍රශ්න ඇති කරති. නාට්‍ය ආදියෙහි එන මෙවැනි චරිත ම්-න් එවැනි ප්‍රශ්න හෝ ලක්ෂණවලින් සැබෑවට ම පෙළෙන අයට සිදුවන හානිය, ඒ පවුල්වල අයට සිදුවන හානිය හෝ චෛතසික පීඩාව ගැන කල්පනා නොකිරීම මහත් අඩුවකි. ම-තොටේදී වුවද යම් යම් අපහසුතාවලට ලක් වීමට පවා මේ සිනමා, සංගීත හා ටෙලි චරිත හා වෙළඳ දැන්වීම් චරිත බලපාන්නේය. ඇතැම් අය උක්ත ආබාධයක්,

රෝගී ලක්ෂණයක් සහිත අය දුටු විට අසවල් ටෙලි නාට්‍යයේ අසවලා වගේ යැයි කියන අවස්ථා ඇත. තව කෙනෙක් අසවල් චරිතයේ එන කෙනාම වගේ යැයි කියමින් සාමදතා ගොඩ නගති. මේ සියලු ගැලපීම් මගින් මෙතෙක් අවධාරණය නොවූ ශාරීරික අඩු පාඩුවක්, ආබාධයක්,රෝගී ලක්ෂණයක් කෙරෙහි සමාජ ඇස විශේෂයෙන් යොමු කෙරේ. එය යොමු වන්නේ ධනාත්මක වශයෙන් සෙතක් ශාන්තියක් උදෙසා නොවේ. හුදෙක් සංසන්දනය හා එම්-න් සැබෑ රෝගීන් හා ශාරීරික අඩු පාඩුවලින් පෙළෙන අය අභිනවයෙන් අපහසුතාවලට ලක් කෙරෙන පරිදිය. මේ වූ කලී මහත් අභාග්‍ය සම්පන්න තත්ත්වයකි.

මිනිසුන් සිනහා විය යුත්තේ මිනිසුන් සම-ය. මිනිසුන්ට සිනහා වීම මිනිස්කමට නොහොබිනා දෙයකි. ප්‍රීති වීම, ජීවිතය වින්දනය කිරීම, සංතෝෂය ලැබීම හා සම්බන්ධ මූලධර්මය විය යුත්තේ මානව හිතවාද යයි. ආබාධිතයන් දෙස බලා සිනාසීම හෝ සිනාසීමට සැලැස්වීම සදාචාර විරෝධී ක්‍රියාවකි. කවර ආකාරයේ හෝ වින්දනයක් සඳහා කායික අඩුපාඩුකම්, ඌනතා හා ලක්ෂණ මතුකොට දැක්වීම යහපත් නොවන්නේය. හිසේ කොණ්ඩය නැතිවිට ඊට “ තට්ටය ” යැයි කියනු ලැබේ. එවැනි පුද්ගලයන්ට “ තට්ටයා ” කියා ව්‍යවහාර කරතත් එය ප්‍රසිද්ධියේ ජනමාධ්‍ය තුළින් ප්‍රකාශ කිරීමට තරම් සදාචාර සම්පන්න ව්‍යවහාරයක් නොවේ. ඇතැම් කලාකරුවෝ හිස බූ ගාගෙන තමන්ට “තට්ටයා” ලෙස ආමන්ත්‍රණය කරවා ගනිති. මහ ඉහළින් වේදිකා දෙවනත් වන පරිදි උපහාසාත්මක හා අපහාසාත්මක ලෙස භාවිත වන මේ ව්‍යවහාර අපට අසන්නට ලැබේ. මේවා මගින් කලාකරුවන් හැදෙන පරපුරට දෙන්නට හදන්නේ කවර ආදර්ශයක්ද? විනෝදයට කෝකත් “ බයිට් ” කිරීමේ ප්‍රවණතාවක් දැන් දැන් මතුවෙමින් පවතී. ඒ සඳහා ශාරීරික ලක්ෂණ ද ඌනතා ද යොදා ගැනීම මිනිසාට තරම් නොවේ.

අපේ අය මිනිසුන් සම- සිනා සීමට වඩා මිනිසුන්ට සිනාසීමට වැඩි රුචිකත්වයක් දරන්නේ ද යන ප්‍රශ්නයක් ම සිත පැන නගින්නේ මේ පසුබිම තුළය. අවඥාවට ලක් නොකළ යුතු, සිනාවට ලක් නොකළ යුතු, අපහාසයට උපහාසයට ලක් නොකළ යුතු කායික අසමානතා, රෝගාබාධ, දුර්වලතා, මානසික රෝගී ලක්ෂණ ආදිය දඩමීමා කොට ගෙන සතුට සම්පාදනය කරන්නෝ කවරහු ද? වෙළඳ ප්‍රචාරය සඳහා ඒවා අමුද්‍රව්‍ය කර ගන්නෝ කවරහුද? මහජනයා තුළ ව්‍යාධි භය,රෝග භය, මරණ භය හා සොර බිය ආදිය ජනිත කොට ව්‍යාපාර කිරීමට ප්‍රයත්න දරන්නෝ කවරහුද ? රක්ෂණය සඳහා මිනිසුන් පොළඹවා ගැනීමට එවැනි භීතියක් ඇති කිරීම අවශ්‍යම ද? මිනිසුන්ගේ “හදවතට පහර දී”කෙරෙන





පෙළෙඹවීම්වලට වඩා වෙනත් වැදගත් උපාය මාර්ග සොයා ගත නොහැකිද?. මෙවැනි නොමනා ක්‍රියාකාරකම් රාශියක් අපේ මාධ්‍ය තුළින් පසුගිය වකවානුව තුළ ප්‍රදර්ශනය විය. මේ කිසිවක් සදාචාර සම්පන්න නොවන්නේය. නිර්මාණකරුවන් ව්‍යාපාරිකයන් ඇතුළු මාධ්‍යකරුවන් මෙවැනි අහිතකර තත්ත්වයන් කෙරෙහි අවධානය යොමු කිරීම කාලීන අවශ්‍යතාවකි.

අපේ අයගේ මිනිසුන්ට සිනාසීමේ චර්යාව මැනවින් ප්‍රදර්ශනය කරන නාට්‍යාංගයකි, සුළු ජාතිකයින්ගේ සිංහල භාෂා ව්‍යවහාරය පිළිබඳ ඊනියා ආදර්ශය. මෙරට සිංහල ජාතිය හැරෙන විට මුස්ලිම් හා දෙමළ ජාතිකයෝ ද සිටිති. ඔවුන්ගෙන් සමහරෙක් හොඳට සිංහල කතා කරන අතර සමහරෙකුට සිංහල කතාව තරමක් අපහසුය. මේ අපහසුතාව එනම් වැරදි සිංහල උච්චාරණය මෙරට නිෂ්පාදනය වන චිත්‍රපට හා නාට්‍යවල ද වෙනත් කලා කෘතිවල ද “ සුළු ජාතින්ගේ සිංහල භාෂා ව්‍යවහාර ආදර්ශයක් ” වන තරමට අවධාරණය වී ඇත. මුස්ලිම් හෝ දෙමළ චරිත ඇත්නම් ඒ චරිතවල අය කතා කරන්නේ කැඩුණු සිංහල දෙමළ ඌරුවටය. නිවැරදි සිංහල උච්චාරණය කරන දෙමළ හෝ මුස්ලිම් චරිත ද දක්නට නොලැබෙන තරම්ය. දෙමළ හෝ මුස්ලිම් චරිතයක් ම්-න් කැඩුණු සිංහල දෙමළ උවදුරට ඉදිරිපත් කරමින් විනෝදය නිෂ්පාදනය කිරීමට උත්සාහ කරන්නෝ මෙහිදී ප්‍රධාන තැනක් ගනිති. භාෂා ව්‍යවහාරයේ ඌනතාවක් අල්ලාගෙන මිනිසුන්ට සිනාසීම හෝ සිනා උපදවීමට කටයුතු කිරීමට හා කටයුතු සැලැස්වීම කොතෙක් දුරට සදාචාර සම්පන්න ද යන්න ප්‍රශ්න කළ යුතුව පවතී.

නිවැරදි ලෙස භාෂාව කතා නොකිරීම හෝ උච්චාරණය නොකිරීම ගැන දෙමළ හෝ මුස්ලිම් ජාතිකයන්ට සිනාසෙමින් ඔවුන්ගේ සිංහල උච්චාරණය හා වාග් විලාශය විසුලුවට නගන සිංහලයෝ ද තමන්ගේ බසවත් හරි හැටි නොදන්නෝ වෙති. අද මාධ්‍යවල ප්‍රචාරක කටයුතුවලද නොඑක් සන්නිවේදන කටයුතුවල ද මහත් උජාරුවෙන් යෙදී සිටින ඇතැම් සිංහලයන්ගේ භාෂා ව්‍යවහාරය, උච්චාරණය හා වාග් විලාශය ඉතාම දුර්වල තත්ත්වයක පවතී. සමහරෙක් ඉංග්‍රීසිය මිශ්‍රකොට ගත් අමුතු සිංහලයක් කතා කරති. මේ අතර වැරදි ලෙස සිංහල උච්චාරණය කරමින්, ඉංග්‍රීසි තාලයට සිංහල කතා කරමින් මෙරට භාෂාවට කරන විණය ද සුළු නොවන්නේය. සැබැවින්ම හාස්‍යයට ලක්විය යුත්තේ ස්වභාෂාවත් හරි හැටි හසුරුවා ගැනීමට, උච්චාරණය කිරීමට අසමත් වීමය.

මව් භාෂාව මෙන්ම පුද්ගලයන් කතා කරන අනෙකුත් භාෂා පිළිබඳ කුසලතාවේ යම් යම් අඩුපාඩු තිබිය හැකිය. අපේ රටේ ඉංග්‍රීසි දෙවන බස හැමියට කතා කරන සිංහල දෙමළ හා මුස්ලිම් ජනයා අතර ප්‍රවීණයන් මෙන්ම එතරම් ප්‍රවීණත්වයක් නොදක්වන නොදරන අයට ද ඇතමෙක් සිනාසෙති. “ කැඩුණු ඉංග්‍රීසි ” කතා කරන්නේ ය යන්න මෙරට භාවිත වන්නේ ලජ්ජාවට කරුණක් වනසේය. දෙවන භාෂාවක් කතා කිරීමේ දී යම් යම් අඩුපාඩුකම් ඇතිවීම ස්වභාවික වුවත් එය පිළිගැනීමට අපේ උද්දච්ච සමාජය සූදානම් නැත. මෙරට තත්ත්වය එසේ වුවත් වෙනත් රටවල් බොහෝමයක තත්වය ඉඳුරාම වෙනස්ය. ජපන් ජාතිකයෝ කිසි විටකත් ඉංග්‍රීසි වරද්දන අයට සිනා නොවෙති. ඒ නිසා මිනැම කෙනෙකුට තම තමන්ට හැකි පමණින් ඉංග්‍රීසියෙන් අදහස් දැක්වීමට එරට විද්වත් සභාවල කාටත් අවස්ථාව ලැබී ඇත්තේය.

සමාජයක් සංවර්ධනය  වන විට, ප්‍රතිගාමී වන විට ඒ සමාජවලින් බැහැර විය යුතු දුර්ගුණ රාශියක් ඇත්තේය. මේ ලිපියේ දී අවධාරණය කරන ලද්දේ එවැනි දුර්ගුණ කීපයක් ගැන පමණි. විශේෂයෙන්ම මිනිසුන්ගේ කායික, මානසික හා වෙනත් අඩුපාඩුකම්, දුර්වලතා ආදිය පිළිබඳව සමාජයේ පවත්නා නොමනා ආකල්ප, විශ්වාස, අර්ථ විවරණ හා බැල්ම වෙනස් විය යුතුය. අද සමාජයට “ තොරතුරු සමාජය ” යැයි ද කියනු ලැබේ. ඒ තොරතුරු තාක්ෂණයේ උන්නතිය ඇති වී විපර්යාසය මතු කොට දැක්වීමටය. බහුවිධ ජනමාධ්‍ය හා සන්නිවේදන මාධ්‍ය තැනකට දෙතැනකට සීමාව වූ තොරතුරු සමස්ත සමාජය පුරාම විසිරුවාහරී. වෙනත් සංස්කෘතිකාංග පිළිබඳ තත්ත්වය ද එසේය.  එවැනි පරිසරක් තුළ විවිධ ශරීර ලක්ෂණ හා ආබාධ පිළිබඳ සමාජයේ පවත්නා නොමනා ආකල්ප වඩාත් තහවුරු වන අයුරින් සම්පාදනය වූ වැඩසටහන් මාධ්‍ය තුළින් විකාශය වීම යෝග්‍ය නොවන්නේය. සංස්කෘතියක් පරම්පරාවකින් පරම්පරාවකට ගෙනයාම ද සංස්කෘතිය වෙනස් කිරිමට ද, ඊට අලුත් අංග එකතු කිරිමට ද බහුවිධ ජනමාධ්‍ය උපකාර වන්නේය. මේ තත්ත්වය තේරුම් ගෙන ක්‍රියාකිරීම ඉතා වැදගත් බව අවධාරණය කළ යුතුව ඇත්තේය. මෙහිදී මිනිසුන්ගේ ආත්ම ගරුත්වය ආරක්ෂා කළ යුතුය. ප්‍රේක්ෂකයෝ සර්ව සම්පූර්ණ අය නොවෙති. විවිධ ශාරීරික ලක්ෂණ, ආබාධ, රෝග හා ගැටලුවලින් පෙළෙන අයගෙන් ප්‍රේක්ෂක ප්‍රජාව සමන්විත වන්නේය. කිසියම් වැඩසටහනකින් අපහාසයට, උපහාසයට, හාස්‍යයට භාජන කරනු ලබන ශරීර ලක්ෂණයක් හෝ ආබාධයක් හෝ සහිත අයද ප්‍රේක්ෂකයන් අතර සිටිති. අදාළ වැඩසටහන නරඹන ඔවුන් තුළ ඇති වන චෛතසික තත්ත්වය කවර ආකාර විය හැකි ද යන්න අමුතුවෙන් විස්තර කළ යුතු නොවේ. මේ නරක ප්‍රවණතාව





ඇතැම් සංස්කෘතිකාංගවලට ද බලපා ඇත්තේය. ඇතැම් වැඩසටහන් මි-න් අපේ ගැමිකම, ගැමිබස, ගැමි සිරිත, ගැමි හාස්‍යයට උපහාසයට හා අපහාසයට ලක් කෙරෙන්නේය. මෙරට ජනයාගෙන් තවමත් සියයට හැත්තෑ පහකට වඩා වැඩි පිරිසක් ගම්වල ජීවත් වන්නෝය. නාගරික සංස්කෘතියේ ඇතැම් මිනුම් දඬු ඉදිරියට දමමින් ගැමි චරිත කිසියම් හැල හැප්පීමකට භාජන කොට ප්‍රේක්ෂකයන් වින්දනයට පත් කිරිමේ නාට්‍යාදිය අපේ මාධ්‍ය වලින් විකාශය වීම අනුමත කළ නොහැක. මෙකී ප්‍රශ්න ගැන ප්‍රමාණවත් අවධානයක් යොමු කිරීම අදාළ සියලු අංශවල වගකීම වන්නේය.

දුබල ගති මතු කොට
සිනා නොමසෙන කිසි විට
කලා කෙත සරු කොට
වඩාලමු දන මන තුට

# 12

# විධාන මාධ්‍ය භාවිතය තුළ මැතිවරණ ප්‍රචාරය

ධම්ම දිසානායක

සන්නිවේදන නාලිකාවක් ලෙස මාධ්‍යය දේශපාලන ප්‍රභූන් සහ ජනතාව අතර ප්‍රබල භූමිකාවක නිරත වෙයි. එහිදි ජනමතය (Public Opinion) හැඩ ගැස්සවීමේ ඉන්ද්‍රජාලික හැකියාවක් (Magical Capacity) මාධ්‍ය සතුව පවතී. ඔස්මින් රනේ (Ranney) දක්වන ආකාරයට බහුතර ජනතාවගේ මූලික සංස්ථාපන මෙන්ම නිශ්චිත මත හැඩගැස්වීමෙහිලා මාධ්‍ය සෘජුව මැදිහත් වේ. මාධ්‍ය සතුව පවතින මෙම හැකියාව විසින් වර්තමානයේ අප ජිවත් වන සමාජය තුළ දේශපාලනය නව ඉසව්වකට තල්ලු කොට ඇත. දේශපාලනය මාධ්‍යකරණයවීම (Medialisation of Politics) නමින් එම නව ඉසව්ව නම් කළ හැකිය. 1960 දශකයේ යුරෝපයේ ආරම්භ වූ මෙම පැරඩයිම වෙනස තුළ ජනතා කේන්ද්‍රිය ජනසේවා මාධ්‍ය භාවිතයෙන් වෙළඳපළ අරමුණු කේන්ද්‍රිය මාධ්‍ය භාවිතයන් බවට පරිවර්තනය විය. වර්තමානය වන විට ලෝක ගෝලයම මාධ්‍ය තුළ සිදුවූ මෙම පැරඩයිම විස්ථාපනය නිසා නිර්මාණය වන අත්දැකීම් වලින් යුක්තය. එහිදි සමාජය සහ තනි පුද්ගලයා තීන්දු ගන්නෙක්/ ගන්නියක්, තෝරන්නෙක්/ තෝරන්නියක් , සිතන්නෙක්/ සිතන්නියක් ලෙස නොව අවනතවන්නෙක් / අවනතවන්නියක් ලෙසට මාධ්‍ය විසින් පිරිහෙළා ඇත. එහි දි වර්තමාන මාධ්‍ය හැඳින්විය යුත්තේ ජනමාධ්‍ය (Public Media) යනුවෙන් නොව විධාන මාධ්‍ය (Commanding Media) යනුවෙනි. මන්ද මාධ්‍යයේ අණසකට හෝ විධානයක බහුජනයා ප්‍රබල ලෙස අවනත වී ඇති බැවිනි.





මේ පිළිබඳ සලකා බැලීමේ දි සමීර් අමීන් විසින් ඉදිරිපත් කොට ඇති මාධ්‍ය ඒකාධිකාරිය (Media Monopoly) පිළිබඳ අදහස ද ඉතා වැදගත්ය. සමස්ත ලෝක ගෝලයම හසුරුවන මාධ්‍ය ඒකාධිකාරයක් පිළිබඳ තර්කය ඔහු විසින් තහවුරු කරනු ලැබ ඇත.

මාධ්‍යයේ බලවත් බව පිළිබඳ වු බොහෝ අවධානයන් විද්‍යුත් මාධ්‍ය කේන්ද්‍රිය ඒවාය. එයිනුත් රූපවාහිනී මාධ්‍ය පිළිබඳ වු අවධානයන් බහුලය. එහෙත් ලෝක මාධ්‍ය භාවිතයන් පිළිබඳව අවධානය යොමු කිරීමේ දි පෙනී යන්නේ පෝස්ටර් දැන්වීම්, දැන්වීම් පුවරු සහ පත්‍රිකා ආදිය ද මාධ්‍ය ක්‍රියාන්විතයේ ප්‍රබල උපකරණ බවයි. එනිසා මෙම පත්‍රිකාව තුළ උත්සාහ දරා ඇත්තේ ශ්‍රී ලංකාවේ ප්‍රාදේශිය සභා මැතිවරණ ප්‍රචාරක ව්‍යාපෘතිය තුළ ක්‍රියාත්මක පෝස්ටර් ප්‍රචාරක ව්‍යාපාරය පිළිබඳ විමර්ශනයක් සිදු කිරීමටය. 2002 වර්ෂයේදී පැවැත්වෙන ප්‍රාදේශිය ආණ්ඩු මැතිවරණයේ දි ප්‍රාදේශිය සභා දහයක මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරයේ තොරතුරු මෙම පත්‍රිකාව සඳහා යොදා ගැනේ. එනම් මාවතගම, හලාවත, නිවිතිගල, රඹුක්කන, රත්නපුර,බිංගිරිය, අලව්ව, අක්මීමන, කොමිකාවත්ත, මුල්ලේරියාව, දඹාන යනුවෙන් වු ප්‍රාදේශිය සභා දහයක මැතිවරණ ප්‍රචාරක ව්‍යාපෘතියේ පොස්ටර්, දැන්වීම් සහ පත්‍රිකා ආශ්‍රයෙන් මෙම විමර්ශනය සිදුකොට ඇත.

ශ්‍රී ලංකාවේ මැතිවරණ ආශ්‍රිත ප්‍රචාරක ව්‍යාපාරය දෙස බැලූ විට පෙනී යන්නේ එය ප්‍රජාතාන්ත්‍රිය සහ යහ ආණ්ඩුකරණ භාවිතයකට විරුද්ධ එකක් වන බවයි. විශේෂයෙන්ම සමානුපාතික මැතිවරණ ක්‍රමය තුළ ඇති මනාප ක්‍රමය නිසා අපේක්ෂකයන් අතර ඇතිවන බල තර-ය මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය තුළ දැකිය හැකිය. එනිසාම සත්‍ය සංයුක්ත දේශපාලන සංවාදයක් ගොඩනැ-ීම සිදු නොවී අසත්‍ය, අතිශයෝක්තිමය හා ව්‍යුක්ත දේශපාලන ප්‍රකාශයන් ප්‍රචාරක ව්‍යාපාරය තුළ මතු වනු දැකිය හැකිය. මෙකී ප්‍රචාරක ව්‍යාපාරය තුළ දක්නට ලැබෙන ප්‍රචණ්ඩ ක්‍රියා මතුවීම් එම ක්‍රියාදාමයේ ප්‍රජාතාන්ත්‍රිය නොවන නිදසුනකි. ශ්‍රී ලංකාවේ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ ආයතනවල තොරතුරුවලට අනුව බොහෝ මැතිවරණ ප්‍රචණ්ඩත්වයන් සිදු වී ඇත්තේ මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය තුළදීය.

මෙහිදී විමර්ශනයට ලක් කෙරෙන ප්‍රාදේශිය ආණ්ඩු මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය තුළ දක්නට ලැබුණේ ඉහත කී ආකාරයේ අතිශයෝක්තිමය සහ ව්‍යුක්ත දේශපාලන සංවාද ගොඩනැගීමේ ක්‍රියාවලියයි. එමෙන්ම ජාතික මට්ටමේ දේශපාලන

සංවාද ප්‍රාදේශීය තලයේ ප්‍රකාශයට පත්වීමක් මිස ප්‍රාදේශීය සංදර්භයක් තුළ ප්‍රාදේශීය උනන්දුන් හා ආශාවන් තුළ ප්‍රකාශයට පත් වීම නොවේ. එසේ ප්‍රාදේශීය උනන්දුන් ප්‍රකාශයට පත් වුවා නම් ඒ ඉතා අවම වශයෙනි. එම තත්ත්වය ප්‍රජාතාන්ත්‍රිය හා යහ ආණ්ඩුකරණය ප්‍රාදේශීය මට්ටමින් අසාර්ථක වීමට හේතුවකි.

ඉහත දැක්වූ ප්‍රාදේශීය සභා 10 තුළ දක්නට ලැබුණ ප්‍රචාරක ව්‍යාපාරය ආශ්‍රයෙන් ප්‍රාදේශීය ආණ්ඩුකරණයේ ප්‍රකාශවීම් සවිස්තරාත්මකව පැහැදිලි කරගැනීම සිදු කර ඇත්තේ පොදුජන එක්සත් පෙරමුණ, එක්සත් ජාතික පක්ෂය හා ජනතා විමුක්ති පෙරමුණ යන ප්‍රධාන පක්ෂ තුනක මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය පදනම් කොටගෙනය. මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය තුළ මතු වූ තේමා ප්‍රධාන වශයෙන් කොටස් පහකට වර්ග කර දැක්විය හැකිය.

1. පවුල් පසුබිම හා ඥාති සබඳතා දැක්වීම.
2. දේශපාලන නායකයන් හා ප්‍රභූන් සම- ඇති සම්බන්ධතා දැක්වීම.
3. තමන් කළ හා ඉදිරියේ දි කිරිමට අපේක්ෂිත කාර්යන් දැක්වීම.
4. ජාතික දේශපාලන සංවාදයට අදාළ අදහස් දැක්විම.
5. විශේෂ වදන් භාවිත කරමින් පුද්ගල ප්‍රතිරූපය ජනප්‍රිය කර දැක්වීම.

## 1. පවුල් පසුබිම, සමාජ තත්ත්වය හා ඥාති සබඳතා දැක්වීම :-

පවුල් පසුබිම හා ඥාතීත්වය දැක්වීම තුළින් උත්සාහ කොට ඇත්තේ තමා අපේක්ෂකයෙකු ලෙස ඉදිරිපත් වීමට යුක්ත යුක්ති භාවයක් ලබා ගැනිමටයි. එය සාම්ප්‍රදායික යුක්ත යුක්ති භාවයක් අපේක්ෂා කිරිමකි. එනම් ලාංකීය සමාජය තුළ පවතින වැඩවසම් සමාජ සබඳතා ජාලය සහ පවුල් කේන්ද්‍රිය ප්‍රභූ බලය ඔස්සේ තම අපේක්ෂකත්වයට ජනතාව වෙතින් අනුමැතිය ලබා ගැනිම මින් අපේක්ෂිතය.

මා තාරුණ්‍යයේ වුවද දේශපාලන පන්නරය ලැබුවේ
........ ප්‍රාදේශිය සභාවේ හිටපු විපක්ෂ නායක අපෙන්
සදහටම සමුගත් .......... වන මගේ මහප්පාගෙන්ය.

තමන් සතු දේශපාලන අවබෝධය හා දේශපාලන අත්දැකීම් ස්වකීය පරම්පරාව තුළින් ලබා ගත් බව එම අපේක්ෂකයා ප්‍රකාශ කරයි. එසේම සිය





තරුණ වයස පිළිබඳ ‘‘තාරුණ්‍ය ’’ යනුවෙන් වු අලංකාරකයක්. එකී ප්‍රකාශය තුළ අන්තර්ගතයි. විශේෂයෙන් මෙම ප්‍රකාශයන් සම- මිය ගිය තම ඥාතීන්ගේ ඡායාරූප ඔවුන් සම- ගත් තම ඡායාරූප හා මියගිය හා ජීවත්වන ප්‍රභූ ඥාතීන්ගේ ප්‍රකාශ යනාදිය පෝස්ටර් තුළට අන්තර්ගත කොට ඇත.

එමෙන්ම ස්වකීය සමාජ තත්ත්වය පවුල් පසුබිම හා ඥාතීත්ව සබඳතා දැක්වීම සඳහා යොදාගත් ප්‍රචාරක උපක්‍රමයක් මාවතගම ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ දක්නට ලැබුණි. එහිදි සිදුවී තිබුණේ අපේක්ෂකයන්ගේ නමට ඉදිරියෙන් ඉහත කී සබඳතා ප්‍රකාශවන අන්වර්ත නාම ඉදිරිපත් කිරීමය. එනම්,

| | |
|---|---|
| ජයසේන වීරක්කොඩි | - ජයවර්ධන අයියා |
| චමින්ද සෝමරත්න | - චමී |
| ඇන්ටන් මුතුකුමාර | - ඉංග්‍රීසි ගුරුතුමා |
| රොබට් කරුණාසිංහ | - වොලිබෝල් රොබට් |
| චන්ද්‍රසිරි | - උක්කුන් මල්ලි |
| කුමාරි ඒකනායක | - කුමාරි අක්කා |
| ඉඳුනිල් සංජීව | - නෙල්සන් අයියගේ පුතා |

යනාදී වශයෙනි. ප්‍රදේශයේ තම හිතවතුන් හා ඥාතීන් තමන්ගේ ලියාපදිංචි නම නොදැමීම නිසා මේ ආකාරයට අන්වර්ත නාම ඉදිරිපත් වීම සිදුවේ. එසේම ස්වකීය හිතවතුන්ට හා ඥාතීන්ට තම හිතවත්කම ඥාතීත්වය තහවුරු කොට ඔවුන් තමාට ඡන්දය දීම සඳහා පොළඹවා ගැනීමට ද මෙයින් උත්සාහ ගෙන ඇත.

‘‘ මීතැන්වල ඔබේ ගමේ වම්බුගම්ගොඩ පදිංචි එම්. ............. වන මම ......... ’’

යනාදි ප්‍රකාශයන් මගින් ඉහත කී අදහස් තවත් තහවුරු කරගැනීමට උත්සාහ කරන ආකාරය පෙනීයයි. අලව්ව ප්‍රාදේශීය සභාව සඳහා ඉදිරිපත් වු අපේක්ෂකයන් විසින් තම ප්‍රචාරක ව්‍යාපාරය තුළ භාවිත කළ අමුද්‍රව්‍ය වුයේ පොලීසියේ සේවය, තම පියාගේ ඝාතනය, තමා උගත් පාසල, දහම් පාසල් අධ්‍යාපනය, තම පවුලේ ව්‍යාපාරික ශක්තිය, මුල්‍යමය හැකියාව සහ වැටුප නොගෙන සේවය කිරිම යනාදියයි. ප්‍රාදේශිය සභාව සඳහා ඉදිරිපත් වු අපේක්ෂිකාවක් ප්‍රකාශ කර සිම්යේ ‘‘ පියාගේ අනුගාමිකත්වය හා වැඩ පිළිවෙල ඉදිරියට

ගෙනයාමට ” තමාට උදව් කරන ලෙසයි. එම ප්‍රාදේශීය සභාවට තර- වැදුණු තවත් අපේක්ෂකයෙකු තම කළමනාකරණ උපාධිය සහ ගණිත උපදේශක තනතුර තම ප්‍රචාරක කටයුතුවලදී අවධාරණය කරනු ලැබිය. තවත් අපේක්ෂකයෙකුගේ ප්‍රචාරණ ව්‍යාපාරය තුළ,

අප ප්‍රදේශය දේශපාලනික වශයෙන් අඳුරු වළාකුලකින් වැසී යද්දී නැවත දිප්තිමත් තරුවක් ඒතුළින් මතු විය. ඒ වෙනකෙකු නොව දිවංගත …… මැතිතුමාගේ එකම දියණිය සමග විවාහ වී සිමින ….. මහතාය.

යනාදි වශයෙන් සඳහන් වී තිබීමෙන් පෙනී ගියේ ප්‍රාදේශීය දේශපාලනය තුළ දි පවතින ඥාති සබඳතා සහ විවාහ සබඳතා බලවත් වන ආකාරයයි.

## 2. දේශපාලන නායකයින් සහ ප්‍රභූන් සමග සම්බන්ධතා දැක්වීම :-

මෙහිදී ප්‍රාදේශීය හා ජාතික මට්ටමේ දේශපාලන නායකයින් හා ප්‍රභූන් සම- තමාට පවතින සම්බන්ධතාව හුවා දැක්වීම සිදු කොට ඇත. ඉන් අපේක්ෂා කරනුයේ සේවාදායක - අනුග්‍රහයක ජන්ද චර්යාවක් තුළ ජන්ද දායකයාට වඩාත්ම ප්‍රතිලාභ ලබාදිය හැකි පුද්ගලයා තමා බව තහවුරු කිරිමයි. එනම් තමා සතුව පවතින සම්බන්ධතා ජාලය මගින් තම ජන්ද දායකයාට සේවාවක් කළ හැකි බව ඔප්පු කිරිමට උත්සාහ ගැනිමයි. එසේම එකී දේශපාලන නායකයින් හා ප්‍රභූන් හරහා තමා සුදුස්සෙකු බවට හා දේශපාලන වශයෙන් ශක්තිමත් අයෙකු බවට රෙකමදාරු කරවා ගැනිමට ද සිදු කරනු ඇත. මෙහිදී දේශපාලන නායකයින් ප්‍රභූන් සම- වු ජායාරූප, ඔවුන් තමා ගැන කියු ප්‍රකාශය ආදිය ප්‍රචාරක ව්‍යාපාරය සඳහා යොදා ගනී. එසේම ඔවුන් සම- තමාගේ ඇති සම්බන්ධය පැහැදිලි කිරිම ද සිදුවෙයි. විශේෂයෙන්ම එහිදී ප්‍රසිද්ධ, බලවත් හා ජන පදනමක් ඇති අයෙකු සතුව පවතින බලය තවකෙනෙකුට ලබා ගැනීම සඳහා මෙම වන උත්සාහය උපයෝගී කර ගැනීමක් සිදුකෙරී ඇත. මෙම ක්‍රියාවලිය ජනමාධ්‍යවේදය තුළ නම් කෙරෙනුයේ පැවරුම එනම් යම්කිසි අයෙකු සතුව පවතින පිළිගැනිම වෙනත් දෙයක් පිළිගැන්වීම සඳහා යොදා ගැනීම නැතහොත් වෙනත් දෙයක් වෙත පැවරුම - සහ චරිත සහතික දිම යනුවෙනි.

බොහෝ ප්‍රාදේශීය සභාවල එක්සත් ජාතික පක්ෂයේ සහ පොදුජන එක්සත්





පෙරමුණේ අපේක්ෂකයන්ගේ පෝස්ටර්වල දක්නට ලැබුණු පොදු ලක්ෂණයක් වුයේ සිය ජාතික හා ප්‍රාදේශීය දේශපාලන නායකයන්ගේ ජායාරූප සම-න් තම ජායාරූපය ද සහිතව පෝස්ටර් සකසා ඇති බවයි. මාවතගම ප්‍රාදේශීය සභාවේ අපේක්ෂකයෙක් අත් පත්‍රිකාවක් මගින් ප්‍රකාශ කර සිම්යේ

මාවතගම ජන නායක ක්‍රිඩා කටයුතු හා යෞවන කටයුතු පිළිබඳ
ගරු අමාත්‍ය …………………… මැතිතුමාගේ බලවත් ආශාවක්
හා වුවමනාවක් ඉටුකරමින් මාවතගම ප්‍රාදේශීය සභා එක්සත්
ජාතික පක්ෂ ලැයිස්තුවේ තරුණ අපේක්ෂකයෙකු ලෙස
ඉදිරිපත් විමේ වගකීම මා පිට පැටවිණ යනුවෙනි.

එම ප්‍රාදේශීය සභාවට තර- වැදුණු පොදුජන එක්සත්
පෙරමුණේ අපේක්ෂකයෙක්,

මෙම ගමන පෙරට යන්නට මා හට ධෛර්ය හා ශක්තිය
ලබා දුන් වයඹ පළාත් අමාත්‍ය ……………………
මැතිතුමා මේ අවස්ථාවේදී ගෞරවයෙන් සිහිපත් කරමි.
යනුවෙන් සිය පත්‍රිකාවේ සඳහන් කළේය.

තවත් අපේක්ෂකයෙක් දක්වා තිබුණේ තමා මෙරට බිහිවු ශ්‍රේෂ්ඨතම මානවාදියෙකු වු දිවංගත විජය කුමාරතුංග සහෝදරයා සම- සමීපව දේශපාලන කටයුතු කරන්නට භාග්‍ය ලැබුවෙකු වන අතර පුරා අවුරුදු 42 මහත්මා දේශපාලනයේ යෙදෙමින් කීර්තියක් දිනා හිටපු සමුපාකාර අමාත්‍ය ගරු ඩී. පී. වික්‍රමසිංහ මැතිදුන්ගේ ම- පෙන්වීම සහ අශිර්වාදය ලැබු අයෙක් බවයි. එක් අත්පත්‍රිකාවක සඳහන් වී තිබුණේ

“ රටට ජෝති - ගමට චන්ද්‍රසිරි
කළ මෙහෙවරට කළගුණ සලකමු
හෙට රූස්ස ගස් අද කොහොමත් ළපම්යි ” යනුවෙනි.

මෙම ප්‍රකාශයන්ගේ ස්වරූපය විසින් තහවුරු කරන්නේ ප්‍රාදේශීය සභාව සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයන්ගෙන් වැඩි පිරිසක්ම ජාතික දේශපාලනයේ ප්‍රාදේශීය හිතවතුන් හෝ ප්‍රාදේශීය නියෝජිතයින්ගෙන් සමන්විත වන බවයි. මෙම

අපේක්ෂකයින් අපේක්ෂකත්වය සඳහා අවස්ථාව ලබාගනුයේ ජාතික වශයෙන් ක්‍රියාත්මක දේශපාලනයේ අනුමැතියට අනුවය. එම අනුමැතිය ලබා ගැනීමේදී ජාතික දේශපාලන න්‍යෂ්මිය තුළ ක්‍රියාකාරි දේශපාලන බලවතුන්ගේ ප්‍රාදේශීය දේශපාලන උනන්දුන් හා චර්යාව වැදගත් සාධකයකි. සත්‍ය වශයෙන්ම ජාතික දේශපාලනයේ ක්‍රියාකාරි දේශපාලන නායකයන් සම- වන මිතුරු භාවය හා ඥාතීත්වය ප්‍රාදේශීය තලයේ දේශපාලකයන්ගේ පැවැත්මේ ස්වරූපය තීරණය වන සාධකයෝය. එනිසා ප්‍රාදේශීය සභාවල අපේක්ෂකයන් තම අපේක්ෂකත්වය ලබා ගැනීම පමණක් නොව ජයග්‍රහණය කිරීම පිළිබඳවත් ප්‍රබල ආධාරකයක් ලෙස සලකනු ලබන්නේ ජාතික මට්ටමේ දේශපාලනඥයාය. ඒ නිසා සිදුවී ඇති ප්‍රාදේශීය දේශපාලනඥයෙකුට තිබිය යුතු ප්‍රාදේශීය උනන්දුව අවම වී තම පෞද්ගලික ජයග්‍රහණය උදෙසා ජාතික දේශපාලන සබඳතා වෙත නැඹුරුවීමයි. එය යහ ප්‍රාදේශීය ආණ්ඩුකරණයකට බාධාකාරි තත්ත්වයකි.

## 3. තමා කළ හා ප්‍රදේශයේ ඉදිරියේදි කිරීමට අපේක්ෂිත කාර්යන් දැක්වීම :-

ප්‍රාදේශීය සභා මැතිවරණයේදි අපේක්ෂකයන් විසින් තමා ඉදිරියේදි කිරිමට අපේක්ෂිත කාර්යයන් සහ තම ඉදිරි දේශපාලන ප්‍රාර්ථනාවන් ඉදිරිපත් කිරිම සුවිශේෂිය. කලක් ප්‍රාදේශීය සභාව තුළ නියෝජිතයින් ලෙස කටයුතු කළ අපේක්ෂකයන්ගෙන් සමහරු තමා කර ඇති වැඩ කටයුතු ප්‍රචාරක ව්‍යාපාරය තුළ ඉදිරිපත් කරනු ලබයි. එහෙත් අධ්‍යයනයට ලක් කළ ප්‍රාදේශීය සභාවල එසේ තමා කළ වැඩ ගැන ප්‍රචාරක ව්‍යාපාරයේදි සඳහන් කළ අය ගණනින් ඉතා සීමිතය. එකී සීමිත අපේක්ෂකයන්ගෙන් තම අතීත ක්‍රියාකාරිත්වයන් වශයෙන් ග්‍රාමෝදය මණ්ඩල සභාපති ධුරය, වසර 11 ක් ප්‍රාදේශීය සභා නියෝජනය, පොදු ආගමික සේවා, විදුලිය ලබා දීම, සෞඛ්‍ය කටයුතු, සුබ සාධන සේවා, පොදු සංවිධාන සේවා, මර්ග සංවර්ධන කටයුතු, වීථි ලාම්පු ලබාදිම රැකියා ලබාදිම හා ක්‍රීඩා උපකරණ ලබා දීම යනාදිය ඉදිරිපත් කර තිබුණි. ජනතා විමුක්ති පෙරමුණ විසින් සිය මන්ත්‍රී වැටුප් අරමුදල මගින් කළ සේවා වශයෙන් පරිගණක මධ්‍යස්ථාන පිහිටුවිම රෝහල්වලට අවශ්‍ය ඇඳන් ආදිය සැපයීම, නිය-යෙන් පීඩාවට පත්වූවන්ට සහනාධාර සැපයීම, ක්‍රීඩාවට උපකාර කිරීම හා වෛද්‍ය සායන පැවැත්වීම යනාදිය ඉදිරිපත් කර තිබුණි.

බොහෝ අපේක්ෂකයන් විසින් ඉදිරිපත් කර තිබු ඉදිරියේදි කිරිමට





අපේක්ෂිත කාර්යන් ඉහත කාර්යන්ට වඩා වෙනස් ස්වරූපයක් ගෙන තිබුණි. එනම් ප්‍රාදේශීය ආණ්ඩුකරණයට අදාළ වැඩ කටයුතුවලට වඩා ජාතික ආණ්ඩුකරණයට අදාළ ක්‍රියා එහිදී හඳුනාගත හැකිය. ප්‍රාදේශීය ආණ්ඩුකරණයට අදාළව ඉදිරියේදී කිරීමට අපේක්ෂිත කාර්යන් අතර,

- × ප්‍රදේශය තුළ පොදු පහසුකම් දියුණු කිරිම.
- × ක්‍රීඩා සමාජවලට සහ යෞවන සමාජවලට උපකාර කිරිම.
- × ප්‍රදේශය තුළ යහපත් සෞඛ්‍ය තත්ත්වයක් න-ා සිටුවීම.
- × ජනතාව ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුගෙන් අපේක්ෂා කරන සේවාව අකුරටම ඉටු කිරිම.
- × තරුණ අයට කාර්මික පුහුණු මධ්‍යස්ථාන ලබාදීම.
- × විදේශීය මිතුරන්ගේ හා ධනපතින්ගේ උදව් ඇතිව ස්වේච්ඡා සංවිධාන සහ මිත්‍රත්ව පදනම් ඇති කිරිම.
- × ජපන් ආධාර මත පෙර පාසැල් ආරම්භ කිරිම හා ගුරුවරු පුහුණු කිරිම.
- × විදේශ රැකියා පුහුණු මධ්‍යස්ථානයක් ඇති කිරිම.
- × ස්වයං රැකියා වර්ධනයට රාජ්‍ය අනුග්‍රහය ලබාදීම.
- × ප්‍රාදේශීය සභාව තුළින් කළ හැකි දේවල් කිරිම.
- × පාසලට සේවය කිරිම.
- × දූෂණයෙන් තොර පිරිසිදු පාලනයක් ගෙනයාම.
- × මමය මාගේය යන හැ-මෙන් මිදී අපය අපගේය යන පරමාර්ථයෙන් සේවය කිරිම.
- × බිංගිරිය ප්‍රාදේශීය සභාවට කාන්තා හඬක් නැ-ම.
- × දේශයට සමුපාකාර ගොඩනැගිල්ලක් ඉදිකිරිම.
- × නව කර්මාන්ත ශාලාවක් ආරම්භ කිරිම.
- × රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් ආරම්භ කිරිම.
- × ප්‍රදේශයට සහල් සැලසුම් මධ්‍යස්ථානයක් ගොඩ නැගීම.
- × වැව් හා පාරවල් ප්‍රතිසංස්කරණය කිරිම.
- × කුණු කසල ප්‍රශ්නයට විසඳුම් ලබා දීම.
- × විධිමත් කාණු පද්ධතියක් ඇති කිරිම.
- × ඔරලෝසු කණු නඩත්තු කිරිම.
- × නගරය අලංකාර කිරිම.
- × ප්‍රදේශය පිළිබඳ අධ්‍යයනය කර අදියර 4 කින් යුත් සංවර්ධන සැලැස්මක් ඇති කිරිම.

× මහල් නිවාස සංකීර්ණ දෙකක් ඉදිකිරීම.

× නව පුස්තකාලයක් ඉදිකිරීම.

× ප්‍රදේශයේ ජනතාවගේ නිවාස, ජලය , පුස්තකාල, ප්‍රජා ශාලා, ක්‍රීඩා පිම්, පෙර පාසල්, පොදු වැසිකිලි යනාදී පහසුකම් දියුණු කිරීම.

× ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය දියුණු කිරීම.

× අධ්‍යාපන පහසුකම් ලබාදීම.

× සභාපති තුමාගේ ක්‍රියාවලට උදව් කිරීම.

යනාදී ඒවා විය. මේවා ප්‍රාදේශීය ආණ්ඩුකරණයේ යහපත් ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් අත්‍යවශ්‍ය කරුණු යැයි දැක්විය හැකිය. එහෙත් මෙම කාරණා මතු කර තිබුණේ ඉතා සීමිත අපේක්ෂකයන් පිරිසකි. බොහෝ අපේක්ෂකයන්ගේ ඉදිරි කාර්යන් අතර දක්නට ලැබුණේ,

× අගමැතිතුමාගේ සාම වැඩපිළිවෙලට අත්වැලක් වීම.

× අගමැතිතුමාගේ සාම වැඩපිළිවෙලට සහ ආර්ථිකය ගොඩ නැගීමට උදව් දීම.

× උතුරේ සාමය උදෙසා කටයුතු කිරීම.

× භීෂණයෙන් තොර නිදහස් රටක්, ජනතා අදහස් සුරකින ප්‍රජාතන්ත්‍රවාදී රටක්, යුද්ධයෙන් තොර සාමකාමී රටක් දූෂණයෙන් තොර පිරිසිදු රටක් , නිරෝගී ජනතාවක් ජිවත් කරවන සෞඛ්‍ය සම්පන්න රටක් හා ජාතියේ  අවශ්‍යතාවන්ට ගැළපෙන අධ්‍යාපන ක්‍රමයක් තිබෙන රටක් ඇති කිරීම.

× යුද්ධය නිමාකොට බිඳුනු දේශය යළි ගොඩනැගීම.

× බඩගෝස්තර වාදී දේශපාලනය තුරන් කිරීම.

× ජනතා දේපළ කොල්ලකන්නවුන් පලවා හැරීම.

× ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීම.

× දූෂණය හා භිෂණය මුලිනුපුටා දැමීම.

×  පසුගිය හත් වසරක කාලය තුළ විනාශ වී ගිය ආර්ථික සමාජ සංස්කෘතිය යළි ගොඩගෙන සමෘද්ධිමත් සදාචාරවත් දේශයක් ගොඩනැගීම.

× 2001 දෙසැම්බර් 05 වන දින දිනාගත් නිදහස තහවුරු කිරීම.

× තාරුණ්‍ය වෙනුවෙන් හඬක් නැ-ීම.

× තරුණයන්ගේ දැවෙන ප්‍රශ්න විසඳීම.

× යුක්ති සහගත සමාජයක අරුණළු පිබිදීම.

× පවතින සමාජ ආර්ථික, වාර්ගික හා සංස්කෘතික යහපත් සම්ප්‍රදායක් පෝෂණය කිරීම.





× තරුණ අසහනය නැති කිරීමට කටයුතු කිරීම.

× නොම- ගිය තරුණ තරුණියන්  යහම-ට ගැනීම.

× ගම හදා රට හැදීම.

× දේශද්‍රෝහී අලි - කොම් හවුල පැරදවීම.

යනාදී සමකාලීන ජාතික ආණ්ඩුකරණය තුළ දක්නට ලැබුණු ප්‍රාදේශීය වශයෙන් වියුක්ත කාරණාය. බොහෝ රචිත අරමුණු විශේෂ වචන භාවිතාවක් පමණක්ම විය. එහිදී හඳුනා ගැනීමට හැකිවූ සුවිශේෂී තත්ත්වය වන්නේ ප්‍රාදේශීය ආණ්ඩුකරණය තුළ මතුවන සටන් පාඨ හා තේමාවන්වල ස්වරූපය ජාතික දේශපාලනය විසින් දැනුවත්ව හෝ නොදැනුවත්ව හැඩගස්වා ඇති බවයි. එසේම ජාතික මට්ටමේ දේශපාලන පක්ෂවල බලය හා අධිපති බව විසින් ප්‍රාදේශීය දේශපාලනයේ ප්‍රාදේශීය විවිධතාවන් නොසලකා හැර ඇති බවයි. යහපත් ප්‍රජාතාන්ත්‍රීය ප්‍රාදේශීය ආණ්ඩුකරණයේදී එකී තත්ත්වය ප්‍රබල බාධාවකි. එසේම විමධ්‍යගත ආණ්ඩුකරණ අපේක්ෂාවන්වල ක්‍රියාකාරිත්වය පිළිබඳ ප්‍රතිවිරෝධතා මතු වන්නකි.

## 4. ජාතික දේශපාලන සංවාදයට අදාළ අදහස් දැක්වීම :-

ප්‍රාදේශීය සභා මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය තුළ දක්නට ලැබුණු ප්‍රධාන කරුණක් වන්නේ ප්‍රාදේශීය තත්ත්වය මත වූ ප්‍රාදේශීය දේශපාලන සංවාදයක් ගොඩනැගෙනවාට වඩා පවත්නා ජාතික දේශපාලන සංවාදය ප්‍රාදේශීය සංවාදයක් බවට පත් කිරීමට ගෙන තිබූ උත්සාහයකි. එය එක්තරා ආකාරයකට ජාතික දේශපාලනය විසින් ප්‍රාදේශීය දේශපාලනය යටපත් කිරීමකි.

හලාවත ප්‍රාදේශීය සභාව සඳහා එක්සත් ජාතික පක්ෂයෙන් ඉදිරිපත් වූ අපේක්ෂකයෙක්  සිය පත්‍රිකාවක දක්වා සිම්යේ

රටේ බිඳවැටී තිබෙන ආර්ථිකය යළි ගොඩනැගීමට පමණක් නොව දිනෙන් දින මහා පරිමාණයෙන් විනාශ වී යන මිනිස් ජීවිත, මුදල් සුරාකන කුරිරු යුද්ධය අවසන් කිරීමට හැකි එකම පුද්ගලයා වර්තමාන අග්‍රාමාත්‍ය ……………………… එතුමාගේ ගමන් ම- යමින් ගරු අගමැති තුමාට අත්වැලක් වී ඔබේ ගමේ දියුණුව සලසා දීම මගේ ප්‍රයත්නයයි.   යනුවෙනි.

මේ ආකාරයේ අගමැතිවරයාගේ කටයුතු ඉදිරියට ගෙනයාමේ අපේක්ෂාවන්, වාර්ගික යුද්ධය අවසන් කිරීම, ජාතීන් අතර සංවාදයෙන් රට ගොඩනැ-ීම, ආර්ථික සංවර්ධනයක් ලබා ගැනීම, ජාතික සමගිය ඇති කිරීම යනාදී තේමාවන් ප්‍රචාරක ව්‍යාපාරය තුළ දැකිය හැකි විය. පොදු ජන එක්සත් පෙරමුණේ අපේක්ෂකයන්ගේ තේමාවන් හා සටන් පාඨ අතර ප්‍රචණ්ඩත්වයට එරෙහිව මහත්මා දේශපාලනය උදෙසා පොදුජන එක්සත් පෙරමුණ දිනවමු. යන්න ප්‍රදේශ කිහිපයකම පොදු සටන් පාඨයක් විය. එමෙන්ම එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ප්‍රචණ්ඩ ක්‍රියා විදුලිබල කප්පාදුව, අවබෝධතා ගිවිසුමේ අහිසි ප්‍රතිවිපාක යනාදී ප්‍රධාන සහ සුලභව භාවිත කළ තේමාවන් විය.

ජනතා විමුක්ති පෙරමුණ විසින් මතු කළ තේමාවන් අතර,

මේ මාතෘ භූමිය හැර අපේ දරුවන්ට වෙනත් මව් බිමක් නැහැ
පෙරට එන්න ! දේශද්‍රෝහි අලි - කොටි හවුල පරදවමු.
කොටින්ට ඊළම පුදන දේශද්‍රෝහි ............... පරදවමු.
කොටින්ට උතුරු - නැගෙනහිර පාවාදෙන රනිල් - ප්‍රභා යටත්වීමේ ගිවිසුම පරදවමු.
බෙදුම්වාදයට හා ප්‍රචණ්ඩත්වයට ජාතික සමගියේ හා
ගෞරවාන්විත සාමයේ නාමයෙන් පෙරට එමු.
සිංහල, දෙමළ, මුස්ලිම් අප සැවොමගේ මාතෘ භූමිය ආරක්ෂා කරමු.
රට බෙදන - රට විකුණන ආණ්ඩුවේ සැලසුම් පරදවමු
ගම හදන - රට රකින ජනතා බලය ගොඩනගමු.

යනාදිය ප්‍රධාන විය. ජනතා විමුක්ති පෙරමුණ ප්‍රාදේශීය ආණ්ඩු මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාර මුළුමනින්ම පාහේ යොදා ගෙන තිබුණේ ජාතික ගැටලුව ට එරෙහි මතවාදයක් ගොඩ නැගීම අරමුණු කර ගෙනය. ඔවුන්ගේ ප්‍රචාරක ව්‍යාපාරය දිවයිනේ ප්‍රාදේශීය ආණ්ඩු මැතිවරණ පැවැත්වූ සෑම ප්‍රදේශයකම සමරූපී විය. මේනිසා ඔවුන් වෙතින් ප්‍රාදේශීයව වෙන වෙනම පවත්නා තත්ත්වයන් කෙරෙහි අවධානය යොමු කොට ප්‍රචාරක ව්‍යාපාරය ගෙන යාමක් සිදුනොවීය.

## 5. විශේෂ වචන සහ වාක්‍ය භාවිත කරමින් පුද්ගල ප්‍රතිරූප ගොඩනැගීම හා ජනප්‍රිය කරවීම :-

ප්‍රාදේශීය ආණ්ඩු මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය තුළ වැඩි ඉඩක් වෙන් වී





තිබුණේ විශේෂ වචන සහ වාක්‍ය භාවිතා කරමින් පුද්ගල ප්‍රතිරූප ගොඩ නැගීමට හා ජනප්‍රිය කරවීමටය. සාමූහික දේශපාලන කතිකාවකට වඩා හුදු පුද්ගල කේන්ද්‍රීය ස්වරූපයක් මේ තුළ ප්‍රදර්ශනය විය. මෙහිදී ඉදිරිපත් කර තිබූ බොහෝ වචන හා වාක්‍ය කාව්‍යමය ස්වරූපයක් ගෙන තිබූ අතර ප්‍රාදේශීය ආණ්ඩුකරණයේ පැවතිය යුතු තේමාවන්වලට අදාල නොවන ව්‍යුක්ත ස්වරූපයක් ද ඒවා තුළ දක්නට හැකි විය. එවැනි පාඨයන් හා වාක්‍ය කාණ්ඩ කිහිපයක් පහත සඳහන් වේ.

× සියල්ල අහිමිව අසරණ වූදා
  වාසිය දැක දැක මිනිසුන් යන විට
  නොසැලී අප හා එක්වී සිමියට
  කළ ගුණ දත් අප ඔබට මනාපය.
× දේශපාලන තුළින් දෑත් වලට විලංගු වැටුණ තරුණයෙක්මි
× පිරිසිදු දේශපාලනයක තරුණ නායකත්වය
× පිරිසිදු පාලනයකට අවංක වෘත්තිකයෙක්
× පුරවර මෙහෙවර නොනැවත පෙරටම
× ස්වර්ණමය යුගයක නිර්මාතෘ
× දූෂණයෙන් තොර පිරිසිදු පාලනය නොනැවතී පෙරටම
× බුද්ධිමත් ක්‍රියාශීලි නායකත්වය
× අලුත් හෙටක් අලුත් බලාපොරොත්තුවක්
× නිහතමානී අවංක සේවකයෙක්
× ජනතාව වෙනුවෙන් ප්‍රබල මෙහෙවරයක් සඳහා දුප්පතාගේ හිතවතා
× නීතියේ වෘත්තිය යුක්තියක් බවට පත් කරමු.
× අනුපමය කැප වීමට නොකැළැල් නායකත්වය.
× මිනිසාගේ පරම යුතුකම මිනිසාට සේවය කිරීමය.
× අයුක්තිය අසාධාරණය හමුවේ අභීතව නැ- සිමින අනාගත ප්‍රාර්ථනා මල්ඵල ගැන්වීමට අයෝමය හස්තයක්
× මිණිපුර සුරපුරක් කරන්නට.
× වීර හෙළ පුත්‍රයෙනි දැන්වත් නැගිටින්න මේ අපට කළ හැකි අවසාන මෙහෙවරයි. දැයක් ගොඩ නගන්න ඔබ අප හා එක්වන්න.
× ඇස්ගෙඩි දෙකට හෙන ගහල ද සිහලුන්නේ, රට ජාතිය රකින සිහළ උරුමයට ඔබේ වමිනා ඡන්දය දෙන්න.
× බල ලෝභි දේශපාලනයට එරෙහිව ජාතියේ නාමයෙන් සිංහල පුතුන් හා එක්වන්න.

× රුවන්පුරයට නව කිරුළක් නව යුගයට නවක හඬක්
× දේශයට ආදරය කරන අපේ ජන්දය සිනුවට
× මමය මාගේ යනු ආත්මාර්ථකාමී හැ-මෙන් මිදී අපය අපගේය යන පරාර්ථකාමී හැගීමෙන් සේවය කිරීමට
× අරමුණ මල්වල ගන්වා අදට වඩා හෙටක් ගොඩන-න්න.
× රටට බුද්ධිමත් ක්‍රියාශීලි ජනතා නායකයා
× ලොවේ නොයෙක් අවමන් මැද නොසෙල්වෙමි, මිනිස් මහිම දෝතින් ගෙන සිනාසෙමී.
× ඉතින් හදමු අපි අලුත් රටක්
× මිනිසත් බව දිනවා රටම දිනවමු.
× හෙට ඔබේ දරුවාට නිදහස් ලොවක් ගොඩ නැ-මට අපි දිනන්නෙමු.
× බිදුණු දේශය යළි එක්සත් කරමු.
× නිදහස සාම මාවතේ විවරණය, ආර්ථික සමෘද්ධිය යළි විනාශ කිරීමට ඉඩ නොදෙමු.
× රනිල් රටට - අනිල් ගමට.
× දේශය වෙනුවෙන් සියලුම කැපවීම් කළ රණවිරු ලක්සිරි දිනවමු.
× දයාබර ජයග්‍රහණයක්
× නව තරුණ හඬක්
× අපි මෙතෙනින් පටන් ගමු.
ඔබ සිමියත් සිපිරිගෙය
යුතුකම් ඉටු කරන්නෙමු අපි
× බිංගිරියට නවෝදයක්
× නොපරදින දයාබරත්වය
තාරුණ්‍යයට අරුත්බර හඬක්
× ගවිසිය ගාණක පළමු පියවරට මනාපය දෙන්න
× තාරුණ්‍යයට හිරු කිරණ
× පුරසභයට නව ජවයක්
× රකිමු මිනිස්කම හේද නොවී

× දේශපාලන මඩ ගොහොරුවෙන් උපුලක්ව පිපෙන්න
ඔබ හිරු කිරණ වන්න
× පුංචි ජන්දෙට - පුංචි කොල්ලෙක්
× මිනිසත්බවෙන් පිරිපුන් අවංක මිනිසෙක්





× නොසැළෙන නායකත්වයක්
නව ප්‍රාදේශිය පාලනයක්
× නොසැලෙන නායකත්වයට සවිමත් අත්වැලක්
× පුංචි ජන්දයේ කුංචනාදය
× බුදුසරණ වේවා
සදහම් සරණ වේවා
ස- සරණ වේවා
මෙතුන සරණින් ජයම වේවා
× යෞවන සමාජ තුළින් බිහිවූ අවංක නිහතමානි නායකත්වය

මේ ප්‍රකාශයන් පරීක්ෂා කරන විට පෙනියන්නේ ප්‍රාදේශිය ආණ්ඩු මැතිවරණ තුළ අපේක්ෂිත මැදිහත්වීම සංයුක්ත ප්‍රාදේශිය අරමුණු මත පදනම් නොවන බවයි. එවැනි සංයුක්ත ප්‍රාදේශිය උනන්දුන් හා අවශ්‍යතාවන් පිළිබඳ අවධානය යොමු කරමින් තම මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය ගෙන ගියේ ඉතා සුළු අපේක්ෂක පිරිසකි. බොහෝ අපේක්ෂකයන්ගේ අරමුණ වී තිබුණේ විවිධ උපක්‍රම මගින් සිය පුද්ගල ප්‍රතිරූපය ජනප්‍රිය කරවීම සහ ජනතාවගේ මනාපය ලබා ගැනීමයි. එහිදි සිදුවී තිබුණේ ඵලදායි ප්‍රජාතාන්ත්‍රිය සහ ප්‍රාදේශිය ආණ්ඩුකරණයක් සඳහා වන සමාජ සාකච්ඡාවක් මැතිවරණය කේන්ද්‍රියවත් ඇතිවීමට තිබෙන ඉඩ ඇහිරීයාමයි. එවැනි තත්ත්වයකට පදනම් වන ප්‍රධාන සාධකයක් ලෙස සමානුපාතික මැතිවරණ ක්‍රමය දැක්විය හැකිය. එකිනෙකා හා තර- කරමින් ද , පරයා යමින් ද දැවැන්ත මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරයක් පවත්වා ගෙන යාමට තනි තනි අපේක්ෂකයාට සිදු වී ඇත. එකී ක්‍රියාවලිය තුළ තනි පුද්ගල ප්‍රතිරූප අන් හැමටම වඩා ශක්තිමත් කිරීමට අපේක්ෂකයන් උත්සාහ ගෙන ඇත. එවැනි තත්ත්වයක් තුළ ප්‍රාදේශිය ආණ්ඩු මැතිවරණය යන්න ජනතාව විසින් සිය නියෝජිතයින් තෝරා පත් කරගන්නා ක්‍රියාවලියක් නොව අපේක්ෂකයන් විසින් ජනතාව බෙදා ගැනීමට පොරකන ප්‍රචාරක ක්‍රියාන්විතයක් ලෙස දැක්වීම උචිතය.

## නිගමනය

ප්‍රාදේශිය සභා මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය පුරාම එක්තරා ආකාරයට සමරූපි සහ ඒකාකාරී ස්වරූපයක් දක්නට ලැබිණි. ප්‍රාදේශිය ආණ්ඩුකරණයක මූලික ස්වරූපය විය යුත්තේ යම් මට්ටමක වෙනස් බවක් හා විවිධත්වයකි. මන්ද විවිධාකාර සන්දර්භයන් ප්‍රාදේශිය වශයෙන් පවතින හෙයිනි. එම විවිධ

සන්දර්භයන් මත පදනම් වෙමින් ප්‍රාදේශීය තත්ත්වයක් හා කටයුතු කිරීමේදී එකී ප්‍රාදේශීය ආණ්ඩුකරණයේ විවිධත්වය අනිවාර්ය වේ. එහෙත් එවැනි යහපත් ආකාරයක් ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය ආණ්ඩු ආශ්‍රිත ප්‍රාදේශීය ආණ්ඩුකරණ ක්‍රියාවලිය තුළ නොමැති බවට ප්‍රාදේශීය ආණ්ඩු මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය නිදසුනකි. මේ තත්ත්වයට බලපාන මූලික හේතුවක් වන්නේ ජාතික දේශපාලනික පක්ෂවල ව්‍යාපෘති විසින් ප්‍රාදේශීය ආණ්ඩුවලට නියෝජිතයන් පත් කරගැනීම සඳහා වූ මැතිවරණය සහිත සමස්ත ක්‍රියාවලිය තීරණය කිරීම සහ හැසිරවීමයි. එනම් එම ක්‍රියාවලිය මුළුමනින් ම ජාතික දේශපාලන පක්ෂ විසින් මෙහෙය වීමයි. එසේම මෙම සමරූපීය ස්වරූපයට ප්‍රචාරක ව්‍යාපාරයේ බලපෑම් සහගත භාවය ද හේතුවෙයි.

මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය තුළ දක්නට ලැබුණු ප්‍රධාන කරුණක් වූයේ අන් සියලුම දේවලට වඩා ප්‍රචාරක ව්‍යාපාරයේ බලවත්භාවය පිළිබඳ අපේක්ෂකයන් ඉහළ තක්සේරුවක පසුවන බවයි. විශේෂයෙන්ම ප්‍රජාතාන්ත්‍රවාදී ප්‍රාදේශීය ආණ්ඩුකරණයකට අදාළ ගැටලු හා සිදුවීම් කෙරෙහි අවධානය යොමු කරනවාට වඩා මැතිවරණ තර-යෙන් ජයග්‍රහණය කිරීම සඳහා ප්‍රචාරය කෙරෙහි විශාල විශ්වාසයක් තබා ඇති බව දක්නට හැකි විය. ග්‍රාමීය සහ නාගරික භේදයකින් තොරව එකී තත්ත්වය හඳුනාගත හැකිය.

එමෙන්ම මාධ්‍ය හා ප්‍රජාතාන්ත්‍රවාදය අතර පැවැතිය යුතු යහපත් සමීප සම්බන්ධතාවට වඩා වෙනත් සබඳතාවක් මැතිවරණයේදී ප්‍රචාරක ව්‍යාපාරය හා ප්‍රජාතාන්ත්‍රීය සමාජ භාවිතාවන් ආශ්‍රිතව දක්නට ලැබිණි. එනම් ජනතාවගේ අභිලාෂයන්ට අදාළව ජනතා නියෝජිතයන් පත්කර ගැනීම සඳහා ජනයා සම්මුති ගතවීමේ ප්‍රජාතාන්ත්‍රීය භාවිතය නොව ප්‍රචාරක මාධ්‍යයන්හි හා ප්‍රචාරක ස්වරූපයන්හි බලවත්කම යොදාගනිමින් අපේක්ෂකයන් සඳහා ජනතාවගේ මනාපය ලබා ගන්නේ කෙසේ ද යන්න මත ප්‍රචාරක ව්‍යාපාරය ක්‍රියාත්මක වනු දැකිය හැකි විය. එහිදී අතිශයෝක්තිමය හා ව්‍යුක්ත දේශපාලන තේමාවන් හා පාඨයන් යොදා ගනිමින් ප්‍රචාරක ව්‍යාපාරය දියත් කෙරී ඇත. බොහෝ අපේක්ෂකයන් විසින් අවධාරණය කෙරුණු තේමාවන් සහ පාඨයන් එකී අපේක්ෂකයන්ට අදාළ ප්‍රාදේශීය ආණ්ඩු බල ප්‍රදේශයේ තත්ත්වයන් සම- කිසිදු සම්බන්ධතාවක් නොදක්වන බව ප්‍රචාරක ව්‍යාපාරය තුළ දක්නට ලැබුණි.

ප්‍රාදේශීය ආණ්ඩු මැතිවරණ ව්‍යාපාරය තුළින් අපේක්ෂකයන්ගේ ක්‍රියාමාර්ග පහක් හඳුනා ගැනීමට හැකිවිය. එනම් පවුල් පසුබිම





හා ඥාති සම්බන්ධතා දැක්වීම, දේශපාලන නායකයන් හා ප්‍රභූන් සම- පවතින සබඳතා දැක්වීම, තමා කළ හා ඉදිරියේදී කිරීමට අපේක්ෂිත කාර්යන් දැක්වීම ජාතික දේශපාලන සංවාදයට අදාළ අදහස් දැක්වීම සහ විශේෂ වචන සහ වාක්‍ය භාවිතා කරමින් පුද්ගල ප්‍රතිරූපය ගොඩනැගීම සහ ජනප්‍රිය කරවීම යනාදී වශයෙනි. එහිදී ප්‍රාදේශීය ආණ්ඩුකරණයට අදාළව තමා කළ හා ඉදිරියේදී කිරීමට අපේක්ෂිත ක්‍රියාමාර්ගයන් දැක්වීම සිදුකොට තිබුණේ ඉතා ම සුළු අපේක්ෂකයන් ප්‍රමාණයකි. පැරණි කොට්ඨාශ ක්‍රමය සහිත මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරයන්හි දක්නට ලැබුණු පොරොන්දුව ලබා දීමේ ක්‍රියාවලියට වෙනස්ව අපේක්ෂකයා පිළිබඳ ජනප්‍රිය ප්‍රතිරූපයන් ගොඩ නැගීම වර්තමාන මැතිවරණ ව්‍යාපාරයන්හි ප්‍රධාන අරමුණක් වී ඇත. අධ්‍යයනයට පදනම් වූ ප්‍රාදේශීය ආණ්ඩු මැතිවරණ ව්‍යාපාරය තුළ එම තත්ත්වය බහුලව දක්නට ලැබුණි. එහිදී සියලුම අපේක්ෂකයන් උත්සාහ ගෙන තිබුණේ පෝස්ටර් සහ පත්‍රිකා තුළ ඔවුන් ඉතා හොඳ දේශපාලකයන් වීමටය. එය ව්‍යුක්තව දක්වන්නේ නම් මාධ්‍ය තුළ දී දේශපාලකයන් ඉතාම යහපත් පුද්ගලයන්ය. ජනතා කැමැත්ත ලබාදෙන්නේ මාධ්‍ය විසින් යෝජනාකරන (විධානය කරන) අර යහපත් දේශපාලකයාටය.

# 13

# රූපවාහිනී මාධ්‍ය පිළිබඳව විද්‍යාත්මක අධ්‍යයනයක අවශ්‍යතාවය

සුගත් හේවාවිතාරණ

රූපවාහිනී මාධ්‍ය යනු ගැඹුරින් අධ්‍යයනය කොට අවබෝධ යෙන් යුතුව පරිශීලනය කළ යුතු ඒකකයකි. රූපවාහිනී මාධ්‍ය අධ්‍යයනය පිළිබඳව බටහිර මෙන්ම පෙරදිග රටවලද විවිධ කතිකාවන් බිහිවී තිබේ. විශේෂයෙන්ම ඇමෙරිකාව, එංගලන්තය වැනි රටවල් සහ ඉන්දියාව, ජපානය වැනි රටවල් ද රූපවාහිනී මාධ්‍ය පිළිබඳව විවිධ මට්ටමේ අධ්‍යයනයන් සිදු කරයි. නමුත් ශ්‍රී ලංකාව වැනි රටවල් තවමත් රූපවාහිනී මාධ්‍ය අධ්‍යයනය කර භාවිත කළ යුතු මාධ්‍යයක් ලෙස වටහා නොගැනීම බරපතල ජාතික ප්‍රශ්නයක් බව තේරුම් නොගැනීම මේදවාචකයකි.

රූපවාහිනී මාධ්‍ය එකවර පුද්ගලයාගේ ඉන්ද්‍රියයන් දෙකකට ආමන්ත්‍රණය කරන බව සන්නිවේදන විද්‍යාඥයෙකු වන මාර්ෂල් මැක්ලුහන් (Marshall Mcluhan ) ප්‍රකාශ කරයි.

I. දෘශ්‍ය නැතහොත් රූපය (Visual) - ඇස මූලික කොට ගනී.
II. ශබ්දය නැතහොත් හඬ (Audio) - කණ මූලික කොට ගනී.

මානෝවිද්‍යාත්මක පරීක්ෂණ මගින් තහවුරු කර ඇති අන්දමට පුද්ගලයෙකුට යම් දෙයක් ශ්‍රවණය කිරීමෙන් ඒ පිළිබඳ 40% ක මතකයක් පවත්වා





ගත හැකිය. ශ්‍රවණයෙන් සහ කියවීමෙන් 60% ක මතකයක් රඳවා ගත හැකිය. නමුත් ශ්‍රවණයෙන් හා දැකීමෙන් 90% ක පමණ මතකයක් පවත්වා ගෙන යාහැකිය. මෙයින් පැහැදිලි වන්නේ රූපවාහිනී මාධ්‍ය සතු ශ්‍රව්‍ය (Audio) දෘශ්‍ය (Video) බව හේතු කොට කිසියම් සංදේශයක් (Massage) පුද්ගලයාගේ මතකය තුළ කා වැද්දවීමට ඇති හැකියාවයි.

විශේෂයෙනේ ම රූපවාහිනී මාධ්‍ය සතු රූප භාෂාවේ ශක්‍යතාව නිසා එය සමාජානුයෝජනය (Socialization) කාරකයක් ලෙස ද වඩා ප්‍රබලවේ. ජෝජ්ගබ්නර් (George Gerbner) නැමැති ඇමරිකානු සන්නිවේදන විද්‍යාඥයා විසින් රූපවාහිනී මාධ්‍ය පිළිබඳව කරන ලද ආනුභවික පර්යේෂණ (Empirical Research) මගින් ඔහු පෙන්වා දී ඇත්තේ රූපවාහිනී මාධ්‍ය මගින් පුද්ගලයා තුළ විවිධ බලපෑම් ප්‍රරෝහණය (වගාකළ) කළ හැකි බවයි. රූපවාහිනී මාධ්‍යයෙන් ඇති කරන ප්‍රරෝහණ බලපෑම් (Cultivation Effects) හේතු කොට ගෙන අන්කවර මාධ්‍යයකටත් වඩා පුද්ගලයාගේ පෞරුෂය සඳහා බලපෑම් කිරිමට රූපවාහිනී මාධ්‍යයට හැකියාව ලැබී ඇත. “ රූපවාහිනී ටෙලිදර්ශනවල ප්‍රචණ්ඩත්වය ” (Violence in Television Drama) කෘතියෙන් ඔහු පෙන්වා දෙන්නේ ටෙලිනාට්‍ය නැරඹීමේ දී එමගින් විශාල බලපෑමක් සිදුවන බව එක එල්ලේ නොදැනුනද ප්‍රේක්ෂකයා තොන්තු කරවීම, විකලාංග කරවීම, දෘශ්‍යමාන පීඩාවක් නොමැතිව පුද්ගලයාව මරා දැමීම සිදුවන බවයි. ඒවාගේම රූපවාහිනී මාධ්‍ය අධ්‍යාපන මාධ්‍යක් වශයෙන් තෙවන මව්පියන් ලෙස කටයුතු කරන බවද සන්නිවේදන විද්‍යාඥයින් පෙන්වාදෙයි.

රූපවාහිනී මාධ්‍ය පිළිබඳව අධ්‍යයනය කිරීමේදී විශේෂ අවධානය යොමු කළයුතු අංශ කිහිපයක් වෙයි. මෙහිදී ප්‍රථමයෙන් ම රූපවාහිනී මාධ්‍ය යනු කුමක්ද? එහි ක්‍රියාකාරිත්වය කෙසේද? එහි ශක්තීන් සහ කුසලතා මොනවාද? යන්න පිළිබඳව අවධානය යොමු කළ යුතුය. කිසියම් මාධ්‍යයක් එය අසවල් මාධ්‍ය යැයි නම් කළ හැක්කේ නිවැරදි සහ පැහැදිලි කොන්දේසි ඉදිරිපත් කිරීමෙනි.

කිසියම් සන්නිවේදන මූලයක් (A source) මගින් යවනු ලබන පණිවුඩය (Massage) අවසානයේ ග්‍රාහකයා (Receiver) අතටපත් වන්නේ කුමන ස්වරූපයකින් ද, එම ස්වරූපය අනුව එම මාධ්‍ය නම් කළ හැකිය.

ඉහත විග්‍රහයට අනුව රූපවාහිනී මාධ්‍ය විවිධාකාරයෙන් හඳුන්වාදිය හැකිය.

1. ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයකි. ( Audio - Visual )

රූපවාහිනී මාධ්‍යයේ දී කැමරාවෙන් හෝ පරිගණකයෙන් ලබාගන්නා රූප (Visual) සහ මයික්‍රෆෝනයෙන් ලබා ගන්නා ශබ්දය (Audio) ග්‍රාහකයා වෙතට ලබා දෙයි. එමනිසා රූපවාහිනී මාධ්‍ය ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයක් ලෙස සලකයි.

2. විද්‍යුත් සහ විකාශ මාධ්‍යයකි. ( Electronic and Broadcasting )

රූපවාහිනී මාධ්‍යයේ සංඥා විද්‍යුත් චුම්බක තරංග මාර්ගයෙන් (Electronic Magnatic Waves) අපගේ නිවසේ ඇති රූපවාහිනී යන්ත්‍රය දක්වා පැමිණේ. එම නිසා රූපවාහිනී මාධ්‍ය විද්‍යුත් තරංග මාධ්‍යක් ලෙස හැඳින්විය හැකිය. ඒවාගේම රූපවාහිනී මාධ්‍ය සංඥා විකාශය කිරීමක් සිදු කරන බැවින් එය විකාශන (Brodcasting) මාධ්‍යක් ලෙස ද හඳුන්වයි.

3. තොරතුරු හා ප්‍රවෘත්ති මාධ්‍යයකි. ( Information and News )

ඉතාමත් පහසුවෙන් සහ ඉක්මණින් ග්‍රාහකයා වෙතට තොරතුරු හා ප්‍රවෘත්ති ලගා කර වීමේ ගුණයෙන් යුතු බැවින් රූපවාහිනී මාධ්‍ය තොරතුරු හා ප්‍රවෘත්ති මාධ්‍යයක් ලෙස හඳුන්වයි.

4. සජීවී මාධ්‍යයකි. ( Live Telecast )

සජීවී නැතහොත් එසැන විකාශයන් සිදු කිරීමට හැකි නිසා රූපවාහිනී මාධ්‍ය සජීවි මාධ්‍යයක් ලෙස ද හඳුන්වයි.

5. කලා නිර්මාණ මාධ්‍යයකි.

රූපවාහිනී මාධ්‍ය මගින් කලා නිර්මාණ ද සිදු කළ හැකි බැවින් රූපවාහිනී මාධ්‍ය කලා නිර්මාණ මාධ්‍යයක් ලෙස ද හඳුන්වයි.

6. ජනමාධ්‍යයකි. ( Mass Medium )

ජනමාධ්‍යයක් සතු ගුණාංගවලින් යුතු බැවින් රූපවාහිනී මාධ්‍ය ජනමාධ්‍ය අතුරින් ප්‍රබලම මාධ්‍ය බවට වර්තමානයේ පත්ව තිබේ.

7. තාක්ෂණික මාධ්‍යයකි. ( Technological Medium )

රූපවාහිනී මාධ්‍ය සම්පූර්ණයෙන්ම තාක්ෂණික මෙවලම් සම- බද්ධ වී නිර්මාණ කරයි.





රූපවාහිනී මාධ්‍ය සතු ඉහත ලක්ෂණ හඳුනා ගැනීමත් ඒ පිළිබඳව විධිමත්ව අධ්‍යයන කිරීමත් මගින් රූපවාහිනී මාධ්‍ය ප්‍රයෝජනවත් ලෙස භාවිතයට ගත හැකිය.

රූපවාහිනී මාධ්‍ය අධ්‍යයන අපගේ අවධානය යොමු කළ යුතු වැදගත් අංශයක් ලෙස අනෙකුත් මාධ්‍යයන් හා සැසඳීමේදී රූපවාහිනී මාධ්‍ය කුමන අනන්‍යතාවන් ප්‍රදර්ශනය කරන්නේදැයි වටහා ගැනීම වැදගත්වේ.

රූපවාහිනීය සහ සිනමා මාධ්‍ය ඉතා සමීප ලක්ෂණවලින් යුතු බැවින් මෙම මාධ්‍යයන්ගේ තාක්ෂණික ක්‍රියවලියේ සම්බන්ධතාවන් ද අද වඩා සමීප වී තිබේ. එසේ වුවත් රූපවාහිනී මාධ්‍ය (Television) සහ සිනමා මාධ්‍ය (Cinema) තව දුරටත් ඔවුන්ගේ අනන්‍යතාව ඔස්සේ ගමන් කරන බැවින් එය පහසුවෙන් හඳුනාගත හැකිය.

රූපවාහිනි මාධ්‍ය නිල වශයෙන් 1926 වසරේ දී හඳුන්වා දෙනු ලැබුව ද රූපවාහිනී (Recording) පමිගත කිරිමේ ක්‍රමයක් සිදු වුයේ 1956 වසරේදිය.[1] 1956 දී ඇම්පෙක්ස් ( Ampex) ආයතනය විද්‍යුත් පමිගත කිරිමේ ක්‍රමයක් සොයා ගනු ලැබීය. ඊට ප්‍රථම රූපවාහිනී වැඩසටහන් සජීවීව (Live) විකාශය කළ අතර පමිගත කිරිම් සිදු කළේ සිනමා ක්‍රමයටය. රූපවාහිනී ප්‍රවෘත්ති සඳහා සිනමා කැමරා යොදා ගනිමින් කළ පමිගත කිරීම් ක්‍රමය හැඳින් වුයේ News Reel ක්‍රමය යනුවෙනි.[2] එසේ රූපවාහිනී මාධ්‍යයට අවශ්‍ය පමිගත කිරීම් සිනමා මාධ්‍යයෙන් සිදු කොට එය නැවත රූපවාහිනී මාධ්‍යයට පෙරළිම සඳහා ප්‍රොජෙක්ටරයක් මගින් පමිගත කරන ලද දර්ශන තිරයක් මතට පතිත කොට එම තිරයේ දර්ශන රූපවාහිනී කැමරාවකින් කැමරාගත කොට විකාශය කරන ලදි.

පසුකාලීන සිනමා පමිගත කිරිම් රූපවාහිනී මාධ්‍යයට පෙරළිම සඳහා ටෙලි සිනේ ( Tele- cine ) උපකරණය නිපදවන ලදී.[3]

රූපවාහිනී මාධ්‍ය තාක්ෂණය මුලික අවධියේදී සිනමාව උපකාර කර ගත්තා සේම අද රූපවාහිනී මාධ්‍යයේ දියුණුවත් සම- ම සිනමාව රූපවාහිනී මාධ්‍යයේ ඩිජිටල් පමිගත කිරිම් තාක්ෂණය (Digital Recording) සහ රේඛිය නොවන සංස්කරණ (Non linear Editing) ක්‍රමය ආදිය භාවිතයට ගනී.

රූපවාහිනී තාක්ෂණය භාවිත කොට චිත්‍රපට නිපදවා එම චිත්‍රපටයේ වීඩියෝ පටය මගින් (Tele Recording) සිනමා පිටපත් කිරීම් සිදු කරයි. මෙම ක්‍රමය සිනමා පටවල පම්ගත කොට රූපවාහිනී මාධ්‍යයට පෙරළීමේ (Tele Cene) ක්‍රමයේ ප්‍රතිපක්ෂ ක්‍රමයයි.[4] (Reverse Tele Cene System)

එකිනෙකට සම්බන්ධ සමාන ලක්ෂණවලින් යුතු ජනමාධ්‍ය අතර පුළුල් සම්බන්ධතාවන් ගොඩ නැගීම වර්තමාන තාක්ෂණ දියුණුවත් සම- වර්ධනය වී ඇත. ජනමාධ්‍යයන්ගේ මෙම නව තත්ත්වය අන්‍යෝන්‍යය වාසිදායක සම්බන්ධතා ( Symbiotic Relationships ) යනුවෙන් හැඳින්වීය.[5] එකිනෙකට වෙන් වෙන්ව තිබූ ජනමාධ්‍ය අතර මෙසේ සමාන සම්බන්ධතාවන් ගොඩ නැගීමේ බලවේගය වුයේ පරිගණක තාක්ෂණයයි. ( Computer Technology ) එසේ වුව ද ඒ ඒ මාධ්‍ය සතු විවිධත්වයට එයින් හානියක් සහ අවාසියක් සිදු නොකොට වඩා යහපත් ලෙස ඒවා පවත්වා ගෙන යාම සමාජ ප්‍රගතියට අත්‍යාවශ්‍ය කොන්දේසියක් බව වටහා ගත යුතුය.

රූපවාහිනී මාධ්‍ය සහ සිනමා මාධ්‍ය එකිනෙකට සම්බන්ධතාවයකින් යුතුව කටයුතු කිරිම හරහා එකිනෙකට වාසිදායක තත්ත්වයන් උදාකර ගත්ත ද එම මාධ්‍ය දෙක තුළ ඇති අනන්‍යතාවයට එමගින් බලපෑමක් සිදුවන බවක් නොපෙනේ. ඒ අනුව රූපවාහිනී මාධ්‍ය තවදුරටත් විද්‍යුත් මාධ්‍යක් ලෙස හඳුන්වනු ලබන අතරම සිනමා මාධ්‍ය හඳුන්වන්නේ චලන රූප මාධ්‍යය (Motion Picture / Movie Medium) ලෙසිනි.

## ප්‍රවෘත්ති මාධ්‍යයක් ලෙස රූපවාහිනිය.

රූපවාහිනී මාධ්‍ය ගුවන්විදුලි මාධ්‍යයේ ආභාසයෙන් පැන නැගුණක් ලෙස ද හඳුන්වාදිය හැකිය. මුල් කාලයේ රූපවාහිනිය හැඳින්වුයේ ගුවන්විදුලියෙන් රූප ලැබිම යනුවෙනි. 1920 දශකයේ දි පුවත් පත් මාධ්‍ය අභිබවමින් ගුවන්විදුලි මාධ්‍ය ප්‍රචලිත වුයේ එහි තිබූ තොරතුරු ලබාදීමේ ශක්‍යතාවය නිසාය. මේ නිසා එදා ගුවන්විදුලිය හැඳින්වුයේ First with the News යනුවෙනි. ප්‍රථමයෙන් ජනතාවට ප්‍රවෘත්ති ලබාදීමේ මාධ්‍ය බවට පුවත් පත අභිබවමින් ගුවන්විදුලිය ඉදිරියට පැමිණුනි. ගුවන්විදුලි මාධ්‍ය සංදේශ (Massage) ග්‍රාහකයා (Receiver) වෙත යවන්නේ විද්‍යුත් චුම්භක තරංග (Electronic Magnatic Waves) ආධාරයෙනි. [6] රූපවාහිනී මාධ්‍යයේ සංදේශ යැවීමේ කාර්ය ඉටු කරන්නේ ද විද්‍යුත් චුම්බක තරංග





ආධාරයෙනි. විද්‍යුත් චුම්බක තරංග භාවිතය නිසා තොරතුරු ඉතා ඉක්මනින් සහ සජීවී ව විකාශය කිරීමට හැකියාව ලැබේ.

ප්‍රවෘත්ති පිළිබඳව නිර්වචනයන් ට අනුව ප්‍රවෘත්තියක් නම් එය ඉතා ඉක්මනින් වර්තා කළ යුතුවේ. සිදුවීමක් ඉතා ඉක්මනින් ග්‍රාහකයා වෙත ලගා කරවීමේ ප්‍රබලතම මාධ්‍යයන් වන්නේ ගුවන්විදුලිය හා රූපවාහිනීයයි. නමුත් වර්තමානය වන විට ගුවන්විදුලිය අභිබවා ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයක් ලෙස ප්‍රවෘත්ති සහ තොතුරු ලබා දීමේ ප්‍රබලතම මාධ්‍යය ලෙස රූපවාහිනිය පත්වී ඇත.

1991 ගල්ෆ් යුද්ධයේදී CNN වාර්තාකරු පීටර් ආර්නට් ප්‍රථම වතාවට යුද්ධ භූමියේ සිට ලොව පුරා සජීවී ප්‍රවෘත්ති ( Live News) විකාශය කරන ලදී.[7] “ සිදු වූ සිද්ධියක් වාර්තා කිරීම ප්‍රවෘත්ති වේ.” යනුවෙන් මෙතෙක් පැවති නිර්වචනය මෙම වාර්තා කිරීමත් සම-ම අර්බුදයකට පත් වූ අතර “සිදු වෙමින් පවතින දෙයක් වාර්තා කිරීම.” ප්‍රවෘත්ති ලෙස නිර්වචනය කිරීම රූපවාහිනී මාධ්‍යය සතු තාක්ෂණික කුසලතාවක් සහ නිර්මාණකුලත්වය ම්-න් තීන්දු කර තිබේ. ගුවන්විදුලි මැදිරිය තුළ ගුවන්විදුලි වැඩසටහන් ආකෘතීන් සහ තාක්ෂණික ආභාසයන් ලබමින් වර්ධනය වූ රූපවාහිනී මාධ්‍ය අද්‍යතනයේදි තමාගේම අනන්‍යතාවක් ඔස්සේ වර්ධනය වී තිබේ.

ඇමෙරිකාවේ CBS ගුවන්විදුලි ආයතනයේ වැඩසටහන් නිෂ්පාදකවරයෙකු වූ එඩ්වඩ් ආර්.මරෝ (Edward.R.Murrow) විසින් ගුවන්විදුලිය සඳහා නිර්මාණය කළ “Hear it now ” නැමති ප්‍රවෘත්ති වැඩසටහන් ඔහු විසින් CBS රූපවාහිනී ආයතනයට See it now නමින් රූපවාහිනී වැඩසටහනක් ලෙසින් නිර්මාණය කරන ලදි.[8] එඩ්වඩ් ආර්.මරෝ මෙම වැඩසටහනේ එළිමහන් දර්ශන කැමරා ගත කළේ සිනමා පම්ගත කිරීමේ තාක්ෂණය මගිනි. එය හැඳින්වූයේ News Reel System[9] යනුවෙනි. මෙම සිනමා කැමරා ශිල්පියා හැඳින්වූයේ News Reel Cameraman[10] යනුවෙනි.

රූපවාහිනී මාධ්‍යයේ සංධිස්ථානයක් වන්නේ 1974 වන විට අතේ රැගෙන යා හැකි කුඩා කැමරා සහ පම්ගත කිරීමේ උපකරණ නිර්මාණය කිරීමයි. 1974 වන විට මෙසේ නිර්මාණය වූ ENG කට්ටලය (Electronic News Gathering Unit) නිසා ඉතාමත් පහසුවෙන් රූපවාහිනී ප්‍රවෘත්ති ආවරණ කටයුතු සිදු කළ හැකි විය.[11] 1984 වන විට කැමරාව සහ පම්ගත කිරීමේ යන්ත්‍රය එකම

උපකරණයක් බවට පත් වී කැම්කෝඩරය බිහි විය. ( Cemera + Recorder = Camcorder) [12] මේ නිසා පහසුවෙන් තනි පුද්ගලයෙකුට ප්‍රවෘත්ති ආවරණය කිරීමේ හැකියාව ඇති විය. මේ නිසා රූපවාහිනී ප්‍රවෘත්ති කණ්ඩායම එක් පුද්ගලයෙකුගේ කණ්ඩායමක් බවට ( One Man Band ) පත්විය.[13] චන්ද්‍රිකා ප්‍රවෘත්ති ඒකරාශී කිරීම් ක්‍රමය දියුණු වීමත් සම-ම (Satellite News Gathering) ජංගම සංස්කරණ කට්ටලය (Portable Editing Unit), ජංගම සැටලයිට් විකාශන උපකරණ භාවිත කරමින් රූපවාහිනී ප්‍රවෘත්ති ක්ෂේත්‍රයේ සිට මධ්‍යස්ථානය දක්වා විකාශය කිරීමක් (Fly away System) දියුණු වී තිබේ.[14] මේ නිසා අද්‍යතන රූපවාහිනී ප්‍රවෘත්ති යනු සංස්කරණ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස අධ්‍යයනය කිරීම ලෝක ප්‍රවෘත්ති පාලනය පිළිබඳ වටහා ගැනීමට මහෝපකාරී වේ.

## තාක්ෂණය හා බද්ධ වූ කලා මාධ්‍යයක් ලෙස රූපවාහිනිය

රූපවාහිනී මාධ්‍යය කලා මාධ්‍යයක් ලෙසද අනෙකුත් කලා මාධ්‍යයන් අතර කැපී පෙනේ. මෙම රූපවාහිනී මාධ්‍ය සුවිශේෂ වන්නේ අතිවිශාල පිරිසකට ඉතා පහසුවෙන් නිර්මාණය සමීප කරවීමට ඇති හැකියාව නිසාය. රූපවාහිනී මාධ්‍ය ප්‍රේක්ෂකයා විවිධ රුචිකත්වයන්ට හුරුකරවීමේ ප්‍රබල මාධ්‍යයක් ලෙස හඳුනාගත හැකිය.

රූපවාහිනී මාධ්‍ය සිනමා මාධ්‍ය මෙන්ම අධ්‍යක්ෂකවරයාගේ ප්‍රකාශන මාධ්‍යක් ලෙස හඳුන්වයි. නමුත් එය අධ්‍යක්ෂකවරයාගේ හුදකලා ප්‍රකාශන මාධ්‍යක් නොවේ. එය සාමූහික කණ්ඩායම් ක්‍රියාවලියකි. රූපවාහිනී නිර්මාණ බිහි කිරීමත්, එම නිර්මාණ රස විඳීමත් සෑම විටම සිදු වන්නේ කණ්ඩායම් ස්වරූපයෙනි. රූපවාහිනී ප්‍රකාශකයා යනු පවුලේ සාමාජික පිරිසගේ නැතහොත් සමීප සම්බන්ධතාවලින් යුතු පිරිසකි. රූපවාහිනී නිර්මාණයක් සිදු කරන්නෙත් එය රස විඳින්නේත් බහිර්වර්ති තත්ත්වයක් තුළය. (Extrovert) " කලාව යනු අනුකරණයයි." යනුවෙන් ඇරිස්ටෝටල් පඬිවරයා පවසයි. බාහිර සාහිත්‍ය විචාරකයන්ද නිර්මාණකරුවා සතු ප්‍රධාන ගුණ තුනක් පිළිබඳ සඳහන් කරයි. එනම් ප්‍රතිභා ශක්තිය, ව්‍යුත්පන්න බව, සතතාභ්‍යාසය යනාදී වශයෙනි. අපූර්ව දේ නිර්මාණය කිරීමට ඇති හැකියාව ප්‍රතිභා ශක්තිය ලෙස හඳුන්වයි. ප්‍රාථමික යුගයේදී කලා නිර්මාණ සම්පූර්ණයෙන්ම පුද්ගලයාගේ ප්‍රතිභා ශක්තිය මතම ක්‍රියාත්මක වූ බව පිළිගනී. එම නිසාම තාක්ෂණික අංශය (Technical Aspect) වෙනම අංශයක් ලෙසත් නිර්මාණාත්මක වින්දනය (Creative Feelings) වෙනම අංශයක් ලෙසත් බෙදා





වෙන්කර පවත්වා ගෙන යන ලදී. කලා නිර්මාණයක් යනු තාක්ෂණයෙන් වෙන් වූ භාවිතයක් බව මෙමගින් තහවුරු කෙරේ.

ග්‍රීක දාර්ශනිකයෙකු වූ ප්ලේටෝ ට අනුව ශිල්ප ප්‍රධාන කොටස් දෙකකට බෙදා දක්වයි. එනම් මානුෂික ශිල්ප සහ දිව්‍යමය ශිල්ප වශයෙනි. එය තවත් වර්ග කිරීමකට අනුව ලලිත කලා හා උපයෝගිතාවාදී ශිල්ප ක්‍රමයක් යනුවෙන් බෙදා දක්වයි.[15]

ප්ලේටෝගේ මෙම බෙදාදීම අනුව කලා ශිල්ප යනු දිව්‍යමය ක්‍රියාවලියකි. කලාකරුවා ආවේශයෙන් යුතුව නිර්මාණ බිහි කරන අතර එය ඔහුට සහජයෙන් ලැබුණු දායාදයකි.[16] මෙම විග්‍රහයෙන් පැහැදිලි වන්නේ කලා නිර්මාණ යනු සම්පූර්ණයෙන්ම පුද්ගලයා මූලික කොට ගෙන නිර්මාණය වන බවයි.

නමුත් කාර්මික විප්ලවයත් සම-ම (Industrial Revolution) ඇති වන තාක්ෂණික පෙරළියත්, ධනේෂ්වර වෙළඳපොළ බිහිවීමත් හේතු කොට ගෙන තාක්ෂණිකමය (Technologically) සම්බන්ධතාව නිර්මාණකරණයට බද්ධ විය. එදා පුද්ගලයා මූලිකව බිහිවූ ගීතය, නැටුම, චිත්‍රය පවා අද තාක්ෂණය හා මුසුව ක්‍රියාත්මක වෙයි. තාක්ෂණ මාධ්‍යක් ලෙස බිහිවන රූපවාහිනී මාධ්‍ය තාක්ෂණික හා නිර්මාණාත්මක ක්‍රියාවලියක සුසංයෝගයක් ලෙසින් හඳුනා ගත යුතුයි. රූපවාහිනී නිර්මාණයකින් තාක්ෂණය හෝ නිර්මාණාත්මක බව හෝ බෙදා වෙන් කළ නොහැක.

රූපවාහිනී මාධ්‍ය වැඩසටහන් වල අන්තර්ගතය සහ ආකෘතිය නිර්මාණය කිරීමේදී ඒ සඳහා භාවිත කරන තාක්ෂණික ආම්පන්න සහ තාක්ෂණික ක්‍රමවේද විශාල කාර්යභාරයක් ඉටු කරයි. මුල් යුගයේ භාවිත කළ Tube රූපවාහිනී කැමරා වලට වඩා වර්තමානයේ භාවිත කරන CCD කැමරා වලින් ගුණාත්මක රූප ලබා ගත හැකිය. ඒවාගේම මුල් යුගයේ භාවිත කළ U- Matic low Band / U- Matic High Band පටිගත කිරීම්වලට වඩා Digital පටිගත කිරීම්වල ඇති ගුණාත්මක බව නිර්මාණකරණයට විශාල දායකත්වයක් ලබා දෙයි. කලින් භාවිත කළ ඒකජ (Linear) සංස්කරණ ක්‍රමවේදයට වඩා පරිගණක ඒකජ නොවන (Non-Linear) සංස්කරණ ක්‍රමය භාවිත කිරීමෙන් විවිධ නිර්මාණ අංගයන් රූපයට එක්කළ හැකිය. ධනේෂ්වරයේ වර්තමාන අදියරේදී මිනිස් නිර්මාණ ශක්තිය පරිගණක සම-සම්බන්ධ වී ඇති තත්ත්වය අවබෝධ කර ගැනීමෙන් මෙය තව දුරටත් අවබෝධ කර ගත හැකිය.

රූපවාහිනී මාධ්‍ය හා සම්බන්ධ වන කුමන තරාතිරමක නිර්මාණශීලී පුද්ගලයෙකු වුවද රූපවාහිනී මාධ්‍ය සතු පුද්ගල බද්ධ නිර්මාණාත්මක කුසලතාව හා තාක්ෂණික කුසලතාවය යන අංශ දෙක පිළිබඳව අධ්‍යාපනයක් නොලබන්නේ නම් නිර්මාණ අසාර්ථක බවට පත්වේ. රූපවාහිනී නිර්මාණයක නිර්මාණාත්මක බව හුදෙක් පුද්ගලයාගේ නිර්මාණ ශක්තිය තුළ පමණක් නොව තාක්ෂණික ශක්තිය තුළ ද වර්ධනය වී ඇති බව මෙහිදී අවධාරණය කළ යුතුයි. රූපවාහිනී මාධ්‍ය සඳහා රූපය මවන එකම මෙවලම කැමරාව (Camera) පමණක් යන්න අද යල්පැන ගිය මතයකි. සමහර රූපවාහිනී සහ සිනමා කෘතිවල ස්වභාවික ලෝකයේ දර්ශන (Natural) හෝ ජීවීන් ( මිනිසුන් / සතුන්) දැකිය නොහැකි අතර ඒ වෙනුවට ඇත්තේ පරිගණකයෙන් නිර්මාණය කළ ත්‍රිමාණ (CD) ජීවීන් සහ පරිසරයන්ය. සමහර දර්ශන වල ස්වභාවික හා පරිගණක දර්ශන එකට මුසුකර ඇත. විවිධාකාර වූ පසුතල නිර්මාණය කිරීම, විශේෂ දෘශ්‍ය ප්‍රයෝග සකස් කිරීම ආදිය පරිගණක ම-ින් සිදු කරයි. දිනෙන් දින තාක්ෂණය මගින් හැඩතල වෙනස් කරන්නා වූ රූපවාහිනී මාධ්‍ය තුළ හැසිරෙන මාධ්‍යකරුවා නිතර අභ්‍යාසයේ යෙදෙන අධ්‍යයනයේ යෙදෙන පුද්ගලයෙකු වීම අත්‍යාවශ්‍ය වේ. තාක්ෂණික අංශය පිළිබඳව අනවබෝධයෙන් නිර්මාණයේ යෙදෙන රූපවාහිනී නිර්මාණකරුවා පූර්ණ නිර්මාණකරුවෙකු නොවේ. එසේම තාක්ෂණික අංශය පමණක් දැනගත් පුද්ගලයා නිර්මාණකරුවෙකු නොවන්නේය. ඔහු හුදෙක් උපකරණයක් මෙහෙය වන්නෙක් පමණක් වේ.

## අවබෝධයෙන් අධ්‍යයනය කළ යුතු රූපවාහිනී මාධ්‍ය :-

රූපවාහිනී මාධ්‍ය බටහිර ලෝකය පුරා ප්‍රචලිත වූ මුල් යුගයේ සිටම එය අවබෝධයෙන් අධ්‍යයනය කළ යුතු මාධ්‍යයක් බව පෙන්වා දී තිබේ. රූපවාහිනී මාධ්‍ය පිළිබඳව අධ්‍යයනය කළ යුත්තේ ඒ හා සම්බන්ධ වී සිටින මාධ්‍යකරුවන්ට පමණක් නොවේ. රජය, මාධ්‍ය අයිතිකරුවන්, මාධ්‍ය ශිල්පීන්, සම්පත් දායකයින්, ප්‍රේක්ෂකයින්, සිවිල් සමාජය, ආගමික නායකයින් ආදී සියලු දෙනාම විවිධ මට්ටමෙන් රූපවාහිනී මාධ්‍ය පිළිබඳවත් එහි භාවිතාව පිළිබඳවත් නිරන්තර අධ්‍යයනයක යෙදීම සහ සුපරික්ෂාකාරී වීම ඉතා ඵලදායී වේ. 1970 දශකය වන විට රූපවාහිනී මාධ්‍ය පිළිබඳව ඉගෙනීම බටහිර ලෝකය තුළ ව්‍යාප්ත වන්නට විය. නමුත් ඒ සඳහා විධිමත් ආයතන බිහිවූයේ සෙමිනි. විධිමත් ඉගැන්වීම් ආයතන නොතිබුණු නිසාම සිනමාව සහ රූපවාහිනිය පිළිබඳ ආධුනිකයාට ඉගෙන ගැනීමට සිදුවූයේ මාධ්‍ය තුළ සිටින ජ්‍යෙෂ්ඨයන් ඇසුරිනි.





Leanner Klein බ්‍රිතාන්‍යයේ රූපවාහිනී වාර්තා වැඩසටහන් අධ්‍යක්ෂකවරියකි. 1970 දශකයේ ඇය රූපවාහිනී අධ්‍යක්ෂකවරියක් වීමට ඉගෙන ගැනීම සඳහා උත්සාහ ගත්ත ද ඒ සඳහා විධිමත් ආයතනයක් නොවීය. එහිදී යම් යම් පුද්ගලයින් ඇයට උපදෙස් දී ඇත්තේ " ඔබට රූපවාහිනී අධ්‍යක්ෂකවරියක් වීමට නම් ඇති හොඳම සුදුසුකම සංස්කරණ මැදිරි බිම අතුගෑමත් තේ සෑදීමත් " බවයි. [17]

( " The best qualification for becoming a Television Director, they siad, was to sweep the cutting room floor and make the tea.........." )

රූපවාහිනී මාධ්‍ය අධ්‍යයනය පිළිබඳ විධිමත් අධ්‍යාපන ආයතන බිහිවීමත් සම- ම මෙම තත්ත්වය බටහිර රටවලින් ගිලිහුන ද ලංකාවේ සිනමාව හා රූපවාහිනී මාධ්‍ය පිළිබඳව ආධුනිකයින්ට ඉගෙන ගැනීමට ඇති එකම මාර්ගය ජ්‍යෙෂ්ඨයින් පසුපස යෑමේ මාර්ගයයි. එයට හේතුව ශ්‍රී ලංකාවේ මේ වන තුරු ජාතික මට්ටමින් විධිමත් වූත් පිළිගත හැකි වූත් රූපවාහිනී මාධ්‍ය අධ්‍යාපන ආයතන බිහි නොවීමයි.

බටහිර ලෝකයේ රටවල 1970 දශකය තුළ රූපවාහිනී මාධ්‍ය ප්‍රචලිත කිරීමට විවිධ වැඩපිළිවෙලවල් ක්‍රියාත්මක කරන ලදී.එංගලන්තයේ බි.බි.සි.(BBC) ආයතනය (British Broadcasting Corporation) ඉතා විධිමත් පුහුණු පම්පමියක් ආරම්භ කළ අතර එය විශේෂයෙන් ම තාක්ෂණික ශිල්පීන් බිහි කිරිමටත් ඒ හරහා විවිධ රැකියා අවස්ථා නිර්මාණය කිරිමටත් මූලිකත්වය දී තිබේ. ඊට අමතරව තරුණ උපාධිධාරීන් සඳහා රූපවාහිනී මාධ්‍ය පිළිබඳ අධ්‍යයන පාඨමාලා ද ආරම්භ කරන ලදි.[18]

1970, 1980 දශක වන විට එංගලන්තයේ පෞද්ගලික අංශය ද වැඩමුළු ආශ්‍රිතව කුඩා ප්‍රමාණයේ පුහුණු ලබා දීම් සිදු කර තිබේ. එහි දී විශේෂයෙන්ම කාන්තාවන්ට ද රූපවාහිනී මාධ්‍යයට ඇතුළු වීමට අවස්ථාවක් ලබා දී ඇත.[19] රූපවාහිනී මාධ්‍යයේ තාක්ෂණික අංශයේ අධිකාරි බලය තවමත් අපේ රටේ පවත්වාගෙන යනු ලබන්නේ පිරිමින් විසිනි. තාක්ෂණ අංශයේ බල අධිකාරිය පමණක් නොව ර-පෑම හැර අනෙකුත් නිර්මාණ අංශයන්ගේ අධිකාරි බලය ද පිරිමින් සතුවෙයි. රූපවාහිනී මාධ්‍ය පිරිමින් සතු හැකියාවක් (Male Job) ලෙස ලාංකීය කාන්තාව ද තීරණය කිරිම මෙයට ප්‍රධාන හේතුවක් වී තිබේ. එංගලන්තය, ඇමරිකාව වැනි රටවල කාන්තාවන් රූපවාහිනී මාධ්‍ය තාක්ෂණික අංශය පිළිබඳ පුහුණු සඳහා

ද සම්බන්ධවීමට අවස්ථාව උදාකර ඇත. කැමරා ශිල්පිනියන්, සංස්කරණ ශිල්පිනියන් ලෙස එම රටවල කාන්තාවන් විශාල වශයෙන් සේවය කරයි. විශේෂයෙන් ම ශාලිකා කැමරා කටයුතුවල (Studio Camera Operation) කාන්තාවන් විශාල වශයෙන් යෙදී සිටී.

මෙම ප්‍රවණතාවට ප්‍රධන හේතුවක් වී ඇත්තේ රූපවාහිනී මාධ්‍ය උපකරණ ඉතා පහසුවෙන් ක්‍රියාත්මක කළහැකි සැහැල්ලු උපකරණ ලෙස නිර්මාණය වීමත් සමගය. එංගලන්තයේ ලන්ඩන් නුවර ආශ්‍රිතව කාන්තාවන් සඳහා ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය පිළිබඳව අධ්‍යාපනය ලබා දීමේ (Women’s Audio Visual Education Scheme) වැඩ පිළිවෙලවල් ආරම්භ විය.[20] මෙසේ විධිමත් අධ්‍යාපනයක් රූපවාහිනී මාධ්‍ය පිළිබඳව ලබා ගැනිමට සැලැස්වීම නිසා එංගලන්තයේ රූපවාහිනී වැඩ සටහන්වල ගුණාත්මක වැඩි දියුණුවක් ඇති වු බව පෙනේ.

ඉතා විශාල වශයෙන් අධ්‍යාපන ආයතනවලත් බහුකාර්මික ආයතන වලත් රූපවාහිනී සහ සිනමා මාධ්‍ය පිළිබඳව විධිමත් ඉගැන්වීම් කටයුතු ආරම්භ වී ව්‍යාප්ත වු අතර 1990 දශකයේ දී රූපවාහිනී මාධ්‍ය අධ්‍යයන කටයුතු විශ්වවිද්‍යාල තුළ ද ක්‍රියාත්මක වීම ආරම්භ විය.[21] විශ්වවිද්‍යාලවල ආරම්භ කළ ප්‍රායෝගික පුහුණුව ඇතුළත් පාඨමාලාවල ඉලක්කය වුයේ නිර්මාණශිලි වැඩසටහන් නිපදවීමට අවශ්‍ය ශිල්පීන් නිර්මාණය කිරිමයි. එමෙන්ම විචාරාත්මක විනයකින් යුතු මාධ්‍ය අධ්‍යයනයක් සහ සංස්කෘතික අධ්‍යයනයක් මේ මගින් ඇති කරන ලදි. මෙම පුහුණුව මගින් විශ්වවිද්‍යාල තරුණ තරුණියන් මාධ්‍ය අංශයේ රැකියා ලබා ගැනීම අපහසු නොවීය.

බෙහෝ දියුණු රටවල් පිළිබඳව අධ්‍යයන කිරිමේදී එම රටවල රූපවාහිනී මාධ්‍යයට සම්බන්ධ වී ඇති මාධ්‍යකරුවන් මාධ්‍ය පිළිබඳව උපාධි, පශ්චාද් උපාධි වැනි උසස් අධ්‍යාපන ලැබූ අය බැව් තහවුරු වේ. නමුත් අප රටේ රූපවාහිනී මාධ්‍ය පිළිබඳව විධිමත් ඩිප්ලෝමා, උපාධි, පශ්චාද් උපාධි වැනි පාඨමාලා නොතිබීම රූපවාහිනී මාධ්‍ය අයාලේ යාමට හේතු වී ඇත.

රූපවාහිනී මාධ්‍ය කර්මාන්තයක් (Industry) ලෙස වර්ධනය වීමට නම් ඒ තුළ විවිධ මට්ටමේ වෘත්තීන් (Professions) වර්ධනය විය යුතුයි. මාධ්‍ය ආයතනයට සම්බන්ධ මාධ්‍යකරුවාමෙන්ම, නිදහස් මාධ්‍යකරුවා ද (Free Lance) විධිමත් පුහුණුවකට බඳුන් කළ යුතුයි. එමගින් මාධ්‍යකරුවා වෘත්තිකයෙකු (Professional)විය යුතුය. රූපවාහිනී මාධ්‍යයේ තාක්ෂණය නිතර වෙනස් වන





බැවින් එම වෙනස්වන තාක්ෂණය පිළිබඳව නිරන්තර පුහුණු පාඨමාලා පැවැත්වීම අත්‍යාවශ්‍ය කරුණකි. එංගලන්තයේ සිනමා හා රූපවාහිනී කාර්මිකයන්ගේ සංගමය (The Association of Cinematograph and Television Technicians - (ACTT)) සහ (Broadcast Entertainment Cinema Theatre union) - (BECTU) යන සංගම් මගින් තම සමාජික ශිල්පින්ට මුලික පුහුණුව ලබා දිම සඳහා වගකීමෙන් කටයුතු කරයි. මෙම පුහුණුවීම් ලබා දිම සඳහා කර්මාන්ත පුහුණු සංවිධානයක් (Industry Training Organisation) පිහිට වූ අතර එම ආයතන මගින් රූපවාහිනී, ගුවන්විදුලි සහ චිත්‍රපට කර්මානතයට අදාළ මාධ්‍ය කුසලතාවයන් වර්ධනයට අදාල පුහුණුව ලබා දෙයි.[22] එංගලන්තයේ සිනමා සහ රූපවාහිනී මාධ්‍යයේ අවශ්‍යතාවයමත ප්‍රමිතගත පුහුණු පාඨමාලා ක්‍රමවේදයක් ලෙස National Vocational Qualification (NVQ) සැලැස්ම ඉදිරිපත් කරන ලදී.[23] වෘත්තිය කුසලතා වැඩි දියුණු කරවීම සඳහා ආරම්භ කළ මෙම සැලැස්ම විවෘත විශ්ව විද්‍යාලය සමග ඒකාබද්ධව ක්‍රියාත්මක කරනලදි. 1994 වසරේ දී එවැනි පාඨමාලා 27ක් ආරම්භ කෙරිණි. එම පාඨමාලා වලින් කැමරාකරණය (Camera) ආලෝකකරණය (Lighting) ශබ්ද (sound) වැඩ සටහන් නිෂ්පාදනය (Production) අංග රචනය (Make-up) පසු නිෂ්පාදනය සහ සංස්කරණය (Post Production - Editing) යන විෂයන් පිළිබඳ මනා පුහුණුවක් ලබා ගැනීමට අවස්ථාවක් උදාකර දුන් අතර ප්‍රායෝගික අභ්‍යාස සඳහා වැඩි අවස්ථාවක් ලබා දී තිබේ. මෙහි දි මෙම රටවල ප්‍රධාන අභිප්‍රාය වුයේ “ මනා පුහුණුවකින් යුතු වෘත්තිකයෙකු ” බිහි කිරිමයි.[24]

ශ්‍රී ලංකාවේ රූපවාහිනී මාධ්‍ය පිළිබඳව පුළුල් හැදෑරීමකින් යුතු ජාතික මට්ටමේ පාඨමාලා ආරම්භ නොවීම අඩුපාඩුවකි. රාජ්‍ය මට්ටමෙන් සහ පෞද්ගලික මට්ටමෙන් රූපාවාහිනී මාධ්‍ය පිළිබඳව පාඨමාලා පැවැත් වුව ද ඒවායේ විෂය මාලා සහ දේශකවරුන් පිළිබඳවත් එහි සැලැස්ම පිළිබඳවත් ප්‍රමිති ගත තත්ත්වයක් තිබේ දැයි සහතිකයක් දිය නොහැක. ලංකාවේ ක්‍රියාත්මක වන බෙහෝ රූපවාහිනී පාඨමාලා න්‍යායාත්මක තලයේ පවතින අතර විධිමත් ප්‍රායෝගික පුහුණුවක් ඉන් නොලැබේ. විධිමත් ප්‍රායෝගික පුහුණුවක් ලබා දිම යනු කලින් කලට වෙනස් වන තාක්ෂණය සම- සම්බන්ධ වී පුහුණු පාඨමාලා පැවැත්වීමයි. පාඨමාලා මෙහෙය වන පුද්ගලයන්ගේ ඒකායන අභිප්‍රාය එම පාඨමාලා හරහා ලාභ ලැබීම බැවින් උසස් මට්ටමේ ප්‍රායෝගික පුහුණුවක් ලබා දිම අදික වියදම් ක්‍රියාවලියක් වන්නාසේම එසේ කලහොත් පාඨමාලා අභ්‍යාසලාභියෙකුට එය දැරිය නොහැකි තරම් වන බැවින් එම පාඨමාලා අසාර්ථක වේ.

මේනිසා ම ලංකාව වැනි රටක වෘත්තිය වශයෙන් රූපවාහිනී මාධ්‍යකරුවන් පුහුණුකිරිමේ ජාතික ක්‍රියවලියට රජයත් පෞද්ගලික අංශයත් ඒකාබද්ධව වැඩ පිළිවෙලක් ආරම්භ කළ යුතුවේ. විශේෂයෙන් ම රූපවාහිනී මාධ්‍ය ඉගැන්වීම රජයේ මැදිහත් වීම මත උසස් අධ්‍යාපන ආයතන හෝ විශ්වවිද්‍යාල මට්ටමෙන් ක්‍රියාත්මක කිරීම රූපවාහිනී මාධ්‍ය අධ්‍යයනයට පිළිගැනීමක් ඇති කිරීම වෙයි. ඒ සඳහා ජාතික මට්ටමේ රූපවාහිනී මාධ්‍ය ඉගෙනුම් ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීම අත්‍යවශ්‍ය වේ.

## මූලාශ්‍ර


1. *Newcomb Horace ( Editor), 1997, Encyclopedia of Television, museum of Broadcast Communication U. S. A., Fitzroy Deaborn Publishers, PP. 1759 - 1760;*
2 *- Ibide - 1977, PP. 1463-1464;*
3. *Wezel Ru Van, 1987, Vedio Hand Book, Second Edition, Helnemann, London;*
4. *Crystal David (Editor), The Cambridge Encyclopedia, Second Edition, P. 1089;*
5. *Dominic Joseph R., 1994, The Dynamics of Mass Communication, NewYork, McGrowHill Publishing Company ;*
6. *- Ibide - 1994;*
7. *Holland Patricia, 1997, The Television Hand Book, London Routledge, P. 248;*
8. *Newcomb Horace, Op.cit, 1997;*
9. *- Ibide - 1997;*
10. *- Ibide - 1997;*
11. *Shrivastava K.M., Radio and T.V. Journalism, Sterling Publishers (PVT) Ltd., New Delhi, PP. 128-130;*
12. *Newcomb Horace, Op.cit, 1997;*
13. *Merrill John C., Lee John, Friedlander Edward Jay, 1990, Modern Mass Media, Harper collings Publishers ;*
14. *- Ibide - 1990;*
15. *ගම්ලත් සුචරිත, සෞන්දර්ය විද්‍යා ඉතිහාසය, එස්. ගොඩගේ සහෝදරයෝ, 1997;*
16. *- එම - 1997;*
17. *Holland Patricia, Op.cit, 1997;*
18. *- Ibide - 1997;*







19. *- Ibide - 1997;*
20. *- Ibide - 1997;*
21. *- Ibide - 1997;*
22. *- Ibide - 1997;*
23. *- Ibide - 1997;*
24. *- Ibide - 1997;*

# 14

# තාක්ෂණික හා කලාත්මක ප්‍රවණතාවනට අනුකූලව වෙනස් වන සිනමා කැමරා ශිල්පියාගේ වෘත්තිකභාවය.

චමින්ද ප්‍රභාත්

කැමරාකරුගේ වෘත්තියමය පසුබිමෙහි වාර්තාකරණ ක්‍රියාවලියට සීමා වී පවතින්නේ කැමරාකරුගේ කාර්යයෙහි සැබෑ ස්වරූපය කියාපෑමට පමණක් නොව එහි සමාජීය ස්වරූපය හෙළි දැක්වීම යන්නයි. වර්තා කරුවකු ලෙසින් ක්‍රියාකරන කැමරාකරු විසින් රූපවාහිනී හෝ චිත්‍රපට සම්මතයට අනුකූල වූ ප්‍රදර්ශනාත්මක ක්‍රියාවලියක් මත පිහිටා ක්‍රියාකිරීම ද අනිවාර්ය වූවකි. එයට අන්තර්ගත අනෙකුත් උපාංගයන් අතර නිරූපණය කරන දෙයෙහි අසමානත්වයන් එයට අලෝකය සැපයෙන කලාපයන් සහ ප්‍රමාණයන් යන මේ කරුණු මත වෙනසක් වන්නේ නම් එය ඉතා පැහැදිලිවම කලාත්මක යමක් එළිදැක්වීම සඳහා ම විය යුතුය. වර්තාකරුවකු ලෙස ක්‍රියාකරන කැමරාකරුවෙකුගේ අනිවාර්ය බැඳීම් අතර වැදගත් තැනක් එහි මාධ්‍ය ප්‍රචාරණය සහ එහි නියමයන් වටා බැඳී ඇත. එහි අවාසනාවන්තම කාරණය ලෙස දැක්විය හැක්කේ කැමරා ශිල්පියාත් නරඹන්නාත් අතර පවත්නා සම්බන්ධතාව බිඳ වැටීමයි. එනම් ඔහු සාමාන්‍ය සිනමා රසිකයෙකු බවට පත්වූයේය යන්නයි. නැතහොත් ඔහුගේ වෘත්තීමය හැකියාවන් අවම වශයෙන් ප්‍රදර්ශනය කිරීම හෝ එය පහළටම වැටීමයි.

එමගින් කැමරා ශිල්පියාගේ කලාත්මක කුසලතාවන්ට කොන්දේසි





පැමිණවීමක් සිදුවන්නේ ද නැතහොත් එමගින් ඔහුගේ අනන්‍යතාව හෙළි දැක්වීමට බාධාවක් වන්නේ හෝ ඔහුගේ කලාත්මක හා සිවිල් අයිතිවාසිකම්වලට හානියක් සිදුවේ ද? මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීම එතරම් සරල එකක් නොවේ. එය එම වෘත්තියෙහි වර්ධනයට හේතුකාරක වූ නියමයන් සියල්ලම විමසා බැලීමෙන් හෙළිදරව් කරගත යුත්තකි. එය කෙනෙකුගේ කුසලතාවයෙන් දැක්විය හැකි දෙයක් නොවන අතර විවිධ ශිල්පීන්ගේ වෘත්තියමය අත්දැකීම්වලින් හෙළිවන්නක් ද නොවේ. එය වාර්තාකරුවෙකු ලෙසින් ක්‍රියාකරන කැමරාකරුවාගේ වෘත්තියෙහි දිර්ඝකාලින වර්ධනය විමර්ශනය කර බැලීමකින්ම පැහැදිළි කරගත යුතු කාරණාවකි.

ලූමියෙර් සහෝදරයන්ගේ මුල් කාලයේ චිත්‍රපට බොහෝමයක් වාර්තා චිත්‍රපටකරණයෙහි පියවර ලෙස සඳහන් කළ හැකිය. එහිදී චිත්‍රපට වාර්තාකරුවා විසින් එම අරමුණට විශේෂිත වූ සිද්ධිය උපරිම වශයෙන් හෙළිදැක්වීමයි. මෙවන් රූපගත කිරිමක මූලිකත්වය ගෙන ක්‍රියාකල මුල් ම කැමරා ශිල්පියා කවුරුන් ද යන්න අප්‍රකට කරුණකි. එය කැමරාවේ යාන්ත්‍රික ක්‍රියාවලිය මත හට ගත්තා වූ රූපගතකරන සේයාපටයෙහි නිරූපණය වන ඇතුළ වෘත්තීමය කුසලතාවන් මතුකර දැක්වීමක් ලෙසින් සඳහන් කළ හැකිය. එහි වැදගත් ම සාධකය ලෙස ගැනෙන්නේ වෘත්තිය වශයෙන් ඉහළ තත්ත්වයක් පැවතිමයි. නමුත් ඇත්ත වශයෙන්ම මෙහිදී ප්‍රේක්ෂකයා ඉහළ තත්වයෙන් නිරූපණය කිරිම කවරක් උපකාරයෙන් සිදුකළේ ද යන්න දැනගැනීමේද අවශ්‍යතාවක් ඔහු තුළ නොපවතියි. නමුත් වාර්තාකරුවෙකු ලෙසින් ක්‍රියාකරන කැමරාකරුවා විසින් කිසියම් සම්පාදිත ක්‍රමෝපායයන් සෑමවිටම නිර්මාණාත්මක හෙළිදැක්වීමක් වීම ද අත්‍යවශ්‍ය කරුණකි. ප්‍රේක්ෂක අපහට මෙවැනි නිරූපණයක් වැදගත් වන්නේ වාර්තාවක් ලෙසින් පමණක් වන අතර එය නිර්ණාමිකව හෙළි දැක්වීම මතින් එහි මුල් ස්වරූපය කිසිසේත් බැහැර කළ නොහැකි වනු ඇත. එහි තාක්ෂණික සීමාවන්ට සැබෑ වැදගත්කමක් හිමි වන්නේ කලාතුරකිනි. මෙ මගින් තීරණය වන්නේ නිරූපණයට අදාළ වන්නාවූ කෘතියෙහි වටිනාකම මිස එහි ගුණාත්මක තත්ත්වය නොවේ. නිදසුනක් ලෙස ආවරණය වූ අවකාශයක් නිරූපණය කිරීමට අදාළ වන කොන්දේසි මත වැදගත් වන්නේ එහි සැබෑවක් ලෙස නිරූපණය කිරීම මිස එහි සියල්ල අලංකාරාත්මකව නිරූපණය කිරීම නොවේ. මෙවන් පදනමක් මත පිහිටා සිට දෙවන මට්ටමට අයත් ලක්ෂණයන් හෙළි දැක්වෙනු ඇත. ඒ අනුව සේයා පටයේ අඩංගු වන සිද්ධියට අයත් සමහර කරුණු හෙළි දැක්වෙනු ඇත්තේ තෝරා ගත් සියල්ලෙන් මූලික කොටස්වල ඉදිරිපත් කිරීමක් ආකාරයෙනි. චිත්‍රපට කැමරාකරු වන

“ද්‍රන්කොව් ” විසින් “ ලියෝ තොල්ස්තෝයි ” රූපගත කරණු ලැබීය. එහිදී ඔහු විසින් තෝරා ගනු ලැබූ සමහර ස්ථානයන් සටහන් කර ගන්නා ලදි. එම අවස්ථාවන් කැමරාකරු විසින් සිතා මතාම ශ්‍රේෂ්ඨ ලේඛකයාගේ ජීවිතය දෙස නැඹුරු වී බැලීමක් ලෙසින් දැක්විය නොහැක. ඇත්ත වශයෙන්ම එය එම වකවානුවෙහි තිර මාධ්‍ය ඉදිරිපත් කිරීමේ ප්‍රවණතාවක් ලෙසින් පැවති දෙයක් විනා වෙනත් කරුණක් නොවෙයි. එයට අන්තර්ගත අංගයන් ලෙස පැවතියේ “ලියෝ තොල්ස්තෝයි ” ඇවිදිමින් කාලය ගෙවන ආකාරය තොල්ස්තෝයි තම නිවසෙහි මැද සාලයෙහි තම පවුලේ අය සම- තේ පානය කරන ආකාරය තොල්ස්තෝයි ගෙදරට අවශ්‍ය දර තමන් විසින් ම පලා රැස් කර ගන්නා ආකාරය සහ තම ගවයන්ට අවශ්‍ය තණ කොළ කැතිගසා තමන් විසින්ම රැස් කර ගන්නා ආකාරය මෙසේ චිත්‍රපට කැමරා ශිල්පී “ ද්‍රන්කෝන් ” වාර්තාකරුවකුගේ ස්වරූපයක් ගනිමින් සාමාන්‍යයෙන් දෛනිකව සිදු වන ක්‍රියාවලියක කොටස් ඉදිරිපත් කරනු ලබයි. නමුත් මෙතෙක් වේලා ඔහු විසින් සම්පාදනය කරනු ලැබූ ගමන්මග එතරම් සංකීර්ණ ගැටලුවක් ලෙසින් දැක්විය නොහැකිය. මෙහි තාක්ෂණික ක්‍රියාවලියට හිමි වන්නේ දෙවන ස්ථානයයි. මෙහි කැමරාව ඉතා පහසුවෙන් භාවිත කරමින් ඒ උපකරණ සමගින් ගස් අතර සැ-වී ගතහැකි තරමේ සරල සහ සැහැල්ලුවෙන් පැවතිය යුතුව තිබිණි. එවන් තාක්ෂණික හැකියාවන් භාවිත කර ගැනීම මි-න් ක්ෂණිකව කැමරාව තැනින් තැනට ගෙන යමින් විවිධ ස්ථානයන්හි රූපගත කිරීමටත් ඔහුටත් නොදැනීම රූපගත කිරීම නිසා කීර්තිමත් ලේඛකයාගේ සාමාන්‍ය හැසිරීම ඒ හරහා හෙළි දැක්වීමටත් සමත්විය. වෙනත් වචනවලින් සඳහන් කරන්නේ නම් ඒ මට්ටම සිනමාවෙහි පරිමාණය ඉතා පහත් අවධියක පැවති යුගයක් ලෙසින් සඳහන් කළ හැකිය. නමුත් එවන් මට්ටමක සිට වුවද කැමරාකරුවා විසින් එම සැබෑ ස්වරූපය හෙළි දැක්වීමට උත්සාහ දැරුවා මිස එය කලාත්මක නිරූපණයක් ලෙසින් චමිනාකම් විනාශ නොවී රැක ගැනීම ප්‍රශංසා කටයුතු කරුණකි.

තාක්ෂණික ක්‍රියාවලියට සමාන්තරව එම සේයා පටයේ ගුණාත්මක චමිනාකම මතුකර දැක්වීම උදෙසා වාර්තාකරුවෙකු ලෙස කටයුතු කරන කැමරාකරු සතුවද වගකිවයුතු කාර්යන් කිහිපයක් පැවරී ඇත. එනම් එම ඉදිරිපත් කිරීමට යෝජිත නිරූපණයට අදාළ සිද්ධීන් සහ එයට අදාළ තොරතුරු වෙන් කර ගැනීම එම වාර්තාකරණයට අදාළ වන වීරයන් වෙන් කර දැක්වීම එයට අයත් වුවන් හෝ වස්තූන්ගේ ගති ලක්ෂණ හෝ ස්වභාවය හෙළි කර දැක්වීම ඉදිරිපත් කරන්නා වූ සිද්ධියට අදාළ වන වැදගත් අවස්ථාවන් මතුකර දැක්වීම ඉදිරිපත් කර ඇති සිද්ධියෙහි සැබෑ ස්වරූපය හෙවත් යථා තත්වය හෙළි දැක්වෙන





රූ කොටස් හෝ සේයා පට ඇත්නම් ඒවා එකතු කර රූපරාමු අතරට සම්බන්ධ කිරීම යන මේවායි. මේ සියල්ලෙන්ම පැහැදිලි වන්නේ වාර්තාකරුවකු ලෙස මාධ්‍යවේදියෙකු සතුව පැවතිය යුතු විශේෂිත ගුණාංගයන්ය. මෙවන් නො වෙනස්වන කරුණු මත පදනම් වූ වාර්තා චිත්‍රපටයට පෙර කාලයෙහි වාර්තාකරණය යන්න හෝ වාර්තාකරුගේ ක්‍රියාවලිය යන්න සම්පාදනය වී තිබිණි.

වාර්තා චිත්‍රපටකරණයට මීල-ට බලපෑ ප්‍රබල සාධකයක් ලෙස සාමාජීය දේශපාලනය පිළිබඳ මාධ්‍ය කාර්යභාරය යන්න දැක්විය හැකිය. මෙහිදී ප්‍රචාරණය සඳහා මාධ්‍ය භාවිතය යන්න ප්‍රබල ලෙස සමාජය තුළ තහවුරු කරනු ලැබූවකි. එහිදී අනෙකුත් ප්‍රචාරණ මාධ්‍යයන් අභිබවා නැගීසිම් තිර මාධ්‍ය දේශපාලනික මතවාදයන් සහ දේශපාලනික දර්ශනය මාධ්‍ය ප්‍රචාරණ වැඩි වරප්‍රසාද ලබා දෙන්නට වීම එම මාධ්‍යයෙහි ස්ථාවරත්වයට බලපෑ වැදගත් කරුණක් ලෙසින් සඳහන් කළ හැකිය. මෙම සංකීර්ණ සමාජීය දේශපාලන ක්‍රියාවලිය පොදු ජනතාවගේ කලාත්මකත්වය නංවන්නා වූ තවත් ආකාරයක සැබෑ තත්වයෙහි හෙළි දැක්වීමක් ලෙසින් සැලකීමට හැකියාවක් නොමැත. මක්නිසාදයත් එමගින් කිසියම් නියමිත දත්තයන් පිළිබඳව ඉදිරිපත් කිරීමක් සිදු නොවන නිසාවෙනි.

සාමාජීය දේශපාලනමය වැඩසටහන් අධ්‍යක්ෂකවරයෙකුට මිනැම ස්වරූපයක් ගත් සේයා පටයක් විශ්ලේෂණාත්මකව ගෙන හැර දැක්වීමට හැකියාවක් පවතියි. ඒ සඳහා ඔහු සංස්කරණය මගින් හැකියාවක් ලබා දී ඇති අතර තවදුරටත් එම ක්‍රියාවලිය පැහැදිලි කරනු සඳහා රූපරාමු සංරචනය ශබ්ද සහ සංගීතය යෙදවීම පිළිබඳව හැඳින්වීමක් පිටපත උපකාරයෙන් ගෙනහැර දක්වා ඇත. නමුත් එය මැන බැලීමේ සැබෑ හැකියාවක් ඇත්තේ ඉතා පටු සීමාවක් තුළය. එසේ වනුයේ රූපගත කරනු ලැබුවා වූ සියල්ල කලින් සකස් කර ගන්නා ලද සැලැස්මකට අනුව සිදු වන්නේ නම් පමණි. එවන් අවස්ථාවක තිරයට හිමි සෞන්දර්යාත්මක සීමාවන් වඩාත් ආධාරකයක් ලෙසින් රූප මාධ්‍ය තුළ විවිධ කෝණාංගයන්ගෙන් ඉදිරිපත් කරන නිරූපණයන් හා සමීප රූප භාවිතය හා මූලාංගයන් තෝරා ගැනීම යොදා ගත් බව දැක්විය හැකිය. “ ජිහි වෙර්තව් ” නම් සිනමාකරුවා මෙවන් අරමුණක් කරා හඹා ගිය බව කිව හැකිය. ඔහු විසින් තම අරමුණ මුදුන් පමුණුවා ගනු වස් සෑම කැමරාකරුවෙකුම මාධ්‍යවේදියෙකු විය යුතුය යන්න අවධාරණය කළේය. ඒ අනුව ඔහුගේ නිගමනය වූයේ තමන් තනියම සේයා පටයට අවශ්‍ය තොරතුරු රැස් කරගත යුතු බවයි. ඒ සඳහා ඔහුට අවශ්‍ය වන තිර මාධ්‍යයට අදාළ මූලික දැනීම ලබා දීම වැදගත් කොට සලකනු ලැබීය.

නව කාර්මීකරණය නිසා කැමරාකරුගේ හැකියාවන් වඩාත් පුළුල් කරනු ලැබීය. උදාකරණු ලැබූ ඔහුගේ හැකියාවන් අතර ප්‍රබල ස්ථානයක් ගත්තක් ලෙස තම පරිකල්පනයට අනුව සකස් වූ සීමාවන් මත ක්‍රියා කිරීමට වැදගත් ස්ථානයක් හිමි වෙයි. චිත්‍රපට වාර්තාකරණයෙහි වර්ධනය සංකේතවක් කරවන්නක් ලෙස එහි කලාත්මක ක්‍රියාකාරීත්වයෙහි ආරම්භය සඳහන් කළ හැකිය. එය රදා පවතිනු ඇත්තේ වාර්තා චිත්‍රපටයෙහි අධ්‍යක්ෂකවරයාගේ හා කැමරාකරුගේ භූමිකාව මතය. වාර්තා චිත්‍රපටකරණයට අදාළ අත්දැකීම් ඒකාරාශී කරගෙන එයට අදාළ කාර්මික හැකියාවන් තව තවත් දියුණු වන්නට වූ බව පෙනේ. ඒත් සම-න් එහි කලාත්මක හැකියාවන් භාවිතා කොට ගැනීමේ ප්‍රවණතාවක්ද වර්ධනය වන්නට විණි. මේ ආකාරයෙන් ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වෙමින් පැවති වාර්තා චිත්‍රපටකරණය අවසානයේ කලාත්මක නිරූපණයන් දක්වා විකාශනය වූ බව පෙනෙයි. නමුත් එහි අනිවාර්ය අංගයක් ලෙස වාර්තාමය ස්වරූපය ඉදිරියටත් රැක ගන්නට සමත් විය. ඇත්ත වශයෙන්ම 1920 සහ 1930 යන දශකයක කාල පරාසයක් තුළ මෙවන් නිර්මාණකරණයන් බිහි වූයේ අතලොස්සක් තරම් ප්‍රමාණයකි. නමුත් එම වකවානුවෙහි චරිතයක මනෝභාවයන් තුළ සැරිසැරීම නැතහොත් චරිතයේ අධ්‍යාත්මිකත්වය විවරණය කර දැක්වීමට උනන්දු වූ බව කිව හැකිය. එයට කදිම නිදසුනක් ලෙස වාර්තා චිත්‍රපටයක ස්වරූපය ඇස්කිමෝ ගෝත්‍රිකයන්ගේ ජීවිතය ගෙන හැරපෑම හෝ ඩෝන්ඩාස්හී පතල්කරුවන්ගේ ජීවන ගැටලු ගෙනහැර දැක්වීම සඳහන් කළ හැකිය. සිනමාවේ මූලාරම්භයේ සිටම සිනමාකරුවාට කාව්‍යාත්මක යම් යම් දේ නිරූපණය කිරීමේ හැකියාව පැවති අතර ඒ හරහා තිරය මත අපූරු සංකලනයන් නිරූපණය කිරීමට සමත් වූ බව පෙනෙයි. එනම් උද්යෝගිමත් නිර්මාණ කිරීම, ශ්‍රමය, ප්‍රකෘති ස්වභාවය සමගින් පවත්නා අරගලය, මාතෘත්වය, ආදි මෙවන් පොදු නිගමනයන්ගේ සීමාවන් තුළට වීරයා සීමා කර ඉදිරිපත් කළ බව පෙනෙයි. ඒ හරහා අප සමාජයේ ජීවත්වන පුද්ගලයෙකුගේ හෝ පුද්ගල සමාජයක හැසිරීම් රටාව හා ක්‍රියාකාරකම් හෙළි දැක්වීමට සමත් වූ බව පෙනෙයි. මේ නිසාම සිනමා කර්මාන්තයට ශබ්ද හා සංගීත හඬ මුසුකළ හොඳ තාක්ෂණික වටපිටාවක් පැවතිම අත්‍යාවශ්‍ය විය. එවන් හැකියාවකින් පිරිපුන් රූපවාහිනී තාක්ෂණයක් හරහා පුද්ගලයන් විශාල සංඛ්‍යාවකගේ හැසිරීම් රටාවන් තුළ එකවරම එක් පුද්ගලයෙකුගේ ක්‍රියාවලියකට ප්‍රේක්ෂක අවධානය යොමු කර වීමට පවා හැකියාවක් ලැබිණි. ඒ සියලු ක්‍රියාකාරකම්වල තාක්ෂණික ක්‍රියාකාරිත්වය මෙහෙයවීමේ කාර්යය භාරව පැවතියේ කැමරාකරුවා හටය. ඔහු සතු හැකියාව ඔහු උපතින් ගෙනා කුසලතාවයන් මත පදනම් වූවක් නොවේ. එය ප්‍රගුණ කිරීමෙන් පුද්ගල හැගීම් දැනගැනීමේ සංවේදී





භාවයක් ඇති ඔවුන්ගේ මානසිකත්වය නිරූපණය කර දැක්වීමේ හැකියාවෙන් පිරිපුන් බුද්ධියක් කැමරාකරු සතුව පැවතිය යුතුය. එසේම පුද්ගලයෙකුගේ සියුම් හැගීම් පවා තේරුම් ගැනීමට සමත් වීම සහ එය ආචාරශීලි ලෙස ඉදිරිපත් කරලීම වැදගත්ය. සිනමා වර්තාකරණය සම්බන්ධව ඇති මෙම පුද්ගලයන්ගේ සිතේ අභ්‍යන්තරයට වැද ගැනීමට ඇති හැකියාව හා එය මතුපිටට හෙළිකර දැක්වීමට ඇති හැකියාව අවසන් වශයෙන් වෘත්තියෙහි සදාචාරාත්මක පැවතුම්වලට දැඩි ලෙස බද්ධ වී පැවතිණි. එවැනි ගැටලුවක් මින් ඉහත දී කිසිවිටක සිදුවිය නොහැකි එකක් විය.

1960 දශකයේ සිනමාකරුවන්ගේ සිනමා කෘතීන් විමසා බැලීමේදී ජීවිත ස්වභාවය මතුපිටට හෙළි දැක්වීම පමණක් සිදු නොකර එය සියලු ආකාරයෙන් විශ්ලේෂණය කොට දැක්වීමට සමත් වේ. එහිදී පුද්ගලයන්ගේ චරිත ස්වභාවයන් හා හැසිරීම් ක්‍රියාකලාපයන් පිළිබඳව බැඳි සැබෑ අරගලයක මාර්ගයෙන් නිරූපණය කර දැක්වීමට සමත් විය. ඇත්ත වශයෙන් ම මෙය ඒ වකවානුවේ තිර මාධ්‍යයේ නිර්මාණකරණයේ නියැලුනු පුද්ගලයන් විසින් සිනමාව ගද්‍යාකාරයෙන් ඉදිරිපත් කිරීමක් ලෙසින් හඳුන්වා දෙනු ලැබීය.

එසේ නම් තිර මාධ්‍යයෙහි පද්‍යාකාර ස්වරූපයට අයත්ව පැවති වටපිටාව පිළිබඳව විමසා බැලීම වමියි. ඒ අනුව මෙම සිනමාවේ පද්‍යාකාර ස්වරූපය කවර ආකාරයෙන් එහි කාර්මික වර්ධනයට මුහුණ දුන්නේද යන්න සලකා බැලීම වමියි. 1920 සහ 1930 අතර දශකයක පමණ කාලයක් තුළ සිනමාවෙහි පද්‍ය ස්වරූපය මතු කර ඇත්තේ සංස්කරණය භාවිත කර ගනිමිනි. වාර්තාමය ස්වරූපයෙන් රූප ගත කරන ලද කොටස් එකිනෙකට සම්බන්ධකරවීම මගිනි. එහි පොදු සංකල්පය ලෙසින් භාවිත දෙය මේ වන විට යථාර්ථය ලෙසින් ඉදිරිපත් කිරීමට සමත් වූ බව පෙනෙයි. එනම් පවත්නා මාතෘකාවට අදාළ වන ලෙස එයට අවශ්‍ය මූලාංගයන් තෝරා ගෙන තේමාව අර්ථ ගැන්වෙන පරිදි ක්‍රමානුකූලව සම්බන්ධ කිරීමයි. මෙය අවබෝධ කර ගැනීමේ පහසුව සඳහා එයට සංගීත හඬ ශබ්දය යන ශ්‍රව්‍යමය උපාංගයන් එකතු කළ බව පෙනේ. ඒ අනුව මෙම සන්ධි කිරීමේ කාර්ය සිදු කර ඇත්තේ කිසියම් තාල රිද්මයකට අනුව බව මෙහිලා විශේෂයෙන් සඳහන් කළ යුත්තකි.

මෙයට කදිම නිදසුනක් ලෙස " විනාඩි දහයකකින් මහල්ලෙක් " සහ විනාඩි දහයක තරම් කෙම් කාලයක් පුරා නොනවත්වා දිවෙන කුඩා දරුවකුගේ

දර්ශනයකි. ප්‍රේක්ෂකාගාරයෙහිද සිමින ළමයා වැඩිහිමි ප්‍රේක්ෂකයන් වේදිකාව දෙස ඉතා හැඟීම්බරව සිමින ආකාරය දෙස බලා සිමියි. අප එම දරුවාගේ වත ගොත දැන ගැනීම එතරම් වැදගත් නොවන අතර ඔහු කවර නාට්‍යයක් නරඹමින් සිමින්නේද යන්න එතරම් වැදගත් නොවේ. අපි දකින්නේ මෙම කුඩා දරුවාගේ සිතෙහි හට ගන්නා වූ වැඩිහිමි ආකල්ප පමණි. එමගින් කිසිම වැදගත් අධ්‍යාත්මික පළපුරුද්දක් උත්පාදනය නොකරනු ඇත.

මෙහි සටහන් කර ඇති වාර්තා චිත්‍රපටකරණයෙහි වර්ධනයට බලපෑ හේතූන් එකකට එකක් පරිණාමය වූවක් වැනිය. එසේම අද එය රූපවාහිනිය දක්වා විකාශනය වූ බව සඳහන් කළ හැකිය. මෙහි ආඛ්‍යානය විවිධ වර්ගීකරණයන්ට අයත්ව පවතී. මෙහි කැමරාකරු සන්නිවේදකයකු ලෙස ද ක්‍රියා කරනු ලබයි. කලාත්මකව සිදු වන්නා වූ වාර්තාකරණය අද වන විට ගද්‍යාකාර හා පද්‍යාකාර ස්වරූපයෙන් බැහැරව ගොස් හමාරය. අද වන විට සිනමාවේ හෝ රූපවාහිනී කැමරා ශිල්පියා මෙම සෑම වර්ගීකරණයකටම එක සේ ක්‍රියාකරන්නෙකි. එනිසාම ඒ පිළිබඳ වෙනත් බොහෝ දෙනෙකුගේ අවධානය යොමු වී පවතින්නේ පුළුල් වෘත්තීය පසුබිමක් ඒ මත ඉදිරිපත් කිරීම මගිනි. එහි ඉතා වැදගත් කාර්යක් වන්නේ නිර්මාණයට අයත් කලාත්මක නියමයන් හඳුනා ගැනීම සහ එහි කැමරාකරුගේ කාර්යභාරය නිවැරදිව හඳුනා ගැනීමයි. ඇත්ත වශයෙන් රූපගත කිරීමට අදහස් කරන්නා වූ සියල්ල සටහන් කර ඒ අනුව යමින් රූපගත කිරීම තරමක් සංකීර්ණ ක්‍රියාවකි. එසේ අනුගමනය කරනු ලැබූ ක්‍රමෝපායන් මත සිද්ධියක් සම්පාදනය වීම එය ඉදිරිපත් කරන්නාට මෙන්ම නරඹන්නාගේ වින්දනයට ද බලපානු ලබන වැදගත් සාධකයක් ලෙස දැක්විය හැකිය. උදාහරණයක් ලෙස වෙනත් රටක සිට සංචාරය සඳහා පැමිණෙන පුද්ගලයකුගේ පුද්ගලික හැඟීම් කෙසේද යන්න එම රටෙහි ස්වභාසෞන්දර්ය හෝ සංස්කෘතික අංගයන් ඉදිරිපත් කිරීම මඟින් සඳහන් කළ නොහැකිය. කැමරාකරු තුළ පිටපත් රචනය, අධ්‍යක්ෂණය හා කැමරාකරණය යන අංග තුන මත පිහිටා ක්‍රියා කළ යුතුවේ.

රූපවාහිනිය ආරම්භ වූ වකවානුවෙහි මුල් රූපවාහිනී මාධ්‍යවේදීන් ලෙසින් සඳහන් කළ හැක්කේ විවිධ ජාතීන්ට අදාළව සේවය කරනු ලැබූ පුද්ගලයන්ය. එනම් පුවත්පත් කතෘවරුන් ගුවන්විදුලියේ සේවය කළ පුද්ගලයන් හා සිනමාකරුවන්ය. එහිදී සිනමාකරණයට සම්බන්ධ පුද්ගලයන් අතර මෙම නව මාධ්‍ය කෙරෙහි විශාල උනන්දුවක් පැවති අතර නොබෝ දිනකින්ම වැඩිදෙනා එම නව මාධ්‍යයේ ක්‍රියාකාරී කාර්යභාරයක් ඉටු කිරීමේ වගකිය යුත්තන් බවට පත්වූහ.





එහිලා පිටපත් රචකයන් අධ්‍යක්ෂකවරුන් සහ අනෙකුත් කාර්මික ශිල්පීන්ට වැදගත් ස්ථානයක් හිමි විය. එසේම ඔවුන් සියලු දෙනාටම වාගේ මෙම නව මාධ්‍යයේ විශේෂත්වයන්ට අනුගතව ක්‍රියා කිරීමට සිදු වන බව කිව යුතුය. එම මාධ්‍යයේ ඉල්ලීම සපුරාලීම සඳහා චිත්‍රපට වාර්තාකරණයට අදාළව පැවති සමහර සීමාවන්ගෙන් බැහැරව ගොස් ක්‍රියා කිරීමට පවා සිදු වන බව පෙනෙයි.

මේ අනුව රූපවාහිනී මාධ්‍යයට විශේෂිත වාර්තාකරණයක් හා වාර්තාකරුවන් බිහිවන්නට වූ බව පෙනෙයි. ඒ සඳහා රූපවාහිනී කථනයට පෙර අවධියේ වාර්තාකරණයේ සමහර දෑ ගුරු තනතුරෙහි ලා සැලකූ බව කිව හැකිය. එසේම තිර මාධ්‍ය වාර්තාකරණයේ සියලුම කලාත්මක රීතීන් එසේම හෝ වැඩිදියුණු කර ඉදිරිපත් කිරීමට රූපවාහිනී මාධ්‍ය කටයුතු කළ යුතු බව කිව හැකි තවත් කරුණකි. ක්ෂණික තොරතුරු වාර්තාකරණය එහි වර්ධනයට අනියම් ලෙස බලපෑ තවත් කරුණකි. මෙසේ පිටපත් සකස් කර ගැනීමකින් තොරව හෝ කලින් සංවිධානය කළ පෙරහුරුවකින් තොරව සාමාන්‍ය ජීවන ස්වරූපය ඒ ආකාරයෙන්ම ඉදිරිපත් කිරීමට මූලිකව ක්‍රියා කළ බව පෙනෙයි.

ජනමාධ්‍යවේදියා සතු එම ප්‍රවීණතාවන් රැසක්ම කලාත්මක රූපවාහිනී වාර්තාකරණයට අන්තර්ගතව පවතිනවා ඇත. එය වඩාත් තදින් බලපාන්නේ කැමරා ශිල්පියාගේ වෘත්තීයමය හැකියාවන් වෙතය. ඒ අනුව සිතා බලන කළ පැන නගින ගැටලුව වන්නේ එම වෘත්තීය කෙතෙක් දුරට කලාත්මක හා ස්වාධීන තත්ත්වයක් උසුලන්නේද යන්නයි. සාමාන්‍යයෙන් කැමරාකරු වශයෙන් හඳුන්වන්නේ අධ්‍යක්ෂකවරයාගේ අදහස් ක්‍රියාවට නැංවීම සඳහා යෙදවූ යන්ත්‍ර ක්‍රියාකරු යන්නයි. ඒ අනුව බලන කල ඔහුගේ හැකියාවන් අතර වැදගත් තැනක් හිමි වන්නේ අධ්‍යක්ෂකවරයාට හැසිරවිය නොහැකි යන්ත්‍රයක් ක්‍රියා කරවමින් ඔහු දක්වන්නා වූ අදහස් ඉදිරිපත් කිරීමයි. ඇත්තෙන්ම එය එසේ සිදුවන්නේ නම් කැමරාකරුවා සතුව පවතින්නේත් තාක්ෂණික හැකියාවක් පමණක් වන අතර ඒ මත ඔහු තුළ පවත්නා කලාත්මක හැකියාවන් යටපත් වනු ඇත.

නමුත් ඇත්ත වශයෙන් ද සිනමාවේදී කැමරාකරුවාගේ කාර්යභාරය ව පැවතියේ යන්ත්‍රයක් ක්‍රියාකරවන්නෙකුගේ වෘත්තියක් ලෙසිනි. නමුත් ඇත්ත වශයෙන්ම චිත්‍රපටය නිෂ්පාදනයේ ආරම්භයට පදනම වැටී ඇත්තේ එම යන්ත්‍ර ක්‍රියාකරු කේන්ද්‍රකර ගනිමිනි. නොඑසේ නම් රූපගත කරන්නාහට හිමි වුයේ එහි පළමු තැන සහ වම්නාම ස්ථානයයි. එය ඒ වකවානුවේ දී කලාමාධ්‍යක් ලෙසින්

නොපැවති අතර එහි පිටපත් රචකයෙකුගේ කාර්යභාරයක් ඇතැයි යන්න ද සැ-ච ගත්තකි. එසේ ද එයට අධ්‍යක්ෂවරයෙකුගේ අවශ්‍යතාවක් මතු වන්නේ ද පසු කාලීනවයි. ඒ අනුව කැමරාවේ ක්‍රියාකාරිත්වයන් සමගින් එහි කාර්මික වර්ධනයේ විවිධ සොයා ගැනීම් සිදුවූ බව පෙනෙයි. එම සොයා ගැනීම්වල මල්ඵල දැරීමක් ලෙස ඒ හරහා අවසානයේ කලාත්මක නිර්මාණයක් හෙළි දැක් වීමට හැකි වීම සඳහන් කළ හැකිය. එහි සාමාන්‍ය වර්ධනය සිදු වූයේ චිත්‍රය, ඡායාරූපය, සිනමාව, රූපවාහිනීය හරහා තාත්වික නිරූපණය සජීවීකරණය දක්වා ගමන් ගත්තා වූ දීර්ඝ මාර්ගයක් ඔස්සේය. ඒ අනුව වර්ධනය වූ සිනමා කර්මාන්තය තුළ නවමාදිලියේ කැමරාකරුවකුගේ අවශ්‍යතාවට පදනම වැටී ඇති බව පෙනෙයි. එහි භාරකරු සහ වගකිවයුත්තන් අතර ප්‍රධාන ස්ථානයගත් තනතුරු ලෙස කැමරා ශිල්පියාට හිමි වන්නේ විශේෂ ස්ථානයකි.

තිර මාධ්‍ය හරහා වැම් ඇති කැමරාකරුගේ කාර්යභාරය රූපවාහිනීය සහ චිත්‍රපට සන්නිවේදන ක්‍රියාවලිය හා බැඳී පවතින්නකි. එම වෘත්තිය තුළ අප ඉහත සඳහන් කලාක් මෙන් ජනමාධ්‍යවේදයට අයත් ගුණාංගයක් හා කලාත්මක ගුණාංගයන් අන්තර්ගතව පවතී. කැමරාකරුවෙකු ලෙස ක්‍රියාකරන ජනමාධ්‍යවේදියා හා ඔහු රූපගත කරණු ලබන සියල්ල සැබෑ ජීවිතයට අයත් වුවන්ය. එය ඒ ආකාරයෙන් ම දැකීමක් ලෙසින් ම ඉදිරිපත් කිරීමක් තමන්ගේ අදහස් ක්‍රියාපෑම හා එයට තම ප්‍රතිචාරය දැක්වීමටත් එහි ක්‍රමානුකූලත්වය අවබෝධ කර ගෙන ක්‍රියාකිරීම ඉතා වැදගත් වන කරුණු ලෙසින් දැක්විය හැකිය. එසේම කැමරාකරුවෙකු හට තිර මාධ්‍ය භාෂාව දැන ගැනීම ඉතා වැදගත් වන්නකි. මක්නිසා ද යත් එය එහි ජීවන ස්වරූපය අවබෝධ කොට ගැනීමක් වැනිය.

කැමරා ශිල්පියා සහ අධ්‍යක්ෂකවරයා යන දෙදෙනාම එකවර දැකීමත්, දැනීමත් , විධිමත්ව පවත්නා වූ කලාත්මක නිගමනයන් සුදුසුම තත්ත්වය ලෙස සඳහන් කළ හැකිය. එය කලාත්මක සිනමාවට මෙන්ම වර්තා චිත්‍රපටකරණයකට ද එක සේ වැදගත් සාධකයකි. තිර මාධ්‍ය හරහා දිගහැරෙන වර්තා චිත්‍රපටකරණය තුළ එය සැබෑ වර්තා චිත්‍රපට ඝනයට අයත් වන්නක් නම් එහි නළු නිළියන් නැවත නැවත රූපගත කිරීම් පසුතල නිර්මාණ තුළින් සැලසුම් කරනු ලැබූ ක්‍රමානුකූලත්වයක් යන මෙවැනි දෑ තිබිය නොහැක. ඇත්ත වශයෙන්ම එහි සාමාන්‍ය පවත්නා ස්වරූපය විසින් එයට ආවේණික සිද්ධිය මතු කර දක්වන අතර එයට වර්තාකරුවන්ගේ මැදිහත් වීම කිසිසේත් අවශ්‍ය නොවන්නකි. ඔහු සතු කාර්ය වන්නේ ක්ෂණිකව ක්‍රියාත්මක වෙමින් එහි සිද්ධිය සම්පාදනය වන අයුරින් රූපගත





කිරීමයි. පසුව එම කෘතියෙහි අනාගත වම්නාකම් වලට අයත් වන්නේ එය රූපගත කිරීමට ඇති හැකියාව පමණක් නොව එය කවර අරමුණක් සඳහා කවර ආකාරයකින් රූපගත කළ යුතු ද යන්න දැන ගැනීමටත්ය.

මා දන්නා ආකාරයට සිනමාකරුවෙකු, සිනමාවේදියෙකු, කැමරාකරුවෙකු වශයෙන් වාර්තා චිත්‍රපටකරණය තුළ බෙදා වෙන් කිරීම කලාත්මක චිත්‍රපටයක තරම් පහසු කටයුත්තක් නොවේ. නමුත් වාර්තා චිත්‍රපට කරණයෙහි නියැලෙන සිනමාවේදියා පුළුල් සමාජ අවබෝධයකින්, විවේචනාත්මක බුද්ධියකින්, අදාළ කාල වකවානුවලට අයත් දෑ තෝරා බේරා ගැනීමේ සහජ බුද්ධියකින් හොඳ රසඥතාවයකින් හා හොඳ වචන හැසිරවීමේ හැකියාවකින් යුක්ත විය යුතුය. වචන හැසිරවීමේ හැකියාව යන්න තව දුරටත් විග්‍රහ කරන්නේ නම් ඔහු විසින් තම කැමරාකරුවා මාධ්‍යවේදියෙකු තත්ත්වයට ගෙන ඒම සඳහා හැසිරවිය යුතුව පවත්නා අදහස් දැක්වීම මෙසේ හඳුන්වා ඇති බව කිවයුතුය.

වර්තාකරුවකු ලෙසින් ක්‍රියාකරන කැමරාකරුවා ප්‍රධාන වශයෙන්ම මාධ්‍යවේදියෙකු ලෙසින් හැඳින්විය හැකිය. නමුත් මෙම මාධ්‍යවේදියා ප්‍රධාන වශයෙන්ම නිරූපණය කරන සමාජ සංස්කෘතිය හා චිත්‍ර ශිල්පය පිලිබඳව මනා හැකියාවක් හා දැනුමකින් පිරිපුන් පුද්ගලයකු විය යුතුය. මක් නිසාද යත් සියල්ලටම පෙර තමන්ගේ හැඟීම් ඔහු විසින් ඉදිරිපත් කරන්නේ කිසියම් නිරූපණයක් ඇසුරු කොට ගෙන නිසාය. එසේම තමන් ඉදිරිපත් කර දක්වන්නට උත්සාහ ගන්නා වුත් සිද්ධිය අර්ථවත් ස්වරූපයෙන් කලාත්මක හැඩයක් තුළ සංක්ෂිප්තව ඉදිරිපත් කළ යුතුව ඇත.

වෘත්තීයමය කැමරා ශිල්පියෙකු සතු කලාත්මක කුසලතාවන් අතර ඔහු වටා ඇති සංස්කෘතික දැනීමට හා නිෂ්පාදන හැකියාවට ලැබෙන්නේ ප්‍රධාන ස්ථානයකි. පිටපත් රචකයාගේ, අධ්‍යක්ෂකවරයාගේ, නළු නිළියන්ගේ මෙන්ම නිර්මාණයකට දායක වූ අනෙකුත් සියලු දෙනාගේ ද අවසාන ප්‍රතිඵලය ලෙස සඳහන් කළ හැක්කේ සේයා පටයෙහි නිරූපණය වන්නා වූ දර්ශනය උපකාරයෙනි. එහි නිර්මාතෘ වන්නේ ද කැමරා ශිල්පියාමය. එනම් කැමරා ශිල්පියාගේ කලාත්මක ඇසින් දුටුවා වූ යමක් ප්‍රේක්ෂකයා තිර මාධ්‍ය ඔස්සේ දකින්නේය යන්නයි. මෙහි දී මූලික වන්නේ එම වස්තුව හෝ පුද්ගලයා කැමරාවට හසුකර ගැනීමට ඔහු විසින් තෝරා ගත් කැමරා කෝණයයි. ඒ හරහා ඔහු දුටුවා වූ පුද්ගලයාගේ හෝ වස්තුවෙහි හැඩයයි.

තිර මාධ්‍යයේ කලාත්මක ස්වරූපය ඇත්ත වශයෙන්ම කිසියම් යාන්ත්‍රණික හැඩයක් උසුලන්නකි. එය නිරන්තරව භාවිත වන්නේ කාර්මික ක්‍රියාවලියක උපකාරයෙනි. එනම් මිනැම දෙයක් මෙම යාන්ත්‍රණය උපකාර කර ගනිමින් අර්ථ ගැන්වීමට හැකියාවක් ඇත්තේය යන්නයි. ඒ සඳහා කැමරාකරු භාවිත කර ගන්නේ කැමරාව, විවිධ වර්ණයන්ගෙන් යුත් කාච, ආලෝකකරණය සඳහා භාවිත වන විවිධ උපකරණ යන මෙම කාර්මික උපාංගයන් ආධාර කොට ගෙන ඔහු අදාළ සිද්ධිය නිරූපණය කරනවා ඇත. ඇත්ත වශයෙන්ම එය ලේඛකයෙකු පෑනක් ආධාරයෙන් ග්‍රන්ථයක් රචනා කරන්නක් හෝ චිත්‍ර ශිල්පියෙකු පින්සල් සහ සායම් භාවිත කර ගෙන කැන්වසයක් මත චිත්‍රයක් නිරූපණය කරන්නාක් වැනි තවත් එක් ක්‍රියාවලියක්ම පමණි.

මාධ්‍යවේදියෙකු ලෙසින් ක්‍රියාකරන්නා වූ කැමරා ශිල්පියෙකුගේ කාර්යභාරයට අයත් වගකීම් ප්‍රමාණය මාධ්‍යවේදියෙකු ලෙසින් ක්‍රියාකරන සාහිත්‍යකරුවෙකුට වඩා බෙහෙවින් ම සංකීර්ණ ක්‍රියාවලියක් හා බැඳී පවතී. ඇත්ත වශයෙන්ම කැමරාකරු සිද්ධියට මුහුණ දෙන්නේ තනිතනිව වන අතර එය සේයාපටයට නගන්නා වු එකම තැනැත්තා ද ඔහුය. මේ අනුව තිර මාධ්‍යවේදියෙකුට අදාළව පැවරී ඇති අතිශය සංකීර්ණ වගකීම් සම්භාරය තුළ ඔහු එහි කලාත්මක නිර්මාණකරුවා බවට පත්වනවා ඇත. මෙහි ඇති වැදගත්කම වන්නේ කැමරාකරු භාවිතයට ගන්නේ වචන වෙනුවට රූපරාමුය. ඔහු විසින් තිරයේ සටහන් කර දක්වන එම දර්ශනයන්, පාඨකයෙකු හට කතෘවරයෙකු සටහන් තබා මුද්‍රා කර පිටපත් වන කෘතියක් මෙන්ම ප්‍රේක්ෂකයකු හට එය අර්ථයෙන් වැදගත් වන අතර, දර්ශන මඟින් උත්පාදනය වන හැඟීමෙන්, සරල අවබෝධයෙන් හා වින්දනයෙන් ඒකරාශී වූ හොඳ සාහිත්‍ය සංස්කෘතියක් හා සමානය. මෙය තිර මාධ්‍යයෙහි සන්නිවේදනමය කාර්ය හා මාධ්‍යවේදියෙකුගේ කාර්යභාරය අතර කලාත්මක සම්බන්ධතාව පිළිබඳ තවත් එක් තහවුරු කිරීමකි.

සංස්කරණයෙහි සාමාන්‍ය ස්වරූපය රූපරාමුවක් රූප සංරචනාත්මක සැලැස්මක් හෝ පර්යාලෝකනය අනුව සම්පාදනය වී පවතින්නකි. සිනමාවේ රූප රචනය සඳහා විවිධ ක්‍රමෝපායන් ඔස්සේ භාවිතයට ගැනෙන සංස්කරණය වර්තමාන රූපවාහිනිය තුළද ඒ ආකාරයෙන්ම භාවිතවන්නකි. එසේ වුවද මෙය භාවිතකරන්නා වූ ක්‍රමෝපායයන් දෙස බැලුව හොත් එය එකිනෙකට වෙනස් මුහුණුවරක් ගත්තකි. මෙය කැපී පෙනෙන ස්ථානයක් ලෙස සජීවීකරණය සඳහන් කළ හැකිය.





සිනමාකරණ ක්‍රියාකාරකම් ගොඩ නැගී ඇත්තේ පහත සඳහන් ආකාරයට වන අතර එය “ සිවකොඩ් පුදෝව්කින් ” “ Sevocod Pudovkin ” මේ ආකාරයෙන් අර්ථ ගන්වා ඇත. අසීමිත වේගයකින් රූපගත කරන්නා වූ ක්‍රියාවලියක් හරහා අපට අවශ්‍ය වන කිසියම් මූලාංගයන් මතු කර ගැනීමට නම් එය කපා වෙන්ව ඉදිරිපත් කළ යුතු වන අතර එසේ නැතිනම් එය වෙන් වෙන්ව ඉදිරිපත් කළ යුතු වේ. එසේත් නැතිනම් එය කිහිපවරක් නැවත නැවත ප්‍රකාශනය වන සේ රූපගත කළ යුතු වේ. සංස්කරණාත්මකව යමක් රූපගත කරන්නේ නම් මේ ආකාරයෙන් කොටස් වශයෙන් විස්තරාත්මකව ක්‍රියාකාරීත්වය හෝ මූලාංගයන් සම්බන්ධ කළ යුතු ආකාරයට හෝ අර්ථ දැක්වෙන ආකාරයට එය සම්බන්ධ කළ යුතුය. මෙම ක්‍රියාමාර්ගයෙන් තොරව චිත්‍රපටයක් විස්තර කථනාත්මකව දිග හැරීමට අපොහොසත් වනවා ඇත.

මෙම ක්‍රියාකාරීත්වය රූපවාහිනී සජීවීකරණයක් හරහා ඉදිරිපත් කරනු ඇත්තේ ක්‍රමානුකූලත්වයක් මත එය සම්පාදනය කරමිනි. එයට හේතුව ලෙස දැක්විය හැක්කේ කාලය නියම ස්වරූපයෙන් හෙළිදැක්වීමයි. නොඑසේනම් කාලය සජීවීව ඉදිරිපත් කිරීම මඟින් එහි සැබෑ ක්‍රියාකාරීත්වය හෝ වැඩසටහන ප්‍රකෘති ස්වරූපයෙන් හෙළි කර දැක්වීමට ඇති හැකියාවයි.

සංස්කරණයෙහි පවතින්නා වූ විවිධ උපක්‍රමයන් හා සජීවී රූපවාහිනී වෙනස පැහැදිලිව වටහා ගැනීම පහත සඳහන් සරල නිදසුන් ඔස්සේ විමසා බලමු. පිටපතකට අඩංගු වන දර්ශනයක විස්තර වන ආකාරයට එය මෙසේය. මිනිසෙක් තම සාක්කුවෙන් ලයිටරයක් පිටතට ගෙන එයින් සිගරැට්ටුවක් දල්වනු ලබයි. මෙම ඉහත ක්‍රියාකාරීත්වය චිත්‍රපටයකට රූපගත කර සංස්කරණය කර ඇත්තේ පහත සඳහන් ආකාරයටයි.

රූප රාමුව 01 - පුද්ගලයාගේ මධ්‍යම රූපය හරහා ඔහු තම සාක්කුවෙන් ලයිටරය පිටතට ගන්නා ආකාරය. ලයිටරය දල්වන අයුරු.

රූප රාමුව 02 - සමීප රූප රාමුවක් මඟින් ගිනි දැල්වෙන ලයිටරයෙන් සිගරැට්ටුව දැල්වීම. සිගරැට්ටුවෙන් දුම් නගින අයුරු.

රූප රාමුව 03 - එම පුද්ගලයා ලයිටරය සාක්කුවේ දමා ගන්නා අයුරු.

රූපරාමු වශයෙන් එකේ සිට තුන දක්වා කොටස් කර දක්වා ඇති පිළිවෙල මේ ආකාරයෙන් ද දැක්විය හැකිය. නළුවාගේ මධ්‍යම රූපයක සිට ලයිටරය අතට ගෙන එයින් සිගරැට්ටුවක් දල්වා පසුව ලයිටරය සාක්කුවේ දමා ගනියි. පසුව කැමරාව ඔහු ඉදිරියට ගමන් ගන්නා අතර ඔහු නැවත වතාවක් එම ක්‍රියාවලිය සිදු කරනු ලබයි. එවර ඔහු හසුකරගන්නේ සමීප රූපයකටයි. එනම් අප රූපරාමුවෙහි දකින්නේ අත, ලයිටරය සහ මුහුණේ පහළ කොටස පමණය.

අධ්‍යක්ෂකවරයාගේ සංස්කරණ මේසය මතට මෙම කොටස් දෙකක සේයාපට ලැබෙන අතර එහි එකක නළුවාගේ මධ්‍යම රූපය හරහා හෙළි දැක්වෙන ක්‍රියාකාරීත්වය වන අතර අනෙක් කොටසින් හෙළි දැක්වෙන්නේ සමීප රූපය හරහා ඔහුගේ ක්‍රියාකාරීත්වය හෙළි දැක්වීමයි. ඒ අනුව අධ්‍යක්ෂකවරයා විසින් කතුරක් ආධාරයෙන් මෙම පළමුවැනි කොටස කොටස් තුනක් වශයෙන් වෙන් කරනු ලබයි. එහි පළමු කොටස අයත් වන්නේ පුද්ගලයෙකු තම සාක්කුවෙන් ලයිටරයක් පිටතට ගෙන එය දල්වන තෙක් පමණි. නිෂ්පාදකවරයා විසින් සිගරැට්ටුව දැල්වීම ඇතුළත් එහි ක්‍රියාකාරී කොටස පළමු සේයාපටයත් සම්-න් ඉවත දමා ඇත. නමුත් එම සේයාපටයටම අයත් තුන්වන කොටස වන එම පුද්ගලයා සාක්කුවට ලයිටරය බහාලන කොටසින් ඔහු සිගරැට්ටුවෙන් දුම්පිට කර හැරීමත් යන මෙම පළමු සේයාපටයහි අවසන් කොටස ද වෙන්ව කපා ඉවත් කර ගෙන ඇත. පළමු සේයාපටයෙන් සිගරැට්ටුව දැල්වීම ඉවත දමන අධ්‍යක්ෂකවරයා දෙවන සේයාපටය ගෙන එහි සමීප රූපය හරහා එම පුද්ගලයා සිගරැට්ටුව දැල්වීම යන කොටසෙහි ප්‍රබල ක්‍රියාකාරකම් හෙළි දක්වන හෙයින් එය වෙන්කර ඇති අතර එය හැර එම දෙවන සේයාපටයෙහි අනෙක් සියල්ල අධ්‍යක්ෂකවරයා විසින් ඉවත දමා ඇත. දැන් ඔහුගේ සංස්කරණ මේසය මත ඇත්තේ සේයාපට දෙකෙන්ම කපා ඉවත් කරගත් කොටස් සමූහයකි. ඒ අනුව එම කොටස් ඒකරාශී කරමින් ඔහු අදාළ ක්‍රියාකාරීත්වය ඔහුගේ අදහසට අනුව හෙළි දක්වනවා ඇත.

ඒ අනුව බලන කල එම ක්‍රියාකාරීත්වය දෙවරක් ම සිදුකරනු ලැබ ඇති අතර එය දෙවරක්ම කැමරා ගත කරනු ලැබූවකි. අධ්‍යක්ෂකවරයා විසින් පිටපතට අනුකූලව මෙය 1, 2, 3 වශයෙන් කොටස් පිළිවෙලකට එකතු කරගනු ලැබූවක් වන නමුත් එය ප්‍රේක්ෂකයා හට අවබෝධ වන්නේ කෙළවරක් නැතිව සිදුවන්නා වූ ක්‍රියාකාරීත්වයක් පරිද්දෙනි. නමුත් සැබෑ කාලය සහ අවකාශය මත මෙය එක්වරක් සිදුවන්නක් හෝ නොකඩවා සිදුවන්නක් ලෙසින් පැවතිය නොහැකිය.





මෙය රූපවාහිනිය තුළ කවර ආකාරයෙන් ඉදිරිපත් වන්නේ ද යන්න සොයා බැලීම වැදගත්ය.

කිසියම් අංගනයක කැමරා දෙකක් සවිකර ඇත. එක් කැමරාවක් නළුවා වෙත එල්ලකර ඇති අතර දෙවන කැමරාව ඔහුගේ සමීප රූපය වෙත එල්ලකරන ලද්දකි. සහායකයෙකු විසින් නිෂ්පාදකවරයාගෙන් ලැබෙන උපදෙස් ක්‍රියාත්මක කරවන අතර ඒ අනුව නළුවා සිගරැට්ටුව දල්වන අවස්ථාවේදී පළමු කැමරාව රූපගත කරන අතර දෙවන කැමරාව ද රූපගත කරනු ඇත. එම සිගරැට්ටුව දැල්වීමෙන් පසුව සිදුවන දෙය දෙවන කැමරාව උපකාරයෙන් හසුකරගන්නා අතර මෙහිදී වැදගත් වන්නේ නොනවත්වා ගලනය වන්නා වූ ක්‍රියාකාරීත්වය කැමරා දෙකක් උපකාරයෙන් රූපවාහිනී තිරය මත ඒ මොහොතේ ම පිටපතේ අන්තර්ගත එම හැ-ිම ම ඉදිරිපත් කිරිමට සමත් වීම යන්නයි.

මේ ආකාරයට සිනමා තිරයේ දිගහැරෙන්නක් හා සමාන නිරූපණයක් රූපවාහිනී තිරය මත දිගහැරෙනවා ඇත. එසේම එහි රූපරාමු සන්ධි කිරිම සිදුවන්නේ කැමරා දෙකක් එකවර එක පුද්ගලයෙකු දෙයාකාරයකින් රූපගත කිරිම මගිනි. ඒ අනුව එම කැමරා භාවිතය ඉතා නිවැරදිව පිහිටා තිබේ නම් හා අවස්ථානුකූලව අදහසට අනුකූලව ක්‍රියාත්මක වේ නම් පමණි. ඒ අනුව බලන කළ සිනමා පටයක රූපගත කිරිමේ කාර්යයේ මෙන් නොව රූපවාහිනී රූපගත කිරිමේ කටයුතු වලදී මොනම ආකාරයක වුව ද නැවත ක්‍රියාකිරිමක් හෝ නැවත රූපගත කිරිමක් දැකගත නොහැකි වී ඇති බවයි. එය සහ එහි ක්‍රියාකාරිත්වය එක මත එක වැටී ඇති බවයි. එය අධ්‍යක්ෂකවරයාගේ කැමැත්තට අනුව ඉදිරිපත් කිරිමක් වන අතර එහි ක්‍රියාකාරිත්වය හෙළි දැක්වීමේ දී පළමුව එක් කැමරාවක් භාවිත කර පසුව අනෙක් කැමරාව භාවිතයට ගැනීම මෙහිදී සිදුවන වා ඇත.

සජීවී වැඩසටහන් ඉදිරිපත් කිරිමේ කාර්යභාරය තුළ ඉහත සඳහන් කළ මෙම ක්‍රියාවලිය වෙනත් මගක් ගත් ඉදිරිපත් කිරිමක් ලෙසින් සඳහන් කළ හැකිය.

රූපවාහිනී සතු හැකියාවන් හා සාමාන්‍ය රූපවාහිනී වැඩසටහන් කරණයෙහි පසුබිමට අනුකූලව නම් කැමරා කිහිපයක් ක්‍රියා කලයුතු වන අතර එමගින් වඩාත් වැඩි ඵලදායිතාවක් ඒ හරහා උදාකර ගත හැකි වනු ඇත. රූපවාහිනිය ආරම්භක වකවානුවේදී එහි බොහෝ කාර්යන් සිදු කරනු ලැබූවේ

තනි කැමරාවක් උපකාර කර ගනිමිනි. එය භාවිත කර ගැනීමේ දී මෙවන් උපාය මාර්ගයක් යොදා කර ගත් බව පෙනෙයි. එනම් නිශ්චලව ස්ථාන ගත කර ඇති කැමරාව වෙත නළුවා පැමිණීම ඉන් එක් ක්‍රමයකි. නොඑසේ නම් එයින් ඈත් වීමයි. මෙම ක්‍රම දෙක මගින් වස්තුවෙහි විශාලත්වය වෙනස් වනවා ඇත. මේ සඳහා සිනමාවේ භාවිත වන උපක්‍රමයන් කලක සිට දැන ගැනීම නිසා එවන් තත්ත්වයක් නිරූපණය කිරීමට චලනය කළ හැකි රැඳවුමක කැමරාව නවත්වා තැබීම සිදුකෙරිණි. නමුත් එය ඉටු වූ පමණින් එහි පැවති සියලුම අවශ්‍යතාවන් ජය ගැනීමට නොහැකිවිණි. මේ නිසා එකින් එකට නව තාක්ෂණික ක්‍රමෝපායයන් හෙළි දැක්විණි.

සේයාපටයක රූපරාමු වශයෙන් කොටස් දෙකක් එකට සම්බන්ධ කර දැක්වීම මගින් නොකඩවා ගලන නිරූපණයන් දැක ගත හැකිය. එය සිනමාවේ තාක්ෂණික සංස්කරණයක් සේ ප්‍රකට වූවකි. එම ක්‍රියාකාරීත්වය මතු කෙරෙන්නා වූ ආකාරයට අදාළ කොටස් ඒකරාශි කිරීම ක්‍රමානුකූල ක්‍රියාවලියක් මත සිදු වන්නේ වී නම් එම සම්බන්ධ කිරීමේ ක්‍රියාවලිය සැලසුම්ගත සංස්කරණය යන්නෙන් හඳුන්වයි. මෙ මගින් තිරය මත නිවැරදි චලිතයක් ඇති කිරීම සිදුකෙරේ. සජීවී වැඩසටහන්කරණය සේයාපට භාවිතයෙන් තොරවූවක් වන අතර එහි තාක්ෂණික සංස්කරණයකට ඇත්තේ මඳ ඉඩකඩකි. එය සමන්විත වන්නේ සැලසුම්ගත සංස්කරණයෙහි නියමයන් මගිනි.

සැලසුම්ගත සංස්කරණය සම්පාදනය වනු ඇත්තේ කැමරා එකින් එක භාවිත කිරීම මගිනි. එම ක්‍රියාකාරීත්වය මෙහෙයවනු ලබන්නේ රූපවාහිනී නිෂ්පාදනයකු විසිනි. ඔහු එම කාර්යයේ නියැලෙනු ඇත්තේ වැඩසටහනේ නිෂ්පාදන පිටපත සංස්කරණ අවස්ථාවේදීමය. එසේ ම එය වර්තා වැඩසටහනක් නම් එය විකාශය වන අවස්ථාවේදීම ඔහු විසින් එය සකස්කර ඉදිරිපත් කරවා ඇත. සැලසුම්ගත සංස්කරණය හෙවත් නිවැරදි චලිතයක් දිගහැරෙන විස්තර කථනයක අඛංඩ ක්‍රියාවලිය ගොඩනැගී ඇත්තේ ක්‍රමානුකූලව රූපරාමු එකිනෙකට සන්ධි කිරීම මගිනි. ඇත්ත වශයෙන්ම මෙම ක්‍රියාවලිය නිෂ්පාදකවරයා සතුව පවත්නා වූ එකම අරමුණ ලෙස සඳහන් කළ නොහැකි අතර ඔහු ඉදිරියේ පවත්නා අනෙක් ගැටලුව ලෙස එය කලාත්මකව සෞන්දර්යාත්මක ගොනුවක් තුළ ඉදිරිපත් කිරීමට ද වැදගත් තැනක් හිමිවේ. කැමරා එකින් එක සම්බන්ධ කිරීම මගින් රූපරාමු එකිනෙක සම්බන්ධ කිරීමෙන් ලබන්නා වූ ප්‍රතිඵලය ලැබෙන්නේ ද යන්න මෙහි දී ඇති වන ප්‍රධාන ගැටලුවකි. එසේම රූපවාහිනී සංස්කරණයේ උපකාරයෙන්





කලාත්මක නිරූපණයක් මතු කර දැක්වීමට හැකියාවක් ඇත් ද? ඇත්ත වශයෙන්ම රූපවාහිනී සංස්කරණය භාවිතයෙන් වෙනස් වන්නා වූ අවකාශය කොතරම් දුර ප්‍රමාණයකට සීමාවන්නේ ද යන්නත් සමගින් සිනමාවේ දී නිදහස් කැමරා භාවිතයත් අතර වෙනස පැහැදිලිව දැක ගත හැකිය. නමුත් රූපවාහිනී කැමරා භාවිතය මගින් අවකාශය ඉතා පුළුල් ලෙස භාවිත කොට ගත හැකිවේ. රූපවාහිනී තිරය මත නිරූපණයන් සමූහයක් එකවර රූප රාමුවක් ලෙස ඉදිරිපත් කළහැකි අතර එය සමහර විට වෙනත් නගරයක හෝ රටක සිට ගෙන එන විකාශයක් විය හැකිය. සිනමාවෙහි මෙන් නොව යම්කිසි නිරූපණයක් ඉදිරිපත් කිරීම ම රූපවාහිනී යාන්ත්‍රණයේ දී බලවත් පරිශ්‍රමයක් දැරි යුතු නොහේ. එනම් සිදු වන්නාවූ සියල්ල සජීවී කැමරාකරණයක් හරහා ඉදිරිපත් කිරීමට ඇති හැකියාවයි.

තිර මාධ්‍ය භාෂාවෙහි විශේෂත්වය ලෙස අප විසින් ඉහත සඳහන් කරන ලද්දේ තිරයෙහි චලනයට බලපාන්නා වූ සමූහයකි. එවන් හැකියාවන්වලට රූපවාහිනීකරණය තුළ විශේෂිත ස්ථානයක් හිමිවන අතර ඒ හරහා රූපවාහිනියට විශේෂිත ගුණාංගයන් හෙළි දක්වනවා ඇත. මෙහිදී මතකයට නැගෙනුයේ චිත්‍රපට සංස්කරණයෙහි නියමයන්ය. එහි අන්තර්ගතය වන්නේ පුද්ගලයෙකු සිතන ආකාරයට ඉදිරිපත් කිරීම හා අප වටා ඇති ලෝකය විසින් එය අවබෝධ කරගන්නාවූ ආකාරයෙන් සැබෑ ස්වරූපය හෙළිදැක්වීමයි. නමුත් චින්තන ක්‍රියාවලිය සැම විටම සැබෑ ස්වරූපය අවබෝධ කරගැනීම සඳහාම නිර්මාණය වූවක් නොවේ. ඇත්ත වශයෙන්ම එය සැම සංසිද්ධියකම අන්තර්ගතය ලෙස ක්‍රියාකරනු ඇත. සමහර විට එම ඉදිරිපත් කිරීම වූ කලි ඉතා කෙටි පැහැදිලි හෙළිදැක්වීමක් වනු ඇත. තවත් සමහර අවස්ථාවක දී පුද්ගලයෙකුගේ චින්තනය, පවතින ලෝක සම්මතයට පටහැනි වීමට ද හැකියාවක් ඇත. මිනිස් ඇස කැමරා කාචයට වඩා ඉතා ප්‍රබල හැකියාවන්ගෙන් සමන්විත ඉන්ද්‍රියක් වන අතර එමගින් ක්ෂණිකව ඇස ගැටෙන වස්තුව පැහැදිලි කර ගැනීමේ හැකියාවෙන් සමන්විත වන අතර ක්ෂණිකව ම එහි සමීප රූපය කරා යොමු වීමේ හැකියාවෙන් සහ විවිධ කෝණාංශයන් හරහා දැකීමේ හැකියාවෙන් පර්යාවලෝකනයට අන්තර්ගත හැඩතලයන් හරහා එය දැකීමේ හැකියාවෙන් ද යුක්ත වූවකි. දෘශ්‍ය මාධ්‍ය භාවිතය හරහා මිනිසකුගේ හැ-ිම් වටහාගනුයේ ඔහු වටා ඇති භෞතික අවකාශය සැබෑ කාල වකවානු තුළ ඉදිරිපත් කළ යුතුවන බැවිනි. එය දෑස ඉදිරිපිට දිගහැරෙන ක්‍රියාවලියකි. කෙනෙකු දකින ආකාරයෙන් අවකාශයෙහි වෙනස්වීමක් ලෙසින් ඉදිරිපත් කරනු ඇත. එසේ සිදුවන්නා වූ ක්‍රියාවලිය මානසිකත්වය නිරූපණය කිරීමට ගත් උත්සාහයක් ලෙස මෙය දැක්විය හැක.

රූප රාමුවක් ලෙසින් අප හඳුන් වන්නේ චිත්‍රපටයක එක් කොටසක් එක් සන්ධි කිරීමක සිට අනෙක් සන්ධි කිරීම දක්වා දිග හැරෙන ආකාරය නම් රූපවාහිනී මාධ්‍යයේදී නම්, එය කැමරාව රූගත කිරීමට ආරම්භ කළ ස්ථානයේ සිට රූගත කිරීම නැවැත්වූ ස්ථානය දක්වා යනුවෙනි. එහි අන්තර්ගතය ලෙස පවතින්නේ පුද්ගලයන් හෝ වස්තූන් හරහා භෞතික අවකාශය නිරූපණය කිරීමක් වන අතර එය කිසියම් වෙන්කරගත් කාලවේලාවකට හිමිකම් කියාපානවා ඇත. එම කාලය තිරයේ නිරූපණය වන සැබෑ කාලයන් සමගින් සමානව පවතී.

වෙනත් වචනවලින් සඳහන් කරන්නේ නම් රූපරාමු වශයෙන් වෙන් කරගත් කොටස් එය රූගත කළ කාලයට අනුරූපවම අප දකිනු ඇත. නමුත් ඇත්ත වශයෙන් ම එය කොටස්වලට කපා වෙන් කර ඉදිරිපත් කිරීම මගින් අපට එහි කාල අවකාශය යන්න නැවත නිර්මාණය කර ඉදිරිපත් කිරීමේ හැකියාවක් පවතියි. අප එවැනි ක්‍රියාවලියක් අනුගමනය නොකරන්නේ නම් තිරය මත නිරූපණය වන්නා වූ කාලය එය රූගත කළ කාලය හා සමාන වන්නේය. නොඑසේ නම් සැබෑ කාලයක් සහ චලිතයක් මත ගොඩනැගී රූපරාමුවෙහි ක්‍රියාකාරීත්වයක් යන්නයි.

රූපවාහිනියට හිමි කුසලතාවන් පිළිබඳව සඳහන් කරන්නේ නම් අපට රූපාවාහිනියට හිමි විශේෂිත හැකියාවන් පිළිබඳව දැනගැනීමක් අවශ්‍යවනු ඇත. එනම් එහි යාන්ත්‍රණයකට අන්තර්ගතව පවතින්නාවූ වැදගත්ම සාධකය වන ඉදිරිපත් කරන ක්‍රියාකාරිත්වය ක්ෂණිකව නැරඹීමේ හැකියාවෙන් යුක්ත වීම ලෙස සඳහන් කළ යුතුමය. එම රූපවාහිනියට හිමිව වත්නිනාවූ විශේෂිත හැකියාව මගින් කියාපානු ඇත්තේ එයට අදාළ කාලය සහ අවකාශය රූපවාහිනී තිරයේ කවර ස්ථානයක පවතින්නේ ද යන්නයි.

මේ නිසාම සංස්කරණයට අයත් නියමයන්ගේන් වඩාත් වැදගත් ලෙස ගැනෙන සමාන්තර සංස්කරණ ක්‍රියාවලිය තුළට අයත්, එකිනෙකට හරස් අතට සිඹින සේ ගොඩනැගී පවත්නා ක්‍රියාකාරිත්වය සහ එහි සැබෑ ස්වරූපය අදාළ කාලය තුළ ම ඉදිරිපත් කිරීමයි. මේ එකිනෙකට හරස් අතට ගමන්ගන්නා වූ සංස්කරණ විධික්‍රමය රූපවාහිනියට ම විශේෂිත වූවක් ලෙසින් සඳහන් කළ හැකිය. එනම් එකවර ක්‍රියාත්මක වීමේ හැකියාව යන්නයි.

සංස්කරණාත්මක නිරූපණයකට අදාළ රූගත කිරීමක් සෑම විටම





විවිධ පැතිකඩයන් හරහා හෙළි දැක්වීමක් වන අතර එය රූප රාමු දෙකක් අතර සංස්කරණය යනුවෙන් හඳුන්වා ඇත. අදාළ රූප රාමුවෙහි අර්ථය වෙනස් කර එහි චලිතයකට අදාළව සම්පාදනය කිරීම සඳහා සමීපරූප භාවිතය පර්යාවලෝකනයට අනුව රූපරාමු හැඩතල එළිදැක්වීම, හෝ විවිධ කෝණ තුළින් වස්තුව හෝ පුද්ගලයා දෙස බැලීම යන මෙම ක්‍රියාවලිය අභ්‍යන්තර රූපරාමු සංස්කරණය යනුවෙන් හඳුන්වයි. මෙම රූපරාමු අභ්‍යන්තරයෙහි ගොඩනැගී සංස්කරණය යන්න දිර්ඝ කාලයක් පුරා සිනමාවෙහි භාවිතයට ගැනෙන්නෙකි. නමුත් රූපවාහිනියෙහි එය වෙනයම් වම්නාකමක් හිමිකරගන්නකි. එයට අයත් ප්‍රධාන අංගය ලෙසින් හැගෙන්නේ කාලය අවකාශය හරහා ගොඩනැගී පවත්නා කෙළවරක් නැති චලනය යන්නයි.

රූපගත කරන ලද සේයාපටයට අයත් චලිතය එය විනාශ කරනවා පමණක් නොව එය ඉතා පැහැදිලි කරුණක් ලෙසින් සනාථ කරනු ඇත. එයට අයත් අනෙක් හේතුකාරකය ලෙසින් සඳහන් කළ හැක්කේ රූපවාහිනී තිරය තුළ නිරූපණය වන දෑ එහි ස්වරූපයට අනුව චිත්‍රපටයකට වඩා නිවැරදි තොරතුරු හෙළි දැක්වීමක් විසින් පිළිගැනෙනු ඇත. මෙය සැබෑ ස්වරූපය ලෙස පිළිගැනීමේ කාර්ය ප්‍රේක්ෂකයා හැ-මට වඩා මානසික ක්‍රියාවලියක් වටා බැඳී පවතිනු පෙනේ. නමුත් එය අනුමාන රහිත දෙයක් වනු ඇත. එම හේතුකාරකයන් සමගින් රූපවාහිනිය සහ සිනමාව ඒකාබද්ධවී පවතින්නකි. ඒ අනුව රූපරාමු දෙකක් අතර සිදුවන සංස්කරණයෙන් සහ මුලින්ම එහි සැබෑ කාලය සහ අවකාශය බිඳ දමනු ඇත. රූපරාමුවෙහි අභ්‍යන්තර සංස්කරණය මගින් හටගන්නාවූ සේයාපටයෙහි චලිතය රූපවාහිනී පසුබිමට අයත් වූවකි.එය රූපවාහිනීය තුළ ඉතා පුළුල් ලෙස භාවිතයට ගන්නාවූ ඵලදායී ක්‍රමයක් ලෙසින් සඳහන් කළ හැකිය.

එම හේතුව නිසාවෙන් ම රූපාවාහිනීකරණය අසාමාන්‍ය හෝ තියුණු රූපරාමු භාවිතයට සීමාසහිත වූවකි. රූපවාහිනී විකාශයෙහි ස්වභාවය මිනිසාට ආවේණික ලෙස සම්පාදනය වූවකි. සාමාන්‍යයෙන් එය සැබෑ යථාර්ථයට සමීප හෙළි දැක්වීමකි. මේ නිසාම පර්යාවලෝකණයට සමීප රූපරාමුව ගොඩනැගීම එහි අදහස ඉදිරිපත් කිරීමේ වැදගත් මූලාංගයක්ව පවතියි. එය ඉතා ප්‍රවේශම් සහිතව දෘශ්‍ය මාධ්‍ය නිරූපණය හරහා සැබෑ ස්වරූපය විනාශ නොවන ආකාරයට අනිසි ලෙස පාවිච්චි නොකළ යුතුය. රූපවාහිනී තිරය මත දිග හරෙන නිරූපණය සාමාන්‍ය දේ මත පදනම් විය යුතුව පවතී. අප එහි එක් එක් ස්වරූපයන් පිළිබඳව විමසා බලමු. එනම් පුද්ගලයකුගේ ඇස දෙස පරීක්ෂාකාරීව බැලීම සඳහා ඔහුට

සමීප වීම අත්‍යාවශ්‍ය කරුණකි. මෙම ඉහත සඳහන් අවස්ථාව රූපවාහිනීකරණය තුළ කවර අර්ථයක් නිරූපණය කිරීම සඳහා යොදාගෙන ඇත්ද? පළමුවෙන්ම එය සිනමාව හා සසඳා බලන කල අඩු තාලවේගයක් මත ගොඩනැගී පැවතිය යුතුය. දෙවනුව එම දර්ශනයට අයත් පුද්ගලයා හා වස්තූන් සමීප රූපරාමු මි-න් දැක්වීම අත්‍යාවශ්‍යය. අනිකුත් සියලු දැක්මෙන් ඒ සඳහා රූපවාහිනීකරණයට විශේෂිත පරිසරයක් වැඩසටහන තුළ මතු කළ යුතුව පවතී. පුද්ගලයකුගේ ඇසට සමීපව බැලීමට රූපවාහිනී ප්‍රේක්ෂකයාට අවශ්‍ය වන්නේ මක්නිසාද යත් එම පුද්ගලයාද ප්‍රේක්ෂකයා සිටින කාමරයෙහිම සිටින්නෙකු වන හෙයිනි. එය වඩාත් නිවැරදිව සටහන් කරන්නේ නම් තමන් ඒ සියල්ල සම්-න් නියෝජනය වන්නේය යන්නයි. යම් කෙනෙකුට තම නිවසට පැමිණෙන්නෙකුගේ ඇසට සමීපව දැකීමේ හැකියාවක් පවතීද? ඇත්ත වශයෙන්ම මෙහි අර්ථයට පදනම් වන්නේ නිරූපණය යන්නම නොවේ. අප ඉදිරියට පැමිණෙන පුද්ගලයා අප හට අමුත්තෙකු වන අතර ඔහු පිළිබඳව තොරතුරු දැන ගැනීමට ඇති අවශ්‍යතාව යන්න එයින් අර්ථ ගැන්වෙනවා ඇත. රූපවාහිනිය සමීප රූප භාවිතය ගෙන හැර දක්වනු ඇත්තේ එයට හිමි මෙවන් හැකියාවක් පිළිබඳව කියාපෑමක් ලෙසිනි.

වෙනත් පැත්තකින් බලන කල තිරය මත සමීප රූපය සිනමාවෙහි මෙන්ම රූපවාහිනියෙහිද අධ්‍යක්ෂකවරයාගේ හෝ පිටපත් රචකයාගේ අදහස් කියාපෑමට යොදා ගන්නකි. ඇත්ත වශයෙන්ම අපට එම අවස්ථාව දැකීමට අවශ්‍ය නොවනු ඇත." සිවකොඩි පුදෝව්කි " ගේ අර්ථ දැක්වීමට අනුව සිනමාකරුවා විසින් ප්‍රේක්ෂක අවධානය අනවශ්‍යය යැයි ඔහු දක්වන කරුණු කෙරෙහි පමණක් රඳවා තබා ගනිමින් අනෙකුත් සියල්ල එයින් බැහැර කර හරිනු ලබන අතරට කිසියම් රාමුවකින් බැහැර වටපිටාවකට අයත් මූලාංගයන් ප්‍රේක්ෂකයා වෙත දිගහරිනු ලබයි. එමගින් ප්‍රේක්ෂක අවධානය පහකර හරිමින් ප්‍රේක්ෂකයා සතුව පවතින වින්දනයේ ශක්තිය ඉතිරි කර ගනිමින් ඔහුව වින්දනයේ උපරිම සීමාවන් කරා ගෙන යනවා ඇත. ඇත්ත වශයෙන්ම ප්‍රේක්ෂකයාට මෙන්ම නිෂ්පාදකවරයාටද රූපවාහිනී මාධ්‍යයේදී සමීප රූප භාවිතය සිනමාවට වඩා ප්‍රබල ලෙස අදහස් කියාපෑමේ මාර්ගයක් ලෙස වැඩසටහන්කරණය තුළදී භාවිතයට ගැනෙන්නකි. සංස්කරණයත් කලාත්මකත්වයත් අතර ක්‍රියාවලිය සිනමාවෙහි හා රූපවාහිනියෙහි වශයෙන් පොදුවේ පවතින්නා වර්ධනයක් දැකිය නොහැක. නමුත් රූපවාහිනී අධ්‍යක්ෂකවරයා විසින් කළ කලාත්මක හෙළිදැක්වීම එක් ස්ථානයක සිට සිදුකරන අතර එය සිනමාවට වඩා සංකීර්ණ ස්වරූපයක් උසුලන්නකි. රූපවාහිනී සජීවීකරණ ක්‍රියාවලියට අයත් හැකියාවන් සහ එහි ක්ෂණික ක්‍රියාකාරීත්වය රූපවාහිනී





නිෂ්පාදන ක්‍රියාවලියට අයත් විශේෂ කලාත්මක හැකියාවක් ලෙස සඳහන් කළ හැක. මෙම ක්‍රියාකාරීත්වය එම හැකියාවන් පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක් බඳු එකකි. ඇත්ත වශයෙන්ම මෙහිදී අධ්‍යක්ෂකවරයාට සංස්කරණ අවශ්‍ය මූලාංගයන් ඒකරාශී කරගැනීමට අවශ්‍ය වන අතර එහි තාල රිද්මය ක්ෂණිකව ක්‍රියාත්මක වන වැඩසටහන අතරතුරදීම තෝරා ගත යුතුව පවතියි.

ඉහත සඳහන් සියල්ලට එක්කළ යුතු එක් වැදගත් තත්ත්වයක් ඇත. එනම් අදාළ සේයාපටය පුළුල්ව අධ්‍යයනයට භාජනය කිරීමයි. අප මෙයින් අදහස් කළේ කලින් රැස් කරගත්තා වූ සේයාපටයක් පිළිබඳව නොව දිග හැරෙන සජීවී විකාශය අතරතුරදී ඒ පිළිබඳව දැඩි අවධානයෙන් සිටිය යුතුය යන්නයි. එනම් සජීවී වැඩසටහන් විකාශය අතරතුරදී සිනමාවෙහි මෙම සංස්කරණාත්මක ක්‍රියාවලියක් අනුගමනය කළහැකි වටාපිටාවක් රූපවාහිනී සංස්කරණ ක්‍රියාවලිය තුළ වුවද නිර්මාණය කළ හැකිවනු ඇත යන්නයි. මෙහිදී සංස්කරණ ක්‍රියාවලිය සිනමාවට අනුයුක්තව පැවතියද ගැටලුවකට ඇත්තේ විකාශය වන දෙයෙහි සැබෑ ස්වරූපය රැක ගැනීමට පවතින හැකියාවයි. ඇත්ත වශයෙන්ම එහි වගකීම අධ්‍යක්ෂකවරයා සහ සංස්කරණ ශිල්පියා මත පැටවී ඇති බව කිව යුතුය.

## 15

# සන්නිවේදන කාර්යයෙහිලා සංගීතයේ සමාජයීය භූමිකාව

කේ.ඩී.එල්. මහරංජනී

දේශ සීමා, භාෂා සීමා හෝ ජාති, ආගම් ආදී සීමා ඉක්මවමින් මානව සමාජය වෙත නිර්මාණාත්මකව සංවේදීවීමේ හැකියාව ඇත්තේ, සීමිත වූ සංඥා සප්තකයක් මාධ්‍ය කරගත් සංගීතයටයි. පෙරදිගුවන් " ස,රි,ග,ම,ප,ධ,නි " යෙන් කරන්නා වූ සන්නිවේදනය, අපරදිගුවන් " Do, Re, Mi, Fa, So, La, Te " ලෙසින් ඉදිරිපත් කරයි. මෙය ශාස්ත්‍රීය වූ මහා සම්ප්‍රදායන්ට (Classical Music) මෙන්ම ගැමි (Folk) හෝ ප්‍රාථමික (Primitive) සමාජ පද්ධතීන්ට ද පොදු ධර්මතාවකි.

මානවයා සිය උපතින් ම උරුම කරගන්නා රිද්මය, නාදය හා රසය සංගීතයේ මූලික සන්නිවේදන මූලධර්මයන් ය. වෛද්‍ය විද්‍යාවේ " ලබ් ඩබ් " නමින් හඳුන්වන හද ගැස්ම සංගීතයේ රිද්මයයි. සත්වයා කුස පිළිසිඳ ගත් මොහොතේ සිට පවත්නා සමාජ රිද්මයට අනුගත වන්නේ එලෙසිනි. තම මව සම- මූලික සන්නිවේදන කාර්ය අරඹන්නේ එලෙසිනි. දෙවැන්න මෙලොව එළිය දුටු කෙනෙහි ඔහුගේ හෝ ඇයගේ මුවින් නිතැතින්ම නැගෙන " ක්වෑ ක්වෑ " නම් හැඬුමයි. එය ස්වර දෙක තුනක පරාසයක් ආවරණය කරන්නකි. කිසිදු ජීවියෙකු එක් ස්වරයකට තම හැඬුම සීමා නොකරයි. එනම් ස්වර තුනකට නොඅඩු සංඥා පරාසයක් ඔහු උපතින්ම හඳුනන්නේය. තෙවැන්න ඔහු මවගේ කිරි උරාබීමෙන් රසයට දක්වන සංවේදීතාවයයි. ඉන් තෘප්තිමත් වන ඔහු අන් කිසිදු රසයකින් තෘප්ත නොවේ. ඔහු විශ්වයේ අනර්ඝතම රසය හඳුනා ගන්නේ එලෙසිනි. ඒ අනුව සමස්ත මානව හා සත්ව සමාජ සංගීතයේ මූලික පදනම වන රිද්මය, නාදය හා





රසය වෙත අනුකූල වීම අරඹන්නේ ජන්මයෙන්ම බව පැහැදිලි කරුණකි. මෙය විශ්වයටම පොදු ධර්මතාවයකි. සංගීතයේ වූ මෙකී විශ්වීය ගුණය නිසා මිනෑම ජීවියෙකුට මිනෑම නාද සිත්තමකින් කිසියම් වින්දනයක්, රසයක් හෝ පෙළඹවීමක් කළ හැකිවේ. සිව් සැට කලාවන් අතර සංගීතය සියුම් හා විශිෂ්ටතම කලා මාධ්‍යයක් ලෙස සළකන්නේ එබැවිනි. ශුභාන්කර් (Shubhankar) " සංගීත දාමෝදර " යෙහි,

" Nada Rupam Param Jyoti "
(Divine fire is nada)

වශයෙනුත් එඩ්වඩ් හැන්ස්ලික් ( Eduard Hanslick ) නම් ජර්මන් දාර්ශනිකයා " A vital spark of the divine fire " වශයෙනුත් හඳුන්වා ඇත්තේ එහි වූ යථෝක්ත විශිෂ්ට භාවයයි.[1]

ලොව සියලු කලාවන් ප්‍රධාන අංග 3 කට ගැනේ.[2]

1. වාචික - verbal
2. දෘශ්‍ය - visual
3. ප්‍රසාංගික - performing

ගද්‍ය (Prose) හා පද්‍ය (Poetry) සහිත සමස්ත සාහිත්‍යාංග (Literature) වාචික ගණයටත්, චිත්‍ර කලා (Painting), වාස්තු විද්‍යාව (Sculpture) හා ගෘහ නිර්මාණ කලාවන් (Architecture) දෘශ්‍ය ගණයටත්, සංගීත (Music), නැටුම් (Dance) හා නාට්‍ය (Drama) ප්‍රසංග කලා ගණයටත් වැටේ. සංගීතයේ වූ මෙකී ප්‍රසංගාත්මක ගුණය රසිකයා ආත්මීයව බද්ධ කර ගනිමින්, සංස්කෘතික, ආගමික හා සමාජීය වටිනාකම් පිළිබඳ සුමට හා සරල අවබෝධයක් නිර්මාණාත්මකව හා රසාලිප්තව ඉදිරිපත් කිරීමට අවකාශ හිමි කර ගනී. ජන විඥානය පුළුල් කරමින්, සමාජ යථාර්ථය වඩාත් සංවේදීව ජනනය කිරීමට ශක්‍යතා හිමි කර ගනී. වර්තමාන විවිධ සංගීතවේදීන් හා මනෝ විද්‍යාඥයින් මානව වර්ගයාගේ පෞරුෂ වර්ධනයට හා බුද්ධි වර්ධනයට සංගීතය ප්‍රධාන හේතුවකැයි පිළිගෙන ඇත්තේ එබැවිනි.[3]

සංගීතය ස්වභාදහම සම- පවත්වන්නේ අවියෝජනීය සම්බන්ධයකි. භාරතයේ හා බටහිර විවිධ රටවල්හි මෙතෙක් සිදු කර ඇති පර්යේෂණයන්ට

අනුව සංගීතය ස්වබාදහම කෙරෙහි දක්වන සන්නිවේදනය කෙබඳුදැයි අවබෝධ කර ගත හැකිය. භාරතයේ මුත්තුසාමි ඩික්ෂිතාර් (ක්‍රි. ව. 1775 - 1827) අමෘතවර්ෂිනී (Amritavarsini) රාගයේ " ආනන්ද මෘතකර්ෂනී " (Anandamritakarsini) ගීතය ගයමින් වර්ෂාව වැස්වූ බවත්, ත්‍යාගරාජා (ක්‍රි. ව.1767 - 1847 ) බිලහාරි (Bilahari) රාගයේ " නා ජීවාධාර " නම් ගීතය ගයමින් මළ මිනිසෙකුට ප්‍රාණය ලබා දුන් බවත් කියැවේ.[4] මිනිසකුගේ හැඟීම් වලට ආමන්ත්‍රණය කිරීමේ, භාෂාවකට නොවූ ප්‍රබල හැකියාවක් සංගීතය සතුවීම මීට හේතුව විය හැකිය.

ගින්න (අග්නි) හෝ වර්ෂාව (මේඝ) වෙත නාද මඟින් කිසියම් කම්පනයක් හෙවත් සංඥාමය බලපෑමක් සිදු කළ හැකි බව මින් පැහැදිලි වේ. එසේම අක්බාර් රජුගේ රජ වාසල සංගීතඥයෙකු වූ තාන්සේන්ට රජුගේ බලවත් ඇවිමිල්ල නිසා දීපක් රාගය ගැයීමට සිදු විය. එය ගැයීමෙන් තමා ගිනිගෙන අළු බවට පත්වන බව දත් තාන්සේන්, එහෙත් රජ අණට අකීකරුවීමට නොහැකි වූ නිසා ගායනා කරන්නට විය. ස්වල්ප වේලාවකින් රජ වාසලේ ලාම්පු දැල්වෙන්නටත්, අවට පරිසරය ගිනියම් වන්නටත් පටන් ගත් කල්හි, ඔහුගේ දියණිය මේඝ් (Megh) රාගය ගයා වැසි වස්වා සියලු ජීවිත විපතින් බේරාගත් බවද කියැවේ.[5] සංගීතයෙහි වූ සීමිත සංඥා සප්තකයට සන්නිවේදන කාර්යයෙහිලා ඇති ප්‍රබල ශක්‍යතාව මින් මොනවට විශද වේ.

එසේම සංගීතය (වාදන) තුළින් කුඩා වෘක්ෂලතාදිය, ප්‍රමාණාත්මක හා ගුණාත්මක බවින් ශීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරන බවත්, එළදෙනුන් වැඩි වැඩියෙන් කිරි උත්පාදනය කරන බවත් ඉන්දියානු විද්‍යාඥයන් පර්යේෂණ මඟින් සොයාගෙන ඇත.[6] එසේම තිවාරි (Tiwari) විසින් 1980 දී ඉදිරිපත්කර ඇති වාර්තාවක " පණ්ඩිත් ඕම්කාර්නාත් ධාකූර් " භෛරවී රාගය වාදනයෙන් (වයලීනයේ) සත්තුවත්තක සිම් බෙහෙවින් රෞද්‍ර වූ සිංහයකුව සමනය කොට සාමාන්‍ය තත්ත්වයට පත් කළ බව දැක්වේ.[7] එසේම ආන්ද්‍රා හි කෘෂිකර්ම විශ්ව විද්‍යාලයේ කරන ලද සමීක්ෂණයකට අනුව පමිගත කරන ලද විපතට පත් කුරුල්ලන්ගේ නාදයක් කැසට් යන්ත්‍රයක් මඟින් කුඹුරක නින්නාද වන්නට සැළැස්වීමෙන් එහි රැස් වූ කුරුල්ලන් බියට පත්ව ඉගිලීගොස් ඇති බවත්, එනිසාම කිසිදු හානියකින් තොරව අස්වැන්න ආරක්ෂා කර ගැනීමට හැකි වූ බවත් සොයාගෙන තිබේ.[8] මෙලෙස සංගීතය කෙරෙහි සත්ව ලෝකය දක්වන සංවේදිතාවන් විවිධ ජන සමාජ අත්දැකීම් අතරින් අසන්නට, දකින්නට ලැබේ.





නාගයන්, වඳුරන් හා රිලවුන් නටවන මිනිසුන් අප නිතර ඇස ගැටේ. විවිධ සංගීත සංඥා තුළින් තමාට කෙරෙන විධානයන් තේරුම් ගනිමින් ඊට අනුගතව තම රැඟුම් විලාශ ඉදිරිපත් කිරීමට තරම් දියුණු මනෝ කායික තත්ත්වයක් උන් සතුව ඇත. කුඩා ළදරුවන් මවගේ " නැළවිලි ගී " (Lullaby) වලට දක්වන සංවේදිතාව මෙනි. දඩයක්කරුවන්ගේ ගීත අසා ඉන් උද්දාමයට පත්ව, කැලයේ අහර සොයා ඇවිදින මුවන්, ඒ හඬ වෙත නොදැනුවත්ව ඇදීයාම නිසා තම ජීවිත පවා අහිමි කරගන්නා බව ඉන්දියානු පර්යේෂකයන් වාර්තා කර තිබේ.[9] ස්වභා දහමටත් , සත්ව ලෝකයටත්, එකසේ සංගීතයෙන් කළහැකි ආමන්ත්‍රණය කෙතරම් ප්‍රබල දැයි මින් අවබෝධ කර ගත හැකිය.

සංගීතය යන්නට නිර්වචනයක් ඉදිරිපත් කරන V. S. නිගම් " ක්‍රමවත් වූ නාද මාධ්‍යයෙන් මිනිසාගේ හැඟීම් ප්‍රකාශ කිරීමේ කලාව " යනුවෙන් විග්‍රහ කර තිබේ.[10] ක්‍රමවත්ව සංවිධිත වූ නාද මාධ්‍යයෙන් සංගීතයට අතික්‍රමණය කළ හැකි සීමා අතිවිශාලය. රෝග නිවාරණයෙහිලා සංගීතයට ඇති පුදුමාකාර ශක්තිය දෙස බැලීමෙන් එය පසක් වේ. පෙරදිග හා අපරදිග මෙතෙක් කෙරී ඇති පර්යේෂණයන්ට අනුව මනෝ චිකිත්සක ක්‍රමයක් ලෙස සංගීතයේ ශක්‍යතාව මතු පරිදිය.

මානවයා සිය ජීවිතයේ මුහුණ දෙන විවිධාකාරයේ දුක්ඛ දෝමනස්සයන් සමනය කොට මනසට හා හදවතට සතුට, සාමය ළඟාකර දීමට සංගීතයේ සෞන්දර්ය (Aesthetics) අංශයෙන් සැලසෙන මෙහෙය පෙර අපර දෙදිග සංගීතඥයන්, විද්‍යාඥයන්, දර්ශනවාදීන් හා මනෝ විද්‍යාඥයන්ගේ ද විශේෂ අවධානයට ලක් වී තිබේ.[11] හරිදාස් ස්වාමි හා ඔහුට සමකාලීන සංගීතඥයන් රෝග නිවාරණයෙහිලා සංගීතය උපයෝගී කර ගෙන ඇත. ජෙහන්ගිර් රජු කලක් තිස්සේ දැඩිව පෙළුණු නින්ද නොයෑම (Insomnia) නම් රෝගී තත්ත්වය, ඔහුගේ නිදන කාමරයේ සිව්කොණ තාම්පුරා 4 ක් නින්නාද කරවීමට සැලැස්වීමෙන් සුවපත් කළ බව කියැවේ.[12] එසේම නින්ද නොයෑමේ රෝගයෙන් පෙළෙමින් සිටි පිරිමි දරුවකු පණ්ඩිත් ඕම්කාර්නාත් ධාකූර් විසින් පූරියා (Puriya) රාගය ගායනා කිරීමෙන් සුවපත් කළ බව තිවාරි වාර්තා කරයි.[13]

වේද්මනි සිංග් ධාකූර් ( Ved Mani Singn Thakur ),1981 දී ඉදිරිපත් කර ඇති වාර්තාවක මැලේරියා ( Malaria ), හිස්ටීරියා ( Hysteria ), නින්ද නොයෑම ( Insomnia), ක්ෂය රෝගය ( Tuberculosis ) , මලබද්ධය

( Constipation ) , උණසන්නිපාතය ( Typhoid ), හා තවත් එවැනි බොහෝ අසනීප තත්ත්වයන් හින්දෝල, මාර්වා, පුරියා, බිලාවල්, තිලංග , රාම්බලී, මුල්තානි, කාලිංගඩා, සෝහිණී, පරජ්, තෝඩි, භෛරවී, මාල්කෞන්ස්, පීලු, බිහාග්, දර්භාරිකාණ්ඩා, ඛමාජ්, සොරට්, අඩානා, මේඝ් මල්හාර්, ආසාවරී, භෛරව, බ්‍රින්ද්‍රමනී සාරංග හා දේශ් ආදී රාග තුළින් සුවපත් කළ හැකි බව දක්වා තිබේ.[14]

එසේම බැරෝඩාහි එම්. එස්. විශ්වවිද්‍යාලයේ ආචාර්ය භට්ටාචාර්යයන් විසින් 1970 දී කරන ලද පර්යේෂණයකට අනුව බිහාග්, ලලිත් හා ජයජයවන්ති ආදී රාග වලින් මානසික අසහනතාවන්ගෙන් පෙළුණු රෝගීන් සුවපත් වූ බව සොයා ගෙන තිබේ. එසේම නවාබ් අලිඛාන් අංශභාග (Paralysis) රෝගය නිසා දැඩි අපහසුතාවයකට පත්ව සිටි බවත්, රජ වාසල සංගීතඥයින් අවුරුදු 3 ක් මුළුල්ලේ ජය ජයවන්ති ( JeJevanti ) රාගය වීණා තුළින් වාදනය කොට අසන්නට සලස්වා ඔහුව සුවපත් කළ බවද කියැවේ.[15]

සංගීතයට සවන්දීම හෝ නිර්මාණකරණය කෙනෙකුගේ ශාරීරික වෙනස්වීම් වලට වක්‍ර බලපෑමක් කරන බව ඔහුගේ මුහුණින් ප්‍රකාශ කෙරෙන සිනහව, හා සතුට වැනි ලක්ෂණ ධ්වනිත කරන බව විද්වතුන්ගේ පිළිගැනීමයි.[16] එසේම බියක්, කළකිරීමක් හෝ කේන්තියක් දැනුණු විට සංගීතයට සවන්දීමෙන් හෝ සංගීත වාදනයෙන් සිතට අස්වැසිල්ලක් ලැබේ.

සුවිශේෂී සංගීත භාවිතාව ශාරීරික අසම්බන්ධතාවයන් නිවැරදි කරයි. නලා පිඹීම (Blowing the horn) උදරයේ දුර්වල මාංශ පේශී සංවර්ධනය කරන අතර, ෂෙලෝ (Cello) වාදනය පෝලියෝ රෝගී තත්ත්වය නිරෝගී කරවයි. පෝලියෝ රෝගියාගේ ඇ-ිලි වල නිවැරදි සමබර තත්ත්වයක් පවත්වා ගැනීමට එම වාදනය උපකාරී වීම ඊට හේතුව ලෙස විද්‍යාඥයින්ට සොයා ගත හැකි විය. එසේම සංගීතයේ මූලික පදනම වන ස්වර අභ්‍යාස වල යෙදීමෙන් කොර (Cripples) මිනිසුන්ගේ අවයව වල මනා චලනයක් ඇති කිරීමට හැකි වී තිබේ. එසේම ගොත ගසන ළමයින් තුළින් විශද වන ප්‍රමාණවත් නොවන හුස්ම ගැනීම්, බොහෝ කලබල වන ස්වභාවය, පහත් කොට සැලකීම් හා ස්නායු පද්ධතියේ මනා සම්බන්ධයක් නොමැති වීම ආදී ලක්ෂණ සංගීතයේ විවිධ ශිල්ප ක්‍රම, නාද මාලා හා සරල රිද්ම රටා තුළින් සුවකර ගෙන තිබේ. මේ අනුව සංගීතයට, මානව ශරීරය පිළිබඳ අතිවිශාල බලපෑමක් කළ හැකි බව පෙනේ.[17]





කායික විද්‍යානුකූලව (Physiology) නිරෝගී පෙනහළු පවත්වා ගැනීමට ගායන සංගීතයේ (Vocal Music) ඇති වැදගත්කමත්, ස්නායු පද්ධතියේ නිරෝගී පෝෂණයට සංගීතයේ ඇති ශක්‍යතාවත් බොහෝ විද්‍යාඥයන් සිය පර්යේෂණ තුළින් අනාවරණය කොට ඇත.[18] හදවත් රෝගීන්ට (Heart Patients) ඉන් සහනයක් ලබා ගැනීම සඳහා සංගීතයට සවන්දෙන ලෙස ඉන්දියානු වෛද්‍යවරු උපදෙස් දී තිබේ. එක් රුසියානු වෛද්‍යවරයෙකු වූ ඩොජියල් (Dogial), සංගීතයේ මානසික බලපෑම් පිළිබඳ අධ්‍යයනයක් කරමින් ලේ ගමනාගමනය කෙරෙහි සංගීතයේ බලපෑම කෙබඳු දැයි ගවේෂණය කර ඇත.[19] එහිදී සංගීතයේ තාරතාව (Pitch), හඬේ අඩු වැඩි බව (Loudness) හා සංගීතයේ තානය (Tone) විවිධ ලේ සම්පීඩනයන්ට (Variation of the blood pressure) බලපාන අයුරු අධ්‍යයනය කර තිබේ.

ජීව විද්‍යානුකූලව කර ඇති පර්යේෂණයන්ට අනුව සංගීතයෙන් මානවයා කෙරෙහි සිදු කරන බලපෑම මූලික වශයෙන් දෙයාකාර බව සොයා ගෙන තිබේ.[20] එනම්,

1) ඝෝෂාකාරී සංගීතය නාඩි වේගය, මාංශ පේශීන්ගේ චලන, රුධිර පීඩනය හා ලේ වල සීනි ප්‍රමාණය වර්ධනය කරන බවත්,

2) රිද්මයානුකූල වූත්, සෞම්‍ය වූත් හුරුපුරුදු සංගීතයක් ආතතීන් ලිහිල් කිරීමට, නින්ද වර්ධනය කරවීමට හා අධි රුධිර පීඩන තත්ත්වයන් සමනයට හේතුවන බවත් ය.

කායික විද්‍යානුකූලව (Physiologically) මිනිස් සිරුරේ විවිධ ඉන්ද්‍රිය කොටස් කෙරෙහි සංගීතය කොතරම් බලපාන්නේ ද යත් ආහාර දිරවීම, ලේ ගමනාගමනය හා පෝෂණ ක්‍රියාවලිය ආදී තත්වයන් ක්‍රමවත්ව හා ස්ථිරසාරව පවත්වා ගැනීමට එය බෙහෙවින්ම මහෝපකාරී වන්නේයැයි විද්‍යාඥයින් සොයා ගෙන තිබේ.[21] එසේම එය සිරුරේ වර්ධනයට හා ශක්තිය ආරක්ෂා කිරීමට මහෝපකාරී වේ. සංගීත භාණ්ඩ වාදනය (මූලිකව බෙර වාදනය) හා රිද්මයානුකූල අභ්‍යාසයන්හි යෙදීම ස්නායු පද්ධතියේ කාර්යක්ෂමතාව මනාව පවත්වා ගැනීමට උපකාරී වේ.

සංගීතාත්මක ක්‍රියාකාරකම් සිතීමේ හා නිර්මාණාත්මක චින්තනයේ සංවර්ධනයක් ඇති කරන බව මනෝවිද්‍යාඥ මතයයි.[22] ගායනය, වාදනය හෝ රිද්මයානුකූල චලනයන් තෘප්තිකර වූ හැ:මි වර්ධනය කරයි. ලැජ්ජාව ආදි තත්ත්වයන් සමනය කරයි. තනිකම, පාළුව, ඒකාකාරී බව හා මන්දෝත්සාහි බව ආදි මානසික අවපීඩනයන් සැහැල්ලු කොට මනසට නැවුම්බවක් ලබා දෙයි. තන්වි (Thanvi) පෙන්වා දෙන ආකාරයට මිනිසාගේ මානසික හැසිරීම් වලට සීමා රහිතව බලපෑම් කිරීමේ හැකියාවක් සංගීතයට ඇත.[23] Slack (ස්ලැක්) වර්ෂ 1970 දී කරන ලද සමීක්ෂණයකට අනුව මන්දගාමී ශිෂ්‍යයින්ගේ අධ්‍යාපනික හැකියාවන් සක්‍රිය බවට පත් කිරීමේ ධනාත්මක චාලක ශක්තියක් සංගීතයට ඇති බව අනාවරණය කොට ඇත. William Green , " වෙහෙසවන්නාගේ මිත්‍රයා සංගීතය බවත්, එය ස්නායු පද්ධතියේ හා ආත්මයේ නැවුම් භාවය ඇති කිරීමට හේතුවන බවත් " පවසා තිබේ. විවිධ මනෝමය වුත්, ශාරීරික වුත් සම්පීඩනතාවන්ට සංගීතය ඖෂධයක් වී ඇති බව මින් පැහැදිලි වේ.

18 වන ශත වර්ෂයේ දී ප්‍රංශ දන්ත වෛද්‍යවරුන් කර ඇති ගවේෂණයන්ට අනුව, ශරීරයේ නොයෙක් වේදනාවන් සංගීත වාදන තුළින් සමනය කළ හැකි බව සොයා ගෙන තිබේ.[24] ඔවුන්ගේ දන්ත සායනයේ වාර්චක දත් ගලවන අවස්ථාවේදී, රෝගියාට දැනෙන වේදනාව ගිටාර්හි තත් නින්නාද කිරීමෙන් සමනය කරවීමට හැකි වූ බව ඔවුන් පවසයි.

සංගීතයට මානව ජීවිතයේ විශේෂ වුත්, ප්‍රමාණාත්මකව විශාල වුත් භූමිකාවක් හිමි වී තිබේ. උපතේ සිට මරණය දක්වා වූ ඔහුගේ ජීවිතයේ සෑම වැදගත් අවස්ථාවක්ම සංගීතය හා බද්ධ වී පවතී. ඉන්දියානුවන්ගේ නාමකරණ (Namakarana), උපනයන, මංගල හා අවමංගල මෙන්ම සෙසු ආගමික, යාතුකර්මමය, කෘෂිකාර්මික හා යුද්ධ ආදි සෑම සාමාජීය හා සංස්කෘතික අංගයක්ම සංගීතයෙන් උපලක්ෂිත වී තිබේ.[25] මින් පැහැදිලි වන්නේ සංගීතයට මිනිස් මනස සම- සංවේදිවීමටත්, බලපෑම් කිරීමටත්, සංවාද ගොඩනගා ගැනීමටත් ඇති හැකියාවයි.

සංගීතය විවිධ කාලයන්ට, ඍතු වලට හා විවිධ විෂයන්ට සහ සම්බන්ධයක් දක්වයි.[26] සංගීතයේ මනෝවිද්‍යාත්මක (Psychology), ශරීර විද්‍යාත්මක (Physiology) , ස්නායු කායික විද්‍යාත්මක (Neuro Physiology), සන්නිවේදනාත්මක (Communication Value) හා ආධ්‍යාත්මික වටිනාකම්





(Spiritual Value) කිහිපයක් දෙස අප අවධානය යොමු කළෙමු. එසේම එය නැටුම හා නාට්‍යය සම- පවත්වන්නේ අවියෝජනීය සම්බන්ධයක් බව භරතමුනිගේ " Drama is Colourless without music " යන ප්‍රකාශනයෙන් පැහැදිලි වේ.

එමෙන්ම එය ගණිත ශාස්ත්‍රය (Mathematics) සම- දක්වන සහ - සම්බන්ධය, එහි තාල පක්ෂය හා ස්වර කල්පනා වෙත අවධානය යොමු කිරීමෙන් අවබෝධ කර ගත හැකිය. උත්තර භාරතීය සංගීතයේ ලයකාරී , හුදෙක්ම ගණිත ශාස්ත්‍රය මත පදනම් වේ. සංගීතයේ භෞතික විද්‍යාත්මක (Physics of Music) ගුණය, තාරතාව (Pitch), හඬෙහි උස් පහත් වන ප්‍රමාණය , ස්වර ගුණය (Timbre) හා කම්පන සංඛ්‍යාතය (Frequency) මත රඳා පවතී. මෙ මගින් සංගීතයේ විද්‍යාත්මක පදනම අනාවරණය කර ගත හැකිය.

මෙකී සමස්ථය සැලකිල්ලට ගත් කල සංගීතයෙන් සලසා ගත හැකි පුරුෂාර්ථයෝ සිව් වැදෑරුම් වෙති. ( The Goals of Human Life)

| | | |
|---|---|---|
| 1) | ධර්ම | (Righteousness) |
| 2) | අර්ථ | (Wealth) |
| 3) | කාම | (Desire) |
| 4) | මෝක්ෂ | (Liberation) |

සංගීතයෙන් සලසා ගතහැකි සැබෑ වටිනාකම් අවබෝධ කර ගන්නේ නම් මෙකී පුරුෂාර්ථ වෙත ළ-ා වීම අපහසු කරුණක් නොවේ. මානසික ආතතින්ගෙන් වියුක්ත වූ නිරවුල් මනසක් ලබා ගැනීමට හැකියාව ලැබෙන්නේ මෝක්ෂ නම් වූ අවසාන ඉලක්කය වෙත සමීප වූ විටය. සංගීතයකට සවන්දෙන ප්‍රථම අවස්ථාවේදී සිතේ චංචලභාවය එලෙසම පෙන්නුම් කළත්, ස්වල්ප මොහොතකින් සියල්ල අමතක වී ධ්‍යානයකට සමවැදුනාක් මෙන් සිත සංතෘප්ත වේ. Liberation හෙවත් Emancipation ලෙස හඳුන්වන මෝක්ෂය වෙත ළ-ාවීමේදී සිත අතෘප්ත කරවන ආතතින් (Tensions) ක්‍රමයෙන් අමතක වී ගොස් සිතට සැනසුම ලැබේ. ආත්ම තෘප්තිය ඇති වේ. (Self Satisfaction)

වර්තමාන ව්‍යවහාරික සංගීතයේ යථෝක්ත වටිනාකම් වෙත රසිකයා සමීප කරවීමේ සැබෑ උවමනාවක් ඇත්දැයි සොයා බැලීම වටී. එහිදී අප වඩාත් සංවේදි වන්නේ ගීතයටයි. එය සංගීතයේ අග්‍රඵලය වී හමාරය. සංගීතය ප්‍රජාවගේ

සම්පතම සාහිත්‍යාංගය බවට පත්වී ඇත. හේතුව හුදෙක් නාද සංඥා වලට පරිබාහිර වූ වාග් මාලාවක් තුළින් හැඟීම් ජාලයක් ජ්වනිත කළ හැකි බැවිනි. එහිදී ගේය පද රචනයත්, තනු රචනයත් අවියෝජනීයව සංයෝග වීම සංගීත නිර්මාණයේ උසස් බව ආරක්ෂා කරයි. අදින් වසර 2500 කට ඉහත බුදුරජාණන් වහන්සේ දීඝ නිකායේ සක්ඛ පඤ්ච සූත්‍රයේදී කළ දේශනාව මෙහිදී අගනා පූර්වාදර්ශයක් ලබා දේ. පංචසිඛගේ වීණා වාදනයට සවන් දෙන උන් වහන්සේ අවසානයේදී, " ඔබගේ තත් සරය නොඉක්ම වූ ගායනයත්, ගායනය නොඉක්ම වූ තත් සරයත් අගනේය. " යි වදාරා ඇත. මනාව සුසංයෝග වූ ගේය පද රචනයත්, තනුව හා කටහඬත් එතුමා අගය කර ඇති බව මින් පැහැදිලිය.

මේ අනුව ක්‍රමවත් නාද මාලාවක අනුනාදයට පෙළ ගැසෙන ගේය පද ධ්වනි පූර්ණ විය යුතුය. ව්‍යංගාර්ථවත් විය යුතුය. හුදු වාද්‍ය සංගීතයකට වඩා පොදු ජන වින්දන පක්ෂයට ආමන්ත්‍රණය කිරීමේ මහගු බලයක් ගීතයකට ඇති බැවිනි. එමගින් වමිනා ආකල්ප, හර පද්ධතීන් සරල හා සුගම ලෙස රසිකයා වෙත සම්ප්‍රේෂණය කරමින් මනෝ ශුද්ධියක් කළ හැකිය. " මනෝ ධර්මී සංගීතය " යැයි විශේෂ සංගීත ආකෘතියක් අද විකාශයට පත්වී ඇත්තේ මේ නිසාය.[27] මෙකී කරුණු දෙස විමසුම් නෙතින් බැලීමට වර්තමාන ගේය පද රචකයාට හා සංගීත නිර්මාපකයාට කාලය එළඹ තිබේ. දිනෙන් දින උග්‍ර වන තරුණ අසහනය සංතෘප්ත කරවීමට සංගීතයට මනා හැකියාවක් ඇත. සංගීතයේ සන්නිවේදන භූමිකාව වඩාත් අර්ථවත් ලෙස ප්‍රයෝජනයට ගැනීමෙන් සමාජයට සුභවාදී ප්‍රතිඵල ලැබිය හැකිය.

හුදු අර්ථ ශූන්‍ය වූත් , ළාමක වූත්, ගේය පද හා වේග රිද්මයනට අනුගත වූ තාවකාලික, තෘප්තිය මතු කරන සංගීත ආකෘති වෙනුවට, නව පරපුරේ සංගීත චින්තනය යොමු විය යුත්තේ එයින් මතු කෙරෙන සමාජ චින්තාව (Message) වෙතයි. දියුණු සංවේදී භාව ප්‍රේරණය වෙතයි. (Improved Sensitive Transmission) ආකල්පමය වෙනසක් වෙතයි. පුද්ගලයාගේ ජීවිත පරිකල්පනයෙහි ලා ගීතයකට ඇති බලය වෙනත් කිසිදු මාධ්‍යකට නොවන්නේය. හේතුව එය ජන හදට සමීප වන්නේ අගනා පද මාලාවක්, සංගීත රචනයක් හා මධුර කටහඬක් තුළින් වීමයි. එබැවින් මෙම ශ්‍රව්‍ය - දෘශ්‍ය මාධ්‍යයට කළහැකි මනෝ චිකිත්සාව අතිප්‍රබල බව අවධාරණය කර ගත යුතුය.

මෙකී ශක්‍යතාව අවබෝධ කර ගනිමින් තාරුණ්‍යයේ අවශ්‍යතාවන්ට





සුභවාදීව සමීප වීමට දියුණු සංගීතයට උවමනා තරම් අවකාශ තිබේ. එබැවින් කායික, මානසික හා සමාජයීය හර පද්ධතියක්, උසස් රසිකත්වයක් හා දියුණු චින්තනයක් පෝෂණය කිරීමෙහි ලා සංගීතයේ භූමිකාව අර්ථවත්ව භාවිතා කරමින් නව ආකල්පමය ප්‍රබෝධයක් හා උසස් රසඥතාවක් වර්ධනය කිරීමෙහි ලා තරුණ මාධ්‍යවේදීන්ට, විද්‍යාර්ථීන්ට , සංගීතඥයින්ට හා මනෝ විශ්ලේෂකයින්ට යෝග්‍යතම කාලය එළඹ තිබේ. G.M. ෆොස්ටර්ට අනුව " ආනන්දය තුළින් ප්‍රඥාව " වෙත රසිකයා සමීප කළ හැකිවන්නේත්, සංගීතයෙන් අපේක්ෂිත මූලික සන්නිවේදන අභිප්‍රේතාර්ථ පූරණය වන්නේත් එවිටයි.

## මූලාශ්‍ර


1. *Sharma, Manorma, 1996, Special Education Music Therapy, APH Publishers, New Delhi, PP.2-5;*
2. *Sengupta , Pradeep Kumar, 1991, Foundation of Indian Musicology , Abhinav publications, India, P.25;*
3. *Sharma, Manorma, 1996, Special Education Music Therapy - See Chapter 2, APH Publishers, New Delhi;*
4. *Vedavalli , M.B, 2001, <u>Sangita Sastra Sangraha</u>, Harsha type setters, Chennaw, India, PP.6,7;*
5. *Ram Avtar Veer. 1987, Histor of Indian Music and Musicians , Pankaj, Publications, India, P.65;*
6. *Vedavalli, M., B., 2001, OP.cit , P. 7;*
7. *Sharma, Manorma, 1996, OP.cit, PP. 45,46;*
8. *-------- Ibide ------- 1996, PP. 45,46;*
9. *Vedavalli, M. B., 2001, OP.cit, P. 6;*
10. *Nigam., V. S., 1992, Musicology of India (Part I), Lucknow Citizen Press;*
11. *Swami , Prajnananda, 1981 , A Historical Studies of Indian Music, Munshiram Manoharlal Publishers ,India. ( See, " The Philosophy of Music " );*
12. *Vedavalli . M. B., OP.cit, 2001;*
13. *Sharma , Manorma , 1996 ,OP.cit , P. 48;*
14. *-------- Ibide -------- 1996 , P.49 ;*
15. *Vedavalli, M. B., OP .cit, 2001;*
16. *Sharma. Manorma , OP. cit , 1996 , P. 42;*
17. *-------- Ibide -------- 1996, P.42;*

18. Vedavalli, M.,B., 2001,OP.cit;
19. Adyantayya N.,M., 1946, Article " Therapeanitic Qualities of Music " , Music Academy Journal Vol XVII;
20. Sharma, Manorma, 1996, OP . cit, PP. 38, 39;
21. -------- Ibide -------- 1996, PP. 42 , 43;
22 -------- Ibide -------- 1996, P. 39;
23 -------- Ibide -------- 1996;
24. Hall, Manly, P., 2000, Therapeutic Value of Music, Pilgrims Publishing Varanasi , India, PP. 5,6;
25. Vedavalli M.B. , 2001,OP.cit , " The Place of Name in Life"
26. Chaitanga Deva, B., 1992 ," Mind and Music " An introduction to Indian Music, Publications Division , India;
27 රත්නපාල චන්ද්‍රසේන, 2003 " ප්‍රබන්ධනාත්මක ගීත චින්තනයෙහි සමාජානුයෝජනය " , අමරදේව ප්‍රතිසංවේදය , එස්.ගොඩගේ ප්‍රකාශන;





# 16

# තූර්ය භාෂාභ්‍යන්තරයෙහි ප්‍රවර්ධනීය සාම්ප්‍රදායික සමාජ සන්නිවේදන ලක්ෂණ.

ජේ. එම්. ආර්. සී. බණ්ඩාර

පොළව ආශ්‍රයස්ථානය ලෙස පාදකකොට ගෙන නිපන් ජීවී බව උපස්ථම්භක වී විවිධානුකරණයෙන් යුතුවැ පුද්ගලානුරූප වී ඇත. එහි අභ්‍යන්තරික ව ආකාශය, වායුව, අග්නිය, ජලය, පෘථිවිය යන පඤ්චම භූතයෝ වෙත්. අදෘෂ්‍ය බලයන් වූ කලී ඒ ඒ තන්හි පුද්ගලානුරූපව මිනෑ එපාකම් මධ්‍යයේ සන්තර්පනයට ලක්වන්නකි. එසේ අදෘෂ්‍යයන් සන්තර්පනයෙහි ලා ප්‍රාග්බෞද්ධ යුගයන් හි මෙන් ම එදා මෙදා තුර අද්‍යතනය දක්වා ම පාදකව උකහා ගන්නා ගතික මෙවලමක් ලෙස තූර්ය යන්න සැලකේ. එය තූර්ය, පංචතූර්ය පස-තුරුගෙය යනුවමැ නා නා විධ අයුරින් හඳුනා ගැනීම් සමුදායකි. ඒ තුළ විවිධ නාම භේදයන් සහිතව ප්‍රභේධ ගතව සැකසුනු මෙවලම් රාශියක් වෙත්. ශබ්ද කෝෂකරු, තූර්යය යන්නෙන් පොන්වා දෙන්නේ " වැයීමේදී හඬ උපදවන, උපකරණය, ධ්වනිය විහිදවාලන භාණ්ඩය, වාද්‍ය තූර්ය[1] " වශයෙන් අර්ථ ගෙන හැර පායි.

මධුර ශබ්ද නිපදවා ගත හැකි සමින් බඳනා ලද දවුල්, තම්මැට්ටම් බෙර වැනි භාණ්ඩත්, වීනා නලා ආදි තත් සුසිර භාණ්ඩත් බව, නර්තන වාක් කෝෂය පූර්වාපර දෙදිග කරුණු හෙළිදරව් කරයි.[2] උක්ත තූර්ය භාෂාව තුළ ඇති ගුණාත්මක බව හේතුවක මතු දක්වනු වස් අදෘශ්‍ය වාසීන් සන්තර්පනයෙහිලා අද්‍යතනය දක්වාම අවිච්ඡින්නව පැවත ආ බව සිතීම යුක්ති යුක්ත වේ. ඒ නයින්ම

ප්‍රාකෘත, ප්‍රථම, මධ්‍යකාලීන, නූතන හා අද්‍යතන අවධීන් හි නා නා තන් හි ප්‍රපංචයන් ඔස්සේ තේමා කොට ගනිමින් තූර්ය යන්න පාරිභාෂික තත්වයට පත් වී ඇත. අෂ්ටාංග, අයුර්වේදයෙහි වෙන් වෙන් වශයෙන් හඳුනා ගැනීමේ දී ශල්‍යතන්ත්‍රය, ශාලාක්‍යතන්ත්‍රය කායචිකිත්සා, භූත විද්‍යා, කෞමාරභෘත්‍ය, අගදතන්ත්‍ර, රසායනතන්ත්‍ර, වාජීකරණතන්ත්‍ර, වශයෙන් මැ වෙත්[3] . එහි භූත විද්‍යා තුළ දේවතා - අසුර - ගාන්ධර්ව - යක්ෂ - රාක්ෂ - පීතෘ - පිසාච - නාග - සහ ග්‍රහ ආදීන්ගේ ආවේශය හේතු කොටගෙන උපදෘත වන සිත් ඇතියවුන්ගේ ඒ ග්‍රහ වේගයන් සමනය කිරීම සඳහා ශාන්තිකර්ම බලිදාන කරන බව ආයුර්වේදිය ග්‍රන්ථ උපුටා දක්වත්. [4] එම ශාන්තිකර්ම ආදිය සඳහා යොදා ගනු ලබන්නාවූ තූරියෙහි රිද්මයක් ( Ritham) මූලික අපේක්ෂා වුව ද, ඒ තුළ ද යම් යම් ශාන්ත්‍යාර්ථයෙහි හඬ නිපද වූ බව පැහැදිලි වෙත්. ඒ තුළ තත් (ත) , ජිත් (ජි) , තො (තොං) , න (නං), යන සිව් බීජාක්ෂයන් මතුයෙහි ජීවය ලබා ගර්භාක්ෂරෝත්පත්ති වී තරි, ජිතෙහි, කුරුැම්ට, තකරොං, තහකඩ, කඩතක ......... වශයෙන් නිෂ්පන්න වී ඇති බවට සාක්ෂ්‍ය එමට ය. එකී අක්ෂර වෘතය වටා සම්ප්‍රදායානුගතව (Traditional) ගුරුකුල ප්‍රවේණි තුළ, පුද්ගලානුබද්ධව, ගතානුගතිකව , වල්‍යවාදීව අන්තර්ගතයෙහි ශිල්පීය නෛපුණ්‍යතාවය කරණකොට ගෙන විවිධ මතිමතාන්තර මෙන් ම විශ්වාස තුළ, හැඳින ගැනීමේ නාම සකස් වී ඇත. ඒ තුළ අක්ෂර, හරඹ, හුරු නුහුරු පෙරළුම්, සුරල් , අඩවි, මැල් බෙර, අත්‍යාබෙර, වැඳුම් අත්, දැකුම් අත්, සව්දම්, කවුස්තම්, තාලම්, අහින පද, විණා පද, සේම හේවිසි, හේවිසි පහෙ හේවිසි , මණ්ඩම් පෙරළුම්, හැන්දැදුර, මධ්‍යම දුර, අලුයම් මුර, තේවා හේවිසි, ගමන් හේවිසි, පෝය හේවිසි, පුජා පද , කෙම්මුර පද, අයිල් පද , අඩ පද , වට හේවිසි පද [5] වශයෙන් තූර්යභාෂාභ්‍යන්තරයට අදාළ අංකුර රාශියක් වෙත්. මේවා ගද්‍ය හා පද්‍යමය වශයෙන් තූර්ය සාහිත්‍යයක් නිර්මාණය කරයි.

තූර්ය ගද්‍යය - ( පද ) හරඹ පද වාදනයේ සිට සියලු නිර්මිත සහ පද ඛණ්ඩයන් අවනද්ධ භාණ්ඩයන්ගෙන් නිපදවෙන්නා වු සියලු ශබ්දයන් ආශ්‍රිත ධ්වනි අක්ෂර සංයෝග වු පද වර්ග.

තූර්ය පද්‍ය - උපත් කථා සාහිත්‍ය ( කවි ඇතුළත්ව ) ව්‍යුහිය ලක්ෂණ ඇතුළත් ගායන බීජාක්ෂර වලින් නිර්මිත පද හා වාදනයන්ට අදාල සියලු ගායනා.





උක්ත සියල්ල ගොනු වු, එකක් අනෙකට වෙන්කොට හඳුනාගත හැකි මිනුම් දණ්ඩ “ තිත ” ලෙස හඳුනාගෙන ඇත. විද්වත්හු මෙය,

1. සංලක්ෂණාර්ථවාචී
2. තාලාර්ථවාචී යනුවෙන් තිත් ශබ්ද ප්‍රධාන ලෙස බෙදා වෙන්කොට දක්වත්.[6]

මේ සියලු තන් හි ම අක්ෂරයෝ සුභ සහ අසුභ වශයෙන් ඝණ පිහිටුවාලත් . ඒ වු කලී හොඳ හෝ නරක පැමිණවීම වස් යෝගකාරක අක්ෂරයන් වේ.

## තූර්ය භාෂා ඝණ පිහිටුවීම.

තූර්ය වාදන භාෂාවෙහි මුඛ්‍යාංගය ලෙස ඝණ පිහිටුවීම උපුටා දැක්විය හැකිය. සන්නිවේදන කාර්ය සඳහා යොදාගනු ලබන තූර්ය අක්ෂර පද ආදිය විෂයෙහි මෙම ඝණ පිහිටුවීම ප්‍රධාන වේ. යට දැක්වුවා සේම ඒවා සුභ ඝණ හා අසුභ ඝණ වෙත්. මේ තුළ ජ්‍යොතිශ්‍රාස්ත්‍රයෙහි අන්තර්ගත සියලු ජ්‍යාමිතික මෙන් ම ගණිතමය කාලහෝරා සංමේතයන් ඉතාමත් සමීපතාවයක් දක්වයි. කෙසේ ද යත් සිංහල දින කාලවකවානු බෙදීමේ දී මේවා සූර්ය මාස ලෙස ගනිනු ලැබේ.



මෙසේ වෙන් කරනු ලබන සූර්ය මාසයන් කොටස් දෙකකට බෙදෙත්. ඒවා නම්,

1. පුර පක්ෂ (හඳ පිරෙන පක්ෂයයි)

2. අවපක්ෂය (හඳ ගෙවෙන පක්ෂයයි) වශයෙනි.[7]

පුර පක්ෂයේ දින නම් පුර පැලවිය, පුර දියවක, පුර තියවක, පුර ජලවක, පුර විසේනිය පුර සැටවක, පුර සතවක, පුර අටවක, පුර නවවක, පුර දසවක, පුර එකොළොස්වක, පුර දොළොස්වක, පුර තෙලෙස්වක, පුර තුදුස්වක, පුර පසලොස්වක, වශයෙන් බෙදා වෙන්කොට දක්වන අතර අව පක්ෂය අව පැලවිය, අව දියවක, ආදි වශයෙන් නම් කෙරෙත්.[8] පුර සහ අව යන ද්වි පක්ෂයේ ග්‍රහ පිහිටීම මත ලාංකේය ජනසමාජය තුළ සුභාර්ථයේ මෙන්ම අසුභාර්ථයේ කටයුතු වල යෙදෙත්.

## අක්ෂර පිහිටීම

තූර්ය භාෂාව තුළ මතුයෙහි විභාග කළ වස් තා, පි, තො, නං, යනු මුල් හෝඩිය සේ සැලකෙත්.[9] එයින් බෙදී ගොස් ඇති විවිධ අක්මුල් රාශියකි. එසේම භාෂාවක අක්ෂර උසුරනු ලබන ආකාරය පිළිබඳව ද පරිශීලනයේ දී පෙනී යයි. උක්ත භාෂාව තුළ අක්ෂර බෙදියන පිළිවෙත් අනුව කොටස් හඳුනාගත හැකිය.

1. ලඝු අක්ෂර ( කෙමි අකුරු)

2. ගුරු අක්ෂර ( ඇදෙන අකුරු)

3. ප්ලුත අක්ෂර ( - )

4. හලන්ත අක්ෂර ( - ) යනු එම වර්ග අක්ෂරයන් වෙයි.

ඒ ඒ කරුණු වෙන වෙනම නිදසුන් ලෙස ගෙන බැලූ කළ මෙසේ කාණ්ඩගත කළ හැකිය.



ජනමාධ්‍යවේදය

| ලඝු | ගුරු | ප්ලුත | හලන්ත |
|---|---|---|---|
| ත ක , පි තො , රෙ කි යනුවෙන් කෙමි ශබ්ද අග්‍රයෙන් උසුරනු ලබන අක්ෂර | ද්‍රෙං , ප්‍රිං, න්‍රං ට්‍රිං , රෙග්‍ර ත්‍රන, කිට්‍ර | ද්‍රෝං, ප්‍රීං,රූං තභ්‍රර්, ක්‍රිස් | රත්‍ර්, පිත්‍ර් ජෙන්‍ර්, ද්‍රෙහොර්ලත්, කිත්තත්, ජෙප්‍ර් |

ඝන පිහිටවනු වස් ගුරු අක්ෂර මෙන් ම ලඝු අක්ෂරයෝ වෙසෙසින් භාවිත කෙරෙත්. ඒ මතු ද නොව සිදත් ස-රාව දක්වන ඝන අක්ෂර සුභ හා අසුභ වශයෙන් ප්‍රභේදද්වයකට වෙන් කොට දක්වත්.

1. අපායාක්ෂර ( එ, ක, ය, ම,ර, ජ, අ, ණ, න, ල, අං)
2. මනුෂ්‍යාක්ෂර (උ, ප, බ, ග, හ)

එපමණක් ද නොව ඉතිරි අක්ෂරයෝ සියල්ලක් ම දිව්‍යාකාෂර වශයෙන් හඳුන්වයි.[10] උක්ත මනුෂ්‍යාක්ෂර හා දිව්‍යාක්ෂර වූ කලී ග්‍රන්ථ සම්පාදනයේ දී සෙත් කවි වැනි කාව්‍ය නිෂ්පත්තිය ආදි වශයෙන් පිළිමනිනු ලබන සකලවිධ සුභ කටයුතු සඳහා විෂය කොට ගනිත්. සිදත් ස-රාව මෙය දක්වන්නේ ,

“ එක යම රජ අණ හළ අං අවාකර
උපබග හා නර නම් තිරි වේ අමර...........”[11]

වශයෙනි. ඒ මතු ද නොව අෂ්ටඝණ සහ එහි ඵල හොරාභරණයෙ හි භූමි, දේව, ගිණි, වායු , ජල , සූර්ය, අකාස, චන්ද්‍ර ලෙස දක්වත්. එසේ ම ඒවායෙහි අනුපිළිවෙලින් සිරි සැප, දිර්ඝා, මරණ, විදේසයාම, දිර්ඝා ධෛය්‍යීවන්ත, ලෙඩරෝග, විනාශ ,කීර්ති, අෂ්ට ඵල ද දක්වත්.[12]

**අෂ්ට ගණ බෙදීම**

| සුභ ගණ | | | | අසුභ ගණ | | | |
|---|---|---|---|---|---|---|---|
| අක්ෂර | සංඥ්මේත | ගණමුල | විපාක | අක්ෂ | සංඥ්මේත | ගණමුල | විපාක |
| ම | U U U | භූමි | සිරිසැප | ජ | - U | සූර්ය | ලෙඩරෝග |
| න | - - - | දේව | දිඝීයුෂ | ර | U - U | වන්න | මරණභ |
| භ | U - - | චන්ද්‍ර | කිර්තිය | ස | - - U | වාය | විදේසයාම |
| ය | - U U | වාරි | ධෛයයවන්ත | ත | U U - | ආකාස | විනාශ |

ඉහත දක්වනුයේ අෂ්ට ගණය සම්බන්ධ අන්තර්ගතයෙහි දළ සැකිල්ලකි. ලාංකිය සාහිත්‍ය ඉතිහාසය තුළ සංදේශ කාව්‍ය ප්‍රධාන විවිධ කාල යුගයන්ට අයත් සේ සැලකෙන බොහෝ ගද්‍ය මෙන් ම පද්‍ය කෘතීන් හි ප්‍රවිශ්ඨය වු කලි සුභ ගණ හෝ අසුභ ගණ සේ සැලකේ. ගුත්තිල කාව්‍ය ගත්කළ එහි එන “ සියපින් සිරින් සරු ” යන්නෙ හි “ සි ය පින් ” වශයෙන් ලඝු දෙකක් හා එක් ගුරු අක්ෂරයක් පාදකකොට ගෙන කාව්‍යකරණය සිදු කොට ඇත.[13] ලඝු දෙකක් හා ගුරු එකක් යනු මෙහි වායු ගණයෙන් ආරම්භ කොට ඇත. ඒ නයින් සැලකන කළ එහි අදෘෂ්‍ය පදගතාර්ථය විදේස් යාම වේ. ඉන් අර්ථකථනය කෙරෙනුයේ විරස්ථිතික වාසස්ථානය හැරයාමකි. එසේ වුව හංසය වැනි සංදේශ කාව්‍ය පිරික්සු කළ “ සැරද හසරද සඳ ”[14] යන්නෙහි “ සැරද ” යනු ලඝු තුනක එකතුවකි. එනම් දේව ගණය වෙත්. දිඝීයුෂ ලැබීමට ප්‍රාර්ථනාත්මක ප්‍රවේශයක් මෙන්ම විශ්වාසයකි. ලාංකීය සමාජය තුළ සිංහල නර්තන උපසංස්කෘතියෙහි තූර්ය භාෂා ප්‍රවර්ධනයේ දී ද මෙවැනිම වු පද සංඝටකයන් රාශියක් මූලික නාම මාත්‍ර ඔස්සේ අප හොවා දක්වා ඇත. ඒ තුළ ලංකාවේ මෙන් ම ලෝකය තුළ ද සුපුරුදු හඳුනාගැනීමේ “ පද ” විශේෂය මංගල බෙර වාදනය මගුල් බෙර වශයෙන් හඳුන්වති. එහි භාවිතය වූකලි සුභ අවස්ථාවන් මූර්තිමත් කරනු වස් වේ. නිදසුන් ලෙස එහි ආරම්භය සුභ ගණ යෝග අනුව අෂ්ඨගණයෙහි පිහිටුවා සලකා බැලිය යුතුය.





ආරම්භක පදය හෙවත් “ දේව පදය ”

තුං ජිං තුං / ජිං ත ක / ජිං ග ත / කු ද ග / ජිං ත රි / කි ට ක / ද ග ත / ග ත

භූමි ගණය සිරිසැපදේ | චන්ද්‍රගණය කිර්තිය ලැබේ | චන්ද්‍රගණය කිර්තිය ලැබේ | දේවගණය දිර්ඝායුෂ | චන්ද්‍රගණය | දේවගණය

කු කු / ද කු ද / ග ජිං ත / ක ජිං ග / ත කුං ජිං / ග ත කුං / ත කුං

ත ත් / ජිං තකුං / තකුං ජිං / ජිං ගජ්ජිං /

ආදි වශයෙන් මුලින් යෙදෙන ම, න, භ, ය, යන සුභ ගණ සතරෙහි සංයෝගාත්මක වීමෙන් මංගල බෙර වාදනය පූර්වාරම්භයේහි ම සුභ කටයුතු සඳහාම පමණක් භාවිතා කරත්. බුද්ධ, ධම්ම, සංඝ යන රත්නත්‍රය විෂයෙහිත් දේව යක්ෂාදීන් යන අදෘෂ්‍ය කොටස් වෙනුවෙන් කෙරෙන සුභ කටයුතු සඳහා මංගල බෙර යොදා ගනිත්.

“ විණ පද ”[15] වැයීම කෙනෙකුගේ වාදන කෞශල්‍යය දුබල කිරීම් වස් භාවිතයට ගැනෙන්නක් ලෙස තත් වාදන ඇඳුරෝ හුවා දක්වත්. එහි භාවිත අක්ෂර සහ පද බෙදීම් ජ, ර, ස, ත, යන සිව් විණාක්ෂර සංයෝගය මත පිහිටා ඇති බව කරුණු හෙළිවේ. සබරගමු නර්තන සාම්ප්‍රදයේ පංච අක්ෂර යොදගත් විණ පදයක් වේ.

අයනු අහත අහලුම්
ඉයනු ඉහිත ඉහිලුම්
උයනු උහිත උහුලුම්
එයනු එහිත එහෙලුම්
ඔයනු ඔහිත ඔහොලුම්

“අයනු, ඉයනු, උයනු, එයනු, ඔයනු කවට නොමිත බක්කේ වාජ්‍යං ගබ: ”[16]

එසේම ලංකාවේ යක්දෙස්සන් අතර යන්ත්‍රමන්ත්‍ර ආදිය භාවිත කිරිම ද පුරාණයේ සුලභ කරුණක් වුව ද අද්‍යතනයේ එසේ ඒවා භාවිත කරන්නවුන් අහඹු ලෙස දැකිය හැකිය. වාදන ශිල්පීන් අතුරෙහි වුව ප්‍රතිවාදියා මෙල්ල කරනු වස්

“ තිබ්බටු ” ගෙඩියකට මන්ත්‍රයක් මතුරා යටකී තූර්යය භාෂාවේ වාදන අසුභ විණ අක්ෂරයකට අල්ලා හැපීම තුළින් ඔහුගේ බෙරය පැලීමට තරම් සමත්වන බවට කරුණු දක්වයි.[17] යටකී අදෘශ්‍යමය තත්වයන් විදහා දක්වමින් ඉතා උපක්‍රමශීලිව තම විෂය ක්ෂේත්‍රය තුළ ඇති පෘථුල බව සහ ගූඪ බව දැක්වීමට පැරණි වාදන ශිල්පියා උත්සාහ දරා ඇති බව පෙනෙන කරුණකි.

## සාම්ප්‍රදායික සන්නිවේදනය සහ සන්නිපාත භේරී

සන්නිවේදනය යනු යමක් දැන්වීම, හැ-වීම උදෙසා පිළිමනිනු ලබන ක්‍රමෝපාය යැයි පදගතාර්ථ විග්‍රහ කිරීම සාමාන්‍ය තත්ත්වයයි. ජන සමාජයේ පෞද්ගලික වශයෙන් මෙන්ම ආයතනික වශයෙන්ද අදහස් උදහස්, ආරංචි, ප්‍රවෘත්ති හුවමාරු කර ගැනීමේ කාර්යය හා බැඳුණු ක්‍රියාවලිය[18] ප්‍රවෘත්ති හුවමාරුව[19] සන්නිවේදනය ලෙස ශබ්ද කෝෂ කරු පදගතාර්ථ විග්‍රහයක යෙදේ. සන්නිවේදනය යනු බෙර, දවුල්, තම්මැට්ටම්, උඩැක්කි, මෙන්ම ඝණ, සුසිර ආදි වූ නානාවිධ තූර්ය භාණ්ඩ මෙහෙයවා කරණු ලබන දැනුම් දීම් වේ. තත් සමස්ත තූර්ය සන්නිවේදනය, සාම්ප්‍රදායික සන්නිවේදනයේ ප්‍රධාන වූ ප්‍රවාහයක් ලෙස හැඳින්වීම යුක්ති යුක්ත වේ. ගිනි ගැසීම, හූ කීම, ලී කොට එකට හැප්පීම, අත්පුඩි තැලීම වැනි මුල් යුගයේ ක්‍රියාකාරකම් මෙන්ම ගිරා, නීලකොබෝ, ඇම් කුකුලු, හංස, සැළලිහිණි ආදි පක්ෂීන් මෙන්ම තුරඟුන් වැනි සතුන් ද ආධාරයෙන් මෙකී සන්නිවේදන කාර්යය පහසු කරවීය. ආදි මිනිසා සතුන් දඩයම් කර ගැනීමට පහසු කරවනු වස් දඩයමට උචිත සත්වයාගේ හඬ මෙන් හඬ පිට කිරීමෙන් සතුන් නොම- යවා සිය දඩයම හේ ග්‍රහණයට නතු කර ගැනීමේ ක්‍රම පිළිවෙතක් විය. මෙය අනුකරණාත්මක සන්නිවේදනයෙහි මූලික අවස්ථාව ලෙස හැඳින්වීම ඉතා යෝග්‍යය වේ. එපමණක් ද නොව සතෙකු දඩයම් කළ පසුද එම සතා පිළිස්සෙන විට, දඩයම් කළ ආකාරය දක්වමින් අනුකරණාත්මක රංගනයන් හි යෙදීම, ගස් බෙනවලට තබා සම් කැබලි වලට ගැසීම හා ශරීරයට ගසා ගැනීමෙන් විවිධ ශබ්ද නිකුත් කිරීම උක්ත තූර්යය සාම්ප්‍රදායික සන්නිවේදනයේ මූලික අවස්ථාව ලෙස පෙනී යන ආකාරයකි. දරු නැළවිලි ගීතයන් බිළින්දාට නින්දට ඇරයුම් කරන මව[20] සවන්දීමේ හුරුව ලබා දෙන්නා සේම ඒ තුළින් බිළිදා මානසික සුසංයමයකට ද පත්වේ. ඇත් ගොව්වන්ගේ වස්දඬුරාවය ඇතා මෙල්ල වීමට සන්නිවේදනය කරන්නා සේම වැද්දාගේ මිණි හඬට අවනත වීමෙන් මරණය කරා මුවාද ළං වෙත්.[21] මේ නයින්ම කන පිනවීම උදෙසා මෙන්ම දැනුම් දීම උදෙසා ද වාදනය යොදාගත් බවට සාක්ෂ්‍ය එමටය.





“ ඒ ඒ තන්හි සියළු තූර්යයෙන්ද, නොයෙක් පරිද්දෙන් පූජා පවත්වා සියල්ලෝ පෙහෙවස් අගයන් ඉටාගෙන ධම්මපද අසත්වා එදවස්හි ද නොයෙක් පූජා විශේෂයන් කෙරෙත් වා ” යි පුරයෙහි **බෙර** හැසිරවූයේය.[22] මහාවංශය දක්වන මෙවැනි පාඨ සන්නිපාත භේරී යන්නට ඉතාමත් උචිත වූ නිදසුන් වෙත්. සන්නිපාත භේරී යනු “ සමූහයකට රැස්වීම සඳහා වයන බෙරය, රැස්වන්නැයි අඬගසා වැයෙන බෙරය ”[23] යනුවෙන් ශබ්ද කෝෂය පදගතාර්ථ ගෙනහැර දක්වයි.

“ නොමහත් කොට සුවාසු දහසක් පූජාය, නා නා විධ වූ නැට්ටුවන් විසින් කරවණ ලද නැටුම් හා නා නා ප්‍රකාර පංචාංගික තූර්යයනාදය ; යන පූජා වලිය ශ්‍රධාවෙන් මෙහෙයන ලද රජ තෙමේ මහ සෑයෙහි පැවැත් වී, දවස තුන් යලක් බුඩොපස්ථානයට ආයේය. ඒ තෙමේම නියත කොට දෙවරක් මල් පූජායෙහි බෙර ඇසිරවීය.[24]

අනුරාධපුර මහා සෑයට පුජෝපහාර දැක්වූ අවස්ථාවන් හි නා නා විධ පංචතූර්යයන් හැසිරවූ බව මහාවංශය සඳහන් කරන අතර **දළදා සිරිත** වැනි කෘතියක විවිධ අවස්ථාවන් හි භාවිත කළ තූර්යය භාණ්ඩ පිළිබඳව ද කරුණු දක්වයි.

“ සක්පකද්ව, වඩ්ඩාරු, දළහං, මද්දල, මහුමකුඩම, පණාබෙර, මිහි-ෘබෙර, ඩමරු ඩැක්කි, උඩැක්කි, තලප්පර, වීරන්දම්, වීරමොරසු, කංසුතාලම්, සින්නම්, තම්මැට්ට, නිසාන, තිඹුලිවු, රොදුබෙර, බොම්බිලි, මාබෙර, ගැටපහටු, එකැස්බෙර, රන්රිදි දහර, කාහළ, කාළම්, සිරිවිළි, තන්තිරිපට, විජයෙධවනී, ගවරහං, වංගී,වස්දඬු, වස්කුලල්, තන්තිරි, දණ්ඩ, වැදවෙසෙස්, සතිස්රා ”[25] වශයෙන් පංච තූර්යය භාණ්ඩ නාමාවලින් දක්වා ඇත. සන්නිපාත භේරී උදෙසා අවනද්ධ භාණ්ඩ රාශියක් භාවිත කොට ඇති බව කරුණු සනාථ වේ. එපමණක් ද නොව කරුණාරත්න බණ්ඩාර මහතා පවසන්නේ ලෝකයේ විවිධ ප්‍රාථමික ගෝත්‍රික සමාජ වල සන්නිවේදනය උදෙසා බෙර භාවිතා කළ බවයි.[26]

සාම්ප්‍රදායික සන්නිවේදනය විෂයෙහි ලා සලකනු ලබන විශේෂ අවස්ථා ගම්‍යමාන කිරීම ඉතා වැදගති. වෙසෙසින් එහි දෘෂ්‍ය තත්ත්වයන් පසක් කිරීම කාලෝචිතය. එය සිව් වැදෑරුම් වේ.

1) අණ බෙර ලවා කළ සන්නිවේදනය
2) වද බෙර ලවා කළ සන්නිවේදනය
3) මළ බෙර ලවා කළ සන්නිවේදනය
4) රණ බෙර ලවා කළ සන්නිවේදනය
5) පූජා බෙර ලවා කළ සන්නිවේදනය

## අණ බෙර ලවා කළ සන්නිවේදනය

ප්‍රාග් බෞද්ධ යුගයේ සිටම කුමන හෝ රාජ්‍යයික පණිවුඩ හුවමාරුවක් දැනුම් දීමක් කරන ලද්දේ අණ බෙර මඟිනි. “ මා හැර අනෙක් එළාර රජු නොමරව ” බෙර හසුරුවා[27] .........

“ නුවර අණ බෙර ලවා හාත්පස යොදුනෙක මිනිසුන් රැස්කරවා එළාර රජ හට සත්කාර කරවිය ”[28] ..........

ඓතිහාසික වශයෙන් තත් මූලාශ්‍ර රාශියක් මඟින් කරුණු හෙළිදරව් වේ. පසුකාලය දක්වා විහිදී ආ අණ බෙර වාදනය ජෙංත / ජෙං ජෙං / ජෙං ජෙං / ජෙං ජෙං / ජෙං - [29] / වැනි පද කොටස් සඳහා භාවිතා කළ බව පෙනේ. 19 වන සියවසේ පළමු දශක කිහිපය දක්වාම මෙම අණ බෙර සන්නිවේදන ක්‍රමවේදය පවත්වාගෙන ආ බවට තොරතුරු ඇත. මෙය ක්‍රමයෙන් ලාංකීය ජන ප්‍රවාහයෙන් දුරස්ථ බවට පත්වීමට පෙළඹවූයේ 1800 පමණ දේශීය මුද්‍රණ ශිල්පය දියුණු වීම හේතු කොටගෙන ය.[30] සාම්ප්‍රදායික සන්නිවේදනය අභිබවා විද්‍යුත් සන්නිවේදනය හඳුන්වාදීම ය.

## වද බෙර ලවා කළ සන්නිවේදනය

“ දහස් ගණන් ගස්වමින් මෙසේ විචිත්‍ර වධ කෙරෙමින් **වද බෙර ගස්වා** ගෙන හුලක් සැස කර තබා ආඝාතන භූමිය බලා නික්මුණාහ. ”[31]

රාජ උදහසට ලක්වූ යම් අයෙක් වෙත් නම් හේ උල තබා ජීවිතක්ෂයට පමුණුවාලිය. හිස ගැසීම, සිව් මංසලක සිටුවා පස්ගසා ගල් මුල් ප්‍රහාර එල්ල කෙරිණ. සියලු වද බන්ධන පමුණුවා ලීමට පූර්වාංගය ලෙස **වද බෙර ලවමින්** ප්‍රසිද්ධ ස්ථානයන්හි මෙන්ම විථි ඔස්සේ පෙරහරින් ගෙනයාම





සිරිත විය. එසේ කරනුයේ රට වැසියන්ගේ දැනගැනීම උදෙසාය. ජනයා වද බෙර හඬ ඇසීමෙන් පසක් කර ගනුයේ වරදකරුවෙකුට දඬුවම් පැමිණවීමේ අවස්ථාවක් බවයි. මෙහි ප්‍රතිඵලය වරද පිළිබඳ සහ දඬුවම් පිළිබඳ සමාජ සන්නිවේදනයක් ගොඩ න-මින් සමාජ පාලනයක් (Social Control) නිර්මාණය කිරීමයි.

## මළ බෙර ලවා කළ සන්නිවේදනය

ශ්‍රී ලංකාවේ ප්‍රභූන් මරණයට පත්වූ ක්ෂණයෙන් එම ස්ථානයේ මළ බෙර වාදනය කිරීම සිරිතයි. එසේම ආදාහනයට රැගෙන යන පෙරහරේ මළ බෙර වාදනය කිරීම ලංකාවේ පුරාණයේ සිටම පැවත එන චාරිත්‍රයකි.

ජෙං
ජෙං ජෙං
ජෙං .....

තක්කඩ තරිකිට කුකු තකු “ යන පද කොටස් ඉතා විලම්භ ලය මානයෙන් යුතුව වාදනය කරන අතරතුර හොරණෑ ද ඉතාමත් ශෝකාකුල අන්දමින් වාදනය කෙරෙත්. මෙහිදී ඉපැරණි ලංකා වාසීන් භාවිතා කරන ලද්දේ “ යශෝදරා වත ” වැනි කාව්‍යකරණයේ සුවිශේෂ පද්‍ය ගායනයන් හි නාද මාලාවකි. උක්ත වාදන ශෛලිය මිනිසුන්ට කොතෙක් සමීපද යත් ඒ සඳහා ග්‍රාම්‍ය ජන ශ්‍රැතියේ “ යං කනත්තට මළකඳ අරගෙන ” වැනි පද කණ්ඩයන් වාදනය වන්නේ යැයි වහරත්.

ජෙං කි / තක් කිට / රජ් ජෙං / කුද කඩ /[33]

අද්‍යතනයේ තම්මැට්ටම දවුල හා සම්බන්ධව හොරණෑව භාවිතා කළද දුරාතීතයේ “ පටාව ” නම් බෙරයක් මළ බෙරය වාදනය සඳහා යොදාගත් බවට සාක්ෂි ලැබේ.

## රණ බෙර ලවා කළ සන්නිවේදනය

රණ බෙර යනු යුධමය හෝ රාජ්‍ය බල වික්‍රමය හුවා දක්වනු වස් භාවිතා කළ වාදන වෙසෙසකි. යම් හමුදාවක් යුධ භටයෙකුගේ ආත්ම ශක්තිය මෙන්ම

යුධ මානසික තත්ත්වයන් වර්ධනාවස්ථාවට තිව්‍ර කිරීම උදෙසා භාවිත යොදා ගනී.

" වීර මොරසු " යනු බෙර වර්ගය රණ බෙර හෝ යුධ බෙර සඳහා භාවිතා කරන ලද්දකි. මෙහි මොරසු - මොරහු යන තම්මැට්ටම බවද දළදා සිරිතේ පවසයි.[34]

" තිඹිලිවි " " නිසාන " යනු ද යුධ බෙර වෙසෙසකි.[35]

උක්ත භාණ්ඩ යුධ බෙර සහ රණ බෙර වශයෙන් භාවිතා කළ බව මහාවංශය, ථූපවංශය වැනි මූලාශ්‍ර කරුණු හෙළි පෙහෙළි කරයි. රණ බෙර හෝ යුධ බෙර වාදනයෙන් සන්නිවේදනය කරනුයේ රටවැසියන් රාජ්‍යයික කටයුතු උදෙසා සුවිශේෂී අවධානය මෙන්ම ඔවුන්ගේ ආත්ම ශක්තිය වර්ධනය කිරීමක් වේ. මහාචාර්ය විහෙල්ම් ගයිගර් දක්වන ආකාරයට යුධ බෙරය හඳුන්වනුයේ " භේරී " හෝ " රණ භේරී " වශයෙන් වෙයි. සංස්කෘත භාෂාවෙන් " ජය භේරී " යනු ජය බෙරය බවයි. ඔහු පවසන්නේ වැයිම, කාහල පිඹීම සාමකාමී යුගයකදී ද සිදුවූයේ බවත්, මහජනයා වෙත දන්වන සියලුම නිවේදන " අණ බෙරයක් " ගසා දැනුම් දෙන ලද බවත් වේ.[36] එසේවුව " රණ බෙර " වැයිම අද්‍යතනයේ වුව සිදුවූයේ සේනාංකයක් හැසිරවීමේදී හෝ ක්‍රියාත්මක කරවීමේදී පමණකි. ඒ බව ජනතාවට දන්වනුයේ රණ බෙර වැයීමෙනි.

## පූජා බෙර ලවා කළ සන්නිවේදනය

දෘෂ්‍යමානයේ මෙන්ම අදෘෂ්‍යමානයේ ආගමික හා ආගමික නොවන සියලු තන්හි වතාවත් උදෙසා පූජා බෙර වාදනය කරයි. බෞද්ධ දර්ශනයේ වූ පිරිතේ දී වාදනය කරනු ලබන ජාම හේවිසි වාදනය අදෘෂ්‍ය තත්ත්වයන් විෂද කරන සන්නිවේදන අවස්ථාවකි. තම්මැට්ටම, දවුල, හොරණෑව සහ ගැට බෙරය හෝ පහත රට බෙරය වයනු ලබන්නේ බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධ රත්නය සඳහා වේ. පසුව දෙවියන්ට සහ අවශේෂ ග්‍රහ යක්ෂයනට තෙවනුව ද වාදනය කළ යුතු බව සිරි අහුගොඩ මහතා පවසයි.ඒවා,

1. මංගල් බෙර
2. පූජා පද
3. කෙම්මුර පද





වශයෙන් වෙන් කොට වාදනය කළ යුතු බවයි.[37] මෙයින් පසක්වන එක් කරුණක් නම් දෘෂ්‍ය නොවන බලවේග වෙනුවෙන් ආරාධනා කරනු වස් තූර්යය භාණ්ඩ අතීතයේ මෙන්ම අද්‍යතනයේද යොදා ගන්නා බවයි. අද්‍යතනයේ මෙම අවස්ථාව මංගල බෙර වාදනය පමණක් ම යොදාගන්නා අවස්ථා බහුල වී ඇත. මෙම අවස්ථාව සිංහල බෙර වාදන කලාවේ " සමූහ බෙර වාදන " (Symphony) ආරම්භක විකාශන අවධිය බව පියසාර ශිල්පාධිපති පවසයි.[38] " කුරප්පට්ටුව "[39] " පුරප්පට්ටුව "[40] වශයෙන් හඳුන්වන පද විශේෂය පිරිත් දේශනයක් සඳහා මහා සංඝ රත්නය වැඩම වීමට පූර්ව අවස්ථාව සඳහා කරනු ලබන දැනුම්දීමක් වශයෙන් හැඳින්වේ.

" ජෙග තරිකට ජෙං කිතක්ක //
ජෙග තරිකිට ජෙග තරිකිට ජෙග තරිකිට ජෙං කිතක්ක
ජෙං ජෙං කිතක්ක
තකුද ගත්ත ජෙංකිට කුදකිට......."

ආදි වශයෙන් මෙම පද කොටස වාදනය කරනුයේ එක් පට, දෙපට, තුන් පට ආදි වූ විවරදරා පිරිත සඳහා සූදානම් වීම උදෙසාය. මෙය ගැමියන්

මහ පිරිතට දැන් වඩින්න //

දැං දැං වඩින්න ......... වශයෙන් සන්නිවේදන හඬ, වහරනු ලබන බසට පෙරළාගෙන සිමිත්. එපමණක් ද නොව පන්සල් ආශ්‍රිත, පොහොය දින, පිංකම් දින පුණ්‍ය කර්ම අවස්ථාවන් ජනතාවට දැනුම් දෙන්නේ කුරප්පට්ටුවෙන් හෝ පෙහොය හේවිසියක් මගිනි. මහජනතාව ඒකාරාශි කිරීම සඳහා මෙවැනි තූර්යාංග භාවිතා කරයි.

" ජෙං ජෙංත කුද ජෙංත ජෙංත කුද[41]

තකට තකට තකු ජෙං " වැනි හේවිසි වාදනයේ " වඩම්මවන " පද වාදනයෙන් ජනයා දනට සංඝයා වැඩම කරන බවට ඉඳුරාම දැනගනී. දෙවියන් විෂයෙහිලා " තේවා පද " වශයෙන් උපහාර සඳහා යොදා ගෙන ඇත.

" ජෙං කි / ටක් කිට / රජ් ජෙං / කුද කිට / "[42]

උක්ත පද බාණ්ඩයන් ශ්‍රවණය වීමෙන් අසල්වාසී දේවාලෙහි තේවා හෝ මුරුතැන් මංගල්‍යය හෝ මඩු තෝත්‍ර සිදුවන බව පසක්කොට ගනිත්, එසේ ම අලුයම් දුරය, මැදියම් දුරය, හැන්දෑ දුරය මෙහි දී පූජා පවත්වන අවස්ථාවන් පිළිබඳ ව ගැමියාට දැනුම් දෙයි.[43] මේ වූ කලී සන්නිවේදනයේ ප්‍රාථමික අවස්ථාවන් ලෙස හුවා දැක්වීම වඩාත් උචිතය.

මෙපණක් ද නොව ග්‍රාම්‍ය තූර්ය සන්නිවේදනය වසරක් පාසා එළඹෙන සිංහල අලුත් අවුරුදු චාරිත්‍ර වාරිත්‍ර උදෙසා ද භාවිතා කරන්නට යෙදිණි. " අවුරුද්දක් කිට්ටු කිට්ටු එරබදු මල් පොට්ටු පොට්ටු " වැනි බංකු රබන් පද සිංහල අලුත් අවුරුද්ද එළඹි බව පසක් කිරීමට තරම් මහෝපකාරී වී ඇත. ජන ජීවිතයේ අනේක විධ සිදුවීම් අලලා නිර්මාණය වී ඇති රබන් පද උක්ත ජන ක්‍රියාකාරකම් ඒකරාශි වන අලුත් අවුරුදු දින සිහිපත් කිරීමට ගම්මුන් අමතක නොකරති. ජන ජීවිතයේ දුප්පත්කම්, අ-හිගකම් මැද පැමිණි දුක් පැණිරසය ලෙස සිතා එම තත්වයන්, ආත්ම සංතෘෂ්මිය පිණිස සෞන්දර්යාත්මක ආකල්ප වර්ධනීය තත්ත්වයකට පත් කිරීමට උත්සාහ දරා ඇත. ඒවා,

කැකුණ මොටද පොල් නැති කොට
කැකුණ පොත්ත ගං සුරතට
කැකුණ විකුණා කා
දොද් දොං තරිකිට කැකුණ විකුණා කා [44]

වැනි රබන් පද අධාරයෙන් විදහාපා යි. තත් රබන් පද රාශියක් සිංහල ජනශ්‍රැතිය තුළ අන්තර්ගත බව පෙනෙන කරුණකි. ඈත පිම්සර ගමක රිලවකු නටවනු බව පසක් කර ගනුයේ අහිකුණ්ඨිකයා අතැති කුඩා බෙරය හැඬවීම තුළිනි.

රූපවාහිනිය, ගුවන්විදුලිය, දුරකථනය, සෙලියුලරය, වැනි සන්නිවේදනය තාක්ෂණයේ ආරම්භයට පෙර සාම්ප්‍රදායික සන්නිවේදනය ලෙස පැවති තත් තූර්ය කාර්යාවලිය මහත් මෙහෙයක් ඉටු කරන ලද බව සැලකුව මනාය. උක්ත සියලු සාම්ප්‍රදායික හෝ අද්‍යතන විද්‍යුත් සන්නිවේදනය භාෂණය පදනම් වී ඇති බව විද්වත් මතය වී ඇත.[45] ඒ නයින්ම තූර්ය භාෂණය තුළ ප්‍රබල ප්‍රවනතාවයක් මත සන්නිවේදන ක්‍රියාවලිය පැවත ආ බව පෙනෙන කරුණකි ඒ වූ කලී තූර්ය භාෂණ ශබ්ද ශෛලිය ප්‍රකාශනයකි. අප්‍රිකානු ප්‍රාථමික ගෝත්‍රයන්හි පණිවුඩ යැවීම උදෙසා කථා කරන බෙර (Talking Drums) නම් බෙර විශේෂය





විද්වතුනගේ භාෂණයට ඉතා යෝග්‍ය නිදසුනකි.[46]

තත් සම්ප්‍රදායික තූර්යාංග මෙන්ම එහි භාෂණය, නූතන සන්නිවේදන මාධ්‍ය ජාලයන් ඔස්සේ ද අනේක විධ වාණිජමය ආයතන තුළ වෙළඳ ප්‍රචාරණය උදෙසා ද ප්‍රබල පවුරක් ලෙස භාවිතා කිරීම පෙනෙන්නට ඇති තත්ත්වයකි. උදාහරණ ලෙස ගත හොත් රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන ආයතනයන්හි ද වාදන අංග මෙන්ම තූර්ය සංකල්පිය භාණ්ඩ ආකෘතින් ද යොදා ගනිමින් තම අරමුණු සාක්ෂාත් කර ගනු සඳහා ක්‍රියත්මක වී ඇත. ඇතැම් විද්වතුන් පවසන්නේ කිසියම් සමාජයකට නව භාණ්ඩයක්, නව මතයක් හඳුන්වා දෙන විට එම සමාජයේ සංස්කෘතික හා සමාජ සම්බන්ධතා ජාලය මෙන්ම පුද්ගල ක්‍රියා සංජානන ක්‍රියාවලියටත් බලපෑම් එල්ල විය හැකි යන්නයි.[47] ඒ නයින්ම සාම්ප්‍රදායානුගත මෙවලම් මෙන්ම ක්‍රියාකාරමකම් හා අංග ප්‍රත්‍යාංග එකී හඳුන්වා දීමේ ක්‍රියාවලියට නතු වීමේදී පැහැදිලි සමාජ විපර්යාසයක් සිදුවනු නොඅනුමානය. අධ්‍යාත්මික සංවර්ධනයකට මෙන්ම අනන්‍යතාවයකට මාධ්‍ය ක්ෂේත්‍රය පෙරළීමට නම් කුමන හෝ රාජ්‍යයක මැදිහත්වීම සහ රටක හෘදය වස්තුව වන එහි අනන්‍ය සංස්කෘතිකාංග භාවිතයට ගැනීම බව සක්සුදක් සේ පසක් වන කරුණකි. ලාංකේය ජනශ්‍රැතිය තුළ තූර්යාංග සහ එහි භාෂණය ජාතික වශයෙන් මෙන්ම ජාත්‍යන්තර වශයෙන් භාවිතා වන්නක් බව නොරහසකි. එවැනි තත්ත්වයක් යටතේ උක්ත විෂය ක්ෂේත්‍රය පරිහානික ප්‍රවේශයන් කරා නොව එය සංරක්ෂිත පිළිවෙත් කෙරෙහි හුදි ජන පහන් ආකර්ෂණීය ප්‍රවේශයන් කරා යොමුවීම බෙහෙවින්ම කාලෝචිතය.

## මූලාශ්‍ර


1. *විජේතුංග, හරිස්චන්ද්‍ර , 1984, ප්‍රායෝගික සිංහල ශබ්ද කෝෂය, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යංශය, පළමුවැනි කාණ්ඩය, 824 පිටුව;*

2. *දිසානායක, මුදියන්සේ, 2001, නර්තන වාක් කෝෂය, ප්‍රථම මුද්‍රණය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 565 පිටුව;*

3. *බුද්ධදාස, ආර්., 1962, සුශ්‍රැත සංහිතා, ලංකාණ්ඩුවේ මුද්‍රණාලය, ප්‍රථම මුද්‍රණය, 2 පිටුව;*

4. *-------- එම -------- 1962, 2 පිටුව;*

5. සිරි අහුගොඩ මහතා සම- 2001 ජනවාරි 15 දින සම්මුඛ සාකච්ඡාව;

6. විජේවර්ධන, සරත්, 1994, සිංහල තිත් තාල ක්‍රමය, ප්‍රථම මුද්‍රණය, සංස්කෘතික දෙපාර්තමේනුතුව, 1 පිටුව;

7. පිය ජය විතාන මහතා සම- 2003 .12. 16 දින සම්මුඛ සාකච්ජාව ;

8. බෙරන්නාවේ, ඩී., එච්., පොඩිඅප්පුහාමි මහතා සතු තත්කාල නිමිති නම් අත්පිටපතෙන් උපුටා ගන්නා ලදි;

9. බණ්ඩාර, කරුණාරත්න, 2002, සාම්ප්‍රදායික බෙර වාදනයේ සන්නිවේදන හා භාෂාමය ලක්ෂණ පිළිබඳ විමසුමක්, ලලිතකලා සාර සංග්‍රහය - 2, මුදියන්සේ දිසානායක ( සංස්කාරක ), විශ්වවිද්‍යාලයිය ලලිතකලා අධ්‍යාපනඥයින්ගේ සංගමය, 218 පිටුව;

10. කුමාරතුංග මුනිදාස, සිදත් ස-රා විවරණය, කේ. ඒ. ආරියදාස සහ සමාගම, 36 පිටුව;

11. -------- එම ------- 36 පිටුව;

12. අප්පුහාමි, ඇම්., ඇම්., පි., විජයරත්න, 1932, හොරාබරණය, සෙවශ්‍රී යන්ත්‍රාලය, දෙවන මුද්‍රණය, 8 පිටුව;

13. බටුවන්තුඩාවේ, රොබර්ම්, ගුත්තිල කාව්‍ය , සිමාසහිත රත්නාකාර යන්ත්‍රාලය, 1 පිටුව;

14. ජයතිලක, කේ., 1998, විමර්ශන සහිත තිසර සන්දේශය, දෙවැනි මුද්‍රණය, ප්‍රදිප ප්‍රකාශකයෝ, 45 පිටුව;

15. " විණා පද " යනු කුමන සම්ප්‍රදායික බෙර වාදනයේ දි තමා හැර අන් කවර වාදකයෙකු ඉස්මතුව එනු දැනුනු විට තම ප්‍රතිවාදියා මෙල්ල කරගැනිමට හෝ ඔහුගේ බෙරය බිදිමට පද වෙසෙසක් ලෙස ශාන්තිකර්ම ඇදුරෝ සලකන්නකි;

16. යමියන්තොට සිරිසේන මහතා සතු අභින පද සහ විණා පද අඩංගු අත්පිටපතකිනි;

17. බෙරන්නාව, ඞී., එච්., පොඩි අප්පුහාමි මහතා සම- 2003.04.08 දින සම්මුඛ සාකච්ජාව;





18. විජේතුංග, හරිස්චන්ද්‍ර, 1984, ප්‍රායෝගික සිංහල ශබ්ද කෝෂය, දෙවැනි කාණ්ඩය, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය , 1683 පිටුව;

19. -------- එම -------- 1984, 1683 පිටුව;

20. සේදරමන්, ජේ. ඊ., 1997, උඩරට නැටුම් කලාව, සිමාසහිත ගුණසේන සහ සමාගම, 01, 02 පිටු;

21. -------- එම -------- 1997, 01, 02, පිටු;

22. නයන ස්ථිවිර මහගොඩ, 1996, මහා වංශය, ප්‍රථමභාගය (සිංහල පරිවර්තනය) තෙවැනි මුද්‍රණය, 24 පිටුව;

23. විජේතුංග, හරිස්චන්ද්‍ර, 1984, ප්‍රායෝගික සිංහල ශබ්ද කෝෂය, දෙවැනි කාණ්ඩය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව , 1682 පිටුව;

24. නයන ස්ථිවිර මහගොඩ, ඉහත ග්‍රන්ථය, 1996, 134 පිටුව;

25. සෝරත හිමි වැලිවිටියේ, 1970, දළඳා සිරිත, ද්විතිය මුද්‍රණය, සිමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, 104 - 108 පිටු;

26. බණ්ඩාර, කරුණාරත්න, 2000, උඩරට බෙර වාදන කලාව, ප්‍රථම මුද්‍රණය, කතෘ ප්‍රකාශනයකි, තරංජි ප්‍රින්ටර්ස් මහරගම, 196 පිටුව;

27. මහගොඩ නයන ස්ථවිර, 1996, මහා වංශය, ප්‍රථම භාගය, (සිංහල පරිවර්තනය) සිමාසහිත දිපානි මුද්‍රණය, තෙවැනි මුද්‍රණය, 98 පිටුව;

28. -------- එම -------- 1996, 99 පිටුව;

29. සිරි අහුගොඩ මහතා සම- 2001.01.15 දින සම්මුඛ සාකච්ජාව;

30. ඇතුගල, ආරියරත්න, 1998 , සංජානනය සහ සන්නිවේදනය, සිමාසහිත ඇම්.ඩී.ගුණසේන සහ සමාගම , 208 පිටුව;

31. කැණවිමලහිමි කිරි ඇල්ලේ, 1948, සිතියම් සහිත සද්ධර්මාලංකාරය, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 263 පිටුව;

32. සිංහල නර්තනයේ වේගය විලම්භ, මාධ්‍ය, ධත යනුවෙන් ලයමානයන් වශයෙන් ප්‍රභේද තුනක් වෙත්. එහි අඩුම වේගය ලය ලෙස නර්තන හා වාදන විෂය ක්ෂේත්‍රයන්හි භාවිතා කෙරෙත්;

33. බෙරන්තාවේ සිරිසේන ගුරුන්නාන්සේ සම- 1998.02.05 දින සාකච්ජාව;

34. සෝරත හිමි වැලිපිමියේ, 1970, දළදා සිරිත, ද්විතිය මුද්‍රණය, සීමා සහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 105 පිටුව;

35. -------- එම -------- 1970, 106 පිටුව;

36. ගයිගර්,මධ්‍යම කාලීන ලංකාවේ යුධ සේනා හා යුධ, (පොලොන්නරු යුගය), 1966, තිසර ප්‍රකාශකයෝ, 186 පිටුව;

37. සිරි අනුගොඩ මහතා සම- 2001.01.05 දින සාකච්ජාව;

38. පියසාර ශිල්පාධිපති, සංඛ, මුදියන්සේ දිසානායක, මියුරින් අබේවික්‍රම, 1998, සිංහල බෙර වාදන සහ සන්නිවේදන විධි ක්‍රම, සංස්කරණය සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, බෙර පිළිබඳ විශේෂ කලාපය , 33 පිටුව;

39. -------- එම -------- 1998, 32 පිටුව;

40. කෑගල්ල රත්නපුර ප්‍රදේශයෙහි මෙය පුරප්පට්ටුව ලෙස විසුරුවයි.

41. බෙරන්තාවේ විසූ සිරිසේන මහතා සම- 1998.02.05 දින සම්මුඛ සාකච්ජාව;

42. -------- එම -------- 1998.02.05;

43. බණ්ඩාර, කරුණාරත්න, සාම්ප්‍රදායික බෙර වාදනයේ සන්නිවේදන හා භාෂාමය ලක්ෂණ පිළිබඳ විමසුමක් , ලලිත කලා සාර සංග්‍රහය - 2, 2002, 215 පිටුව;

44. 2002.04.18 දින යමියන්තොට දොංඹිපොළ පදිංචි සාපින් නෝනා මහත්මිය ලබා දෙන ලදි.

45. ඇතුගල, ආරියරත්න, 1998, ඉහත ග්‍රන්ථය, 207 පිටුව;

46. බණ්ඩාර කරුණාරත්න, ඉහත ග්‍රන්ථය, 2002, 215 පිටුව;

47. ඇතුගල, ආරියරත්න, 1998, ඉහත ග්‍රන්ථය, 207 පිටුව;





# 17

# විශේෂාංග ලිපි රචනය

චන්දන විජේකෝන්

පුවත්පතක විශේෂාංග පිටුව ලෙස සාමාන්‍යයෙන් සලකනු ලබන්නේ කතුවැකිය තිබෙන පිටුවයි. නමුත් සමහර පුවත්පත්වල කතුවැකිය මුල් පිටුවේ පළ වෙයි. එබඳු පුවත්පත් බොහෝමයක විශේෂාංග ලිපි පළවන්නේ ඇතුළු පිටුවලය. විශේෂයෙන් මුල් පිටුවේ පළවන කාලීන ප්‍රවෘත්ති විචාරශීලීව විග්‍රහ කර විශේෂාංග ලිපි ලෙස පළවන්නේ මේ පිටුවලය. විශේෂාංග පුවත් හෙවත් ලිහිල් පුවත් පිළිබඳ කරන විග්‍රහයේදී ඒවා වර්ග කිපයකට බෙදා දැක්වීමට පුළුවන.

## ප්‍රධාන පෙළේ ප්‍රවෘත්ති පදනම් කර ගත් විශේෂාංග

නිදසුනක් ලෙස හෙරොයින් රට තුළට ගෙන ඒම සඳහා ප්‍රධාන පෙළේ ව්‍යාපාරිකයන් යැයි කියා ගන්නා පිරිසක් දරන උත්සාහය ගැනත් හෙරොයින් බෙදා හැරීමට පාතාල ලෝක සාමාජිකයන් දරන වැයම ගැනත් පුවත් පතක මුල් පිටුවේ ප්‍රවෘත්තියක් පළ විය හැකිය. එම ප්‍රවෘත්තියට ගැළපෙන ලෙස “ පාතාලේ රජ කරවන කුඩු ” නමින් විශේෂාංග ලිපියක් ලිවිය හැකිය. මත්ද්‍රව්‍ය භාවිතයේ ආරම්භය, එය විකාශනය වී අප රට තුළට ආ අන්දම, අද පවතින ස්වභාවය, ලෝක ප්‍රශ්නයක් වී ඇති අන්දම, මේ සඳහා ගත යුතු පිළියම් යනාදි කරුණු ඔස්සේ සාරවත් විශේෂාංග ලිපියක් හෝ ලිපි පෙළක් ලිවීමට පුළුවන. මනෝ විද්‍යාඥයන්, සමාජ විද්‍යාඥයන්, පොලිස් දෙපාර්තමේන්තුව හා විවිධ උගතුන්

ප්‍රාකෘත, ප්‍රථම, මධ්‍යකාලීන, නූතන හා අද්‍යතන අවධීන් හි නා නා තන් හි ප්‍රපංචයන් ඔස්සේ තේමා කොට ගනිමින් තූර්ය යන්න පාරිහාරික තත්වයට පත් වී ඇත. අෂ්ටාංග, අයුර්වේදයෙහි වෙන් වෙන් වශයෙන් හඳුනා ගැනීමේ දී ශල්‍යතන්ත්‍රය, ශාලාක්‍යතන්ත්‍රය කායචිකිත්සා, භූත විද්‍යා, කෞමාරභෘත්‍ය, අගදතන්ත්‍ර, රසායනතන්ත්‍ර, වාජීකරණතන්ත්‍ර, වශයෙන් මැ වෙත්[3] . එහි භූත විද්‍යා තුළ දේවතා - අසුර - ගාන්ධර්ව - යක්ෂ - රාක්ෂ - පිතෘ - පිසාච - නාග - සහ ග්‍රහ ආදීන්ගේ ආවේශය හේතු කොටගෙන උපදෘත වන සිත් ඇතියවුන්ගේ ඒ ග්‍රහ වේශයන් සමනය කිරීම සඳහා ශාන්තිකර්ම බලිදාන කරන බව ආයුර්වේදීය ග්‍රන්ථ උපුටා දක්වත්. [4] එම ශාන්තිකර්ම ආදීය සඳහා යොදා ගනු ලබන්නාවූ තූර්යෙහි රිද්මයක් ( Ritham) මූලික අපේක්ෂා වුව ද, ඒ තුළ ද යම් යම් ශාන්ත්‍යාර්ථයෙහි හඬ නිපද වූ බව පැහැදිලි වෙත්. ඒ තුළ තත් (ත) , ජිත් (ජි) , තො (තොං) , න (නං), යන සිව් බීජාක්ෂයන් මතුයෙහි ජීවය ලබා ගර්භාක්ෂරෝත්පත්ති වී තරි, ජිතෙහි, කුරුම්ට, තකරොං, තහකඩ, කඩතක ......... වශයෙන් නිෂ්පන්න වී ඇති බවට සාක්ෂ්‍ය එමට ය. එකී අක්ෂර වෘතය වටා සම්ප්‍රදායානුගතව (Traditional) ගුරුකුල ප්‍රවේණි තුළ, පුද්ගලානුබද්ධව, ගතානුගතිකව , වල්‍යවාදීව අන්තර්ගතයෙහි ශිල්පීය නෛපුණ්‍යතාවය කරණකොට ගෙන විවිධ මතිමතාන්තර මෙන් ම විශ්වාස තුළ, හැඳින ගැනීමේ නාම සකස් වී ඇත. ඒ තුළ අක්ෂර, හරඹ, හුරු නුහුරු පෙරළුම්, සුරල් , අඩව්, මෑල් බෙර, අත්‍යාබෙර, වැඳුම් අත්, දැකුම් අත්, සව්දම්, කවුස්තම්, තාලම්, අභින පද, වීණා පද, සේම හේවිසි, හේවිසි පහෙ හේවිසි , මණ්ඩම් පෙරළුම්, හැන්දෑදුර, මධ්‍යම දුර, අලුයම් මුර, තේවා හේවිසි, ගමන් හේවිසි, පෝය හේවිසි, පූජා පද , කෙම්මුර පද, අයිල් පද , අඩ පද , වට හේවිසි පද [5] වශයෙන් තූර්යභාෂාභ්‍යන්තරයට අදාළ අංකුර රාශියක් වෙත්. මේවා ගද්‍ය හා පද්‍යමය වශයෙන් තූර්ය සාහිත්‍යයක් නිර්මාණය කරයි.

තූර්ය ගද්‍යය - ( පද ) හරඹ පද වාදනයේ සිට සියලු නිර්මිත සහ පද ඛණ්ඩයන් අවනද්ධ භාණ්ඩයන්ගෙන් නිපදවෙන්නා වූ සියලු ශබ්දයන් ආශ්‍රිත ධ්වනි අක්ෂර සංයෝග වූ පද වර්ග.

තූර්ය පද්‍ය - උපත් කථා සාහිත්‍ය ( කවි ඇතුළත්ව ) ව්‍යුහීය ලක්ෂණ ඇතුළත් ගායන බීජාක්ෂර වලින් නිර්මිත පද හා වාදනයන්ට අදාල සියලු ගායනා.





උක්ත සියල්ල ගොනු වූ, එකක් අනෙකට වෙන්කොට හඳුනාගත හැකි මිනුම් දණ්ඩ “ තිත ” ලෙස හඳුනාගෙන ඇත. විද්වත්හු මෙය,

1. සංලක්ෂණාර්ථවාචී
2. තාලාර්ථවාචී යනුවෙන් තිත් ශබ්ද ප්‍රධාන ලෙස බෙදා වෙන්කොට දක්වත්.[6]

මේ සියලු තන් හි ම අක්ෂරයෝ සුභ සහ අසුභ වශයෙන් ඝණ පිහිටුවාලත් . ඒ වූ කලී හොඳ හෝ නරක පැමිණවීම වස් යෝගකාරක අක්ෂරයන් වේ.

## තූර්ය භාෂා ඝණ පිහිටුවීම.

තූර්ය වාදන භාෂාවෙහි මුඛ්‍යාංගය ලෙස ඝණ පිහිටුවීම උපුටා දැක්විය හැකිය. සන්නිවේදන කාර්ය සඳහා යොදාගනු ලබන තූර්ය අක්ෂර පද ආදිය විෂයෙහි මෙම ඝණ පිහිටුවීම ප්‍රධාන වේ. යට දැක්වුවා සේම ඒවා සුභ ඝණ හා අසුභ ඝණ වෙත්. මේ තුළ ජ්‍යොතිශ්‍රාස්ත්‍රයෙහි අන්තර්ගත සියලු ජ්‍යාමිතික මෙන් ම ගණිතමය කාලහෝරා සංමේතයන් ඉතාමත් සමීපතාවයක් දක්වයි. කෙසේ ද යත් සිංහල දින කාලවකවානු බෙදීමේ දී මේවා සූර්ය මාස ලෙස ගනිනු ලැබේ.



මෙසේ වෙන් කරනු ලබන සූර්ය මාසයන් කොටස් දෙකකට බෙදෙත්. ඒවා නම්,

1. පුර පක්ෂ (හඳ පිරෙන පක්ෂයයි)

2. අවපක්ෂය (හඳ ගෙවෙන පක්ෂයයි) වශයෙනි.[7]

පුර පක්ෂයේ දින නම් පුර පෑලවිය, පුර දියවක, පුර තියවක, පුර ජලවක, පුර විසේනිය පුර සැටවක, පුර සතවක, පුර අටවක, පුර නවවක, පුර දසවක, පුර එකොළොස්වක, පුර දොළොස්වක, පුර තෙලෙස්වක, පුර තුදුස්වක, පුර පසලොස්වක, වශයෙන් බෙදා වෙන්කොට දක්වන අතර අව පක්ෂය අව පෑලවිය, අව දියවක, ආදි වශයෙන් නම් කෙරෙත්.[8] පුර සහ අව යන ද්වි පක්ෂයේ ග්‍රහ පිහිටීම මත ලාංකේය ජනසමාජය තුළ සුභාර්ථයේ මෙන්ම අසුභාර්ථයේ කටයුතු වල යෙදෙත්.

## අක්ෂර පිහිටීම

තුර්ය භාෂාව තුළ මතුයෙහි විභාග කළ වස් තා, පි, තො, නං, යනු මුල් හෝඩිය සේ සැලකෙත්.[9] එයින් බෙදී ගොස් ඇති විවිධ අක්මුල් රාශියකි. එසේම භාෂාවක අක්ෂර උසුරනු ලබන ආකාරය පිළිබඳව ද පරිශීලනයේ දී පෙනී යයි. උක්ත භාෂාව තුළ අක්ෂර බෙදියන පිළිවෙත් අනුව කොටස් හඳුනාගත හැකිය.

1. ලඝු අක්ෂර ( කෙමි අකුරු)

2. ගුරු අක්ෂර ( ඇදෙන අකුරු)

3. ප්ලුත අක්ෂර ( - )

4. හලන්ත අක්ෂර ( - ) යනු එම වර්ග අක්ෂරයන් වෙයි.

ඒ ඒ කරුණු වෙන වෙනම නිදසුන් ලෙස ගෙන බැලූ කළ මෙසේ කාණ්ඩගත කළ හැකිය.





| ලඝු | ගුරු | ප්ලුත | හලන්ත |
|---|---|---|---|
| ත ක , පි තො , රෙ කි යනුවෙන් කෙමි ශබ්ද අග්‍රයෙන් උසුරනු ලබන අක්ෂර | ද්‍රෙං , ප්‍රිං, න්‍රං ට්‍රිං , රෙශ්‍ර තන්‍ර, කිට්‍ර | ද්‍රෝං, ප්‍රීං,රූං තහ්‍ර්, ක්‍රිස් | රත්‍ර්, පිත්‍ර් ජෙන්‍ර්, ද්‍රෙහොර්ලත්, කිත්තත්, ජෙප්‍ර් |

ඝන පිහිටවනු වස් ගුරු අක්ෂර මෙන් ම ලඝු අක්ෂරයෝ වෙසෙසින් භාවිත කෙරෙත්. ඒ මතු ද නොව සිදත් ස-රාව දක්වන ඝන අක්ෂර සුභ හා අසුභ වශයෙන් ප්‍රභේදද්වයකට වෙන් කොට දක්වත්.

1. අපායාක්ෂර ( එ, ක, ය, ම,ර, ජ, අ, ණ, න, ල, අං)
2. මනුෂ්‍යාක්ෂර (උ, ප, බ, ග, හ)

එපමණක් ද නොව ඉතිරි අක්ෂරයෝ සියල්ලක් ම දිව්‍යාකාෂර වශයෙන් හඳුන්වයි.[10] උක්ත මනුෂ්‍යාක්ෂර හා දිව්‍යාක්ෂර වූ කලී ග්‍රන්ථ සම්පාදනයේ දී සෙත් කවි වැනි කාව්‍ය නිෂ්පත්තිය ආදි වශයෙන් පිළිමනිනු ලබන සකලවිධ සුභ කටයුතු සඳහා විෂය කොට ගනිත්. සිදත් ස-රාව මෙය දක්වන්නේ ,

“ එක යම රජ අණ හළ අං අවාකර
උපබග හා නර නම් තිරි වේ අමර...........”[11]

වශයෙනි. ඒ මතු ද නොව අෂ්ටඝණ සහ එහි ඵල හොරාහරණයෙ හි භූමි, දේව, ගිණි, වායු , ජල , සූර්ය, අකාස, චන්ද්‍ර ලෙස දක්වත්. එසේ ම ඒවායෙහි අනුපිළිවෙලින් සිරි සැප, දිර්ඝා, මරණ, විදේසයාම, දිර්ඝා ධෛයඝීවන්ත, ලෙඩරෝග, විනාශ ,කීර්ති, අෂ්ට ඵල ද දක්වත්.[12]

**අෂ්ට ඝණ බෙදිම**

| සුභ ඝණ | | | | අසුභ ඝණ | | | |
|---|---|---|---|---|---|---|---|
| අක්ෂර | සංකේත | ඝණමුල | විපාක | අක්ෂ | සංකේත | ඝණමුල | විපාක |
| ම | U U U | භූමි | සිරිසැප | ජ | - U | සූර්ය | ලෙඩරෝග |
| න | - - - | දේව | දිඝීයුෂ | ර | U - U | වන්න | මරණභ |
| භ | U - - | චන්ද්‍ර | කිර්තිය | ස | - - U | වාය | විදේසයාම |
| ය | - U U | වාරි | ධෛර්‍යවන්ත | ත | U U - | ආකාස | විනාශ |

ඉහත දක්වනුයේ අෂ්ට ඝණය සම්බන්ධ අන්තර්ගතයෙහි දළ සැකිල්ලකි. ලාංකිය සාහිත්‍ය ඉතිහාසය තුළ සංදේශ කාව්‍ය ප්‍රධාන විවිධ කාල යුගයන්ට අයත් සේ සැලකෙන බොහෝ ගද්‍ය මෙන් ම පද්‍ය කෘතීන් හි ප්‍රවිශ්ඨය වූ කලි සුභ ඝණ හෝ අසුභ ඝණ සේ සැලකේ. ගුත්තිල කාව්‍ය ගත්කළ එහි එන " සියපින් සිරින් සරු " යන්නෙ හි " සි ය පින් " වශයෙන් ලඝු දෙකක් හා එක් ගුරු අක්ෂරයක් පාදකකොට ගෙන කාව්‍යකරණය සිදු කොට ඇත.[13] ලඝු දෙකක් හා ගුරු එකක් යනු මෙහි වායු ඝණයෙන් ආරම්භ කොට ඇත. ඒ නයින් සැලකන කළ එහි අදෘෂ්‍ය පදගතාර්ථය විදේස් යාම වේ. ඉන් අර්ථකථනය කෙරෙනුයේ විරස්ථිතික වාසස්ථානය හැරයාමකි. එසේ වුව හංසය වැනි සංදේශ කාව්‍ය පිරික්සු කළ " සැරද හසරද සඳ "[14] යන්නෙහි " සැරද " යනු ලඝු තුනක එකතුවකි. එනම් දේව ඝණය වෙත්. දිඝීයුෂ ලැබීමට ප්‍රාර්ථනාත්මක ප්‍රවේශයක් මෙන්ම විශ්වාසයකි. ලාංකීය සමාජය තුළ සිංහල නර්තන උපසංස්කෘතියෙහි තූර්ය භාෂා ප්‍රවර්ධනයේ දී ද මෙවැනිම වු පද සංඝටකයන් රාශියක් මූලික නාම මාත්‍ර ඔස්සේ අප හොවා දක්වා ඇත. ඒ තුළ ලංකාවේ මෙන් ම ලෝකය තුළ ද සුපුරුදු හඳුනාගැනීමේ " පද " විශේෂය මංගල බෙර වාදනය මගුල් බෙර වශයෙන් හඳුන්වති. එහි භාවිතය වූකලි සුභ අවස්ථාවන් මූර්තිමත් කරනු වස් වේ. නිදසුන් ලෙස එහි ආරම්භය සුභ ගණ යෝග අනුව අෂ්ඨගණයෙහි පිහිටුවා සලකා බැලිය යුතුය.





ආරම්භක පදය හෙවත් " දේව පදය "

තං ජිං තං / ජිං ත ක / ජිං ග ත / කු ද ග / ජිං ත රි / කි ට ක / ද ග ත / ග ත

භූමි ඝණය සිරිසැපදේ | චන්ද්‍රඝණය කීර්තිය ලැබේ | චන්ද්‍රඝණය කීර්තිය ලැබේ | දේවඝණය දිර්ඝායුෂ | චන්ද්‍රඝණය | දේවඝණය

කු කු / ද කු ද / ග ජිං ත / ක ජිං ග / ත කුං ජිං / ග ත කුං / ත කුං

ත ත් / ජිං තකුං / තකුං ජිං / ජිං ගජ්ජිං /

ආදි වශයෙන් මුලින් යෙදෙන ම, න, භ, ය, යන සුභ ඝණ සතරෙහි සංයෝගාත්මක වීමෙන් මංගල බෙර වාදනය පූර්වාරම්භයේහි ම සුභ කටයුතු සඳහාම පමණක් භාවිතා කරත්. බුද්ධ, ධම්ම, සංඝ යන රත්නත්‍රය විෂයෙහිත් දේව යක්ෂාදීන් යන අදෘෂ්‍ය කොටස් වෙනුවෙන් කෙරෙන සුභ කටයුතු සඳහා මංගල බෙර යොදා ගනිත්.

" විණ පද "[15] වැයීම කෙනෙකුගේ වාදන කෞශල්‍යය දුබල කිරීම් වස් භාවිතයට ගැනෙන්නක් ලෙස තත් වාදන ඇඳුරෝ හුවා දක්වත්. එහි භාවිත අක්ෂර සහ පද බෙදීම් ජ, ර, ස, ත, යන සිව් විණාක්ෂර සංයෝගය මත පිහිටා ඇති බව කරුණු හෙළිවේ. සබරගමු නර්තන සාම්ප්‍රදයේ පංච අක්ෂර යොදගත් විණ පදයක් වේ.

අයනු අහත අහලුම්
ඉයනු ඉහිත ඉහිලුම්
උයනු උහිත උහුලුම්
එයනු එහිත එහෙලුම්
ඔයනු ඔහිත ඔහොලුම්

"අයනු, ඉයනු, උයනු, එයනු, ඔයනු කවට නොමිත බක්කේ වාජයං ගබ: "[16]

එසේම ලංකාවේ යක්දෙස්සන් අතර යන්ත්‍රමන්ත්‍ර ආදිය භාවිත කිරිම ද පුරාණයේ සුලභ කරුණක් වුව ද අද්‍යතනයේ එසේ ඒවා භාවිත කරන්නවුන් අහඹු ලෙස දැකිය හැකිය. වාදන ශිල්පීන් අතුරෙහි වුව ප්‍රතිවාදියා මෙල්ල කරනු වස්

“ තිබ්බටු ” ගෙඩියකට මන්ත්‍රයක් මතුරා යටකී තූර්යය භාෂාවේ වාදන අසුභ විණ අක්ෂරයකට අල්ලා හැපීම තුළින් ඔහුගේ බෙරය පැලීමට තරම් සමත්වන බවට කරුණු දක්වයි.[17] යටකී අදෘශ්‍යමය තත්වයන් විදහා දක්වමින් ඉතා උපක්‍රමශීලීව තම විෂය ක්ෂේත්‍රය තුළ ඇති පෘථුල බව සහ ගූඪ බව දැක්වීමට පැරණි වාදන ශිල්පියා උත්සාහ දරා ඇති බව පෙනෙන කරුණකි.

## සාම්ප්‍රදායික සන්නිවේදනය සහ සන්නිපාත භේරී

සන්නිවේදනය යනු යමක් දැන්වීම, හැ-වීම උදෙසා පිළිමනිනු ලබන ක්‍රමෝපාය යැයි පදගතාර්ථ විග්‍රහ කිරීම සාමාන්‍ය තත්ත්වයයි. ජන සමාජයේ පෞද්ගලික වශයෙන් මෙන්ම ආයතනික වශයෙන්ද අදහස් උදහස්, ආරංචි, ප්‍රවෘත්ති හුවමාරු කර ගැනීමේ කාර්යය හා බැඳුණු ක්‍රියාවලිය[18] ප්‍රවෘත්ති හුවමාරුව[19] සන්නිවේදනය ලෙස ශබ්ද කෝෂ කරු පදගතාර්ථ විග්‍රහයක යෙදේ. සන්නිවේදනය යනු බෙර, දවුල්, තම්මැට්ටම්, උඩැක්කි, මෙන්ම ඝණ, සුසිර ආදි වූ නානාවිධ තූර්ය භාණ්ඩ මෙහෙයවා කරණු ලබන දැනුම් දීම් වේ. තත් සමස්ත තූර්ය සන්නිවේදනය, සාම්ප්‍රදායික සන්නිවේදනයේ ප්‍රධාන වූ ප්‍රවාහයක් ලෙස හැඳින්වීම යුක්ති යුක්ත වේ. ගිනි ගැසීම, හූ කීම, ලී කොට එකට හැප්පීම, අත්පුඩි තැලීම වැනි මුල් යුගයේ ක්‍රියාකාරකම් මෙන්ම ගිරා, නීලකොබෝ, ඇම් කුකුලු, හංස, සැළලිහිණි ආදි පක්ෂීන් මෙන්ම තුරංගුන් වැනි සතුන් ද ආධාරයෙන් මෙකී සන්නිවේදන කාර්යය පහසු කරවීය. ආදි මිනිසා සතුන් දඩයම් කර ගැනීමට පහසු කරවනු වස් දඩයමට උචිත සත්වයාගේ හඬ මෙන් හඬ පිට කිරීමෙන් සතුන් නොම- යවා සිය දඩයම හේ ග්‍රහණයට නතු කර ගැනීමේ ක්‍රම පිළිවෙතක් විය. මෙය අනුකරණාත්මක සන්නිවේදනයෙහි මූලික අවස්ථාව ලෙස හැඳින්වීම ඉතා යෝග්‍යය වේ. එපමණක් ද නොව සතෙකු දඩයම් කළ පසුද එම සතා පිළිස්සෙන විට, දඩයම් කළ ආකාරය දක්වමින් අනුකරණාත්මක රංගනයන් හි යෙදීම, ගස් බෙනවලට තබා සම් කැබලි වලට ගැසීම හා ශරීරයට ගසා ගැනීමෙන් විවිධ ශබ්ද නිකුත් කිරීම උක්ත තූර්යය සාම්ප්‍රදායික සන්නිවේදනයේ මූලික අවස්ථාව ලෙස පෙනී යන ආකාරයකි. දරු නැළවිලි ගීතයන් බිළින්දාට නින්දට ඇරයුම් කරන මව[20] සවන්දීමේ හුරුව ලබා දෙන්නා සේම ඒ තුළින් බිළිඳා මානසික සුසංයමයකට ද පත්වේ. ඇත් ගොව්වන්ගේ වස්දඬුරාවය ඇතා මෙල්ල වීමට සන්නිවේදනය කරන්නා සේම වැද්දාගේ මිණි හඬට අවනත වීමෙන් මරණය කරා මුවාද ළං වෙත්.[21] මේ නයින්ම කන පිනවීම උදෙසා මෙන්ම දැනුම් දීම උදෙසා ද වාදනය යොදාගත් බවට සාක්‍ෂ්‍ය එමටය.





“ ඒ ඒ තන්හි සියළු තූර්යයෙන්ද, නොයෙක් පරිද්දෙන් පූජා පවත්වා සියල්ලෝ පෙහෙවස් අගයන් ඉටාගෙන ධම්මපද අසත්වා එදවස්හි ද නොයෙක් පූජා විශේෂයන් කෙරෙත් වා ” යි පුරයෙහි **බෙර** හැසිරවූයේය.[22] මහාවංශය දක්වන මෙවැනි පාධ සන්නිපාත භේරී යන්නට ඉතාමත් උචිත වූ නිදසුන් වෙත්. සන්නිපාත භේරී යනු “ සමූහයකට රැස්වීම සඳහා වයන බෙරය, රැස්වන්නැයි අඬගසා වැයෙන බෙරය ”[23] යනුවෙන් ශබ්ද කෝෂය පදගතාර්ථ ගෙනහැර දක්වයි.

“ නොමහත් කොට සුවාසු දහසක් පූජාය, නා නා විධ වූ නැට්ටුවන් විසින් කරවණ ලද නැටුම් හා නා නා ප්‍රකාර පංචාංගික තූර්යයනාදය ; යන පූජා වලිය ශ්‍රධාවෙන් මෙහෙයන ලද රජ තෙමේ මහ සෑයෙහි පැවැත් වී, දවස තුන් යලක් බුඩොපස්ථානයට ආයේය. ඒ තෙමේම නියත කොට දෙවරක් මල් පූජායෙහි බෙර ඇසිරවීය.[24]

අනුරාධපුර මහා සෑයට පුජෝපහාර දැක්වූ අවස්ථාවන් හි නා නා විධ පංචතූර්යයන් හැසිරවූ බව මහාවංශය සඳහන් කරන අතර **දළදා සිරිත** වැනි කෘතියක විවිධ අවස්ථාවන් හි භාවිත කළ තූර්යය භාණ්ඩ පිළිබඳව ද කරුණු දක්වයි.

“ සක්පඤ්ච, වඩ්ඩාරු, දළහං, මද්දල, මහුමකුඩම, පණාබෙර, මිහිඳුබෙර, ඩමරු ඩැක්කි, උඩැක්කි, තලප්පර, වීරන්දම්, වීරමොරසු, කංසුතාලම්, සින්නම්, තම්මැට්ට, නිසාන, තිඹුලිවු, රොදුබෙර, බොම්බිලි, මාබෙර, ගැටපහටු, එකැස්බෙර, රන්රිදි දහර, කාහළ, කාළම්, සිරිවිළි, තන්තිරිපට, විජයෙධවනී, ගවරහං, වංගී,වස්දඬු, වස්කුලල්, තන්තිරි, දණ්ඬ, වැදවෙසෙස්, සතිස්රා ”[25] වශයෙන් පංච තූර්යය භාණ්ඩ නාමාවලීන් දක්වා ඇත. සන්නිපාත භේරී උදෙසා අවනද්ධ භාණ්ඩ රාශියක් භාවිත කොට ඇති බව කරුණු සනාථ වේ. එපමණක් ද නොව කරුණාරත්න බණ්ඩාර මහතා පවසන්නේ ලෝකයේ විවිධ ප්‍රාථමික ගෝත්‍රික සමාජ වල සන්නිවේදනය උදෙසා බෙර භාවිතා කළ බවයි.[26]

සාම්ප්‍රදායික සන්නිවේදනය විෂයෙහි ලා සලකනු ලබන විශේෂ අවස්ථා ගම්‍යමාන කිරීම ඉතා වැදගති. වෙසෙසින් එහි දෘෂ්‍ය තත්ත්වයන් පසක් කිරීම කාලෝචිතය. එය සිව් වැදෑරුම් වේ.

1) අණ බෙර ලවා කළ සන්නිවේදනය
2) වද බෙර ලවා කළ සන්නිවේදනය
3) මළ බෙර ලවා කළ සන්නිවේදනය
4) රණ බෙර ලවා කළ සන්නිවේදනය
5) පූජා බෙර ලවා කළ සන්නිවේදනය

## අණ බෙර ලවා කළ සන්නිවේදනය

ප්‍රාග් බෞද්ධ යුගයේ සිටම කුමන හෝ රාජ්‍යයික පණිවුඩ හුවමාරුවක් දැනුම් දීමක් කරන ලද්දේ අණ බෙර මි-නි. " මා හැර අනෙක් එළාර රජු නොමරව " බෙර හසුරුවා[27] .........

" නුවර අණ බෙර ලවා හාත්පස යොදුනෙක මිනිසුන් රැස්කරවා එළාර රජ හට සත්කාර කරවිය "[28] ..........

ඓතිහාසික වශයෙන් තත් මූලාශ්‍ර රාශියක් මි-න් කරුණු හෙළිදරව් වේ. පසුකාලය දක්වා විහිදී ආ අණ බෙර වාදනය ජෙංත / ජෙං ජෙං / ජෙං ජෙං / ජෙං ජෙං / ජෙං - [29] / වැනි පද කොටස් සඳහා භාවිතා කළ බව පෙනේ. 19 වන සියවසේ පළමු දශක කිහිපය දක්වාම මෙම අණ බෙර සන්නිවේදන ක්‍රමවේදය පවත්වාගෙන ආ බවට තොරතුරු ඇත. මෙය ක්‍රමයෙන් ලාංකීය ජන ප්‍රවාහයෙන් දුරස්ථ බවට පත්වීමට පෙළඹවූයේ 1800 පමණ දේශීය මුද්‍රණ ශිල්පය දියුණු වීම හේතු කොටගෙන ය.[30] සාම්ප්‍රාදායික සන්නිවේදනය අභිබවා විද්‍යුත් සන්නිවේදනය හඳුන්වාදීම ය.

## වද බෙර ලවා කළ සන්නිවේදනය

" දහස් ගණන් ගස්වමින් මෙසේ විචිත්‍ර වධ කෙරෙමින් **වද බෙර ගස්වා** ගෙන හුලක් සැස කර තබා ආඝාතන භූමිය බලා නික්මුණාහ. "[31]

රාජ උදහසට ලක්වූ යම් අයෙක් වෙත් නම් හේ උල තබා ජීවිතක්ෂයට පමුණුවාලිය. හිස ගැසීම, සිව් මංසලක සිටුවා පස්ගසා ගල් මුල් ප්‍රහාර එල්ල කෙරිණ. සියලු වද බන්ධන පමුණුවා ලීමට පූර්වාංගය ලෙස **වද බෙර ලවමින්** ප්‍රසිද්ධ ස්ථානයන්හි මෙන්ම විථි ඔස්සේ පෙරහරින් ගෙනයාම





සිරිත විය. එසේ කරනුයේ රට වැසියන්ගේ දැනගැනීම උදෙසාය. ජනයා වද බෙර හඬ ඇසීමෙන් පසක් කර ගනුයේ වරදකරුවෙකුට දඬුවම් පැමිණවීමේ අවස්ථාවක් බවයි. මෙහි ප්‍රතිඵලය වරද පිළිබඳ සහ දඬුවම් පිළිබඳ සමාජ සන්නිවේදනයක් ගොඩ න-මින් සමාජ පාලනයක් (Social Control) නිර්මාණය කිරීමයි.

## මළ බෙර ලවා කළ සන්නිවේදනය

ශ්‍රී ලංකාවේ ප්‍රභූන් මරණයට පත්වූ ක්ෂණයෙන් එම ස්ථානයේ මළ බෙර වාදනය කිරීම සිරිතයි. එසේම ආදාහනයට රැගෙන යන පෙරහරේ මළ බෙර වාදනය කිරීම ලංකාවේ පුරාණයේ සිටම පැවත එන චාරිත්‍රයකි.

ජෙං
ජෙං ජෙං
ජෙං .....

තක්කඩ තරිකිට කුකු තකු " යන පද කොටස් ඉතා විලම්භ ලය මානයෙන් යුතුව වාදනය කරන අතරතුර හොරණෑ ද ඉතාමත් ශෝකාකුල අන්දමින් වාදනය කෙරෙත්. මෙහිදී ඉපැරණි ලංකා වාසීන් භාවිතා කරන ලද්දේ " යශෝදරා වත " වැනි කාව්‍යකරණයේ සුවිශේෂ පද්‍ය ගායනයන් හි නාද මාලාවකි. උක්ත වාදන ශෛලිය මිනිසුන්ට කොතෙක් සමීපද යත් ඒ සඳහා ග්‍රාම්‍ය ජන ශ්‍රැතියේ " යං කනත්තට මළකඳ අරගෙන " වැනි පද කණ්ඩයන් වාදනය වන්නේ යැයි වහරත්.

ජෙං කි / තක් කිට / රජ් ජෙං / කුද කඩ /[33]

අද්‍යතනයේ තම්මැට්ටම දවුල හා සම්බන්ධව හොරණෑව භාවිතා කළද දුරාතීතයේ " පටාව " නම් බෙරයක් මළ බෙරය වාදනය සඳහා යොදාගත් බවට සාක්ෂි ලැබේ.

## රණ බෙර ලවා කළ සන්නිවේදනය

රණ බෙර යනු යුධමය හෝ රාජ්‍ය බල වික්‍රමය හුවා දක්වනු වස් භාවිතා කළ වාදන වෙසෙසකි. යම් හමුදාවක් යුධ භටයෙකුගේ ආත්ම ශක්තිය මෙන්ම

යුධ මානසික තත්ත්වයන් වර්ධනාවස්ථාවට තිව්‍ර කිරීම උදෙසා භාවිත යොදා ගනී.

" වීර මොරසු " යනු බෙර වර්ගය රණ බෙර හෝ යුධ බෙර සඳහා භාවිතා කරන ලද්දකි. මෙහි මොරසු - මොරහු යන තම්මැට්ටම බවද දළදා සිරිතේ පවසයි.[34]

" තිඹිලිවි " " නිසාන " යනු ද යුධ බෙර වෙසෙසකි.[35]

උක්ත භාණ්ඩ යුධ බෙර සහ රණ බෙර වශයෙන් භාවිතා කළ බව මහාවංශය, ථූපවංශය වැනි මූලාශ්‍ර කරුණු හෙළි පෙහෙළි කරයි. රණ බෙර හෝ යුධ බෙර වාදනයෙන් සන්නිවේදනය කරනුයේ රටවැසියන් රාජ්‍යයික කටයුතු උදෙසා සුවිශේෂී අවධානය මෙන්ම ඔවුන්ගේ ආත්ම ශක්තිය වර්ධනය කිරීමක් වේ. මහාචාර්ය විහෙල්ම් ගයිගර් දක්වන ආකාරයට යුධ බෙරය හඳුන්වනුයේ " භේරී " හෝ " රණ භේරී " වශයෙන් වෙයි. සංස්කෘත භාෂාවෙන් " ජය භේරී " යනු ජය බෙරය බවයි. ඔහු පවසන්නේ වැයීම, කාහල පිඹීම සාමකාමී යුගයකදී ද සිදුවූයේ බවත්, මහජනයා වෙත දන්වන සියලුම නිවේදන " අණ බෙරයක් " ගසා දැනුම් දෙන ලද බවත් වේ.[36] එසේවුව " රණ බෙර " වැයීම අද්‍යතනයේ වුව සිදුවූයේ සේනාංකයක් හැසිරවීමේදී හෝ ක්‍රියාත්මක කරවීමේදී පමණකි. ඒ බව ජනතාවට දන්වනුයේ රණ බෙර වැයීමෙනි.

## පූජා බෙර ලවා කළ සන්නිවේදනය

දෘෂ්‍යමානයේ මෙන්ම අදෘෂ්‍යමානයේ ආගමික හා ආගමික නොවන සියලු තන්හි වතාවත් උදෙසා පූජා බෙර වාදනය කරයි. බෞද්ධ දර්ශනයේ වූ පිරිතේ දී වාදනය කරනු ලබන ජාම හේවිසි වාදනය අදෘෂ්‍ය තත්ත්වයන් විෂද කරන සන්නිවේදන අවස්ථාවකි. තම්මැට්ටම, දවුල, හොරණෑව සහ ගැට බෙරය හෝ පහත රට බෙරය වයනු ලබන්නේ බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධ රත්නය සඳහා වේ. පසුව දෙවියන්ට සහ අවශේෂ ග්‍රහ යක්ෂයනට තෙවනුව ද වාදනය කළ යුතු බව සිරි අහුගොඩ මහතා පවසයි.ඒවා,

1. මඟුල් බෙර
2. පූජා පද
3. කෙම්මුර පද





වශයෙන් වෙන් කොට වාදනය කළ යුතු බවයි.[37] මෙයින් පසක්වන එක් කරුණක් නම් දෘෂ්‍ය නොවන බලවේග වෙනුවෙන් ආරාධනා කරනු වස් තූර්යය භාණ්ඩ අතීතයේ මෙන්ම අද්‍යතනයේද යොදා ගන්නා බවයි. අද්‍යතනයේ මෙම අවස්ථාව මංගල බෙර වාදනය පමණක් ම යොදාගන්නා අවස්ථා බහුල වී ඇත. මෙම අවස්ථාව සිංහල බෙර වාදන කලාවේ " සමූහ බෙර වාදන " (Symphony) ආරම්භක විකාශන අවධිය බව පියසාර ශිල්පාධිපති පවසයි.[38] " කුරප්පට්ටුව "[39] " පුරප්පට්ටුව "[40] වශයෙන් හඳුන්වන පද විශේෂය පිරිත් දේශනයක් සඳහා මහා සංඝ රත්නය වැඩම වීමට පූර්ව අවස්ථාව සඳහා කරනු ලබන දැනුම්දීමක් වශයෙන් හැඳින්වේ.

" ජෙග තරිකට ජෙං කිතක්ක //
ජෙග තරිකිට ජෙග තරිකිට ජෙග තරිකිට ජෙං කිතක්ක
ජෙං ජෙං කිතක්ක
තකුද ගත්ත ජෙංකිට කුදකිට......."

ආදි වශයෙන් මෙම පද කොටස වාදනය කරනුයේ එක් පට, දෙපට, තුන් පට ආදි වූ විවරදරා පිරිත සඳහා සූදානම් වීම උදෙසාය. මෙය ගැමියන්

මහ පිරිතට දැන් වඩින්න //

දැං දැං වඩින්න ......... වශයෙන් සන්නිවේදන හඬ, වහරනු ලබන බසට පෙරළාගෙන සිමිත්. එපමණක් ද නොව පන්සල් ආශ්‍රිත, පොහොය දින, පිංකම් දින පුණ්‍ය කර්ම අවස්ථාවන් ජනතාවට දැනුම් දෙන්නේ කුරප්පට්ටුවෙන් හෝ පෙහොය හේවිසියක් මගිනි. මහජනතාව ඒකාරාශී කිරීම සඳහා මෙවැනි තූර්යාංග භාවිතා කරයි.

" ජෙං ජෙංත කුද ජෙංත ජෙංත කුද[41]

තකට තකට තකු ජෙං " වැනි හේවිසි වාදනයේ " වඩම්මවන " පද වාදනයෙන් ජනයා දනට සංඝයා වැඩම කරන බවට ඉඳුරාම දැනගනී. දෙවියන් විෂයෙහිලා " තේවා පද " වශයෙන් උපහාර සඳහා යොදා ගෙන ඇත.

" ජෙං කි / ටක් කිට / රජ් ජෙං / කුද කිට / "[42]

උක්ත පද බාණ්ඩයන් ශ්‍රවණය වීමෙන් අසල්වාසී දේවාලෙහි තේවා හෝ මුරුතැන් මංගල්‍යය හෝ මඩු තෝත්‍ර සිදුවන බව පසක්කොට ගනිත්, එසේ ම අලුයම් දුරය, මැදියම් දුරය, හැන්දෑ දුරය මෙහි දී පුජා පවත්වන අවස්ථාවන් පිළිබඳ ව ගැමියාට දැනුම් දෙයි.[43] මේ වූ කලි සන්නිවේදනයේ ප්‍රාථමික අවස්ථාවන් ලෙස හුවා දැක්වීම වඩාත් උචිතය.

මෙපණක් ද නොව ග්‍රාම්‍ය තූර්ය සන්නිවේදනය වසරක් පාසා එළඹෙන සිංහල අලුත් අවුරුදු චාරිත්‍ර වාරිත්‍ර උදෙසා ද භාවිතා කරන්නට යෙදිණී. “ අවුරුද්දක් කිට්ටු කිට්ටු එරබදු මල් පොට්ටු පොට්ටු ” වැනි බංකු රබන් පද සිංහල අලුත් අවුරුද්ද එළඹි බව පසක් කිරිමට තරම් මහෝපකාරී වී ඇත. ජන ජීවතයේ අනේක විධ සිදුවීම් අලලා නිර්මාණය වී ඇති රබන් පද උක්ත ජන ක්‍රියාකාරකම් ඒකරාශි වන අලුත් අවුරුදු දින සිහිපත් කිරිමට ගම්මුන් අමතක නොකරති. ජන ජීවිතයේ දුප්පත්කම්, අ-හිගකම් මැද පැමිණි දුක් පැණිරසය ලෙස සිතා එම තත්වයන්, ආත්ම සංතෘෂ්මිය පිණිස සෞන්දර්යාත්මක ආකල්ප වර්ධනීය තත්ත්වයකට පත් කිරීමට උත්සාහ දරා ඇත. ඒවා,

කැකුණ මොටද පොල් නැති කොට
කැකුණ පොත්ත ගං සුරතට
කැකුණ විකුණා කා
දොද් දොං තරිකිට කැකුණ විකුණා කා [44]

වැනි රබන් පද අධාරයෙන් විදහාපා යි. තත් රබන් පද රාශියක් සිංහල ජනශ්‍රැතිය තුළ අන්තර්ගත බව පෙනෙන කරුණකි. ඈත පිම්සර ගමක රිලවකු නටවනු බව පසක් කර ගනුයේ අහිකුණ්ඩිකයා අතැති කුඩා බෙරය හැඬවීම තුළිනි.

රූපවාහිනිය, ගුවන්විදුලිය, දුරකථනය, සෙලියුලරය, වැනි සන්නිවේදනය තාක්ෂණයේ ආරම්භයට පෙර සාම්ප්‍රදායික සන්නිවේදනය ලෙස පැවති තත් තූර්ය කාර්යාවලිය මහත් මෙහෙයක් ඉටු කරන ලද බව සැලකුව මනාය. උක්ත සියලු සාම්ප්‍රදායික හෝ අද්‍යතන විද්‍යුත් සන්නිවේදනය භාෂණය පදනම් වී ඇති බව විද්වත් මතය වී ඇත.[45] ඒ නයින්ම තූර්ය භාෂණය තුළ ප්‍රබල ප්‍රවනතාවයක් මත සන්නිවේදන ක්‍රියාවලිය පැවත ආ බව පෙනෙන කරුණකි ඒ වූ කලි තූර්ය භාෂණ ශබ්ද ශෛලිය ප්‍රකාශනයකි. අප්‍රිකානු ප්‍රාථමික ගෝත්‍රයන්හි පණිවුඩ යැවීම උදෙසා කථා කරන බෙර (Talking Drums) නම් බෙර විශේෂය





විද්වතුනගේ භාෂණයට ඉතා යෝග්‍ය නිදසුනකි.[46]

තත් සම්ප්‍රදායික තූර්යාංග මෙන්ම එහි භාෂණය, නුතන සන්නිවේදන මාධ්‍ය ජාලයන් ඔස්සේ ද අනේක විධ වාණිජමය ආයතන තුළ වෙළඳ ප්‍රචාරණය උදෙසා ද ප්‍රබල පවුරක් ලෙස භාවිතා කිරිම පෙනෙන්නට ඇති තත්ත්වයකි. උදාහරණ ලෙස ගත හොත් රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන ආයතනයන්හි ද වාදන අංග මෙන්ම තූර්ය සංකල්පිය භාණ්ඩ ආකෘතින් ද යොදා ගනිමින් තම අරමුණු සාක්ෂාත් කර ගනු සඳහා ක්‍රියත්මක වී ඇත. ඇතැම් විද්වතුන් පවසන්නේ කිසියම් සමාජයකට නව භාණ්ඩයක්, නව මතයක් හඳුන්වා දෙන විට එම සමාජයේ සංස්කෘතික හා සමාජ සම්බන්ධතා ජාලය මෙන්ම පුද්ගල ක්‍රියා සංජානන ක්‍රියාවලියටත් බලපෑම් එල්ල විය හැකි යන්නයි.[47] ඒ නයින්ම සාම්ප්‍රදායානුගත මෙවලම් මෙන්ම ක්‍රියාකාරමකම් හා අංග ප්‍රත්‍යාංග එකී හඳුන්වා දීමේ ක්‍රියාවලියට නතු වීමේදි පැහැදිලි සමාජ විපර්යාසයක් සිදුවනු නොඅනුමානය. අධ්‍යාත්මික සංවර්ධනයකට මෙන්ම අනන්‍යතාවයකට මාධ්‍ය ක්ෂේත්‍රය පෙරළීමට නම් කුමන හෝ රාජ්‍යයක මැදිහත්වීම සහ රටක හෘදය වස්තුව වන එහි අනන්‍ය සංස්කෘතිකාංග භාවිතයට ගැනීම බව සක්සුදක් සේ පසක් වන කරුණකි. ලාංකේය ජනශ්‍රැතිය තුළ තූර්යාංග සහ එහි භාෂණය ජාතික වශයෙන් මෙන්ම ජාත්‍යන්තර වශයෙන් භාවිතා වන්නක් බව නොරහසකි. එවැනි තත්ත්වයක් යටතේ උක්ත විෂය ක්ෂේත්‍රය පරිහානික ප්‍රවේශයන් කරා නොව එය සංරක්ෂිත පිළිවෙත් කෙරෙහි හුදී ජන පහන් ආකර්ෂණීය ප්‍රවේශයන් කරා යොමුවීම බෙහෙවින්ම කාලෝචිතය.

## මූලාශ්‍ර


1. *විජේතුංග, හරිස්චන්ද්‍ර , 1984, ප්‍රායෝගික සිංහල ශබ්ද කෝෂය, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යංශය, පළමුවැනි කාණ්ඩය, 824 පිටුව;*

2. *දිසානායක, මුදියන්සේ, 2001, නර්තන වාක් කෝෂය, ප්‍රථම මුද්‍රණය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 565 පිටුව;*

3. *බුද්ධදාස, ආර්., 1962, සුශ්‍රැත සංහිතා, ලංකාණ්ඩුවේ මුද්‍රණාලය, ප්‍රථම මුද්‍රණය, 2 පිටුව;*

4. *-------- එම -------- 1962, 2 පිටුව;*

5. සිරි අහුගොඩ මහතා සම- 2001 ජනවාරි 15 දින සම්මුඛ සාකච්ඡාව;

6. විජේවර්ධන, සරත්, 1994, සිංහල තිත් තාල ක්‍රමය, ප්‍රථම මුද්‍රණය, සංස්කෘතික දෙපාර්තමේනුතුව, 1 පිටුව;

7. පිය ජය විතාන මහතා සම- 2003 .12. 16 දින සම්මුඛ සාකච්ඡාව ;

8. බෙරන්නාවේ, ඩී., එච්., පොඩිඅප්පුහාමි මහතා සතු තත්කාල නිමිති නම් අත්පිටපතෙන් උපුටා ගන්නා ලදි;

9. බණ්ඩාර, කරුණාරත්න, 2002, සාම්ප්‍රදායික බෙර වාදනයේ සන්නිවේදන හා භාෂාමය ලක්ෂණ පිළිබඳ විමසුමක්, ලලිතකලා සාර සංග්‍රහය - 2, මුදියන්සේ දිසානායක ( සංස්කාරක ), විශ්වවිද්‍යාලයීය ලලිතකලා අධ්‍යාපනඥයින්ගේ සංගමය, 218 පිටුව;

10. කුමාරතුංග මුනිදාස, සිදත් ස-රා විවරණය, කේ. ඒ. ආරියදාස සහ සමාගම, 36 පිටුව;

11. -------- එම ------- 36 පිටුව;

12. අප්පුහාමි, ඇම්., ඇම්., පි., විජයරත්න, 1932, හොරාබරණය, සෙව්‍යශ්‍රී යන්ත්‍රාලය, දෙවන මුද්‍රණය, 8 පිටුව;

13. බටුවන්තුඩාවේ, රොබර්ම්, ගුත්තිල කාව්‍ය , සිමාසහිත රත්නාකාර යන්ත්‍රාලය, 1 පිටුව;

14. ජයතිලක, කේ., 1998, විමර්ශන සහිත තිසර සන්දේශය, දෙවැනි මුද්‍රණය, ප්‍රදිප ප්‍රකාශකයෝ, 45 පිටුව;

15. " විණා පද " යනු කුමන සම්ප්‍රදායික බෙර වාදනයේ දි තමා හැර අන් කවර වාදකයෙකු ඉස්මතුව එනු දැනුනු විට තම ප්‍රතිවාදියා මෙල්ල කරගැනිමට හෝ ඔහුගේ බෙරය බිදිමට පද වෙසෙසක් ලෙස ශාන්තිකර්ම ඇඳුරෝ සලකන්නකි;

16. යමියන්තොට සිරිසේන මහතා සතු අභින පද සහ විණා පද අඩංගු අත්පිටපතකිනි;

17. බෙරන්නාව, ඩී., එච්., පොඩි අප්පුහාමි මහතා සම- 2003.04.08 දින සම්මුඛ සාකච්ඡාව;





18. විජේතුංග, හරිස්චන්ද්‍ර, 1984, ප්‍රායෝගික සිංහල ශබ්ද කෝෂය, දෙවැනි කාණ්ඩය, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය , 1683 පිටුව;
19. -------- එම -------- 1984, 1683 පිටුව;

20. සේදරමන්, ජේ. ඊ., 1997, උඩරට නැටුම් කලාව, සිමාසහිත ගුණසේන සහ සමාගම, 01, 02 පිටු;

21. -------- එම -------- 1997, 01, 02, පිටු;

22. නයන ස්ථිවිර මහගොඩ, 1996, මහා වංශය, ප්‍රථමභාගය (සිංහල පරිවර්තනය) තෙවැනි මුද්‍රණය, 24 පිටුව;

23. විජේතුංග, හරිස්චන්ද්‍ර, 1984, ප්‍රායෝගික සිංහල ශබ්ද කෝෂය, දෙවැනි කාණ්ඩය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව , 1682 පිටුව;

24. නයන ස්ථිවිර මහගොඩ, ඉහත ග්‍රන්ථය, 1996, 134 පිටුව;

25. සෝරත හිමි වැලිවිටියේ, 1970, දළඳා සිරිත, ද්විතිය මුද්‍රණය, සිමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, 104 - 108 පිටු;

26. බණ්ඩාර, කරුණාරත්න, 2000, උඩරට බෙර වාදන කලාව, ප්‍රථම මුද්‍රණය, කතෘ ප්‍රකාශනයකි, තරංජි ප්‍රින්ටර්ස් මහරගම, 196 පිටුව;

27. මහගොඩ නයන ස්ථවිර, 1996, මහා වංශය, ප්‍රථම භාගය, (සිංහල පරිවර්තනය) සිමාසහිත දිපානි මුද්‍රණය, තෙවැනි මුද්‍රණය, 98 පිටුව;

28. -------- එම -------- 1996, 99 පිටුව;

29. සිරි අහුගොඩ මහතා සම- 2001.01.15 දින සම්මුඛ සාකච්ඡාව;

30. ඇතුගල, ආරියරත්න, 1998 , සංජානනය සහ සන්නිවේදනය, සිමාසහිත ඇම්.ඩී.ගුණසේන සහ සමාගම , 208 පිටුව;

31. කැණවිමලහිමි කිරි ඇල්ලේ, 1948, සිතියම් සහිත සද්ධර්මාලංකාරය, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 263 පිටුව;

32. සිංහල නර්තනයේ වේගය විලම්භ, මාධ්‍ය, ධන යනුවෙන් ලයමානයන් වශයෙන් ප්‍රභේද තුනක් වෙත්. එහි අඩුම වේගය ලය ලෙස නර්තන හා වාදන විෂය ක්ෂේත්‍රයන්හි භාවිතා කෙරෙත්;
33. බෙරන්තාවේ සිරිසේන ගුරුන්නාන්සේ සම- 1998.02.05 දින සාකච්ඡාව;
34. සෝරත හිමි වැලිපිමියේ, 1970, දළදා සිරිත, ද්විතිය මුද්‍රණය, සීමා සහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 105 පිටුව;

35. -------- එම -------- 1970, 106 පිටුව;

36. ගයිගර්,මධ්‍යම කාලීන ලංකාවේ යුධ සේනා හා යුධ, (පොලොන්නරු යුගය), 1966, තිසර ප්‍රකාශකයෝ, 186 පිටුව;

37. සිරි අනුගොඩ මහතා සම- 2001.01.05 දින සාකච්ඡාව;

38. පියසාර ශිල්පාධිපති, සංඛ, මුදියන්සේ දිසානායක, මියුරින් අබේවික්‍රම, 1998, සිංහල බෙර වාදන සහ සන්නිවේදන විධි ක්‍රම, සංස්කරණය සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, බෙර පිළිබඳ විශේෂ කලාපය , 33 පිටුව;

39. -------- එම -------- 1998, 32 පිටුව;

40. කැගල්ල රත්නපුර ප්‍රදේශයෙහි මෙය පුරප්පට්ටුව ලෙස විසුරුවයි.

41. බෙරන්තාවේ විසු සිරිසේන මහතා සම- 1998.02.05 දින සම්මුඛ සාකච්ඡාව;

42. -------- එම -------- 1998.02.05;

43. බණ්ඩාර, කරුණාරත්න, සාම්ප්‍රදායික බෙර වාදනයේ සන්නිවේදන හා භාෂාමය ලක්ෂණ පිළිබඳ විමසුමක් , ලලිත කලා සාර සංග්‍රහය - 2, 2002, 215 පිටුව;

44. 2002.04.18 දින යමියන්තොට දොංඹිපොළ පදිංචි සාපින් නෝනා මහත්මිය ලබා දෙන ලදි.

45. ඇතුගල, ආරියරත්න, 1998, ඉහත ග්‍රන්ථය, 207 පිටුව;

46. බණ්ඩාර කරුණාරත්න, ඉහත ග්‍රන්ථය, 2002, 215 පිටුව;

47. ඇතුගල, ආරියරත්න, 1998, ඉහත ග්‍රන්ථය, 207 පිටුව;





17

# විශේෂාංග ලිපි රචනය

චන්දන විජේකෝන්

පුවත්පතක විශේෂාංග පිටුව ලෙස සාමාන්‍යයෙන් සලකනු ලබන්නේ කතුවැකිය තිබෙන පිටුවයි. නමුත් සමහර පුවත්පත්වල කතුවැකිය මුල් පිටුවේ පළ වෙයි. එබඳු පුවත්පත් බොහෝමයක විශේෂාංග ලිපි පළවන්නේ ඇතුළු පිටුවලය. විශේෂයෙන් මුල් පිටුවේ පළවන කාලීන ප්‍රවෘත්ති විචාරශීලීව විග්‍රහ කර විශේෂාංග ලිපි ලෙස පළවන්නේ මේ පිටුවලය. විශේෂාංග පුවත් හෙවත් ලිහිල් පුවත් පිළිබඳ කරන විග්‍රහයේදී ඒවා වර්ග කීපයකට බෙදා දැක්වීමට පුළුවන.

## ප්‍රධාන පෙළේ ප්‍රවෘත්ති පදනම් කර ගත් විශේෂාංග

නිදසුනක් ලෙස හෙරොයින් රට තුළට ගෙන ඒම සඳහා ප්‍රධාන පෙළේ ව්‍යාපාරිකයන් යැයි කියා ගන්නා පිරිසක් දරන උත්සාහය ගැනත් හෙරොයින් බෙදා හැරීමට පාතාල ලෝක සාමාජිකයන් දරන වෑයම ගැනත් පුවත් පතක මුල් පිටුවේ ප්‍රවෘත්තියක් පළ විය හැකිය. එම ප්‍රවෘත්තියට ගැළපෙන ලෙස " පාතාලේ රජ කරවන කුඩු " නමින් විශේෂාංග ලිපියක් ලිවිය හැකිය. මත්ද්‍රව්‍ය භාවිතයේ ආරම්භය, එය ව්‍යාප්තිය ලෙස විකාශනය වී අප රට තුළට ආ අන්දම, අද පවතින ස්වභාවය, ලෝක ප්‍රශ්නයක් වී ඇති අන්දම, මේ සඳහා ගත යුතු පිළියම් යනාදී කරුණු ඔස්සේ සාරවත් විශේෂාංග ලිපියක් හෝ ලිපි පෙළක් ලිවීමට පුළුවන. මනෝ විද්‍යාඥයන්, සමාජ විද්‍යාඥයන්, පොලිස් දෙපාර්තමේන්තුව හා විවිධ උගතුන්

' කළ පර්යේෂණ විවරණ මෙහිදී උපයෝගී කැර ගැනීම උචිතය.

## පුද්ගල චරිත වටා ගෙතුණු විශේෂාංග

නිදසුනක් ලෙස " රජීව් ගාන්ධි ඝාතනය " වැනි සිද්ධියක් තෝරා ගත හැකිය. මෙහිදී ඉන්දියාවේ ගාන්ධි පරපුර දේශපාලනය හා ඇති සම්බන්ධතාව, රජීව් ගාන්ධිගේ දේශපාලන කටයුතු සහ ලෝකයට ඒවා බලපෑ අයුරු එහි ප්‍රබලතා හා දුර්වලතා ඝාතනයේ ස්වභාවය යනාදී කරුණු එක්රැස් කොට සාරවත් විශේෂාංගයක් ලිවිය හැකිය.

## සමාජ ප්‍රශ්නයක් පිළිබඳව ගොඩනැගුණු විශේෂාංග

නිදසුනක් ලෙස " ශ්‍රී ලංකාවේ අපරාධ "ගැන විශේෂාංගයක් ලිවිය හැකිය. අපරාධ නිසා බියට පත් වී ඇති සමාජය, වසරකට සිදුවන අපරාධ සංඛ්‍යාව, ඒවායේ ස්වභාවය, අපරාධ වැඩි වන්නේ ඇයි යන අපරාධ කරුණු ඇතුළත් කර ගනිමින් විශේෂාංගය හෝ විශේෂාංග පෙළක් රචනා කළ හැකිය.

## කාලීන විශේෂාංග

නිදසුනක් ලෙස " ශ්‍රී ලංකාවේ මානව හිමිකම් "ගැන විශේෂාංගයක් ලිවිය හැකිය. මිනිසාගේ මූලික අයිතිවාසිකම් මොනවාද? ඒවා ක්‍රියාත්මක කිරීමට ඇති බාධක මොනවාද? බලයට ආ ආණ්ඩුව මානව අයිතිවාසිකම් රැක ගැනීමට ගෙන ඇති පියවර මොනවාද? ඒවායේ ප්‍රබලතා හා දුබලතා යනාදිය මෙබඳු විශේෂාංගයක් ලියන විට සැලැසුම් කර ගැනීම සුදුසුය.

## සම්මුඛ සාකච්ජා ඇසුරින් සැකසෙන විශේෂාංග

නිදසුනක් ලෙස, පවතින ආර්ථික අර්බුදය ගැන හෝ දේශපාලන ව්‍යාකූලත්වය ගැන හෝ ඒ ඒ ක්ෂේත්‍රවල වියතුන් සම- කරන ලද සම්මුඛ සාකච්ජාවකින් හෝ විශේෂාංගයක් සකස් කිරීමට පුළුවන. මෙහිදී විශේෂාංග ලේඛකයාට අදාළ විෂය ගැන හොඳ අවබෝධයක් තිබිය යුතුය. විශේෂාංග ලේඛකයා, තමා කථා කිරීමට යන විෂය පිළිබඳ අවබෝධයකින් නො සිටිය හොත් සාර්ථක සම්මුඛ සාකච්ජාවක් පැවැත්විය නොහැකිය. එසේම ඔහු එහිදී විශේෂාංග





සකස් කරන්නේද අනවබෝධයකිනි.

## විචාර විශේෂාංග

නිදසුනක් වශයෙන් දිනපතාම පුවත්පතකට විවිධ පුවත් ලැබේ. සිනමාව, කාව්‍ය, නිර්මාණ මෙන්ම සමාජ, ආර්ථික හා දේශපාලන කටයුතු අරභයා ලියැවුණු ග්‍රන්ථ ද මේ අතර වෙයි. මෙම ග්‍රන්ථ පිළිබඳව ශාස්ත්‍රීය පදනමක පිහිටා ඒවායේ ප්‍රබලතා හා දුර්වලතා ගැන මැදිහත්ව විචාරයකට භාජනය කරමින් විශේෂාංග සකස් කිරීමට පුළුවන.

## සාහිත්‍ය වර්ණනාකමකින් යුක්ත විශේෂාංග

නිදසුනක් ලෙස පුවත්පත්වල ඉදිරිපත් වන නිර්මාණශීලි රචනාවක් මෙයට ඇතුළත් වෙයි. මේ කිසියම් සිද්ධියක් හෝ අවස්ථාවක් පිළිබඳ ප්‍රාණවත් ශෛලියකින් ලියන ලිපියකි. ප්‍රවීණ ලේඛකයන්ගේ අදහස් යොදා ගනිමින් කරන නිර්මාණ මෙයට ඇතුළත් වෙයි. විශේෂයෙන් මෙවැනි නිර්මාණ පදනම් කර ගනිමින් සකස් කරන විශේෂාංගවලින් නව චින්තනයක් පුබුදු කිරීමට ශක්තිය ලැබෙයි.

## විශේෂාංග රචනයේදී සැලකිය යුතු කරුණු

විශේෂාංග රචකයාට තියුණු ඇසක් සන්සුන් මනසක් විචාර බුද්ධියක් හා ප්‍රබල මතයක් අනිවාර්යයෙන්ම තිබිය යුතුය. රසවත් වූ වැකි යෙදූ පමණින් එය විශේෂාංගයක් ද වන්නේ නැත. විශේෂයෙන් ආරම්භය විකාශනය, අවසානය ක්‍රමවත්ව සැලැසුම් මත සකස් විය යුතුය.

## විෂය තෝරා ගැනීම

විශේෂාංගයක් ලිවීමේදී තෝරා ගනු ලබන්නේ විශේෂ අවස්ථාවක්, සිද්ධියක් මිස සාමාන්‍ය සරල අවස්ථාවක් නොවේ. සරල අවස්ථාවක් පදනම් කරගෙන විශේෂාංගයක් ලිවීමට නොහැකිය යන්න එහි තේරුම නොවේ. සාමාන්‍ය තත්ත්වයක් තුළ ක්‍රියාත්මක විය හැකි අසාමාන්‍ය දෙයක් (සාමාන්‍ය නොවූ අවස්ථාවක්) දක්ෂ විශේෂාංග රචකයෝ තෝරා ගැනීමට මැළි නොවෙති. නිදසුනක් වශයෙන් කොළඹ නගරයේ අද වන විට හෝටල් සිය ගණනක් තිබේ. දිනපතාම මේ හෝටල්වලට ආහාර

ගැනීමට විවිධ මාදිලියේ පිරිස් පැමිණෙති. දක්ෂ විශේෂාංග රචකයෙකුට මේ පිරිස්වල ඇබ්බැහි වීම්, පුරුදු, චාරිත්‍ර, යෙදුම් මෙන්ම සමහර හෝටල් පදනම් කර ගෙන සිදු වන ජාත්‍යන්තර මට්ටමේ හොර ජාවාරම් ඔස්සේ විශේෂාංගයකට මාතෘකාවක් සොයා ගැනීමට පුළුවන.

විශේෂාංග සඳහා විෂයන් තෝරා ගැනීම ඒ තරම් අපහසුකාර්යක් නොවේ. පුවත්පත හෝ වෙනත් මාධ්‍යයක් ඒ සඳහා බොහෝ දුරට අවශ්‍ය පසුබිම සපයයි. බොහෝ විට පුවත්පත්වල ප්‍රධාන ප්‍රවෘත්ති ලුහු බැඳ ( follow - up ) යෑමත් ඒ පිළිබඳව නිතර අවධානයෙන් සිටීමත් විශේෂාංග රචකයකු කළ යුතු දෙයකි.

## මූලාශ්‍ර රැස් කිරීම

විශේෂාංග රචනය සඳහා තොරතුරු හා මූලාශ්‍ර රැස් කිරීමේදී නිවැරැදි තොරතුරු ඉදිරිපත් කිරීමට විශේෂාංග රචකයා උනන්දු විය යුතුය. මාතෘකාවට අදාළ මූලාශ්‍ර හා තොරතුරු රැස් කළ යුත්තේ කෙසේද? විශේෂාංගයක් ලිවීමේදී විශේෂාංග රචකයා මෙම ගැටලුවට මැදි වෙයි. මූලාශ්‍රවල ශක්තිමත්කම විශේෂාංගයේ සාර්ථක හා අසාර්ථකභාවය තීරණය කරනු ලබන සාධකයයි. සමහර විශේෂාංගයකදී එම ක්ෂේත්‍රයේ ඒ අවස්ථාවට නිරීක්ෂකයකු ලෙස සහභාගී වීමට ජනමාධ්‍යවේදියාට සිදුවේ. තවත් අවස්ථාවක සම්මුඛ සාකච්ඡාව මගින්ද කරුණු රැස් කිරීමට සිදුවෙයි. ලේඛනාගාරය සහ පුස්තකාල ඇසුරු කරගෙන පැරැණි පත පොතද වාර්තාද තෝරාගත් විශේෂාංගය පිළිබඳ විශේෂඥයන් ද ඇසුර ද සමහර විට මූලාශ්‍ර රැස් කිරීමට උපකාරී විය හැකිය. මෙ මඟින් විශ්වසනීය ලෙස විශේෂාංග ඉදිරිපත් කිරීමට අවස්ථාව යෙදෙයි. නිදසුනක් ලෙස ඇතැම් රාජ්‍ය ආයතනවල නිලධාරීන් කරන නීති විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් ලිවීමට අදහස් කරන ලේඛකයාට සෘජුව ජනමාධ්‍යවේදියෙකු ලෙස එම රාජ්‍ය ආයතනවලට ඇතුළු වීමට අවස්ථාව නොලැබී යා හැකිය. ඒ වන විට නියමිත තොරතුරු හා දත්තයන් ලබා ගැනීම සඳහා විවිධ උපක්‍රම අනුගමනය කිරීමට සිදු වෙයි. සමහර විට එම ආයතන වල වෘත්තීය සමිති නියෝජිතයන්, සාමාන්‍ය සේවකයකු හෝ මෙම ආයතනය සමග සම්බන්ධතා පවත්වන සේවා දායකයකු මුණ ගැසීමට සිදු වන අවස්ථා තිබේ. තවත් සමහර අවස්ථාවල ආයතන හා සම්බන්ධ වෙනත් සංවිධානයක සේවකයෙකු, සේවා දායකයෙකු, පාරිභෝගිකයෙකු ලෙසින් පෙනී සිටිමින් තොරතුරු ලබා ගැනීමට පුවත්පත් කලාවේදියාට සිදු වෙයි.





## මූලික සැලැස්ම

සාර්ථක විශේෂාංගයක් රචනා කිරීමට පෙර විශේෂාංග ලේඛකයකු කළ යුතු කාර්යක් තිබේ. තමන් රැස්කර ගත් මූලාශ්‍ර ඇසුරින් මූලික සැලැස්මකට අවශ්‍ය කරන දළ සටහනක් සකස් කළ යුතුය. මෙම දළ සටහන මගින් විශේෂාංගයේ වඩාත් උචිත සිත් ගන්නා අවස්ථාව තීරණය කර ගැනීමට පහසු වෙයි. එමෙන්ම පාඨක අවධානය හසු කර ගන්නා ආකාරය ගැන යම් නිගමනයන්ට එළැඹිය හැකිය. මාතෘකාවක් ගැන විශේෂාංග ලේඛකයා සැලැසුම් කර ඒ මත පිහිටා සිය විශේෂාංගය ලිවිය යුතුය. විශේෂාංග ලේඛකයාට සිතැ- පරිදි විශේෂාංගය ඇරඹිය හැකිය. එයට සංවාදයක්, දෙබසක්, උපමාවක්, කුඩා ප්‍රවාදයක් නිශ්චිත වේලාවක්, කතන්දරයක් ආදි කවර හෝ ආකාරයකින් භාවිත කළ හැකිය. මේ කුමන ආකාරයෙන් විශේෂාංගය සකස් කළත් එය සෘජුවම මාතෘකාවට අදාළ වීම ඉතා වැදගත්ය.

විශේෂාංග රචකයා සකස් කැර ගනු ලබන සැලැසුම සමග ඉදිරිපත් කරන ශෛලිය පිළිබඳව යම් තීරණයකට එළැඹීම වැදගත්ය. එය ඒ ඒ විශේෂාංගයේ ස්වරූපය විෂය මත වෙනස් විය හැකිය. නිදසුනක් වශයෙන් ධාරානිපාත වැස්සකින් නාය යෑමකට ලක් වූ කඳුකර ප්‍රදේශයකට ගොස් ලියන විශේෂාංගය අනුවේදනීය ශෛලයකින් සිද්ධි, විස්තර, දෙබස් සහිතව ලිවිය හැකිය. වෙන කාලවලට වඩා වී අස්වැන්නක් ලැබුණු අම්පාර ප්‍රදේශය පදනම් කැරගෙන ලියැවෙන විශේෂාංගයකදී එම ප්‍රදේශයේ ජනයා වහරන බස, පද්‍ය, මිනිසුන්ගේ ඇදහිලි ක්‍රම ආදිය සැලකිල්ලට ගත යුතුය. නව ප්‍රතිසංස්කරණයන්ට ලක් කළ ඉපැරැණි පන්සලක් පිළිබඳව ලියැවෙන විශේෂාංගය ඉහත නිදසුන් දෙකකට වඩා වෙනස්ව ලිවිය යුතුය. බෞද්ධ දර්ශනයේ යම් යම් අවස්ථා විස්තර කිරීම, ගාථා ඉදිරිපත් කිරීම ඊට පිටු බලයක් වෙයි. කෙසේ නමුත් විශේෂාංගයේ ප්‍රස්තුතයට වඩා පහසුවෙන් එහි ශෛලිය පාඨකයාට තේරුම් ගැනීමට වටහා ගැනීමට පුළුල් ඉඩ කඩ සපයා දෙන අත්වැලක් විය යුතුමය.

විශේෂාංගයක ඡේද ප්‍රවෘත්තියක ඡේදවලට වඩා පුළුල් බවක් පෙන්නුම් කරයි. එහි භාෂාව සරල මෙන්ම සාහිත්‍යමය බවක් පෙන්නුම් කරයි. මේ හැම උපක්‍රමයකම අරමුණ විය යුත්තේ පාඨකයාගේ අවධානය රඳවා තබා ගෙන ඒ පිළිබඳව ආශ්වාදයක් අවබෝධයක් ලබා දීමයි. එසේම විශේෂාංගයකට ආලෝකය මෙන්ම විශ්වසනීය බවක් ලබා දෙන්නේ ඒ සඳහා භාවිත කරන ඡායාරූප හා යම්

යම් රූප සටහන් මගිනි. එම නිසා මේ පිළිබඳව මූලික අවස්ථාවේදීම විශේෂාංග ලේඛකයා උනන්දු විය යුතුය.

## පුනරීක්ෂණය

විශේෂාංග ලේඛකයෙකුට තමා සකස් කළ දළ සැකැස්ම දෙස ප්‍රවීණයෙකුසේම සාමාන්‍ය පාඨකයෙකු ලෙසද බැලීමට හැකියාව තිබිය යුතුය. තමා සකස් කළ දළ සටහනේ තිබෙන අඩුපාඩු මෙන්ම නිවැරැදි කළ යුතු තැන් ගැන අවධානය යොමු කිරීම වැදගත්ය. මෙයට අමතරව නොගැළපෙන තැන්, ගොනු කළ කරුණුවල තිබෙන ඌණතාවන් සකස් කිරීමට උත්සාහ කළ යුතුය. විශේෂාංගයක භාෂාමය දුබලතාවන් තිබේ නම් ඉහත කරුණු කාරණා කොපමණ නිවැරැදි වුවත් නිසි ප්‍රතිඵලයක් ලබා ගැනීමට හැකියාවක් ලැබෙන්නේ නැත. ඒ ගැන විශේෂාංග රචකයකු නිරන්තරයෙන් අවධානය යොමු කළ යුතුය.

## ඉදිරිපත් කිරීම

විශේෂාංග රචකයා තමා ලියන අත් පිටපත ගැන නිතර අවධානය යොමු කළ යුතුය. පේළි අතර ඉඩ තබා ලිවිය යුතු අතර සිංහල හා දෙමළ පුවත්පත් මේ ක්‍රමය භාවිත කරයි. මෙසේ පේළි අතර ඉඩ තැබීමට හේතුව විශේෂාංග කතුවරයාට හෝ සංස්කාරකවරයාට හෝ උප කර්තෘවරුනට පිටපත සංස්කරණය කැරගැනීම පහසු කරවීමටය.





# 18

# අද්‍යතන රූපවාහිනී මාධ්‍ය සහ ජනප්‍රිය සංස්කෘතික ප්‍රාග්ධනයේ ක්‍රියාකාරීත්වය

**විජේසිංහ දිසානායක**

සමාජ සංස්කෘතික විචලයයන් පවුල් ව්‍යුහීය රටාවන් කෙරෙහි සෘජුවම බලපෑම් කරයි. අද්‍යතන ජනප්‍රිය සංස්කෘතික වටිනාකම් පොදුවේ සමාජය තුළ ක්‍රියාත්මක වන ආකාරය මෙහි විග්‍රහයට ලක් කෙරේ. නූතන පවුල ජනප්‍රිය සංස්කෘතික භාවිතය තුළ මුහුණපාන ගතිකත්වය තේරුම් ගැනීම සඳහා ජනප්‍රිය සංස්කෘතිය පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් ලබා ගත යුතු වේ.

කිසියම් සමාජයක නිෂ්පාදනය වන සංස්කෘතිකාංග ඒ සමාජයේ අධිපති නිෂ්පාදන රටාව මෙහි හිමි පන්තියේ අවශ්‍යතා, විශ්වාස, වටිනාකම්, දර්ශනය පිළිබිඹු කරයි යන මාක්ස්වාදී විග්‍රහය තුළින් අධිපති මතවාදය (Dominant Ideology) යන්න බිහිවී තිබේ. “ ඒ අනුව ජනප්‍රිය සංස්කෘතිය යනු කිසියම් සමාජ රටාවක ආර්ථික බලය හිමිකර ගෙන සිටින පංතිය, තම අදහස් උදහස් ජනතාව වෙත එන්නත් කිරීම සඳහා නිර්මාණය කරන ලද්දක්ය යන්න මාක්ස්වාදී විචාරකයින් දරන මතයයි.” [1] මෙයට අනුව ධනවාදයේ තුන්වන කාර්තුවේදී ආර්ථික බලය හිමි පංතියේ සංස්කෘතික පරාවර්තනයක් ලෙස ජනප්‍රිය සංස්කෘතිය ව්‍යුත්පන්න වේ. ජනප්‍රිය සංස්කෘතිය හඳුනා ගැනීමේදී භාවිතකරන තවත් එළඹුමක් වන්නේ කාර්මීකරණයත් සම- හටගත් සමාජ විපර්යාසයේ ප්‍රතිඵලයක් ලෙස මෙම සංස්කෘතික ප්‍රවණතාව මතුවී ඇතැයි යන්නයි. කාර්මික සහ ප්‍රංශ විප්ලවවලින්

පසුව යුරෝපයේ ඇති වූ වෙනස්කම් ඩැනියෙල් බෙල් විසින් " The coming of post Industrial Society " නම් ග්‍රන්ථයේ මූලික කරුණු තුනක් ඔස්සේ විස්තර කර තිබේ.

I සේවා ආර්ථිකයක් උදෙසා වූ භාණ්ඩ නිෂ්පාදනයෙන් ඉවත්වී නව සේවා ආර්ථිකයක් ඇති වීම.

II නව වෘත්තීය, තාක්ෂණික පංතියක් මතුවීම.

III නව දේශපාලනික ඥානයකින් හෙබි පංතියක් බිහිවීම.

මෙම තත්ත්වයන් අද්‍යතන ජනප්‍රිය සංස්කෘතිය ප්‍රවර්ධනයෙහිලා විශාල බලපෑමක් කර තිබේ. නූතන පවුලේ හි සංස්කෘතික විචලයයන් තීරණය වන්නේද මෙයට අනුවයි.

විසිවන සියවසේ අගභාගය වනවිට ප්‍රධාන ධාරා තුනක් ඔ්-න් සංස්කෘතිය විදග්ධ සහ ජනප්‍රිය ලෙස බෙදා විග්‍රහ කරනු ලැබ ඇත. ඉංග්‍රීසි සාහිත්‍ය විචාරවාදීන් දෙදෙනෙකු වශයෙන් ප්‍රසිද්ධ වී සිටි එෆ්.ආර්.ලිවිස්. සහ කිව්. ඩී. ලිවිස්. යන අය මේ පිළිබඳ අදහස් දැක්වූ ලිබරල් මතධාරීහු වෙති. ෆ්‍රැන්ක්ෆර්ට් ගුරුකුලයේ තියොඩෝර් ඇඩර්නෝ සහ හර්බට් මාකියුස් යන මතධාරීන්ගේ අදහස් වූයේ සංස්කෘතික ක්‍රියාවලින් තීරණය කරන්නේ නිෂ්පාදන ප්‍රකාරය බවයි. " සංස්ථාපිත ධනවාදය යටතේ ශ්‍රමිකයා ඉතා දැඩි ලෙස පරාරෝපණය වී සිටින අතර ශ්‍රමිකයා විවේකය සඳහා තමන් වෙනුවෙන් ඇරි තිබෙන කාලය හුදු විනිමය භාණ්ඩ නිෂ්පාදනයක් පමණි "[2] පොදු ජනතාව පාලක පංතියේ මතවාදයට යටත් වී සිටින හෙයින් ජනප්‍රිය සංස්කෘතිය ද අධිපති මතවාදයට යටත්ව තිබෙන බවත්, එසේ වුවද විදග්ධ සංස්කෘතිය එතරම්ම එහි බලපෑමට හසුවී නොමැති බවත්, ලුවී අල්තුසර් ඇතුළු අධිපති මතධාරීහු අදහස් කරති. " ග්‍රාම්ස්චිට අනුව ජනප්‍රිය සංස්කෘතිය යන්න ජනතාව ස්වකීය සංස්කෘතිය ගොඩන-න තැනක් හෝ එය විකෘති කරන තැනක් හෝ නොවේ. ඒ වූ කලී එකිනෙකට ප්‍රතිවිරෝධීව ක්‍රියාකරන ප්‍රවණතාවන් සහ පීඩනයන් විසින් සමාජ සම්බන්ධතා හැඩගන්වන බල ක්ෂේත්‍රයයි"[3] (hegemony). මාක්ස්වාදී විග්‍රහයට අනුව මිනිසුන්ගේ සංස්කෘතික භාවිතයන් හුදෙක් පන්ති ප්‍රතිවිරෝධතා නියමය අනුව, එනම් පාලක පාලිත පන්තීන් අතර සිදු වන ගැටුම අනුව සිදු වෙතැයි විග්‍රහ වේ. මාක්ස් ඉදිරිපත් කළ මෙම





අදහස් ලෙනින් සහ නව මාක්ස්වාදීන් විසින් තව දුරටත් වැඩි දියුණු කර තිබේ.

ග්‍රාම්ස්චිගේ අදහස වන්නේ මිනිසුන්ගේ සංස්කෘතික භාවිතයන් හුදෙක් පන්ති ප්‍රතිවිරෝධිතා නියමය අනුව, එනම් පාලක පාලිත පන්තීන් අතර සිදුවන ගැටුම අනුව පමණක් විග්‍රහ කළ නොහැකි බවයි. ධනවාදී සමාජය තුළ ජීවත් වන ඉහත පාර්ශව දෙක තුළ ඇත්තේ " හුදෙක් අල්තුෂර් අවධාරණය කරන ආධිපත්‍ය හෙවත් dominance සඳහා කෙරෙන අරගලයම පමණක් නොවේ. එහි හෙජමනිය ( Hegemony ) හෙවත් අණසක සඳහා කෙරෙන අරගලයද ඇත. "[4] හෙජමනිය යන වචනයෙන් අර්ථ ගැන්වෙන්නේ හුදෙක් රාජ්‍ය බලය ලබා ගැනීම සඳහා සෙන්ද්‍රිය පන්තීන් අතර සිදුවන අරගලය පමණක් නොවේ. තමතමාගේ සදාචාර මිනුම් දඬු සංස්කෘතික ඇගයුම් මතු කර ගැනීම සඳහා කරන අරගලය ද එයට ඇතුළත් වෙයි. ජනප්‍රිය සංස්කෘතිය යනු පුළුල් අර්ථයකින් ගත්කළ හෙජමනිය පවත්වා ගැනීම සඳහා පන්තීන් අතර සැම විටම අරගල කරමින් මෙම ක්ෂේත්‍රයන්හි ක්‍රියාත්මක වේ. ජනප්‍රිය සංස්කෘතිය යන්න බල ක්ෂේත්‍රයකි. ඒ තුළ බල සම්බන්ධතාවන්ගේ අරගලයන් සිදුවේ.

මෙම බල සම්බන්ධතා අධිපතිධාරී, පරාධීන හෝ ප්‍රතික්ෂේප වන්නා සේම මේවා පාලකයන්ගේ හෝ පාලිතයන්ගේ හෝ විය හැකිය. බොහෝවිට ජනප්‍රිය සංස්කෘතිය තුළ කෙරෙන අරගල සිදුවන්නේ මිනිසුන්ගේ එදිනෙදා දෛනික සංස්කෘතික වටිනාකම් සඳහාය. ඒ අතර මිපා දූප, ආහාර පාන, විනෝදය, ඇඳුම් පැළඳුම්, හැසිරීම් රටාව, ජීවිත ශෛලිය හෝ ශ්‍රම ක්‍රියාකාරිත්වය ආදිය අන්තර්ගත විය හැකි වේ.

අද්‍යතන සමාජයේ ජනප්‍රිය සංස්කෘතික භාවිතය සඳහා ප්‍රාග්ධන ක්‍රියාකරීත්වය ප්‍රබල දායකත්වයක් සපයා තිබේ. ජනප්‍රිය සංස්කෘතිය සම්පාදනය වන්නේ සංස්කෘතික කර්මාන්තය විසින් නිපදවා සංස්කෘතික භාණ්ඩ හා ඒවා භුක්තිවිඳින මිනිසුන්ගේ එදිනෙදා ජීවිතය අතර තිබෙන අවකාශය තුළයි. බෝර්ඩියෝ ( Bourdieu ) ජනප්‍රිය සංස්කෘතික ප්‍රාග්ධනය පිළිබඳව පුළුල්ව විශ්ලේෂණයක් කර තිබේ. යම් සංස්කෘතික භාණ්ඩ නිෂ්පාදනය කරන පුද්ගලයෙක් හෝ ආයතනයක් අර්ථ ( meanings ) සහ සුඛ ( pleasure ) නිෂ්පාදනය කර බෙදා හැරීම බූර්ඩියෝ විසින් විග්‍රහ කරනු ලැබේ. ජනප්‍රිය සංස්කෘතික මූලධනයට අදාළ තවත් සංකල්පයක් මොහු විසින් ඉදිරිපත් කෙරේ. එනම් ආර්ථික මූලධනය වේ.

" සංස්කෘතික මූල ධනය තවත් ආකාරයකට විග්‍රහ කරන විචාරකයෝ කිසියම් සමාජයක පහළ පංති ස්තරවල වෙසෙන ජනතාවට සන්තෘෂ්මිය හා අරුත් ලබා දෙන සංස්කෘතික භාණ්ඩ නිෂ්පාදනය කරන්නට ඒ සමාජයේ කලා ශිල්පීන් තමන්ගේ කුසලතා ආයෝජනය කිරීමේ දී ද සංස්කෘතික මූල ධන ආයෝජනයක් සිදුවන බව පෙන්වා දෙති "[5] මෙම ප්‍රවේශ දෙක මගින් වැදගත් කරුණු කිහිපයක්ම හෙළිවේ. එනම් මාක්ස්වාදී අධිපති මතවාදය සහ ව්‍යාජ සවිඥානිකත්වය ( falls consciousness ) පිළිබඳ අදහසට ප්‍රබල පහරක් එල්ල කරන ජනප්‍රිය සංස්කෘතිය තුළ ඇති සන්තුෂ්මී ජනක මූල ධනය පහළ සමාජ ස්ථරවල ජන කොටස්වලට තම අවශ්‍යතා ඉටු කර ගන්නට සහ ඒවා ප්‍රවර්ධනය කර ගන්නටත් යොදා ගැනීමට හැකිය යන අදහස ප්‍රධාන වේ. අතීතයේ ප්‍රබල සමාජානුයෝජන මාධ්‍ය බවට පත්වූ පවුල, පාසල, ආගම ආදිය වර්තමානයේ අක්‍රිය තත්ත්වයකට පත්වෙමින් පවතී. පංති ස්ථර බේදයකින් තොරව අද්‍යතන විද්‍යුත් සහ වෙනත් මාධ්‍ය පොදුජනතාවගේ ආගම බවට පත්ව ඇත. මෙය ජනප්‍රිය සංස්කෘතික භාවිතයත් සම- ක්ෂණිකව සහ පුළුල්ව ව්‍යාප්ත වීම සිදුවේ. " රූපවාහිනියත් එහි සමහර වැඩ සටහනුත් ජනප්‍රිය සංස්කෘතික ප්‍රාග්ධනය හෙවත් Popular cultural capital වශයෙන් ක්‍රියාකරන බව අප හඳුනා ගත යුතුය. "

පියරේ බෝර්ඩියෝ ( pierre Bourdieu ) දක්වන අදහසට අනුව ප්‍රාග්ධනය ආර්ථික හා සංස්කෘතික වශයෙන් කොටස් දෙකකට බෙදේ. සාමාන්‍යයෙන් සංස්කෘතිය ගැන කතාකරන විට ආර්ථිකය පිළිබඳ සාකච්ඡා නොකළ ද ආර්ථික සහ සංස්කෘතිය එකිනෙකට ස්වාධීනව සහ සමගාමීව ක්‍රියාත්මක වන අර්ථ ක්‍රම දෙකක් පවතී. වෙළඳපළේ ඇති වෙනත් හුවමාරු භාණ්ඩයක් මෙන්ම කිසියම් රූපවාහිනී ආඛ්‍යානයක් ද හුවමාරු වටිනාකමකින් යුක්ත වේ. කෙසේ වුව ද එම වෙළඳපළේ ඇති හුවමාරු භාණ්ඩ සහ සංස්කෘතික හුවමාරු භාණ්ඩ අතර විවිධ විභේදනයන් ද අන්තර්ගත වේ.

" රූපවාහිනී මාධ්‍ය මගින් නිෂ්පාදනය කොට බෙදාහරිනු ලබන ජනප්‍රිය සංස්කෘතික නිෂ්පාදන ජනතාව තුළ පැවති ජනසංස්කෘතික වටිනාකම් වේ. ජනතාව විසින් ජනතාව උදෙසා නිෂ්පාදනය කළ ජනසංස්කෘතික අංග රූපවාහිනී මාධ්‍ය මගින් ප්‍රතිනිෂ්පාදනය කොට, එම මාධ්‍යයෙහි කුඩා කණ්ඩායම් මගින් ගොඩනංවා බෙදාහරින තත්ත්වයකට වර්තමානයේ පත්ව තිබේ. රූපවාහිනී මාධ්‍ය මගින් ප්‍රාග්ධන සංකේන්ද්‍රණ ක්‍රියාවලියේ දී ජනප්‍රිය සංස්කෘතික ගොඩනැංවීම් සිදු කරනු දැකිය හැකි වේ. "





**Culture of, by and for The people**




ජනප්‍රිය සංස්කෘතික නිෂ්පාදන සිදුකරනු ලබන මාධ්‍ය ආයතන වල දෘෂ්මිය හැඩගැසී ඇත්තේ පොදු ජනයා තුළ පවතින ජනසංස්කෘතික මතකයන් උත්තේජනය කරමිනි. " ජනසංස්කෘතික අංග තුළ නර්ථනයෙන්, ගීත රංගනයෙන් දායක වූ අය ජනප්‍රිය සංස්කෘතික නිෂ්පාදනවලට දළ වෙනස් ස්වරූපවලින් දායකවීම සිදුවේ. අතීත සමාජයේ කලාවෙන් සංගීතයෙන් ජනතාව පිනවූ පුද්ගලයා අද මාධ්‍යවේදියා, සංගීතඥයා, මාධ්‍ය ශිල්පියා, ගායකයා, වැනි නම් වලින් හඳුන්වයි. මේ සියල්ල ජනප්‍රිය යෙදුම් බවට පත් වී ඇත. "[6]

" ජනප්‍රිය සංස්කෘතිය සමග ඉතා ශක්තිමත් සැණකෙළිය (carnival) සහ සැණකෙළි න්‍යාය බැඳී පවතී. සැණකෙළි ආගමික උත්සව සමග ඓතිහාසික සම්බන්ධතාවක් පවතී. ආගමික වශයෙන් වැදගත්, යම් වර්ෂයක නිශ්චිත ආගමික උත්සව සමයේ මෙවැනි සැණකෙළි සංවිධානය කරනු ලැබේ."[7] නැටුම්, ගැයුම්, විවිධ තර-, ගායනාවලින් මෙම සැණකෙළි සමන්විත වේ. මිඛායල් බඛ්තින්ගේ ගේ අදහසට අනුව කානිවල් හෙවත් සැණකෙළිය ලාක්ෂණික වන්නේ සිනහවෙන් ය, ප්‍රමාණය ඉක්මවා යන තරම් කායික දේහවලින් සහ ඒවායේ කාර්ය කටයුතු වලින් ය. පහත්යැයි සැලකෙන වින්දනයෙන් අද්‍යතන රූපවාහිනී මාධ්‍ය මෙම කාර්ය ඉතා ඉහළින් සිදු කරයි. එතුළින් ජනප්‍රියත්වයත් ජනප්‍රියත්වය මගින් ප්‍රාග්ධන තර කර ගැනීම කෙරෙහිත් අවධානය යොමු කරයි.

මෙහිදී ජනප්‍රියත්වය න-ාසිටුවීමේ ඒජන්තලා ( Agent ) වශයෙන් සංස්කෘතික භාණ්ඩ ක්‍රියාකරයි. හුවමාරු භාණ්ඩ සංසරණය මෙන් නොව සංස්කෘතික භාණ්ඩ හුවමාරුවේදී ජනප්‍රිය සුඛ සහ අර්ථයන් සංසරණය සිදුවේ. මිනැම හුවමාරු

භාණ්ඩයක් පදනම් වන්නේ මුලය ආර්ථිකයක් මතයි. එසේ වුවත් සංස්කෘතික ආර්ථිකයකින් තොරව එයට පැවැත්මක් නොමැත. කිසිම ආර්ථිකයක් තනිකරම මුලය ආර්ථිකයක් නොවේ. ඒ තුළද සංස්කෘතික අංගයන්ද පවතී. අද්‍යතන සමාජයේ ජනප්‍රිය විද්‍යුත් මාධ්‍ය මගින් මෙම සංස්කෘතික ප්‍රාග්ධනය සක්‍රිය කරනු ලබයි. ජනප්‍රිය සුඛ සහ අර්ථ සම්ප්‍රේෂණය මගින් ජනප්‍රිය සංස්කෘතික වටපිටාවක් ගොඩ නැගීම මේ මගින් සිදුවේ. " සංස්කෘතික අර්ථයක් තුළ අර්ථ සහ සුඛ සම්පාදනය කිරීමෙහි ලා ශකයතාව හොබවන මිනැම දෙයක් ප්‍රධාන ජනප්‍රිය සංස්කෘතික සම්පතක් ලෙස සැලකේ." [8] පශ්චාත් නූතන තත්වය ( Post modern condition ) තුළ ප්‍රධාන වශයෙන් විද්‍යුත් මාධ්‍ය මගින් පොදු ජන පාරිභෝජන අවශ්‍යතා වර්ධනය කොට තිබේ. එනම් ධනවාදී ආර්ථික ක්‍රමය නිෂ්පාදන ආර්ථිකයේ සිට වෙළද පළ ආර්ථිකය දක්වා දැවැන්ත පරිණාමයක් ලැබූ විට ද්‍රව්‍යමය හුවමාරු භාණ්ඩවලට විශාල සංස්කෘතික වටිනාකමක් ලැබෙන්නට විය. විලාසිතා සහ රථ වාහන ක්ෂේත්‍රය මීට නිදසුනකි. " ජනමාධ්‍යවේදය හා විලාසිතා නැමැති ප්‍රිස්මය තුළින් නොගිය කිසිවක් පශ්චාත් නූතන සමාජයේ සංස්කෘතියේ සංඝටකයක් බවට පත් නොවේ. " [9] ජනප්‍රිය සංස්කෘතික ප්‍රාග්ධනය තුළ සුඛපරමවාදය ( hedonism ) අනුගමනය වේ. මෙම සංස්කෘතිය තුළ සම්භාව්‍ය සංස්කෘතිය සහ සෞන්දර්යවේදය පුනරුත්තාපනය කෙරේ. ඒ සඳහා අතිරමණීයකරණය සහ සෞන්දර්යකරණය හඳුන්වා දෙනු ලැබේ. " මේ නිසා සංස්කෘතික වටපිටාව එන්න එන්නම ආලෝකවත් වන අතරම මිනිසාගේ ජීවිතය අඳුරු වේ. මෙය " උවමනාවට වඩා සුන්දරවීම " වශයෙන් ලියෝතාද් හඳුන්වයි. මෙය " ජිවං " ( Kitch ) සෞන්දර්ය ලෙස හැඳින්විය හැකිය " [10] අද්‍යතන රූපවාහිනිය තම ගුවන් කාලය වෙන් කොට ඇත්තේ මෙම සෞන්දර්ය සම්ප්‍රේෂණය කිරීම සඳහාය. අද්‍යතන පවුලේ විවිධ ස්ථර වල ප්‍රේක්ෂකයෝ සමස්තයක් වශයෙන් මෙම ජනප්‍රිය සංස්කෘතික වටිනාකම් පරිභෝජනය කරති. සංස්කෘතික හා ආර්ථික ප්‍රාග්ධනය මෙම ක්‍රියාවලිය තුළ ප්‍රබල අයුරින් හුවමාරු වේ. ජනප්‍රිය සංස්කෘතියේ ස්වභාවය තුළම එහි අවධානය යොමු වන්නේ ඒ තුළ ඇති සිරස් හා තිරස් ව්‍යාප්තිය සහ මතුපිටින් ලිස්සායාම කෙරෙහිය. අද්‍යතන පවුල තුළත් විශේෂයෙන්ම න්‍යෂ්ටික පවුලේ සාමාජිකයන් ජනප්‍රිය සංස්කෘතිය සමග තදින් බැදී පවතී. මොවුන් දුරස්ත පාලක ආධාරයෙන් වේගයෙන් රූපවාහිනී නාලිකා ඒ මේ අතට මාරු කිරීම මගින් සංතෘප්තියක් ලබයි. ප්‍රේක්ෂකයාට මෙමගින් ප්‍රධාන වශයෙන් සුඛ (pleasure) ලැබේ. " රූපවාහිනී තිරය මත මතුවන රූප පුද්ගලයා තුළ ප්‍රියජනක සංවේදිතාවක් ඇති කරයි. ඒ සමගම තිරයේ දෘශ්‍ය සෞන්දර්ය ක්ෂේත්‍රය තුළ අනපේක්ෂිතව සිදු වන රූප සමෝධානික හැ-ම් මේ තත්ත්වය තවත් උත්කර්ෂණය කරන්නේය." [11]





මේ අයුරින් " ධනේෂ්වර ක්‍රමය මගින් අති විශාල වශයෙන් නිෂ්පාදනය කොට අද්‍යතන මාධ්‍ය මගින් යථාර්ථයක් ලෙස හුවා දක්වනු ලබන දෘශ්‍ය රූපය (Visual Image ) හුදෙක්ම බොල් හේමාල රූපයක් ලෙස පශ්චාත් නූතන චින්තකයකු වන ෂොන් බව්ඩ්‍රිලාඩ් ගේ අදහස වේ. ආභාසන රූපය ( Simulacrum ) යන්න මොවුන් විසින් මේ සඳහා භාවිත කරනු ලබන වචනයයි. බව්ඩ්‍රිලාඩ්ගේ මෙම අදහසට අනුව නිරූපණාත්මක රූප සංඥාව (Representation Image Sign ) අනුක්‍රමික ඓතිහාසික අදියර හතරක් ඔස්සේ ගමන් කරන බව රිචර්ඩ් අපිග්නානෙසි සහ ක්‍රිස් ගැරට් ( Richard Appignanesi and Chris Garrat ) පෙන්වා දෙති "[12] අද්‍යතන රූපවාහිනී ප්‍රේක්ෂකයා සහ අද්‍යතන පවුල සර්ව ව්‍යාපී වශයෙන් මෙම ආභාසන රූපය සමග සම්බන්ධතා පවත්වයි. අද්‍යතන පවුල තුළට එන මෙවැනි රූපවාහිනී වැඩසටහන් මගින් නිරූපණය වන යථාර්ථීය ඔවුහු විග්‍රහ කරති. පුළුල් වශයෙන් රූපවාහිනී මාධ්‍ය වර්තමානයේ ජනප්‍රිය සංස්කෘතික ප්‍රාග්ධනය හුවමාරු වන මාධ්‍යයක් බවට පත්ව තිබේ. ඒ තුළ කලාත්මක වැඩසටහන්වලටද සැලකිය යුතු මට්ටමක අවකාශයක් හිමිවී ඇත. මෙම කලාත්මක වැඩසටහන් සහ යථාර්ථය යන දෙකම සාර්වත්‍රික ආභාසන රූපයක් ( Universal Simulacrum ) දක්වා පත්ව ඇති බවට පශ්චාත් නූතන විචාරකයෝ තර්ක කරති. නිරූපණය සහ යථාර්ථීය ( Representation and Reality ) අතර වෙනස බිඳ වැටුණු කල්හි ආභාසන රූපය බිහිවන බව ඔවුන්ගේ මතයයි.එනම් සංඥාව හා එමගින් සංකේතවත් කරන බාහිර ලෝකයේ යථාර්ථීය අතර වෙනසයි.අද්‍යතන පවුලේ ප්‍රේක්ෂකයා වෙත ළගාවන අභාසන රූපය ඓතිහාසික අවධි හතරක් ඔස්සේ ඔවුහු විග්‍රහ කරති.

" I මූලික යථාර්ථය පිළිබඳ ප්‍රතිබිම්බය ( Reflections of Basic Reality )

II මූලික යථාර්ථීය සැ-වීම සහ විපර්යාස කිරීම (Masking Perverting a Basic Reality)

III මූලික යථාර්ථීය නැතිවීම (Absence of Reality)

IV කවර යථාර්ථීය සමග හෝ සම්බන්ධතාවක් නැති පාරිශුද්ධ ආභාසන රූපණයක් ඇති වීම ( Pure Simulacrum with more relation to any reality what ever ) "[13]

මෙයට අනුව රූපවාහිනිය මගින් සිදු කරනු ලබන ප්‍රේක්ෂාව (spectacle) තැනිමේ කලාත්මක ව්‍යායාමය ව්‍යාජ යථාර්ථීයක් මවන තත්වයකට පත්ව තිබේ.

එය ධනේශ්වරයේ තෙවන කාර්තුවේ දෘශ්‍ය රූපයේ අර්බුදයක් සහ ස්වභාවය වන්නේය " මෙම ස්වභාවය තුළ රූපවාහිනිය පවුල් සංස්කෘතියේ කොටසක් බවට පත්ව තිබේ."[14] පවුලේ සාමාජිකයන් තුළ කාන්තාවන් සහ ළමයිනුත් මෙම ජනප්‍රිය වැඩසටහන් සම- දැඩි සම්බන්ධතාවක් ඇති කර ගෙන තිබේ. ලාංකේය පවුලේ සාමාජිකයන් තුළ පමණක් නොව ගෝලීය වශයෙන්ද ජනප්‍රිය සංස්කෘතියක ටෙලි ආඛ්‍යාන ප්‍රබල ක්‍රියාකාරිත්වයක් දරන ආකාරය සමාජ විද්‍යාත්මකව සමීක්ෂණ තුළින් හෙළි වේ. " 1983 දි එංගලන්තයේ කරන ලද සමීක්ෂණයකින් හෙළි වී ඇත්තේ පාසල් ළමුන්ගෙන් වැඩි කොටසක් ජනප්‍රිය රූපවාහිනිය වටා එක්රොක් වන බවයි "[15] මෙම තත්ත්වය ජනප්‍රිය සංස්කෘතික වැඩසටහන් සහ ප්‍රාග්ධනයේ ක්‍රියාකාරීත්වයට අනුකූලව ක්‍රියාත්මක වේ.

" රූපවාහිනිය පෙර සඳහන් කළ පරිද්දෙන් සර්ව තන්ත්‍ර සමගාමී ආර්ථිකයන් දෙකක එනම් මූල්‍ය ආර්ථිකය සහ සංස්කෘතික ආර්ථිකයේ ඒකාබද්ධ මෙන්ම විභේධිත ප්‍රතිඵලයකි. පහත පෙනෙන වගුවෙන් එකී යාන්ත්‍රණය පිළිබඳ කිසියම් අදහසක් ව්‍යුත්පන්න කළ හැකිය." [16]

| | මූල්‍ය ආර්ථිකය | | සංස්කෘතික ආර්ථිකය |
|---|---|---|---|
| | I | II | |
| නිෂ්පාදකයා: | නිෂ්පාදන මැදිරිය | වැඩසටහන් | ප්‍රේක්ෂකයා |
| | ↓ | ↓ | ↓ |
| භුවමාරුභාණ්ඩය: | වැඩසටහන | ප්‍රේක්ෂකයා | අර්ථ සුබ |
| | ↓ | ↓ | ↓ |
| පාරිභෝගිකයා: | බෙදාහරින්නා | අනුග්‍රාහකයා | රූපවාහිනිය |

ප්‍රාග්ධන පිළිබඳ විග්‍රහ කිරීමේදී මීට වඩා වෙනස් ප්‍රවේශයන්ද දක්නට ලැබේ. " සමාජ ප්‍රාග්ධනය ( Social Capital ), සංස්කෘතික ප්‍රාග්ධනය, වාණිජ්‍ය ප්‍රාග්ධනය, සංකේත ප්‍රාග්ධනය ( Symbolic capital ) ආදී බෝර්ඩියෝගේ වැදගත් සංකල්ප රාශියක් තිබේ." [17]

මේ අයුරින් පශ්චාත් කාර්මික ශිෂ්ටාචාරයේ ක්‍රියාකාරීත්වය තුළ සංස්කෘතික ජන විඥානයට මැදිහත් වීමේ මාර්ගයක් බවට පත්වීමත් එමගින්





සියලු සංස්කෘතික අංග ජන සංස්කෘතියට කැමි කොට හුදු විනෝදය සපයන මාධ්‍යයක් බවට පත්වීමත් සිදුවිය. " වෙළඳ ප්‍රචාරක ශිල්පය මගින් මෙම විනෝදායන මාර්ග පාරිභෝගික පාලනයට යටත් කරන ලදි. එනම් දියුණු ප්‍රචාරක විධි, ක්‍රම මගින් පාරිභෝගිකයන්ට ලබා ගත යුතුම විනෝදායන මාර්ග මේවා යැයි ඒත්තු ගන්වන්නට වූයේ ඔවුන්ගේ මනස කුරුටුගාමින්ය "[18] මේවා හුදෙක්ම භාණ්ඩ අලෙවිය සඳහා භාවිත කරන්නට විය.

රූපවාහිනී මාධ්‍ය මේ සඳහා ඉතා ප්‍රබල ලෙස වර්තමානයේ යොදා ගනු ලැබේ. පශ්චාත් කාර්මික ශිෂ්ටාචාරයේදී එතෙක් පැවති පවුලේ හැසිරීම් සහ සම්බන්ධතා බොහෝ දුරට කඩා බිඳ දමා තිබේ. " ඔවුන් ඇසුරු කළ ප්‍රාථමික සංස්කෘතිය හුදු මිලයට ගත හැකි භාණ්ඩයක් බවට පත්ව ඇත." [19] පැවති සංස්කෘතික වටිනාකම් මේ මගින් වෙනත් වටිනාකම් දක්වා වෙනස් වී ඇත. මේ සම්පූර්ණයෙන්ම බටහිරවාදයේ සංස්කෘතික පරාවර්තනයක් ලෙස පෙනී සිටී. සාම්ප්‍රදායික සංස්කෘතිය තුළ පුද්ගලයා ප්‍රජාව හා තිබූ සම්බන්ධතාව ජනප්‍රිය සංස්කෘතිය තුළ දක්නට නොලැබේ. ඒ තුළ තවදුරටත් පුද්ගලයා හුදකලා වී සිටී. අද්‍යතන පවුලද එම ජනප්‍රිය සංස්කෘතික ප්‍රාග්ධනය තුළ දරන්නේ මෙවැනි තත්ත්වයකි.

## මූලාශ්‍ර


*1. විජේතුංග ගාමිණී, 1994 , සිනමාව සංස්කෘතිය හා මතවාදය , 103 පිටුව;*

*2. Maracuse, Herbert, 1968, Ngations , PP. 88- 90;*

*3. පෙරේරා, රංජිත්, 2001, ප්‍රවාද, ජනවාරි - මාර්තු, 144පිටුව;*

*4.. පෙරේරා, රංජිත්, 2001, ඉහත ග්‍රන්ථය, 145පිටුව ;*
*5. විජේතුංග ගාමිණී, 1994 , ඉහත ග්‍රන්ථය, 10පිටුව;*

*6.සෙනෙවිරත්න සේනක, 1999, ජනප්‍රිය සංස්කෘතිය හා ජනමාධ්‍ය, රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ 10;*

*7. Nichoals, Joe/price, 1998, John - Advanced studies in media - Thomas Nelson and sons Ltd, P. 74;*

*8. පෙරේරා රංජිත්, 2001 ඉහත ග්‍රන්ථය, 159 පිටුව;*

*9. වීරසිංහ මියුඩර්, 2002, ගෝලීය සමාජය සහ එහි මතවාදය ගොඩගේ ප්‍රකාශන, 115 පිටුව ;*

*10. වීරසිංහ මියුඩර්, 2002, ඉහත ග්‍රන්ථය, 127පිටුව;*

*11. වීරසිංහ මියුඩර්, 2002, ඉහත ග්‍රන්ථය, 142 පිටුව;*

*12. ඉලයප්ප ආරච්චි, එරික්, 2000, කලාත්මක ඥානය සහ සැබෑ ලෝකය, දැවෙන ප්‍රශ්න විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය,273, 274පිටු;*

*13.ඉලයප්ප ආරච්චි, එරික්, 2000, ඉහත ග්‍රන්ථය, 274 පිටුව;*

*14. Fiske John, 1997 , Television Culture, P. 279;*

*15. විතානගේ චන්ද්‍රසෝම, 2002, සන්නිවේදනය සංස්කෘතිය සමාජය, විශ්වලේඛා ප්‍රකාශන;*

*16.පෙරේරා රංජිත්, 2001, ඉහත ග්‍රන්ථය;*

*17.විජේතුංග ගාමිණී,1996, ඉහත ග්‍රන්ථය, ඔක්තෝම්බර්- දෙසැම්බර්, 39පිටුව;*

*18.විජේතුංග ගාමිණී, 1994, ඉහත ග්‍රන්ථය, 106පිටුව;*

*19.විජේතුංග ගාමිණී, 1994, ඉහත ග්‍රන්ථය,106පිටුව ;*





# 19

# ජනමාධ්‍යවේදියා සහ ඔහුගේ අධ්‍යාපනික භූමිකාව

**නිවන්ති තිලකරත්න**

ජනමාධ්‍යවේදියා සහ අධ්‍යාපනය පිළිබඳ පුළුල් සංකල්පීය සහ න්‍යායාත්මක ප්‍රවේශයක් තුළ හඳුනා ගත යුතුවේ. එහිදී “ ජනමාධ්‍යවේදියා ” හා “ ජනමාධ්‍යවේදය ” යන වචන ද්විත්වය පිළිබඳ අවධානය වැදගත් වනු ඇත.

“ ජනමාධ්‍යවේදය ” යන වචනයට සමගාමීව විවිධ යෙදුම් භාවිත වෙයි. එනම් පුවත්පත් කලාව (Journalism), ජන සන්නිවේදනය (Mass Communication), ජනමාධ්‍ය (Mass Media), පොදුජන තොරතුරු මාධ්‍යයන් (Mass Information Media), පොදුජන තොරතුරු හා ප්‍රචාරක මාධ්‍යයන් (Mass Information and Propaganda Media ) යනාදි යෙදුම් භාවිතවෙනු දක්නට ලැබේ. එසේ වුවද වඩාත් ගැළපෙන වචනය ලෙසට “ ජනමාධ්‍යවේදය ” යන යෙදුම ආචාර්ය එල්. ටියුඩර් වීරසිංහ හා ආචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂ “ ජනමාධ්‍යවේදය ” යන කෘතිය තුළින් යෝජනා කරයි.

“ ඒ අනුව අප සිතන ආකාරයට ජනමාධ්‍යවේදය යන යෙදුම මෙම විෂය පිළිබඳව ඉතා ගැඹුරු වුද පරිපූර්ණ වුද පරාවර්තනයක් කිරීමට යෝග්‍යයැයි අදහස් කරමු ”.[1]

මෙම විෂය ක්ෂේත්‍රයට අදාළ සියලුම සංඝටකයන් මෙම වචනය තුළට ගැබ් වී තිබේ. එනම් මාධ්‍ය ආයතන, ඒවායෙහි අයිතිකරුවන්, ජනමාධ්‍යවේදීන්, ග්‍රාහකයින්, බල කේන්ද්‍රිය ආයතන, නාලිකා, සංදේශ, සමාජ ආයතන ආදි සියල්ල ජනමාධ්‍යවේදය යන්නට ඇතුළත් වේ.

තවද ජන සන්නිවේදනය යනු " ශ්‍රව්‍ය දෘශ්‍ය හෝ ලිඛිත මාධ්‍ය වශයෙන් හැඳින්වෙන ගුවන් විදුලි, සිනමාව, හා රූපවාහිනිය සහ පුවත් පත් ග්‍රන්ථ සම්පාදන මාධ්‍ය මෙනමින් හැඳින්වේ. එම මාධ්‍යයන් උපයෝගි කොටගෙන සිදුවන ක්‍රියාදාමය ජන සන්නිවේදන ක්‍රියාදාමයයි. "[2]

එනම් ජනමාධ්‍යවේදය තුළ සිදු වන්නේ පොදු ජන තොරතුරු ක්‍රියාදාමයකි. ජනමාධ්‍යවේදය යන්නෙන් අදහස් වනුයේ තොරතුරු මුලාශ්‍ර පදනම් කරගෙන ගොඩ නැ-ේන්නා වු දැනුම, තොරතුරු මාධ්‍යයක් භාවිත කර ජනතාව වෙත සම්ප්‍රේෂණය කිරිමේ ක්‍රියාවලියයි.

ජනමාධ්‍යවේදියා යනු කවරෙක් ද? සුනන්ද මහේන්ද්‍රගේ සන්නිවේදන ශබ්දාකරයට අනුව පුවත්පත් කලාවේදියා (Journalist) යන්න භාවිත කර ඇත්තේ පුවත්පත් ස-රා, පත්‍රිකා ලේඛන සම්බන්ධ සන්නිවේදකයා හඳුන්වාදිමටයි. නමුත් පසුකාලිනව ගුවන්විදුලිය, රූපවාහිනිය සහ චිත්‍රපටය යන සියලු ජනමාධ්‍යයන්හි තොරතුරු සම්පාදන කාර්යයභාර පිරිස Journalists වශයෙන් හැඳින් වු බව එහි දක්වා ඇත. ඒ අනුව ජනමාධ්‍යයන් භාවිත කර පොදු ජන තොරතුරු සන්නිවේදනය කරන්නා වශයෙන් ජනමාධ්‍යවේදියා හඳුනාගත හැකිවේ.

එසේ නම් ජනමාධ්‍යවේදියාට ජනමාධ්‍යවේදය අධ්‍යයනය කිරීමේ අවශ්‍යතාවක් පවති ද? වර්තමාන සමාජ සන්දර්භය තුළ පවතින කතිකාවක් වන්නේ බෙහෝ ජනමාධ්‍යවේදීහු නිසි අධ්‍යාපනයකින් තොරව එම ක්ෂේත්‍රය තුළ නියැළෙන බවයි. ඒ හරහා ජනමාධ්‍යවේදයේ ක්‍රියාකාරිත්වය ක්‍ෂණ තත්ත්වයට පත්ව ඇතැයි බොහෝ දෙනෙක් චෝදනා කරති. මේ කතිකාවන්හි සත්‍යතාවක් ගැබ්වී තිබේ ද යන්න සොයා බැලිම වර්තමාන අවශ්‍යතාවක් වී තිබේ.

ජනමාධ්‍යවේදයට විෂයක් ලෙස ලෝකය තුළ කවර පැවැත්මක් තිබේ ද යන්න විමසා බැලිය යුතුවේ. මන්ද ඒ හරහා ජනමාධ්‍යවේදියාගේ අධ්‍යාපනයට ඇති වැදගත්කම පිළිබඳ යම් පරාවර්තනයක් සිදු කරන බැවිනි. නුතන





ජනසන්නිවේදන මාධ්‍ය එනම් පුවත්පත, ගුවන්විදුලිය, චිත්‍රපට , රූපවාහිනිය සහ සන්නිවේදන චන්ද්‍රිකා බිහිවීමත් සම- ලෝකය තුළ සන්නිවේදනයේ දැවැන්ත විප්ලවයක් සිදු විය. මෙහි පරිණාමය අධ්‍යයනය කිරිම සඳහා සමාජ විද්‍යාව තුළ මාධ්‍ය අධ්‍යයනය (Media Studies) විෂය බිහිව ඇත. නමුත් ජනමාධ්‍යවේද ක්ෂේත්‍රයේ න්‍යායන් පුළුල් විමත් සම- එය සුවිශේෂ විෂයක් බවට පත් වෙමින් පවති. " 1993 වන විට සන්නිවේදන විෂය මුලු ලෝක විශ්වවිද්‍යාලයන්හි ජනප්‍රියතම විෂයක් බවට පත් වී තිබේ. ඇමරිකා එක්සත් ජනපදය තුළ සන්නිවේදනය හදාරන්නවුන්ගේ සංඛ්‍යාව වසරින් වසර ඉහළ ගියේය. 1970 දි ජනසන්නිවේදනය ප්‍රථම උපාධියට හැදෑරූ සංඛ්‍යාව 11, 000 කි. 1993 වන විට එම ප්‍රමාණය 50,000 දක්වා ඉහළ ගොස් ඇත.[3] "

මේ ආකාරයෙන් ඇමෙරිකාවේ පමණක් නොව ආසියානු, අප්‍රිකානු, ලතින් ඇමරිකානු, ඕස්ට්‍රේලියා ආදි රටවලට ද ජනමාධ්‍යවේදය ජනප්‍රියතම අධ්‍යයන ක්ෂේත්‍රයක් බවට පත් තිබේ.

ජනමාධ්‍යවේදියාට අධ්‍යාපනයෙහි ඇති වැදගත්කම පිළිබඳ විවිධ විද්වතුන් අවධාරණය කර තිබේ. එහිදි එඩ්වින් ආරියදාසගේ අදහස් අනුව " සෙසු බොහෝ වෘත්තීන්හි යෙදුණු පුද්ගලයන් මෙන්ම ජනමාධ්‍ය හා බද්ධ වෘත්තීන්හි නිරතව සිටින විද්‍යාර්ථීහු අධ්‍යාපනයක්, අභ්‍යාසයක්, පුහුණුවක්, වෘත්තිමය ප්‍රවිණතාවක් ලද යුතුවෙති. "[4]

තම වෘත්තියට පිවිසීමට ප්‍රථම වෛද්‍යවරයෙක් වෛද්‍ය විද්‍යාව හදාරයි. නිතිඥයෙක් නිතිවේදය හදාරයි සුවිශේෂ වූ වෘත්තියමය ක්ෂේත්‍රයන් වශයෙන් එම වෘත්තීන්ට ප්‍රවිෂ්ට විමට ප්‍රථම අදාළ විෂය පිළිබඳ න්‍යායන් සංකල්පයන්, සංඝටකයන්, භාවිතයන් ක්‍රමානුකූලව හැදෑරීමට සිදුවෙයි. එසේනම් මාධ්‍යවේදියා ද තම වෘත්තියට ප්‍රවිෂ්ට විමට ප්‍රථම ජනමාධ්‍යවේදය හැදෑරිය යුතුවෙයි. වර්තමාන සමාජය තුළ ජනතාවට බලපෑම් කිරීමේ ආධිපත්‍යය පතුරුවා හැරිමේ මුලිකම ක්ෂේත්‍රය බවට ජනමාධ්‍යවේදය පත්ව තිබේ. එනිසා ජනමාධ්‍යවේදය පිළිබඳ නිවැරදි අවබෝධයකින් තොරව එම වෘත්තිය තුළ නියැලිම සමාජ අපගමනය කෙරෙහි හේතුවන්නක් විය හැකිය. " විශිෂ්ට ජනතා සේවයක් සපයන උසස් මාධ්‍යවේදීන් සකස් කිරීම, මෙම පාසලෙහි අරමුණ බවට පත්වේවි.[5] " යනුවෙන් කොළොම්බියා විශ්වවිද්‍යාලය තුළ ජනමාධ්‍ය පාසලක් ස්ථාපිත කිරිම සම්බන්ධව ජෝශප් පුලිට්ස(ර්) (Joseph Pulitzer) කරනු ලැබු එම

ප්‍රකාශනය තුළින් ද ජනමාධ්‍යවේදියාගේ අධ්‍යාපනයේ වැදගත්කම පෙන්නුම් කරයි.

ඒ අනුව ජනමාධ්‍යවේදියා තම සමාජ වගකීම සම්බන්ධයෙන් දැනුවත් වී කටයුතු කිරීම වැදගත් වෙයි. එනම් තමන්ගේ ක්‍රියාකාරීත්වය පිළිබඳ වගකීම සම්බන්ධව දැනුවත් වීම අවශ්‍යවීමයි. " ජනමාධ්‍යවේදියා කුමක් සඳහා සිය වැඩසටහන්, නිර්මාණ බිහිකරන්නේ ද යන්න නොදැනත් නිර්මාණකරණයේ සැබෑ නිදහස කුමක් ද යන්න නොදැනත් අදාළ විෂය ක්ෂේත්‍රයට අවතීරණ නොවිය යුතුය. එසේම ජනමාධ්‍යවේදියාට දේශප්‍රේමීභාවය යනු කුමක් දැයි නිවැරදි අවබෝධයක් නැති කල්හි යම් යම් ගැටලු සහ සිද්ධීන් සම්බන්ධව ජාතිවාදී ප්‍රවේශයක් අනුගමනය කළ හැකිය. මෙම බරපතල වැරදිවලින් මිදීම සඳහා ගැඹුරු වූ ද නිර්මාණාත්මක වූ ද පොදු න්‍යායික දැනුම් සම්භාරයකින් පෝෂණය විය යුතුය.[6]"

" යුනෙස්කෝව මාධ්‍ය අධ්‍යාපනය හඳුන්වන්නේ විසිඑක්වන සියවසේ සංස්කෘතික අධ්‍යාපනවේද සංවර්ධනයේ ප්‍රමුඛ ක්ෂේත්‍රයක් වශයෙනි.[7] "

එසේනම් ජනමාධ්‍යය ද විෂය තුළ කුමක් අධ්‍යයන කෙරෙයි ද? ජනමාධ්‍යවේදියාට ඒවායේ වැදගත්කම කුමක් ද? මිනැම ක්ෂේත්‍රයක් විෂයක් ලෙස හැඩගැසෙන විට ඒ ආශ්‍රිත න්‍යායන්, අධ්‍යාපන මාදිලින් ගොඩනැගෙනු දක්නට ලැබේ. න්‍යායන් යනු අදාළ විෂය ක්ෂේත්‍රයක් ආශ්‍රිතව ගොඩනැගුණා වූ පොදු අදහස්, දැනුම් සංගෘහිතයකි. ජනමාධ්‍යවේදියාට, ජනමාධ්‍යවේදයේ න්‍යායන් අධ්‍යයනය කිරීම ඉතා වැදගත් වේ. "------------- එසේම න්‍යාය ජනමාධ්‍යවේදියා තුළ වෘත්තියමය හැකියාවන්, ගුණාංගයන් මෙන්ම නිර්මාණාත්මක චින්තනය ද හැඩගස්වනු ලබයි.[8]"

ජනසන්නිවේදනය තුළ මූලික වශයෙන් න්‍යායන් හතරක් හඳුනාගත හැකිබව ඩෙනිස් මැක්යෙල් (Denis Macquail) ප්‍රකාශ කරයි. එනම්,

1. සමජවිද්‍යාත්මක න්‍යාය - Social Scientific Theory
2. ප්‍රතිමානික න්‍යාය - Normative Theory
3. කාර්යාත්මක න්‍යාය - Operational Theory
4. දිනපතා න්‍යාය / පොදු සංවේදිතා න්‍යාය - Every day Theory / Common sense Theory [9]





එසේනම් ජනමාධ්‍යවේදය තුළ මෙම න්‍යායන් හරහා කුමක් අධ්‍යයනය කරයිද? එය ජනමාධ්‍යවේදියාට කෙසේ වැදගත්වේ ද යන්න විමසා බැලිය යුතු වේ.

" මාධ්‍ය හා ඒ සම්බන්ධ වෙනත් සාධක පිළිබඳ ක්‍රමානුකූල හා වාස්තවික ගවේෂණය පදනම් කර ගත් ජනසන්නිවේදනයේ ස්වභාවය, ක්‍රියාකාරීත්වය සහ බලපෑම පිළිබඳ පොදු ප්‍රකාශනයන් සමාජ විද්‍යාත්මක න්‍යාය තුළට ඇතුළත් වේ.[10]" මෙම න්‍යාය තම අවධානය යොමු කරනු ලබන්නේ, පොදුජන තොරතුරු සහ පෙළඹවීම් ක්‍රියාවලියෙහි, සංවර්ධිත වූ විධිමත් වූ විවේචනයක් හා ප්‍රායෝගික උපයෝගිතාවය එක්ව බැඳුනා වූ නිරන්තරව සිදුවෙමින් පවතින තත්ත්වයෙහි අවබෝධයකින් යුක්තවය. එසේනම් සාර සන්නිවේදනයක් උදෙසා ජනමාධ්‍යවේදියාට මෙම තත්ත්වය පිළිබඳ මනා අවබෝධයක් අවශ්‍ය වේ. එනම් ජනතාව වෙත කුමනාකාරයකින් සංදේශය ප්‍රවේශය කළ යුතුද? ඒ සඳහා සංදේශය කෙසේ සකස් කළ යුතුද? යන්න පිළිබඳ අවබෝධය මේ තුළින් ලැබෙන බැවිනි. තවද මාධ්‍යයෙහි ස්වභාවය ගැන ද මෙහිදී අධ්‍යයනය වේ. එහිදී ඒ ඒ මාධ්‍යයන්හි ශක්‍යතා පිළිබඳ අවබෝධය ලැබේ. මේ තුළින් ජනමාධ්‍යවේදියාට තම මාධ්‍යයේ ශක්‍යතාව හඳුනාගෙන කුමනාකාරයෙන් සංදේශ නිර්මාණය කළ යුතුද යන්න පිළිබඳ දැනුම ලබා දෙයි.

ප්‍රතිමානික න්‍යාය අධ්‍යනය කිරීමද ඒ ආකාරයෙන්ම ජනමාධ්‍යවේදියාට වැදගත් වෙයි. ඔහුගේ කාර්ය නිසි පරිදි ඉටු කිරීම උදෙසා එය අධ්‍යයනය කිරීම මහත් පිම්වහලක් වේ. එසේනම් මෙම න්‍යාය තුළින් ජනමාධ්‍යවේදියාට කුමක් අධ්‍යයනය කළ හැකිවේද? මෙම න්‍යාය හරහා පරීක්ෂා කරනු ලබන්නේ, සමාජ වටිනාකම් නිරීක්ෂණය හෝ භාවිතය තුළ මාධ්‍ය මෙහෙයවිය යුත්තේ කෙසේ ද යන්න පිළිබඳවයි. සමාජ හා සංස්කෘතික සාරධර්ම පිළිබඳ අධ්‍යයනය මෙහිදී සිදුවේ. තවද නීති, රීති, මාධ්‍ය ප්‍රතිපත්ති, ආචාරධර්ම පද්ධතීන් හා මහජන කතිකාවන් පිළිබඳ අවධානය යොමු වේ. සමාජ විද්‍යාවේ වාස්තවික ක්‍රමවේදය හරහා මෙය අධ්‍යයනය කළ හැකිවේ. එසේනම් ජනමාධ්‍ය සංදේශ සැකසීමේදී මෙම න්‍යායේ ඇති වටිනාකම කවර අයෙකුට වුවද අවබෝධ කර ගැනීම අපහසු නොවෙයි. වර්තමාන සමාජය තුළ ජනමාධ්‍යවේදීන් වෙත එල්ලවන ප්‍රබල චෝදනාවක් වන්නේ ඔවුන් සමාජ, සංස්කෘතික වටිනාකම් පිළිබඳ අවධානයක් යොමු නොකර, නීති රීති මාධ්‍ය ප්‍රතිපත්ති උල්ලංඝනය කර කටයුතු කරන බවයි. නමුත් ජනමාධ්‍යවේදියා, තම විෂය ආශ්‍රිතව කාලාන්තරයක් තිස්සේ ගොඩනැ-, සැකසුණු මාධ්‍ය ප්‍රතිපත්ති ආචාර ධර්ම, නීති රීති හොඳින් අධ්‍යයනය කර කටයුතු කරන්නේ

නම් ඔහුට සාර්ථක ජනමාධ්‍යවේදියෙකු ලෙස සියලු දෙනාගේ ප්‍රශංසාව හිමිවනු ඇත. යමෙකුට මෙම සමාජ වටිනාකම් සංකල්ප ආදිය නිසියාකාරව අධ්‍යයනය කර, ජනතා සුභසිද්ධිය ගැන නොතකා තම ව්‍යාපාරික අරමුණු උදෙසා ඒවා භාවිත කළ හැකිවේ. වර්තමානය තුළ මෙය බහුලව සිදුවනු දක්නට ලැබේ. නමුත් තම විෂය ක්ෂේත්‍රයේ පරිණාමය තුළින් ගොඩනැගුණු වූ ප්‍රතිපත්ති, ආචාරධර්ම පිළිබඳ මනා අවබෝධයකින් යුතු, මානවවාදී ජනමාධ්‍යවේදය ගරුකරන ජනමාධ්‍යවේදියෙකු එවැනි සමාජ අපහරණයන් තුළට යොමු නොවේ.

කාර්යාත්මක න්‍යාය අධ්‍යයනය කිරීම ද ජනමාධ්‍යවේදියාට වැදගත් වේ. මේ තුළින් අවධානය යොමු කරනු ලබන්නේ මාධ්‍ය ක්‍රියාකාරකම් හා සම්බන්ධ ව්‍යවහාරික සංකල්පයන්ය. මෙහිදී සංගෘහිත වූ ව්‍යවහාරික ඥානය තුළින් සංවිධානාත්මක හා වෘත්තිමය පරිස්ථිතීන් ගවේෂණය කරනු ලබයි. ග්‍රාහකයන්ට ඵලදායිවීම හා සමාජ අවසරයන්ගේ සීමාව තුළ හිඳිමින්, කෙසේ ප්‍රවෘත්ති තෝරනවාද? ප්‍රේක්ෂක තෘප්තිය ඇති කරනවාද? ඵලදායීව වෙළඳ දැන්වීම් සකස් කරනවාද? යනාදි ගැටලු විසඳා ගැනීමට මෙම න්‍යාය තුළින් ජනමාධ්‍යවේදියා හට අවබෝධයක් ලබා දෙයි. මේවා අධ්‍යයනයකින් තොරව යමෙකුට සැබෑ ජනමාධ්‍යවේදියකු විය නොහැකිය.

ජනසන්නිවේදනයේ සිව්වන න්‍යාය වන පොදු සංවේදිතා න්‍යාය යටතේ අවධානය යොමු කරන්නේ මාධ්‍ය භාවිතය හා දැනුම පිළිබඳවයි. අප සියලු දෙනාටම මාධ්‍ය පිළිබඳ අත්දැකීම් තිබේ. නමුත් එදිනෙදා ජීවිතයට මාධ්‍ය සම්බන්ධ වන්නේ කෙසේද? විවිධාකාර වූ ශෛලීන් කියවා ගත යුත්තේ කෙසේද? එසේම එම ශෛලීන් ග්‍රාහකයා කියවීමට කැමති වන්නේ කුමන ආකාරයෙන්ද? විවිධාකාර වූ මාධ්‍යයන් හා මාධ්‍ය ශෛලීන් මොනවාද? යනාදිය පිළිබඳ අවබෝධයක් අපට නොමැත. එසේ වන්නේ ඒ පිළිබඳ විද්‍යාත්මක හැදෑරීමක නියැලී නොමැති නිසාය.

රසවින්දනයේ රටාවන් වර්ධනයට, ස්ථිරසාර වූ තෝරා ගැනීම් වලට, ජීවන ශෛලීන් ගොඩ නැගීමට අවශ්‍ය හැකියාව, මාධ්‍ය පාරිභෝගිකයන් වශයෙන් අනන්‍යතා ආදිය වෙත මෙම න්‍යාය හරහා උපදෙස් ලබා දෙයි. මාධ්‍ය භාවිතය හා සම්බන්ධව මෙම න්‍යාය හරහා පෙන්වා දෙන අතර එය මාධ්‍යවේදියාට ඉතා වැදගත් වේ. එය මාධ්‍ය භාවිතයේ රස වින්දනාත්මක තලයන්, ග්‍රාහක තත්ත්වය ඔවුන්ගේ එදිනෙදා ජීවිතයට කුමන බලපෑමක් සිදුවේ ද යනාදිය පිළිබඳ සංදේශ නිර්මාණයේදී අවධානය යොමු කළ යුතු බැවිනි. විශේෂයෙන් ජනතාව වෙත





අධ්‍යාපනයක් ලබා දීමේ කාර්යයේදී මෙම න්‍යාය වැදගත් වේ. එනම් ජනතාවගේ ජීවිතය හැඩගස්වා ගැනීමට අවශ්‍ය දැනුම, ආකල්ප, කුසලතා වර්ධනය උදෙසා ජනමාධ්‍යවේදියා කෙසේ ක්‍රියාකළ යුතුද යන අවබෝධය මෙම න්‍යාය හරහා ලබා ගත හැකිය.

මෙසේ ඩෙනිස් මැක්යෙල් ඉදිරිපත් කරන ජන සන්නිවේදනයේ න්‍යායන් විද්‍යාත්මකව අධ්‍යයනය කිරීම හරහා ජනමාධ්‍යවේදියාට තම කාර්ය ඉතා ඵලදායීව හා ක්‍රමවත්ව සිදු කළ හැකි බැව් හඳුනා ගැනීමට පුළුවන.

මහාචාර්ය ඇලෙක්සැන්ඩර් ෆෙඩොර්ව් (Prof Alexander Fedorov) හඳුන්වා දෙන මාධ්‍ය අධ්‍යාපන ආකෘතිය හරහා ද ජනමාධ්‍යවේදියාට ලබා ගත හැකි අධ්‍යාපනය පිළිබඳ හඳුනා ගැනීමට පුළුවන. ඔහුගේ මාධ්‍ය අධ්‍යාපන ආකෘතිය තුළ අදියර හතරක් දක්වා ඇත.[11]

1. සත්‍යෙක්ෂණ මොඩියුලය.
   Verification Module.
   එනම් ශිෂ්‍යයින්ගේ මාධ්‍ය සංවර්ධනයේ මට්ටම හා මාධ්‍ය සංජානනයේ මට්ටම පිළිබඳ නිර්ණය.

2. ව්‍යවහාරික නිර්මාණ හා සංජානන මොඩියුලය.
   Module of Practical Creation & Perception
   මාධ්‍යයේ ද්‍රව්‍යාත්මක පදනමෙහි නිර්මාණාත්මක කුසලතාවන්ගේ නිපුණතාව සහ මාධ්‍යයෙහි කාර්යන්, චිත්‍රපට ආදියෙහි ව්‍යුහයේ ශ්‍රව්‍ය දෘශ්‍ය සංජානනයේ හැඩ ගැසීමත් අධ්‍යයනය කෙරේ.

3. විශ්ලේෂණ මොඩියුලය.
   Module of Analysis
   මාධ්‍ය කලාවේ විෂය ක්ෂේත්‍රය තුළ විශ්ලේෂණාත්මක කුසලතාවන්හි වර්ධනය සිදු කරයි.

4. මාධ්‍ය ඉතිහාස මොඩියුලය.
   Module of Media History
   සමකාලීන සමාජ, සංස්කෘතික තත්ත්වය සමග මාධ්‍ය කලා ඉතිහාසයේ

ප්‍රධාන සිදුවීම් හඳුනා ගැනීම මාධ්‍ය ඉතිහාසය මොඩියුලයෙන් සිදුවේ.

මෙම ආකෘතිය තුළින් ඉදිරිපත් වන දැනුම හරහාද ජනමාධ්‍යවේදියාට තම භූමිකාවේ සඵලදායි බව වර්ධනය කර ගත හැකිවේ.

ජනමාධ්‍යවේදියාගේ කාර්යන් හා ඔහුගේ භූමිකාවත්, ඒ සඳහා අවශ්‍ය කුසලතා පිළිබඳවත් අවධානය යොමු කිරීමේදි , ඔහුට ඒ පිළිබඳ අධ්‍යාපනයේ ඇති වැදගත්කම ඉස්මතු වෙයි. ජනමාධ්‍යවේදියාගේ මූලික කාර්යන් වන සන්නිවේදන කාර්ය, මතවාදාත්මක කාර්ය, සෘජු සංවිධානමය කාර්ය, අධ්‍යාපනික හා සංස්කෘතිකමය කාර්ය, විනෝදාස්වාදන කාර්ය, ප්‍රචාරණ කාර්ය ආදිය සඵලතාවයකින් යුතුව ඉටු කිරීමට නම් පූර්ව දැනුමක් තිබිම අවශ්‍ය වේ. එනම් සිද්ධීන් පිළිබඳ මතු පිට වාර්තාකරණයෙන් මිදී අභ්‍යන්තර ගැඹුර වෙත යොමු වූ සන්නිවේදනයක් කිරීමට මනා දැනුමක් අවශ්‍ය වේ. මේ පිළිබඳ කේ. එම්. ජී. කෝනාර දක්වන අදහස වන්නේ " වචනාර්ථයෙන්, අධ්‍යාපනයෙන්, ජනමාධ්‍ය වේදියෙකු ගුණාත්මක බවින් ඉහළ තලයක සිටිය යුතුය. -------- උපාධියක් හෝ ඊට සමාන අධ්‍යාපනයක් ලබා දීම මාධ්‍යවේදියාගේ අත්දැකීම්වලින් ලබන දැනුම වඩා ඔප දැමීමක් වේ." 12 යනුවෙනි.

එනම් ජනතා සුභ සිද්ධිය උදෙසා අවශ්‍ය දත්ත සපයන්නෙකු වශයෙන් ජනමාධ්‍යවේදියා සිද්ධීන් පිළිබඳ ගැඹුරින් අධ්‍යයනය කරන්නෙකු විය යුතුය. එනම් ඔහු පර්යේෂකයෙක් විය යුතු වීමය. ඒ සඳහා ඔහු මානව සමාජය, කාලීන අවශ්‍යතා, සමාජ සංවර්ධනය, සංස්කෘතිය, පර්යේෂණ ක්‍රමවේද ආදී අනේකවිධ අංශ වලින් තුලනාත්මක දැනුමක් අවශ්‍ය වේ. එනම් ඔහුට විශ්වියකරණය වූ දැනුමත් තිබිය යුතු වීමයි. " සමාජ විඥානයේ සෙසු ස්වරූප වන දේශපාලනය විද්‍යාව, කලාව, නීතිය, ආගම, සදාචාරය, දර්ශනය ආදීන් අතර ඒකාග්‍රතාවක් හා අන්‍යෝන්‍ය සම්බන්ධතාවන් නිර්මාණය කිරීමේ දී ජනමාධ්‍යවේදයට පැවරෙන්නේ සුවිශේෂ වූ කාර්යභාරයකි."[13] එනිසා එම ක්ෂේත්‍ර පිළිබඳව ද ජනමාධ්‍යවේදියාගේ අධ්‍යාපනය ඉතා වැදගත් වේ. ආචාර්ය නන්දන කරුණානායකගේ අදහස වන්නේ " පුවත්පත් කලාව උගන්වන විශ්වවිද්‍යාල පිළිබඳව කළ ඇගයීමේදී හොඳ පුවත් පත් කලාවේදියෙකු වීමට නම් ගණිතයේ සිට විදේශ ප්‍රතිපත්ති දක්වාත්, දේශපාලනයේ සිට අධිකරණ හා නීති කටයුතු දක්වාත්, අර්ථික විද්‍යාවේ සිට දේශපාලන විද්‍යාව මෙන්ම සමාජ විද්‍යාව පිළිබඳව ද සාමාන්‍ය අවබෝධයක්වත් ඇති කරගත යුතු බවය."[14]





ජනමාධ්‍යවේදියෙකු වශයෙන් ප්‍රගුණ කළ යුතු මූලික කුසලතා තිබේ. විශ්ලේෂණාත්මක චින්තනය, ගවේෂණාත්මක බව, පර්යේෂණ හැකියාව, මනා භාෂා කුසලතාව, තාක්ෂණය භාවිත කිරීමේ හැකියාව, නිර්මාණාත්මක චින්තනය ආදී කුසලතා, ඔහුට තිබිය යුතුවේ. මේ කුසලතා නිසියාකාරව තම වෘත්තිය තුළ දී හැසිරවීමට ද ඒ ආශ්‍රිත දැනුමක් තිබීම අවශ්‍ය වේ. ඉහත විස්තර කළ ජනමාධ්‍යවේදයේ න්‍යායන් හා අධ්‍යාපන මාදිලි විමසා බලන විට ඒවා හරහා මෙම දැනුම ලබා ගත හැකි බව පැහැදිලි වේ.

මේ ජනමාධ්‍යවේදියාට තම භූමිකාව පිළිබඳවත්, තොරතුරු ක්‍රියාකාරිත්වය පිළිබඳවත්, සංදේශ, වැඩසටහන් සකස් කිරීම පිළිබඳවත්, ඒවා ග්‍රාහකයන් වෙත සම්ප්‍රේෂණය කිරීමේ ක්‍රමවේදය පිළිබඳවත්, වෘත්තියේ නව ප්‍රවණතා පිළිබඳවත්, තමාගේ සමාජ වගකීම පිළිබඳවත් මනා අවබෝධයක් තිබිය යුතුවේ. ජනමාධ්‍ය අධ්‍යාපනය තුළින් මේ දැනුම ලබා ගත හැකිවේ. එරික් ලූ ගේ (Eric Loo) අදහස් අනුව " ජනමාධ්‍යවේද උපාධිධාරී අධ්‍යාපනයේ අරමුණ වන්නේ, අර්බුද පිළිබඳව තර්කානුකූල හා විචාරාත්මක පරාවර්තනයක් කිරීමටත්, තර්කානුකූලව ලිවීමටත් සහ අත්‍යවශ්‍ය පරාසයක් වූ දාර්ශනික, දේශපාලනික හා සංස්කෘතික අංශයන්ගෙන් බුද්ධිමත් වීමටත් ඉගැන්වීමයි."[15]

මේ ආකාරයෙන් ජනමාධ්‍යවේදියාට තම ක්ෂේත්‍රය පිළිබඳ ව්‍යවහාරික දැනුමක් තිබීම ද අවශ්‍ය වේ. එනම් අදාළ ක්ෂේත්‍රයේ ද්‍රව්‍යමය ක්‍රියාකාරිත්වය පිළිබඳවයි.

මෙසේ ජනමාධ්‍යවේදියාට, සිය වෘත්තිමය සඵලතාව උදෙසා අදාළ ක්ෂේත්‍රය පිළිබඳ න්‍යායික හා ව්‍යවහාරික දැනුමක් තිබීම අත්‍යවශ්‍ය බව පෙනෙයි. එම දැනුම ලබා ගැනීම උදෙසා ජනමාධ්‍යවේදියාට, ජනමාධ්‍යවේදය පිළිබඳ අධ්‍යාපනය ලැබීමේ අවශ්‍යතාවක් පවති.

## මූලාශ්‍ර

1. *වීරසිංහ ටියුඩර්, චන්ද්‍රසිරි රාජපක්ෂ, 2002, ජනමාධ්‍යවේදය, සංහිඳ ප්‍රකාශන, 10 පිටුව;*

2 . *මහේන්ද්‍ර සුනන්ද, 1997, සන්නිවේදන ශබ්දාකරය, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 185 පිටුව;*

3 . කරුණානායක නන්දන, 1994, සන්නිවේදනය ප්‍රභවය හා ව්‍යාප්තිය, මාධ්‍ය ප්‍රකාශකයෝ, 91 පිටුව;

4 . ආරියදාස එඩ්වින්, 1993, පුවත්පත් කලා සමීක්ෂා, ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ ප්‍රකාශනයක්, 114 පිටුව;

5. *Everett, E., Dennis, 1989, Reshaping the Media, Sage Publication, London;*

6. විරසිංහ මියුඩර්, රාජපක්ෂ චන්ද්‍රසිරි, 2002, ඉහත ග්‍රන්ථය, 28 පිටුව;

7. <u>http:// www.Media education.boom .ru / Russina.htm</u>

8. විරසිංහ මියුඩර්, රාජපක්ෂ චන්ද්‍රසිරි, 2002, ඉහත ග්‍රන්ථය, 28 පිටුව;

9. *Mcquail Denis, 2000, Mcquail's Mass Communication Theory, 4th Edition - SAGE Publication, P 7;*

10. *------- Ibid ------, 2000, P 7;*

11. <u>Http://www.media education.boom.ru/Russia.htm</u>

12. ප්‍රාදේශිය ප්‍රවෘත්තිකරණයට ප්‍රවේශයක්, 2000, ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ ප්‍රකාශයක් , 85 පිටුව;

13. විරසිංහ මියුඩර්, ජනමාධ්‍යවේදයේ මනෝ විද්‍යාත්මක පදනම පිළිබඳ විවිධ ප්‍රවේශ/සන්නිවේදන ශාස්ත්‍රීය සංග්‍රහය දෙවන වෙළුම, මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර උපහාර කලාපය, රෝහණ ලක්ෂ්මන් පියදාස (සංස්කාරක) 79 පිටුව;

14. පුවත්පත් කලා සමීක්ෂා <u>II</u> , 1998 , ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ ප්‍රකාශනයක්, 300 පිටුව;

15. <u>Media Asia Volume 28</u>, *No - 01- 2001, AMIC Publication, P 23, 24;*





# 20

# පවුල් සැලසුම් ක්‍රම භාවිතයේ දි උද්ගත වන ප්‍රජනක සෞඛ්‍යය පිළිබඳ සමාජ විද්‍යාත්මක විමසුමක්

**ලක්ෂ්මන් දිසානායක**
**මනෝරි කලුතන්තිරි**

*ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ ශ්‍රී ලංකාවේ මහජනයාගේ අවධානය මෙන්ම ඒ පිළිබඳ ඇති දැනුම ද අල්ප යැයි හැගෙයි. ප්‍රජනක සෞඛ්‍ය යනුවෙන් සාමාන්‍යයෙන් අදහස් කරන්නේ ස්ත්‍රියකගේ ආර්ථවය පටන් ගැනීමේ සිට ආර්ථවහරණය දක්වා වන කාලපරිච්ඡේදයේ දි මතුවන සෞඛ්‍ය තත්ත්වයන්ය. මෙහිදී සාවුලයත්වය පටන් ගැනීමේ අවධිය, දරුවන් බිහි කිරීමේ අවධිය හා දරුවන් බිහි කිරීම නවත්වන අවධිය යනුවෙන් මූලික වශයෙන් ප්‍රජනන කාලපරිච්ඡේදය කොටස් තුනකට බෙදා වෙන්කර දැක්විය හැකි අතර ඒ කාලපරිච්ඡේද තුන තුළ ස්ත්‍රියක් මුහුණපාන සෞඛ්‍ය ගැටලු ද විවිධ වේ. මේ පිළිබඳව අවධානය යොමුකර මහජනයාට දැනුමක් ලබා දීම මෙන්ම ඒ හා සම්බන්ධ ප්‍රතිපත්ති සකස් කරන ශිල්පීන්ගේ අවධානය ද ප්‍රජනක සෞඛ්‍ය ගැටලු නිරාකරණය කිරීම පිළිබඳ යොමු කිරීම ද අවශ්‍ය වේ. මෙහිදී මෙම දැනුවත් කිරීම සම්බන්ධයෙන් ප්‍රබල මෙහෙයක් ජනමාධ්‍යවේදයට කළ හැකි වේ.*

*නමුත් වර්තමානයේ මේ පිළිබඳ ඇති අවධානය ඉතා අල්පය. මෙම ලිපියේ ප්‍රධාන පරමාර්ථය වන්නේ ජනමාධ්‍යයේ වෙසෙන හා ඊට පිවිසෙන පුද්ගලයන්ගේ අවධානය මෙම වැදගත් විෂය ක්ෂේත්‍ර සඳහා යොමුකර වීමයි. මේ පිළිබඳව ජනමාධ්‍ය මූලිකව ගොඩන- න කතිකාව තුළින් නිවැරදි දත්ත ජනවිඥාන ගත වීම සිදුවේ.*

## 1. හැඳින්වීම

මෙම අධ්‍යයනයේ මූලිකම **අපේක්ෂාව** වන්නේ පවුල් සැලසුම් ක්‍රම සහ ප්‍රජනක සෞඛ්‍ය අතර සබඳතාව පිළිබඳ සමාජ විද්‍යාත්මක විග්‍රහයක් ඉදිරිපත් කිරීමය. පවුල් සැලසුම් ක්‍රම ප්‍රජනක සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වැදගත් අංශයකි. ප්‍රජනක සෞඛ්‍ය ක්ෂේත්‍රය කෙරෙහි පවුල් සැලසුම් ක්‍රම, ගබ්සාව, ලිංගික සම්ප්‍රේෂණ රෝග, ළමා සෞඛ්‍ය, මාතෘ සෞඛය යන අංශ ගණනාවක් අයත් වෙයි. මේ අතරින් පවුල් සැලසුම් ක්‍රම මේ සෑම අංශයක් කෙරෙහිම බලපෑමක් කරයි. අනවශ්‍ය දරු උපත් පාලනය සඳහා පවුල් සැලසුම් ක්‍රමයක් භාවිත කිරීම තුළින් ගබ්සාව වැනි අවදානම් තත්ත්වයන්ගෙන් මිදීම, අනාරක්ෂිත ලිංගික හැසිරීමක දී රබර් කොපු (කොන්ඩම්) භාවිත කිරීම තුළින් ලිංගික සම්ප්‍රේෂණ රෝගවලින් වැළකීම, දරුවන් අතර පරතරය තබා ගැනීම, දරුවන් ප්‍රමාණය සීමා කිරීම, අඩු වයසින් දරුවන් නොලැබීම යන තත්වයන් තුළ දී දරුවාගේ මෙන්ම මවගේද සෞඛ්‍ය තත්ත්වය ආරක්ෂා වන අතර දරුවාගේ පෝෂණ තත්ත්වය කෙරෙහි දළුය බලපායි. මේ අනුව ප්‍රජනක සෞඛ්‍ය ක්ෂේත්‍රයෙහි පවුල් සැලසුම් ක්‍රමවලට හිමි වනුයේ සුවිශේෂී ස්ථානයකි.

පවුල් සැලසුම් ක්‍රම හා ප්‍රජනක සෞඛ්‍ය යනු එකිනෙක වෙන් කර සාකච්ඡා කළ නොහැකි මාතෘකා දෙකකි. මේ නිසා අවබෝධයකින් යුක්තව පවුල් සැලසුම් ක්‍රම භාවිත කිරීම ම්-න් ප්‍රජනක සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඇතිවන ප්‍රශ්න ගණනාවකින් වැළකිය හැකි වෙයි. එසේම මෙම අධ්‍යයනයේ තවත් පරමාර්ථයක් වන්නේ පවුල් සැලසුම් ක්‍රම භාවිතයේ දී ස්ත්‍රීන් ප්‍රජනක සෞඛ්‍ය ගැන සැලකිලිමත් වන්නේ තමාගේ සමාජ, ආර්ථික වටපිටාව නිසා ද නො එසේ නම් වෙනත් සාධකයන්ගේ බලපෑමක් නිසා ද යන්න විමසා බැලීමයි.

මෙහිදී විශේෂ අවධානයක් යොමු වන්නේ ඉහළ අධ්‍යාපනයක් ලද විවාහක නාගරික කාන්තාවන් පවුල් සැලසුම් ක්‍රම භාවිතයේ දී ප්‍රජනක සෞඛ්‍ය





ගැන සැලකිලිමත් වේද යන්නයි. එසේම මෙහි තවත් අරමුණු කිහිපයකි. වර්තමාන විවාහක කාන්තාවන්ගේ පවුල් සැලසුම් ක්‍රම භාවිතය පිළිබඳ අවබෝධය නිවැරදි දැයි යන්න විමසා බැලීමත්, වර්තමානයේ විවාහක කාන්තාවන් පවුල් සැලසුම් ක්‍රම භාවිතයේ දී ප්‍රජනක සෞඛ්‍ය ගැන සැලකිලිමත් වේද යන්න විමසා බැලීමත්ය.

ප්‍රජනක සෞඛ්‍යය වර්තමානයේ වැදගත් ලෙස සාකච්ජාවට බඳුන් වන මාතෘකාවකි. මේ පිළිබඳ විධිමත් සාකච්ජාවක් සිදු වූයේ 1994 දී ජනගහනය හා සංවර්ධනය තේමා කර ගනිමින් පැවැත්වූ කයිරෝ සමුළුවේදී ය. එහිදී ප්‍රජනක අයිතිවාසිකම් සහ ප්‍රජනන සෞඛ්‍ය පහත සඳහන් අන්දමට නිර්වචනය කර ඇත.

ජීවිතයේ සියලුම අවස්ථාවන් හිදී ප්‍රජනන පද්ධතියේ ප්‍රජනක ක්‍රියාවලියේ සහ ප්‍රජනක ක්‍රියාකාරකම්වල යහ පැවැත්ම ආරක්ෂා කර ගනිමින් රෝගී තත්ත්ව වලින් වැළකී සිටීම පමණක් නොව කායික මානසික හා සමාජීය සුවදායීභාවය ද ප්‍රජනක සෞඛ්‍ය වෙයි. මෙයින් තවදුරටත් පැහැදිලි වන්නේ මිනිසුන්ට ආරක්ෂා සහිත තෘප්තිමත් වියහැකි ලිංගික ජීවන රටාවක් තුළින් ප්‍රජනනය ඇති කිරීමට ඇති හැකියාව සහ කෙබඳු අවස්ථාවන්හි දී මෙන් ම කෙතෙරම් පරතරයක් තුළ මෙම ක්‍රියාවලියට යොමු විය යුතු ද යන්නයි. ඉහත සඳහන් වගන්තියෙන් තව දුරටත් පැහැදිලි කරන්නේ මිනිසුන් සහ කාන්තාවන් තම තමන්ගේ අභිමතාර්ථයට අනුකූල වන ලෙස ආරක්ෂා සහිතව සහ ක්‍රියාශීලීව පවුල් සැලසුම් ක්‍රමයක් තෝරාගෙන ප්‍රජනන ක්‍රියාවලියන්හි ද ඉතාමත් ම හිතකර සෞඛ්‍යාරක්ෂිත ක්‍රම භාවිත කරමින් ගර්භනී අවස්ථාවේ සිට දරු උපත් දක්වා ආරක්ෂිත ලෙස පියවරවල් අනුගමනය කළ යුතුය. එහිදී සුවදායී ප්‍රතිඵල ළ-ා කර ගත හැක්කේ සෞඛ්‍යදායී දරුවන් ගේ බිහිවීම ම්-නි. (Hardeetal . 1998)

මෙම හිමිකම් යටතේ මිනැම පුද්ගලයෙකුට මිනැම විවාහක පුද්ගලයින්ට දරුවන් බිහි කිරීමේ සංඛ්‍යාවත් පරතරයත් කාලයත් නිගමනය කර ගැනීම පෞද්ගලිකව සිදු කර ගත යුතු කාර්යයක් වෙයි. එමෙන්ම විෂමතාවලින් සහ විවිධාකාර හිංසක ක්‍රියාවලින් තොරව ප්‍රජනන ක්‍රියාවලියට යොමු වීම ඉතාමත් ම හිතකර තීරණයක් වියයුතු බව මානව හිමිකම් පද්ධතිය ප්‍රකාශ කරයි. මෙම හිමිකම භුක්ති විදිමේ දී දරුවන්ගේ සහ දෙමාපියන්ගේ අනාගත පැවැත්ම ගැන විශේෂ උනන්දුවක් ඇතිවෙයි. බොහෝ රටවල මිනිසුන් තුළ විශේෂයෙන් ඌන සංවර්ධිත රටවල අධ්‍යාපනික පහසුකම්වල ඇති දුර්වලතා නිසා ලිංගික අධ්‍යාපනයක් කිසිසේත් නොලැබෙන බැවින් ඉතාමත් ම සෞඛ්‍යයට අහිතකර වන දුර්වල ස්වභාවයේ ප්‍රජනන

සෞඛ්‍ය පද්ධතියක් ඔවුන්ට හිමි වී ඇති අතර, මේ නිසා තරුණ පරපුර නොයෙකුත් ප්‍රශ්න රාශියකට මුහුණ දී ඇත. ( United Nations 1996)

1970 දශකයේ අවසාන භාගයේ සිට ශ්‍රී ලංකාවේ ජනගහනය පාලනය කිරීමට ඉතාමත් උනන්දුවක් දක්නට ලැබුණි. එයට හේතුව එවකට රජය සෘජුව ජනගහන ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමට උත්සාහ දැරීමයි. මේ අනුව සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය යටතේ, ජනගහන අංශය නමින් වෙනම අංශයක් පිහිටුවා විශේෂයෙන්ම සාපල්‍යතාවය පාලනය කිරීම පිළිබඳව විවිධ වූ වැඩ සටහන් රාශියක් දිවයින පුරාම ක්‍රියාත්මක කළේය. මෙහිදී මුල් අවධියේදී ගුවන්විදුලි හා ප්‍රවෘත්ති පත්‍රද, ශ්‍රී ලංකාවට රූපවාහිනිය හඳුන්වා දීමෙන් පසු රූපවාහිනිය ද මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා භාවිත කළේය. මෙහිදී විශේෂයෙන්ම අවධාරණය කෙරුණේ ස්ත්‍රීන්ගේ සඵලතාවය තමන්ට පාලනය කළ හැකි බවත්, ඒ සඳහා නවීන උපත් පාලන ක්‍රම ඇති බවත් ඒවා ලබා ගත හැක්කේ කෙසේද යන්න පිළිබඳවත්ය. ඒ අනුව, ජනගහන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ජනමාධ්‍ය වලින් ලැබෙනුයේ විශාල අනුග්‍රහයක් බව යමෙකුට ප්‍රකාශ කළ හැකිය.

1970 හා 1980 දශකවල ජනගහනය පාලනය සඳහා සඵලතාවය පාලනය කිරීමට වෙහෙසක් හා උනන්දුවක් දැක්වූ කාලපරිච්ඡේද වුවත් ප්‍රජනන සෞඛ්‍ය කෙරෙහි රජය උනන්දුවන්නට පටන් ගත්තේ 1994 පැවති ලෝක ජනගහන සමුළුවෙන් පසුවයි. යම් අයෙකුට එය අහම්බෙන් සිදු වූවක් යැයි තර්ක කිරීමටද හැකියි. එයට හේතුව 1994 ලෝක ජනගහන සමුළුව පැවැත්වූයේ ඊජිප්තුවේ කයිරෝ අගනුවර වීමත් මුස්ලිම් ලොව උපත් පාලන ක්‍රම පිළිබඳ සාකච්ඡාවලට දැඩි විරෝධයක් පෑමත් ඒ හේතුවෙන් එහි තේමාව ප්‍රජනක සෞඛ්‍ය යනුවෙන් මාරු වීමත්ය. සාමාන්‍යයෙන් බලන කළ ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ අවධාරණය කිරීම වැදගත් වන්නේ පහත සඳහන් කරුණු පිළිබඳ නිසා බව කිව හැකිය.

* ලෝකයේ බොහොමයක් තරුණයන් මූලික වයස්වලදී ලිංගික ක්‍රියාකාරීත්වයෙන් යුත් අතර මේ කටයුතු වඩාත් සිදුවන්නේ ස්වභාවයෙන් පරිබාහිරවය.
* බොහොමයක් ලිංගික වශයෙන් ක්‍රියාකාරී තරුණයන් පවුල් සැලසුම් ක්‍රම උපයෝගී කර නොගනී. ඊට අමතරව බොහෝ විවාහක තරුණ පිරිස්වල ද උපත් පාලන ක්‍රම භාවිතය පහළ මට්ටමක පවතී. දියුණු වෙමින් පවතින රටවල අවුරුදු 15 - 19 වයස් කාණ්ඩයේ විවාහක ස්ත්‍රීන්ගෙන් උපත් පාලන





ක්‍රම කරන්නේ 17% ප්‍රමාණයක්ය.
* අවුරුදු 19ට අඩු වයස් කාණ්ඩයේ ස්ත්‍රීහු මිලියන 15ක් වාර්ෂිකව දරුවන් බිහිකරති. මෙම ප්‍රමාණය ලෝකයේ මුළු උපත් ප්‍රමාණයෙන් 1/5 පමණ වේ. මින් වැඩි ප්‍රමාණයක් වාර්තාවන්නේ දියුණු වෙමින් පවතින රටවලින්ය.
* වාර්ෂිකව මිලියන 4 ක පමණ තරුණ ස්ත්‍රීන් ප්‍රමාණයක් ගබ්සාවලට භාජනය වන අතර මින් වැඩි ප්‍රමාණයක් ප්‍රේරිත ගබ්සා හෙවත් නීත්‍යානුකූල නොවන ගබ්සා වේ. ඒවා කෙරෙනු ලබන්නේ ආනාරක්ෂිත තත්ත්වයන් යටතේය.
* වාර්ෂිකව අවු. 19ට අඩු තරුණ අය 20 කගෙන් එක් අයෙකු සමාජ රෝග වලට භාජනය වන අතර සමහර රෝග නිසා වඳභාවය හෝ මරණයට පත්වීමට පුළුවන.
* මේ වන විට අවු. 25 ට අඩු වයසේ සිටින තරුණ ජනගහනයෙන් භාගයක් පමණ විවිධ ආසාධනයට භාජනය වී ඇති බව වාර්තා වේ. මේ හේතූන් නිසා ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ අවධානය වැදගත් බව අමුතුවෙන් කිව යුතු නැත.

මේ අනුව ප්‍රජනන සෞඛ්‍ය ගැන සැලකිලිමත් වීම කාලීනව වැදගත් මාතෘකාවකි. විශේෂයෙන්ම කාන්තාවන්ගේ ප්‍රජනන සෞඛ්‍ය මතු ඉපදීමට සිටින දරුවන්ගේ සෞඛ්‍යයටද බලපෑම් කරන හෙයින් අනාගත සෞඛ්‍ය සම්පන්න දරුවන් බිහි කිරීමට නම් කාන්තාවන්ගේ ප්‍රජනන සෞඛ්‍ය ගැන ප්‍රධාන වශයෙන්ම අවධානය යොමු කළ යුතුය. ප්‍රජනන සෞඛ්‍ය ක්ෂේත්‍රය පවුල් සැලසුම් ක්‍රම මඟින් සුවිශේෂී බලපෑමක් කරයි. පවුල් සැලසුම් ක්‍රම වර්තමානයේ ලෝකයේ සෑම රටකම ප්‍රථම දරු උපත කල් දමා ගැනීමට දරුවන් අතර පරතරය තබා ගැනීමට හා දරුවන් සීමා කර ගැනීමට භාවිත කරයි. මේ ආකාරයට සැලසුමකින් යුක්තව දරුවන් බිහි කිරීම මවගේ මෙන්ම දරුවාගේ සෞඛ්‍යයට හිතකර වන්නා සේම කායික මානසික සුවදායීතාවට ද හේතු වෙයි. පවුල් සැලසුම් ක්‍රම පිළිබඳ පහත පරිදි නිර්වචනය කළ හැකිය.

කිසියම් විවාහක යුවලක් අතර සාර්ථක ලිංගික සම්බන්ධතාවන් පවත්වා ගෙන යෑමේ දි බුද්ධිමත් ලෙස සාපල්‍යතාව පාලනය කිරීමේ අවශ්‍යතාව වන්නේ දරු උපත් අතර පරතරය සහ දරුවන් සංඛ්‍යාව මනා අවබෝධයකින් පවත්වා ගෙනයාමය. මෙම බුද්ධිමත් පාලනය යන තේමාව රාජ්‍ය ආයතන මඟිනුත් ජාත්‍යන්තර සංවිධාන සහ ස්වේච්ඡා සංවිධාන මඟිනුත් පවත්වා ගෙනයනු ලබන නීත්‍යානුකූල වැඩ සටහන්වලට ද යොමු විය යුතු එක්තරා සාධකයක් විය යුතුය.

මේ පිළිබඳව වැඩි දුරටත් නිර්වචනය කරන්නේ නම් සාපලයතාවය පාලනය වශයෙන් හැඳින්වෙන්නේ උපත් පාලනයයි. තවදුරටත් උපත් පාලන ක්‍රම මඟින් හෝ අදාළ පාර්ශවකරුවන් දෙදෙනාගේ (ස්වාමියා, භාර්යාව) එක් අයෙකු හෝ වන්දිකරණයට භාජනය වීමත් මෙම තේමාවේ එක්තරා අංශයක් විය යුතු අතර ගබ්සාව මෙහි අංගයක් නොවිය යුතුය. (Gebenik & Hill 1974)

පවුල් සැලසුම් ක්‍රම භාවිතය 1960 ගණන් වලින් පසුව සීඝ්‍ර වර්ධනයක් දක්නට හැකිය. 1991 වන විට පවුල් සැලසුම් ක්‍රම භාවිතය වේගවත් වූ අතර ඌන සංවර්ධිත රටවල 53% කින්ද සංවර්ධිත වූ රටවල 71% කින්ද ලොව පුරාම 57% කින්ද පවුල් සැලසුම් ක්‍රම භාවිතය වර්ධනය වී ඇත. එසේම ආසියාවේ 43% ක ප්‍රතිශතයක් 1991 වන විට හඳුනා ගත හැකිය. (United Nations 1996)

ලංකාවේ මේ දක්වා පවුල් සැලසුම් ක්‍රම පිළිබඳ කර ඇති පර්යේෂණ වලට අනුව සලකා බැලීමේදී පවුල් සැලසුම් ක්‍රම භාවිතය ක්‍රමයෙන් වර්ධනය වී ඇත. සමාජ ආර්ථික සාධක අනුව මෙම පවුල් සැලසුම් ක්‍රම භාවිතය එනම් වයස් ව්‍යුහය, අධ්‍යාපනය, රැකියාව, ජාතිය, ආගම, ග්‍රාමීය නාගරික බව යනාදි වශයෙන් විස්තර කර ඇත. මීට අමතරව ලංකාවේ විවාහක කාන්තාවන් අතර පවුල් සැලසුම් ක්‍රම භාවිතය පිළිබඳ අවබෝධයක් තිබෙන බවත් පෙන්වා දී ඇත. නමුත් මෙම අධ්‍යාපනය මඟින් පවුල් සැලසුම් ක්‍රම භාවිතය පිළිබඳ මූලික අවධානය යොමුකළ ද ඒවායෙහි පවතින නොයෙකුත් සෞඛ්‍ය ගැටලු ඇතිවීම ඒ හේතු නිසා පවුල් සැලසුම් ක්‍රම නැවැත්වීම, එසේම කාන්තාවන්ට පවුල් සැලසුම් ක්‍රම භාවිත කිරීමට අවශ්‍ය වුවද නොයෙකුත් සමාජ බලපෑම් නිසා ඒවායේ නොයෙදීම, ඒ තුළින් අනවශ්‍ය දරු උපත් ඇතිවීම හා ඒ තත්වයන් තුළින් විවාහක කාන්තාවන් නොයෙකුත් කායික මානසික පීඩාවලට පත්වීම වැනි තත්වයන් කෙරෙහි අවධානය යොමුකර ඇත්තේ අඩු වශයෙනි. ඒ අනුව පවුල් සැලසුම් ක්‍රමයක් භාවිත කිරීමේදී විවාහක කාන්තාවන් තමන්ගේ ප්‍රජනන සෞඛ්‍ය ගැන සැලකිලිමත් වීම කෙරෙහි අධ්‍යයනය කිරීම වැදගත් සේ සැලකිය හැකියි.

උපත් පාලනය සඳහා භාවිත කරනක්‍රම වලින් ඇතිවන අතුරු ආබාධ නිසා සමහර විවාහක කාන්තාවන් පීඩාවට පත්වන බව සමහර අධ්‍යයන පෙන්වා දී ඇත. පවුල් සැලසුම් ක්‍රම සහ ප්‍රජනන සෞඛ්‍ය අතර සබඳතාව විමසා බැලීමේදී





මෙම තත්වය හඳුනා ගැනීමට උත්සාහ කිරීම ද මෙම අධ්‍යයනයේ අරමුණක් වේ. එසේම විවාහක කාන්තාවන් පවුල් සැලසුම් ක්‍රමයක් තෝරා ගන්නේ ප්‍රජනන සෞඛ්‍ය ගැන සැලකිලිමත් වූ නිසාද ? නොඑසේ නම් පවුල් සැලසුම් ක්‍රම සහ ප්‍රජනන සෞඛ්‍ය අතර ඇති සබඳතාව ඇති කිරීමට දැනුවත් භාවයක් ලබා දිය යුත්තේ කුමන සමාජ ආර්ථික පසුබිමක සිටින විවාහක කාන්තාවන්ට ද යන්න අවබෝධ කර ගැනීමට ද මෙම අධ්‍යයනය තුළින් බලාපොරොත්තු වෙයි.

පර්යේෂණ නියැදිය වශයෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තෝරා ගත් අතර එහි නාගරික ප්‍රදේශ මූලික කර ගනිමින් කරන ලදි. එසේම මෙම අධ්‍යයනයට භාජනය වූයේ වයස අවු. 18 ත් 49 ත් අතර නාගරික විවාහක කාන්තාවන් වෙයි. වයස අවු. 18 - 49 අතර විවාහක කාන්තාවන් තෝරා ගැනීමට මූලික හේතුව වූයේ ලංකාවේ නිත්‍යානුකූල විවාහ වන වයස අවු.18 නිසාත් අවු.49 වන විට කාන්තාව ආර්තවහරණයට ලංවීමත් නිසාය. මේ අධ්‍යයනයේදී විශේෂයෙන් ම ප්‍රමාණාත්මක තොරතුරුවලට අමතරව ගුණාත්මක දත්ත භාවිත කරන ලදි. එයට හේතු වූ ප්‍රමාණාත්මක දත්තවලින් පමණක් පර්යේෂණයේ පරමාර්ථ මුදුන් පමුනුවා ගත නොහැකි වීමයි. මෙහිදී ප්‍රමාණාත්මකව ලබා ගන්නා තොරතුරුවලට අනුව පැහැදිලි අරුතක් ලබා ගැනීම සඳහා ප්‍රත්‍යෙක අධ්‍යයන කිහිපයක් ම මෙම අධ්‍යාපනය සඳහා භාවිත කර ඇත.

මේ අධ්‍යයනය සඳහා අවශ්‍ය තොරතුරු 1983 දී කරනු ලබන ශ්‍රී ලංකා ප්‍රජා විද්‍යාත්මක වෙනස් වීම නැමැති පර්යේෂණ ආධාර කරගෙන ලබාගෙන ඇත. සමහර අවස්ථාවන්වලදී 1987 දී කරනු ලබන ප්‍රජා විද්‍යාත්මක හා සෞඛ්‍ය සමීක්ෂණය ද භාවිත කරන ලදි. ප්‍රජා විද්‍යාත්මක වෙනස් වීම පිළිබඳ සමීක්ෂණය කරනු ලැබුවේ ඕස්ට්‍රේලියාවේ ජාතික විශ්වවිද්‍යාලය හා කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රජා විද්‍යාත්මක අංශයයි. මෙම සමීක්ෂණයේදී සූක්ෂම ලෙස ක්‍රම යොදා ගැණින. මෙහිදී දත්ත එකතු කළ අතර, නොයෙකුත් සාකච්ඡා තුළින් වැදගත් තොරතුරු අධ්‍යයනය කරනු ලැබීය. මෙහිදී කුටුම්බ 1974 ක වෙසෙන 10,964 ක ජනගහනයක් අධ්‍යයනයට භාජනය කෙරින. එයිනුත් අවු. 15 න් 49 අතර 2151 විවාහක පුරුෂයන් හා විවාහක ස්ත්‍රීන් සංඛ්‍යාවක් මෙම නියැදියට ඇතුලත් විය.

## 2. පවුල් සංවිධාන ක්‍රම භාවිතය

මෙහිදී සලකා බලනුයේ නියැඳියකට අයත් වූ නාගරික විවාහක කාන්තාවන් වර්තමානයේ භාවිත කරන පවුල් සැලසම් ක්‍රම පිළිබඳවයි. නාගරික විවාහක කාන්තාවන් වැඩිම වශයෙන් භාවිත කරනුයේ නවීන ක්‍රමයි. ඒ අතර ලූප්, එන්නත් වැඩි ප්‍රමාණයක් භාවිත කරයි.

භාවිත නොකරන පිරිසක් සහ පාරම්පරික ක්‍රම භාවිත කරන පිරිස ද ඊට සමගාමීව අඩුය. පවුල් සැලසුම් භාවිත නොකරන පිරිස අතර වර්තමානයේ විවාහ වූ කාන්තාවන් ද සිමි.

පවුල් සැලසුම් ක්‍රම භාවිත කරන අය සම- සාකච්ඡා කිරීමේ දී අවබෝධ වූයේ විවාහක කාන්තාවන්ගෙන් බහුතරය නොකඩවා එකම ක්‍රමයක් භාවිත කර නොමැති බවයි. නවීන ක්‍රම භාවිත කරන විවාහක කාන්තාවන් අතරින් කිහිප දෙනෙක් එක්තරා කාලයකදී පාරම්පරික ක්‍රම භාවිත කර ඇත.

පාරම්පරික ක්‍රම භාවිත කරන අය කිහිපදෙනෙක් පමණක් නවීන ක්‍රම අතහැර දමා පාරම්පරික ක්‍රමවලට පැමිණ ඇති අතර අනිත් අය දිගටම පාරම්පරික ක්‍රම භාවිත කර ඇත. දැනට පවුල් සැලසුම් ක්‍රමයක් භාවිත නොකරන අය අතරින් ගැබිණි තත්ත්වයේ පසුවන විවාහක කාන්තාවන් අතරින් බහුතරයක් පමණ දරු ප්‍රසූතියෙන් පසුව පවුල් සැලසුම් ක්‍රමයක් භාවිත කිරිමට බලාපොරොත්තු වෙයි.

පවුල් සැලසුම් ක්‍රම භාවිතය අතරින් වැඩි ප්‍රමාණයක් නවීන ක්‍රම භාවිතා කරයි. සම්ප්‍රදායික ක්‍රම භාවිත කරන විවාහක කාන්තවන් අතරින් දුටු විශේෂත්වය නම් එම ක්‍රම සියල්ලම මිශ්‍රව භාවිත කිරිමට ඔවුන් පුරුදුව සිටීමයි. මන්ද පාරම්පරික ක්‍රමවලින් ඇති විය හැකි දරුවන් ලැබීමේ අවදානම් තත්ත්වයන්ගෙන් වැළකීම සඳහාය. පාරම්පරික ක්‍රම භාවිත කරන සියලුම කාන්තවන් නාගරික සිංහල විවාහක කාන්තාවන් වූ අතර ඔවුන් අතරින් බහුතරයකගේ අදහස වූයේ බලාපොරොත්තු රහිත අවස්ථාවල පිලිසිඳ ගැනීම ඇති වූ බවයි. නමුත් ප්‍රමාණවත් දරුවන් ලැබීමේන් පසුව ස්ථිර පවුල් සැලසුම් ක්‍රමයකට බෙහෝ දෙනෙක් කැමැත්තක් දක්වයි. අධ්‍යයනයට ලක් වූ මුස්ලිම් කාන්වන් සියලු දෙනාම නවීන ක්‍රම සඳහා යොමු වූ අයයි. ඔවුන් පවසන පරිදි පාරම්පරික ක්‍රම භාවිත කිරීමට ස්වාමි පුරුෂයන්ගේ විරෝධයක් ඇත. එසේම මුස්ලිම් කාන්තාවන් අතරින් වැඩි පිරිසකගේ





පාරම්පරික ක්‍රම භාවිතය පිළිබඳ අවබෝධය අඩු මට්ටමක තිබුණි.

නවීන ක්‍රම සහ පාරම්පරික ක්‍රම භාවිත කළ ස්ත්‍රීන් අතරින් පාරම්පරික ක්‍රම භාවිත කළ ස්ත්‍රීන් තමන්ගේ අනවශ්‍ය පිළිසිඳ ගැනීම් පිළිබඳ අවධානමක් තිබුණ ද පාරම්පරික ක්‍රම භාවිත කරනුයේ ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ සැලකිමත් වීම නිසාය. ඒ අතරින් දරුවන් නොමැති වේය යන බිය තිබූ කාන්තාවන් ද සිට අතර, ඔවුන් ප්‍රජනක සෞඛ්‍ය ගැන සැලකිලිමත් වන බව කෙලින්ම අවධාරණය කර නොසිම්ය ද ඔවුන් දරුවන් නොලැබේ යනුවෙන් බියෙන් පසු වනුයේ ඒ තුළින් තමන්ගේ ප්‍රජනක පද්ධතිය පිළිබඳ සැලකිලිමත් වීම නිසා එයට හානි දායක තත්ත්වයන් ඇති වුවහොත් දරුවන් පිළිසඳ ගැනීම වැළකේ යන බිය නිසාය.

මේ අනුව පාරම්පරික ක්‍රම භාවිත කරන කාන්තාවන් අතරින් බහුතරය නවීන ක්‍රම කෙරෙහි ඇති බියත් එනම් ඒ තුළින් තමන්ගේ ප්‍රජනන පද්ධතියට යම් හානියක් වේ යන බියෙන් එම ක්‍රමවලට යොමු වෙති. මෙහිදී නවීන ක්‍රම භාවිත නොකිරිමට හේතු වූ තවත් සාධකයක් වනුයේ ස්වාමි පුරුෂයා අකමැති වීමයි. තමන්ගේ භාර්යාව තුළින් ලිංගික හැ-ීම් අඩුවේ යන බියක් ද ඔවුන් තුළ තිබුණි. මේ තත්ත්වය ගැඹුරින් විමසා බැලිමේදී පෙනෙනුයේ තම භාර්යාවගේ ප්‍රජනක පද්ධතියට කිසියම් ගැටලුකාරී තත්ත්වයක් ඇතිවීම නිසා ලිංගික හැ-ීම් මර්ධනය වේ යන බිය ඔවුන් තුළ පැවතිමයි.

## 2.1 විවාහයේ සිට ප්‍රථම දරු උපත දක්වා පවුල් සැලසුම් ක්‍රම භාවිතය ප්‍රජනක සෞඛ්‍යයට ඇති කරන බලපෑම්

පුද්ගලයෙකුගේ ප්‍රජනන වයස අවු. 15 දී පමණ ආරම්භ වෙයි. නමුත් විවිධ රටවල මෙම වයස් සීමාවෙහි වෙනස්කම් දක්නට හැකිය. කෙසේ වුවත් එයට හේතුව ප්‍රජනක ශක්තිය එසේම ඒ ඒ රටේ සාපලයතා හැසිරීම් රටාවන්ට බලපානු ලබන සමාජ, සංස්කෘතික හා ආර්ථික සාධකයි. අඩු වයසින් ප්‍රජනන ක්‍රියාවලියට යොමු වීම එම කාන්තාවන්ගේ මෙන්ම ලැබෙන දරුවන්ගේ ද සෞඛ්‍ය තත්ත්වය කෙරෙහි බලපෑම් කරයි. (United Nations 1996)

අධ්‍යයනයට භාජනය කළ නාගාරික විවාහක කාන්තාවන් අතරින් වැඩි ප්‍රතිශතයක් ප්‍රථම දරු උපත නොලබා සිටි අයයි. එම කාන්තාවන් බහුතරයක් ගර්භණී තත්ත්වයේ සිමි අතර එයින් කාන්වන් කිහිපදෙනෙක් ප්‍රථම දරු උපත් කල්

දමා ඇත. මේ සියලුම කාන්තාවන්ගෙන් ලබා ගන්නා ලද තොරතුරුවලට අනුව පැහැදිලි වූයේ ප්‍රථම දරු උපත පිළිසිඳ ගන්නා විට එක් අයෙක්වත් පවුල් සැලසුම් ක්‍රමයක් භාවිත නොකළ බවයි. එසේම පවුල් සැලසුම් ක්‍රමයක් මි-න් ප්‍රථම දරු උපත කල් දමා ගන්නා කාන්තාව භාවිත කරනුයේද පාරම්පරික පවුල් සැලසුම් ක්‍රමයකි. ගර්භණීවූ කාන්තාවන් පවසා සිම් පරිදි ඒ අතුරින් කාන්තාවන් කිහිප දෙනෙක් නවීන පවුල් සැලසුම් ක්‍රම භාවිත කිරිමට පටන් ගෙන ඇති අතර ඉන් ශරීරයට ඇති වූ නොයෙකුත් අපහසුතා නිසා නවත්වා දැමූ බවත් ඉන්පසු පාරම්පරික ක්‍රම භාවිතය කළබවද පවසන ලදී.

මේ අනුව පැහැදිලි වනුයේ ප්‍රථම දරු උපත ලැබීමට පෙර විවාහක කාන්තවන් නවීන ක්‍රමවලට යොමු වී නොමැති බවයි. නමුත් ඔවුන් සම- සාකච්ඡා කිරිමේදී වැටහුනේ නවීන ක්‍රම භාවිතයට පෙළඹී ඇති කාන්තාවන් ද සිම් අතර එම තත්ත්වයන් ඉතා ඉක්මනින් නවත්වා ඇති බවයි.

මේ සඳහා හේතු වී ඇත්තේ නවීන පවුල් සැලසුම් ක්‍රම මගින් ඇති වූ අමතර බලපෑම් ය. එසේම මේ තුළින් තමන්ට දරුවන් නොමැති වේය යන බියත් එසේම එම ක්‍රමවල අතුරු ආබාධ පිළිබඳ නොයෙකුත්, කථා අසල්වැසියන්ගෙන්,නෑදෑයන්ගෙන් , යහළුවන්ගෙන් අසා තිබීමත් නිසාය. මේ අනුව ඔවුන් පවසනුයේ පාරම්පරික ක්‍රමයක් භාවිත කිරීම හැම අතින්ම ආරක්ෂා සහිත බවත් අවශ්‍ය දරුවන් ලැබීමෙන් පසුව නවීන ක්‍රමයක් භාවිත කිරීම සුදුසු බවයි.

තවමත් ප්‍රථම දරු උපත නොලබා සිටි නාගරික විවාහක කාන්තාවන් තමාගේ අත්දැකීම් පිළිබඳ ඉදිරිපත් කළ අදහස් පහත සඳහන් කරන අතර මේ තුළින් ඔවුන් භාවිත කරන පවුල් සැලසුම් ක්‍රමය භාවිත කිරීමට හේතු, භාවිත නොකිරීමට හේතු එසේම ප්‍රජනන සෞඛ්‍ය ගැන ඔවුන්ගේ සැලකිලිමත් වීම කෙබදු ද යන්න අවබෝධ කර ගැනීමට හැකි වෙයි.

## ප්‍රත්‍යෙක අධ්‍යයනය 1

ඇය සරෝජනී නමින් හදුන්වමු. වයස අවු.24 කි. ඇය විවාහ වන විට වයස අවු. 23 කි. වර්තමානයේ ගර්භණී මවකි. අ.පො.ස. (සා.පෙළ) දක්වා අධ්‍යාපනය ලබා තිබෙන ඇය විවාහ වන තුරු වෙළඳ කලාපයේ සේවය කර ඇත. දෙමාපියන් ගෙනෙන ලද යෝජනාවකට අනුව විවාහ වී ඇත. ඇගේ ස්වාමි පුරුෂයා රියදුරෙකි. විවාහයෙන්





පසු පදිංචි වී සිමින්නේ සරෝජනීගේම නිවසේ ය. විවාහයෙන් පසු ප්‍රථම දරු උපත කල් දමා ගැනීමට අවශ්‍ය නිසා ඇය වෙළඳ කලාපයේ වෛද්‍යවරයා හමුවී උපදෙස් ලබා ගෙන ඇත. ඇයට අනුව වෛද්‍යවරයා පවසා ඇත්තේ ප්‍රථම දරු උපත කල් දැමීමට නවීන පවුල් සැලසුම් ක්‍රම භාවිත නොකරන ලෙසයි. පවුල් සැලසුම් ක්‍රම අතුරින් ඇයට වඩාත් අවබෝධයක් ඇත්තේ පෙති පිළිබඳවයි. මන්ද සේවය කළ ස්ථානයේ දොස්තර මහතාගෙන් දැනගත් නිසාය. කෙසේ හෝ ඇය විවාහයට පෙර මාසයේ සිටම පෙති භාවිත කිරීමට පටන් ගෙන ඇත. ඇය පවසන පරිදි ආර්ථික තත්ත්වය මත ඉක්මනින් දරුවෙකු බලාපොරොත්තු නොවිය හැකිය. විවාහ වී දෙමාපියන් ල- සිටීම නිසා ගෙයක් සදා ගන්නා තුරු ප්‍රථම දරු උපත ප්‍රමාද කිරීමට අවශ්‍ය වී ඇත. නමුත් පෙති භාවිතයෙන් පසුව ඇයට වමනය, ඔක්කාරය වැනි ශරීරයට අපහසු තත්ත්වයන් ඇති වී ඇත. එවැනි තත්ත්වයන් එතරම් ගණන් නොගත යුතු බව දොස්තර මහතා පවසා තිබුණද විවාහයට පෙර එසේ ඔක්කාරය වැනි තත්ත්වය ඇති වීමෙන් අසල්වැසියන්, නෑදෑයන් , යහළුවන් කටකථා ප්‍රචාරය කරයි යන බිය නිසා එය නවත්වා ඇත.

නමුත් ඇය පවසනුයේ ප්‍රථම දරු උපත තව ප්‍රමාද කර ගැනීමට හැකි වුවානම් හොඳ බවයි. දරුවකු හැදීමට නම් ආර්ථික අතින් යම් තරමකට හෝ යහපත් විය යුතු බවත් එසේ නොමැතිව දරුවන් හැදීම තුළින් එය දරුවන්ගේ පෝෂණය කෙරෙහි බලපාන බවයි. ඇයට අවශ්‍ය වී තිබුණේ අවුරුද්දකට, ප්‍රථම දරු උපත කල් දමා ගැනීමට. ඇයගේ විවාහ වී සිම් යහළුවන් පවුල් සැලසුම් ක්‍රම වල අතුරු ආබාධ ගැන නොයෙකුත් විස්තර කියා ඇත. ඒවා ගනන් නොගෙන පවුල් සැලසුම් ක්‍රමයක් භාවිත කිරීමට පෙළඹුනද ඇය පවසනුයේ ඇයටද එම තත්ත්වයට මුහුණ දීමට සිදු වූ බවයි. දෙවෙනි දරු උපත කල් දමා ගැනීමට අවශ්‍ය බව පවසන ඇය ඒ සඳහා ලූප් භාවිත කිරීමට බලාපොරොත්තු වේ. එම තොරතුරු ලබා ගත් ආකාරය පිළිබඳ ඇය කියා සිම්යේ පුවත්පත් කියවීමෙන් දැනගත් බවයි. පළමුවෙනි දරුවා පිළිසිඳ ගත් පසු දෙවෙනි දරුවා ලැබීමට වසර දෙක තුනක් වත් ගත විය යුතු බව පවසයි. මේ නිසා ලූප් පාවිච්චි කිරීමට සිතන ඇය ඒ පිළිබඳ හොඳ අවබෝධයක් බලාපොරොත්තු වන අතර ඒ තුළින් ශරීරයට හානියක් නොවේ යැයි විශ්වාස කරයි.

## ප්‍රත්‍යෙක අධ්‍යයනය 2

ඇය දිස්නා නමින් හඳුන්වමු. ඇයගේ වයස අවු. 26 කි. විවාහ වන විට වයස අවු. 25 කි. අ.පො.ස.( උ.පෙළ) දක්වා අධ්‍යාපනය ලබා ඇති අතර රැකියාවක යුක්ත නොවෙයි. විවාහයට පෙර පාවා රැකියාවක් කර නොමැත. ප්‍රේම සම්බන්ධතාවක් මත

ඇති වූ විවාහයකි. ඇයගේ ස්වාමි පුරුෂයා වෙළඳ කටයුතු වල නිරත වේ. විවාහයයෙන් පසු ප්‍රථම දරු උපත කල් දමා ගැනීමට ඇයට අවශ්‍ය වී නොමැත. දැනට ගර්භණී කාන්තාවකි. ඇය පවසා සිමිනුයේ දරු උපත් කල් දමා ගැනීමට ඇයට අවශ්‍ය වී නොමැති බවයි. දැනට ගර්භණී කාන්තාවකි. ඇය පවසා සිමිනුයේ දරුවකු ලැබීමට ප්‍රමාද වූ විට නෑදෑයන්ගෙන් විශේෂයෙන්ම ස්වාමි පුරුෂයාගේ නෑදෑයන්ගෙන් නොයෙකුත් කටකතා අහන්න සිදු වන බැවින් ප්‍රථම දරු උපත කල් දැමීම නුසුදුසු බවයි. පවුල් සැලසුම් ක්‍රම භාවිතය පිළිබඳ ඇගේ අවබෝධය නිවැරදිය. එම තොරතුරු ප්‍රධාන වශයෙන්ම දැන ගෙන ඇත්තේ ස්වාමි පුරුෂයාගෙන් වන අතර තව දුරටත් පොත්, පත්තර කියවීමෙන් තොරතුරු දැන ගෙන ඇත. ලූප්, එන්නත්, පෙති ගැන අවබෝධයක් ඇති අතර ඔසප් චක්‍රය පිළිබඳවත් අවබෝධයක් ඇත. ප්‍රථම දරු උපත කල් දැමීමට අවශ්‍ය නොවූ නිසා නවීන පවුල් සැලසුම් ක්‍රම භාවිත කිරීමට අදහස් කරන්නේද යනුවෙන් මා ඇසූ ප්‍රශ්නයට පිළිතුරු දෙමින් ඇය කිව්වේ නැත යන්නයි. ඒ වෙනුවට පාරම්පරික ක්‍රම භාවිත කරන බව පැවසුවාය. ඒ සඳහා ප්‍රධානතම හේතුව වී ඇත්තේ පවුල් සැලසුම් ක්‍රම කෙරෙහි පවත්නා බියයි. ඇය පවසන පරිදි ඇගේ ගෙවල් අසල කාන්තාවක් දරුවකු ප්‍රමාද කිරීමට පෙති ගෙන ඇත. ඉන් පසු දරුවෙකු බලාපොරොත්තු වී ඇති නමුදු තවම දරුවෙකු නොමැති බවත් දැන් ඇගේ වයස අවු. 41 ක් බවත් පැවසුවාය. මේ තත්ත්වය පවුල් සැලසුම් ක්‍රම කෙරෙහි බියක් දැක්වීමට හේතු වූ බව ඇය පවසයි. ඇගේ අදහස අවශ්‍ය දරුවන් ප්‍රමාණය ලැබීමෙන් පසු නවීන තාවකාලික පවුල් සැලසුම් ක්‍රමයක් හෝ ස්ථිර පවුල් සැලසුම් ක්‍රමයක් භාවිත කිරීමට අදහසක් ඇති බවයි. ස්වාමි පුරුෂයා පුතෙක් බලාපොරොත්තු වී සිමින අතර හමුවීමට සිටන දරුවා පුතෙක් වුවහොත් පාරම්පරක ක්‍රමවලින් දෙවෙනි දරු උපත කල් දැමීමට බලාපොරොත්තු වන අතර එම දරුවා දුවෙක් වුවහොත් ඉක්මනින් තව දරු උපතක් බලාපොරොත්තු වීමට සිදු වන බව ඇය පවසයි. යම් ආකාරයකින් පවුල් සැලසුම් භාවිතය ම්-න් දරුවන් නොමැති වුවහොත් එය පවුල් ජීවිතයේ අසමගියට ද හේතු වන බව පවසන ඇයගේ අදහස නම් ශරීරයට හානි දායක නොවන ක්‍රම ම්-න් දරු උපත් පාලනය කර ගෙන අවශ්‍ය දරුවන් ලැබීමෙන් පසුව ස්ථිර පෙළඹීම සුදුසු බවයි.

ඉහත ඉදිරිපත් කරන ලද තත්ත්වයට අනුව ප්‍රථම දරු උපත බලාපොරොත්තු වන කාන්තාවෝ නවීන පවුල් සැලසුම් ක්‍රම සඳහා නො පෙලඹෙති. එහි ඇති විය හැකි අතුරු ආබාධ ගැන ඔවුන් සැලකිලිමත් වන නිසාය. මේ වයස් සීමාවට මුස්ලිම් කාන්තාවන් පවුල් සැලසුම් ක්‍රම තෝරා ගැනීමේදී එසේම ඒවා භාවිතයේදී ප්‍රජනන සෞඛ්‍ය ගැන සැලකිලිමත් වන බව පෙනේ.





## 2.1.1 ප්‍රථම දරු උපතට පෙර පවුල් සැලසුම් ක්‍රම භාවිත කිරීමට හේතු

දිසානායක (1995) ගේ අධ්‍යයනයට අනුව පෙනීගොස් ඇත්තේ පූර්ව විවාහ ගැබ් ගැනීම් ක්‍රමයෙන් මෑත පරම්පරාවල අඩුවී ඇති බවයි. කෙසේ වුවත් යමෙකුට තර්ක කළ හැකියි ශ්‍රී ලංකාව වැනි සංස්කෘතියක් ඇති රටවල පූර්ව විවාහක ගැබ් ගැනිම්වලට ඉඩක් නැති බව. නමුත් කොරියාව, තායිලන්තය, තායිවානය, හා මැලේසියාව වැනි රටවල පූර්ව විවාහයක ගැබ් ගැනීම් සැලකිය යුතු ප්‍රතිශතයක් ඇති බව වාර්තාවෙයි. ශ්‍රී ලංකාවේ තත්ත්වය බලන කළ පෙනී යන්නේ, මුල් පරම්පරාවල පූර්ව ගැබ් ගැනීම් ප්‍රවණතාවය අදට වඩා ඉහළ තත්ත්වයක පැවති බවයි. මෙය වඩා හොඳින් අවබෝධවන්නේ මුල් පරම්පරා වල විශේෂයෙන්ම සාක්ෂරතාව අඩු හා පවුල් සංවිධාන ක්‍රම පිළිබඳ අවබෝධයක් රහිත පරම්පරාවන්හි මේ ප්‍රතිශතය ඉහළ යාමෙනි. නමුත් මෑත පරම්පරාවල ස්ත්‍රීන්ගේ සාක්ෂරතාවය ඉහළ යාමත් ඒවගේම විවාහ වන වයස ඉහළ යාම නිසා මුහුකුරා යන වයසකට පැමිණීමත් ආදී කරුණු මෙන්ම පවුල් සංවිධාන ක්‍රම පිළිබඳ අවබෝධය හා ඒ ක්‍රමවල සුලභතාවය ද පූර්ව විවාහක ගැබ් ගැනීම් ප්‍රවණතාවය අඩුවීමට හේතු වී ඇති බව අප අධ්‍යයනයේදී හෙළි වුනි.

අධ්‍යයනය කරන අවස්ථාව වනි විට ප්‍රථම දරු උපත නොලබා සිටි කාන්තාවන් කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීමේදී ප්‍රථම දරු උපතට පෙර පවුල් සැලසුම් ක්‍රමයක් භාවිත කිරිමට හේතු විමසා බැලීම වටී. කාන්තාවන් කිහිපදෙනෙක් පවුල් සැලසුම් ක්‍රම භාවිත කර ඇත. භාවිතා කල අයද භාවිත කර ඇත්තේ පාරම්පරික පවුල් සැලසුම් ක්‍රමයි. ඉහත ප්‍රත්‍යේක අධ්‍යයන දෙක තුළින් ද නවීන පවුල් සැලසුම් භාවිත නොකිරීමට හේතු ඉදිරිපත් කර ඇත.

පවුල් සැලසුම් ක්‍රමයක් භාවිත කිරීමට හේතු විමසා බැලීමේදී ඒ සියලු දෙනාම පවසා සිමියේ ආර්ථික තත්ත්වයන් පිළිබඳවය. ගෙයක් දොරක් හදා ගන්නා තුරු දරුවෙකු බලාපොරොත්තු විය නොහැකි බවයි. එසේම ආර්ථික ස්ථාවර තත්ත්වයක් නොමැතිව දරුවෙකු සැදීමේදී දරුවාගේ පෝෂණයට එම තත්ත්වය බලපාන බව පවසන ලදී.

පවුල් සැලසුම් ක්‍රම භාවිත කළ සියලු දෙනාම පාරම්පරික ක්‍රම භාවිත කිරිම විශේෂ තත්ත්වයක් ලෙස හඳුනාගත් අතර ඒ සඳහා හේතු විමසා බැලීමේදී

පැවසුවේ ප්‍රථම දරු උපත අවුරුදු කිහිපයක් කල් දැමට අවශ්‍ය නොවන බවත් නවීන ක්‍රම පිළිබඳ අසා ඇති නොයෙකුත් අතුරු ආබාධ නිසා පාරම්පරික ක්‍රම භාවිත කළ බවයි. නවීන පවුල් සැලසුම් ක්‍රම භාවිත කොට දරුවන් නොමැති වුවහොත් එම තත්ත්වය තමන්ගේ මුළු ජීවිතයටම බලපාන නිසා පාරම්පරික ක්‍රමයක් භාවිත කිරීම උචිත බවත් එසේම දරුවකු පිළිසඳ ගත්තද එම අවධානම දැරීමට ප්‍රථම දරු උපත නොලබා සිමින කාන්තවන්ට අපහසුතාවක් නොවන බවද පවසන ලදි.

එසේම තවත් කාන්තාවක් පැවසුවේ පළමු දරු උපත මාස දෙකක් පමණ කල් දමා ගැනීමට අවශ්‍ය වූ බවයි. ප්‍රවේශම් වූ විට මාස දෙකක් පමණ කල් දමා ගත හැකි බවත් ඉන් පසු ඉක්මනින් දරුවෙකු බලාපොරොත්තු වීමට සිදු වනුයේ ස්වාමියාගේ මව දරුවෙකු බලාපොරොත්තුවෙන් සිමින නිසා බවත් පැවසුවාය. නවීන ක්‍රම භාවිතකර තමාගේ යෙහෙළියකට ඒවා නැවැත්වීමෙන් පසු ප්‍රථම දරු උපත සඳහා අවු. 2 ක් පමණ ගත වූ බවත් එපමණ කලක් දරුවන් නොමැති වීම කාන්තාවන්ට නොයෙකුත් ප්‍රශ්නවලට මුහුණ දීමට සිදුවන ප්‍රශ්නයක් බවද පැවසුවාය. මෙහිදී ඇය අදහස් කළේ නෑදැයින්ගෙන්, අසල්වැසියන්ගෙන්, යහළුවන්ගෙන්, නොයෙකුත් මානසික පීඩා තම යෙහෙළියට ඇති වූ බවයි. මෙම තත්ත්වය ආසියාතික රටවල බහුලව දන්නට ලැබෙන තත්ත්වයකි. එම රටවල සංස්කෘතික තත්ත්වයන් මේ සඳහා බොහෝ විට හේතු වෙයි. මෙම තත්ත්වයන් බහුල වශයෙන් ග්‍රාමීය ප්‍රජාව තුළ මෙන්ම නාගරික ප්‍රජාව තුළ ද දක්නට ඇත.

සමහර රටවල බාල වයස් විවාහයන් සිදුවන අතර විශේෂයෙන්ම මේ තත්ත්වය ඉන්දිය ප්‍රජාව තුළ හඳුනාගත හැකිය. එම කාන්තාවන්ගේ සාපලයතා ශක්තිය පෙන්වීමට සිදුවී තිබීම ඔවුන් මුහුණ දී ඇති එක්තරා මානසික පීඩනයකි. මේ නිසා ඔවුන් උපත් පාලන ක්‍රම භාවිතයට නොපෙළඹේ. (De Silva 2000) ලංකාවේද මෙම තත්ත්වය හඳුනා ගැනිමට හැකිවන අතර ප්‍රථම දරු උපත සඳහා පවුල් සැලසුම් ක්‍රමයක් භාවිත නොකර සිම්මට මෙම තත්ත්වය බලපායි. අධ්‍යයනය කරන ලද කාන්තාවන් සියලු දෙනාටම නවීන ක්‍රම කෙරෙහි යොමු වීමට බියක් පැවතියේ තමාගේ සාපලයතා, හැකියාව නොමැති වේය යන බිය නිසාය. මෙසේ තමන්ගේ ආර්ථික තත්තවය නිසාත් එසේ විවාහ වී මික කලක් යනතුරු දරුවන් නොමැතිව සිටීමට අවශ්‍ය වුවත් ඔවුන් නවීන ක්‍රමවලට පෙළඹීමට බියක් දක්වති. ඒ වන විටත් ප්‍රථම දරු උපතකට පෙර භාවිත කළ පවුල් සැලසුම් ක්‍රම වලින් දරුවන් නොමැති වේ යන බිය ද ඔවුන් තුළ පැවතුනි. මුස්ලිම් කාන්තාවන් මෙසේ





පවුල් සැලසුම් ක්‍රම භාවිත කිරීමට බිය වුයේ ඇයි? යන්න විමසා බැලීමේදී ඔවුන් පැවසුවේ ඒවා භාවිතයෙන් දරුවන් නැතිව යන බව බොහෝ අය කියන බවත් තමන්ගේ ස්වාමි පුරුෂයන්ද දරුවෙකු කෙරෙහි විශාල කැමැත්තක් දක්වන බවත් පැවසීය. එසේම මුස්ලිම් විවාහක කාන්තාවගේ බහුතරයක් පැවසු පරිදි ඔවුන්ගෙන් ස්වාමිපුරුෂයන් පවුල් සැලසුම් ක්‍රම භාවිත කරනවාට කැමැත්ත ප්‍රකාශ කර ඇත.

## 2.2 දරුවන් අතර පරතරයේදි පවුල් සැලසුම් ක්‍රම භාවිතය ප්‍රජනක සෞඛ්‍යයට කරන බලපෑම.

මෑත පර්යේෂණ තුළින් පිළිබිඹු වන්නේ වයස් පරතරයෙන් අඩු ළමයි සංඛ්‍යාවක් බිහි කර ඇති බවයි. එය ප්‍රජා විද්‍යා සංක්‍රාන්තියට භාජනය වූ මිනෑම රටක දක්නට පුල්වන් ලක්ෂණයක් හැමියට හැඳින්විය හැකිය. ස්ත්‍රීන්ගේ වැඩි ප්‍රතිශතයක් එනම් 50% කට වඩා ප්‍රකාශකරන්නේ ඔවුන්ට තම දරුවන් අවශ්‍ය නැති බවයි.ඊට අමතරව කැපී පෙනෙන කරුණක් වන්නේ ඔවුන් තමන්ගේ ප්‍රජනක කාල පරිච්ජේදයේ මුල් භාගයේම තමන්ට අවශ්‍ය දරුවන් සංඛ්‍යාව බිහිකර තම පවුලේ ප්‍රමාණයන් සම්පුර්ණ කර ඇති බවත්ය. මේ තත්ත්වය සමාජයේ සියලු කොටස්වලින් පිළිබිඹු වූ ලක්ෂණයක් බවට පත්විය යුතුයි. තවදුරටත් පරම්පරාවන් වෙන වෙනම ගෙන අධ්‍යයනය කිරිමේදී දක්නට ලැබෙනුයේ මෑත පරම්පරාවන්හි දරුවන් අතර පරතරය ක්‍රමයෙන් දිර්ඝ වී ඇති බවයි. මෙහිදී දරුවන් දෙදෙනෙකු අතර පරතරය අවුරුදු 3කට වඩා දිර්ඝ නම් එය දිගු කාල පරිච්ජේදයක් ලෙස සැලකිය හැකියි. මේ තත්ත්වයට හේතු විමසා බැලීමේදී අවබෝධ වුයේ පවුල් සැලසුම් ක්‍රම භාවිත කර මෙසේ උපත් අතර පරතරය දිගු කරගෙන ඇති බවයි.

ප්‍රජනක කාලපරිච්ජේදයේ තවත් අවස්ථාවක් වනුයේ දරුවන් අතර පරතරය තබාගන්නා කාලයයි. පවුල් සැලසුම් ව්‍යාපෘතිවලින් වඩා සැලකිල්ලක් යොමු කරනු ලබන්නේ විවාහක තරුණ කාන්තාවන් තුළ දරු උපත් අතර පරතරයක් පිළිබඳ සැලකිල්ල යොමු කිරිමටය. (De Silva 2000)

මෙසේ දරුවන් අතර පරතරය තබා ගැනීම මවගේ මෙන්ම දරුවන්ගේ ද සෞඛ්‍ය තත්ත්වය යහපත් වන අතර පවුලේ ආර්ථිකය ද දරුවාගේ පෝෂණයට බලපෑමක් කරයි. ප්‍රථම දරු උපත කල්දමා ගැනීමට වඩා විවාහක කාන්තාවන්ගේ දෙවෙනි දරු උපත කල්දමා ගැනීමට උත්සාහ ගනිති. මේ නිසා මෙහිදී විවාහක කාන්තාවෝ පවුල් සැලසුම් කෙරෙහි අවධානය යෙමු කරති.

බොහෝ අසියාතික රටවල වයස අවු. 25-29 වැනි ප්‍රජනන වයස් සීමාවන් අතර කාන්තාවන් පවුල් සැලසුම් භාවිත කිරීම සෑහෙන ඉහළ මට්ටමකින් පවත්වාගෙන යන අතර ඊට පසු වයස් කාණ්ඩවල සිටින කාන්තාවන් මේ පිළිබඳ මන්දෝත්සාහී සැලකිල්ලක් දක්වන බවද පරීක්ෂණවලින් හෙළි වී ඇත. (United Nations 1989)

මේ අනුව වර්තමානයේ පැහැදිලි වන කරුණක් වනුයේ ප්‍රථම දරුවා බිහිකර සිටි කාන්තාවන්ට එසේම දරුවන් කිහිපදෙනෙකු බලාපොරොත්තු වන කාන්තාවන් දරුවන් අතර පරතරයක් තබා ගැනීමට අවශ්‍ය වන බවයි. මේ නිසා ඔවුන් පවුල් සැලසුම් ක්‍රම භාවිතයට පෙළඹේ.

එම අධ්‍යයනයට භාජනය වු දරුවන් අතර පරතරය තබා ගන්නා කාන්තාවන් අතරින් වැඩි ප්‍රතිශතයක් පවුල් සැලසුම් ක්‍රම භාවිත කරන ලදී. මේ අතර පවුල් සැලසුම් ක්‍රමයක් භාවිත කිරීමේදී  දරුවන් පිළිසිඳ ගැනීම් ඇති වු කාන්තාවන් ද සිටී.

දරුවන් අතර පරතරයක් තබා ගැනීමට පවුල් සැලසුම් ක්‍රම භාවිත කරන කාන්තාවන් අතරින් වැඩිම යොමු වීම ඇත්තේ නවීන තාවකාලික පවුල් සැලසුම් ක්‍රම වලටයි. පාරම්පරික පවුල් සැලසුම් ක්‍රම භාවිත කරමින් දරුවන් අතර පරතරයක් තබා ගැනීමට උත්සාහ ගන්නා අතර එම කාන්තාවන් සියලු දෙනාම සිංහල කාන්තාවන් වෙයි. නවීන  පවුල් සැලසුම් ක්‍රම භාවිතය දරුවන් අතර පරතරයේ දී මුස්ලිම් කාන්තාවන් භාවිත කරයි. දරුවන් අතර පරතරයක් තබා ගැනීම සඳහා කිසිම පවුල් සැලසුම් ක්‍රමයක් භාවිත නොකරන අය එක්කෙනෙක් සිටි අතර ස්වාමි පුරුෂයා හමුදාවේ වැඩ කරන බවත් මාස තුනකට පසුව ගෙදර එන බව පැවසීය.

නමුත් මෙම පවුල් සැලසුම් ක්‍රම භාවිත කරන විට පිළිසඳ ගැනීම් ඇති වී ඇත. මේ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වී ඇත්තේ පාරම්පරික ක්‍රම භාවිත කිරීමයි. නුතන ක්‍රම භාවිත කරන විට පිළිසිඳ ගැනීම් ඇති වී ඇත්තේ මුස්ලිම් කාන්තාවන් තුළයි. එහිදී ඔවුන්ගේ අවබෝධය එම තත්ත්වන් ලබා ගැනීමට සමාජීය වශයෙන් පවතින අපහසුතා මේ කෙරෙහි බලපායි. සිංහල කාන්තාවන් සෞඛ්‍ය තත්ත්වය ගැන සැලකිලිමත් වීම නිසා පවුල් සැලසුම් ක්‍රම මාරු කරමින් භාවිතා කිරීම අනවශ්‍ය පිළිසිඳ ගැනීම්වලට හේතු වී ඇත.





## 2.2.1 දරුවන් අතර පරතරයක් තබා ගැනීමට පවුල් සැලසුම් ක්‍රම භාවිත කිරීමට හේතු

දරුවන් අතර පරතරයක් තබා ගැනීමට අවශ්‍ය සියලුම කාන්තාවන් එනම් ප්‍රමාණවත් දරුවන් මෙතෙක් නොලබා සිටින කාන්තාවන් සියලු පවුල් සැලසුම් ක්‍රම භාවිත කරන බව අධ්‍යයනයෙන් පැහැදිලි විය. මේ අතරින් සාම්ප්‍රදායික පවුල් සැලසුම් ක්‍රම මෙන්ම නවීන පවුල් සැලසුම් ක්‍රම භාවිත කරන අය හඳුනා ගන්නා ලදී. අධ්‍යයනය ක්ෂේත්‍රය තුළ පාරම්පරික ක්‍රම භාවිත කරන කාන්තාවන්ගේ අධ්‍යාපන තත්ත්වය ඉහළ වු අතර උපාධි දක්වා අධ්‍යාපනය ලද කාන්තාවන් ද සිටින ලදී. මොවුන් නවීන පවුල් සැලසුම් ක්‍රම භාවිත කිරීමට කැමැත්තක් නොදක්වයි. උසස් අධ්‍යාපනයක් ලද කාන්තාවන් හා ඔවුන්ගේ ස්වාමි පුරුෂයා පවසා සිටියේ පවුල් සැලසුම්  ක්‍රම අතරින් තමන් තෝරා ගත යුත්තේ තමාට ගැළපෙන පවුල් සැලසුම් ක්‍රමය බවයි. පාරම්පරික ක්‍රම භාවිත කිරීමට මනා අවබෝධයක් ඇති නිසා පාරම්පරික ක්‍රම භාවිත කරන බව පැවසුවේය. එම කාන්තාවන් පිළිගත් රැකියාවල නිරත වූ අතර ඇය පැවසුයේ ද තමන් පවුල් සැලසුම් ක්‍රමය තමන්ගේ ශරීරයට අගුණ නොවන පරිදි තෝරා ගත යුතු බවයි. මෙහි දී පැහැදිලි වන්නේ නවීන ක්‍රම භාවිත කරනවාට වඩා පාරම්පරික ක්‍රම භාවිතය හොඳය යයි ඔවුන් දෙදෙනා තීරණය කර ඇත්තේ සෞඛ්‍යමය තත්ත්වයන් ගැන සැලකිලිමත්  වූ  නිසායි. ඔවුන්ගේ දෙවෙනි දරුවා පළමු දරුවාට වඩා අවුරුදු දෙකකට පසුව හමු වූ බවත් එසේ බලාපෙරොත්තු වු අවස්ථාව නොවුනත් දරුවා හදා ගැනීමේ අවදානමක් ඔවුන්ට නොතිබණු බව පවසන ලදී.

මෙම තත්ත්වය තුළින් පැහැදිලි වු තවත් තත්ත්වයක් නම් ඔවුන් ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳ සැලකිලිමත් වන අයුරුයි. ස්වාමි පුරුෂයා ද තම භාර්යාවගේ ප්‍රජනක සෞඛ්‍ය ගැන සැලකිලිමත් වන අතර මේ සඳහා දෙදෙනාගේම අධ්‍යාපන තත්ත්වය ද විශාල බලපෑමක් කර ඇති බව පැහැදිලි වෙයි.

එසේම පාරම්පාරික ක්‍රම භාවිත කළ අන් කාන්තාවන් අතරින් කිහිප දෙනෙක් නවීන ක්‍රම භාවිතයේ දී ඇති වූ සෞඛ්‍යමය ගැටලුකාරී තත්ත්වයන් නිසා පාරම්පරික ක්‍රමවලට පෙළඹී ඇති අතර මෙම හැම කාන්තාවක් ම ද්විතීය අධ්‍යාපනයක් ලබා ඇති කාන්තාවන්ය. ඔවුන් නූතන ක්‍රම පිළිබඳ අසා ඇති නොයෙකුත් කටකතා නිසාත් දරුවන් නොමැතිවේ ය යන බිය නිසාත් සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ සැලකිලිමත් වීම නිසාත් පාරම්පරික ක්‍රම භාවිත කරන අය වුහ.

නූතන පවුල් සැලසුම් ක්‍රම භාවිත කිරීමට හේතු විමසා බැලීමේ දී දරුවන් අතර පරතරයක් තබා ගැනීමට අවශ්‍ය බවත් එවැනි ක්‍රමයක් භාවිත නොකර අනවශ්‍ය දරු උපත් ඇතිවීම දරුවාගේ පෝෂණයට බලපාන බව බොහෝ දෙනෙක් පවසන ලදි. පාරම්පරික ක්‍රම කෙරෙහි සම්පූර්ණ විශ්වාසයක් තබා ගතනොහැකි බව ද නූතන ක්‍රම භාවිත කරන බොහෝ දෙනෙකුගේ අදහසකි. නූතන පවුල් සැලසුම් ක්‍රම භාවිත කරන විවාහක කාන්තාවන් අතරින් බොහෝ දෙනෙක් පවුල් සැලසුම් ක්‍රම වෙනස් කරමින් භාවිත කර ඇත. එහිදී ඔවුන් පවසනුයේ ශරීරයට ඇති වූ නොයෙකුත් අපහසුතා නිසා මෙසේ පවුල් සැලසුම් ක්‍රම වෙනස් කළ බවයි. මේ අතරින් එකම පවුල් සැලසුම් ක්‍රමය භාවිත කරන කාන්තාවන් ද සිටි අතර ඔවුන් පැවසුයේ තමන්ට ඒ තුළින් කිසිම හානියක් නොමැති බවයි. නූතන පවුල් සැලසුම් ක්‍රම භාවිත කිරීමට හේතු පිළිබඳ මුස්ලිම් කාන්තාවන්ගෙන් විමසා බැලීමේ දී ඔවුන්ට පාරම්පරික ක්‍රම පිළිබ ඳ අවබෝධය ඉතාමත් අඩු අතර පවුල් සැලසුම් ක්‍රම හඳුන්වා දීම ඉතාමත් වැදගත් බව පවසන ලදි. මන්ද අනවශ්‍ය දරු උපත් ඇති වීම නිසා ආර්ථිකයට බලපෑම් ඔවුන් නාගරිකව වාසය කිරීම නිසා සීමිත ඉඩකඩ දරුවන්ගේ පෝෂණය කෙරෙහි වැඩි දරුවන් සංඛ්‍යාවක් සිටීම වැනි සාධක බලපාන බව ද පවසන ලදි.

මේ අන්දමට පුවල් සැලසුම් ක්‍රම මි-න් දරුවන් අතර පරතරක් තබා ගැනීමට අවශ්‍ය වුවද එම ක්‍රම භාවිත කරගෙන යාමේ දී නොයෙකුත් අපහසුතා නිසා නැවැත්වීම තුළින් අනවශ්‍ය දරු උපත් ඇති වූ තත්ත්වයන් සහ එම තත්ත්වයන් සඳහා මුහුණ දීමට නොහැකි වීම නිසා ප්‍රේරිත ගබ්සාවල් සඳහා යොමු වූ අවස්ථා හඳුනා ගැනීමට හැකි විය. ලංකාවේ ගබ්සාව නීති විරෝධි වෙයි. මෙම නීති විරෝධි තත්ත්වය නිසා බොහෝ කාන්තාවන් තමන්ට ගබ්සාවක් කර ගැනීමට අවශ්‍ය වූ විට රහසිගත ක්‍රම මි-න් ඒ සඳහා පෙළඹේ.

ශ්‍රී ලංකාවේ 1833 සාපරාධි නීති සංග්‍රහයෙහි අංක 303 වගන්තිය අනුව කිසියම් කාන්තාවක් ගබ්සාවක් කරවා ගැනීමට පෙළඹවීම කරන්නෙහි නම් එය නීති විරෝධි සහ දඬුවම් ලැබිය හැකි ක්‍රියවලියකි. නමුත් කිසයම් මවකගේ ජීවිතය අනතුරෙන් බේරා ගැනීමට වෛද්‍ය උපදෙස් මත ගබ්සාවක් කරන විට එය නීති විරෝධි නොවේ. (De Silva and Ukwatta, 2000)

දරුවන් අතර පරතරයක් තබා ගැනීමේ දී ගබ්සාව සඳහා යොමු වූ කාන්තාවන් ද ගත හැකි වු අතර ඔවුන් සියලූ දෙනාම මුස්ලිම් කාන්තාවන් වෙයි.





ප්‍රථර දරු උපතින් පසු ඇති වූ පිළිසඳ ගැනීම් දෙකක් සඳහා ද දරුවන් දෙදෙනෙකු පිළිසිඳ ගැනීමෙන් ඇති වූ එක් ගබ්සාවක් ද වාර්තා විය. පහත ඉදිරිපත් කරන ප්‍රත්‍යෙක අධ්‍යයනය 3 මි-න් මේ පිළිබඳ තව දුරටත් පැහැදිලි කර ගැනීමට හැකිය.

## ප්‍රත්‍යෙක අධ්‍යයනය 3

ඇය සහිරා නමින් හඳුන්වමු. ඇයගේ වයස අවු. 28 කි. 7 වෙනි ශ්‍රේණිය දක්වා පාසල් අධ්‍යාපනය ලබා ඇත. ඇය විවාහ වී ඇත්තේ වයස අවු. 25 දිය. ප්‍රථම දරු උපත අවු. 26 දී සිදු වී ඇත. ප්‍රථම දරු උපතට පෙර පවුල් සැලසුම් ක්‍රමයක් භාවිත කර නොමැති අතර භාවිත කිරීමට අවශ්‍යතාවක් තිබී නොමැත. ස්වාමි පුරුෂයා වෙළඳ ව්‍යාපාරවල නිරත වෙයි. ප්‍රථම දරු උපතින් පසු වසරක් යාමටත් ප්‍රථම නැවත දරු ගැබක් පිළිසඳ ගැනීම පිළිබඳ ඇය පැවසුවේ එවැනි අවස්ථාවක දරුවෙකු හැදීමට ප්‍රමාණවත් ආර්ථික තත්ත්වයක් නොතිබු බවයි. එසේම ඇය පවසා සිම්යේ ප්‍රථම දරු උපත ලැබීමට සිමින විට දී දොලදුක, ඇති වූ බවත් එය දරා ගැනීම අපහසු තත්ත්වයක් බවයි. මේ නිසා ස්වාමි පුරුෂයාගෙන් ද කැමැත්ත ලබාගෙන ගබ්සාවකට පෙළඹී ඇත. ඇය පවසා සිම් පරිදි මාසික ඔසප් වීම නතර වී දින 14ක් ගිය පසු ප්‍රදේශයේ දොස්තර කෙනෙකු ලවා එන්නතක් විදගත් බවයි. ඇය පවසා සිම්යේ අපට ආගමෙන් කන්න දෙන්නේ නැහැනේ යනුවෙනි. ඇගේ පවුලේ තවත් විශාල සාමාජිකයන් සංඛ්‍යාවක් ජීවත් වූ අතර සීමිත ඉඩ ප්‍රමාණය ද ඒ සඳහා හේතු වූ තවත් කරුණක් බව පැවසීය. ඇයගේ දෙවෙනි දරුවා පිළිසිඳ ගන්නා විට ඇය භාවිත කරමින් සිට ඇත්තේ එන්නත්ය. නියමිත දිනට එන්නත් ගැනීමට කොළඹට යා යුතු බව පවසයි. පවුල් සෞඛ්‍ය සේවිකාවගෙන් උපදෙස් ලැබීමට කැමැත්තක් නොදක්වන බව පැවසුවාය. එන්නත ගැනීමේ දී ශරීරයට අපහසුතාවයක් ඇති නොවූ බව ඇය පැවසුවාය. ඉහත කාන්තාවගේ අදහස්වලට අනුව පැහැදිලි වනුයේ පවුල් සැලසුම් ක්‍රමයක් භාවිත කළ ද ඒ පිළිබඳ එතරම් සැළකිලිමත් වී නොමැති බවයි. මේ හේතුව නිසා අනවශ්‍ය දරු උපතක් ඇති වී තිබෙන අතර එහි දී ගබ්සාවකට යොමු වී ඇත.

## ප්‍රත්‍යෙක අධ්‍යයනය 4

ඇය රෝහිනී නමින් හඳුන්වමු. ඇගේ වයස අවු. 30 කි. විවාහ වී ඇත්තේ අවු. 28නි. ඇය පවසන පරිදි විවාහයට කල් ගත වී ඇත. එසේ හේතු වී ඇත්තේ පවුලේ පවතින ආර්ථික තත්ත්වයන් හේතු කොට ගෙනය. 5 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලබා ඇත. ඇය පැවසු පරිදි විවාහය ප්‍රමාද වීමට හේතු වී ඇත්තේ දැවැද්ද නොමැතිකම

නිසය. ලංකාවේ මුස්ලිම් කාන්තාවන් විවාහ වන විට දෑවැද්දක් දිය යුතු බව ඇය පැවසීය. ස්වාමියා සුළු වෙළඳාමක නිරත වන බව පැවසීය.

වර්තමානයේ ගර්භණී මවක් වන ඇය පැවසුයේ අවු. 29 දී පළමු දරුවා බිහිකළ බවයි. ඊට පසුව එන්නත් ගත් අතර ඇ-ට අපහසු තත්ත්වයක් ඇති වු බවයි. එන්නත් ස්වාමි පුරුෂයාට හොරෙන් භාවිත කළ බව පවසන ඇය ඇ-ට අපහසුතා ඇති වීම නිසා නවත්වා දමා ඇත. නමුත් ඇය පවසන පරිදි ප්‍රථම දරුවා බිහි වීමට සිමින විට දොලදුක ඇති වී ඇත. මේ නිසා දෙවෙනි දරුවා පිළිසිඳ ගත් විට ඇය එය නැති කර ගැනීමට උත්සාහ දරා ඇත. තමාගේ ස්වාමි පුරුෂයා මේ සඳහා අකමැති බවත් ඒ නිසා මල්ලිගේ උදව් ඉල්ලාගෙන දරුවා ගබ්සා කර ගැනීමට එන්නතක් ලබා ගෙන ඇත. නමුත් දරුවා ඒ තුළින් නැති වී නොමැත. ඉහත කාන්තාවගේ තත්ත්වය විමසා බලන විට ඇය එම අදහස් ඍජුව ප්‍රකාශ නොකළ අතර බොහෝ වේලා ඇය සම- කථා කිරීමේ දී ඇය පැවසුයේ එහා ගෙදර කාන්තාවකට දරුවන් ලැබීමට සිමින විට ඉබේම ගබ්සා වන බවයි. නමුත් අපි එන්නත් ගත්තත් ගබ්සාව සිදු නොවූ බව පැවසුවාය.

## ප්‍රත්‍යෙක අධ්‍යයනය 5

ඇය කාන්ති නමින් හඳුන්වමු. ඇය මුස්ලිම් කාන්තාවකි. 7 ශ්‍රේණිය දක්වා ද අධ්‍යාපනය ලබා ඇත. ඇය ප්‍රදේශය පිළිබඳ ඉදිරිපත් කළ අදහස්වලට අනුව ඒ ප්‍රදේශයේ අවුරුදු 2 ට පෙර ගබ්සා වලට යොමු වීම නිසා කාන්තාවන් දෙදෙනෙකු මරණයට පත් වී ඇත. ඇය පවසා සිමියේ මළ කාන්තාවන් ගබ්සාව කර ගැනීමට සිංහල වෙද මහතා ල-ට ගොස් එහිදී පිටගැස්ම හැදී මරණයට පත්වී ඇති බවයි. එසේම ල- ගෙදරක කාන්තාවක් දරුවා නැතිකර ගැනීමට එන්නත් ගත් අතර නමුත් දරුවා නැති වී නොමැත. නමුත් දරුවා ඉපදීමෙන් පසුව දරුවාගේ ඔලුව විශාල වී ඇත. ඒ සඳහා ගබ්සාව අසාර්ථක වීම හේතු සාධක වු බව ඇය පවයි. අසල් වැසියන්ට නොමිලේ ඇඳුම් මසා දෙන ඇය ප්‍රදේශයේ සමාජශිලි කාන්තාවකි.

## 2.3 ප්‍රමාණවත් දරුවන් ලැබීමෙන් පසුව පවුල් සැලසුම් ක්‍රම ප්‍රජනක සෞඛ්‍යයට කරන බලපෑම.

මුලින් අදහස් කළ පරිදි මෑත පරම්පරාවල ස්ත්‍රීන් තම ප්‍රජනන කාල සීමාවේ පළමු භාගයේදී ම තමන්ට අවශ්‍ය දරුවන් ප්‍රමාණය බිහිකර අවසන් කරයි. ඒ සඳහා 1979 න් පසුව රජය විසින් දියත් කළ සංශෝධනාත්මක පවුල් සංවිධාන





වැඩ සටහන විශාල වශයෙන් බලපෑම් කර ඇත. දිර්ඝ වශයෙන් දත්ත විශ්ලේෂණය කිරිමේදි පැහැදිලිවුයේ දරුවන් ප්‍රමාණය බිහිකිරිම නැවැත්වීමේ ක්‍රියාවලිය සැලකිය යුතු ස්ත්‍රීන් ප්‍රතිශතයක් වන්ද්‍යාකර සැත්කම් භාවිත කර මේ තත්ත්වය උදාකරගෙන ඇති බවයි. ස්ත්‍රීන්ගේ අධ්‍යාපනික තත්ත්වය හා වන්ද්‍යාකරණ සැත්කම් භාවිතය අතර සම්බන්ධතාවක් දැකිය හැකිය. මේ අනුව එවන් ස්ත්‍රීන්ට තව දරුවකු බිහිවීම පිළිබඳ අවදානමක් දැරිය හැකි බැවින් ඔවුන් තාවකාලිකව උපත් පාලන ක්‍රමවලට ප්‍රියතාවක් දක්වන බව පෙනීයයි. මීට අමතරව, සංවිධානාත්මක පවුල් සැලසුම් ක්‍රියාවන්ට අඩු අධ්‍යාපනයක් සහිත කාන්තාවන් කෙරෙහි වැඩිදුර යොමුවීමට ද හේතුවක් දැක්විය හැකිය.

ප්‍රමාණවත් දරුවන් ලැබීමෙන් පසුව විවාහක කාන්තාවන් පවුල් සැලසුම් ක්‍රම භාවිතයට අනිවාර්යයෙන්ම පෙළඹෙන තත්ත්වයක් හඳුනාගැනීමට හැකිවිය. අධ්‍යයන කාලය වන විට ප්‍රමාණවත් දරුවන් ලබා සිම් කාන්තාවන් ගණන මෙම අධ්‍යයනයේ නියැදියට අනුව 18 කි. මෙම කාන්තවන් අතරින් ආර්ථවහරණයට ලංව ඇති ප්‍රමාණවත් දරුවන් ලබා සිම් කාන්තාවන් අතර වෙනසක් හඳුනා ගැනීමට හැකිවිය. එනම් ආර්තවහරණයට ල-ා වී ඇති ප්‍රමාණවත් දරුවන් ලබා අවසන් කාන්තාවන්ගේ පවුලේ දරුවන් ප්‍රමාණය විශාලවීම දැකිය හැකිය. වයස අවු. 40න් පසු කාන්තාවන් මෙයට අයත් වී ඇති අතර ඔවුන් දරුවන් පාලනය සඳහා සැලසුම් ක්‍රම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර නොමැත. මොවුන්ගේ තවත් විශේෂ ලක්ෂණයක් වනුයේ ඉතා කෙම් පරතරයකින් යුක්තව දරුවන් ලබා සිම්මයි. ඉන් පසුව ස්ථිර පවුල් සැලසුම් ක්‍රමයකට පෙළඹී ඇත.

නමුත් මධ්‍යම වයසින්, ප්‍රමාණවත් දරුවන් ලබා සිමින කාන්තාවන්ගේ දරුවන්ගේ ප්‍රමාණය සීමා කර ගැනීමක් ද දක්නට හැකිය. එම පවුල්වල දරුවන් දෙදෙනෙකු ප්‍රමාණවත් ලෙස සලකා ඇති අතර එක් දරුවෙකුගෙන් සෑහීමකට පත් වෙමින් නවීන පවුල් සැලසුම් ක්‍රම භාවිතා කරන කාන්තාවන් ද හමු විය.

ප්‍රමාණවත් දරුවන් ලබා සිම් කාන්තාවන්ගෙන් පවුල් සැලසුම් භාවිත කිරිමට හේතු විමසා බලන ලදි. මෙහිදි නවීන තාවකාලික පවුල් සැලසුම් ක්‍රම භාවිත කිරිමට දැඩි නැඹුරුවක් ඇත. ඒ අතුරින් බොහෝ දෙනෙක් ලූප් කෙරෙහි වැඩි විශ්වසය තබා ඇත. නවීන තාවකාලික ක්‍රම භාවිත කරන කාන්තාවන් ස්ථිර සැත්කමකට ලක් වී ඇති ප්‍රමාණය වැඩිය. ස්ථිර සැත්කමක් භාවිත කිරිමට හේතු

විමසා බැලීමේදී ඒවන විට දරුවන් වැඩි ප්‍රමාණයක් ලැබීම නිසා රෝහලේදීම ස්ථිර සැත්කමකට භාජනය කිරීම, සෞඛ්‍ය තත්ත්වය දුර්වල නිසා නැවත දරුවන් හැදීමට තරම් නිරෝගී භාවයක් නොමැති නිසා රෝහල තුළින් ස්ථිර සැත්කමකට යොමු කරවා තිබීම හා එක් කාන්තාවක් ගැහැණු දරුවන් තිදෙනෙක් එක දිගට ලැබීම නිසා ස්ථිර සැත්කමක් කරවා ගෙන ඇත. ඇය පවසා සිම්යේ ගැහැණු දරුවන් තුන්දෙනෙකු පසුව පිරිම දරුවකු හමුවුනොත් පවුලේ පියාට අගුණ වන නිසා වයස අවු. 25 දී ස්ථිර සැත්කමකට යොමු වූ බවයි. මොවුන්ගේ ස්ථිර පවුල් සැලසුම් ක්‍රමයකට යොමු වීම සඳහා ප්‍රජනන සෞඛ්‍ය ගැන සැලකිලිමත් වීමට වඩා වෙනත් සමාජ කරුණු බැඳීම් හේතු වී ඇති බව පෙනී යයි.

පාරම්පරික ක්‍රම භාවිත කරන කාන්තාවන් ප්‍රමාණවත් දරුවන් ලබා සිටිය ද නවීන තාවකාලික ක්‍රම භාවිතයට අකමැති අතර ඒවායේ නොයෙක් අමතර ප්‍රතිවිපාක ඇති බව පවසයි. කිසිම ක්‍රමයක් භාවිතා නොකරන කාන්තාවන් සිම් අතර ඔවුන්ගෙන් එක් අයෙකු පවසා සිම්යේ ලිංගික හැසිරීමට එතරම් අවශ්‍යතාවයක් නොමැති බවත් දරුවන්ගේ දරුවන් සිම්න බවත්ය. අනෙක් කාන්තාවන් ද දරුවන් වැඩිවියට පැමිණ ඇති බැවින් ද ලිංගික හැසිරීම් වල එතරම් අවශ්‍යතාවයක් නොමැති බව පැවසීය. මොවුන් දරුවන් අතර පරතරයේදී නවීන පවුල් සැලසුම් ක්‍රම භාවිතා කල බව පැවසීය.

මුස්ලිම් කාන්තාවන්ගේ ද මධ්‍යම වියේ කාන්තාවන්ට විශාල දරුවන් සංඛ්‍යාවන් නැත. ඔවුන් පැවසුවේ දරුවන් විශාල ප්‍රමාණයක් හදා ගැනීම ආර්ථිකයට විශාල බලපෑමක් කරන බවකි. මුස්ලිම් කාන්තාවන් අතර ප්‍රමාණවත් දරුවන් ලබා සිම්ය ද ස්ථිර සැත්කමකට බඳුන් වී ඇත්තේ එක් කාන්තාවක් පමණි. නවීන පවුල් සැලසුම් ක්‍රම දරුවන් මගින් සිමා කර ගෙන සිම්න මුස්ලිම් කාන්තාවන් පවුල් සැලසුම් භාවිතා කිරීමට හේතු විමසා බැලීමේදී මෙයට වෙනස් වූ පිළිතුරු දෙන ලදී. එනම් ඔවුන් දරුවන් ලැබිමට සිම්න විට දී දොලදුක ඇති වන බවත් එය ඉවසා සිම්මට අපහසු බවත්ය. මේනිසා අඩු පරතරයකින් දරුවන් සැදීමට ඔවුන් නොපෙළඹෙන බවද පවසන ලදී. මෙම අධ්‍යයනයට බඳුන් වූ කාන්තාවන් දහ දෙනෙකුගෙන් හත් දෙනෙක්ම දොලදුක පිළිබඳ අදහස් ඉදිරිපත් කරන ලදී. මෙහිදී වැටහුනේ පුරුෂ ආධිපත්‍යයට නතු වී සිම්න මුස්ලිම් කාන්තාව තමන්ට ල- ල- දරුවන් හැදීමේ අපහසුතාව පෙන්වා දීමට යොදා ගන්නා ලද මානසික තත්ත්වයක් බවයි.එම කාන්තාවන් බහුතරයකට අනුව පවුලේ සියළුම තීරණ ගන්නේ ස්වාමී පුරුෂයාය. සිංහල පවුල්වල මීට වෙනස් තත්ත්වයක් හඳුනා ගැනීමට හැකිවිය. එනම් නාගරික





බහුතරයක් විවාහක කාන්තාව තීරණ ගැනීමේදී ප්‍රධානත්වය දරන බවත් නො එසේ නම් කතා කර තීරණය ගන්නා බවයි. මේ තත්ත්වය වැඩියෙන් විද්‍යාමාන වූයේ මාධ්‍යම වයසේ ල-දී විවාහ වූ සිංහල කාන්තාවන් අතරේය. ආර්තවහරණයට ළං වන කාන්තාවන්ගේ තීරණ ගැනීම ස්වාමි පුරුෂයා විසින් ගෙන ඇති අතර ස්වාමි පුරුෂයා අකමැති වීම නිසා පවුල් සැලසුම් ක්‍රම භාවිතා කිරීමට නොහැකි වී ඇත.

අධ්‍යයන කරන කාලය වන විට ප්‍රමාණවත් දරුවන් ලබා සිම් කාන්තාවන්ගේ ගබ්සා වීම් පිළිබඳ වර්තා නොවූ අතර දැනට එම වයසේ සිම්න නමුත් දරුවන් අතර පරතරයේදී ගබ්සාවක් සඳහා පෙළඹුන එක් සිංහල කාන්තාවක් පිළිබඳ ප්‍රත්‍යෙක අධ්‍යයන 6 තුළින් ඉදිරිපත් කර ඇත.

## ප්‍රත්‍යෙක අධ්‍යයනය 6

ඇය නයනා නමින් හඳුන්වමු. ඇගේ වයස අවු.40 කි. සිංහල බෞද්ධ කාන්තාවකි. විවාහ වී ඇත්තේ වයස අවු. 25 දීය. ස්වාමියා වෙළඳ ව්‍යාපාර කටයුතු වල නිරත වේ. ඇය අ.පො.ස.සාමාන්‍ය පෙළ දක්වා ඉගෙන ඇත. දැනට දරුවන් තිදෙනෙකු සිම්න ඇයගේ දරුවන් 1986,1990, 1998 දී ඉපදී ඇත. ප්‍රථම දරු උපත සඳහා පවුල් සැලසුම් ක්‍රම භාවිතා කර නොමැත. දෙවැනි දරු උපත කල් දැමීමට පෙති භාවිතා කර ඇත. එහිදී වමනය, ඔක්කාරය වැනි තත්ත්වයන් ඇති වීමත් ඔසප් නතර වීමත් නිසා පෙති භාවිතය නතර කර ඇත. ක්ලාන්ත ගතියක් ඇති වී ඇත. පසුව නික්ෂේපන භාවිතා කර ඇත. පමණට වඩා මහත් වීම නිසා එය නවත්වා නැවත පාරම්පරික ක්‍රම භාවිතා කර ඇත. දෙවැනි දරුවා හමුවීමෙන් පසුව ස්ථිර සැත්කමක් කර ගන්නා ලෙස දොස්තර පවසා ඇත. ස්ථිර සැත්කමකට පැවති බිය නිසා එය නතර කර ඇත. එසේ පැවසීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ ඇගේ ගර්භාෂය පහත් වී තිබීමයි. මෙහිදී තවත් දරුවන් ලැබීමට නුසුදුසු නිසා ස්ථිර සැත්කමක් කර ගැනීමට වෛද්‍යවරයා අවවාද කර ඇත. නමුත් ඇය පවසනුයේ ස්ථිර සැත්කමකට තම ස්වාමි පුරුෂයා කැමැත්ත දුන්නද ඇය ඒ සඳහා කැමැත්තක් නොමැති බවයි. එයට ප්‍රධාන හේතුව ස්ථිර සැත්කමක් කර ගැනීම මගින් ඇගේ ලිංගික ශක්තිය අඩුවේ යන මිථ්‍යා මතය නිසාය. ඇගේ යහළුවන් මේ පිළිබඳ විස්තර සපයා ඇති අතර ඒ තුළින් තමන් ගේ පුවල් ජීවිතයට බලපෑම් ඇති කරයි යනුවෙන් බියක් පවති. මේ නිසා පාරම්පරික ක්‍රම භාවිතා කරන විට දරුවකු පිළිසඳ ගෙන ඇත. එනම් දෙවැනි දරු උපත ලැබීමෙන් පසුව ඇය පවසන පරිදි ඒ වන විට දරුවන් දෙදෙනෙකු සිටන නිසා තමන්ගේ ගර්භාෂය පහත් වී ඇති නිසාත් දරුවකු හැදීමට සුදුසු

තත්ත්වයක් නොවේ යැයි ස්වාමි පුරුෂයා තිරණය කර ගබ්සාවට පෙළඹී ඇත. ඇය පවසනුයේ දෙවැනි දරු උපත ලබා ඇය ඉතාමත් අපහසුතාවයකින් සිටි බවයි. නවීන තාවකාලික ක්‍රම මගින් අමතර ආබාධ නිර්මාණය වේ යැයි සිතා ස්ථිර ක්‍රමයකට යොමු වීමට බිය නිසා ඒ අවස්ථාවේදී දරුවෙකු හැදීමට අපහසු යැයි තීරණය කර ගබ්සාවට පෙළඹී ඇත. ඇය පැවසූ තොරතුරුවලට අනුව අවබෝධ වූයේ අනාරක්ෂිත ලෙස ඒ සඳහා යොමු වී ඇති බවයි. වෛද්‍යවරයා දෙවැනි දරු උපතේ දී ස්ථිර සැත්කමකට යොමු වීමට පැවසුව ද ඇය ඒ සඳහා යොමු නොවීම නිසා නැවත වෛද්‍ය උපදෙස් ලබා ගැනීමට බියක් ද දක්වා ඇත. ගබ්සාවෙන් පසුව ද ඇයට ශරීරයේ අපහසුතා තිබී ඇත. නමුත් එම අපහසුතා නිසා නවීන තාවකාලික පවුල් සැලසුම් ක්‍රම වලට යොමු වී නොමැති අතර ගබ්සාවෙන් අවුරුදු හතකට පසුව නැවත දරුවෙකු පිළිසිඳ ගෙන ඇත. එහිදී දරුවා ගබ්සා කිරීමට පෙළඹී නැති අතර ඒ සඳහා ද ඇය බිය වී ඇත. තුන් වන දරුවා ලැබීමෙන් පසුව ස්ථිර සැත්කමකට යොමු වීමට බලාපොරොත්තුවෙන් සිටන අතර තමන් ස්ථිර සැත්කමකට යොමු වී නැති බවද පැවසුවාය. වර්තමානයේ ඇය ප්‍රමාණවත් දරුවන් ලබා සිටන බව පැවසුව ද තවම නවීන තාවකාලික හෝ ස්ථිර පවුල් සැලසුම් ක්‍රමයකට යොමු වී නැත. ඉදිරි මාසයක් තුල ස්ථිර සැත්කමකට යොමු වීමට බලාපොරොත්තුවේ. ඇය තමන්ගේ ප්‍රජනන සෞඛ්‍ය තත්ත්වයට වඩා අවධානය යොමු කර ඇත්තේ තමන්ගේ පවුල් සංස්ථාව රැක ගැනීමටය. මෙය පැහැදිලි වනුයේ වෛද්‍යවරයා ඇයට ස්ථිර සැත්කමක් සඳහා අවවාද කල විට දී ඇය ඒ සඳහා පෙළඹී ඇත්තේ යහළුවන් විසින් ලිංගික ශක්තිය අඩුවේ යැයි යනුවෙන් පවසා ඇති කතා නිසාය. නමුත් තුන් වෙනි දරුවා ලැබීමේන් පසුව සායනික උපදෙස් ලබා ගත් ඇය ස්ථිර සැත්කමකට පෙළඹීමට බලාපොරොත්තුවේ. ඇය මුලින්ම නවීන තාවකාලික ක්‍රම සඳහා යොමු වී ඇත්තේ තමන්ගේ ප්‍රජනක සෞඛ්‍ය ගැන සිතමිනි. නමුත් එහි ඇති වූ අතුරු ආබාධ නිසා පවුල් සැලසුම් ක්‍රම පිළිබඳ බියක් දක්වා ඇත.

පවුල් සැලසුම් ක්‍රම භාවිතයේ දී ප්‍රජනක සෞඛ්‍ය ගැන සැලකිලිමත් වීම කෙරෙහි විවිධ සමාජ හැසිරීම් රටා බලපෑම් කරන අයුරු මේ අනුව පැහැදිලි වේ.

## පවුල් සැලසුම් ක්‍රම භාවිතය ප්‍රජනක සෞඛ්‍යයට කරන බලපෑම සෞඛ්‍ය සේවා නිලධාරීන්ගේ අත්දැකීම් අනුව

ප්‍රදේශයේ සෞඛ්‍ය සේවා නිලධාරින්ගේ අත්දැකීම් අසුරින් මෙහිදී කරුණු ඉදිරිපත් කරනු ලැබේ. එහිදී සම්මුඛ සාකච්ඡා කළ නිලධාරින් කිහිපදෙනෙකුගේ අදහස් මෙහි ඉදිරිපත් කරමින් මේ පිළිබඳව සලකා බලනු ලැබේ.





**වෛද්‍ය නිලධාරීන්** - ඔවුන්ගේ අදහස් වලට අනුව වර්තමානයේ මිනුවන්ගොඩ ප්‍රදේශයේ පවුල් සැලසුම් ක්‍රම භාවිතය ඉහළ මට්ටමක පවති. නමුත් මෙම ක්‍රම භාවිත කිරීමේ දී ඇති වූ නොයෙකුත් අපහසුතා නිසා දැනට භාවිත කරන ක්‍රම ඉවත් කරමින් වෙනත් ක්‍රම සඳහා යොමුවීම් වල ප්‍රවණතාවක් තිබෙන බව ඇය පැවසුවාය. මෙහිදී තවදුරටත් ඇය පවසා සිටියේ එන්නත් ලූප් වැනි පවුල් සැලසුම් ක්‍රම ලබා ගැනීමට ප්‍රදේශයේ සෞඛ්‍ය කාර්යාංශයට පැමිණි යුතු අතර මෙම ක්‍රම ලබා ගැනීමට පෙළඹෙන පිරිසක් සිටන අතරම ඒවා තුලින් ඉවත්වන පිරිසත් හඳුනා ගත හැකි බවයි. එසේම ඇය පවසන පරිදි පවුල් සැලසුම් ක්‍රම පිළිබඳ උපදෙස් ලබා ගැනීමට පැමිණෙන පිරිසෙහි ප්‍රවණතාවක් දක්නට ඇති බවයි. පවුල් සැලසුම් ක්‍රම භාවිතය පිළිබඳව මුස්ලිම් හා සිංහල කාන්තාවන් පිළිබඳව පැවසුයේ සිංහල කාන්තාවන් පවුල් සැලසුම් ක්‍රම භාවිතයෙහි වැඩි ප්‍රතිශතයක් ඇති බවයි. නමුත් වර්තමානයේ මුස්ලිම් කාන්තාවන්ගේ ද පවුල් සැලසුම් ක්‍රම පිළිබඳ අවධානය වැඩි වී ඇත. නමුත් ඇය පවසන පරිදි බොහෝ මුස්ලිම් කාන්තාවන් පවුල් සෞඛ්‍ය සේවිකාවන්ගෙන් උපදෙස් නොගෙන තමා වෙත පැමිණෙන බව පැවසුවාය. මෙහිදී පවුල් සෞඛ්‍ය සේවිකාවන් සැම නිවසකටම යන නිසා තමන්ගේ පවුල් සැලසුම් ක්‍රම ප්‍රචාරය වේයැයි බියකින් පසුවේ. මේ තත්ත්වය නිසා කෙලින්ම තමා හමුවීමට පැමිණ තොරතුරු ලබා ගන්නා බව පැවසුවාය.

සමස්තයක් ලෙස සැලසුම් ක්‍රම භාවිතය ප්‍රදේශයේ ඉහළ මට්ටමක පවතින බවත් ඒ සම-ම පවුලක සිටිය යුතු දරුවන් ප්‍රමාණය ද සීමා කරගෙන තිබෙන බවත් ඇය පැවසුවාය. ප්‍රධාන වශයෙන්ම පවුල් සැලසුම් අවශ්‍යතාවය නිසා බව ඇය පවසයි. එම තත්ත්වය තුළ කාන්තාවන්ගේ ප්‍රජනන සෞඛ්‍ය ද ආරක්ෂා වන බව පැවසුවාය. විශේෂයෙන්ම නාගරික ප්‍රදේශයේ පවුල් සැලසුම් ක්‍රම භාවිතය ග්‍රාමීය ප්‍රදේශ වලට වඩා වෙනසක් පවතින බව පැවසූ ඇය නාගරික සමාජයේ කාන්තාවන් දරුවන් සීමා කර ගැනීමේ උත්සාහයක යෙදෙන අතර මෙය මුස්ලිම් ප්‍රජාවන් දෙක තුළම දක්නට ලැබෙන බව පවසයි.

**හෙද නිලධාරීන්** - ප්‍රදේශයේ හෙද නිලධාරිනියන්ගේ අදහස් වලට අනුව සලකා බලන විට වර්තමානයේ පවුල් සැලසුම් ක්‍රම භාවිතය ඉහළ මට්ටමක ඇති බවත් ඒ තුළින් දරුවන් පාලනය කර ඇති බවත්ය. නමුත් බෙහෝ කාන්තාවන් පවුල් සැලසුම් ක්‍රම පිළිබඳව නොයෙකුත් දුර්මතයන් වල එල්බ සිටින බව ඔවුහු පවසති. නවීන තාවකාලික ක්‍රම සහ පාරම්පරික ක්‍රම පිළිබඳව ඇය අදහස් ඉදිරිපත්

කළ පරිදි මෙම ක්‍රමයන් දෙකම භාවිතයට අධ්‍යාපන තත්ත්වයන් විශේෂ බලපෑමක් කරන බව පැවසීය. ඒ සඳහා හේතු විමසීමේදී ඇය අවධාරණය කර සිම්යේ අඩු අධ්‍යාපනයක් ලබා ඇති කාන්තාවන් මෙම ක්‍රම දෙක තුළින්ම අසාර්ථක තත්ත්වයකට පත්වී ඇති බවයි. පවුල් සැලසුම් ක්‍රම භාවිතා කිරීම ප්‍රජනක සෞඛ්‍ය කෙරෙහි යහපත් අයුරින් බලපාන බව ඇය පවසයි. නොයෙකුත් නවීන ක්‍රම මි-න් ඇති වන අතුරු ආබාධ තත්ත්වයන් වලදී පවුල් සෞඛ්‍ය සේවිකාවන් එම කාන්තාවන්ගෙන් දෝෂාරෝපණයට පත්වූ අවස්ථා ද ඇති බව පැවසීය. කෙසේ නමුත් ඇය පවසන පරිදි පවුල් සැලසුම් ක්‍රමයක් භාවිතා නොකිරීම තුළින් ළ- ළ- දරුවන් ලැබීම දරුවන් ප්‍රමාණය වැඩිවීම වැනි තත්ත්වයන් ඇති වේ. නමුත් මේ තත්ත්වය වළකා ගැනීමට ප්‍රේරිත ගබ්සා වලට යොමු වීම විවාහක කාන්තාවන්ගේ ජීවිතයට තවදුරටත් අනතුරුදායක වේ. එසේම නාගරික විවාහක කාන්තාවන් තුළ ග්‍රාමීය විවාහක කාන්තාවන්ට වඩා දරුවන් සීමා කිරීම විශේෂ ලක්ෂණයකි. වසර ගණනක හෙද සේවයේ අත්දැකීම් වලට අනුව ඇය කියනුයේ පවුල් සැලසුම් ක්‍රමය ගැන නොහිතන විශ්වාසයන් මිනිසුන් තුළ පවතින බවයි. මේ හේතු කොට ගෙන පවුල් සැලසුම් ක්‍රම භාවිතා නොකරන කාන්තාවන් ද එසේම ඒ නිසා නොයෙකුත් ක්‍රම වලට කාන්තාවන් ද පෙළඹී සිමින බවයි. ඇයගේ අදහස් වලට අනුව පවුල් සැලසුම් ක්‍රම කාන්තාව වඳ භාවයට පත්වීමට හේතු වන්නේ නැත. නමුත් බොහෝ දෙනා නොයෙකුත් මිත්‍යාවන් ඔස්සේ මෙම ක්‍රම පිළිබඳ විශ්වාසය නොතිබීම නිසා ප්‍රජනක සෞඛ්‍යයට හානිදායක තත්ත්වයන් ඇතිවිය හැකි බවයි. ලූප් ක්‍රමය වර්තමානයේ බහුල ලෙස ප්‍රචාරය කිරීමට බලාපොරොත්තු වේ. මන්ද එය ස්ථිර ක්‍රමයක් නොවූවත් කාලයක් භාවිතා කළ හැකි ක්‍රමයක් බැවිනි. එසේම දරුවන් ප්‍රමාණය සීමා කිරීමට මෙම ක්‍රමය උචිත බව ඇය පවසයි.

**පවුල් සෞඛ්‍ය සේවිකාවන් -** පවුල් සෞඛ්‍යය සේවිකාවන්ගේ අදහස් වලට අනුව ඔවුන් පැවසුවේ සිංහල පවුල් වල ඔවුනට හොඳ පිළිගැනීමක් තිබෙන බවත් මුස්ලිම් පවුල් වලට පවුල් සැලසුම් ක්‍රම හඳුන්වා දීමට ගියවිට නොයෙකුත් දෝෂාරෝපණ ඇති වන බවත්ය. එක් පවුල් සෞඛ්‍ය සේවිකාවක් තමන්ට අත්විදින්නට වූ තත්ත්වය මෙසේ පැවසුවාය.

එක් මුස්ලිම් කාන්තාවක් අවුරුද්දකට වරක් දරුවන් බිහි කරන අතර පවුල් සැලසුම් ක්‍රමයක් භාවිතා කිරීමට උපදෙස් දී ඇති අතර නමුත් එය පිළිගෙන නොමැත. මෙහිදී ඇයට දරුවන් තුන්දෙනෙකු හමු වූ පසුව ඇගේ සෞඛ්‍ය තත්ත්වය ද දුර්වල නිසා ස්ථිර සැත්කමක් කර ගැනීමට අවවාද කර ඇත. නමුත් නැවත





දරුවකු පිළිසිඳ ගැනීම නිසා මෙම කාන්තාවට තදින් අවවාද කර ඇත. එසේ අවවාද කර ඇත්තේ සෞඛ්‍ය තත්ත්වයට හානිදායක තත්ත්වයක් ඇති විය හැකි බැවිනි. අවසානයේ ඇයට ලැබී ඇත්තේ මළ දරු උපතකි. පසුව පවුල් සෞඛ්‍ය සේවිකාව තමන්ගේ සේවය සඳහා එම ගමට යනවිට ඇයගේ කට නිසා දරුවා නැති වූ බව පවසමින් දෝෂාරෝපණය කර ඇත. නැවත ඇයට එම ගමට යාමට නොහැකි තත්ත්වයක් උදාවී ඇත.

මේ තත්ත්වයන් මත ඇය පැවසුවේ මෙවැනි දුර්මතයන් වල එල්ඹ ගෙන සිටින මිනිසුන්ද සිමින බවයි. නමුත් නාගරික මුස්ලිම් කාන්තාවන් පවුල් සැලසුම් ක්‍රම භාවිතය පිළිබඳ ප්‍රසිද්ධියේ කතා නොකරන බවත් නමුත් ඔවුන් දරුවන් පාලනය කරන බවත් පවසයි. එසේම පවුල් සැලසුම් ක්‍රම වලට අදාළ දෙය පෞද්ගලික ආයතන වලින් ලබා ගන්නා බවයි. එසේම එක් නාගරික මුස්ලිම් කාන්තාවක් තුන්වැනි දරුවා ගැබ් ගැනීමෙන් පසුව එය නැති කරගැනීමට උත්සාහ කර ඇත. පවුල් සෞඛ්‍ය සේවිකාව පවසන පරිදි ඇයට එම තත්ත්වය ඇයගෙන් සැ-වීමටද අවශ්‍ය නොවීය. මෙහි පවතින අනතුරුදායක තත්ත්වය පැවසූ විට ඇය ප්‍රකාශ කර සිම්යේ " අපට දරුවෝ හදන්න බැරිනම් කුමක් කරන්නද? " යනුවෙනි. එසේම ඇය පැවසූ පරිදි මුස්ලිම් දරුවන් ප්‍රමාණවත් සෞඛ්‍ය තත්ත්වයක සිටී.

සිංහල කාන්තාවන් පවුල් සැලසුම් ක්‍රම පිළිබඳ ප්‍රසිද්ධියේ තොරතුරු ලබා ගන්නා අතර ඔවුන්ට ඇති වන ගැටලු පිළිබඳව ද තමන් සම- කතා කරන බව පැවසීය. කෙසේ හෝ වර්තමානයේ සිංහල මුස්ලිම් ප්‍රජාවන් පවුල් සැලසුම් ක්‍රම භාවිතයෙහි යෙදී සිමියි. මොවුහු වැරදි වැටහීම් මේ පිළිබඳ ගොඩන-ා ගෙන ඇති බව ඇය පවසයි.

ඉහත සෞඛ්‍ය සේවා හෙද නිලධාරීන්ගේ අදහස් විමසා බලන විට ඔවුන් පෙන්වීමට උත්සාහ ගත්තේ මෙම ක්‍රම භාවිතය ප්‍රජනක සෞඛ්‍ය ආරක්ෂා වීමට හේතු වන බවයි. එසේම ඒවායේ අතුරු ආබාධ පිළිබඳ අවබෝධයකින් කටයුතු කල යුතු බවත් ඒ අතර වාරයේදී කොන්ඩම් වැනි නවීන ක්‍රමයන් භාවිතා කිරීම උචිත බව හෙද නිලධාරීන්ගේ අදහසයි. කුමන හෝ පවුල් සැලසුම් ක්‍රම භාවිතය උචිත බව ඇය පවසයි.

ශ්‍රී ලංකාවේ සඵලතා සංක්‍රාන්තිය වේගවත් වීම සඳහා බලපෑ ප්‍රධාන කරුණක් ලෙස නවීන උපත් පාලන ක්‍රම වල භාවිතයේ ඉහළ යාම දැක්විය හැකිය.

මෙම අධ්‍යයනයේදී භාවිතා කළ ප්‍රමාණාත්මක සහ ගුණාත්මක දත්ත වලින් අවබෝධ වන්නේ ප්‍රජනන හැසිරීමේ වෙනස්කම් වලට බොහෝ දුරට හේතු වී ඇත්තේ උපත් පාලනය පිළිබඳ දැනුම ඉහල යාමත් වැඩි අධ්‍යාපනයක් හා අඩු අධ්‍යාපනයක් සහිත සියලුම ස්ත්‍රීන් පොදුවේ කුඩා පවුල් සෑදීම සඳහාත් වැඩි කැමැත්තක් දැක්වීමයි. මෙම ස්ත්‍රීන්ගෙන් අඩුම තරමේ තමන්ගේ ප්‍රජනන කාල පරිච්ඡේදයේ පළමු භාගයේදී එක් උපත් පාලන ක්‍රමයක් වත් භාවිත කර ඇත. වතු අංශයේ උපත් පාලන භාවිතය ග්‍රාමීය හා නාගරික අංශ වලට වඩා අඩු ප්‍රමාණයක් දක්වයි. මෙයට ප්‍රධාන හේතුව හැමියට දැක්විය හැක්කේ විශාල කාල පරිච්ඡේදයක් මව් කිරි දීම හා දරුවන් බිහි වූ පසු ඉතා දිගු කාලයක් ලිංගික සංවාසයේ නො යෙදීමයි. මීට අමතරව මෑත කාලීන පරිච්ඡේදවල මුස්ලිම් කාන්තාවන් ද පවුල් සංවිධාන ක්‍රම භාවිතයේ ප්‍රතිශතයේ ඉහළ යෑමක් ඇති බවයි. ජාතික පවුල් සංවිධාන ක්‍රියාවලියේ වැදගත් සාධකයක් ලෙස මෙය දැක්විය හැකිය. අපගේ අධ්‍යයනයෙන් පෙනී යන්නේ මෑත කාලීන පරම්පරාව තුළ කිසිවකු මෙම සේවාව ලබා ගැනීම හා ඒ සඳහා යන වියදම නො තැකීමයි. කෙසේ වුවත් උපත් පාලන කොපු හැර අනෙක් තාවකාලික නවීන උපත් පාලන ක්‍රම වල සෞඛ්‍ය සම්පන්න ගැටලු සහගත තත්ත්වයක් ඇති බව වැඩි දෙනා ප්‍රකාශ කරයි. ඉන් වැඩි ප්‍රතිශතයක් වැඩි අධ්‍යාපනයක් ලබා ඇති ස්ත්‍රීන්ය. මෙම ස්ත්‍රීන් සෞඛ්‍ය ගැටලු සහිත යැයි ඔවුන් විශ්වාස කරන බැවින් තාවකාලික උපත් පාලන ක්‍රම භාවිතය නවත්වා උපත් අතර පරතරයක් තබා ගැනීම සඳහා තාවකාලික පාරම්පරික උපත් පාලන ක්‍රම වලට පෙළඹෙන අතර පවුලේ සංඛ්‍යාව ස්ථිර වශයෙන්ම නිශ්චය කිරීම සඳහා ස්ථිර උපත් පාලන ක්‍රම යොදා ගැනීම දක්නට හැකිය. මෙයින් බොහෝ දුරට පැහැදිලි වන කරුණක් වන්නේ විවාහක ස්ත්‍රීන්ගේ අධ්‍යාපන තත්ත්වය ඉහළ ගොස් වඩ වඩාත් උපත් පාලන ක්‍රම සම්බන්ධයෙන් ඇති සෞඛ්‍යමය ගැටලු සම්බන්ධයෙන් උත්සුක වන බවයි.

## නිගමන

පවුල් සැලසුම් ක්‍රම සහ ප්‍රජනන සෞඛ්‍ය අතර සබඳතාව විමසා බැලීමේදී අධ්‍යයනයට භාජනය කරන ලද නාගරික විවාහක කාන්තාවන්ගෙන් බහුතරය තමන්ගේ ප්‍රජනක සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ සැලකිලිමත් වන බව පෙනී යයි. මෙහිදී බොහෝ කාන්තාවන් බියක් දක්වන්නේ දරුවන් නොමැති වේයැයි යන තත්ත්වයටය. දරුවන් නොමැති වේය යන තත්වය ගැඹුරින් විමසා බැලීමේදී පෙනෙනුයේ එය තමන්ගේ ප්‍රජනන පද්ධතිය ආරක්ෂා කර ගැනීමට උත්සාහ කරන තත්ත්වයක් බවයි. මේ නිසා ප්‍රජනක සෞඛ්‍ය ගැන සැලකිලිමත් වෙයි. නමුත් මෙසේ





තමාට ඇති වන සෞඛ්‍යමය ගැටලු තත්ත්වයන් නිසා පවුල් සැලසුම් ක්‍රම නැවැත්වීම නිසා අනවශ්‍ය ගැබ් ගැනීම් වලට භාජනය වීමක්ද හඳුනා ගත හැකිය. මේ නිසා විවාහක කාත්තාවෝ තවදුරටත් කායික මානසික පීඩනයට හසුවෙති.

ප්‍රජනන අයිතිවාසිකම් මානව හිමිකම් පද්ධතියේ වැදගත් ස්ථානයක් ගනී. මේ නිසා හැම යුවලකටම තම අභිමතාර්ථය පරිදි දරුවන් අතර පරතරය තබා ගැනීමටත් දරුවන් ප්‍රමාණය තීරණය කර ගැනීමටද හැකියාව තිබිය යුතුය. නමුත් පවුල් සැලසුම් ක්‍රම වල පවත්නා නොයෙකුත් අපහසුතා සහ ඒවා දිගටම භාවිතා නොකිරීම නිසාත් විශේෂයෙන් මුස්ලිම් කාන්තාවන්ගේ නොදැනුවත්කම, සමාජීය බැඳීම් වලට හසුවීම පවුල් සැලසුම් ක්‍රම අසාර්ථක වීම නිසා අනවශ්‍ය ගැබ් ගැනීම් වලට ලක්වී ඇත.

සිංහල මුස්ලිම් ජන කොට්ඨාශ දෙකටම දරුවන් සීමා කර ගැනීම ට අවශ්‍ය වී ඇත. මේ තත්ත්වය නිසාම අනවශ්‍ය දරු උපත් වලින් වැලකීමට උත්සාහ ගනී. ආර්ථිකය සහ නාගරික සීමිත ඉඩකඩ මේ තත්ත්වයන් සඳහා බලපෑම් එල්ල කරයි. අනවශ්‍ය දරු උපත් වලින් වැලකීමට උත්සාහ ගැනීමේදී නවීන ක්‍රම වලින් ඇති වූ අතුරු ආබාධයන් එසේම නවීන පවුල් සැලසුම් ක්‍රම පිළිබඳව අසා ඇති නොයෙකුත් කට කතා දරුවන් නොමැති වේය යන බිය, ස්වාමි පුරුෂයාගේ අකමැත්ත, විවාහක කාන්තාවන්ගේ අධ්‍යාපනය, සමාජ අවබෝධය, සමාජ මට්ටම, රැකියාව, වයස් සීමාවන් අනුව විවිධ වන ආකාරය හඳුනා ගත හැකිය. මෙම තත්ත්වය මුස්ලිම් සිංහල ජාතීන් දෙකට අනුව පැහැදිලි වෙනසක් හඳුනා ගත හැකිය. එසේම සවාමියා හා භාර්යාව අතර පවත්නා අන්‍යෝන්‍ය සබඳතාව ප්‍රජනන සෞඛ්‍ය ක්ෂේත්‍රයෙහි වැදගත් වේ. ඉහළ අධ්‍යාපනයක් ලද කාන්තාවන්ගේ අන්‍යෝන්‍ය සබඳතාව නිසා අවබෝධයකින් යුක්තව පවුල් සැලසුම් ක්‍රමයක් භාවිතා කිරීමට හේතු වී ඇත. මුස්ලිම් කාන්තාවගේ පවුල් සැලසුම් ක්‍රම පිළිබඳ අන්‍යෝන්‍ය සබඳතාව සිංහල නාගරික කාන්තාවට වඩා අඩුය. තම භාර්යාවගේ පවුල් සැලසුම් ක්‍රම භාවිතය කෙරෙහි ඔවුන්ගේ උනන්දුවක් නොමැත.

නමුත් මෙසේ ප්‍රජනක සෞඛ්‍ය ගැන සැලකිලිමත් වීම ඒ නිසාම පවුල් සැලසුම් ක්‍රම භාවිතය, ඒවායින් ඉවත් වීම, නොකඩවා භාවිතා නොකිරීම, වැනි තත්ත්වයන් වලදී අනවශ්‍ය දරු උපත් ඇතිවේ. මේ තත්ත්වය ප්‍රේරිත ගබ්සා වලට යොමු වීමට හේතු වේ. එය තවත් අතකින් ප්‍රජනක සෞඛ්‍යයට අහිතකර වේ. එසේම තමන්ට ප්‍රමාණවත් දරුවන් හැදීම, පරතරය තබා ගැනීම, තමන්ට අවශ්‍ය

පරිදි ලිංගික හැසිරීම් වල නිරත වීම මානව හිමිකමකි. මෙම තත්ත්වයට නොබියව මුහුණ දීමට නොහැකි වීම එක්තරා අවාසනාවකි. මේ නිසා නවීන පවුල් සැලසුම් ක්‍රම වල දුෂ්කරතා හඳුනා ගෙන ප්‍රජනක සෞඛ්‍යට හානි දායක නොවන පරිදි පවුල් සැලසුම් ක්‍රමයක් හඳුන්වා දීම වැදගත් වේ.

## මූලාශ්‍ර


1. Berelson & others, 1996, Family Planning and Population Programmes, **A Review of World Development s,** The University of Chicago Pres;

2. Caldwell. C., 1996, The International Conference of Population and Development, Cairo 1994. Is its Plan of action important, desirable and feasible?, **Health Transition Review.** Vol.6.No.1;

3. Chharban. S., 1992, step towards Helping Mothers with Unmarried Pregnancies., **Indian Jorurnal of Maternal and Child Health,** 2): 41 - 42;

4. C.P.O. - Center for Population Options, 1990, **The facts: Adolescents and Abortions. washington;**

5. Department of Census & Statistics, 1995, **Sri Lanka Contrceptive Prevalence Survey,** Sri Lanka Colombo;

6. Department of Census and Statistics, 1995, **Sri Lanka Demograpic & Health Survey,** Sri Lanka Colombo;

7. De Silva, W.I. and Ukwatta S., 2000, Development of Population and Reproductive Health Policy in Sri Lanka, **Demography of Sri Lanka , Issues and Challenges,** Department of Demography;

8. De Silva, W.I. and Ukwatta S., 2000, Development of Population and Reproductive Health Policy in Sri Lanka, **Demography of Sri Lanka, Issues and Challenges,** Department of Demography;

9. De Silva, W.I., 1997, Population for Sri Lanka: 1991 - 2041, **Research Studies Series,** No. 2, Health Policy Programme, Institute of Policy Studies, Colombo;







10. De Silva, W.I., 1997, Population Planning Straegies and Programme in Sri Lanka, **Asian Profile,** 23 (5) : 399 - 404;

11. De Silva, W.I.,1990, Age at Marriage in Sri Lanka: Stabilizing of Declining? **Journal of Biosocial Science,** 22(4): 395-404;

12. Dissanayake L., 2000, Factors in Influencing Stablization of Women's Age at Marriage in Sri Lanka: **Demography of Sri Lanka Issues and Challenges,** Department of Demogaphy;

13. Dissanayake L.,1998, Fertility Behaviour of two ethic minorities at the Onset of the Fertility Transition in Sri Lanka : **The Journal of Family Welfare,** Vol. 44, No. 4, Bajaj, Bhavan, Nariman Point, Mumbai 400 021, India;

14. Family Care International , 1996, **Action forth 21st Century, Reproductive health & Right for All,** New York, NY 100012;

15. Family Health Bureau, 1992, **Annual Report on Family Health in Sri Lanka, 1990,** Ministry of Health and Women Affairs;

16. Grebenik, E.&Hill, A.,1974, **International Union for the Scientific Study of Population, International Demographic Technology** ; Fertility Family Planing and Nuptiality, IUSSP Liege, Belgium;

17. Hardee, K.Agarwal K. Luke, N. Wilson e. Pendzish, M. Farewell. M. Cross, H., 1998, **Post Cairo Reproductive Health Policies and Programmes;** a Comparative Study of Eight Countries, Policy Occasional Paper, USAID;

18. Jegeebhoy, S.J., 1996, **Adolescent Sexual and Reproductive Behaviour;** a Raview of Evidence form, India, Wasington, D.C. International Center for Research on Women, 9ICRW;

19. Johnes, G.W. and Selvarathnam, S., 1970, **Urbanization in Ceylon,** 1946-1953, Modern Ceylon Studies, I(I) 199-212;

20. Merton's W., 1995, **The 1994 international Conference on Population and Development, ICPD, Context and Characteristics,** Policy and Research papers, IUSSP;

21. Solapurkar, M.L.& Sangam, R.N., 1985, Has the MTP Ast in India Proved Beneficial? **Journal of family Welfrare,** 31(3): 46-52;

22. United Nations, 1989, **Report and Recommendations of the Expert Group Meeting on Adolescents;** Implications Trends, Environment and Development, Asian Population Studies, Series no 149,ESCAP;

23. United Nations,1996, **Reproductive Rights & Reproductive Health,** a Concise Report, United Nations Reproduction section, NewYork;

24. UNOP/UNFP/WHO., 1998, **Progress in Human Reproduction Research;**